ඒ. ටී. ආරියරත්න



භව තණ්හා

ස්ව චරිතාපදානය

සිව්වන වෙළුම

සර්වෝදය පොත් එකතුව/විශ්ව ලේඛා ප්‍රකාශන

දෙල්ගහ යට ගෙදර විප්ලවය (පළමු මුද්‍රණය)	- 1978
(දෙවන මුද්‍රණය)	- 1987
දේශන සංහිතා	-
උගුල - ජේම්ස්ගෝල්ඩ්ස්මිත්	-
(සංස්: වෛද්‍ය වින්යා ආරියරත්න)	- 1996
ලේඛන සංහිතා	- 1997
යුග පුරුෂයෙකුගේ කථාව (ළමයින්ට)	- 1997
ජනාධිපති ප්‍රේමදාසයි පුරවැසි මමයි	- 1999
සර්වෝදය මාර්ගෝපදේශකයා	- 1999
සර්වෝදය-මහත්මා ගාන්ධි	- 1999
භව තණ්හා වෙළුම 1	- 2001
භව තණ්හා වෙළුම 2	- 2003

The Sarvodaya Book Collection /VISHVA LEKHA PUBLICATIONS

COLLECTED WORKS	Vol I	-	1978
by Dr. A.T. Ariyaratne	Vol II	-	1980
	Vol III	-	1985
	Vol IV	-	1989
Edited by Prof. Nandasena Ratnapala	Vol V	-	1991
in an exclusive gift pack	Vol VI	-	1996
Reprinted in 1999	Vol VII	-	1999
Bhava Thanha	Vol I	-	2001

Voices from the Heart	-	1999
With Gandhiji in Ceylon	-	1998
Revolution under the Breadfruit Tree	-	1988
People's Movement Under Siege	-	1993
Schumaker Lectures on Buddhist Economics	-	1999
Apostle of Peace (S. Godage Books)	-	1997
Sarvodaya and Buddhism	-	1997

භව තණ්හා

ස්ව චරිතාපදානය

සිව්වන වෙළුම

ඒ. ටී. ආරියරත්න

ඒ. ටී. ආරියරත්න
පළමුවන මුද්‍රණය : 2014 අගෝස්තු
දෙවන මුද්‍රණය : 2014 සැප්තැම්බර්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ආරියරත්න ඒ. ටී.
භව තණ්හා/සිව්වන වෙළුම/ඒ. ටී. ආරියරත්න
98, රාවතාවත්ත පාර, මොරටුව. 2014
පි 400. සෙ.මි. 14 x 22 : ආචාර්ය ඒ. ටී. ආරියරත්න
මහතාගේ ජීව චරිතාපදානය
ISBN 978-955-599-516-0 මිල : රු. 600/=

i. 920 විවි 21
1. චරිතාපදාන

ii. ග්‍රන්ථ නාමය
2. ස්වචරිතාපදාන

ISBN 978-955-599-516-0

මේ සිව්වන වෙළුමෙහි පිටු අංකනය කර ඇත්තේ තෙවන වෙළුමෙහි අවසාන පිටු අංකය තවදුරටත් ඉදිරියට ගෙන යාමෙන් බව කරුණාවෙන් සලකන්න. ඒ අනුව සිව්වන වෙළුමෙහි ආරම්භක පිටු අංකය 1651 ලෙස දක්වා ඇත.

මුද්‍රණය:-
සර්වෝදය විශ්ව ලේඛා
'මෙත් මැදුර'
අංක: 77, ද සොයිසා පාර,
මොරටුව.
0776000600

මගේත් සර්වෝදයේත් හිසට ඉහළින් අටවා තිබූ
කඩුව තවදුරටත් එල්ලා තැබීමට
තමා විරුද්ධ බව නිර්භයව ප්‍රකාශ කරමින්
සර්වෝදය වනසුන්දර කොමිසමේ නිගමන ප්‍රතික්ෂේප කරමින්
නිර්භයව නීතියත්, යුක්ති ධර්මයත් වෙනුවෙන් ක්‍රියා කළ
ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිශ්චයකාර
ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමාගේ
ශ්‍රී නාමයට
හව තණ්හා සිව්වන වෙළුම භක්ත්‍යාදරයෙන් පිදේ.

ඒ. ටී. ආරියරත්න

පෙරවදන

භව තණ්හා තෙවැනි වෙළුම මුද්‍රණයට දීමට සූදානම් වන විට එහි පිටු ගණන දහසක් ඉක්මවා යන බව අපට පෙනුණි. ඒ නිසා එය වෙළුම් දෙකකට සකස් කිරීමට මාත් මට සහාය දෙන පිරිසත් තීරණය කළෙමු.

තුන්වැනි වෙළුමේදී යම් පිරිසකට මා ස්තුති කර පින් දී තිබේ ද මේ සිව්වන වෙළුම සඳහාත් ඔවුනට මගේ ගෞරව ප්‍රසාදය පිරිනැමේ.

දැනටමම වෙළුම් හතරකින් පළ කළ මෙම ස්ව චරිතාපදානය පිටු 2100 ක් ඉක්මවා තිබේ. ඒ එසේ වුවත් තවත් වෙළුම් දෙකකට සෑහෙන ප්‍රමාණයේ අත්දැකීම් මා සතුව තිබේ. තවත් වසර කිහිපයක් ජීවත්වීමට ලැබුණොත් තව පොත් දෙකක්වත් පාඨකයාට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

මෙම සිව්වන වෙළුමට පසුවදන සැපයූ ගෞරවාර්හ පූජ්‍ය බුද්ධංගල ආනන්ද හිමිපාණන් වහන්සේට මගේ ගෞරවය පිරිනමමි. මෙම සිව්වැනි වෙළුම පුදනු ලැබුවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සිට විශ්‍රාමලත් දිවංගත විනිසුරු ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමාටය. මහාචාර්ය ටෙනිසන් පෙරේරා ශූරීන් විසින් භවතණ්හා තෙවැනි වෙළුමට ලියූ හැඳින්වීම මෙම වෙළුමට ද ප්‍රමාණවත්ය.

සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා !

ආචාර්ය ඒ. ටී. ආරියරත්න

නො. 114, 'සමුදන',
රාවතාවත්ත පාර,
මොරටුව.
2014 අගෝස්තු

හැඳින්වීම

තම නිජ බිමට අනූපමේය වූ සේවයක් කරන හා සේවයක් කළ, මනා අත්දැකීම් සම්භාරයක් සතු, ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත කතා කියවීම තුළින් ලැබෙන දැනුම කෙනෙකුගේ චිත්ත ධෛර්යය හා පෞරුෂ වර්ධනයට හේතු වන බව අවිවාදයෙන් පිළිගත යුතු කරුණකි. එවන් චරිතාපදාන සංයමව කියවීම මගින් ලබා ගත හැකි ආදර්ශ අපමණ වේ. තම රට වෙනුවෙන්, විශේෂයෙන් පොදු ජනතාව උදෙසා ඇප කැප වී සේවය කරන, ආත්ම ලාභයෙන් තොරව පරාර්ථකාමිත්වය මුල් කර ගෙන කටයුතු කරන කාගේත් හිතාදරයට පත් වී සිටින ප්‍රජා නායකයකුගේ ස්ව චරිත කතාවක් කියවීම සත්‍ය වශයෙන්ම අපූර්ව ආශ්වාදයක් වන්නේය.

1950 දශකයේ අග භාගයේ ආර්ථික දරිද්‍රතාවයෙන් හා සමාජ පීඩනයෙන් හෙම්බත් වූ එසේම හුදකලා වූ ජන කොටසකගේ සුබ සාධනය වෙනුවෙන් කුඩා ශ්‍රමදාන කඳවුරක් ඇරැඹූ නාලන්දා විදුහලේ තරුණ ගුරුවරයෙකු වූ ඒ. ටී. ආරියරත්න මහතාගේ එම කර්තව්‍යය මේ සා විශාල ප්‍රජා සංවර්ධන ව්‍යාපාරයක් බවට පත් වේ යැයි ඒ මහතා මොහොතකටවත් නොසිතන්නට ඇත. එහෙත් එය නිකම්ම සිහිනයක් නොවීය. ජාතික මට්ටමේ පමණක් නොව, ජාත්‍යන්තර මට්ටමේ ස්වේච්ඡා සංවිධානයක් ලෙස කීර්තියට පත් වී ඇති ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන (සංස්ථාපිත) සංගමය එම තත්ත්වයට ගෙන ආ ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතාගේ ස්ව චරිතාපදානය වූ ''භවතණ්හා'' සිව්වන වෙළුමට හැඳින්වීමක් සැපයීම මා ලත් භාග්‍යයක් කොට සලකමි.

''භවතණ්හා'' පළමුවැනි හා දෙවැනි කාණ්ඩ කියැවූ කවර කෙනෙකුට වුවද වැටහෙන මූලික දෙය නම් එතුමා සතුව ඇති නිහතමානී ගුණාංගයයි. තම අදහස් ඉදිරිපත් කර තිබෙන සරල ශෛලිය නිසාම නවතාවෙන් කියවා ගෙන ගිය හැකි ඇති ආකාරය ''භවතණ්හා'' තුන්වැනි සහ හතරවැනි වෙළුමෙන් ද මොනවට

පැහැදිලි වනු නොඅනුමානය. චරිත කතාවකින් එය කියවන පාඨකයාට ලබා ගත හැකි පාඩම් එමටය. ආචාර්ය ආරියරත්න මහතාගේ මෙම ස්ව චරිතාපදානය එවන් පදනමකින් යුත් බව සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ.

භාරතයේ අවිහිංසාවාදයේ පියා ලෙස විරුදාවලිය ලත් මහත්මා ගාන්ධිතුමාගේ ''සර්වෝදය'' සංකල්පයට දේශීය මුහුණුවරක් ලබා දෙමින් බෞද්ධ දර්ශනය හා එහි පිළිවෙත් අනුව සර්වෝදය ව්‍යාපාරය මේ රට තුළ දියත් කරන්නට ආචාර්ය ආරියරත්න මහතා ගත් උත්සාහය සුළුපටු නොවේ. කුඩා ශ්‍රමදාන කඳවුරකින් ආරම්භ කොට මහ වෘක්ෂයක් සේ මේ වන විට ව්‍යාප්තව තිබෙන සර්වෝදය ව්‍යාපාරය ඒ තත්ත්වයට නගා සිටුවන්නට එතුමා ගත් අප්‍රතිහත ධෛර්යය පැසසුම් කට යුතුය. සමාජය තුළ පවතින අසමතාවය හා අසාධාරණ තත්ත්වයන් නැති කිරීමට ගොඩනැගුණු සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් ලෙස ද හැඳින්විය හැකි සර්වෝදය ව්‍යාපාරය මේ රටේ අහිංසක සමාජ විප්ලවයක් කළ සංවිධානයක් වශයෙන්ද ප්‍රකට වී ඇත.

මේ තත්ත්වයට සර්වෝදය ගෙන ඒමේ දී ආරියරත්න මහතාට අත්විඳින්නට සිදු වූ විවිධ ගැටළු, අභියෝග හා මදි පුංචිකම් ගැන එතුමාගේම වචනයෙන් දැන ගැනීමට සලස්වා ඇති භවතණ්හා ස්ව චරිතාපදානය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම වටිනා දැනුම් සම්භාරයක්ද ලබා දෙන සංග්‍රහයක් ලෙස සැලකිය හැකිය. සර්වෝදය ව්‍යාපාරය ගැන නොදන්නා කෙනෙක් අද නැත. ඒ තත්ත්වයට ගෙන ඒමට එතුමාට හැකි වී තිබෙන්නේ තමන් සතු අනුහසාත්මක නායකත්වය නිසායි.

කෙනෙකුගේ කාලය, සිතිවිලි හා ශක්තිය සියල්ලන්ගේම උදාව උදෙසා බෙදා හදා ගැනීම ''සර්වෝදය'' ලෙස අර්ථ දැක්විය හැකිය. පුද්ගලයාගේ උදාව එනම් පෞරුෂෝදය මධ්‍යගත කර ගෙන ගම තුළ ඇති වන උදාව ග්‍රාමෝදය වන අතර, එම උදාවෙන් පසුව සමස්ත රට තුළ ගොඩ නැගෙන උදාව දේශෝදය වේ. ඒ සඳහා රටේ

සියලු දෙනාම එකතුව සහෝදරත්වයෙන් තම තමන්ට අදාල වැඩ කටයුතු බෙදා හදා ගෙන සේවය කිරීම අවශ්‍ය වේ. ග්‍රාමීය සංවර්ධනය හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ එතෙක් පැවැති සාම්ප්‍රදායික චින්තනයට හා ක්‍රියාවලියට වඩා වෙනස් සර්වෝදය ග්‍රාම සංවර්ධන වැඩ පිළිවෙල ගොඩනගා ඇත්තේ ගමේ සම්පත් උපරිම ලෙස උපයෝගී කර ගෙන ගම තුළින්මය. තීරණ ගනු ලබන්නේ ගමේ ජනතාවයි. ගැමි ජනතාවගේ භෞතික සුබ සාධනය හා සාමකාමී සහජීවනය ඇති කරලීම උදෙසා සර්වෝදය ව්‍යාපාරය අනුගමනය කරන ප්‍රතිපත්ති හා දර්ශනය ගැන මනා වැටහීමක් ලබා ගත හැකි අන්දමේ තොරතුරු අනාවරණයක් ''භවතණ්හා'' තුන්වැනි වෙළුමටද ඇතුලත් වී තිබෙන බව කිව යුතුය.

ලොව විවිධ රටවල්වලට ගොස් තමා විසින් කරන ලද දේශන ගණනාවක් මේ කෘතියට ඇතුලත්වේ. ආචාර්ය ආරියරත්න මහතාට පෙර'පර දෙදිග රටවල්වලින්ම ලැබුණු සම්මාන හා ඒ සම්මානවලට එතුමා සුදුසු වූ ආකාරය ගැන ද තොරතුරු අපට මෙම කෘතිය තුළින් දැන ගත හැකිය. එපමණක් නොව සර්වෝදය මෙතෙක් පැවැති ගමන් මග ගැනත්, එමගින් ඉටු වූ සේවාවන්වලට පදනම් වූ දර්ශනය ගැනත් මාහැඟි අවබෝධයක් එම දේශන කියැවීම තුළින් කෙනෙකුට ලබා ගත හැකිය. තමන්ට ජාත්‍යන්තර වශයෙන් සම්මාන ලබා දීමට පුරෝගාමී වූ නොයෙකුත් ආයතනවල ප්‍රජා නායකයින්ගේ වතගොත ගැනත්, ඔවුන්ගේ සුබ සාධන වැඩ පිළිවෙලවල් පිළිබඳවත් ප්‍රයෝජනවත් තොරතුරු මෙම කෘතිය තුළ අන්තර්ගත කර තිබීම වැදගත්ය යනු මගේ හැඟීමයි.

ලොව විවිධ නායකයින් හා වෙනත් ලේඛකයින් විසින් ලියන ලද චරිතාපදානයන්ට වඩා ආකෘතිය, ව්‍යුහය හා ඉදිරිපත් කිරීම අතින් නව ආරක් දක්නට තිබීම ''භවතණ්හා'' වේ විශේෂ ලක්ෂණයකි. තමන්ගේ විදේශීය ගමන්වලදී හමු වූ නොයෙකුත් හිතවතුන් ගැන හා ඔවුන් කරන ලද කාරුණික අනුග්‍රහයන් පිළිබඳ නිහතමානීව තම අදහස් ඉදිරිපත් කිරීමට ආචාර්ය ආරියරත්න මහතා සමත් වී ඇත. මෙම සද් ව්‍යාපාරයේ දර්ශනය, ප්‍රතිපත්ති හා

වැඩ කටයුතු ගැන අබමල් රේණුවක හෝ හැඟීමක් දැනීමක් නැති අය විසින් කරන ලද අකටයුතුකම්, කෙනහිලි හා හානිකර තත්ත්වයන් ගැන උපේක්ෂා සහගතව කරුණු දැක්වීමක්ද මෙහි දැකිය හැකිය.

සත්‍ය වශයෙන්ම ආචාර්ය ආරියරත්න මහතාගේ ජීවිතය රෝස මල් යහනාවක් නොවේ. ''භවතණ්හා'' පළමුවැනි හා දෙවැනි වෙළුම් කියවන විට ද වැටහෙන්නේ එතුමා මේ ව්‍යාපාරය ආරම්භ කළ දා සිටම කටුක අත්දැකීම්වලට මුහුණ පා ඇති ආකාරයයි. ඒවාට මේ ප්‍රජා නායකයා මුහුණ දී ඇත්තේ දැඩි චිත්ත ශක්තියකින් යුතුව බව නොකිවමනාය. ප්‍රජා සේවයේ යෙදෙන තරුණ නායක නායිකාවන්ට ආරියරත්න චරිතාපදානයෙන් ලබා ගත හැකි පාඩම් අපමණය. අර්බුද අවස්ථාවන්වලදී කලබල නොවීම, සංයමයෙන් ප්‍රශ්නවලට මුහුණදීම ආරියරත්න මහතාගේ චරිත ලක්ෂණයක් ලෙස හැඳින්වීම යුක්ති යුක්තය. නහී වේරේනි වේරානි ... යන බුද්ධ වචනයට අනුකූලව තමන්ට මුහුණපාන්නට සිදු වූ බාධක හා එදිරිවාදිකම්වලට ද්වේෂ සහගත සිතින් නොව සම සිතින් නොබියව මුහුණ දුන් චරිතයක ලක්ෂණ ''භවතණ්හා'' තුළින් පිළිබිඹු වේ.

තමන් ළඟ සේවය කළ, එසේම තමන් විසින් අත හිත දුන් ඇතැම් අය පසුව තමාට කරන ලද විවිධ අකටයුතුකම් සැලකිල්ලට නොගෙන පොදුවේ කාගේත් හිත සුව පිණිස කටයුතු කරන ප්‍රජා නායකයෙකුගේ දර්ශනය කෙබඳුද යන්න වැටහෙන්නේ මේ චරිතාපදානය කියවන විටය. යුග පුරුෂයෙකු වශයෙන් සැලකිය හැකි, සාමය වෙනුවෙන්, දුප්පතුන් වෙනුවෙන් ඇප කැප වී ක්‍රියා කරන මේ ප්‍රජා නායකයාගේ ස්ව චරිතාපදානය වූ ''භවතණ්හා'' පිළිබඳ මේ සටහන එතුමාගේම වැකි කිහිපයකින් අවසන් කරමි.

''මගේ විශ්වාසය අනුව ප්‍රථමයෙන්ම අවබෝධ කර ගත යුතු කරුණ නම්, මිනිසාගේ සමාජීය දේශපාලනික හා ආර්ථික වර්ධනය ප්‍රමාණාත්මකව සැලකිල්ලට ගෙන වැඩ කටයුතු කිරීම පමණක් අර්ථයක් නැති බවය. එමෙන්ම වැදගත් වන්නේ මිනිසාගේ ආධ්‍යාත්මික විෂයෙහි ඇති විය යුතු ප්‍රගතියයි. එවැනි දියුණුවක්

අත්පත් කර ගැනීම උදෙසා යොදනු ලබන ප්‍රයත්නයන්, එම ජනතාවගේ අධ්‍යාත්මික සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකම් සහිත ජීවන රටාවන් හා කිට්ටුවෙන් බැඳී පවතින්නේ නම් පමණකි ඉන් ජයග්‍රහණය ලබා ගත හැකි වන්නේ.''

මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා,
සමාජ විද්‍යා හා මානව විද්‍යාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
නුගේගොඩ.

පටුන	පිටු අංක

251. කෘතවේදී හදවත්වල ජීවත් වන හෙන්රි වුඩ්වඩ් අමරසූරිය 1651

252. ජනාධිපති සියාවුල් හක් හමුවීම 1656

253. දකුණු ආසියානු කලාපීය සම්මන්ත්‍රණය ප්‍රධාන දේශනය 1666

254. මංමුලා වූ දේශයකට මධ්‍යස්ථ දේශපාලන පිළිවෙතක් 1678

255. සර්වෝදය උළෙලක් මට තහනම් 1682

256. ජනතාවට සේවය කිරීමේ අභිලාෂය සහ ආත්මාර්ථය 1700

257. පසුව හමුවෙමු 1707

258. සමථයක් සඳහා වෛර දුරීම 1711

259. විනිශ්චය දිය යුත්තේ ජනතාවයි 1718

260. අසීමිත බලය හසුරුවන විට හෙවණැල්ලටද බිය වේ 1730

261. නොනිමි විරසකය 1733

262. යහපත් උදව්කාරයා දුර්ජනයෙක් වීම 1748

263. පසුතැවිලි නොවී ලද යුතු අත්දැකීමක් මිත්‍ර නිකේතන් නිර්මාතෘ ශ්‍රී විශ්වනාදන් 1754

264. මානව දයාවෙන් පිරි හදවතක් 1763

265. සාටෝ කිචිරෝ - සිල්වර් වොලන්ටියර්ස් 1768

266. ජපානයේ සිංහ සමාජ 1771

267. සෙකයි කියුසෙයි පදනම 1781

		පිටු අංක
268.	සහයෝගයේ එක්ව යමක් කිරීමේ ධනාත්මක සිතිවිලි	1796
269.	ජගත් සම්මාන දෙකක්	1816
270.	තිරසාර ප්‍රබෝධයක් - උනන්දුවක් ඇති කිරීමේ දූත මෙහෙවර ජම්නලාල් බජාජ් ත්‍යාගය පිළිගැනීමේ දේශනය	1824
271.	ශක්තිය සහ ධෛර්යයට	1830
272.	දුර්ගුණ නොව යහගුණ මතු කර ගැනීම-හැට පිරුණු දා	1839
273.	රටට සේවය කිරීමේ අයිතිය තිබෙන්නේ දේශපාලඥයින්ට පමණක් නොවේ	1854
274.	ලෙන්ගතුකමින් අපට උදව් කළ අය	1858
275.	තනිව නොව, සාමූහිකව බොහෝ දේ කළ හැකිය	1871
276.	සාමයේ ප්‍රතිරාවය	1880
277.	බොරු චෝදනා ගෙනා තානාපතිට අමතක නොවන පාඩමක්	1885
278.	නිවානෝ සාම ත්‍යාගයට තානාපති විරෝධය	1897
279.	විශ්ව ව්‍යාප්ත පුනරුදය සඳහා ජනතා ක්‍රියාමාර්ග	1908
280.	ප්‍රඥාවන්තයාට ලෝකය එකම පවුලකි	1930
281.	අන්ධකාර වටපිටාවට අලෝක ධාරාවක්	1948
282.	විශ්ව නිකේතන් ජාත්‍යන්තර සාම නිවහන සහ භාවනා මධ්‍යස්ථානය	1963

පිටු අංක

283. කුණු කූඩයට ගිය වනසුන්දර කොමිසන් වාර්තාව 1977

284. ලෝක ආගමික පාර්ලිමේන්තු සම්මේලනය 1995

285. ඉල්ගා අනුස්මරණ ජාත්‍යන්තරසම්මානය 2004

286. ඉල්ගා අනුස්මරණ ජාත්‍යන්තර සම්මානය පිළිගනිමින් කළ දේශනය 2012

287. ගාන්ධි සාම ත්‍යාගය 2018

288. ගාන්ධි සාම ත්‍යාගය පිළිගනිමින් කළ දේශනය 2024

289. තණමල්විල ගොවිපළට අක්කර 500 ක් 2045

290. ශාන්තුවරයකුගේ හාස්කමක් 2048

291. රටේ ගෞරවය රකින ජීවා හා මානෙල් 2059

292. කවදත් හිතමිතුරු ආචාර්ය ලීල් ගුණසේකර 2063

293. පූජ්‍ය වැලිගම ධම්මිස්සර හිමියන්ගේ මතකයෙන් 2073

294. දස වසරකට පෙර අපෙන් සමුගත් අතිපූජ්‍ය මාපලගම විපුලසාර නාහිමි 2084

295. කම් පල විඳි ශ්‍රේෂ්ඨ ආත්මයක් 2090

296. මගේ බිරිය නීතා ධම්මචාරී 2095

297. අඳුරෙන් ආලෝකය කරා 2101

298. දරු මුණුපුරන් ගැන සතුටු වන පියෙක් 2111

299. අපේ පන්සල නව සැරදුන්ගෙන් හා සෙසු විහාරාංගවලින් පරිපූර්ණ කිරීම 2116

251

කෘතවේදී හදවත්වල ජීවත් වන
හෙන්රි වුඩ්වඩ් අමරසූරිය



අමරසූරිය වලව්ව

කුඩා ළමයෙකු වශයෙන් මා ඔහු දෙස බැලුවේ ගෞරව සම්ප්‍රයුක්ත බියකිනි. තරුණයකු වශයෙන් මා ඔහු දෙස බැලුවේ ආදර්ශවත් නායකයකු ලෙසයි. වැඩිහිටියකු වශයෙන් මා ඔහු දෙස බැලුවේ ගෞරව සම්ප්‍රයුක්ත ආදරයකිනි. ඒ ශ්‍රී ලංකා නිදහස් සටනේ වීර භටයකු වූත්, බෞද්ධ ජනතාවගේ නායකයකු වූත්, දක්ෂිණ ශ්‍රී ලංකාවේ බොහෝ බුද්ධිමත් උගත් පිරිසකගේ ඉටු දෙවියෙක් මෙන් වූත්, ඔහු හෙන්රි වුඩ්වඩ් අමරසූරිය මහතාය. දැනට දෙවසරකට පෙර 77 වැනි වියේදී (1987) ඔහු අප අතරින් වෙන් වූ බව ඇසීමෙන් මාගේ මෙන්ම තවත් ලක්ෂ සංඛ්‍යාත ජාති හිතෛෂී බෞද්ධයන්ගේ හදවත් කම්පා වන්නට ඇත.

අප කුඩා දරුවන් හැටියට එච්.ඩබ්ලිව්. අමරසූරිය මැතිතුමා පළමුවෙන්ම දුටුවේ ඔහුගේ පාරම්පරික නිවස වූ 'අමරගිරි' වලව්වේදීය. අප ඉගෙන ගත් උණවටුන බෞද්ධ මිශ්‍ර පාඨශාලාව පිහිටියේ අමරගිරි වලව්වත්ත කෙළවරේය. අපේ පාසල මෙන්ම, ගාල්ලේ බෞද්ධ අධ්‍යාපන සංගමයෙන් පාලනය වූ පාසල් සියල්ලේම කළමනාකාරිත්වය දැරූ එතුමා අපේ පාසලට පැමිණ තොරතුරු සොයා බලනවා මට මතකය.

හෙන්රි අමරසූරිය මහතා කුඩා කළ මට මතක තවත් අවස්ථාවක් නම් උණවටුනේ, පීල්ලගොඩ චෛත්‍යාලංකාර විහාරාධිපතිව වැඩ විසූ පූජ්‍ය පණ්ඩිත අහංගම ශ්‍රී සුමනජෝති අනුනායක හිමිපාණන් වහන්සේගේ කිට්ටුම දායකයකු හැටියට පන්සලට පැමිණි අවස්ථාවලදීය. ගමේ පන්සලේ සිදුවුණු පින්කම්වල ප්‍රධාන දායකයෙක්ව කටයුතු කළේ එතුමාය. ඒ අවස්ථාවේදී එතුමා මට පෙනුණේ නියම ගැමි නායකයෙක් ලෙසය.

අධ්‍යාපනයට පොදු වශයෙනුත්, බෞද්ධ අධ්‍යාපනයට විශේෂයෙනුත් අමරසූරිය මහතා කළ සේවය සිහි ගන්වන සදානුස්මරණීය සංකේතයක් වශයෙන් ගාල්ලේ මහින්ද විද්‍යාලය සැලකිය හැකිය. මහින්දයේ ආදි ශිෂ්‍යයන් වූ අපි එතුමාට සදා ණයගැති වෙමු. උසස් අධ්‍යාපනය සඳහා ආර්ථික ප්‍රශ්න තිබූ ශිෂ්‍යයන්ට එතුමාගෙන් ලැබුණු ආධාරය නිසා, තම අධ්‍යාපන කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට පුලුවන් විය. මේ අන්දමට එතුමාගේ පිහිට ලැබූ, එතුමාගෙන් ශිෂ්‍යත්ව ලබා ගත් දුප්පත් ළමයින් කිහිප දෙනෙකු ගැන මම දනිමි. දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව ඔහු තුළ තිබුණේ පෞද්ගලික කැපවීමකි. ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් පෞද්ගලිකවම තෝරා පත් කිරීමට එතුමා කාලය යෙදුවේය. ගාල්ලේ ටැල්බට් ටවුමේ පිහිටි ඔහුගේ කාර්යාලයේ සිට, පාසල්වල ප්‍රගතිය සොයමින්, පරිපාලන කටයුතුවල ඔහු යෙදී සිටි සැටි මට මතකය. තම පරිපාලනය යටතේ තිබූ පාසල්වලට නිතරම ගිය ඔහු වැදගත් පාසල් උත්සවවලට සහභාගිවීමට අමතක නොකළේය. අපේ පාසල්වලට අමරසූරිය මහතා පැමිණෙන විට අප තුළ ඇති වූයේ ලොකු ධෛර්යයක් මෙන්ම සතුටකි.

45 වැනි වියේදී ඔහුගේ පියා මිය යන විට අක්කර හාරදහසකට අධික වූ ඉඩකඩම් පාලනය අවුරුදු 12 ක් පමණ වූ හෙන්රි වුඩ්වඩ් අමරසූරිය නමැති මහින්ද විද්‍යාලයීය ශිෂ්‍යයා අතට පත් විය. 18 වැනි වියේදී උසස් අධ්‍යාපනය අතහැර ඔහු වතු වැවිලි කර්මාන්තය තමන්ගේ වෘත්තීය කර ගත්තේය. එක් අතකින් ඒ අංශයෙන් මහත් දස්කම් පෙන්වා, එම ඉඩකඩම් දියුණු කරගත් ඔහු තම ප්‍රදේශයේ බාල පරම්පරාවේ අභිවෘද්ධිය සඳහා අමරණීය අධ්‍යාපනික සේවයක යෙදුණේය.

අමරසූරිය මහතා බෞද්ධ ජීවන මාර්ගය අනුගමනය කළ අයෙකු විය. බෞද්ධ කටයුතු වැඩි දියුණු කිරීමෙහි ලා පෙරමුණ ගත් ඔහු ශිෂ්‍යයනට ආගමික අධ්‍යාපනය දීමේ පුරෝගාමියෙක් ද විය. පිරිවෙන් අධ්‍යාපනයට සහ දහම් පාසල්වලට මුල් තැනක් දුන් ඔහු, ඒවායේ දියුණුවට මහත් ධන පරිත්‍යාගයක් කළේය. ඔහුගේ බලවත් විශ්වාසය වූයේ ආධ්‍යාත්මික සහ සදාචාර වර්ධනය සඳහා ආගමික මධ්‍යස්ථාන මුල් විය යුතු බවය. ඔහුගේ කාලයත් ධනයත් ශ්‍රමයත් වැඩි වශයෙන් කැප වූයේ මේ සඳහාය. අමරසූරිය මහතා පෞද්ගලික මුදල් ආධාරයක් නොකළ ආරාමයක් නැති තරමට ඔහු ආගමික කටයුතුවල නියැලුණේය.

මුදල් පරිත්‍යාග කිරීමට පමණක් හෝ මහජන උත්සවවලට පමණක් හෝ එතුමාගේ සේවය සීමා නොවීය. ඔහුගේ හදවතට සමීප වූ ඕනෑම සමාජ ක්‍රියාවකට සම්බන්ධවීම ඔහුගේ පිළිවෙත විය. තමාගේ ජීවිතයේ අවසානය දක්වා ම ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානවල තනතුරු දැරූ අමරසූරිය මහතා ඉතාමත්ම ක්‍රියාශීලී පුද්ගලයෙකු විය.

පාසල් ශිෂ්‍යයෙක් හැටියට මා පළමුව ඇසූ පළමුව දුටු පොහොසතා අමරසූරිය මහතා විය. පොහොසත් මනුෂ්‍යයෙකු කෙසේ විය යුතු ද යන්න ගැන මගේ හදේ යම් චිත්‍රයක් මැවුණේ හා ඒ දුටුවේ අමරසූරිය මහතා තුළිනි. ඉන්පසු බොහෝ පොහොසත්

මිනිස්සු මා දැක තිබේ. ආත්මාර්ථකාමී ඔවුනගේත් මෙතුමාගේත් අතර ඇති වෙනස සැසඳීම වටී. ඒ යුගයේ අමරසූරිය මහතා ගෙදර සිටින බව දැන ගැනීමට තිබූ බාහිර ලක්ෂණය නම්, ඔහුගේ නිවස ඉදිරිපිට පේළි ගැසී සිටි දුප්පත් මිනිස්සු සංඛ්‍යාවයි. හැම සතියේම එක් දිනයක දුප්පත් මිනිසුන් සිය ගණනකට ඔහුගේම අතින් මුදල් පරිත්‍යාග කෙරුණේය. ඔහු ධනපතියෙක් නොවේ. ඔහු ශ්‍රේෂ්ඨ ගනයේ දානපතියෙක් විය.

සටන් පාඨවලට පමණක් මහජන සේවය සීමා නොකොට, තමා විශ්වාස කළ අරමුණු ඉටු කර ගැනීම සඳහා තමන්ගේ ධනය ඔහු යෙදුවේය. ශ්‍රී සුමනජෝති නාහිමිපාණෝ, අනගාරික ධර්මපා-ලතුමා, සෙන්පති ඕල්කට්තුමා ආදී බහුශ්‍රැත ආගමික නායකයන්ගේ ආභාසය ලැබූ අමරසූරිය මහතා තම ධනයෙන් නියම ප්‍රයෝජන ගත් කෙනෙකි. ඉන්ද්‍රියන් පිනවීමට පමණක් තම ධනය වියදම් කරන වත්මන් ධනපතියනුත් එච්. ඩබ්ලිව්. අමරසූරිය මහතාත් අතර මා දකින්නේ අහසට පොළොව මෙන් වෙනසකි. බුද්ධ ශාසනයේත් බෞද්ධ අධ්‍යාපනයේත් දුප්පතුන්ට සහන සැලසීමේත් අභිප්‍රායෙන් පුණ්‍යාධාර පදනමක් ඔහු විසින් පිහිටුවන ලදී.

ගමේ මරණයක් සිදු වූ විට දුප්පත් පොහොසත් භේදයක් නොබලා එහි ගිය අමරසූරිය මහතා, දුකට පත් අයගේ දුක නිවීමට උදව් කළේය. තමන්ගේ කුඩා මොරිස් මයිනර් රථය පදවමින් සමාජ සේවය සඳහා ඔහු සැතපුම් ගණන් දුර ගියේය. ඔහුගේ ජන්ම නිවාසය වූ අමරගිරි වලව්ව රජයේ කාන්තා ගුරු විද්‍යාලයක් සඳහා පරිත්‍යාග කිරීම ඔහුගේ පුණ්‍යමය කටයුතු අතර ශ්‍රේෂ්ඨතම පුණ්‍ය කර්මයකි.

අමරසූරිය මහතාගේ චරිත ලක්ෂණ නිරායාසයෙන්ම ළාබාල වියෙහි සිටි අප කෙරෙහි බලපෑවේය. දුප්පතුන්ගේ හදවතට ළංවීම ඔහුගෙන් මා ඉගෙන ගත් එක් පාඩමකි. ඔහු තුළ තිබූ නිරහංකාර, චාම්, නිවුනු චරිත ලක්ෂණ ද අපට ආදර්ශයක් විය.

ඔහු තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කතා කිරීමට සහ ක්‍රියා කිරීමට කිසිසේත් බිය වූයේ නැත. නිදහසට පෙර සහ පසු දේශප්‍රේමී ජන නායකයකු හැටියට මන්ත්‍රණ සභාවේ පාර්ලිමේන්තුවේ සහ ඇමති මණ්ඩලයේ ඔහුගෙන් සිදු වූ ආර්ථික සහ දේශපාලනික සේවාව ද අප විසින් අමතක කළයුතු නොවේ. ඒ සෑම ක්‍රියාවකදීම ඔහුගේ ප්‍රතිපත්තිවල පදනම වූයේ ඔහු තේරුම් ගෙන තිබූ බෞද්ධ දර්ශනය සහ ප්‍රතිපත්තියි. අද අපේ ජනතාව භුක්ති විඳින යම් දේශපාලනික සහ ආර්ථික නිදහසක් ඇතොත් අමරසූරිය මහතා ද එය දිනා ගැනීම පිළිබඳව ඔහුගේ කොටස ඉටු කර තිබුණි.

වැවිලිකරුවකු හැටියට ඔහුගේ ජීවිතය සාර්ථක විය. මහජන සේවකයකු හැටියට ඔහුගේ ජීවිතය සාර්ථක කතාන්තරයකි. බෞද්ධ අධ්‍යාපනඥයකු සහ දානපතියකු හැටියට ද ඔහුගේ නම සදාතනික වේ.

ඔහුගේ ජීවිතයේ අවසාන වසර කිහිපය මා මතක් කරන්නේ සංවේග ජනකවය. ශාරීරිකව දුර්වල වූ ඔහුගේ දෘෂ්ටිය ද සම්පූර්ණයෙන්ම නැති වී ගියේය. එහෙත් ඔහුගේ ධෛර්යය සහ ජීවත්වීමේ පරමාර්ථය ඔහු අමතක නොකළේය. ශ්‍රී ලංකා අමද්‍යප සභාවේ රැස්වීම්වලට විද්‍යෝදය පිරිවෙනට ඔහු නොකඩවාම පැමිණියේය. විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩ විසූ අතිගරු කළුකොඳයාවේ පඤ්ඤාසේකර මාහිමිපාණන් වහන්සේ මූලාසනය දැරූ එම අමද්‍යප සභා රැස්වීම්වලට වාහනය ළඟ සිට බොහෝ අවස්ථාවලදී එතුමා අතින් අල්ලා ගෙන කැඳවා ගෙන යාමේ අවස්ථා මට ලැබුණි. එහෙත් සාකච්ඡාවලදී එතුමාගේ තියුණු මනස කිසිසේත් දුර්වල වී නොමැති බව සෙසු අයට අවබෝධ විය.

හෙන්රි වුඩ්වඩ් අමරසූරිය මහතා අද අප අතර නැත. එහෙත් කෘතවේදී සිංහල බෞද්ධ ජනතාවගේ හදවත්වල පරපුරෙන් පරපුරට ඔහු සදා ජීවත් වනු ඇත.

ජනාධිපති සියාඋල් හක් හමුවීම
පකිස්තානු ජනාධිපතිගේ වාචික පණිවිඩය

මෙය ලියන්නේ 1987.09.19 වැනි දින රාවල්පින්ඩි නගරයේ ෂාලිමාර් හෝටලයේ සිටයි. දහහතර වැනිදා මා ලංකාවෙන් පිටත් වූයේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ධර්මප්‍රිය වෙසුම්පෙරුම සොයුරා සමඟයි. මහිලා සමිතියේ සභාපතිනී මේබල් ගනේගොඩ මහත්මිය ද අප සමඟ ආවාය.



මේබල් ගනේගොඩ මහත්මිය, මම සහ ධර්මප්‍රිය වෙසුම්පෙරුම මහතා

කොළඹ සහ කරච්චිය අතර දී මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම සමඟ ගුවන් යානයේදී කතා කිරීමට අවස්ථාවක් ලැබිණි. රටේ සාමාන්‍ය තත්ත්වය ගැනත්, එතුමාගේ පසුගිය තුන් වසරේ අත්දැකීම් ගැනත් සාකච්ඡා කිරීමෙන් පසු, සර්වෝදයට සම්බන්ධව වැඩ කිරීමට එතුමාගේ කැමැත්ත පළ කළේය. නිලධාරී ක්‍රමය යටතේ රටට ප්‍රයෝජනවත් තාක්ෂණික නිර්මාණයක් ක්‍රියාවට නැංවීමට නොහැකි බව තුන් වර්ෂයක් මූලික අධ්‍යයන ආයතනයේ අත්දැකීම් තුළින් එතුමාට ප්‍රත්‍යක්ෂ වී තිබීම වැදගත්ය.

අප තිදෙනාම කරච්චියේ ගුවන් තොටුපොළට නුදුරුව තිබෙන 'මිඩ් වේ හවුස්' හෝටලයේ රාත්‍රී පැය කිහිපයක් නිදා ගෙන සිට, උදේ 7.00 ට ඉස්ලාමාබාද් නුවර බලා පිටත් වීමු. උදේ 9.30 ට පමණ ගුවන් තොටුපොළට ළඟා වූ අපි ෂාලිමාර් හෝටලයට පැමිණ ලැගුම් ගතිමු.

රාවල්පින්දියේ ෂාලිමාර් හෝටලයේ අංක 118 කාමරය මට වෙන් කර තිබිණි. එහෙත් එහි පිවිසෙන විට මට හැඟී ගියේ ඒ කාමරය මට නොව, නව විවාපත් යුවළකට මධු සමය සඳහා සූදානම්

මා සඳහා සූදානම් කර තිබූ කාමරය

කර තිබෙන්නා සේය. නිදන යුගළ ඇඳ හතර වටේම මල් වැල්වලින් සරසා තිබිණි. එසේම කාමරයේ සෑම තැනම විවිධ අන්දමින් සරසා තිබිණි. නිදන කාමරයට අමතරව අමුත්තන් පිළිගැනීමේ කාමරයක් ද තිබිණි. මේ හෝටලයේ තිබෙන ඉතාම සුඛෝපභෝගී කාමරය මෙය විය හැකිය. පහළොස් වැනිදා උදේ 10.30 ට සමුළුවේ ආරම්භක සැසි වාරයට පැමිණීමට සූදානම් වීම සඳහා මට තිබුණේ පැය භාගයක් පමණි. ප්‍රධාන අමුත්තා වූයේ පළාත් පාලන ඇමති (අභ්‍යන්තර ඇමති) නසීම් අහමඩ් මහතායි. හිටපු ඇමතිවරයකු වූත් ග්‍රාම සංවර්ධන පදනම් සභාපති වූත් මිර්සප්රුල්ලා ඛාන් ජමාලි මහතා, එහි විධායක සභාපති ආචාර්ය සදික් මලික් මහතා, (ICVA) ඉක්වා වැඩ සටහන් අධ්‍යක්ෂ පියර් කැම්ප්බල්, ඒ.සී. සෙන් මහතා සහ මම මුලසුනේ මේසයේ සිටියෙමු. ප්‍රාරම්භක දේශනය නියම වී තිබුණේ මටයි.

සම්මන්ත්‍රණයේ මාතෘකාව වුයේ 'දකුණු ආසියාවේ රාජ්‍ය නොවන සංවිධානයන්හි කළමනාකරණ සංවර්ධනය සහ පුහුණුවීම්' යනුයි. සාක් රටවලට අයත් ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංගලිදේශය, නේපාලය සහ පකිස්තානය යන රටවල නියෝජිතයනුත් පිලිපීනයෙන් ඇන්ග්ගොක් මහ ලේකම් එඩ්ගාර් වෙනිසුවේලා, ඉරෙඩ් මහ ලේකම් වින්සන්ට් ෆර්නන්ඩ් මහතා ඇතුළු හතළිහක පමණ නියෝජිත පිරිසක් මේ සමුළුවට සහභාගි වූහ.

නිදහස, සංවර්ධනය, සාරධර්ම, තාක්ෂණය, රාජ්‍යයන්, සාධාරණත්වය, සාමය සහ කළමනාකාරිත්වය යන විවිධ අංශ එකිනෙකට සම්බන්ධ වන අයුරු දක්වා ඒ අවස්ථාවේදීම මා සිතට නැගුණු අදහස් පැහැදිළිව ප්‍රකාශ කළෙමි. අපේ තානාපති ඔස්ටින් ජයවර්ධන මහතා, ඉන්දියානු නේපාල තානාපතිවරු ඇතුළු පැමිණ සිටි සම්භාවනීය පිරිසේ බොහෝ දෙනෙක් පැමිණ මා පළ කළ අදහස්වලට ඔවුන්ගේ ප්‍රසාදය පළ කළහ.

ඔස්ටින් ජයවර්ධන මහතා සමඟ

ආචාර්ය වෙසුම්පෙරුම මහතා, ජනාධිපති සියාඋල් හක් මැතිතුමා, මම සහ ගනේගොඩ මැතිනිය

එදා සවස රාත්‍රී ආහාරය සඳහා පැමිණෙන ලෙස තානාපති ඔස්ටින් ජයවර්ධන මහතා කළ ඇරැයුම මම පිළිගතිමි. දැනට අවුරුදු 10 කට පෙර, මන්නාරමේදී හමු වූවාට පසු ඔස්ටින් මට හමු වූ අවස්ථාව මෙයයි. අප දෙදෙනා උනුන් හඳුනා ගත්තේ ඔහු විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේදී ධර්මා ගුණසිංහ සොහොයුරුගේ මාර්ගයෙනි. පසුව සංස්කෘතික අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඔහු සේවය කරන කාලයේදී අපි නිතර මුණ ගැසුනෙමු. මන්නාරමේ දිසාපති වශයෙන් ඔහු සේවය කරන කාලයේදී අපි වඩාත් කුළුපග මිතුරන් වූයෙමු.

දැනට ඔහු මෙහි තානාපති හැටියට පැමිණ අවුරුදු හතරහමාරක් පමණ වේ. දක්ෂ පෙරදිග භාෂා උගතෙකු වූ ඔස්ටින් පරණ නිහතමානී යාළුකම අඩු නැතිව මෙහිදී පෙන්වූහ. රාත්‍රී හතරක්ම මා ආහාර ගත්තේ ඔහුගේ ගෙදරිනි. ආපසු ඒමට (අද) 22 වන දා පිටත් වන විට ඔහු මා සහ වෙසුම් නැවතී සිටි මාර්ගාලා හෝටලයට පැමිණ විශේෂ අමුත්තන් හැරලන දොරටුව මගින් අප ඉස්ලාමාබාද් ගුවන් තොටුපොළට හැරලූහ. කරච්චි නුවරදී අප මුණගැසී කොළඹ බලා යන ඊළඟ යානයට නැංවීමට ඇලෝසියස් මහතාට බාර දී තිබුණෙන් ඔහු සමග ගෙදරට ගොස් ඔහුගේ මැතිනිය සූදානම් කර දුන් දිවා ආහාරය ගෙනයි, ගුවන් තොටුපොළට ආවේ.

දාහත්වන දා රාත්‍රී පකිස්තානු ජනාධිපති මොහොමඩ් සියා උල් හක් මැතිතුමා අපට රාත්‍රී භෝජන සංග්‍රහයක් හා පිළිගැනීමක් දුන්නේය. හතළිහක පමණ වූ නියෝජිත පිරිසේ ප්‍රධානියා හැටියට මා නම් කර තිබුණෙන්, එක ළඟ එතුමා හා වාඩි වී කතා කිරීමේ වාරය මට ලැබිණි. පැයකට අධික කාලයක් එතුමා හා තනිව කතා කිරීමට ලැබිණි.

"ජනාධිපති ජයවර්ධන මුහුණ දී තිබෙන ගැටළුව මට හොඳට තේරෙනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට කුමන පියවරක් ගත්තත්, ඔහුට අත දීම සැමගේම යුතුකමකි. කුමක් වුවත්

පාකිස්තානු ජනතාව හා මම ශ්‍රී ලංකාව සමඟයි'' යනුවෙන් කතාව ඇරැඹූ එතුමා ජනවාර්ගික ප්‍රශ්න, පකිස්තානයේ බෞද්ධ සංස්කෘතික උරුමය, ශ්‍රී ලංකා - පකිස්තාන මිතුදම දියුණු කිරීම, පකිස්තානයේ ග්‍රාම සංවර්ධන පදනම හා සර්වෝදය ආදී විෂයයන් රාශියක් ගැන මා හා සාකච්ඡා කළේය. මා සිය රට ගිය වහාම ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාට කිවයුතු පණිවුඩයක් ඔහු මට වාචිකව පැවැසීය.

වාර්ෂිකව ග්‍රාම සංවර්ධන පදනම සමඟ සර්වෝදය සේවක සේවිකාවක් හුවමාරු කර ගැනීම, ලබන මස අපේ විශේෂඥයෙක් ග්‍රාම සංවර්ධන පදනමේ කටයුතු හැදෑරීමට පැමිණීම සහ තක්ෂිලාවේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයක් ගොඩනැඟීම යන කාරණා ගැන එතුමාට මම අදහස් දැක්වීමි.

දහඅට වැනිදා අපි තක්ෂිලාව නැරඹීමට ගියෙමු. කාලය සීමිත වූයෙන් නැරඹීමට හැකි වූයේ කෞතුකාගාරය හා එක් ආරාමයක් පමණකි. හැකි ඉක්මණින් ආපසු පැමිණ තක්ෂිලා විශ්ව විද්‍යාලය, ධර්මරාජික ස්තූපය, මොහෙන්දො ජාරෝ - හරප්පා නගර ආදිය නැරඹීමට මම තීරණය කළෙමි.

දකුණු ආසියානු කලාපීය සමුළුවේදී ගත් සමූහ ඡායාරූපයක්

ඉන්දියාව හා අප පැටලී ඇති අවුල ගැන සලකන විට පකිස්තානයේ බෞද්ධ පරිසරය හා සම්බන්ධ වීම දෙරට ජනතාව ද එකතු කිරීමකි. හැරත් බෞද්ධ ලෝකයේ වැදගත්ම නටබුන් පකිස්තානයේ හා ඇෆ්ගනිස්ථානයේ තිබේ. මේ නිසා ශ්‍රී ලංකාව මීට වඩා මේ අතීතයට ළං විය යුතුය.

දහනව වැනිදා ජනාධිපති සියා උල් හක් මට පමණක් විශේෂ තෑග්ගක් එවා තිබුණේය. එනම්, ඉතා වටිනා පලසකි. එයට ස්තුති කර යවන ගමන්, තක්ෂිලා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයක් ගොඩනංවා ශ්‍රී ලංකාවේ බෞද්ධ ස්වාමීන් වහන්සේ නමක් එහි අධ්‍යක්ෂ ලෙස පත් කරන මෙන් මම ඉල්ලා ලිපියක් තැපැල් කළෙමි.

පකිස්තානයේ සිටි කාලය තුළ දී අප ලත් විශේෂ ජයග්‍රහණයක් නම් සංගෝ හෙවත් දකුණු ආසියාතික රාජ්‍ය නොවන ආයතනවල සමුළුවක් ඇති කිරීමය. එහි මූලස්ථානය ඉස්ලාමාබාද් නුවර පිහිටුවීමට තීරණය කළෙමු. මගේ ප්‍රධානත්වයෙන් සංවිධායක කමිටුවක් ද පත් කෙරිණි.

ජනාධිපතිතුමා සමඟ මා කතා කරනු කිහිප වරක්ම රූපවාහිනියෙන් පෙන් වූ නිසා, දෙරට අතර මිත්‍රත්වයට ද මේ වේලාවේ එය වැදගත් වන්ට ඇත.

තානාපති කාර්යාලයේ දෙවැනියා වන ඔලිවර් ගුරුගේ මහතා හා මහත්මිය ද අපට කෑම වේලක් දුන්හ. නිතරම දුක-සැප සොයා බැලුවේය. ඔවුන්ට මාස 14 ක පොඩි දුවක් සිටී.

විසිඑක් වැනිදා මගේ ප්‍රධානත්වයෙන් ආසියානු ග්‍රාම සංවර්ධන ආයතනයේ (AIRD) භාරකාර මණ්ඩලයේ රැස්වීමක් පකිස්තානු ග්‍රාම සංවර්ධන ආයතනයේදී පැවැත්විණි. රාජා, ගෝවින්ද්, අග්‍රවාල්, සදික් මලික්, සුන්දරම් සහ රත්නම් ද නිරීක්ෂකයකු වශයෙන් වෙසුම් ද එයට සහභාගි වූහ.

දැන් වෙසුම් හා මා සිටින්නේ මාලදිවයිනේ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේය. වේලාව 22 දා රාත්‍රී 9.00 යි. උදේ 10.00 ට රාවල්පින්දි නුවරින් පිටත් වී 11.30 ට කරච්චියට ආ අපි 3.30 ට

කොළඹට යන ගුවන් යානය තුළට එන තුරු මේ යානය යන්නේ මාලේ හරහා බව දැන සිටියේ නැත. කෙසේ හෝ ලොවැ බොහෝ පෙදෙස්වලට ගොස් තිබෙන මට, බලාපොරොත්තු රහිතව මෙසේ මාලදිවයිනේ ගුවන් තොටුපොළේ පැය කිහිපයක් ගත කිරීමට සිදුවීමේත් තේරුමක් ඇත.

එදා කරච්චියේ සිට මා පැමිණි ගුවන් යානය කෙළින්ම කොළඹට ළඟාවීමට නොහැකිව මාලදිවයිනට යාත්‍රා කළේ තද කුණාටුවක් මඟ හැරවීමටය. මාලදිවයිනේ ද පැය දෙකක් ප්‍රමාද වී, කාලගුණය යහපත් වී යානය ලංකාවට ළඟා වන විට මැදියම් රැයත් පසු වී තිබුණේය. මා ගෙදර එන විට ඉතාමත්ම විඩාවට පත් වී සිටි නිසා කෙලින්ම නින්දට වැටුණෙමි.

මා අවදි වන විට උදේ 6.00 පසු වී තිබුණේය. මගේ බිරිඳ නීතා කීවේ, ඒ වන විට දෙවරක්ම ගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා දුරකතනයෙන් කතා කළ බවත්, වහාම එතුමාගේ නිවසට අවුත් හමු වන ලෙසත්ය.



ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සමඟ

කෙසේ නමුත් මම වෝඩ් පෙදෙසේ එතුමාගේ නිවසට යන විට උදේ 8.00 ට පමණ ඇත. එහි සිටි අය කීවේ ජනාධිපතිතුමා කාර්යාලයට ගිය බවත් මා පැමිණි වහාම එහි එන ලෙස මට දනුම් දෙන ලෙසත්ය. මේ හදිස්සිය කුමක් දැයි මට හිතා ගත නොහැකි වූ නමුත්, මා කාර්යාලයට ඇතුළු වන විටම, එහි තනිවම සිටි එතුමා දුටු විලාසයෙන්ම ලොකු ප්‍රශ්නයකට මුහුණ දී සිටින බව මම තේරුම් ගතිමි. කෙසේ නමුත් එතුමා හාස්‍ය රසයට කැමති කෙනෙක් නිසා ජනාධිපතිතුමා, තමාගේ හමුදාව අහිමි වූ පෘතුගීසි සෙනෙවියෙක් මෙන් කනස්සල්ලෙන් සිටින්නේ මන්දැයි විමසුවෙමි.

''වාඩිවෙන්න වාඩිවෙන්න පකිස්තානු ජනාධිපති සියාඋල් හක් මට දුරකතනයෙන් කතා කර කිව්වා. ඔබ අත වාචිකව පණිවුඩයක් එවන බව මොකක්ද ඒ පණිවුඩය?''

එතුමා මා සමඟ ප්‍රකාශ කළ සියලු දේ නොවළහා එතුමාට මම ප්‍රකාශ කළෙමි.

එතුමා අවංකවම ඒ මොහොතේ මුහුණ දි තිබෙන ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳව මා විශ්වාසයට ගෙන, එතුමාගේ අදහස් ප්‍රකාශ කළේය. සාර්ථක වඩමාරච්චි මෙහෙයුමෙන් පසු ඉන්දියාව ක්‍රියා කරන හිතුවක්කාර විලාශය ගැනත් විශේෂ ගුවන්යානා තුනක් මගින් ශ්‍රී ලංකාවේ අවසරය නොමැතිව යාපනයට ආහාර හෙලූ හැටිත් ඔවුන්ට එරෙහි වී ඉන්දියාවේ ආක්‍රමණයකට ගොදුරු වීමට නොහැකි බවත් එතුමා ඉතා කනස්සල්ලෙන් මෙන් ප්‍රකාශ කළේය.

මේ අතර දුරකතනය නාද විය දන් ඉන්දීය මහ කොමසාරිස් ඩී. එන්. ඩික්සිත් මහතා ගුවන් තොටුපොළේ සිට කෙලින්ම තමා හමුවීමට එන බවය, දුරකතනයෙන් ලැබුණු පණිවුඩය බැව් ජනාධිපතිතුමා කීය. අනතුරුව එතුමා අසුනෙන් නැගිට එතැනම තිබූ කාමරයේ දොර හැර මට එම කාමරයේ වාඩි වී සිටින ලෙසත් ඔහු ගිය පසු තවදුරටත් කතා කළ හැකි බවත් පැවැසීය.

ජනාධිපතිතුමා සහ ඩික්සිත් මහතා අතර පැය භාගයක පමණ සාකච්ඡාවකින් පසු, එතුමා කාමරයේ දොර විවෘත කොට ඉතාමත්ම සැහැල්ලු විදියට මා සමඟ කතාවට බැස්සේ ජයග්‍රාහී හිනාවක් ද මුවඟ රඳවා ගෙනය.

''ආරියරත්න ඉන්දියාව අපව ආක්‍රමණය කිරීමට නොව, සාම සාධක හමුදාවක් එවීමට තීරණය කර තිබෙන්නේ එහි සියලු වියදම් දරන්නේ ඔවුන්මයි''

''ඔබතුමා එයට එකඟ වුණාද?''

''ඔව් මට කරන්න තියෙන හොඳම දේ එකඟ වෙන එකයි. මෙය අපට විශාල ජයග්‍රහණයක්''

''නමුත් සර් මම නම් මෙයට විරුද්ධයි. කිසිම විදේශීය හමුදාවක් අප රට තුළට නොගෙන්වා අපේ ප්‍රශ්නය අපිම විසඳා ගන්නවා නම් නේද හොඳ?''

''බලමු බලමු''

එතැනින් අපේ සංවාදය නිම විය. මම වේදනා සහගත සිතින් කාර්යාලයෙන් පිට වීමි.

253

දකුණු ආසියානු කලාපීය සම්මන්ත්‍රණය
ප්‍රධාන දේශනය
ඉස්ලාමාබාද් නුවර, පකිස්තානය.

''දකුණු ආසියාවේ රාජ්‍ය නොවන සංවිධානයන්හි කළමනාකරණ සංවර්ධනය හා පුහුණුවීම්''

අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමති නසීම් අහමඩ් අහීර්, පකිස්තානයේ හිටපු ඇමතිවරයෙකු වූත්, ග්‍රාම සංවර්ධන පදනමෙහි සභාපති වූත්, මිර්සප්රුල්හාන් ඛාන් ජමාලි මහතා, එහි විධායක සභාපති වූ ආචාර්ය එම්. සදීක් මලික් මහතා, (ICVA) ඉක්වා වැඩ සටහන් අධ්‍යක්ෂ පියර්ස් කැම්බල් කැම්ප්බල් සහ මැති ඇමතිතුමනි, නෝනාවරුනි, මහත්වරුනි,

මෙම ජාත්‍යන්තර සමුළුව ඇමතීමේ ගෞරවය මට උදාකර දුන් ජිනීවා හි ස්වේච්ඡා සංවිධානයන් පිළිබඳ ජාත්‍යන්තර සභාවට මගේ කෘතඥතාවය පුද කරමි.

සමුළුවේ දේශනය පැවැත්වූ අවස්ථාව

දශක හතරක කාලයක සිට අප විසින් ලබා ගත් නිදහස අපි භුක්ති විඳින්නෙමු. අපේ රටවල් යටත් විජිතයන් ලෙස පාලනය කරනු ලැබූ ධනවාදී බලවත් රටවල්වල ක්‍රමයන්ට අනුව අපේ රටවල් ද සංවර්ධනය කර ගන්නට අපි නිදහස ලැබූ ප්‍රථම දශකයේදී තීරණය කර ගත්තා. එදා අපේ සැලැස්ම වූයේ බටහිර රටවල්වල ආභාසය අනුව ජීවන ක්‍රමයක් අපට ද ලබා ගැනීමටය. නමුත් ඒවායින් බලාපොරොත්තු වූ මහත් ප්‍රතිඵල නොලැබූ විට සංවර්ධනය සඳහා ජනතාවගේ සහභාගිත්වයේ අතිශය වැදගත්කම හා අවශ්‍යතාවය ගැන දෙවන දශකයේදී අපි සිතන්නට ගත්තා. රජය මගින් පිළියෙල කරනු ලැබූ සැළසුම් හා ප්‍රතිපත්ති නියමාකාරයෙන් ක්‍රියාත්මක කළයුතු බැවින් ජනතාවගේ සහභාගිත්වය පදනම් කර ගෙන ක්‍රියා කරන්නා වූ ස්වේච්ඡා ආයතන ද ඒ සඳහා ඉදිරිපත් වීම සිදුවුණා. සැළසුම් ක්‍රියාත්මත කිරීම පමණක් නොව සැළසුම් නිසි පරිදි සකස් කිරීම ගැනත් ජනතාවගේ සහභාගිත්වය සහ එහි වැදගත්කම පිළිබඳවත් ඒ වකවානුවලදී අපි ජාතික හා ජාත්‍යන්තර සමුළුවලදී කතා කළා. නමුත් අභාග්‍යයකට ඒ වන විටත් ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳව ඉතා හොඳ ආදර්ශ ක්‍රම තිබුණත් ඒවා භාවිතයට ගනිමින් අපේ රටවල ගැමි ජීවිතයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීමට අපි අසමත් වී ඇත්තෙමු. මේ සියලු හේතූන් නිසා නිදහස ලබා තුන්වන දශකය වන විට සංවර්ධනය යන්නෙහි මුඛ්‍ය අර්ථයත් එහි සත්‍ය පරමාර්ථ විය යුත්තේ මොනවා ද යන්න ගැනත් ප්‍රශ්න කරන්නට හා කතා කරන්නට අපි පෙළඹුනෙමු. නමුත් ඒ බලවත් පොහොසත් රටවල් විසින් කොලනි සූරාකෑමෙන් අත්පත් කරගත් එම ජීවන ක්‍රම අපට කිසිසේත් ලබා ගැනීමට නොහැකි බවත් අපි අවබෝධ කර ගත්තෙමු. එමෙන්ම මනුෂ්‍යයන් වෙත සතුට සොම්නස ගෙන ඒමට එවැනි ද්‍රව්‍යමය කෘතිම ජීවන රටාවන් කිසිවිටෙක රැකුලක් නොවන බවත් අපට ඒත්තු ගියේ ඒ අවදියේය. මේ අයුරින් නිදහස ලබා තුන්වන දශකයේ සිට ඉදිරියට පැමිණි විට මෙම සිතුවිලි යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක වුණා. එනම්, පුහුණු ක්‍රම භාවිතා කරමින් ප්‍රයෝජනවත් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට පටන් ගෙන එය මුළු ලෝකයේම ප්‍රචලිත වූවා.

දූත් කළමනාකරණය යන්න රාජ්‍ය නොවන සංවිධාන ක්ෂේත්‍රය තුළ නවීනතම හා උද්යෝගීමත් විෂය මූලයක් බවට පත් වී තිබෙනවා. 'රාජ්‍ය නොවන සංවිධාන සඳහා කළමනාකරණ සංවර්ධනය' යන තේමාව යටතේ විශේෂ සාකච්ඡා පවත්වන සම්මන්ත්‍රණ දෙකකට මැලේසියාව හා ලන්ඩනයේදී නොබෝදා මා සහභාගි වූවා.

අප සංවර්ධනය පිළිබඳව කතා කරන විට එය ගැනම පමණක් නොව එහි සමස්ත ව්‍යුහය පිළිබඳවම ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගතයුතු බව මගේ විශ්වාසයයි. එනම්, සංවර්ධනයේදී අප ලබා ගැනීමට උත්සාහ කරන්නේ කුමන ප්‍රතිඵලයන් ද, අපට එම ප්‍රතිඵලයන් ලබා ගත හැක්කේ කිනම් ආකාරයට ද සහ කුමන ආකාරයේ සංවිධානාත්මක ව්‍යුහයක් අප විසින් ඒ සඳහා භාවිතා කළ යුතුද යනාදී කරුණු සම්බන්ධයෙන් පුළුල් දැනුවත් භාවයක් හා විශ්ලේෂණ හැකියාවක් සංවර්ධනය සතු විය යුතුය. තවත් විදියකින් විස්තර කරතොත් අවශ්‍ය මූලධර්ම, තාක්ෂණය හා සංවර්ධනයට අදාල අනෙකුත් ව්‍යුහයන් එකිනෙකට සම්බන්ධ හා සාමූහික ලෙස සලකමින් ඒකාබද්ධ හා ඒකීය ක්‍රියා පටිපාටියක් ලෙස ක්‍රියාවේ යෙදවීම සංවර්ධන කාර්යයයේ කාර්ය සාධකතාවය දැකීමට ඉතාමත් වැදගත් කාර්යයකි.

නිදහස ලබා ගැනීමට පෙරාතුව අපේ සියලුම රටවල් විසින් තම තමන් සතු යම් වටිනාකම් ආරක්ෂා කර ගනු ලැබුවා. අසියාව අප්‍රිකාව හා ලතින් ඇමෙරිකානු රටවල් විදේශික බලයන්ට යටත්ව තිබූ කාලවලදී අපේ නායකයින්ට රට දැය වෙනුවෙන් ශ්‍රේෂ්ට කැප කිරීම් කිරීමට හැකියාව ලැබුණේ එම ආරක්ෂා කර ගත් සාරධර්ම ඇතුළු විවිධ වටිනාකම් පද්ධතීන් නිසාය. යටත් විජිත කාලයන්හි ස්වෛරීභාවය අහිමිව තිබුණ ද එය නැවත අත්පත් කර ගැනීමටත්, සටන් වැදීම උදෙසා ධෛර්යය ශක්තිය උපදවා ගැනීමටත් ඒවා ආරක්ෂා කර ගෙන තිබුණා. දේශපාලන නිදහස ලැබුණායින් පසු ඒ සඳහා මෙතෙක් නිදහස් අරගලයන්හි නියැලී සිටි සමහර පුද්ගලයින්

තම රටවල දේශපාලනික හා පරිපාලන නායකත්වයන් නතු කර ගන්නා ලදී. තම රටේ ජනතාවට ප්‍රශස්ත සේවාවක් ප්‍රදානය කළ හැකි ආකාරයට වැඩ කිරීමෙන් යයි ඔවුන් සිතන්නට ඇත. මීට අමතරව තවත් සමහර දෙනෙක් නිදහස ලැබූ නව සමාජයේ දේශපාලනික හා පරිපාලන ජීවිතයෙන් බැහැරව සිටිමින්, ජනතාවට ඉතාමත් ළංවී ඔවුන් වෙත වටිනා සේවාවක් ඉෂ්ට කිරීම දිගටම කර ගෙන ගියහ. ස්ව සංවර්ධනයක් කරා ප්‍රවේශවීමට ජනතාවට හැකි වන පරිදි ඒ පිළිබඳ ධනාත්මක හැඟීම්, පරමාර්ථවලින් ඔවුන් අවදි කරවා තමන්ගේ අනාගත සැබෑ ප්‍රගතියක් පිළිබඳව හදවත් බැඳ තබා ගනිමින් එම මානව හිතෛෂී සුළු පිරිස විසින් ජාතික ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්පාදනය කරනු ලැබුවා.

අද දවසේ රාජ්‍ය නොවන සංවිධාන ලෙස සමාජය ඉදිරියට පැමිණ තිබෙන්නේ ඉහත කී ස්ව සංවර්ධන ප්‍රයත්නයන් හා ඒවායේ ක්‍රියා කලාපයන් සහිත සමාජසේවා ව්‍යාපාරයන්ය. දේශපාලන හා පාලන තන්ත්‍ර පද්ධතීන්ට තමන්ගේ එම ප්‍රතිපත්ති තුළ දිටම වැඩ කර ගෙන යාමට අපොහොසත් වන විට දේශපාලන, ආර්ථික හා සමාජීය ගැටළුවලට මුහුණපාන්නා වූ ජනතාවගෙන් එම දේශපාලන බලවන්ත කොටස් ටිකෙන් ටික ඈත් වන්නට පටන් ගත්තා. අභාග්‍යයට මෙම කාණ්ඩ දෙක සුහදතාවයෙන් එක්ව වැඩ කිරීමට පෙළඹුනේ නැති නිසා ජනතාවගේ ගැටළු අභියස පොදුවේ එක ලෙස මුහුණදීමට හැකි අවස්ථාවක් උදා වූයේ නැත. බොහොමයක් අවස්ථාවලදී එකම අරමුණ හා කාර්යය සම්බන්ධයෙන් මෙම පාර්ශවයන් දෙක ක්‍රියා කළේ එකිනෙකට වෙනස් වන දිශානති ඔස්සේය. තවද තම ප්‍රජාව වෙත යම් අවංක සේවයක් ප්‍රදානය කරන්නා වූ මෙම රාජ්‍ය නොවන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන හා ඒවායේ නායකයින් දෙස එක්තරා විදියක උපහාසාත්මක හා සරදම් හැඟීමෙන් බැලීමේ ආකල්පයන් ද දක්නට තිබුණි. වෙනත් වචනවලින් කිවහොත් එම ස්වේච්ඡා සංවිධාන හෝ ඒවායේ සේවාවන්ට යම් සැලකිය යුතු අවධානයක් ප්‍රතිචාරයක් සමාජය තුළින් ලැබුණේ නැත. මගේ රටේ පවා ගැමි ප්‍රදේශවල දිළිඳු ජන

සමාජයන් වැඩිදියුණු කිරීම සඳහා අප විසින් කරනු ලැබූ කැපවීම්, සමහර මානසික වියවුල් සහිත මිනිසුන් විසින් නිෂ්ප්‍රයෝජන උත්සාහයන් සේ සලකනු ලැබුවා.

තමන්ගේ රටේ අභිවෘද්ධිය සඳහා රාජ්‍ය පාලන තන්ත්‍රය හා රාජ්‍ය නොවන ස්වේච්ඡා සංවිධාන අන්‍යොන්‍ය ලෙස එකට එක්වී වැඩ කළයුතු බව වර්තමානයේදී හොඳින් අවබෝධ කර ගෙන තිබෙනවා. ස්වාධීනත්වය ලබා ගැනීමේදී තමන් හට උපකාරී වූ ඊට පෙර සිටම තමන් සතුව තිබූ යම් ආගමික සංස්කෘතික හා සදාචාරාත්මක විවිධ පැරණි වටිනාකම් නැවතත් ප්‍රාණවත් කර ගත යුතුව ඇත. ඒ අයුරින්ම ඉදිරියේ ඇති වේ යැයි සිතිය හැකි සමස්ත ව්‍යසනයන් වලක්වාලීමට නම්, ඔවුනොවුන් එකිනෙකා සමඟ අත්වැල් බැඳ ගනිමින් රට ජාතියේ යහපත සඳහා පොදු පරමාර්ථ ඉෂ්ට කර ගැනීමේ අභිලාෂයෙන් එක්ව වැඩෙහි යෙදිය යුතුය. අප ජීවත් වන්නේ ඉතා ප්‍රචණ්ඩකාරී ලොවකය. ස්වභාව ධර්මය වෙතට ද අපි අතිශයින් ප්‍රචණ්ඩ වී ඇත්තෙමු. වටිනා වන ලැහැබ විනාශ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අපේම පොලොවේ පස දූෂණය වී ඇත. ජලයද එසේමය. වටපිටාව පමණක් නොව අපේ පාරිසාරික බලයන්ද ක්‍රියා කරන්නේ අපටම විරුද්ධවය. එනම් කෙටියෙන් විස්තර කරතොත්, මිනිස් වර්ගයාගේ එකම ගැලවීම සඳහා ඇති පිළිසරණ වූ සොබා දහමද මහත් අභියෝගයකට මුහුණ පා ඇත. අපේම ආධ්‍යාත්මික හා සදාචාරාත්මක පිරිහීම හේතු කොටගෙන අපව ගෙන ගොස් තිබෙන්නේ ප්‍රචණ්ඩත්වයේම තරඟයක් වෙතටය. දැවැන්ත යුද්ධෝපකරණ නිෂ්පාදනය වී ඇත්තේද එම භයානක තත්ත්වය තවත් තහවුරු වීමටය. සමහර නවීන යුද්ධ ආම්පන්නයක් න්‍යෂ්ටික බෝම්බවලට මිනිස් වර්ගයා පමණක් නොව අපේ පෘථිවියද නැවත නැවත බොහෝ වාර ගණනක් පුපුරුවා හැරිය හැක.

විනාශකාරී අවශ්‍යතාවයන් සඳහා ප්‍රයෝජනයට ගනු ලබන පෘථිවියේ වටිනා සම්පත් මිනිස් සංහතියේම යහපත උදෙසා

ලෙහෙසියෙන්ම භාවිතයට ගැනීමට පුළුවන. බඩගින්නේ පීඩා විඳින දිළින්දන්ට කුසට අහරක්, විලිවසා ගැනීමට ඇඳුමක් දෙකක්, අසරණ ජනතාවට ඉන්නට නිවහනක් වැනි අඩුපාඩු රැසක් එම ධනයෙන් සම්පූර්ණ කර ගත හැකි නොවේද? එම නිසා මානව වර්ගයා වෙනුවෙන් ඉෂ්ට වියයුතු කාර්යභාරය පුළුල්ය. වගකීම් සහිතය. එබැවින් රටවල රාජ්‍ය පාලන තන්ත්‍ර සහ රාජ්‍ය නොවන සංවිධානයන් විසින් ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක විය යුත්තේ කොරා පිටේ තබා ගෙන ඇවිදින අන්ධයා මෙන්, දෙපාර්ශවයේම සුහදතාවයෙන් ජනතාවගේම යහපත සාමය උදෙසා වැඩ කිරීමෙනි.

ආසියාවේ ප්‍රධාන රාජ්‍ය නොවන සංවිධානවල නායකයෝ අද මේ සමුළුවේ අසුන් ගෙන සිටිති. රාජ්‍ය අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන්වලට වඩා සමහර රාජ්‍ය නොවන සංවිධානයන්හි උසස් කාර්ය සාධකතාවයකින් යුත් ඊට අදාල ක්‍රියා කලාපයන් ජනතාවට ස්ව සංවර්ධනයක් කරා ගමන් කිරීමට මහෝපකාරී වී ඇත. අනිත් අතින් බලන විට රජයේ වැඩ සටහන් හා අනෙකුත් සංවර්ධන කර්තව්‍යයන් ගැන අවබෝධයක් මෙන්ම සහයෝගයත් රාජ්‍ය නොවන සංවිධානවලට ලබා දිය හැකි නම් සමස්ත සංවර්ධන උත්සාහයේදී ලබා ගත හැකි ඵල ප්‍රයෝජන ඉමහත්ය.

මෙම ඉතා වැදගත් ගිවිසුම සිතේ තබා ගෙන කළමනාකරණ පද්ධතීන් හා පුහුණු වැඩ සටහන් වැඩි දියුණු කර ගන්නේ කෙසේද? සංවර්ධන කාර්යයේදී අප විසින් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු අවශ්‍යතා කිහිපයකි. ඉන් පළමුවැන්න නම්, ප්‍රජාවගේ අරමුණු ඉෂ්ට කරදීම සම්බන්ධයෙන් අප විසින් ක්‍රියාත්මක විය යුතු නියම ඉලක්කය කුමක් ද යන්න පැහැදිලිව අවබෝධ කර ගැනීමයි. මෙය වනාහි ප්‍රතිඵල මත රඳා පවතින සංකල්පමය ගැටළුවකි. දෙවන වැදගත් අවශ්‍යතාවය නම් සංවර්ධන විෂයෙහි යොදා ගනු ලබන මාර්ග සහ උපක්‍රමයන්. තාක්ෂණ සහ කාර්මික විද්‍යාවත් යන්න

දුප්පතාගේත් දුප්පතා අතට පත් කරවීමට සුදුසු උපාය මාර්ග සංවිධානය කර ගැනීමය. තාක්ෂණයන් තමන් විසින්ම ප්‍රයෝජනයට ගෙන ඵල ලබා ගැනීමට හැකි වන පරිදි බල කිරීමක් නොමැතිව ඒවා දුප්පත් ජන කොටස්වලට පවරාදීම නිසි වගකීමෙන් කළයුතු කාර්යයකි. එය කළ යුත්තේ කුමන අන්දමින් ද යන්න කල්පනාකාරී හා උපක්‍රමශීලී ලෙස අවබෝධයකින් යුතුව ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්ය. තවද එම දුගී ජනතාව විඳින දුක්බර දිවිය තුළින් මුහුණපාන්නා වූ අනේක විධ අභියෝගයන්ගෙන් ජය ලැබීමට හැකි වන පරිද්දෙන් තමාගේම ශක්තීන් අවදි කර ගැනීමට මහෝපකාරී වන ලෙසට එම තාක්ෂණික ක්‍රම එම ප්‍රජාව අතට පත් කළ යුතුය. අවශ්‍යතාවය හා තාක්ෂණය යන්න එකසේ සැලකිල්ලට ගත් විට දකුණු ආසියාතික රටවල්වල සාර්ථක රාජ්‍ය නොවන සංවිධානවලින් ඒ පිළිබඳ බොහෝ දේ අපට උගත හැකිය. බංගලාදේශය, නේපාලය, ශ්‍රී ලංකාව, පිලිපීනය යන රටවල නියෝජිතයින් අද මෙතැන සිටිනවා. තම තමන්ගේ රටවලට සම්බන්ධ වූ අධ්‍යාත්මික හා සදාචාරාත්මක වටිනාකම්, විද්‍යාත්මක හා උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම සමඟ මුසු කර ගනිමින් ඔව්හු තමන්ගේ සමාජසේවා සංවිධාන මනා ලෙස කළමනාකරණය කර ගත්හ. තුන්වන අවශ්‍යතාවය නම්, තම සංවිධානයන් විසින් ගොඩනඟා ගත යුතු උචිත ව්‍යුහයන්ය.

ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරය ගම් 9000 ක් සමඟ සම්බන්ධ වී ප්‍රජා සංවර්ධන සේවා ඉෂ්ට කරනු ලබයි. ඉන් ගම් 5600 ටම එහි ග්‍රාමීය ජනතාව විසින්ම සම්පාදනය කර ගත් ගැලපෙන සංවිධාන සැලැස්මක් බැගින් ඇත. සමස්තයක් ලෙස සැලකූ විට ලක්ෂ දෙකහමාරේ සිට තුන දක්වා වන ජන සංඛ්‍යාවක් ස්වශක්තියෙන්ම සංවර්ධනයක් කරා ප්‍රවේශවීමට ප්‍රයත්න දරති. ජීවත් වන පරිසරය, ජලය, ආහාර, ඇඳුම්-පැළඳුම්, සෞඛ්‍ය පහසුකම්, නිවාස හා බලශක්ති, සන්නිවේදන, අධ්‍යාපනය ආධ්‍යාත්මික හා සංස්කෘතික පිබිදීම යන තමන්ගේ මානව මූලික අවශ්‍යතා ග්‍රාමීය ප්‍රජාවට හඳුනා ගැනීමටත්, ඒවා අත්පත් කර

ගැනීමෙන් තෘප්තිමත් වීමටත් උපකාරීවීම අප සර්වෝදය සංවිධානයේ මූලික පරමාර්ථ හා උත්සාහය ද වේ.

ජනතාව විසින් තම උනන්දුවෙන් උත්සාහයෙන්ම එවැනි ප්‍රායෝගික අභිවෘද්ධියක් ලබා ගත් අනතුරුව රජය වෙත ද යම් කාර්යභාරයක් යුතුකමක් නිතැතින්ම පැවැරී ඇත. එනම් එම තත්ත්වයන් මනා ලෙස තේරුම් ගෙන ඒ සඳහා රජයේ උදව් ඔවුන වෙත ලබාදීමය. පාලන තන්ත්‍රවලට මෙවැනි තත්ත්වයන් වුවද විසඳීමට අසීරු බරපතල ගැටළු ලෙස පෙනීයන බැවින් ඒ සඳහා කළ යුත්තේ ජනතාව විසින්ම අවශ්‍ය ආරම්භක පියවර ගැනීමෙන් පසු ක්‍රියාත්මත කිරීමේදී රජය එහි වගකීම බාර ගැනීම බැව් අපි විශ්වාස කරමු. එවිට ගුණාත්මක සංවර්ධනයක් දැකීමට ඉඩප්‍රස්ථාව උදාවනු ඇත.

අපි අපේ අනෙකුත් අයිතිවාසිකම් භුක්තිවිඳීම නිසා රාජ්‍යතන්ත්‍ර මගින් ස්වේච්ඡා සංවිධාන ලෙස අපව සැකයට භාජනය කිරීමට ඉඩ ඇත. එබැවින් අපේ අවංකභාවය, පරමාර්ථයන් ගැඹුරින් අවබෝධ කර ගෙන ක්‍රියා කිරීම, කැපවීම් සඳහා සූදානම යන කරුණු තුළින් එම සැකයන් පහ වන අයුරින් වැඩ කිරීම අපේ යුතුකමකි. සමාජ, ආර්ථික හා දේශපාලනික නව ජීවයක් උදාවීමට තුඩුදෙන්නා වූ මාහැඟි වටිනා තවත් සත් කාර්යයක් ස්වේච්ඡා සංවිධානයන් ලෙස අපට කළ හැක. එනම් ඊට අදාල මනෝසමාජීය යටිතල ව්‍යුහයන් නිර්මාණය කර නව නැම්මකින් සංස්කෘතික ප්‍රබෝධයක් ජනතාව තුළ ඇති කිරීමට කටයුතු කිරීමය. ප්‍රධානම ගැටළුව සාධාරණත්ව සමඟ සාමය උදා කර ගැනීමය. ධර්මිෂ්ට කමින් තොරව සාමය අත්පත් කර ගත නොහැක. සෑම දෙනාම අත්වැල් බැඳගෙන එක්ව ගමන් කළ යුතුය. මන්ද යත් අපේ සමාජයන්හි ආර්ථික හා දේශපාලන ව්‍යුහයන්හි වැඩි දියුණුවක් ගැන අප සිතන විට සාමය හා ධර්මිෂ්ටකම ළගා කර ගැන්මට ඉවහල් වන්නා වූ මාධ්‍යයක් නැතහොත් මාර්ගයක් ලෙස ඉස්මතු වන්නේ 'සංවර්ධනය' යන අතරමැදියාය. මින් අපට හඟවන්නේ බලය

බෙදාහැරීමේ අවශ්‍යතාවයයි. නමුත් හැමවිටම අප ගැටීමට පුරුදුව සිටින්නේ බලය ශක්තිමත්ව ඒකරාශී වූ ආණ්ඩු සමඟය. අපි ද අපේ රාජ්‍ය නොවන සංවිධානයන්හි බලය ඒකරාශීව ශක්තිමත් කර ගැන්මට උනන්දු විය යුතුය.

සමාජය වෙනුවෙන් අපට කළ හැකි යහපත රජයට පෙන්විය හැක්කේ එලෙස ශක්තිමත් වූ විටය. තම සම්පත්වල වටිනාකම් තමන්ටම තක්සේරු කර ගත හැකි, ජනතාවගේ අවශ්‍යතාවයන් මොනවා ද යන්න හඳුනා ගත හැකි හා ඒවා ලබා ගැන්මට තම සම්පත් භාවිතාවේ යොදා ගැනීමට ඔවුනට අවශ්‍ය කුසලතාවය ලබාදිය හැකි හා තම සංවර්ධන ව්‍යායාමයෙන් උපරිම ඵල නෙලා ගැනීමට පුළුවන් වන ලෙසට ප්‍රජාවට උදව් උපකාර කිරීමට සුදුසු හා නිවැරදි මංපෙත් තමන්ටම නිර්ණය කර ගත හැකි ප්‍රජාතන්ත්‍රවාදී හා විමධ්‍යගත වූ ජනතාවගේම සංවිධානයක් කෙරෙහි ඔවුන්ගේම විශ්වාසය ගොඩනැගෙන පරිද්දෙන් අපේ රාජ්‍ය නොවන සංවිධානයන් විසින් අපේ රටවල ආණ්ඩුවලට නියම ආදර්ශයක් වන අයුරින් ජනතාවට උදව් උපකාර කළ යුතුය. තමන්ගේ රටවල තිබෙන සම්පත් සොයා බලා නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී නිදහසෙහි භුක්තිවිඳිය යුතු වරප්‍රසාද ජනතාවට ලබා දීමටත් රාජ්‍ය පාලන ආණ්ඩුවලට අපේ සංවිධාන ව්‍යුහයන්හි මෙවැනි ප්‍රයත්නයන් ක්‍රියාකාරිත්වයන් අනුගමනය කිරීමට කදිම අවස්ථාවන් මින් උදාවනු ඇත. ඉන් අපගේ සංවිධාන මගින් රජයට ලබා දෙන්නේ මහඟු ආදර්ශයකි. සෑම තන්හිම පවතින අසමානතාවයන් බැහැර කර ගනිමින්, සමෘද්ධිමත් අනාගතයක් කරා විසීමට හැකි වන අයුරින් සුදුසු සැළසුම් නිර්මාණය කර ගැන්මට සියලු ප්‍රජාවන් විසින් අදාල රාජ්‍ය නොවන ආයතන සමඟ විවිධ මට්ටම්වලින් සාකච්ඡා පැවැත්වීම ඉතා අවශ්‍ය දෙයකි. වගකිවයුතු රාජ්‍ය නොවන සංවිධාන හැටියට ජනතාව ශක්තීකරණය සඳහා අප සතුව තිබෙන මාහැඟි දක්ෂ හා කාර්යක්ෂම කළමනාකරණය මූලික ලෙස යොදා ගත යුතුව ඇත. රාජ්‍ය ආධිපත්‍යයන් සමඟ තරඟ නොවදිමින් අප එය ඉෂ්ට කර ගන්නේ කෙසේද? රටවල්වල ආණ්ඩු

සඳහාත් සාමය හා ධර්මිෂ්ටකම සඳහාත් ඇති එකම විසඳුම ජනතාවගේ සාමූහික සංවර්ධනය බැව් මම විශ්වාස කරමි. පිරමිඩයේ පාදස්ථානයට පිවිස අපගේ සේවය ජනතාවට ඉෂ්ට කිරීමට වෙනත් විකල්ප මාර්ග නැත.

රාජ්‍ය නොවන සංවිධානවල විශාල ලෙස ඇති වී තිබෙන ගුණාත්මක වර්ධනය අත්‍යවශ්‍යයෙන් කිවමනාය. වෘත්තීමය විශේෂඥයින් මෙන්ම තාක්ෂණික ප්‍රවීනයින් රාජ්‍ය නොවන සංවිධාන වෙත පැමිණීම වැඩිවෙමින් පවතින අතර ඔවුන් විසින් මහා ව්‍යාපෘති හා වැඩ සටහන් භාරගෙන විශිෂ්ට සේවාවක් එමගින් ප්‍රදානය කිරීම අප කාගේත් සතුටට කරුණකි. විශාල දීමනාවන් හෝ නම්බුව පසුපස නොගොස්, සේවාවේ තෘප්තිමත් බව විඳ ගැනීමේ අවංක චේතනාවෙන්ම රාජ්‍ය නොවන සංවිධානවලට සම්බන්ධ වී ඉතා වටිනා කාර්යභාරයක් ඉෂ්ට කළ වෘත්තීමය බොහෝ දෙනෙක් මම පුද්ගලිකවම හඳුනා ගෙන ඇත්තෙමි. ස්වේච්ඡා සේවය යන්න පිනට වැඩ කිරීම හෝ යහපත කිරීම පමණක්ම වන්නේ නැත. රාජ්‍ය නොවන සංවිධානවල ස්වේච්ඡා සේවාවන් රජයේ වැඩ කටයුතු හෝ ගිවිසුම් හා කොන්දේසි මත ක්‍රියාත්මක කරනු ලබන වාණිජමය ව්‍යාපෘති හෝ වැඩ සටහන් තරමටම කාර්ය සාධකතාවයෙන් හා වගකීමෙන් යුක්තය. එමෙන්ම තම කාර්යභාරයන් ඉටු කරනු ලබන්නේ මනා සැළසුම්කරණයක්, ක්‍රියාත්මකවීමේ අධීක්ෂණ හා පාලනයක් සහ තමන් ලබා තිබෙන ප්‍රතිඵලයන්හි ඇගැයීමක් ද සහිතවය. එබැවින් රාජ්‍ය නොවන සංවිධානයන් දිගටම පවත්වා ගෙන යාම පිණිස අදාල ක්ෂේත්‍රයන් තුළ උචිත වූ කළමනාකරණයක් ගොඩනැගීමත් තුළ සේවකයින් පුහුණුවීම්වලට යොමු කිරීමත් ඉතා වැදගත්වේ.

මේ අයුරින් විවිධ වෘත්තීමය ප්‍රවීණ කුසලතාවයන් රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරී ව්‍යුහයන්ට ප්‍රවේශවීමේදී අප විසින් හැම විටම සිහි කල්පනාවට ගතයුතු වැදගත් කරුණක් ඇත. එනම් ආරම්භයේ සිටම අප සංවිධානයන් ප්‍රාණවත් කරන්නා වූ ස්වේච්ඡා

කැපවීම් හා එම සේවාවන් කුමන අන්දමින් හෝ අඩපණවීමකට හෝ දුර්වල තත්ත්වයකට භාජනය නොවන ලෙසට වගබලා ගැනීමය. අනිත් අතට අපගේ අනාගතය පිළිබඳව ඇති භෞතික පරමාර්ථයන් අත්පත් කර ගැනීමේදී විද්‍යාව හා උචිත තාක්ෂණයන් ඒ සඳහා ආයුධ ලෙස භාවිතා කළයුතු අතර මනුෂ්‍යයින් ලෙස යහපත් ජීවිතයක් ගත කිරීමට තම තමන්ගේ අධ්‍යාත්මික පැවැත්ම ද වර්ධනය කර ගැන්මට අප උනන්දු විය යුතුය.

මගේ කතාව අවසන් කිරීමට ප්‍රථමයෙන් අප වෙත ලබාදුන් හෘදයාංගම හා උණුසුම් පිළිගැනීමත්, ඔබේ රටෙහි ප්‍රීතිමත් සහ ඵලදායී දින කිහිපයක් ගත කිරීම සඳහා දක්වන ලද සියලු ආදර සංග්‍රහයන් සඳහාත් මෙහි පැමිණ සිටින සියලුම නියෝජිතයින් වෙනුවෙන් මම පකිස්තාන රජය හා ග්‍රාම සංවර්ධන පදනම වෙත මගේ අවංක ස්තුතිය පිරිනමමි.

සමුළුවට සහභාගි වූ නියෝජිතයින් සමඟ

මෙම සමුළුවට සහභාගිවීමට මා සමඟ එහි ගිය අනෙක් අය නම් ආචාර්ය ඩී. වෙසුම්පෙරුම මහතා හා මහිලා සමිතියේ මාබල් ගනේගොඩ මහත්මියයි.

සමුළුවේ අවසානයේදී රාජ්‍ය නොවන සංවිධානයන්හි දකුණු ආසියානු සංගමය SANGO යනුවෙන් නව සංවිධානයක් එහි මූලස්ථානයේදීම ආරම්භ කරනු ලැබීය.

රාජ්‍ය නොවන සංවිධාන කළමනාකරණ ජාලයේ අනුගහයෙන් පවත්වන ලද මෙම සමුළුවෙහි සාමාජිකයින් විසින් යම් එකඟතාවයකට පත් වුණා. එනම්, සමුළුවේදී ආරම්භ කරනු ලැබූ සියලුම රාජ්‍ය නොවන සංවිධාන මගින් තම කලාපීය අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන සමඟ අන්තර් සබඳතාවයන් පැවැත්වීම හා සාකච්ඡා මෙහෙයවීම දිගටම පවත්වා ගෙන යෑමය. සමාජ සාධාරණත්වය, පාරිසාරික ස්ථිරසාරත්වය, සංස්කෘතික ගැලපීම් ආත්ම විශ්වාසය වැඩි දියුණුවීම හා අන්තර් අපේක්ෂාවන් යනාදිය සමඟ වර්ධනය වන ගැටළු ඇතුලුව සංවර්ධනයේ සියලු පැතිකඩ අන්තර්ගත වන ලෙස යම් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළයුතු බව ද ප්‍රකාශ විය. කාන්තාවන් හා අසරණ දිළිඳු සමාජය වෙනුවෙන් කළ හැකි සංවර්ධනයක් සඳහා ඇති වන ගැටළුවලට විශේෂ අවධානයක් යොමු වියයුතු විය.

මංමුලා වූ දේශයකට
මධ්‍යස්ථ දේශපාලන පිළිවෙතක්

1988 මැයි මාසය වන විට රජය ඇතුළු සමස්ත දේශපාලනය කෙරෙහි ම මගේ තිබුණු කලකිරීම තව තවත් වැඩි විය. 1988 මැයි මස 15 දා KLM සමාගමට අයත් ගුවන් යානයකින් මම නෙදර්ලන්තයේ ඇම්ස්ටඩෑම් බලා පිටත් වීමි. ඉන් පසුව අමෙරිකාව කැනඩාව සහ එංගලන්තයට ද යෑමට මට තිබුණි.

කොළඹ සහ ඇම්ස්ටඩෑම් අතර ගුවන් යානයේදී මගේ දිනපොතේ මා ලියා තිබුණු පහත දක්වෙන සටහන එවකට මගේ සිත වැඩ කළ ආකාරය මනාව පැහැදිළි වනු ඇත.

''එහෙත් රට ගැන සිතන විට කිසිවෙකුට සිතේ සැනසීමක් ඇති කර ගත නොහැකිය මා ගෙදරින් පිටවීමට පෙර අන්තිමට කියැවූ ලිපිය රෝහණ විජේවීරගෙන් තැපෑලෙන් ලැබුණු ලිපියකි. ඔහුගේම අත්සනින් ඔහුම ලියුම් කවරය ලියා කොළඹින් තැපැල් කරන ලද මේ ලිපියෙන් රජය සහ ජනතා විමුක්ති පෙරමුණ අත්සන් කරන ලද'යි කියන සම්මුතිය කුමන්ත්‍රණකාරී මුසාවාදයක් බව ප්‍රකාශ කර තිබුණේය. මේ රජය නීත්‍යානුකූල රජයක් නොවන බවත් ජනාධිපති ඇතුළු පාලකයෝ ජාතිය පාවා දුන් තක්කඩින් සමූහයක් බවත් මොවුන් බලයෙන් පහ කළ යුතු බවත් එහි පැහැදිලිවම සඳහන් කර තිබුණේය. මොහුගේ වචනවල තද ස්වරූපය හැරුණු විට සාධාරණ කිසිවෙකුටත් එහි සත්‍යතාවය ප්‍රතික්ෂේප කිරීමට නොහැකිය. මම කවදා වත් ප්‍රකෝපකාරී හිංසාවාදී මාර්ග අනුමත නොකරමි. එහෙත් රාජ්‍ය පක්ෂය එවැනි මගක ගමන් කරන විට ඒ මාධ්‍යයම උපයෝගී කර ගෙන තවත් පිරිසක් ඒ මගට විරුද්ධවීමක් ඇති වීම වැළැක්විය නොහැක්කකි.

රජය පැත්ත ගෙන බලන විට ඔවුන් සත්‍යයට හා අහිංසාවට විරුද්ධව ක්‍රියා කර තිබේ රටේ ව්‍යවස්ථාවත් ඒ යටතේ පනවන ලද නීතිරීතිත් බලය බෙදා හැරීමත් යන සියල්ලම කර තිබෙන්නේ ජනාධිපතිවරයා ප්‍රධාන වත්මන් පාලක පක්ෂයේ බලය සහ බලයත් සමඟ ලැබෙන පෞද්ගලික ලාභ හා වරප්‍රසාද රැක ගැනීමට මිස පොදු ජනතාවගේ යහපත සහ රටේ සමස්ත අභිවෘද්ධිය අරමුණු කර ගෙන නොවන බව පැහැදිලිය. මෙය අසත්‍යය, හිංසාව සහ ආත්මාර්ථකාමී බව තහවුරු කිරීමකි ඒ නිසා සත්‍යවාදී අහිංසාවාදී ආත්මහරණීය ප්‍රතිපත්ති මාලාවක් මත රට ගොඩනැංවීම සඳහා සර්වෝදය ව්‍යාපාරයට මේ රජයේ මේ ක්‍රියා කලාපය ද අනුමත කළ නොහැකිය.

එහෙත් ඊට විරුද්ධව ප්‍රජාතාන්ත්‍රිකව ක්‍රියා කිරීමේ මං සියල්ල ඔවුන් විසින් අහුරා තිබේ. අප යම් ප්‍රකාශයක් ඔවුන්ගේ ක්‍රියා මාර්ග විවේචනය කරමින් කළහොත් එහි ප්‍රතිඵලය වන්නේ මේ තත්ත්වයට එරෙහිව දීර්ඝ කාලීන වශයෙන් අප කරන නිර්මාණාත්මක ක්‍රියාදාමයට විශාල බාධාවනට මුහුණ දීමට සිදුවීමය.

ජනතා විමුක්ති පෙරමුණේ විප්ලවීය ක්‍රියා මාර්ගය ගැන කිවයුත්ත ද එයමයි. ඔවුන් ගත් හිංසාවාදී මග මම අනුමත නොකරමි. එහෙත් ඔවුන් පමණක් නොව ඔවුන්ගේ නෑදෑ හිතවතුන් ද රජය සමඟ නොවන ඕනෑම වෙනත් කෙනෙක් ද රාජ්‍ය මර්දනයට යටත් කළ හැකි විදියේ නීති එක් අතකින් ද දේශපාලකයන් විසින් පාලනය කරන ව්‍යවස්ථා බාහිර යුද හමුදා පොලිස් හමුදා හා ත්‍රස්ත කණ්ඩායම් තවත් අතකින් ද පාවිච්චි කරන රජයකට විරුද්ධව ගන්නා වෙනත් ඕනෑම මගක් සාර්ථක වේ යැයි කෙසේ පිළිගත හැකිද? ඔවුන්ට විරුද්ධව කතා කිරීමෙන් ද පලක් නොවේ. ඔවුන් විසින් අප සතුරන් හැටියට සැලකුවහොත් අපේ ගම්වල සේවය කරන දස දහස් ගණන් තරුණ තරුණියන් ඔවුන්ගේ උදහසට ලක් වේ.

මේ දෙපක්ෂය අතරමැද තිබෙන කණ්ඩායම් දෙක ගැන කිව හැක්කේ කුමක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකකි. එක්සත් සමාජවාදී පෙරමුණ අනෙකයි. මේ දෙපිරිසම දෙන විකල්පය කුමක්ද? සමස්තය කුමක්ද? එය ද මට නම් නොපැහැදිලිය. තුලනාත්මකව බලන විට එක්සත් ජාතික පක්ෂයට වඩා ඔවුන්ගේ ප්‍රතිපත්තිවල දේශීය බවක් ජනහිතකාමී බවක් සමාජවාදී බවක් ප්‍රජාතාන්ත්‍රික බවක් පෙනුණත් මූලික සාරධර්ම ගැන සිතන විට ඒවා සත්‍යය අහිංසාව හා ආත්මහරණය පදනම් වූ බල කණ්ඩායම් දෙකක් ද? නැතිනම් අවස්ථාවාදීව බල තරගයෙන් ජය බලාපොරොත්තුව කටයුතු කරන පිරිසක් ද? ඔවුන් බලයට වූත් දෙන විසඳුමත් රටේ කලබලකාරී බව විනාශකාරී බව නතර කිරීමට සමත් වේද? මට නම් එය සැකයි. කෙසේ හෝ අනාගතයේදී පොදු මහජන යහපත ගැන සිතා මේ තත්ත්වය යටතේ සර්වෝදය අප කෙසේ ක්‍රියා කළ යුතු ද යනු මා සිත යොදවන ප්‍රශ්නයයි.

අපේ සාරධර්ම හා ප්‍රතිපත්ති අනුව සියල්ලන්ගේම යහපතට ඉලක්ක වූ මාර්ගයක අප ගමන් ගත යුතුය. ඒ මාර්ගය වර්තමානයේදී කුමක් විය යුතුද? එය වත්මන් යථාර්ථයට කෙසේ ගැලපේද?

මෙවැනි අර්බුදකාරී අවස්ථාවලදී පළමුවෙන්ම අප සිතිය යුත්තේ සර්වෝදය වශයෙන් දැනට අපේ තිබෙන ශක්තිය ගැන පැහැදිලි අවබෝධයක් පෙරදැරි කර ගෙනය. අපේ ශක්තිය තිබෙන්නේ ගම්වලය සංවර්ධන ශුභසාධන අංශයෙන් ද ඒ සඳහා ජනතාව සංවිධානය කිරීම අතින් ද අන් සැමට ම වඩා පෙරමුණෙහි සිටිමු. දේශපාලන වශයෙන් පැත්තක් නොගෙන සිටීම ද විශාල ශක්තියකි.

බල දේශපාලනය කෙරෙහි ජනතාවගෙන් විශාල කොටසක් කලකිරී තිබීම ද අපට අපේ කටයුතුවලට වාසියකි. පැත්තක් ගත් අය උනුන් වනසා ගැනීමේදී සාමාන්‍ය අපක්ෂපාතී මහජනයාට ද කරදර හිරිහැර වන නමුත් දීර්ඝ කාලීන සාමයක් හා සංවර්ධනයක් ගැන

සිතන විට සංවිධානය කළ යුත්තේත් ශක්තීකරණය කළ යුත්තේත් මේ නොබැඳුණු ජනතාවය එය කළ යුතු ශිල්පීය ක්‍රම හා මාර්ග අපි දැනට ම විශාල වශයෙන් අත්හදා බලා ඇත්තෙමු''

255

''සර්වෝදය උළෙලක් මට තහනම්''

1988 ජූලි 01 වැනිදා සවස 4.00 ට පමණ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය රංජිත් අමරසිංහ මහතාගෙන් මට දුරකථන ඇමතුමක් ලැබිණි.

''බලාපොරොත්තු නැති අර්බුදයක්. මට වහාම පැමිණ ඔබ හමුවන්න ඕනෑ'' ඔහු කීවේය.

''මා ඉන්නවා වහාම එන්න'' මම එතුමාට පිළිතුරු දුනිමි.

ආචාර්ය රංජිත් අමරසිංහ මහතා සමඟ

ආචාර්ය රංජිත් අමරසිංහ සුවිශේෂ ගණයේ උගත්, නිහතමානී නීති ගරුක රාජ්‍ය සේවකයෙකි. කලින් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විවිධ ජාත්‍යන්තර සිවිල් සේවා කටයුතුවල නිරත වී සිටි ඔහු, වත්මන් රජයේ ඇරයුමෙන් දැනට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් නිලය බාර ගත් තැනැත්තෙකි. ඔහු සේවයට ලැදිව මේ රැකියාව බාර ගත් කෙනෙක් මිස මුදල් කාමයෙන් හෝ නිල කාමයෙන් හෝ එය බාරගත් කෙනෙක් නොවේ. පෞද්ගලික අංශයේ හෝ ජාත්‍යන්තර අංශයේ හෝ ඔහුට මේ වාගේ සිය ගුණයක ආදායමක් ලැබෙන රැකියාවක් ඕනෑම අවස්ථාවක සොයා ගත හැකිය. එහෙත් ඔහු මේ නිලය බාර ගත්තේ තමන්ගේ රටට ජනතාවට සේවයක් කරන අටියෙනි. ඔහු මා ඉහළින්ම ගරු කරන මහත්මයෙකි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම බුද්ධිමතෙකි උගතෙකි ලේඛකයෙකි නීති විශාරදයෙකි.

මේ ගුණයන් නිසා අප දෙදෙනා අතරේ ඉතා කිට්ටු මිත්‍රත්වයක් ගොඩනැඟී තිබීම ගැන මම පුදුම නොවෙමි. මම ඔහුට ගරු කළෙමි. ආදරය කළෙමි. අවුරුදු තිහක පමණ පර්යේෂණයකින් පසු රංජිත් අමරසිංහ මහතා ''ශ්‍රී ලංකාවේ සුප්‍රීම් උසාවිය'' (Supreme Court of Sri Lanka) යන අගනා ග්‍රන්ථයක් ඉංගිරිසියෙන් ලියා අවසන් කළේය විශ්වලේඛා ආයතනයේම මේ ග්‍රන්ථය මුද්‍රණය හා ප්‍රකාශනය කළ යුතු බව අමරසිංහ මහතාගේ අපේක්ෂාව විය.

මෙතරම් විශාල අගනා කෘතියක් අප මුද්‍රණාලයේ මුද්‍රණය කළ හැකි ද යනු අප මුහුණ දුන් අභියෝගය විය. අමරසිංහ මහතා සහ සුසිරි මල්ලී විශ්ව ලේඛා කාර්ය මණ්ඩලයට නායකත්වය දී, පිටු දහසක් පමණ වූ මේ විශාල ඉංගිරිසි ග්‍රන්ථය කොමාවක හෝ නැවතීමේ ලකුණක වරදක් නොමැතිව මුද්‍රණය කොට නිමා වූවා පමණකි. ශ්‍රී ලංකාවේ මුද්‍රණාලයක මෙතරම් විශාල ගුණාත්මක ග්‍රන්ථයක් මුද්‍රණය වූ පළමු වතාව මෙය විය හැකිය. මා කළේ ධෛර්යදීම පමණක් වුවත්, අප තිදෙනාටමත්, මුළු ව්‍යාපාරයටමත් මෙය ජයග්‍රාහී සතුටුදායක අවස්ථාවක් විය.

පොත කලඑළි දැක්වීමේ උළෙල 1988 ජූලි 02 දාට යොදා ගතිමු. එතැන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවය. ප්‍රධාන අමුත්තා හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයේ අග විනිසුරු පාරින්ද රණසිංහ මැතිතුමාට ඇරයුම් කළෙමු. වෙනත් රාජකාරියකට අධිකරණ ඇමති නිශ්ශංක විජයරත්න මැතිතුමා හා අමරසිංහ මැතිතුමා, ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා හමු වූ අවස්ථාවකදී ඔහුට මේ ගැන දැන ගන්නට ලැබී, එදිනට තමා නිදහස් බවත් පැමිණීමට කැමති බවත් දන්වා ඇත. ඔහුම ඒ දිනය දිනපොතේ සටහන් කර ගෙන, අපේ උළෙලට ඔහු ඔහුටම ප්‍රධාන අමුත්තා වශයෙන් පැමිණීමට ඇරයුම් කර ගත්තේය.

ඒ අනුව අපේ වැඩ සටහන වෙනස් කර ගතිමු.

ප්‍රධාන අමුත්තා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාය. මුලසුන අග විනිසුරුතුමාය. පිළිගැනීමේ කතාව මගෙනි. අධිකරණ ඇමති නිශ්ශංක විජයරත්න මැතිතුමා ද කතා කරයි. ස්තුතිය ආචාර්ය රංජිත් අමරසිංහ මැතිතුමාගෙන්ය. මේ අන්දමට උළෙල සංවිධානය කළෙමු.

උත්සවයට පැය විසිහතරකට කලින් ඇති වූ මේ අර්බුදය කුමක්ද? ආචාර්ය රංජිත් අමරසිංහ මහතා පැමිණෙන තුරු මම නොඉවසිල්ලෙන් මඟ බලා සිටියෙමි.

සවස පහට පමණ සුසිරි මල්ලී ද කැටුව අමරසිංහ මහතා මගේ කාමරයට පිවිසුණේය. ඔහු දැඩි මානසික වේදනාවකින් කතා කළේය. සහජයෙන්ම ළාමක ගති ඇති බුද්ධිමතෙකු වූ අමරසිංහ මහතාට, දේශපාලන කපටිකම්වල රසය එතෙක් දැනී තිබුණේ නැත.

''ආරි බී.එම්.අයි.සී.එච්. එකට ගොස් උත්සවයේ කටයුතු සංවිධානය කරන අතර, ජනාධිපතිතුමාට කතා කිරීමට පණිවුඩයක් ලැබී තිබුණා. ඒ අනුව මා කතා කළා. හෙට තිබෙන උළෙලට ආරියරත්න පැමිණෙන්නේ නම්, ඔහු නොපැමිණෙන බව මට කීවා

ඒ ඇයි දැයි මා විමසූ විට ඔහු කීවේ ආරියරත්න ඔහුටත් අගමැතිටත් ආණ්ඩුවටත් විරුද්ධව කටයුතු කරන නිසා, ඔහු යන උළෙලකට තමා නොයන බවයි. මෙය තමාට මහත් පුදුමයක් බවත් එවැනි දෙයක් ගැන තමා නොදන්නා බවත් කී විට, ජනාධිපතිතුමා කියා ඇත්තේ මෙය ළඟදී ඇති වූ තත්ත්වයක් බවයි. මෙය ආරියරත්නට කියන්න දැයි ඇසූ විට, කියන්න යැයි අනුමැතිය පළ කළා.''

මේ වචන ඇසුණු විට තත්පර කීපයක් මට ද කම්පනයක් ඇති වූ බව සැබෑය. එහෙත් රංජිත් අමරසිංහ මහතා සැනසීම මගේ යුතුකම නිසා මම එය නොපෙන්වීමි.

''මෙය කියල වත් කර ගන්න බැරි වැඩක්''. මට නම් මේ වෙලාවේ ජනාධිපතිතුමා සමඟ එකට වේදිකාවේ නොසිටීම ලොකු සැනසීමක් අපි උත්සවය ඒ විදියට ගෙන යමු. මා එන්නේ නෑ. මා වෙනුවට වෙනත් කෙනෙක් පිළිගැනීමේ කතාවට යොදවමු. ඔබ කලබල වෙන්න එපා. මට මේ වගේ ඒවා හොඳට පුරුදුයි'' මම ප්‍රකාශ කළෙමි.

මේ දෙපළ සමඟ මම මගේ බුදුගෙය ඇතුළට පිවිසියෙමි. අපි වාඩිවී පැය භාගයක් භාවනා කළෙමු. ඉන් පසුව මම මෙසේ පැවැසීමි:

''කෙසේ නමුත් හේතුව දැන ගැනීමට මට අයිතියක් තියෙනවා''.? ඒ නිසා ජනාධිපතිතුමාට ටෙලිපෝන් කර බලමු'' යි මම ටෙලිෆෝනය ළඟට ගියෙමි. රංජිත් අමරසිංහ මහතාට සහ සුසිරි මල්ලීට වාඩි වී, කලබල නොවී, සතුටින් සිටින හැටියට ද ඉල්ලීමි. මට ජනාධිපතිතුමා හමුවීමට අවශ්‍ය වූ විට මා කෙලින්ම එතුමාට ටෙලිෆෝන් කිරීමත් එතුමාට මා හමුවීමට වුවමනා වූ විට එතුමා විසින් මට කෙලින්ම ටෙලිෆෝන් කිරීමත් අපේ සිරිත විය. ලේකම්වරයෙකු මගින් කවදාවත් අපි මුණගැසීම් යොදා ගැනීම නොකෙළෙමු.

* *

1967 සහ 1969 වර්ෂවල පැවැති ශාන්ධි ශත සංවත්සර උත්සවවල, ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා මගේ ආරාධනය පිළිගෙන, සහභාගි වී හොඳ දේශන පැවැත්වීය. එහෙත් ජේ.ආර්.ජයවර්ධන මහතා මා හොඳින් හඳුනා ගත්තේ ඩඞ්ලි සේනානායක රජයේ එතුමා රාජ්‍ය ඇමතිව සිටි කාලයේය. එතුමාගේ ලේකම් බර්ටි විජයගුණවර්ධන මහතා මගේ කිට්ටු මිත්‍රයෙකි. ඔහු ජයවර්ධන මැතිතුමාට මා හඳුන්වා දුන්නේය. ඉන්පසු ඉන්දියාවේ පළ වූ සර්වෝදය පොත් මගේ පුස්තකාලයෙන් ගෙන ගොස්, එතුමාට වරින් වර දීමත් කියවූ පසු ආපසු රැගෙන ඒමත් මගේ සිරිත විය. මේ නිසා එතුමාට මා අමුත්තෙකු නොවීය.

* *

සවස 5.30 සිට රාත්‍රී 8.00 දක්වා වෝඩ් පෙදෙසට ටෙලිෆෝන් කළෙමි. අමරසිංහ මහතා සහ සුසිරි මල්ලී මගේ කාමරයේ රැඳී සිටියහ. අට වරක්ම ජනාධිපතිතුමා ටෙලිෆෝනයට එන බව දන්වා, කවුරුදෝ ආ බව කියා නැවත ටෙලිෆෝන් කිරීමට දැන්වීය. ටෙලිෆෝනයත්, ජනාධිපතිතුමාත් අතර කවුරු හෝ මා හා කතා කිරීම වළක්වන බව අපට පැහැදිලි විය. දෙවරක්ම ජනාධිපති නිවසින් ද කතා කොට, ටික වේලාවකට පසු ඒ පිළිතුරම දීමෙන් මෙය වඩාත් ප්‍රත්‍යක්ෂ විය. අවසානයේදී මා උදේ 7.00 ට ලිපියක් එවන බවත්, එය කියවා උත්තරයක් දෙන ලෙසත් ඉල්ලමින් ටෙලිෆෝන් කතාව නැවැත්වීමි. මා කතා කළ විට, ජනාධිපතිතුමා ටෙලිෆෝනය නොගත් එකම අවස්ථාව මෙය විය.

ඒ කාලයේ අප සමඟ සිටි ආනන්ද චිත්තම්පලම් මහතාට ටෙලිෆෝන් කොට, මා වෙනුවට පිළිගැනීමේ කතාව කරන ලෙස ඉතා අමාරුවෙන් පොළඹවා ගතිමි. මා පසු දා උදෙන්ම දින කිහිපයකට කොළඹින් පිටත යන බවත් කලබල නොවී සතුටින් මේ උළෙලේ කටයුතු කරන ලෙසත් රංජිත් අමරසිංහ මහතාට සහ සුසිරි මල්ලීට දන්වා ඔවුන් සැනසීමි. එහෙත් මෙවැනි පහත් ක්‍රියාවක් රාජ්‍ය නායකයකු විසින් කිරීම අමරසිංහ මහතා වැනි උගත්

මිනිසෙකුට තේරුම් ගත නොහැකි විය. ඔහුගේ මළානික මුහුණ වෙනස් වූයේ නැත. රාත්‍රී 9.00 ට පමණ බලෙන්ම වාගේ ඔවුන් ගෙදර යැවීමි.

මගේ කනිටු පුත් ජීවන් ධම්මික අත ජනාධිපතිතුමාගේ වෝඩ් පෙදෙසේ නිවසට උදේ හත වන විට ලියමන යැවීමි. රංජිත් අමරසිංහ මහතා අත උත්සවයට සහභාගි නොවීමට මට කරන ලද දැන්වීම අනුව, මම සහභාගි නොවන බවත් ඉතා මහන්සියෙන් සම්පූර්ණ කළ මේ කටයුත්තට සහභාගි වී උත්සවය සාර්ථක කිරීමට උදව් වන ලෙසත් එතුමාට දැන්වීමි. තවද මම සහභාගි වනවාට එතුමා විරුද්ධවීමට හේතු වූ කරුණු, අප දෙදෙනාගේ අන්‍යොන්‍ය තේරුම් ගැනීම උදෙසා දැන ගැනීමට කැමති නිසා, ඉක්මනින් සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙන ලෙසත් මම ඉල්ලීමි.

මම මේ පියවර නොගන්නට ජනාධිපතිවරයා මේ උත්සවයට නොපැමිණෙන්නට ඉඩ තිබුණි එසේ වූයේ නම් ආත්ම ගෞරවයක් තිබෙන සෘජු පුද්ගලයින් හැටියට නිශ්ශංක විජයරත්න මහතා අධිකරණ ඇමති පදවියෙනුත් රංජිත් අමරසිංහ මහතා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධූරයෙනුත් ස්ථිර වශයෙන්ම ඉල්ලා අස්වීමට ඉඩ තිබුණි. මේ නිසා මගේ මමත්වයට වදින පහර ඉවසා ගෙන මම උත්සවයට නොයෑමට තීරණය කළෙමි. හිරු නැඟ එන්ට පෙර මම අනුරාධපුරය බලා පිටත් වීමි. හමන්ගොඩ ආරියවංශ හිමියන්ගේ ආරාමයට ගොස් බුදුන් වැඳ භාවනා කළෙමි. ශ්‍රී මහා බෝධිය රුවන්වැලිසෑය සහ මිහින්තලේ ගොස් වැඳපුදා ගෙන, ඒ තැන්වලද භාවනා කළෙමි. තුන්වැනිදා රාත්‍රී මම ආපසු ගෙදර ආවෙමි.

ශ්‍රී ලංකාවේ සුප්‍රීම් උසාවිය නැමති මාහැඟි ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවයේ කටයුතු හොඳින් සිදුවී තිබිණි. නීති සහ අධිකරණ අංශයේ එතරම් සම්භාවනීය පිරිසක් එතෙක් එකට එකතු වී නැත. ඒ සෑම දෙනෙකුම මාගේ නොසිටීම පිළිබඳ විපරම් කර තිබේ. සත්‍යය දැනගත් විට මා පිළිබඳ ඔවුන් තුළ තිබූ ගෞරවය වැඩි

වී තිබෙනවා මිස, අඩු වී නැත. සර්වෝදය විසින් සංවිධානය කළ උත්සවයකට මගේ පැමිණීම තහනම් කොට, ජනාධිපතිවරයා පැමිණීම කෙතරම් දුරට සදාචාර ක්‍රියාවක් දැයි නිගමනය කිරීමට තරම් බුද්ධිමත් පිරිසක් එම රැස්වීමේ සිටියහ.

ගින්දර සමඟ සෙල්ලම් කිරීම:

හතරවැනි දා මට ජනාධිපති උප ලේකම්ගෙන් ලිපියක් ලැබිණි. 14 වැනිදා දවල් 12.00ට ජනාධිපති කාර්යාලයේදී ජනාධිපතිතුමා බැහැ දැකීමට මට ඉඩ සලසා තිබෙන බව එහි සඳහන් විය.

1986 දෙසැම්බර් 10 සහ 1987 සැප්තැම්බර් 10 වනදා අතර හැම සතියකට දෙකකට වරක් මම ජනාධිපතිතුමාට ටෙලිෆෝන් කොට, සාමය හෝ වෙනත් සාකච්ඡා පිළිබඳව පැය ගණන් කතා කළෙමි. කවදාවත් ලිපියකින් ලේකම්වරයකුගේ මාර්ගයෙන් අප මුණගැසුණේ නැත. ටෙලිෆෝන් කළ වහාම මා කැඳවීම, එතුමාගේ සිරිත විය. මා යූ. ඇන්. පීකාරයෙක්. හෝ එතුමාට පුදන කෙනෙක් හෝ නොවන බව ඔහු දනී. එහෙත් මගෙන් කෙරෙන අපක්ෂපාතී සේවය ඔහු අගය කළේය.

බැංගලෝර්වල සාම සාකච්ඡාවට යෑමට පෙර එතුමා මා කැඳවූ හැටි මට මතකය. තමාගේ කතාව කෙසේ කළ යුතු දැයි ඔහු මගෙන් විමසීය.

''මහත්මා ගාන්ධිතුමා නේරුතුමා ආදී ඉන්දීය නායකයන් සමඟ ඔබ නිදහස් සටනට සහභාගි වූ අන්දම මතක් කරමින් කතා කරන්න. ඔබේ ඉතිහාසය ගැන දැනීමෙන් සම්පූර්ණ ප්‍රයෝජනය ගන්න'' කට පුරාම සිනාසුණු එතුමා, දැන් මා දන්නවා යැයි කියමින් මට ස්තුති කළේය. එහිදී එතුමා කළ කතාවෙන්, අගමැති රජීව් ගාන්ධිතුමා වශී වුණු බව පසුව මම දැන ගතිමි.

* *

ජූලි 01 දාට පෙර සති දෙක තුනකට උඩදී රජය මා ගැන සොයන බවට සාධක කිහිපයක් මට දැන ගන්නට ලැබිණි. මගේ මිත්‍ර ආචාර්ය රාසපුත්‍රම් බැංකොක්වලදී මගේ මිතුරෙකුට පවසා තිබෙන කරුණක් අනුව, සර්වෝදය විසින් මාරු කරන රුපියල් දස දහසකට වැඩි සෑම චෙක්පතක්ම පිළිබඳ කරුණු ජනාධිපති කාර්යාලයට රහසිගතව දැන්වීමට නියෝග කර තිබෙන බව දැන ගතිමි. මෙය පසුගිය අප්‍රේල් මාසයේ සිටය. මා හිර බාරයට ගැනීමට ඉඩ තිබෙන බවත් ඒ ගැන අවශ්‍ය කරුණු දැන් එකතු කරගෙන යන බවත්, පොලීසියේ ඉහළ තැනකින් ජූනි මාසයේදී මම දැන ගතිමි.

තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ සාකච්ඡාවකදී, ගම්උදාවට යෑම මා ප්‍රතික්ෂේප කළ නිසා අගමැති ආර්. ප්‍රේමදාස මහතා විසින් මා දණ ගස්සවන බවට ප්‍රකාශයක් කර තිබෙන බවත් මට ආරංචි විය. අපේ කැම්බල් පෙදෙසේ ඉඩමෙන් බාගයක් අගමැතිවරයාගේ නියෝගය පරිදි කටුකම්බි ගස්වා, වෙස්ලි විද්‍යාලයට ලබා දී තිබේ.

මේ අතර මට වෙඩි තබා මරා දමා ඇති බවට නුවර ප්‍රදේශයේ කට කතාවක් පැතිර ගියේය. මෙයින් ද හොඳක් සිදු විය. ස්විට්සර්ලන්ත ජාතික සුමේධ හිමියන් තදබල පිළිකා රෝගයකින් පෙළෙමින් සිටියේය. උන්වහන්සේ වාරු කර ගෙන නුවර වෛද්‍යවරයකුගේ කාමරයට පිවිසෙනවා සමඟම, කවුරු හෝ මගින් මේ වැරදි ආරංචිය උන්වහන්සේගේ කනට වැටී තිබේ. ඒ මොහොතේම වාරු කර ගෙන පැමිණි දෙදෙනා ඉවතට තල්ලු කොට, සුමේධ හාමුදුරුවෝ මෙසේ පවසා තිබේ.

''මගේ ගුරුවර ඥාණසීහ හාමුදුරුවන්ගෙන් පසු, ඕනෑම දේකට මා ගියේ ආරියරත්න මහතා ළඟටයි . එතුමා මැරුණ පසු මා වගේ කෙනෙක් මැරුණාට කමක් නැහැ'' මෙසේ පැවැසූ සුමේධ හාමුදුරුවෝ වෛද්‍යවරයා හමු නොවී කෙලින්ම කටුගස්තොට පිහිටි උන්වහන්සේගේ ගල්ලෙනට සාමාන්‍ය පරිදි වැඩම කොට ඇත. මේ සියල්ල මා දැන ගත්තේ ජූනි මාසය තුළදීය.

කෙසේ නමුත් මට විරුද්ධව ලොකු කුමන්ත්‍රණයක් රජය විසින් කරන බවට මට සැකයක් ඇති වී තිබිණි.

ජූලි 01 වනදා කමල් වලේබොඩ මල්ලීගේ විවාහ උළෙලේදී, අගමැතිතුමා හමුවිය. ඔහු සමඟ සාක්ෂිකරුවෙක් වශයෙන් මම ද අත්සන් තැබීමි. නැවත ග්‍රාමෝදය මණ්ඩල භාරකාර රැස්වීමේදී ද හමුවීමි අරලියගහ මැඳුරේදී ඒ සතියේ දෙවරක්ම රාත්‍රී ඔහු සමඟ ඔහුගේ උවමනාවක් සඳහා පැය කිහිපයක් ගත කළෙමි. මේ නිසා අගමැතිවරයා මා සමඟ අමනාපයක් ඇතැයි මම නොසිතමි. කෙසේ වුවද දේශපාලකයන්ගේ චර්යාවන් පුදුම සහගතය දේශපාලනයේ රසය අප වැන්නවුනට හරිහැටි හඳුනා ගත නොහැකිය.

ජූලි 14 වැනිදා මද්දහනේ මම ජනාධිපති කාර්යාලයට ගියෙමි. හරියට දවල් 12.04 ට මා ජනාධිපතිතුමා ඉදිරියට කැඳවන ලදී. ජනාධිපතිතුමා ඔහුගේ මේසයේ අසුනේ වාඩි වී සිටි අතර මේසය ඉදිරිපස අසුනේ ජනාධිපති ලේකම් මැණික්දිවෙල මහතා ද වාඩිවී සිටියේය. ඔහු එතැන සිටීම එතරම් සුබ ලකුණක් නොවන බව මම දැන ගතිමි. 1983 දෙසැම්බර් 02 වැනිදා වෝඩ් පෙදෙසේ ඔහු සිටියේ මගේ සාම පා ගමන කඩාකප්පල් කිරීමටය. 1983 දෙසැම්බර් 06 වැනිදා කතරගම කිරිවෙහෙර සාම උළෙලට ජනාධිපතිවරයා ඒම වැළැක්වූයේත් ඔහුය. දැන් ඔහු මෙහි සිටීම මට ඒ නිසා එතරම් සුබ ලකුණක් නම් නොවීය.

''මොකද මේ ආරියරත්න?'' ජනාධිපතිතුමා කතා කළේය.

''ඒක තමයි මමත් දැන ගන්න ආවේ? මොකද ඔබතුමා මට අපහාස කළේ? වේදනා දුන්නේ?'' මම ප්‍රශ්නයක් නඟමින් ඇසුවෙමි.

''ඔබ මටත් අගමැතිතුමාටත් රජයටත් විරුද්ධව කටයුතු කරන බවට අපට දැන ගන්නට ලැබී තිබෙනවා?''

''එසේ නම් ඇයි මට කතා කරලා ඇහුවේ නැත්තේ? අපහාස නොකර වේදනා නොදී?''

''මා හුඟ කලක් තිස්සේ ඔබට පණිවුඩ එව්වා. ඔබ මඟ අරිනවා''

''මේක මහා පුදුමයක්, කා අතද මට පණිවුඩ එව්වේ? වෙනදා වගේ ඔබතුමා මට ටෙලිෆෝන් නොකළේ ඇයි? කොහොමද මට පණිවුඩ එව්වේ''

ජනාධිපතිතුමා මැණික්දිවෙල මහතා දෙස බැලීය. ඔහු බිම බලාගෙන උත්තර දුන්නේය. ''ඇයි මම කී සැරයක් ටෙලිෆෝන් කළාද? ඒ එකකටවත් ඔබ ආපසු කතා කළේ නෑ''මේ පුද්ගලයා බොරු කියන බවට මට සැකයක් නැත. මම උස් හඬින් කතා කළෙමි.

''මැණික්දිවෙල මහත්මයා මගේ ඇස් දෙක දිහා කෙලින් බලන්න. මට ලෝකේ බොහෝ රටවලින් දිනපතා දුරකතන පණිවුඩ එනවා. ඒ සියල්ල මට ලැබෙනවා. ඔබට මට කතා කරන්න බැරි වුණු එක පුදුමයක්. බලන්න මා දිහා මා දිහා බලා ගෙන කතා කරන්න. ජනාධිපතිතුමා බලන්න, මේ මිනිසා මහ බොරුකාරයෙක්. තමුසේ 1983 දී අපේ සාම ගමන කඩාකප්පල් කළා''

''නැහැ නැහැ''

''නැහැ නැහැ තමුසේ ජනාධිපතිතුමාගේ ඒම නැවැත්වූවා. මම භාවනාව මෙහෙය වන විට තමුසේ ඇවිල්ලා එය නවත්වා, තමුසෙ හා කතා කරන්න කීවා. මා එය ප්‍රතික්ෂේප කළාම තමුසෙ ගිහිල්ලා ජනාධිපතිතුමාව විස කළා. තමුසෙලා තමයි මේ මනුෂ්‍යයාත්, රටත් වැනසුවේ''

''අපි රට වැනසුවා පේන්නෙ නැද්ද රටේ දියුණුව''

''බලාගන්න එනවා මා සමඟ ආරක්ෂක භටයෝ නැතිව පිටකොටුවට ගිහින් එන්න. තමුසෙ පණ පිටින් ආවොත් අන්න රට

දියුණුයි'' මම මේ සෙල්ලම් කරන්නේ ගින්දර සමඟ බව දැන ගෙන සිටියෙමි. එහෙත් ජනාධිපතිතුමා යමක් කියන්න හැදූමුත්, මා එයට ඉඩ නොදී කෙලින්ම කතා කර ගෙන ගියෙමි.

''ජනාධිපතිතුමනි මේ මිනිහා බොරුකාරයෙක්. මට පණිවුඩ එව්වෙ වත් කතා කළේ වත් නැහැ.මොරටුව පොලීසියට පණිවුඩයක් යැව්වා නම්, මම පැය බාගෙන් එනවා. මගෙන් කරුණු නොවිමසා ඔබතුමා මට වේදනා දී අපහාස කළ එක ගැන මට බොහොම කනගාටුයි. එය වැරදි වැඩක්. පසුගිය දිනවල මා වටේ සී.අයි.ඩී. එක දැම්මා ටෙලිෆෝනය ටැප් කළා. මම අගමැතිට විරුද්ධ නම් පසුගිය සතියේ හතර වරක් මම ඔහු මුණගැසුණේ කොහොමද? ඔහුට කියන්ට ඉඩ තිබුණා, ඊයේ රෑ 9.00 සිට 11.30 වනතුරු මා සිටියේ අගමැතිගේ වුවමනාවකට අරලියගහ මැඳුරේ මම ඔහුට විරුද්ධ නම් ඒ බව ඔහුට තිබුණා මට කියන්න''

රාවයේ තුරුම්පුව:

දැන් මැණික්දිවෙල මහතා හොර බලළෙක් වගේ ලිපි ගොනුවක් දිග හරියි 'රාවය' සඟරාවක් ද එළියට ගනියි 1987 දෙසැම්බර් රාවය කලාපය බව මම දනිමි. ඔහු දැන් තුරුම්පුව එළියට ගනියි. කතා කරන්න හදයි මම දිගටම කතා කර ගෙන ගියෙමි.

''ඔබ මගේ සිතට වේදනා දි අපහාස කළා වැරදියි. මැණික්දිවෙල මහත්මයා කියවන්න ඔය සී.අයි.ඩී වාර්තාව මම මොකද කරලා තියෙන්නේ. සල්ලි වංචා කරල තියෙනවද? පිටරට කොමිස් ගහල තියෙනවද? මොකක්ද මම කර තියෙන්නේ ඔව් මම ගම්උදාවට ගියේ නැහැ. එය මගේ තීරණයක්. එයට මට අයිතියක් තියෙනවා යන්න හෝ නොයන්න''

මැණික්දිවෙල 'රාවය' පෙරළයි

''බලන්න මේ පින්තූරය රාවයේ පළවුණු ජනාධිපතිතුමාගේ පින්තූරය යකෙක් වගේ මගේ ජනාධිපතිතුමා මා විසින් ආරක්ෂා කර ගන්න ඕනෑ''

''ජනාධිපතිතුමා තමුසෙගෙ විතරක් නොවේ, රටේ කාගේත්. මටත් ඕනෑ එතුමා රැක ගන්න''. තමුසෙලා වගේ මිනිසුන්ගෙන් කියන්න ජනාධිපතිතුමා තමුන්නාන්සෙගෙන් මට හෝ සර්වෝදයට මම ඉල්ලල තියෙන්නේ මොනවද?''

''ආරියරත්නට ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක කරදර කරන විට, අපි ඔබව ආරක්ෂා කළා අපි ඉඩම් දුන්නා''

''ජනාධිපතිතුමනි මේ ආණ්ඩුව තරම් ෆීලික්ස් අපට ගැහුවේ. නැහැ. අපහාස කළේ නැහැ. කෙලින් පහර දුන්නා. අපි ප්‍රති ප්‍රහාර දුන්නා. මැතිනිය මැදිහත් වෙලා සාමය ඇති කළා''

ජනාධිපතිතුමා මේසයේ ඉදිරියට නැමුණේය. ඔහුගේ දිවග තොල් වටා රවුමක් ගියේය. හෙමිහිට තර්ජනාත්මක ස්වරයෙන් කතා කළේය. 'ආරියරත්න ඔබ මතක තබා ගන්න ඕනෑ අපේ පක්ෂය ඉතා ප්‍රබල බව. තවම මේ රටේ තිබෙන ඉතා හොඳින් සංවිධානය වූ පක්ෂය අපි බලවත් හොඳින් සන්නාහ සන්නද්ධයි. ඉතාම නවීන ආයුධ අපට තිබෙනවා'

''කාටද සර් රජයටද? පක්ෂයටද?''

''නෑ නෑ අපේ පක්ෂයට. අපේ අය හැදුවා රාවය විනාශ කරන්න. සර්වෝදය මුද්‍රණාලය විනාශ කරන්න ගිනි තියන්න. සර්වෝදයට අපේ තියෙන විශ්වාසය නිසා මම ඊට ඉඩ දුන්නේ නැහැ. අපට ඕනෑ නෑ සර්වෝදය එක්ක හබයක් ඇති කර ගන්න. මා දන්නවා සර්වෝදය කරන හොඳ සේවය රට රටවල්වල සර්වෝදයට තිබෙන ගෞරවය අපට ඒවා නැති කරන්න ඕනෑ. නෑ මේ රාවය නවත්වන්න''

මේ අතර මැණික්දිවෙල මහතා රාවය කතුවැකිය කියවයි. තැනින් තැන පිටු හරවා කියවයි මම ඔහු නැවැත්වීමි.

''මැණික්දිවෙල මහත්මයා ඕක ඔහේටවත් ජනාධිපතිතුමාටවත් තේරෙන්නේ නෑ. පක්ෂයේ උගතුන් ලවා කියවන්න. එවිට තේරෙයි. ඕකෙන් කියන්නේ කැලෑවල සිට ආණ්ඩු පෙරළන්නේ නැතිව විවෘතව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට එන්න කියා. කෙසේ නමුත් ඇයි රාවය කර්තෘට එන්න කියා ඕක බේරුම් කර ගන්නේ නැත්තේ? මම රාවය පටන් ගන්න උදව් කළ බව ඇත්ත එහෙත් එය සර්වෝදය ප්‍රකාශනයක් නොවෙයි. ඔබට පුළුවන් පුවත්පත් මණ්ඩලයට, උසාවියට එය ගෙනයන්න ඒක නේද ප්‍රජාතන්ත්‍රවාදී නීත්‍යානුකූල ක්‍රමය?''

මැණික්දිවෙල මහතා තර්ජනාත්මකව යමක් කියයි. මම උත්තර දුනිමි.

''මැණික්දිවෙල මහතාණෙනි, මට තර්ජනය කරන්ට එපා. ඒවාට මා බයවෙන කාලය පහුවෙලා. ඔබ මා හිරබාරයට ගන්න. තාඩන පීඩන කරන්න මරා දමන්න. අද මෙය අපේ සහෝදර ජනතාවට ඔබතුමන්ලා කරනවා. එහෙත් මගේ සාරධර්ම බිඳ දමන්න ඔබට බෑ. මගේ ව්‍යාපාරය දස ලක්ෂ ගණන් හදවත්වලට ඇතුළු වෙලා ඉවරයි. සමහර විට මගේ මළකඳ මගේ ජීවමාන සිරුරට වඩා මේ රටේ ජනතාවට සේවය කරාවි. අසත්‍යයට - හිංසාවට - අවනීතියට - හැමදාම තැනක් නැහැ. මා හදන්නේ ආණ්ඩු හදන්න හෝ කඩන්න නොවෙයි. තියෙන සමාජය වෙනස් කරන්න. අහිංසාවාදී නිර්මාණාත්මක මාර්ගවලින් වෙනස් කරන්න. මෙය ඔබට නොතේරෙන එක ගැන මම පුදුම වෙන්නේ නෑ''

මැණික්දිවෙල මහතා නිශ්ශබ්ද වෙයි පුටුවෙන් නැගිටියි. ඊළඟ මේසය ළඟට ගොස් ලිපිගොනු වගයක් අවුස්සයි ලිපිගොනුවක් සොයනවාට වඩා, මානසික වේගයක් මැණික්දිවෙල මහතා සන්සිඳවා ගන්නා බව මට තේරුණේය. මම ජනාධිපතිතුමා දෙසට හැරුණෙමි. ඔහු දැන් මට වෙනදා කතා කරන පීතෘ ස්වරූපයෙන් පහත් හඬින් කතා කිරීමට පටන් ගනියි.

''ඔබ දන්නවා මා ඔබට ප්‍රිය කරන බව මා සිතා සිටින්නේ ඔබ මගේ මිත්‍රයෙක් කියා''

''මමත් එහෙමයි සර්. ඇයි මිත්‍රයන්ට වේදනා අපහාස දෙන්නේ?''

''නෑ නෑ සර්වෝදය හෝ ඔබ සමඟ මගේ අමනාපයක් නෑ ප්‍රශ්නය මේ රාවය තමයි. මේක නවත්වල දාන්න එය නවත්වන්න මට පුලුවනි. මම ඒක බලාගන්නම් ඔබ කියනවා නම්, සර්වෝදය එක්ක හැප්පෙන්න මට ඕනෑ නෑ'' නැවතත් ජනාධිපතිතුමා තර්ජනාත්මක හඬින් පැවසීය.

මම ඉවසීමෙන් රාවය ගැනත් වික්ටර් අයිවන් ගැනත් කරුණු කීවෙමි. මම දූන් ගිය ගමන් ඔහු හා කතා කරන බවත් කීවෙමි. හදිසි වී, ත්‍රස්තවාදී ලෙස ක්‍රියා කිරීමෙන් වළකින ලෙස ඉල්ලීමි. රාජ්‍ය ත්‍රස්තවාදය ගැන මිනිසුන් දූන් දන්නා නිසා, මෙහි කෙළවරක් දැකීමට අපහසු බව අවබෝධ කරවීමි. කෙලින්ම ජනාධිපතිතුමා හා රජය විවේචනය කිරීමෙන් වළකින ලෙස වික්ටර්ට අවවාද කරන බව කීවෙමි. හැකි තරම් ඉක්මනට වික්ටර් අයිවන් මල්ලීට සම්මුඛ සාකච්ඡාවක් දෙන ලෙස ඉල්ලීමි. මුලින් එය ප්‍රතික්ෂේප කළත්, පසුව විරුද්ධත්වයක් නොමැති බව මටම හැඟී ගියේය. කෙසේ හෝ මේ කඩුල්ලෙනුත් පැන්න බව මට අවබෝධ විය. ප්‍රශ්නය තාවකාලිකව හෝ විසඳුන බව මැණික්දිවෙල මහතාගේ නිශ්ශබ්දතාවයෙන් අවබෝධ කර ගතිමි.

අපට තිබෙන්නේ භාවනා කරන එක විතරයි:

''සර් අපි වගේ අයට තියෙන්නේ භාවනා කරන එක විතරයි. වෙන පිහිටක් පේන්නේ නෑ ඔබතුමා භාවනා කරනවාද?''

''නැහැ මට වෙලාවක් නැහැ''

''වෙලාව හොයාගන්ට ඕනෑ. භාවනා නොකරන රාජ්‍ය නායකයන්ට තමයි මේ ඔක්කොම ප්‍රශ්න එන්නේ. ඔබගේ පුතා රවී හොඳ භාවනා ගුරුවරයෙක්. ඇයි ඔහුගෙන් භාවනාව ටිකක් ඉගෙන ගන්නෙ නැත්තෙ? අනිත් අතින් ඔබතුමා දැන් අසූව පැන්න කෙනෙක්''

දැන් මැණික්දිවෙල ඊළඟ දිග මේසයේ වාඩිවී බොරුවට ලිපිගොනු හරවයි. මම ඒ දෙසට හැරුණෙමි.

''මැණික්දිවෙල මහත්මයා ඔබටත් හොඳයි නේද ටිකක් භාවනා කළොත්?''

ජනාධිපතිතුමා පළමුවරට සිනාසුණේය. මැණික් ද අවඥාසහගත සිනා රැල්ලක් මුහුණට නංවා ගත්තේය.

''මට ඕවාට වෙලා නෑ''

''එහෙම කියන්න එපා අපේ රටේ කවුරු භාවනා නොකළත්, ජනාධිපතිතුමා ළඟ ඉන්න ඔබ වැනි අය භාවනා කිරීම අවශ්‍යයි''

එවිට මැණික්දිවෙල මහතාට ද හිනා ගියේය. අපේ සුහදත්වයට අපේ බහින්බස් වීමෙන් හානියක් නොවුණු බව මට වැටහිණි.

ජනාධිපතිතුමා පුටුවෙන් නැගිට්ටේය. මම ද නැගිටීමි.

''තෙරුවන් සරණයි! මම ගිහිල්ල එන්නම් ජනාධිපතිතුමනි මීට පසු මොනවත් තියෙනවා නම් මට කෙලින්ම කෝල් කරන්න''

''මැණික්දිවෙල මහත්මයා මම ගිහින් එන්නම්. භාවනා කරන්න පුරුදු වෙන්න හොඳද?'' ඔහුගේ පිටට තට්ටු කොට මම සුහද ලීලාවෙන් කාමරයෙන් පිට වීමි.

කාමරයේ එළියේ විස්සක් විතර එක පේළියට ආරක්ෂක භටයෝ සිවිල් ඇඳුමෙන් සිටියහ. මා ඉතා හයියෙන් කතා කළ නිසා, සමහර දේවල් ඔවුන්ට ද ඇසෙන්නට ඇත. එයින් එක් අයෙක් මා විදුලි සෝපානය වෙත කැඳවා ගෙන ගොස් පහළට රැගෙන ගියේය. මා එනතුරු නොඉවසිල්ලෙන් මගේ රියේ සිටි දෙවැනි පුතා ජීවන්ට සියල්ල හරි බව ඇසෙන් කියමින්, දවල් 12.45 ට මම රියට නැගුණෙමි.

මේ සිද්ධියටම සම්බන්ධ තවත් කරුණු කිහිපයක් පසුව මම දැන ගතිමි. ජූලි 02 වනදා එනම් උත්සවය පැවැති දිනයෙහි උදේ 10.30 ට පමණ රංජිත් අමරසිංහ මහතා සහ අධිකරණ ඇමති නිශ්ශංක විජයරත්න මහතා ජනාධිපතිතුමා විසින් වෝඩ් පෙදෙසේ නිවසට කැඳවා තිබේ. එහිදී ද එතුමා ප්‍රකාශ කර තිබෙන්නේ මා එතුමාටත්, රජයටත්, අගමැතිතුමාටත් විරුද්ධව කටයුතු කරන බවයි. උත්සවයේදී මා එතුමාට 'බැන්නහොත්' එතුමා මටත් බණින බවත්ය. එවිට නිශ්ශංක විජයරත්න මහතා කියා ඇත්තේ මේ මොකක්ද සර් අපි හිතා ගෙන හිටියේ ආරි හා සර් අඹයාළුවෝ බවත්, මෙය වැරදි අවබෝධයක් බවත්ය. තවදුරටත් නිශ්ශංක විජයරත්න මහතා මා ගැන හුඟක් හොඳ කියා තිබේ. මේ අතර අමරසිංහ මහතා මා උත්සවයට නොපැමිණෙන බවත්, ඒ බව දන්වා අද උදේ 7.00 ට ලිපියක් එවා ඇති බවත් සඳහන් කර තිබේ.

කෙසේ නමුත් ඒ වේලාව වන තුරු ලිපිය එතුමා අතට දී නැත. එය කොහේදැයි සොයන විටයි ලේකම්වරයා විසින් ලිපිය ගෙනැවිත් දී ඇත්තේ ඒ ලිපිය නිශ්ශබ්දව කියවූ ජනාධිපතිවරයා, නැවත හඬ නගා එය කියවා තිබේ 'ඉතා හොඳින් ලියන ලද ලිපියක්' යයි අමරසිංහ මහතා දෙස බලා ඊළඟට පවසා ඇත මා කොළඹින් පිටතට ගොස් ඇති බවත් තවදුරටත් ආචාර්ය අමරසිංහ මහතා පවසා ඇත.

සමහර විට ජනාධිපතිතුමාට අවශ්‍යව තිබෙන්නට ඇත්තේ උත්සවයට මගේ නොපැමිණීම නොව, ඔහුගේ අමනාපය හෝ උදහස මට පළ කිරීමටයි. එහෙත් දැන් ප්‍රමාද වූවා වැඩියි.

පැය බාගයකට පැමිණි එතුමා, පැය එකහමාරක් පමණ උත්සවයේ හා සාදයේ ගත කොට තිබේ. කාරෙකට නගින විට ''මා ආරියරත්න කැඳවන්නම්'' කියා පවසා තිබේ. සමහර විට තමා කළේ වරදක් බව අවබෝධ වන්නට ඇත.

මේ සිද්ධිය පිළිබඳව මා කිසිදු ප්‍රවෘත්ති ලේඛකයෙක් සමඟ කතා කළේ නැත. ඊට පෙර සතියේ සෑම පුවත්පතකින්ම කතා කොට ''මා ජනාධිපති තරඟයට එනවා දැයි'' විමසීය මෙයින් පුදුමයට පත් මම, එවැනි අදහසක් එතෙක් මා තුළ ඇති වී නැති බව පැවැසුවෙමි. එහෙත් පිටු බාගයක පමණ 'දවස' දේශපාලන විග්‍රහයේ ජනාධිපතිතුමාගේ හා මගේ පින්තූරය ද සහිතව ලිපියක් පළ විය. මේ සිද්ධිය ගැන හොඳුවාව දැන ගෙන තිබෙන ඒ අය, ඉතා ශූරව එය විග්‍රහ කොට තිබිණ. කියවන අයට මා කෙරෙහි අනුකම්පාවක් හා ප්‍රසාදයක් මිස අමනාපයක් ඇති වීමට ඒ ලිපියෙන් ඉඩක් නොතිබිණි.

ගල්ෆ් නිවුස් පුවත්පතේ ද සිංහ රත්නතුංගයන්ගේ නමින් දිග වාර්තා දෙකක් පළ වුණි. මේ අතර දවස වාර්තාවෙන් කරුණු ගෙන, ඒවා විකෘති කොට 'ඇත්ත' පත්‍රයේ ප්‍රධාන ප්‍රවෘත්තිය හැටියට මගේ නම හෝ සර්වෝදයේ නම සඳහන් නොකොට ඉතා පහත් අසත්‍ය කරුණු අඩංගු ප්‍රවෘත්ති වාර්තාවක් පළ කොට තිබිණි. පුවත් කලාව වෛශ්‍ය වෘත්තියකට කලක් පරිවර්තනය කර ගෙන තිබූ 'ඇත්ත' පත්‍රය, රජයට විශාල මුක්කුවක් ඒ ප්‍රවෘත්තියෙන් ගසා තිබිණි. ඔවුන්ගේ මානසික විකෘති වූවන් එය විශ්වාස කළාට, කිසි දා පොදු බුද්ධිමත් අයෙක් ඔවුන්ගේ වාර්තාව විශ්වාස කළේ නැත. පසුගිය රජය කාලයේත්, ඇත්ත හැසුරුණේ මේ අන්දමටම ප්‍රතිගාමීත්වයට මුක්කු ගසමිනි. දැනට අවුරුදු 15 කට පමණ පෙර ලන්ඩනයේදී මට මුණගැසුනු අමෙරිකන් තානාපති කාර්යාලයේ කලින් සේවය කළ

ලේකම්වරයෙක් මට කී කතාවක් මෙහිදී මතක් විය. ඔය පක්ෂයේ සිටින අයගේ සමාජවාදය ගැන අප දන්නවා. ඔවුන්ගේ මධ්‍යම කාරක සභාවේ දොළහක් පමණ ඉන්නේ සී.අයි.ඒ. මුදල් ලබන අය. ඒ නිසයි ඔවුන් ඔබ වැනි අයට චෝදනා කොට, ඔවුන්ගේ හෙළුව වසා ගන්න හදන්නේ. මෙය වසා ගැනීමට දෝ ඊට දෙදිනකට පසු මා නැදලගමුවේ ජිනානන්ද හිමියන්ගේ ආදාහනෝත්සවයේදී කළ කතාවට මොවුන් ලොකු තැනක් දී ඇත්ත පත්‍රයේ පළ කොට තිබිණි.

මෙහිදී මට වැදගත් වන්නේ සිද්ධීන් හෝ පුද්ගලයන් හෝ නොවේ. මේවා හා මොවුන් පිටුපස තිබෙන චින්තනයයි. අපේ රටත්, ජාතියත්, ආගමත් වැනැසී අප ශිෂ්ටත්වයෙන් දිනෙන් දින ඈත් වී පිරිහෙන්නේ, මොවුනගේ චින්තනයේ තිබෙන දෝෂය නිසයි. ඒ නිසා මේ පුද්ගලයන් ගැන හෝ සිද්ධීන් ගැන හෝ කලබල නොවී, සාමාන්‍ය ජනතාවට ඇත්ත ඇති සැටියෙන් කියා දිය යුතුය. මේ නිසා මම සති තුනක් වෙහෙසී, 'බල පිරමීඩය සහ ධර්ම චක්‍රය' නැමැති පොත ලියා විශ්ව ලේඛා ආයතනයට පළ කරන ලෙස දන්වා පිටරට ගියෙමි. එහි ඉංගිරිසි පරිවර්තනය කිරීම සඳහා ඞී.බී.අයි.පී.එස් සිරිවර්ධන මහතාට පැවැරුවෙමි.

මේ අතර මගේ කිසිදු බලපෑමක් නොමැතිව, මගේත්-සර්වෝදයේත් සම්පූර්ණ අනුග්‍රහය සහ ආධාරය යටතේ ආරම්භ කළ රාවය සංවාදශීලී සඟරාව මෙම මෙහෙය ඉටු කරනු ඇතැයි ද මම බලාපොරොත්තු වීමි.

ජනතාවට සේවය කිරීමේ අභිලාෂය සහ ආත්මාර්ථය

ජනාධිපතිවරණය : 1988

ජනාධිපති මැතිවරණයට නාමයෝජනා දීමේ දිනය ළං වත්ම ප්‍රේමදාස මහතා දෙතුන් වරක් එතුමාගේ වුවමනාවෙන්ම, මා මුණගැසිනි. නාමයෝජනා පිළිබඳව ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා දක්වන ආකල්පය කුමක් දැයි දැන ගැනීමටත්, තමා වෙනුවෙන් එතුමා සමඟ කතා කිරීමටත් ප්‍රේමදාස මහතා මගෙන් ඉල්ලා සිටියේය. මා එක්සත් ජාතික පාක්ෂිකයකු හෝ වෙනත් පාක්ෂිකයකු හෝ නොවූවත්, ජනාධිපතිතුමා මට සැලකිල්ලක් දක්වන බව ප්‍රේමදාස මහතා හොඳින් දැන සිටියේය. මගේ ළඟ හිතවතුන් වූ ගාමිණී දිසානායක මහතා සහ ලලිත් ඇතුලත්මුදලි මහතා සමඟ ද ඒ සම්බන්ධයෙන් කතා කරන ලෙස ඉල්ලීමක් ද කළේය. ජනාධිපතිතුමා සමඟත්, ගාමිණී දිසානායක මහතා සමඟත් මම මේ පිළිබඳව කතා කළෙමි. එහෙත් ලලිත් ඇතුලත්මුදලි මහතා සමඟ කතා කිරීමට මට අවස්ථාවක් නොලැබිණි.

නාමයෝජනා පිළිබඳව ස්ථිර නිගමනයක් ජනාධිපතිතුමා විසින් ගෙන ඇති බව මට හැඟී ගියෙන්, මට මතක හැටියට එක් සිකුරාදා දිනක උදේ අගමැති ප්‍රේමදාස මහතාට දුරකතනයෙන් කතා කොට, එතුමාට ස්ථිරවම ජනාධිපතිවරණයට එක්සත් ජාතික පක්ෂයේ නාමයෝජනා ලැබෙන බව මම දැනුම් දුන්නෙමි. එදා රාත්‍රියේ ප්‍රේමදාස මහතා මට දුරකතනයෙන් කතා කොට නාමයෝජනා පත්‍ර ලැබුණු බව දන්වා මට ස්තුති කළේය.

මම එතුමාට පහත සඳහන් ලියමන යැවීමි.

1988 සැප්තැම්බර් 16 දින.

ගරු අගමැති,
ආර්.ප්‍රේමදාස මැතිතුමා,
අරලියගහ මන්දිරය,
කොළඹ.

අදරැති ගරු අගමැතිතුමනි,

ඔබතුමන්ගේ පක්ෂය විසින් ඒකමතිකව ජනාධිපතිවරණයට ඔබතුමන් තෝරා ගැනීම පිළිබඳව මගේ සන්තෝෂය මෙයින් ප්‍රකාශ කරමි. වැදගත් වන්නේ ජය හෝ පරාජය නොවේ. තරග කරන ආකාරයයි. ඔබතුමන් අද සිට මෙහෙය වන සටන තුළින්ම, ශ්‍රේෂ්ට නව ප්‍රජාතාන්ත්‍රික සම්ප්‍රදායන් පිහිටුවන්න. අන්ත ප්‍රපාතයට වැටී ඇති අපේ දේශපාලන ක්ෂෙත්‍රය පිරිසිදු කොට විශිෂ්ට තත්ත්වයකට නංවන්න. මේ ජාතික මෙහෙවර ඉටු කිරීමට ඔබතුමාගේ පෞරුෂයට ශක්තිය තිබෙන බව මගේ අවංක විශ්වාසයයි.

තෙරුවන් සරණින් දෙවි පිහිටෙන් ඔබතුමාගේ අභිමතාර්ථය සාර්ථක වේවායි පතමි.

මෙයට
සේවයෙන් බැඳි,

ඒ.ටී. ආරියරත්න.

මේ කාලය ඇතුළතදී සෑම මසකම අඩු වශයෙන් දෙවරක්වත් මම පිටරට සර්වෝදය කටයුතු සඳහා ගියෙමි. විශේෂයෙන් ඡන්ද කාලයේ මා වැඩි හරියක් සිටියේ මෙරට නොව විදේශගතවය. සර්වෝදයේ සෑම දෙනාටම පැත්තක් නොගෙන අපක්ෂපාතීව මැතිවරණ සමය ගත කරන ලෙස උපදෙස් දුනිමි.

ජනාධිපතිවරණයට දින කිහිපයකට පෙර අරිසෙන් අහුබුදු ශූරීන්ගේ 'සක්විති රාවණා' නාට්‍යයේ දර්ශනයක් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. එහි ප්‍රධාන ආරාධිතයා වූයේ ජනාධිපති අපේක්ෂක ආර්.ප්‍රේමදාස මැතිතුමාය. මම ද එම උත්සවයට සහභාගි වුනෙමි. එතුමා ළඟ තිබූ ඊළඟ අසුනට මා කැඳවා එතුමා මිනිත්තු 10 කින් පමණ උත්සව ශාලාවෙන් පිටව යන බවත්, මා මුණගැසීමට අවශ්‍ය බවත් පැවැසීය. විජයරාම මාවතේ පිහිටි අපවත් වී වදාළ පානදුරේ අරියධම්ම හිමියන්ගේ ආරාමයේදී එවේලේම මුණගැසීමට ද කතිකා කර ගතිමු.

මම විජේරාම මාවතෙන් පැමිණෙයෙමි. ජනාධිපති අපේක්ෂක අගමැති ප්‍රේමදාස මහතා ඊට සමාන්තරව තිබෙන පිටුපස දොරටුවෙන් පැමිණියේය. වාහන දෙකම ආරාමයෙන් පිටත තිබූ අතර, අප දෙදෙනා පමණක් ආරාමය තුළ වීමු. ආරාමයේ විවිධ අංශ පෙන්වමින් මිනිත්තු කිහිපයක් ගත කළ එතුමා, පසුව ඇතුළත කාමරයට මා සමග ගොස්, එහි තිබූ මිටි අසුන් දෙකක වාඩි වෙමුයි යෝජනා කළේය. ඉන්පසු සාකච්ඡාව ඇරඹිණි. ඡන්දය ගැන මගෙන් අදහස් විමසීය. අපට පැත්තක් ගැනීම සර්වෝදය ප්‍රතිපත්තිවලට විරුද්ධ බවත්, හැරත් අපේ සේවක සේවිකාවන්ගේ ජීවිත දේශපාලන භේදවලට මැදිහත් වුවහොත්, අනතුරට පත්වනවා පමණක් නොව, පසුව ජනතාව එකතු කර ගෙන කටයුතු කිරීමට නොහැකි තත්ත්වයක් පැන නැගෙනු ඇති බවත් මම තේරුම් කර දුනිමි. ප්‍රේමදාස මහතා පිළිතුරු වශයෙන් පැවසුවේ, ස්ථිරවම එතුමා දිනන බවත්, එතුමාට පක්ෂව සර්වෝදය විවෘතවම කටයුතු කිරීමට බිය නොවිය යුතු බවත්ය.

කෙසේ හෝ එක් රැස්වීමක හෝ කතා කරන්නැයි එවිට එතුමා මගෙන් ඉල්ලා සිටියේය. දේශපාලන රැස්වීමක මා එතෙක් කතා කර නොමැති නිසා කෙසේවත් ඒ ඉල්ලීමට එකඟ නොවිය හැකි බව මම පැවැසුවෙමි. එතුමා දිනන බව එතුමා මෙන්ම මමත් විශ්වාස කරන බවත්, දේශපාලනයට නොබැසීම තුළින් ජනතාවටත්

එතුමා පිහිටුවන රජයේ සංවර්ධන කටයුතුවලටත් මැතිවරණයෙන් පසු, මට වඩාත් උදව් විය හැකි බවත් මම පැවැසුවෙමි. රටේ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව එයින් මුදා ගැනීමේ වැඩ සටහනකටත්, උතුරු නැගෙනහිර සහ දකුණේ සාමය ඇති කිරීමටත්, එතුමාගේ සහාය ලැබුණොත් මට රජය සමඟ කළ හැකි ප්‍රධාන සේවාවන් දෙකක් බවත්, මම තේරුම් කර දුනිමි. ප්‍රේමදාස මහතා එයින් සෑහීමකට පත් නොවීය. එසේ නම්, දේශපාලන නොවන රැස්වීමක් ඉදිරි දින කිහිපයේදී සංවිධානය කොට එතුමා සහ මා සහභාගි වන එම රැස්වීම ජනමාධ්‍ය තුළින් ජනතාව අතර ප්‍රචාරය කිරීමෙන් මාත් සර්වෝදයත් එතුමා සමඟ බව ඒත්තු ගැන්විය හැකි යැයි එතුමා ප්‍රකාශ කළේය.

මෙතෙක් මගෙන් දේශපාලන ප්‍රයෝජනයක් බලාපොරොත්තු නොවූ ප්‍රේමදාස මහතාගේ මේ වචන මට අදහා ගත නොහැකි තරම් විය. මෙය මගේ හෘද සාක්ෂියට විරුද්ධ ක්‍රියාවක් නේ දැයි මම ඇසුවෙමි. එවිට අසුනෙන් නැගිට මා දෙසට හැරී නැවතත් මෙසේ පැවැසීය. 'හොඳයි' ඒ එකක්වත් අවශ්‍ය නැහැ. රාජ්‍ය බලය යොදවා ලංකාවේ සර්වෝදය සමාජයක් ගොඩනැංවීමට යෙදිය හැකි අවස්ථා මා ඔබට දෙනවා. මා ජනාධිපති වන බව ස්ථිරයි. කිසිම දේශපාලන වේදිකාවකට නොනැග ජාතික ලැයිස්තුවෙන් ඔබ පාර්ලිමේන්තුවට ගෙන, මා ළඟට තිබෙන සියලුම බලය ඔබට දීමට මට පිළිවනි. එවිට අවුරුදු 30 කට අධික කාලයක් සර්වෝදය සඳහා ඔබ කැප කළ ජීවිතයේ ප්‍රතිඵල නිරායාසයෙන්ම මල්ඵල ගන්වන්නට පුළුවනි'. මේ අවස්ථාවේදී මෙතෙක් ඉවසිල්ලෙන් සාධාරණව තර්කානුකූලව කතා කළ මට මගේ හැඟීම් පාලනය කර ගැනීමට මොහොතකට අපහසු විය. ''අගමැතිතුමනි, මෙතරම් කල් ඇසුරු කොට ඔබතුමාට මා තේරුම් ගැනීමට බැරිවීම ගැන මා කනගාටු වෙනවා. මම බලය, ධනය හෝ කීර්තිය පිටුපස මෙතෙක් එලෙව්වේ නැහැ. ඉදිරියට ද එළවන්නේත් නැහැ. මා යන්නේ ආධ්‍යාත්මික ගමනක්. ආධ්‍යාත්මික ශක්තිය තුළින් මාත් වෙනස් වී, අන් අයත් වෙනස් කොට, සර්වෝදය

සමාජයක් දෙසට අපේ ජනතාව යොමු කිරීම මගේ අදහසයි. එය පක්ෂ දේශපාලනයෙන් කරන්න බැහැ. එය බලකාමිත්වයෙන් තොරව ධන ආශාව ඉවත දමා කළ යුතු පරිත්‍යාගශීලී ආගමික මෙහෙයක්. රාජ්‍ය බලය ඇත්තන්ට එයට උදව් වන්නට පිළිවන්. නමුත්, ඔබතුමා ළඟ තිබෙන බලතල මට දීමට පොරොන්දු වෙමින් දේශපාලනයට මා ඇද ගන්නට කරන වෑයම මා සලකන්නේ මට කරනු ලබන අපහාසයක් හැටියටයි. මෙතෙක් කල් ඔබතුමා සමඟ මගේ තිබුණේ පොදුවේ ජනතාවට සේවය කිරීමේ අභිලාෂය මිස, ඔබතුමාගේ පිහිටෙන් ආත්මාර්ථය සලසා ගැනීමක් නොවේ. ඒ නිසා මට සමාවෙන්න. මා නම් මේ පවතින පක්ෂ ක්‍රමයට මැදිහත් වන්නේ නැහැ''. මෙසේ කියමින් මම ද පුටුවෙන් නැගිට්ටෙමි.

කාමරයේ සිවිලිම දෙස බලමින් අඩි කිහිපයක් ගමන් කළ ප්‍රේමදාස අගමැතිතුමා 'හ්ම්' යන ශබ්දය පමණක් නගමින් අවසන් වරට මෙසේ ප්‍රකාශ කළේය. ''හොඳයි, ඒකට කමක් නැහැ. ඉදිරි දින කිහිපය තුළදී මට ඔබට පණිවුඩයක් එවීමට තිබේ නම්, ඒ සඳහා තමන්ට විශ්වාස කෙනෙක් යොමු කරන්නට නොහැකිද?'' මෙසේ අසමින් එතුමා කාමරයෙන් එළියට පැමිණියේය. මම ද ඔහු සමගින්ම එළියට ආවෙමි. ඒ අවස්ථාවේදී පිටුපස ගේට්ටුවෙන් ඔළුව දමා ගෙන ඇතුළත දෙස බලමින් සිටි ඇන්ටන් අල්විස් මහතා මගේ නෙතට ලක් විණි. ඒ මොහොතේම ඔහුගේ මිත්‍රයෙක් වූ හර්ෂ කුමාර නවරත්න මහතා ගැන ද මට සිහි විය. ඕනෑම පණිවුඩයක් ඇන්ටන් අල්විස් මහතාට දූන් වුවහොත්, ඔහු විසින් ඔහුගේ මිත්‍රයකු වූ හර්ෂ කුමාර නවරත්න මහතා මාර්ගයෙන් මට වහාම දැනුම්දීමට පුළුවන් යැයි මම පැවසීමි. ඇන්ටන් අල්විස් මහතාට අගමැතිතුමා කතා කළේය. ඔහු ද අප සිටි තැනට පැමිණියේය. මේ පණිවුඩය ඔහුට එම අවස්ථාවේදී ඒ ආකාරයෙන්ම මා විසින් පැවැසීය. මට ආචාර කළ ප්‍රේමදාස මහතා පිටුපස ගේට්ටුවෙන් පිටත්ව ගිය අතර, මම ද ඉස්සරහ ගේට්ටුවෙන් පිටත්ව ගෙදර ගියෙමි.

පසු දින හර්ෂ කුමාර නවරත්න මහතා මුණගැසුණු විගස ඇන්ටන් අල්විස් මහතා යම් පණිවුඩයක් දුනහොත්, එය නොපමාව මා වෙත දන්වන හැටියට ඔහුට උපදෙස් දුනිමි. එදා සිටම හර්ෂ නවරත්න මහතා ප්‍රේමදාස මහතාගේ කිට්ටුම සහචරයෙක් වශයෙන් කටයුතු කරනු ඇතැයි මම සිහිනයකින්වත් නොසිතුවෙමි. නමුත් සිදුවූයේ එයයි. ජනාධිපතිවරණ ව්‍යාපාරයට ප්‍රේමදාස මැතිතුමා සහ ගාමිණී දිසානායක මැතිතුමා ද සමඟ එකම හෙලිකොප්ටරයෙන් හෝ වෙනත් වාහනවලින් ගමන් කරමින් දේශපාලනයෙහි ඔහු යෙදෙනු ඇතැයි මම නොසිතුවෙමි. නමුත් නො සිතූ දෙයක්ම සිදු විය.

1988 දෙසැම්බර් 20 වෙනිදා පැවැත්වූ ජනාධිපතිවරණයෙන් ආර්. ප්‍රේමදාස මහතා ජයග්‍රහණය කළ බව පසු දා ප්‍රකාශ විණි. එදින සවස සුභ පැතීම සඳහා මම සුචරිතයට දුරකතනයෙන් කතා කළෙමි. ඒත් එතුමා සිටියේ නැත. එදින රාත්‍රී මා කතා කළ බව දැනගත් වහාම, එතුමා මට කතා කළේය. මම සුභ පැතීමට කතා කළ බව පැවැසීමි. තමන් ලද ජයග්‍රහණයෙන් දැහැමිව රට පාලනය කරන හැටියට ද, හිංසාව සහ අසාධාරණය දුරලන හැටියට ද ඉල්ලා සිටියෙමි. මට ස්තුති කර එතුමා ඒ සඳහා උදව් වන්නයි කියමින් රිසීවරය තැබීය.

1988 දෙසැම්බර් 20 දින මේ ලියමන එතුමාට මම යැවීමි:

1988 දෙසැම්බර් 20 දින.

ජනාධිපති ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස මැතිතුමා,
සුචරිත මාවත,
කොළඹ 13.

අදරැති ශ්‍රීමත් ජනාධිපතිතුමනි,

නිහතමානීකම, උට්ඨාන වීර්යය, නොසැලෙන අධිෂ්ඨානය, බලවත් ආත්ම විශ්වාසය, ආදර්ශමත් සංවිධානාත්මක ශක්තිය ආදී මාහැඟි

ගුණාංගයන්ගෙන් යුතු පෞරුෂයකට ඕනෑම බාධකයක් මැඩ පවත්වා ගෙන විජයග්‍රහණය කරා ළඟා විය හැකි බව ඔබතුමා විසින් ප්‍රත්‍යක්ෂ කිරීම අප වැනි සාමාන්‍ය මිනිසුන්ගේ ද ඉමහත් සතුටට හේතුවේ. අනාගතයෙහි රට-දැය-සමයට සේවයක් කිරීමට වඩ වඩාත් එම ආදර්ශයෙන් ධෛර්යය ලැබේ. එම නිසා ඔබතුමාගේ ජයග්‍රහණය සියලුම දේශ සේවකයින්ගේ ජයග්‍රහණයක් හැටියට මම සලකමි.

මේ රටේ නීති පද්ධතිය සාධාරණ කරවීම සෑම මනුෂ්‍යය - කුගේම මූලික මානව අයිතිවාසිකම් ආරක්ෂා කර දී ඔවුන් විසින් ඉටු කළයුතු මානව යුතුකමක් ඉටු කිරීමට ඉඩ සලසාදීම, පෞද්ගලික හිංසාව මෙන්ම ව්‍යුහාත්මක හිංසාවන් ආධ්‍යාත්මික සහ විද්‍යාත්මක ශක්තිය යොදා සමාජයෙන් තුරන් කිරීම, සුඛෝපභෝගිත්වය මෙන්ම දරිද්‍රතාවය ද පිටු දකින ජීවන රටාවකට ජනතාව හුරු කිරීම, නිෂ්පාදනය මධ්‍යගත අර්ථ ක්‍රමය වෙනුවට ජනතා සහභාගිත්වක අර්ථ ක්‍රමයක් ගොඩනැංවීම, විෂම පක්ෂ ක්‍රමය වෙනුවට සම්මුතියෙන් තීරණ ගැනෙන සම්මුති දේශපාලන ක්‍රමයක් ගොඩනැංවීම ආදී මාර්ග තුළින් මේ රටේ සාමය සහ සාධාරණත්වය දෙසට යොමු කිරීමේ ඓතිහාසික සේවාව ඉටු කිරීමට ඔබතුමාට කායික මානසික ශක්තිය ලැබේවා.යි හදපත්ළෙන්ම ප්‍රාර්ථනා කරන අතර, ඒ උත්කෘෂ්ට කාර්යය සඳහා සර්වෝදය සංසදයේත්, මගේත් සම්පූර්ණ සහයෝගය අවශ්‍ය හැම අවස්ථාවකදීම පිරිනමන්නෙමු.

ඔබතුමාටත්, මැතිනියටත්, දරුවන්ටත්, ඔබතුමා සමඟ සේවය කරන බැතිමත් සේවක පිරිසටත් තෙරුවන් සරණින් දෙවි පිහිටෙන් අප රට වත්මන් අර්බුදකාරී තත්ත්වයෙන් මුදා ගැනීමට ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා'යි සුභාශිංසනය කරමි.

සැපවේවා!
මෙයට - සේවයෙන් බැඳි,
ඒ.ටී.ආරියරත්න,
සභාපති.

පසුව හමුවෙමු
නව නායකයා වෙනුවෙන් කාර්ය භාරයක්

ජනාධිපති ප්‍රේමදාස මහතාගේ ග්‍රාමෝදය භාරකාර මණ්ඩලයේ මම ද සාමාජිකයෙක් වීමි. මුස්ලිම් ජාතික රසාක් මහතා සහ ද්‍රවිඩ ජාතික චකී විජයනාදන් මහතා සහ මා හැරුණු විට, එම මණ්ඩලයේ සිටි සියලුදෙනාම කැබිනට් ඇමතිවරු වූහ. 1988 දෙසැම්බර් 28 වෙනිදා නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට ඔබ්බෙහි පිහිටුවා තිබෙන ජනකලා කේන්ද්‍රයේ මෙම භාරකාර මණ්ඩලයේ රැස්වීමක් පැවැත්විණි. මෙහි සභාපති වශයෙන් ජනපති සිය දියණියත් සමඟ පැමිණියේය. වෙන දා මෙම රැස්වීම්වලදී එතුමා වඩාත්ම විමසුයේ මගේ අදහස්ය. එහෙත් මෙදින ඔහු මා දෙස බැලුවේවත් නැත. මිනිත්තු 20 කින් පමණ රැස්වීම නිම කළ ඔහු, ජනකලා කේන්ද්‍රයේ විවිධ අංශ බැලීමට රවි ජයවර්ධන මහතා සහ පිරිසක් සමඟ ගියේය. මා දෙසට හැරී .පසුව හමුවෙමු. යි පැවැසීය. එහෙත් එය එතරම් සතුටකින් නොවේ. දුලාංජලී මහත්මිය සමඟ මම වචන කිහිපයක් කතා කළෙමි. අගමැති ලේකම්ව සිටි කේ.එච්.ජේ. විජයදාස මහතා මා ළඟට පැමිණියේය. ඔහුට ජනාධිපති ලේකම් පදවිය ලැබෙන්නේ දැයි මම විමසීමි. ඔහු පැවැසුවේ, අප කොතරම් මහන්සි වී වැඩ කළත් එය ලැබෙන පාටක් නැති බවයි. එවේලේම ජනාධිපති පදවියට තේරී සිටි ප්‍රේමදාස මහතා ඇවිදින තැනට මම ද වේගයෙන් ගොස් එකතු වීමි. මට වචනයක් කීමට තිබෙන බව පවසා, විජයදාස මහතා අමතක නොකරන මෙන් පවසා, ආයුබෝවන් කියා මම පිටව ගියෙමි. අන් කාටත් පෙර මා පිටත්ව යනු සියලුදෙනාම දුටහ. එදින රැස්වීම පැවැත්වෙන අතරේ භාරකාර මණ්ඩලයෙන් අස්වීමේ ලිපිය මම සකස් කළෙමි. පසුවදාම එය ටයිප් කර අත්සන් කොට යසසිරි ගුණවර්ධන මහතාට තැපැල් කළෙමි.

1988 වර්ෂය ගෙවෙත්ම මා රජය සමඟ තිබුණු එකම නිල බැඳීම ද නිමාවට පත්විණි. එහෙත් එය ආරියරත්න-ප්‍රේමදාස සම්බන්ධයේ අවසානය යයි මම කිසිසේත් නොසිතුවෙමි.

මේ දිනවලදි අප නිවසේ හැමදෙනාටම පැපොල රෝගය වැළඳී තිබුණි. එබැවින් සෑම වසරකම පළමුවෙනි දිනයෙහි දී දළදා වැඳීමට යන මගේ වන්දනා ගමන කල් තැබීමට සිදුවිණි. තවත් හේතුවක් වූයේ ජනාධිපති පදවිප්‍රාප්ත උළෙල ද මේ දිනවල රාජශ්‍රීයෙන් යුක්තව සංවිධානය වීමයි. මම එම පදවිප්‍රාප්ත උළෙලට නොගියෙමි. තවත් හේතුවක් වූයේ, මට නියම කර තිබුණු අසුනට යෑමෙන් සර්වෝදය ව්‍යාපාරයට අගෞරවයක් සිදුවේ යයි මා අදහස් කළ බැවිනි. අනෙක් හේතුව පැපොල් රෝගයෙන් පෙළෙන ගෙදරක සිටි අයෙක් හැටියට, එම විෂබීජ මහජනයා ගැවසෙන ස්ථානයකට රැගෙන යාම නුසුදුසු යයි මා සිතූ නිසාය.

මෙතෙක් ශ්‍රී ලංකාවේ සංවිධානය නොවූ අන්දමේ විශාල පදවිප්‍රාප්ත උළෙලක් ශ්‍රී දළදා මාලිගාව මධ්‍යගත කොට සෙංකඩගල පුරවරයේ සංවිධානය විය. රූපවාහිනියෙන් මෙම උළෙල මම නැරඹුවෙමි. ජනාධිපති ප්‍රේමදාස මහතා පමණක් නොව, එම මැතිනිය සහ දරුවන් ද මේ අන්දමින් පත්තිරිප්පුවට නැග කරන ලද රඟපෑම බෞද්ධයෙක් වශයෙන් මට නම් පිළිගත නොහැක්කක් විය. 1989 ජනවාරි 02 වෙනිදා මේ අන්දමින් ශ්‍රී ලංකාවේ දෙවැනි විධායක ජනාධිපති වශයෙන් දිවුරුම් දී වැඩ බාර ගත් ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මහතා ඊළඟට ගොස් තිබෙන්නේ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ තැන්පත් නෙරංජන් විජයරත්න මහතාගේ කාර්යාලයටය. ඔහු සමඟ ගාමිණී දිසානායක මහතාත්, මගේ වැඩිමහල් සොහොයුරියගේ පුත්‍රයා වූ හර්ෂ කුමාර නවරත්න මහතාත් මේ අවස්ථාවේදී එම කාර්යාලයේම සිටියහ. තමා දිවුරුම් දුන් දිනයේදීම මොහොතකට පෙර, පත්තිරිප්පුවේ කළ කතාවට සම්පූර්ණයෙන් පටහැනි වූ ප්‍රකාශයක් මේ අය ඉදිරිපිටදී නව ජනාධිපති කළ බව ඇසීමෙන් මම පුදුමයට පත් වීමි. එය ඉතා කෙටියෙන් සඳහන් කළහොත් මෙසේය:-

''ආරියරත්න සතියකින් මා ඉදිරියේ දණගස්වා සර්වෝදය පාලනය මා අතට ගන්නවා'. සියලු විස්තර මුලින්ම දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න මහතා හා පසුව ගාමිණී දිසානායක මහතා මට රහසේ පැවැසූහ. මා යටතේ සේවය කළ, අවුරුදු නවය වයසේ සිට මගේ හව්හරණය යටතේ ඇති දැඩිව, පසුව සර්වෝදය පූර්ණකාලිකයෙක් වූ හර්ෂ කුමාර නවරත්න මහතා මේ සිද්ධිය පිළිබඳව මට පැවසුවේ නැත.

සෑම වසරකම දෙසැම්බර් 31 වෙනිදා රාත්‍රී 12.00 ට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳගෙන ඉන් පසු කෙළින්ම මහනුවරට ශ්‍රී දළදා වහන්සේ වැඳගෙන ආපසු ගෙදරට වුත් මාගේ නව වසරේ වැඩ පටන් ගැනීම සිරිතක් වී තිබිණි. එහෙත් මේ පදවි ප්‍රාප්ත උත්සවය නිසා මා හට දළදා වඳින්නට හැකිවූයේ ජනවාරි 04 වෙනිදාය. දළදා වහන්සේ වැඳීමෙන් පසු පහත මාලයේ පිටුපස ඉස්තෝප්පුවට ගොස් පැය බාගයක් පමණ මම භාවනා කළෙමි. සිත සම්පූර්ණ යෙන්ම එකලස් විය. මේ අවස්ථාවේදී මම පුදුම දර්ශනයක් දුටුවෙමි. එනම්, විශාල සුදු තිරයකි. මේ තිරයේ රතු ඉලක්කම්වලින් 30,000 ලකුණු වී ඇති අතර, එය සම්පූර්ණයෙන්ම ගලා වැගිරෙන තද රතුපාට ලේවලින් යුක්ත විය. භාවනාවේ යෙදී සිටියදීම මම මෙය විග්‍රහ කළෙමි. මට හිතට ආවේ ක්ෂණිකවම බෝම්බවලින් හෝ වෙඩි උණ්ඩවලින් මිය ගිය අයවලුන් නැවත ඉපදීමට නොහැකිව සිටින බවත්, ඔවුන්ගේ වික්ෂිප්ත වූ පංච උපාදානස්කන්ධ වෙනත් මානසික දුර්වල අය කෙරෙහි බලපෑම් ඇති කොට, 1989 අවසන් වන විට අවම වශයෙන් තිස්දහසකගේ ජීවිත නැති වන බවට මෙය ලකුණකි යනුවෙනි.

අපේ පෞරුෂය ක්ෂණයක්වත් ස්ථිරව පවතින ස්වභාවයක් නොවේ. අපේ මෝඩකම නිසා මේ ක්ෂණික වෙනස් වීම අපට අවබෝධ නොවේ. බුදුන් වහන්සේගේ දේශනාවේ සඳහන් වචනවලින් පවසතොත් අපේ පෞරුෂය වනාහි පටිච්චසමුප්පන්න ධර්මයට යටත්ව ගමන් කරන පංච උපාදානක්ඛන්ධයන් පමණකි. ක්ෂණිකව යමෙක් ජීවිතක්ෂයට පත්වීමේ දී අතිශය දියුණු වූ

ආධ්‍යාත්මික තත්ත්වයක් ඇති කෙනෙක් හැර අන් කෙනෙකුට තමන්ගේ උපාදානක්ඛන්ධයන් සමතුලිතව හසුරුවා ගැනීමට ශක්තියක් ඇති වේ දැයි මම නොදනිමි. ඔවුන්ගේ විඥාන ධාරාව ක්‍රියාවකට වඩා ප්‍රති ක්‍රියාවක් බවට හැරීමට හොඳටම ඉඩ තිබේ. එනිසා අලුත් පුනර්භවයක් ගැනීමට පෙර ''බියෙන් සැකෙන් වෛරයෙන් මනස විවෘත කර ගෙන ජීවත්වෙන මිනිසුන්ගේ පංච උපාදානක්ඛන්ධයට තාවකාලිකව බලපෑමට මෙම විඥාන ධාරාවන්ට ශක්තිය ඇතැයි'' යන හැඟීමයි, ශ්‍රී දළදා මාලිගාවේ පහත මාලයේ සිට භාවනා කරද්දී දුටු මේ චිත්‍රය විග්‍රහ කිරීමේ දී මා සිතට ආවේ ඒ අවස්ථාවේදී මගේ හොඳ මිත්‍රයෙක්ව සිටි බර්ටි සෙනෙවිරත්න මහතා. මා දැන සිටි පමණින් ඔහු ඉතාම භක්තිමත් බෞද්ධ උපාසකයෙක් විය. ඔහු සමඟ මෙම අත්දැකීම බෙදා ගත යුතු යයි සිතා, මම කෙලින්ම එතුමා හමුවීමට ගොස් මෙසේ ද පැවසීමි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පවුලකින් ප්‍රථම වරට රාජ්‍ය නායකයෙක් බිහි වුණා. ඔහුගේ පාලනය සාර්ථක වුවහොත් ඉදිරියේදී සාමාන්‍ය පවුල් තුළින් තවත් නායකයින් බිහි වන්නට ඉඩ තිබෙනවා. ඔහුගේ පාලනය අසාර්ථක වුවහොත්, ඒ ඉඩ ඇහිරෙනවා. මට අදහස් වන හැටියට අහිංසාවාදී මෙන්ම දේශපාලනයෙන් තොර සාමාන්‍ය අයවලුන් හැටියට මෙම නව රාජ්‍ය නායකයාට අප විසින් කළ හැකි ප්‍රධානම සේවය ස්වභාව ශක්තීන් වඩාත්ම අප රටට ලැබෙන ශ්‍රී දළදා මාලිගාවට නුදුරු වන ලැහැබින් යුත් කඳුමුදුන් වැනි උස් ස්ථානවල සිට අපිරිසිදු වූ චිත්තභ්‍යවකාශයට මෛත්‍රී සහගත චිත්ත ශක්තීන් මුදා හැරීමයි. ක්ෂණික ඝාතනවලට ලක් වී ජීවිත විනාශ වුනු පංච උපාදානක්ඛන්ධවලට එම මෛත්‍රී පූර්වක චිත්ත ශක්තිය ලබා දී ඔවුන්ට ඔවුන්ගේම අලුත් පුනර්භවයක් ලබා ගැනීමට උදව් කිරීමයි. ඔබ සහ මා වැනි භාවනාවේ යෙදෙන අයවලුන් මෙම නව නායකයා වෙනුවෙනුත්, අපේ රටේ සාමය වෙනුවෙනුත් මෙම කාර්යය ඉටු කළ යුතුයි. මෙම අදහස් සෙනෙවිරත්න මහතාට පැවැසූ මම, ඔහු දන්නා හඳුනන, භාවනා කරන අය මාර්ගයෙන් මේ ප්‍රදේශයේ එම ආධ්‍යාත්මික බලවේගය මුදා හරින ලෙස ඉල්ලා සිටියෙමි.

සමථයක් සඳහා වෛර දුරීම
අතීතය-අනාගතය සහ මේ මොහොත

ජනාධිපතිතුමා මා කෙරෙහි වෛරයකින් පසුවන බව දළදා මාලිගාවේදී කරන ලද ප්‍රකාශය නිසා මම දැන ගතිමි. ඒ නිසා මෙය තව දුරදිග යැමට නොදී, සමථයකට පත් කර ගැනීම සඳහා 1989 ජනවාරි 07 වන දින පහත සඳහන් ලිපිය ලියා, මම එතුමාගේ පෞද්ගලික ලේකම් විජේදාස මහතාගේ අතට 1989.01.15 දින භාර දුන්නෙමි.

1989 ජනවාරි 07 දින.

ශ්‍රීමත් ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

ශ්‍රීමත් ජනාධිපතිතුමනි,

ඔබතුමා, ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති වශයෙන් උත්තරීතර පදවියට පත්වීම පිළිබඳව මාගේ සතුට පළ කරමින් එවන ලද ලිපි දෙකට අමතරව, ඔබතුමා නිල වශයෙන් රාජකාරී භාර ගැනීමත් සමඟම මෙවැනි ලිපියක් එවන්නට සිදුවීම පිළිබඳ මුලින්ම සමාව අයදිමි. මා ටික කලකට විදේශීය සේවාවකට යන බැවිනුයි මේ ලිපිය එවන්නේ.

පසුගිය ග්‍රාමෝදය මණ්ඩල රැස්වීමේදී ඔබතුමා මා සමඟ යම් දුරස්ථ වීමක් සිදුව තිබුණු බවට මට ඉඟියක් දැනිණි. පසුව ඔබතුමා කිට්ටුවෙන් ඇසුරු කරන කිහිප දෙනෙකුගේ කතාබස්වලින් මා ලත් ඉඟිය පිළිබඳ යම් සත්‍යයක් ඇති බව මම අනුමාන කළෙමි. ඒ නිසා අප අතර මෙතෙක් කල් තිබුණු හොඳ හිතට ඔබතුමා හෝ මා අතින්

හෝ කිසිදු පළුද්දක් ඇති නොවීම පිණිස පහත සඳහන් කරුණු කිහිපය ලියා එවීමට තීරණය කළෙමි. මෙය වඩාත් වැදගත් වනුයේ සෙසු බොහෝ දෙනා මෙන් නොව, ඔබතුමා මට අතීතයේදී දැක්වූ දයා කරුණාවෙන් මා පෞද්ගලිකව හෝ අප ව්‍යාපාරයට හෝ වැරදි ප්‍රයෝජනයක් නොගත් නිසාත්, ඉදිරියට ද එවැනි හොඳ හිතකින් වැරදි ප්‍රතිලාභයක් ගැනීමට බලාපොරොත්තු නොවන නිසාත්ය. අපේ හොඳ හිතින් ප්‍රතිලාභ ලබන්නේ අපේ අහිංසක පොදු ජනතාවයි.

1. මේ රටේ සමහර වරප්‍රසාද ලත් පුද්ගලයින් ඔබතුමාත් මාත් අතර පරතරයක් ඇති කිරීමට සහ ඇති වනු දැකීමට කැමතිය. හේතුව ඔබතුමා රාජ්‍ය බලය අතිනුත්, මා රාජ්‍ය නොවන සර්වෝදය මග තුළිනුත් වරප්‍රසාද නොලත් පන්තියේ විමුක්තිය සඳහා අත්වැල් බැඳ ගෙන නො යෑම ඔවුන්ගේ වාසියට හේතු වන බැවිනි. අප එකම අරමුණු දෙසට ගමන් කළත් අප තෝරා ගත් මාර්ගය අනුව අපගේ ශිල්පීය ක්‍රම සහ සංවිධාන ව්‍යුහයන් වෙනස්ය. එහෙත් එය වැඩි ළංවීමකට මිස, ඈත් වීමකට තුඩුදිය යුතු නැත. පක්ෂ දේශපාලන ක්‍රමයෙන් වෙන් වූ මගක ගමන් කළ නිසා පසුගිය 35 වසර තුළදීම අසාධාරණ පහරදීම්වලට ලක් වී ඇත්තෙමි. ඔබතුමා යටතේ පවතින රජයකින්වත් මේ අසාධාරණයෙන් මා නිදහස් විය යුතුය. මගේ මේ ක්‍රියාවක් පිළිබඳව ඔබතුමා තුළ නොපැහැදිලි කමක් ඇති වූ වහාම මගෙන් විමසුවහොත් (දුරකතනයෙන් හෝ) එය තේරුම් කර ගෙන අපේ සේවාවන් අපේ ජනතාව වෙනුවෙන් අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව ඉටු කිරීමට බාධාවක් නොවේ. මෙතෙක් ඔබතුමා හෝ මම, අතරමැදියන් මාර්ගයෙන් සන්නිවේදනයක් කිරීමට තරම් දුරස්ථ නොවී සිටියෙමු.

2. බාහිර පක්ෂපාතිකම් ප්‍රදර්ශනය කර, සමාජ-මානසික මට්ටමින් අන්‍යෝන්‍ය සුහදතාවක් පෙන්වීමට වඩා මා

හැමදාම විශ්වාස කළේ ආධ්‍යාත්මික සබඳතාව ඊට වඩා උසස් හා බලවත් සම්බන්ධයක් බවයි. ඔබතුමා සමඟ මාගේ තිබෙන්නේ එබඳු සබැඳියාවකි.ඒ නිසයි හිටපු ජනාධිපතිතුමා පත්තිරිප්පුවේ සිට ජාතිය අමතන අවස්ථාවේදී මෙන්ම, ඔබතුමා පත්තිරිප්පුවේ සිට ප්‍රතිඥාව ගන්නා අවස්ථාවේදීත්, මගේ බුදුගෙය තුළ වාඩි වී ආධ්‍යාත්මික ශක්තියකින් ඔබතුමාටත්, පවුලේ හැම දෙනාටත්, ඔබතුමා පිහිටුවන රජයටත්, පොදුවේ ජනතාවටත් මෛත්‍රී පතුරුවා ආශීර්වාද කිරීම වඩා වැදගත් යැයි මා සලකා ඒ අනුව ක්‍රියා කළේ. ගැඹුරක් නැති සමහර ආත්මලාභී අයවලුන් මෙවැනි අවස්ථාවලදී මගේ මුහුණ නොපෙන්වීම වරදක් කොට ඔබතුමාට පෙන්වාදීමට හොඳටම ඉඩ ඇත. මගේ ගෙදර සියල්ලන් බෝවෙන රෝගයකින් ඒ දිනවල පෙළුනු බව ඔවුන් සඳහන් නොකරනු ඇත.

3. අවුරුදු 35 ක පමණ කාලයක සිට මා මාගේ සහෝදර සේවක සේවිකාවන් සමඟ ගොඩනැගූ සර්වෝදය නමින් ජනප්‍රිය වූ සංසදයේ වගකීම 1956 පටන් ගෙන 1988 ඔක්තෝම්බර් මාසය වන විට, ඊළඟ පරම්පරාවට භාරදී සියලුම මුදල්, පරිපාලන හා ව්‍යාපෘති කටයුතුවලින් මම නිදහස් වීමි. තව ටික දිනකින් ඔවුන්ගේ ඉල්ලීම අනුව සංගමයේ සභාපතිකම නමින් ඉසිලුවත්, එය ද ඔවුනටම ඉක්මණින්ම පවරා දෙන්නෙමි. අප ගොඩනගනු ලැබූ දෙයින් නියම සතුට ලැබෙන්නේ එහි අයිතිය අප අත් හළ විටය. කියවීම, ලිවීම හා ආධ්‍යාත්මික කටයුතුවල යෙදීමටත් සමස්තයක් වශයෙන් රටේත් ලොවේත් ශිෂ්ටාචාරය ගැන හිතා මට පුළුවන් අන්දමින් ප්‍රජා සේවකයෙක් හා ගුරුවරයෙක් වශයෙන් සේවය කිරීමටත් මගේ කාලය දැන් යොමු කර සිටිමි. ඔබතුමාගේ දුප්පත්කම නැති කිරීමේ ව්‍යාපාරය ඇතුළු සියලු ජාතික සේවාවන්ට

සම්පූර්ණ සහයෝගය දෙන ලෙස සෑම සර්වෝදය ආයතනයකටම මම දන්වා ඇත්තෙමි. ඒ එසේම ලැබෙනු ඇත. එමෙන්ම කොයි රටක සිටියත් මගෙන් හෝ ව්‍යාපාරයේ කිසිවෙකුගෙන් හෝ ඒවාට ආධාරයක් මිස, වචනයකින් හෝ අවහිරයක් නොවනු ඇත.

4. රාජ්‍යමය වශයෙන් මගේ තිබෙන එකම සම්බන්ධය ග්‍රාමෝදය අරමුදලේ සභිකයෙකු හැටියට ඔබතුමාගේ පත් කිරීම අනුව ක්‍රියා කිරීමයි. ඔබතුමා මා එහි සිටිනවාට අබමල් රේණුවක හෝ අප්‍රසාදයක් තිබේ නම්, ඔබතුමාට බරක් නොවී, එයිනුදු මම නිදහස් වීමට ඕනෑම අවස්ථාවකදී කැමති වෙමි.

5. දැනට දෙදිනකට පමණ පෙර විශ්‍රාම ගිය ජනාධිපතිතුමා හමුව මම සුබ පැතුවෙමි. එමෙන්ම පොදු ජාතික ප්‍රශ්න පිළිබඳව මගේ අදහස් විවෘතව ප්‍රකාශ කිරීමෙන්, පසුගිය එකොළොස් වසරේදී විශේෂයෙන් පසුගිය ජූලි 14 දා වචනයකින් හෝ එතුමාගේ හිත පෞද්ගලිකව රිදෙව්වා නම්, ඒ ගැන ද කනගාටුව ප්‍රකාශ කළෙමි. ඒ නිසා මා හිතන අන්දමට මා දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔබතුමාට හිත් වේදනාවක් මා නිසා සිදුව ඇතොත්, එය ඉවත් කරවීම මගේ යුතුකමක් ලෙස මම සලකමි. මා, මගේ රට ගැන මාගේ හෘදය සාක්ෂිය අනුව ප්‍රකාශ කරන යම් දෙයක් පෞද්ගලිකව ගණන් ගෙන, ඔබතුමාට සිත් වේදනාවක් ඇති විණි නම්, එයට සමාව අයදිමි. සිතිවිල්ලකින් හෝ ආශීර්වාදයක් මිස, වේදනාවක් ඔබතුමාට මා දී නැත.

6. දුශ්චරිතයෙන්, බිහිසුණු ජාතිවාදයෙන්, විෂම පක්ෂ දේශපාලනයෙන් හා හිංසාවාදයෙන් හා බලකාමයෙන් මිදුණු දස දහස් ගණන් තරුණ තරුණියන් සංඛ්‍යාවක් මාතෘ භූමියේ සේවයට මම යොමු කර ඇත්තෙමි. අන් හැම අරමුණකටම වඩා ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කර දීමට

පසුගිය පස් වසරේදී වෙසෙසින් පසුගිය වසර එකහමාරේදී මම වෙහෙසුණෙමි. සමහර විට ධර්මය ගැන විශ්වාසය තබා හැකි තරම් ජීවිත රැකදීම සඳහා මගේ ජීවිතයත් සමඟ අනතුරුදායක ව්‍යායාමයක යෙදුණෙමි. ආපසු හැරී බලන විට, පිටස්තර අයවලුන්ගේ ආකල්ප කෙසේ වෙතත් ඔවුන් රැක ගැනීම තුළින් පෞද්ගලිකව නිස්සරණාධ්‍යාසි තෘප්තියක් මා ලද බව මට හැඟේ. නිවැරදි දේශෝදය ක්‍රියා මාර්ගයකදී ඔවුන්ගේ නිස්සරණාධ්‍යාසී සේවය ඔබතුමාට ලැබෙනු ඇත. ඔබතුමාගේ පාලන සමයේදී ඔවුන් රැක ගෙන, ඔවුන්ගේ සේවය අපේ ජනතාවට ලබා දෙන්න. ඔබතුමා මුල පිරූ ඓතිහාසික විප්ලවය ඉදිරියට ගෙන යෑම සඳහා ජනතාව අතර පුරෝගාමිත්වය දීමට ඔවුන්ට වඩා ඇප-කැප වූවන් හෝ සුදුස්සන් සොයා ගැනීම අසීරු වනු ඇත.

7. පසුගිය මස මුලදී ඉන්දුනීසියාවේදී මා සතු සියල්ල සොරකම් කරන ලදී. ඒ නිසා මම ණය වීමි. එය ගෙවීමට ටික කලකට දීමනාවක් ලබා සේවයක යෙදෙමි. මාගේ පළමු වන සේවය ගැන්ඩා රජයට ග්‍රාමීය සංවර්ධන ක්‍රමයක් ගොඩනැංවීමට උදව් වීමය. ජනවාරි 30 වැනිදා සිට එහි නිරතවීම සඳහා මම පිටත්ව යමි. මාගේ ශරීර සෞඛ්‍ය එතරම් සතුටුදායක නොවූවත්, දරුවන්ට ජීවත් වන මගක් සාදා දී, මා ද ජීවත් වන තුරු නිස්සරණාධ්‍යාසයෙන් ලෝක සේවයෙහි යෙදිය යුතුය. ඉදිරියේදී මා ලංකාවේ වරින් වර ගත කරන කාලය ජනතාවගේ ආධ්‍යාත්මික ශක්තිය පිබිදීම තුළින් සාමය ඇති කිරීම සඳහා කැප කරමි. ඒ කටයුතුවලදී මට කිරීමට සිදුවන ඕනෑම පරිත්‍යාගයක් ජනතාවගේ සමගිය සහ අහිංසාවාදී ජීවිත නැවත ගොඩනැංවීම සඳහා මම නොපසුබටව කිරීමට ඉදිරිපත් වෙමි. ඒ කටයුතුවලදී ඔබතුමා මට කවදත් දුන් කරුණාව සහ සානුකම්පිත සහයෝගය ලැබේ යැයි ප්‍රාර්ථනා කරමි.

8. 1971 දීත්, ඉන් පසුව 1983 න් පසුවත් හදිසියේ ජීවිතක්ෂයට පත්ව, සාමාන්‍යයෙන් මනුෂ්‍ය ප්‍රාණයකට අවසාන ගෞරව දැක්වීමේදී ලැබෙන පුණ්‍ය ශක්තිය නොලබා, ඒ නිසාම සාමකාමී නැවත ඉපදීමකට ඉඩ නොලැබ, අමනුෂ්‍ය වේශයෙන් ශ්‍රී ලාංකික සමාජයේ මනෝමය පරිසරය තුළ සැරිසරන හිටපු මිනිස් ප්‍රාණ දස දහස් ගණනකි. ඒ සංඛ්‍යාවට අදත් දිනපතා හතලිහක් පමණ එකතු වේ. අප රටේ ජනගහනයෙන් විශාල අනුපාතයක සිත්, මේ අමනුෂ්‍ය ප්‍රාණ විසින් ඉදිරියටත් විකෘති කොට, විනාශ නොකිරීමට නම්, ඔවුන් වෙනුවෙන් ආගමික පිළිවෙත්වලට අතිරේකව භාවනාමය ආධ්‍යාත්මික ශක්තියක් යොමු කිරීමෙන් ඔවුන් නිවීමට සමත් බලයක් මුදා හැරිය යුතුය. ඔබතුමා ඒ ශක්තිය තිබෙන අය ගැන දන්නා නිසා, මේ අවශ්‍ය කාර්යය සඳහා ඔවුන් යොමු කිරීමෙන් ඉදිරියටත් සිදු වන මහා විනාශය මග හරවන්න. මෙය සුළු කොට තකන්න එපා. හමු වූ අවස්ථාවක මේ සඳහා මා සොයා ගත් දේ ඔබතුමාට පවසන්නම්.

9. නිල නොවන මගක් යොදා ගෙන අපේ මූලස්ථානයට පැමිණෙන්නැයි ඔබතුමාට මා පැවසුවා මතක ඇත. එහෙත් පසුගිය වසර තුළ දී සර්වෝදය නිර්මාණය කළ නව ශිල්පීය ක්‍රම පිළිබඳව ඔබතුමා ගෙන්වා අදහසක් දීමට පසුගිය වසර තුළ තිබූ තත්ත්වය නිසා මා අපොහොසත් වීම රටේ අවාසනාවක් කොට සලකමි. කෙසේ නමුත් අතීතය මතකයක් පමණකි. අනාගතය සිතුවිල්ලක් පමණි. සැබෑව මේ මොහොත පමණකි. ඒ නිසා මේ මොහොතේ ද කල්‍යාණ මිත්‍රයෙක් වශයෙන් ඔබතුමාට ආයුබෝවන් කියමි. මගෙන් අවශ්‍ය සේවයක් ඇතොත් දන්වන්න. මා වහාම පැමිණ නිශ්ශබ්දව ස්වේච්ඡාවෙන් උදව් වෙන්නම්.

10. මා කලින් එවූ සුබ පැතුම් ලිපි දෙක ලැබුණේ දැයි නොදන්නා නිසා, මේ ලිපිය ලැබුණු බව පමණක් දන්වූවහොත් කෘතඥවෙමි. මම ජනවාරි 25 දායින් පසු රටින් බැහැරව යන නිසා මා වෙනුවෙන් ඒ උදව්ව කරන්න. එවිට මගේ සිත නිදහස්ව මට යා හැකිය. ඔබතුමා නැවත හදවතින්ම මා විශ්වාස කරන ඕනෑම අවස්ථාවක මා පිළිගත් සාරධර්ම අනුව අපේ ජනතාව වෙනුවෙන් නිස්සරණ සේවයක යෙදීමට මා කොතැන සිටියත් ඔබ හා එක්වෙනු ඇත. මැතිනිය හා දරුවනට මාගේ ආශිංසනය දෙන්න.

ශ්‍රී ලංකාවාසී ජනතාව සාමයේ සමගියේ ක්ෂේම භූමියට ගෙන යෑම සඳහා ඔබතුමාට සැබෑ කල්‍යාණ මිත්‍ර සේවය ලැබේවා'යි ද තෙරුවන් සරණින් දෙවි පිහිටෙන් ඔබතුමාගේ ජාතික නායකත්වය සාර්ථක වේවාය'යි ද හද පත්ලෙන්ම මම ප්‍රාර්ථනා කරමි.

ස්තුතියි!

මෙයට - සේවයෙන් බැඳි,

ඒ. ටී. ආරියරත්න.

විනිශ්චය දිය යුත්තේ ජනතාවයි
රහස් පොලීසියට ප්‍රකාශයක්

මීට දින කිහිපයකට පසු එනම් 1989 ජනවාරි මස 11 වෙනිදා ජාතික රහස් තොරතුරු සෙවීමේ ආයතනය බාර උප පොලිස්පති සර්නි විජේසූරිය මහතා මට දුරකතනයෙන් කතා කළේය.

මා කර තිබෙන ප්‍රකාශයක් පිළිබඳව විභාගයක් කිරීමට ජනාධිපතිතුමා නියෝග කර තිබෙන බවත්, කනගාටුවෙන් වුවත් එම විභාගය සඳහා මා මුණ ගැසීමට අවශ්‍ය බවත්, එතුමා ප්‍රකාශ කළේය. මේ ගැන මම ඉමහත් කම්පනයට පත් වීමි. කෙසේ නමුත් එය නොපෙන්වා පැය බාගයක් ඇතුළත එතුමාගේ කාර්යාලයට මම පැමිණෙන බව එතුමාට දැන්වීමි.

මම වෝඩ් පෙදෙසේ පිහිටි එම රහස් පොලිස් කාර්යාලයට ගොස් වාහනය නවතන විට, විජේසූරිය මහතා ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු ඉතා කරුණාවන්තව සහ ගෞරව පූර්වකව වාහනය ළඟට පැමිණ මා පිළිගෙන, එතුමාගේ කාමරයට කැඳවා ගෙන ගියේය. හැම දෙනෙක්ම මෙම පරීක්ෂණය ගැන පුදුම වී සිටි අතර, මා දෙස සානුකම්පිතව බැලූහ. සර්නි විජේසූරිය මහතා සහ මා පමණක් කාමරයේ ඉතිරි විය. එතුමා මගෙන් ඇසූ ප්‍රශ්නය මෙසේය:

''තිස්දාහක් පමණ වූ මිනිස් ඝාතනයක් මේ වසර තුළ දී සිදු කරනවා යයි ඔබ ප්‍රකාශ කළ බව ජනාධිපතිතුමා දැන ගෙන තිබේ. මෙම තොරතුරු ඔබට ලැබුණේ කෙසේද?''

''මා මේ ප්‍රකාශය කර තිබෙන්නේ කොහේදී ද?'' මම ඇසීමි.
''මහනුවරදී'' යයි ඔහු පිළිතුරු දුනි.

මට එක්වරම සෙනෙවිරත්න මහතා සමඟ කළ ප්‍රකාශය මතක් විය. ඒ අතරම මට සිනහ ගියේය. මා මේ ප්‍රකාශය කළේ සෙනෙවිරත්න මහතා සමඟ පමණය. කෙසේ හෝ වැරදි අන්දමට විග්‍රහ වී ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කනට එය වැටී තිබේ. ඉහත සඳහන් කළ සම්පූර්ණ සිද්ධිය ඒ ආකාරයෙන් සර්නි විජේසූරිය මහතාට පැවසීමි. එතුමාට කාරණය අවබෝධ විය. අප දෙදෙනාටම මේ සිද්ධිය හාස්‍යයට කරුණක් විය. කෙසේ නමුත් මම එතුමාගේ කාර්යාලයෙන් පිටව ගියේ තදබල සිත් වේදනාවකිනි. විජේසූරිය මහතා විසින් මා පරීක්ෂාවට ලක් කොට, යවන ලද වාර්තාව සමහර විට අදත් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මහතාගේ කාර්යාලයේ තිබිය හැකිය.

මාස කිහිපයකට පසු මා පිටරට ගොස් සිටියදී, හදිසියේම බර්ටි සෙනෙවිරත්න මහතා හෘදයාබාධයකින් මිය ගිය බව අසා මම දුක් වීමි. මෙම සිද්ධියේ සුලමුල එතුමාගෙන් අසා දැන ගැනීමට මේ නිසා මට ක්‍රමයක් නොතිබිණි. එහෙත් මා පළ කළ අනාවැකිය එනම් තිස්දාහකට අධික පිරිසක් 1989 වර්ෂයේදී ඝාතනවලින් මිය යන බව සැබෑ වූ බව දැන් නොදන්නා කෙනෙක් නැත.

සර්නි විජේසූරිය මහතාගෙන් ඇරඹුණු රහස් පරීක්ෂණය ආරම්භය පමණකි. එදින සිට දිගින් දිගටම රහස් පොලිස් පරීක්ෂණ ඇතුළු සියලුම රාජ්‍ය ආයතන පෞද්ගලිකව මටත්, පොදුවේ අප ව්‍යාපාරයටත් පහර දීමට පටන් ගත්හ. මුල් වසරේදී මේවා ගැන කිසිවෙකුටත් නොදන්වා සිටියෙමි. එහෙත් සර්වෝදයට පහර දීම භීෂණය මැද්දේ රට පුරා සිදු වූ නිසා, තවදුරටත් නිශ්ශබ්දව සිටීම බුද්ධිගෝචර නොවන බව මම අදහස් කළෙමි. ඒ අනුව 1991 මාර්තු මස 12 දා පහත සඳහන් ප්‍රකාශය මුද්‍රණය කොට විශාල වශයෙන් බෙදා හැරියෙමි.

''මමත්, මගේ සහෝදර සර්වෝදය සේවක සේවිකාවනුත් අපේ ජීවිතවල හොඳම කාලපරිච්ඡේදය අපේ ජනතාවගේ යහපත

සඳහා සේවයට කැප කළෙමු. පසුගිය දශක කිහිපයේදී දේශපාලන වේදිකාවලින් ජනතා සුභසිද්ධිය ගැන කතා කළවුන්, ඔවුන්ගේ සේවාව හරිහැටි ඉටු කළේ නම්, සර්වෝදය වැනි සංවිධානවල සේවාවන් සමහර විට ජනතාවට අවශ්‍ය නොවීමට ඉඩ තිබුණි. එහෙත් මෙහි විනිශ්චය දිය යුත්තේ ජනතාව විසින් නිසා අපි එය ජනතාවටම බාර කරමු.

රාජ්‍ය බලධාරීන් විසින් සම්පූර්ණ රාජ්‍ය තන්ත්‍රය සහ රට අයත් මාධ්‍යයන් උපයෝගී කොට ගෙන විශේෂයෙන් පසුගිය දෙවසර තුළ දී පහත සඳහන් කරන මාදිලියේ ක්‍රියා තුළින් සර්වෝදයටත්, මටත් වේදනාවන් දුන් බව ප්‍රකාශ කරන්නේ දැඩි කනගාටුවෙනි.

1. අපේ නව ජනාධිපතිතුමා දිවුරුම් දී සතියක් ඇතුළත දී (පොලීසියේ) ජාතික විමර්ශන ආයතනයේ ප්‍රධානියා විසින් මගෙන් ප්‍රශ්න කරන ලදී.

2. අවුරුදු ගණනාවක් තිස්සේ අප විසින් ගෙන ගිය සතිපතා සර්වෝදය ගුවන් විදුලිය වැඩ සටහන හිටි හැටියේම අත්හිටවන ලදී.

3. 1990 ජූනි මාසයේදී අල්ලස් කොමසාරිස්වරයා විසින් මට ප්‍රශ්න මාලාවක් එවූ අතර, එයට පිළිතුරු සැපයීමි. එහෙත් අද වන තුරු මගේ නම නිදහස් කිරීමක් හෝ එය ලැබුණු බව දන්වීමක් හෝ කර නැත.

4. රූපවාහිනියෙන් හා ගුවන් විදුලියෙන් අප සංවිධානයේ විශේෂ අවස්ථාවන් ප්‍රචාරය කිරීම සම්පූර්ණයෙන් නවත්වන ලදී. අගමැතිතුමා සහ ඇමතිවරු පවා සහභාගි වුණු විශේෂ අවස්ථාද මේ අතර විය.

5. සර්වෝදය සංවිධානයට සහ මට නින්දා අපහාස වන විදියේ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට ඕනෑ තරම් කාලය සහ ඉඩකඩ මේ මාධ්‍යවලට තිබුණු නමුත්, මා විසින් යම් හොඳ දෙයක් කළේ නම්, ඒ සඳහා කාලය හෝ ඉඩකඩ ඔවුනට නොතිබිණි. එහෙත් ජාත්‍යන්තර මාධ්‍යයන් මගින් ඒවාට නිසි පිළිගැනීම ලැබිණි. 1990 ජූලි මාසයේ නෝර්වේ රටේ ඔස්ලෝ නගරයේදී ජාත්‍යන්තර අමද්‍යපයන්ගේ සංගමය විසින් පිරිනැමුණු ඕගස්ට් ෆෝරල් ජාත්‍යන්තර ත්‍යාගය සහ නොවැම්බර් මාසයේදී ඉන්දියාවෙන් ලැබුණු ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර සාම ත්‍යාගයට ද නිසි ප්‍රචාරය දීම රාජ්‍ය මාධ්‍යයන්ගෙන් සිදු නොවිණි.

6. මගේ අවධානයට යොමු කරන ලද රහස් පොලිස් පරීක්ෂණ සංඛ්‍යාව සඳහන් කිරීමට ද අපහසුය.

intervened to help evacuate several Tamil civilians

Arular who said former EDF MP Parara-

Lanka last week is among the earliest applicants for

father was the last British Mayor of Colombo.

SUNDAY TIMES 1990.12.30

Sarvodaya chief hits out at "dirty politicians"

Sarvodaya Leader A.T. Ariyaratne has challenged the government to prove allegations, against the Sarvodaya movement made by people whom he described as dirty politicians.

Addressing the annual general meeting of the Lanka Jathika Sarvodaya Shramadana Sangamaya at Moratuwa Mr. Ariyaratne said, neither he nor his movement was afraid of the government's move to probe the activities of the Non-governmental Organisations operating in the country.

"I ask the government to place before courts whatsoever it has discovered against Sarvodaya so that we could be punished if we have committed any offence," the Sarvodaya leader told delegates.

In a hard-hitting speech Mr. Ariyaratne lashed out at the government controlled media, accusing it of trying to discredit his movement.

He predicted a day would come when the Sarvodaya movement would be compelled to hit back at the 'dirty' politicians who had obstructed its work.

"There is the possibility of the person called Ariyaratne disappearing from the scene mysteriously. "But," by "eliminating a person one cannot kill a movement like Sarvodaya." Dr. Ariyaratne said.

"Therefore I have decided to decentralise the activities of the movement from next year" he added.

The Sarvodaya leader disclosed that donor countries had refused to give aid to the movement this time.

President Premadasa recently appointed a commission headed by former Supreme Court Judge R.S. Wanasundara to probe all activities of the NGOs operating in the country. The move followed information that certain NGO funds had allegedly been utilised for acts detrimental to the interests of the country.

සර්වෝදය පිළිබඳ මා කළ ප්‍රකාශයක් "Sunday Times" ප්‍රවත්පතේ පළකර තිබූ අයුරු

7. කෙලින්ම මගේ නම සඳහන් කර හෝ වක්‍රව ලේක්හවුස් පුවත්පත්වලින් 25.12.90 (ඩේලිනිවුස් සහ දිනමිණ) 27.01.91 (සිළුමිණ) 03.02.91 (සන්ඬේ ඔබ්සවර්) මා හා සර්වෝදය පිළිබඳව ද්වේශ සහගත වූත්, වේදනාකාරී වූත්, වාර්තා ප්‍රකාශයට පත් කර ඇත.

මටත් මගේ පවුලේ අයවලුන්ටත් විඳින්නට සිදුවූ සෙසු වේදනා කරදර ගැන අවශ්‍ය වුවහොත් සඳහන් කිරීම පසුවට කල් තබමි. මටත් සර්වෝදයටත් විරුද්ධව ගෙන යන මෙම මඩ ගැසීමේ ව්‍යාපාරය පිටුපස තිබෙන හස්තය කවරේ දැයි පැහැදිලි නිසා ඒ සඳහා විශේෂ හැඳින්වීමක් මගෙන් අවශ්‍ය නැත. එයත් මහජන විනිශ්චය සඳහාම තැබීම වඩා හොඳය.

කෙසේ නමුත් මෙවැනි ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගවල කනගාටුදායක ප්‍රතිඵල පෙන්වා දීමට කැමැත්තෙමි. මෙවැනි ක්‍රියාමාර්ග අපේ ජනතාව කෙරෙහි බලපාන්නේ කෙසේද? අතිශය නැති බැරිකම්වලින් පෙළෙන පිළිසරණක් නැති ජනතාව තවදුරටත් නොසලකා හැරෙන නිසා, නිරතුරුවම ඔවුන් පෙළීම්වලට යටත්වීම මෙහි එකම ප්‍රතිඵලයයි.

මගේ උපරිම හැකියාව යොදා මගේ රටට සේවය කර ඇත්තෙමි. එය ජනතාව දනී. ජාත්‍යන්තර වශයෙන් විශාල ලෙස ඒ සේවය පිළිගෙන තිබීම ද සැනසීමකි. එවගේම සතුටකි. මගේ සේවාවන්වලට අමතරව 1969 යේ රමන් මැග්සයිසයි ත්‍යාගයේ සිට මා පෞද්ගලිකව ලැබූ සියලුම ජාත්‍යන්තර ත්‍යාග සමඟ හිමි වූ සියලුම මුදල් මගේ ජනතාව වෙනුවෙන් සර්වෝදයට පරිත්‍යාග කර ඇත්තෙමි. 1982 දී ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ලැබූ බෙල්ජියමේ බෝඩුවින් රාජ්‍ය සම්මානයේ සිට 1990 නොවැම්බර් මාසයේ ලැබූ ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර සාම ත්‍යාගය දක්වා වූ සියලුම ත්‍යාගවලින් ලැබූ ඇමරිකානු ඩොලර් ලක්ෂයකට අධික වූත් (රුපියල් ලක්ෂ 43 කට අධික වූත්) සියළුම මුදල් මා විසින් යොමු කර ඇත්තේ මා මෙන්ම, මනුෂ්‍ය වර්ගයාගේ සංවර්ධනය සහ සාමයේ

ප්‍රගතිය උදෙසා සේවය කරන්න වුනට අත දීමටය. පෞද්ගලිකව ලැබී ඇති මෙම මුදල් 1984 අංක 31 දරන පාර්ලිමේන්තු පනතින් නීතිගත කරන ලද සර්වෝදය භාර අරමුදලට මා විසින් බැර කර ඇත. ඒවා කිසිවෙකුට ණයට දී නැත.

මෙම සර්වෝදය භාර අරමුදල 1972 අංක 16 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත කරන ලද සංගමයට වඩා සම්පූර්ණයෙන් වෙනස්ය.

රාජ්‍ය පාලනය යටතේ තිබෙන මාධ්‍යවලින් සර්වෝදයට සහ මට නිග්‍රහ කිරීමට කුමන අන්දමේ ලිපි හා ප්‍රවෘත්ති පළ කළත්, රාජ්‍ය නොවන සංස්ථා සඳහා සෙවීමට පත් කරන ලද ජනාධිපති කොමිසම ගැන අපි සතුටු වීමු. හේතුව, නීතිය සහ සාධාරණත්වය ඉටු කර ගැනීම සඳහා මෙම අපක්ෂපාතී කොමිසම අපට පිහිට වේ යයි බලාපොරොත්තු වන නිසාය. එහෙත් මේ කොමිසමේ වගකීම් ඉටු කරන තෙක් නොඉවසිලිමත් වූ සමහරු එයට සමාන්තරව කොමිසම ඔවුනට දෙන අවස්ථාව ප්‍රයෝජනයට ගෙන මටත් සර්වෝදයටත් මඩ ගැසීමේ ද්වේශ සහගත අරමුණු පෙරටු කරගත් ව්‍යායාමයක නියැලී සිටිත්.

දේශපාලනමය නොවන, මහජන සේවයක දශක හතරක් පමණ යෙදී සිටි මට සේවයෙහි යෙදෙන අයවලුන් විසින් මුහුණ දිය යුතු නොතකා හැරීම, සමච්චලයට භාජනය වීම, අපහාසවලට ලක් වීම, ශාරීරික වේදනා ලැබීම සහ ගෞරවය හිමිවීම යන අවස්ථා පහම පසු කොට උපේක්ෂා ගුණය වර්ධනය කර ගැනීමට මහත්මා ගාන්ධිතුමා විසින් දී තිබෙන උපදේශය අනුගමනය කිරීම හොඳට පුරුදුය. මෙවැනි අවස්ථාවකදී වුවත් මා පිළිගත් සාරධර්ම සහ ප්‍රතිපත්තිවලින් මම බැහැර නොවෙමි. කිසිවෙකුගේ අයුක්ති සහගත විධානවලට හෝ බලපෑම්වලට යටත් වීමට මා සූදානම් නැත. මම පරමාදර්ශයක් වෙනුවෙන් ජීවත්වෙමි. මට නැතිවීමට රැකියාවක් නැත. එහෙත් මගේ ජනතාවගේ සේවය සඳහා කැපවීමට රටේ සාධාරණ නීතියත්, ධාර්මික නීතියත් මට අහිමි වේ නම් මට සියල්ල

අභිමි වූවා සේය. මගේ රටින් සේවා සුදුසුකම, හැකියාව සහ සේවයට කැපවීම යන ගුණාංග තුරන් නොවේ යැයි මම විශ්වාස කරමි.

ඒ.ටී.ආරියරත්න,
සභාපති,
ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය,
දම්සක් මන්දිරය,
මොරටුව.

1991.03.12

1991 අප්‍රේල් මාසය වන විට අපගේ ආරක්ෂක තත්ත්වය තවත් අනතුරුදායක වූ නිසා ඕනෑම තත්ත්වයකට මුහුණ දීමට සූදානම්ව දෙවැනි ප්‍රකාශයක් ද 1991 මැයි 01 වෙනි දින නිකුත් කළෙමි.

''සර්වෝදය සංසදයටත්, මටත්, මගේ පවුලේ අයවලුන්ටත් විරුද්ධව රාජ්‍ය පාලනය යටතේ පවතින පාලන ව්‍යුහයත්, මාධ්‍යයනුත් විසින් දිගින් දිගටම කර ගෙන යනු ලබන හිරිහැර පිළිබඳව 1991 මාර්තු මස 12 වැනිදා මම ප්‍රකාශයක් නිකුත් කළෙමි. 1991 මාර්තු මස 22 වැනි දා දේශීය හා විදේශීය මාධ්‍යය නියෝජිතයින්ට ඇරයුම් කොට පුවත්පත් සාකච්ඡාවක් ද පැවැත්වූයෙමි.

ඊයේ මැදියම් රැයෙන් පසු නිර්නාමික පුද්ගලයකුගෙන් 8 වැනි වතාවටත් මරණීය තර්ජනයක් ලැබුණු පසු, මෙම දෙවැනි ප්‍රකාශනය නිකුත් කිරීමට මම තීරණය කළෙමි. මමත්, මගේ පවුලේ සාමාජිකයනුත් අද පෞද්ගලිකව අත් දකින මෙම භයානක තත්ත්වය, අපේ සහෝදර රටවාසීන් දහස් ගණන් අත් දකිනු ලැබුවා වූත්, අද ද අත් දකින්නා වූත්, තත්ත්වයක් නිසා මෙවැනි ප්‍රකාශනයක්

කිරීම අවශ්‍යය. මෙම ප්‍රකාශනය මගින් අප ජීවත් වන්නේත්, අප අපේ ජනතාවට සේවය කරන්නේත් කුමන තත්ත්වයක් යටතේ දැයි අපේ සාමාජිකයින්ටත්, අපේ සේවය අගය කරන්නන්ටත්, පොදුවේ නිදහස සහ සාධාරණත්වය ගරු කරන සෑම දෙනාටත්, දැනුම් දීමට අදහස් කරමි. මගේ පළමු ප්‍රකාශනය කියැවූ බොහෝ දෙනෙක් ඔවුන්ගේ අනුකම්පාව, විමසිලිවත් බව, සහෝදරත්වය සහ ධෛර්යය පළ කෙරෙන පණිවුඩ එවා තිබිණි. මේ අතර දේශීය සහ විදේශීය පුද්ගලයන්, සංවිධාන, මානව අයිතිවාසිකම් පිළිබඳ සේවකයෝ රාජ්‍ය තාන්ත්‍රිකයෝ, ආගමික නායකයෝ සහ අපේ සංවර්ධන සහයෝගිතා ආයතන ද වූහ. ඔවුන්ට මගේ අවංක ස්තුතිය පිරි නමමි.

1991 මාර්තු 12 වැනි දින සිට ද්වේශ සහගත වූත්, චරිත ඝාතනය දිගින් දිගටම සර්වෝදයටත්, මටත් විරුද්ධව රජයේ පාලනය යටතේ තිබෙන ලේක්හවුස් පත්‍ර විසින් කර ගෙන යන ලදි.

17.03.1991 (සන්ඩේ ඔබ්සවර්), 12.03.1991 (ඩේලි ඔබ්සවර්), 21.04.1991 (සන්ඩේ ඔබ්සවර්), 28.04.1991 (සන්ඩේ ඔබ්සවර්), 28.04.1991 (සිළුමිණ), 28.04.1991 (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රකාශනය)

වැරදි හේතූන් යටතේ වුවත් රජය විසින් වැඩිම සැක සහිත ප්‍රසිද්ධියක් වර්තමානයේදී ලබා දෙන පුද්ගලයා බවට මා පත්ව තිබේ. රජයේ පාලනය යටතේ තිබෙන පුවත්පත් සහ වෙනත් මාධ්‍යයන් සර්වෝදය සංසදය සහ මා හෙළා දැක්වීමට මහජන මතයක් ගොඩනැංවීමට තැත් කරන්නේ, විකෘති කරන ලද්දා වූ පිළුණු වූ විවිධ ප්‍රවෘත්ති මාර්ගයෙනි. උදාහරණයක් වශයෙන්, ඉරිදා ඔබ්සවර් පත්‍රයේ .සර්වෝදය විසින් ලාංකික දරුවන් ලාභය සඳහා විකුණයි. යන අමූලික බොරුවක් පළ කරයි. අප සර්වෝදය සංසදයේ ඉතිහාසයේ කිසි දිනෙක, විදේශිකයකුට අප භාරයේ සිටින දරුවකු දී නැත. මෙම සදාචාර විරෝධී ළමා ජාවාරමට මුලින්ම විරුද්ධ වූයේ සර්වෝදයයි. අදත් ඉතා බලගතු පුද්ගලයන් ගේ ආවරණ යටතේ ළදරු ජාවාරම දිගින් දිගටම කර ගෙන යති.



නීතිඥ ආර්. කේ. ඩබ්ලිව්. ගුණසේකර

සර්වෝදයේ මූලික අයිතිවාසිකම් නඩුව

නීත්‍යානුකූල ලෙස ක්‍රියා කළා

සර්වෝදය පිළිබඳව පළවූ පුවත්පත් වාර්තාවක්

පහත් දේශපාලන පරමාර්ථ ඇතිව ගෙන යන මෙම ප්‍රචාර මගින් සර්වෝදය හා දශක ගණනක් වැඩ කළ අහිංසක පිරිසිදු හදවත් ඇති ජනතාව මෝඩ කිරීමට ලැබෙන්නේ නැත. නැවත නැවතත් පළ කරන්නා වූ මෙවැනි ත්‍රාසජනක, අසත්‍ය ප්‍රවෘත්තිවලට සමහර විට සර්වෝදය සේවාවන් ගැන අත්දැකීම් නොමැති සමහර නාගරිකයන් නම් රැවටෙන්නට පුළුවන. රාජ්‍ය නොවන සංවිධාන ගැන කරුණු සෙවීමට ජනාධිපති කොමිසමක් පත් කර තිබිය දී, මේ අන්දමින් ලේක්හවුස් ආයතනය විසින් සත්‍යය වසන් කිරීම ගැන මම බලවත් සේ කනගාටු වෙමි.

නීතියත් සාධාරණත්වයත් අතරේ පවතින පරතරය වැඩි වන යුගයක, අපට වඩා විශ්වාසය තබන්නට සිදු වී තිබෙන්නේ .සත්‍යය ජය ගනී - සත්‍ය මෙව ජායතෙ සහ ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින් ආරක්ෂා කරයි - ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී. යන ධර්ම නීතිය කෙරෙහිය.

මාධ්‍යවලින් ගෙන යන මෙම ප්‍රහාරයට අමතරව මා හා මගේ පවුලේ අයවලුන් යන එන වාහන පිටුපස නිතරම වෙනස් කරන ලද නොම්බර තහඩු ඇති වාහනවල නොහඳුනන පිරිස් අප පසු පස එති. මේ නිසා අපේ වැඩිමහල් දරුවෝ ජීවත් වූ නිවෙස් වසා දමා ඔවුන් ද ඕනෑම අතවරයකට මුහුණ දීමට සූදානම්ව අපේ නිවසේම පදිංචි වී සිටිති.

මීට අමතරව රහස් පොලීසියේ පරීක්ෂකයෝ අපේ විධායක අධ්‍යක්ෂතුමා සහ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් ප්‍රශ්න කොට තිබේ. ඔවුන් ඉතා කරුණාවන්තව, එම රාජකාරී කළ බව සඳහන් කළ යුතුය. එහෙත් රජයේ නොවන ආයතන පරීක්ෂා කරන කොමිසමේ විධාන පිට යැයි කියා තවත් නොහඳුනන පරීක්ෂක කණ්ඩායම්, අපේ සමහර සේවකයින් හමුව මටත්, සර්වෝදයටත් විරුද්ධව ප්‍රකාශන කරන්නට යැයි තර්ජන කළ අවස්ථාද මගේ අවධානයට යොමු කර තිබේ. මෙයින් සමහරෙක් ගැන අපි වගකිව යුත්තන්ට වාර්තා කෙළෙමු. බිය පැතිරී ඇති තත්ත්වයක් යටතේ මොවුන් කවුරුන් දැයි සෙවීමට අපට ක්‍රමයක් නැත.

කෙතරම් අනතුරුදායක වුවත්, පසුගිය සති කිහිපයේදී මම සර්වෝදය ගම්මානවලට ගොස් දහස් ගණන් ගම්වාසීන් මුණ ගැසුනෙමි. අපේ ජීවිතයේ වැඩි කලක් අප අනුගමනය කරන ප්‍රතිපත්ති සහ සර්වෝදයේ අප කෙරෙහි කිසිම තැනක ගැමි ජනතාවගේ විශ්වාසය අඩු වී නොමැති බව මා ප්‍රකාශ කරන්නේ සතුටිනි. මේ සියලුම පීඩන මැද්දේ 8000 කට අධික වූ ගම්මානවල ජනතාව ඔවුන්ගේ ස්ව සංවර්ධන කටයුතුවල අඛණ්ඩව යෙදී සිටිති. මගේ එකම කනගාටුව වෙනත් කිසිදු පිළිසරණක් නොමැතිව දිනපතා සර්වෝදය මධ්‍යස්ථානවලට පැමිණෙන විවිධ අවශ්‍යතාවලින් පෙළෙන දහස් ගණන් ජනතාවට කළ හැකි උදව් මේ කරදර නිසා සීමා වී තිබීමයි. අප වෙතට මෙවැනි අවශ්‍යතාවලින් පෙළෙන අය යොමු කරන අය අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ ඇමතිවරු ද වෙති. තවත් දින කිහිපයකින් පළාත් පාලන ඡන්දයක් පැවැත්වේ. කෙතරම් පීඩනවලට සර්වෝදය භාජනය වුවත්, අප කිසිදු දේශපාලන පක්ෂයක පැත්තක් ගෙන නැත. අපක්ෂපාතීව සර්වෝදය දර්ශනයට අනුකූලව ආධ්‍යාත්මික සහ සමාජ සංවර්ධන කටයුතුවල ජනතාව සමඟ යෙදීම අපේ ප්‍රතිපත්තියයි.

මූලික මානව අයිතිවාසිකම් ගැන විශාල ගෞරවයක් දක්වන අපි, ජනතා සහභාගිත්වක ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන විශ්වාසය තබන නිසා, පක්ෂ සහ බලකාමී දේශපාලනයෙහි ඉදිරියටත් නො යෙදෙන්නෙමු. අපට කරදර කරන්නවුන් කෙරෙහි පළිගැනීමේ චේතනාවක් හෝ වෛර කිරීමක් හෝ අප තුළ නැත.

ප්‍රතිපත්ති විරහිත දේශපාලකයින් සහ ඔවුන් හා එකතුව සිටින ආත්මාර්ථකාමී පුද්ගලයින්ගෙන් පසුව ද, අප අපේ මරණය දක්වා අප මෙතෙක් ජීවත් වූ ප්‍රතිපත්ති මාලාවක් තිබුණේ ද, ඒවා අපෙන් පසුවත් පුද්ගලයාත්, පවුලත්, ප්‍රජාවත්, රටත් සමස්තයක් වශයෙන් ලෝකයත් පෝෂණය කරමින් ජීවත් වනු ඇත. සර්වෝදය යනු අපට මඩ ගසන සහ අපව විනාශ කිරීමට තැත් කරන අයවලුන් ඇතුළු සියලු දෙනාගේම උදාවක් ඇති කරන උතුම් ව්‍යායාමයකි.

සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!

ක්‍රෝධය මෛත්‍රියෙන් ජය ගන්න
අධම පුද්ගලයා ධර්මයෙන් ජය ගන්න
ලෝභී පුද්ගලයා පරිත්‍යාගයෙන් ජය ගන්න
බොරු කියන්නා සත්‍යයෙන් ජය ගන්න

(ධම්ම පදය)

ඒ.ටී. ආරියරත්න,
සභාපති,
සර්වෝදය ශ්‍රමදාන සංගමය, 'දම්සක් මන්දිරය',
රාවතාවත්ත පාර, මොරටුව, ශ්‍රී ලංකාව.
1991 මැයි 01 දින.

අසීමිත බලය හසුරුවන විට හෙවණැල්ලට ද බිය වේ නපුරු සිහිනයක්

1992 දෙසැම්බර් සහ 93 ජනවාරි මාස දෙක තුළ කිහිප වරක්ම, ප්‍රේමදාස මහතාව මම සිහිනෙන් දුටුවෙමි. 1993 මැයි 01 වනදා සිදුවූ ශෝචනීය සිද්ධිය ඒ ආකාරයෙන්ම මම නේපාලයේ කත්මණ්ඩු නුවරදී සිහිනෙන් දුටුවෙමි. එතුමාගේ පාලන සමයේදී මටත්, සර්වෝදය ව්‍යාපාරයටත් එතුමාගෙන් කෙබඳු හානියක් සිදුවුවත්, ඔහු කෙරෙහි සානුකම්පිත මෛත්‍රී සිතක් මිස, වෛරයක් ඇති කර ගැනීමට තරම් මම දුර්වලයෙක් නොවීමි. යමෙක් තමාට කළ නරක නොව, හොඳ පමණක් මතක තබා ගැනීම මා ගරු කරන ප්‍රතිපත්තියක් නිසාය.

මා 1989 දී අප්‍රිකාවේ යුගැන්ඩා රටේ ලෝක බැංකුව වෙනුවෙන් විශේෂඥ මෙහෙවරක යෙදී සිටි අවස්ථාවේ, ප්‍රේමදාස මැතිතුමාගේ උපන් දිනය නිමිත්තෙන් එවූ පහත සඳහන් කවි පෙළින් මේ අදහස මතුවේ:

සිරිමත් ජනපති පෙම්දස් මැතිඳුනි
විය පත් දිනු දින එන බව සිහිවිණි
සුවපත් වී දිගුකල් ජය පතමිනි
මෙමපත් කම්පාලා සිට ලියැවිණි

සොබා සවිය දහම් බලය සම්දිටු දෙවියන්ගෙ රැක්ම
ලබා සිතෙහි සතිය සරුව සම්බුදු හිමියනගෙ දැක්ම
නොබා පෙරට යෑමට මග එන බාධක සැවොම ඉක්ම
තබා බැතිය පතමි මැතිඳ හද පතුලෙන් හැඟුම් නික්ම

දස වසකට පෙර ඔබ දිනු දිනෙකත් මෙලෙසම පැතුවා
රස වහරින් ඔබ ගැන මා තුළ තුබු පැතුමන් ගෙතුවා
බස රැස දෙස දහමින් රැකුමට වැඩුමට මං සිතුවා
මිස දිටු පරගැති බව හළ දිවයිනකට දන නතුවා

ගිය වස මැද සිට කළ අදිටනක් අනුව සරමි ලොවේ
ගත සිත වේදනා මඬිමි විඳ නොකැඩුනු බවුන් සුවේ
දත් දේ පුද දෙමි නව දැනුම ද ලැබගෙන දවස ගෙවේ
එහි ප්‍රතිඵල දිනෙක දුබල අපෙ පොදු දනනට හිමිවේ

බල නිල දන කිත් පැසැසුම් පරයන තිසරණ සුවයට
හෙළ කැල මන පත් වන මෙන් සව්දන පිළිවෙත මතු කොට
බිජු උතු දම් කම් සිත් නිය යළි රැක දී රට වැසියනට
නව නිදහස් යුගයක් හෙළි කරනු මැනවි මතු මතුවට

හොඳ අරමුණු වැරදි මගින් කිසිදා ඉටු නොවන නියා
සොහොයුරු ජනතාවට වටහා ගිනි අවි පසෙක තියා
මගෙ මව් බිම යළි ලොවැ සැබි මිනිස් බිමක් කරනු නියා
සපුරිස් නියමුවන් ඇසුර වේ බලයෙන් රුවන් තියා

අසීමිත බලයක් හසුරු වන අය හෙවණැල්ලකට පවා බියවෙත්. තමා සතු එම බලය යම් කෙනෙක් පැහැර ගනු ඇතැයි සැකයෙන් නිතරම තම සිත තුළ හොල්මන් කරයි. එනිසා යමෙකු ගැන සුළු හෝ සැකයක් ඇති වූ විට, ඒ පුද්ගලයා සම්පූර්ණයෙන්ම විනාශ කර දැමීමට ඒකාධිපති යටි සිත පෙළඹවේ. 1993 වසර ලබන විට එතුමා ළඟින් ඇසුරු කළ අය පවා එතුමා කෙරේ විශාල බියකින් පසු වූ බව, එම යුගය මතක තිබෙන කාටත් නොරහසකි. රජයේ පුවත්පතක් දිග හැරියත්, රූපවාහිනිය හෝ ගුවන් විදුලිය ගත්තත් ප්‍රේමදාස මැතිතුමාගේ කටහඬ හැර වෙන කිසිවක් අසන්නට දකින්නට ලැබුණේ කලාතුරකිනි. මුළු රටම බියෙන් ඇලලී සිටියේය.

මෙවැනි අවස්ථාවකදී පවා හැකියාවක් ඇතොත්, මගේ ප්‍රතිපත්ති නොකඩවා ඔහු සමඟ සම්බන්ධ වී, ඒ තත්ත්වය ටිකක් හෝ යහපත් අතට හැරවීමට මම ප්‍රයත්න දැරීමි. මට තිබූ ලොකුම බාධාව, අපට එරෙහිව පත් කර තිබුණු රාජ්‍ය නොවන සංවිධාන පරීක්ෂා කිරීමේ කොමිසන් සභාවත්, අප විසින් රජයට එරෙහිව පවරා තිබූ නඩු කිහිපයත්ය. මේවා තිබෙන අතර ඔහු සමඟ මිත්‍රවීමකට යෑම රටේ යහපතකට නොව, අපගේ වාසියක් සඳහා ගන්නා පියවරක් හැටියට ඔහු මෙන්ම, වෙනත් අයටත් සැක ඇති වීමට ඉඩ තිබිණි. වැරදි කරන්නාට මෛත්‍රී කිරීමත්, වරදට විරුද්ධව නොබියව අහිංසාවාදීව සටන් කිරීමත් මගේ ප්‍රතිපත්තිය විය.

මේ නිසා ප්‍රහාරාත්මක ස්වරූපයෙන් අපේ ආරක්ෂාව සඳහා දියත් කර තිබුණු පංචවිධ ක්‍රියාමාර්ගය නිර්භයව ඉදිරියට ගෙන ගියෙමු. රට ඇතුළේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද මා පෞද්ගලිකවත් ආයතනයක් වශයෙන් සර්වෝදයත් පත්ව ඇති භයානක තත්ත්වය පිළිබඳ මේ වන විටත් දැන ගතයුතු අය අප විසින් දැනුවත් කර තිබුණි.

නොනිමි විරසකය
හොඳ ගතිවලින් පමණක් ආදර්ශ ගනිමු

ආර්. ප්‍රේමදාස මැතිතුමා සුවිශේෂී පුද්ගලයෙකි. අධිෂ්ඨානශීලිත්වය අතින් ඔහු සමඟ සම කළ හැකි වෙනත් දේශපාලන නායකයෙකු මට මුණගැසී නැත. ජීවිතය තුළින් ජීවත් වීම සඳහා ජීවිතාන්තය තෙක් ලැබෙන සියලු අත්දැකීම් අධ්‍යාපනයක් වශයෙන් හැඳින්විය යුතු යැයි වරක් මහත්මා ගාන්ධිතුමා ප්‍රකාශ කළේය. මේ අතින් බලන විට ප්‍රේමදාස මැතිතුමා තරම්, තමාට අවශ්‍ය සෑම විෂයයක් පිළිබඳවම අධ්‍යයනය කළ තවත් නායකයෙකු පිළිබඳ මම නොදනිමි. ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හසුරුවීමට ඔහු ලත් ප්‍රාගුණ්‍යය පුදුම උපදවන සුළුය. ඔහුට සම කළ හැකි සංවිධායකයෙක් නොසිටියේය. ඕනෑම දෙයක් අකුරටම සැලසුම් කළා පමණක් නොව, නිශ්චිත කාල නිර්ණයකට අනුව අංග සම්පූර්ණව සැලසුම් කළ දෙය ක්‍රියාත්මක කළේය. ප්‍රමාදයක් හෝ කල් තැබීමක් හෝ ඔහුගේ දින චරියාවේ නොවීය. ඉතා අළුයමින් පිබිදුණු ඔහු, රාත්‍රී නින්දට යන තුරුම සෑම මිනිත්තුවක්ම සැලසුම් කර එයින් ප්‍රයෝජන ගත්තේය.

දේශපාලකයන් නිතරම මහජනතාව සමඟ ආශ්‍රය කළ යුතුය. ඔහු තරම් එම ගුණය ප්‍රගුණ කළ වෙනත් දේශපාලකයෙකු මේ රටේ සිටියේ නැත. සෑම පෝය දිනකම ඒ පෝයට වැදගත් වූ ස්ථානයන්හි අටසිල් සමාදන්වීමත්, ඒ තුළින් නිරායාසයෙන්ම දහස් ගණන් ජනතාව අතරට යෑමටත් ඔහු දැන සිටියේය. ආධ්‍යාත්මික සුවයක් පමණක් නොව, බාහිර සුවයක් ද එයින් ලැබෙන බව ඔහු අවබෝධ කර ගෙන සිටියේය.

දක්ෂයා දුටු තැන ඔහුගෙන් නියම සේවය ලබා ගැනීමට ප්‍රේමදාස මැතිතුමා නිපුණයෙක් විය. හැම රාජ්‍ය සේවකයෙක්ම

තමන්ගේ රාජකාරිය නොපිරිහෙලා ඉටු කිරීමේ තත්ත්වයක් රාජ්‍ය සේවය තුළ ඇති කිරීමට ප්‍රේමදාස මැතිතුමා සමත් විය. දක්ෂයා තෝරා ගැනීමේදී කුලයක්, ජාතියක්, පක්ෂය හෝ උගත්කම සෙවීමට ඔහු මහන්සි වූයේ නැත. අපේ සර්වෝදය මූලස්ථානය පිහිටි දම්සක් මන්දිර භූමියේ ජලය බැස යෑමට කිසිසේත් පිළිවෙලක් තිබුණේ නැත. දත් හැම උපක්‍රමයක්ම යෙදීමෙන් පසුව, අගමැති ප්‍රේමදාස මැතිතුමාට මේ ප්‍රශ්නය ඉදිරිපත් කළෙමි. පසු දින පාන්දරින්ම එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික ජල සම්පාදන හා ජලාපවාහන අංශයේ සභාපතිතුමා ඇතුළු පිරිසක් මා හමුවීමට පැමිණියෝය. සතියක් ගත වීමට පෙර මේ අමාරු කාර්යය අපේ ශ්‍රමදාන මට්ටමේ සහාය ද ඇතිව සම්පූර්ණ විය. අදත් මේ ප්‍රදේශය ජලයෙන් ආරක්ෂා වී තිබෙන්නේ එම ක්ෂණික ක්‍රියාමාර්ගය නිසාය.

වරක් එතුමා කළ ප්‍රකාශයක් පුවත්පත්වල තිබී කියවූ මා සුපුරුදු පරිදි උදේ 5.00 ට එතුමාට දුරකතනයෙන් කතා කළෙමි. ''ඔබතුමා මේ රටේ අගමැතිවරයා. පුවත්පත්වල පළ වී තිබෙන කතාව ඔබතුමාගේ තත්ත්වයට ගැලපෙන්නේ නැහැ. ඕක කෙලින්ම වෙනත් විදියකට කිව හැකියි. එය මම තේරුම් කර දුනිමි''. කොක් හඬ දී සිනාසුණ එතුමා මට ස්තුති කොට, එම කතාවම මා සඳහන් කළ ක්‍රමයට, එදාම රැස්වීමකදී කරන ලදී. එය පුවත්පත්වල පළ වූ පසු මට නැවත දුරකතනයෙන් කතා කළ එතුමා ''ඔන්න මම එය නිවැරදි කළා'' යි සිනාසෙමින් මා සමඟ පැවසීය.

බොහෝ අවස්ථාවල එතුමාගේ උදහස්වලට ලක් වූ යම් යම් නිලධාරීන් ඔවුන්ගේ දුක්ගැනවිලි මා සමඟ පවසන සිරිතක් විය. මෙහි සත්‍ය අසත්‍යතාවය සොයා බලා,එය සාධාරණ දුක්ගැනවිල්ලක් නම් එතුමාට දුරකතනයෙන් කතා කොට, එතුමා අතින් යම් නිලධාරියෙකුට අකටයුත්තක් සිදුවී තිබෙන බව මම ප්‍රකාශ කළහොත්, පැය 24 ක් යෑමට පෙර එතුමා කර තිබුණු වරදක් නම්, එය නිවැරදි කර දුරකතනයෙන් මට ඒ බව දන්වීමට තරම් ප්‍රේමදාස මහතා නිහතමානී විය. යම් අවස්ථාවකදී එතුමාට දුරකතනයෙන්

කතා කළ විට, එතුමා නොසිටියහොත් පැමිණි වහාම එතුමා විසින් ටෙලිෆෝන් කොට කතා කළේ ඇයි දැයි ඇසීම සිරිතක් විය. ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාට ද මේ නිහතමානී ගුණය තිබුණේය.

ප්‍රේමදාස මහතාගේ කාර්යක්ෂමභාවය සහ නිහතමානී බව පිළිබඳ මෙවැනි සිද්ධීන් රැසක් මගේ මතකයට එයි. මෙවැනි නිහතමානී අගමැති ප්‍රේමදාස මැතිතුමා, ජනාධිපති ධූරයට පත් වූ පසු බෙහෙවින් වෙනස් වී ඇති බව මා පමණක් නොව, එතුමා ගැන දත් වෙනත් අය ද පවසති. මෙයට හේතු වශයෙන් නොතිබුණු පෞද්ගලික ඉතිහාසයක් නැවත ගොඩනැංවීමට අවශ්‍ය යැයි කල්පනා කිරීම, විධායක ජනාධිපති ධූරයෙන් ලත් අසීමිත බලතල උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමට අවශ්‍ය මානසිකත්වයක් ගොඩනංවා නොගැනීම, තමා ගත් මග පමණක් හරි යැයි විශ්වාස කිරීම නිසා කිසිදු විරුද්ධ මතයක් ඉවසීමට නොහැකිවීම යනාදී කරුණු බොහෝ අය ගෙනහැර දක්වති.

ඒ කෙසේ වුවත් අගමැති වශයෙන් එතුමා කටයුතු කළ මුල් කාලය තුළදී ආශ්‍රය කළ කෙනෙක් හැටියටත්, පසුව එම ආශ්‍රය අත්හැර දැමූ කෙනෙක් හැටියටත්, මම ද යුතුකමක් පැහැර හැරි කෙනෙක් හැටියට සමහර අවස්ථාවලදී කල්පනා කළෙමි. එතුමා මට ඇහුම්කන් දුන්නේය. ඉතා ගෞරවයකින් සහ ආදරයකින් මට සැලකුවේය. එහෙත් එතුමා අවංකව වේවා, අවස්ථාවාදීව වේවා මට දීමට තැත් කළ බල තනතුරු බාර නොගත්තත්, ආශ්‍රය දිගටම තබා ගත්තේ නම්, එතුමාගේ පාලන සමය තුළ සිදු වූ බොහෝ අමානුෂික දේවල් සිදුවීම වැළැක්වීමට අවස්ථාවක් තිබුණු බව මට සමහර අවස්ථාවලදී කල්පනා වේ.

ජනාධිපති ප්‍රේමදාස මහතා බලයට පත්වූ දා සිට මිය යන තෙක්ම මටත්, සර්වෝදය ව්‍යාපාරයටත් මුහුණ දෙන්නට සිදු වූ තාඩන පීඩන, වද වේදනා වෙනමම පොතකින් එළි දක්වා ඇත.

ඒ සියල්ලේම වගකීම මම එතුමාට නොපවරමි. නායකයෙක් යම් කෙනෙක් කෙරෙහි අප්‍රසාදයක් ඇති වූ විට, නායකයා විසින් එම අප්‍රසාදයට පත් වූ පුද්ගලයාට මේ මේ දේ කරනු ඇතැයි සිතින් මවාගෙන, නායකයාත් නොදන විවිධ අපරාධ වැරදි කරන දේශපාලකයන්ගෙන් මෙන්ම නිලධාරීන්ගෙන් ද අප රටේ අඩුවක් නැත.

මේ අතර රට ගැන සිතා ප්‍රේමදාස මහතාත් මාත් අතර තිබුණු භේදය සමථයකට පත් කිරීමට ද සමහරු ඉදිරිපත් වූහ. මේ අය අතර බ්‍රැඩ්මන් වීරකෝන් මහතා, ජනරාල් සිරිල් රණතුංග මහතා, උතුරු නැගෙනහිර ආණ්ඩුකාර ජනරාල් නලින් සෙනෙවිරත්න මහතා ද මගේ සිහියට නැගේ.

මේ අතර මගේ මෙන්ම, ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කුළුපග මිත්‍රයෙක් වූ දයාවංශ ජයකොඩි මහතාගෙන් 1992 නොවැම්බර් මාසයේ අග දෙසතිය තුළදී මට දුරකතන පණිවුඩ දෙකක්ම ලැබුණේය. ජනාධිපතිතුමා හා මා අතර ඇති වී තිබෙන මතභේදය ගැන ඔහු ඉතා සංවේගයට පත්ව ඇති බවත්, මෙය සමථයකට පත් කිරීම සඳහා ඔහුට අදහසක් ආ බවත් පැවැසීය. ජනාධිපතිතුමා ඉතා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු බවත්, මාත් එවැනිම ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් බවත් අප දෙදෙනා ඈත්ව සිටීම රටට ම පාඩුවක් බවත් ඔහුගේ අදහස විය. මාගේ අකැමැත්තක් නැත්නම් මේ ගැන ඔහු ජනාධිපතිතුමා හා එදාම සාකච්ඡා කරන බවත් කීවේය.

දයාවංශ ජයකොඩි මා නාලන්දාවේ උගන්වන යුගයේ ආනන්දයේ ඉගෙන ගත් මා හොඳින් දන සිටි, ප්‍රිය කළ, අගය කළ ශිෂ්‍යයෙකි. පාසලෙන් අස්වූ පසු ඔහු දයාවංශ ජයකොඩි පොත් සමාගම අරඹා ඉතා සාර්ථක වෙළඳ ව්‍යාපාරිකයෙක් විය. පසුව ඇමරිකාවට ගොස් එහි නේවාසිකයෙකු වූ ඔහු වරින් වර ලංකාවට ද පැමිණ තම වෙළඳ සමාගමේ කටයුතු දියුණු කර ගත්තේය. අවුරුදු

තිස් ගණනක ඈතට දිවෙන අපේ දැන හැඳුනුම්කම නිසා දයාවංශගේ අවංක බව ගැන මට සැකයක් නොආවේය. දයාවංශ ඉතා ළඟින් ජනාධිපතිතුමා ඇසුරු කරන බව ද මම දැන සිටියෙමි.

එවැනි සමගි සම්මුතියකට මගේ අකැමැත්තක් නැති බවත්, ඒ සඳහා බොහෝ කලක සිට ප්‍රයත්න දැරූ බවත් මම කීවෙමි. මා කළ කුමන වරදක් නිසා මෙවැනි පළි ගැනීමකට අප යටත් කර තිබේ දැයි දැන ගැනීමට අඩු වශයෙන් මට අයිතියක් තිබෙන බවත් ප්‍රකාශ කළෙමි. ඔහු නැවත මට කතා කිරීමට පොරොන්දු විය.

පසුගිය 20 දා ඔහු මට කතා කළේය. එතුමා හා සාකච්ඡා කළ බවත්, මෙහි තිබෙන්නේ ඉතා සුළු දෙයක් බවත් ඔහු කීවේය. මා කළ ප්‍රකාශය අස්කර ගෙන එතුමාට ලියුමක් යවන ලෙස දයාවංශ ඉල්ලා සිටියේය. මට ඉල්ලා අස්කර ගැනීමට ප්‍රකාශන නැති බවත්, ඒ ඒ අවස්ථාවල සිදු වූ දේවල් ගැන සර්වෝදයට අදාල හෝ ජාතික ප්‍රශ්න පිළිබඳව මා කළ කිසිදු ප්‍රකාශයක් ඉල්ලා අස්කර ගැනීමට තරම් කිසිම දෙයක් නොවූ බවත් පැහැදිලි කළෙමි. හැරත් සියලුම ප්‍රහාර හා බාධක එතුමාගෙන් ආරම්භ වූ දේවල් නිසා ඒවා ඉවත් කළ යුත්තේ එතුමා බවත් මම තවදුරටත් ඔහුට තේරුම් කර දුන්නෙමි. කෙසේ නමුත් ඔහු බැගෑපත්ව ඉල්ලා සිටියේ ජනාධිපතිතුමාට ලියුමක් ලියන ලෙසය. ජනාධිපති කොමිසම තිබෙන තුරු එසේ කිරීම යෝග්‍ය නැති බව පෙන්වා දුනිමි. කෙසේ හෝ මේ ගැන කල්පනා කරන ලෙස ඔහු මගෙන් නැවත නැවතත් ඉල්ලා සිටියේය.

ජනාධිපතිතුමාට නොව දයවංශ ජයකොඩි මහතාට ලියුමක් යැවීමට මම තීරණය කළෙමි. සමහර විට ඔහු මේ ලියුම ජනාධිපතිතුමාට පෙන්වූවත් කමෙක් නැත. ඉන්දියාවේදී ලැබුණු විවේක කාලය ප්‍රයෝජනයට ගෙන එය ලියමි. ලංකාවට ගිය විට 28 දා තැපැල් කරමි.

1992 නොවැම්බර් මස 27 වෙනි දින.

දයාවංශ ජයකොඩි මහත්මා,
කොළඹ 10.

අදරැති දයාවංශ මල්ලී,

ඔබ දුන් දුරකතන පණිවුඩ දෙක ගැන කෘතඥවෙමි. මේ රටේ ගරු කටයුතු සංඝයා වහන්සේලා හෝ ශ්‍රීමත් ජනාධිපතිතුමාට සමීප වෙනත් ප්‍රභූවරුන් විසින් හෝ බොහෝ කලකට පෙර ඉටු කළ යුතුව තිබූ ජාතික වගකීමකි, ඔබ විසින් ඉටු කිරීමට දිරි ගෙන තිබෙන්නේ. එය සාර්ථක වුවත්-නැතත්, ඒ ප්‍රයත්නය තුළින් ඔබ ජනාධිපතිතුමාගේ සැබෑ මිතුරෙකු බවත්, ජනතාව ගැන සැබෑ ඇල්මක් ඇත්තකු බවත් ස්ඵුට කර තිබේ. නැවතත් ඔබේ ප්‍රයත්නය ගැන මම ඔබට ප්‍රශංසා කරමි.

පෞද්ගලික හෝ සංවිධානමය හෝ ප්‍රශ්න ඉවත දමා, රටත්-දැයත්-සමයත් මුහුණ දෙන ප්‍රශ්න ගැන සිතා, ජනාධිපතිතුමා හා අප අතර අන්‍යෝන්‍ය තේරුම් ගැනීමක් ඇති විය යුතු බව මම ද තරයේ විශ්වාස කරමි. අපේ බොහෝ අරමුණු ප්‍රතිපත්ති හා විශ්වාසයන් අතර වැඩි වෙනසක් නැතිවාක් මෙන්ම, සමහර අරමුණු ප්‍රතිපත්ති හා විශ්වාසයන් අතර පුළුල් වෙනස්කම් ද තිබේ. එහෙත් උනුන්ගේ පෞද්ගලිකත්වයට ගරු කරන අන්තර් පුද්ගල සම්බන්ධතාවක් හා ප්‍රජාතාන්ත්‍රික සමාජ ධර්ම පිළිගන්නා අපට එය බාධාවක් නොවිය යුතුය.

බලය, ධනය, මුලාව සහ සැකය අපේ හතුරෝය. විශේෂයෙන් බලය, ධනය තිබෙන පුද්ගලයකු දුටු විට, මේ පොදු මිනිස් දුර්වලකම් ගැන දන්නා අවස්ථාවාදී පුද්ගලයෝ ඔවුන්ගේ ආත්මලාභය තකා අන් අයගේ කල්‍යාණ මිත්‍රධර්මයට හානි කරති. ඔවුන්ට හසු නොවීමට අපි විමසිලිමත් විය යුතු වෙමු. මෙතැන සිදුවී තිබෙන්නේ එවැන්නක් බවට මට සැකයක් නැත. මා මුදලකින් හෝ

යම් ක්‍රියාවකින් තබා වචනයකින්වත්, ජනාධිපති මැතිවරණ සමයේ දී එතුමාට විරුද්ධව යමක් කර නැත. ඒ යුගයේ වැඩි කලක් මා සිටියේ ද රටින් බැහැරවය. මා එතුමාට විරුද්ධව දේශපාලනය කළා යැයි යමෙකු කියනවා නම්, එය අමූලික අසත්‍යයකි. මගෙන් යමෙක් ඇසුවේ නම් මා ප්‍රකාශ කර ඇත්තේ එතුමා අපට කළ යම් යම් උදව් සහ බලයට ආවොත් එකතුව අප විසින් රටට කළ හැකි සේවාවන් ගැන පමණෙකි.

මම කිසිදු ද්‍රෝහීකමක් නොකළෙමි. රහසේ හතුරුකම් කිරීම මාගේ පුරුද්දක් නොවේ. මගේ මව ජීවත්ව සිටියා නම්, අපේ චර්යාවන් සඳහා එතුමිය කළ බලපෑම ගැන කියනු ඇත. එහෙත් මට විරුද්ධව රජයේ පුවත්පත්වල පළ වූ අද්භූත චෝදනා හා අපහාස දැනගත් විට දුකෙන් වෙලී ඇඳට වූ ඕ නැවත නොනැගිට්ටාය. ප්‍රේමදාස මහත්මයා, මගේ පුතාට මෙහෙම කරන්නේ ඇයි? යන වචන කිහිපය පමණකි, ඇය කතා කළේ. කතරගම ගම් උදාවේදී මගේ හිත බිඳුණු බව එතුමාට පැවසුවෙමි. එය හිතට වැදුණා දැයි මම නොදනිමි. එතුමා රැවටීම මාගේ ප්‍රතිපත්තිය නොවීය. ඒ නිසා අපේ සම්බන්ධය විවෘත එකක් විය. රටේ තත්ත්වය එන්ට එන්ට බිහිසුණු විය. ජනතා විමුක්ති පෙරමුණේ ඇඳිරි නීතිය පැනවූ දිනෙක, මගේ මේසය මත අත් බෝම්බයක් (ග්‍රෙනේඩයක්) තබා තර්ජනය කිරීමට තරම් ඔවුහු සාහසික වූහ. එහෙත් එයට මම බිය නොවීමි. මගේ සහෝදර සේවිකාවක හා සේවකයකු මරා දමනු ලැබූහ. අපේ විධායක මණ්ඩලයේ තීරණය (දැනට එතුමාට ළංව සිටින නෙකෙකුගේ බලපෑම හා බිය ගැන්වීම අනුව) සහ මගේ ද කැමැත්ත අනුව ගම්උදා වේදිකාවෙන් මට ඉවත් වීමට සිදු විය. සියලු කරුණු එවකට නිවාස අධිකාරියේ සභාපති ජයවර්ධන මහතාට තේරුම් කර දුනිමි. අන් සියලු දේට වඩා මගේ සේවක සේවිකාවන්ගේ ජීවිත දෙපැත්තෙන්ම බේරා ගැනීම මගේ ප්‍රධාන වගකීම විය. ඊට පසු ද ගම්උදාව සඳහා ඉල්ලූ සෑම උදව්වක්ම, වේදිකාවට නැගීම හැර ඉටු කළ බවට සාක්ෂි ඇත. මෙය මා හා උරණ වීමට කරුණක් නොවේ. මා සිටි තත්ත්වය එතුමා තේරුම් ගත්තේ යැයි සිතුවෙමි.

නාම යෝජනා යුගයේ මගෙන් කළ ඉල්ලීම මගේ ශක්ති ප්‍රමාණයේ හැටියට ඉටු කළෙමි. යම් අද්භූත ශක්තියක් ඇති, එහෙත් ප්‍රමාණයට වඩා එය උලුප්පා පෙන්වූ පුද්ගලයකු විසින් එතුමාට යම් අනතුරක් තිබෙන බව දිනක් ප්‍රකාශ කළ විට, එවේලේම එතුමාට කතා කොට එතුමා හා මැතිනිය හමුවී මගේ යුතුකම ඉටු කළෙමි. ඒ අවස්ථාවේදී මා මෙන්ම, ඒ දෙපළ ද එය විශ්වාස කළහ. එය ජීවිතයටම අමතක නොවන උදව්වක් බව අගමැතිතුමා ඉදිරියේදීම මැතිනිය ප්‍රකාශ කළාය. පසුව ඒ පුද්ගලයා මා ආශ්‍රයෙන් ඉවත් කළේ, ඔහු අප රැවටීමක් කරන බව මට ප්‍රත්‍යක්ෂ වූ නිසාය.

සර්වෝදය සංසදයේ මූලිකව කටයුතු කරන පුද්ගලයා හැටියට මගේ ප්‍රධාන වගකීම වූයේ, සියලුම සේවක සේවිකාවන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමයි. රජයේ බලවතුන් පවා ත්‍රස්තවාදයෙන් මිය යන කාලයක, අවි රැකවරණ නොගත් අප සතුව තිබුණේ ධර්මය හා අපක්ෂපාත සේවය තුළින් එකිනෙකාට ආරක්ෂා වීමට උපදෙස් දීමය. මෙය දේශපාලනයේ යෙදී සිටින කවරෙකුට වුවත් තේරුම් ගැනීමට ඉතා පහසුය. ඡන්දයට පෙර අගමැතිතුමාට මෙන්ම, බණ්ඩාරනායක මැතිනියට ද මේ තත්ත්වය තේරුම් කර දුනිමි. ඔව්හු ඒ අවස්ථාවේදී එය පිළිගත්හ. අපේ යමකු දේශපාලන කටයුතුවලට ප්‍රමාණය ඉක්මවා සම්බන්ධ වූ බව දැන ගත් වහාම, මම ඒ ගැන ක්‍රියා කිරීමට පසුබට වූයේ නැත. කෙසේ හෝ එතුමා බලයට පත් වූ විට, එය යුගයේ අවශ්‍යතාවක් සැපිරීමටත් සාමය ඇති කිරීමටත් සැලසුම් හැදුවෙමි. එකට කටයුතු කළ හැකි ජනතා නායකයෙක් බිහි වී යැයි අවංකව විශ්වාස කළෙමි. මගේ පළමු හා අවසාන ආදරය ජනතාවගේ යහපත නිසා එය ඉටු කළ හැකි පුද්ගලයා හා එකතු වී කටයුතු කිරීම මගේ ප්‍රතිපත්තිය විය. මට හෝ සර්වෝදයට යමක් අපේක්ෂාවෙන් නොවේ.

ප්‍රේමදාස මැතිතුමාගේ ශ්‍රේෂ්ඨ ගුණාංග ගැන දැන සිටියෙමි. ඒ පිළිබඳ ප්‍රසිද්ධියේ කීමට හෝ ලිවීමට මා පැකිළුණේ නැත. ඒ නිසා රජයේ ඇතුළත මෙන්ම, පිටස්තර අයගෙන් ද දොස් ඇසුවෙමි.

වරද ඇතොත් ඒවා වක්‍රව පෞද්ගලිකව පෙන්වා දී, කෙමෙන් තනතුරු ලැබීමෙන් පසු, ආදර්ශවත් ජන නායකයකු එතුමා තුළින් බිහි වෙතැයි අවංකව අපේක්ෂා කළෙමි. දේශපාලන හෝ වෙනත් නිලතල කවදාවත් නොපැතුවෙමි. සාධාරණ නීත්‍යානුකූල සහයෝගය පැතුවෙමි. විරුද්ධවාදීකම් සිහිනයකින්වත් බලාපොරොත්තු නොවීමි. එතුමාට සුබ පැතීමි. එතුමා එය පිළිගති.

'චිත්තං පි විනස්සති' අචින්තම්පි භවිස්සති. යන බුදු වදන සැබෑ කරමින් නොසිතුවක් සිදු විය. සිතූ දේ වැනැසිනි. මා ළඟ සිටි වඩාත්ම සර්වෝදයට පටහැනි දේ කළ පුද්ගලයා, එතුමාට ළං විණි. හිටපු පාක්ෂිකයෙකු ද ඔහුට රැවටිණි. සිත් දූෂණය කළේය. මේ බව ජයග්‍රහණයෙන් පසු එතුමා මුණගැසුණු පළමු දිනයේම මට වැටහිණි. මා හා වෙන දා මෙන් කුළුපගව කතා නොකළ නිසා, එදාම ආත්ම ගෞරවය ඇති පුද්ගලයකු ලෙස ග්‍රාමෝදය භාර අරමුදලෙන් ඉල්ලා අස් වුණෙමි.

එහෙත් මෙය දුරදිග යැමට ඉඩ නොදී, හමු වී විසඳා ගැනීමට ලියුම් කිහිපයක් ලීවෙමි. ඒවා නිෂ්ඵල විය. මා එතුමාගේ උදහසට ලක් වූ නිසා, අවුරුදු හතලිහක සමාජ සේවා ජීවිතයක් තුළ නොලැබූ ප්‍රහාරයන්ට ලක් වීම ඇරැඹිණි.

ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියෙන් දින පහකට පසු, රහස් පොලීසියේ විශේෂ ඒකකයේ ප්‍රධානියා වන සර්නි විජේසූරිය මහතා එතුමාගේ නියෝගයක් පරිදි මා පරීක්ෂණයකට ලක් කරන විට, මට ඇති වූයේ ලජ්ජාවක් මෙන්ම සිත් වේදනාවකි. එතැන් සිට අද වනතුරු වූ දේ රටත් ලොවත් දනිති. වසරක්ම නිශ්ශබ්දව ඉවසීමි. සැබෑවම මතු කිරීමට හැම ප්‍රයත්නයක්ම එතුමාට ළං වූ පිරිස තුළින් අවබෝධ කරදීමට උත්සාහ දැරීමි. මාගේ නිර්දෝෂතාව ඔවුන් හැම කෙනෙක්ම පිළිගත්තත් එතුමාගේ 'පළි ගැනීමේ සිරිත. (Vindictiveness) ගැන කියා ඔවුහු අත සෝදා ගත්හ' දැහැමි ප්‍රවේගවලට වඩා, අදැහැමි බලවේග ශක්තිමත් විය. පියවරෙන්

පියවර ජීවිත කාලයක් තිස්සේ ගොඩනැගූ දේ රාජ්‍ය උදහසින් විනාශයටත් පත් කෙරුණි. ලොවැ පළමු වරට නිර්මාණය වූ වැඩ සටහන් රැසක්ම කඩාකප්පල් කෙරුණි. බොහෝ දේ එතුමා පවා නොදන්නවා ඇත. කවදා හෝ එතුමා සමඟ විවෘතව කතා කිරීමට ඉඩ ලැබුණු දිනෙක, ඒවා ගැන එතුමා පවා කම්පා වනු ඇත. මේවායින් කිසිවෙකුටත් යහපතක් සිදු නොවීය. එතුමාටත් මටත් රටටත් හානියක්ම විය.

මේ තත්ත්වය යටතේ තවදුරටත් නිශ්ශබ්ද වීමේ නිවටකම මට තරම් නොවීය. ලොවැම ඇස් හැර මා ජීවිතයට වඩා ගරු කොට ගොඩනැගූ ක්‍රියාදාමයන් හා සේවා විනාශ කරද්දී, අප ගන්නා මාර්ගය ගැන විමසිලිමත් විණි. ඒවා රැක ගැනීමට විකල්පීය මාර්ග වේදනාවෙන් වුවත් සෙවිය යුතු විය. ඉවසීම, දැනුවත් කිරීම, නීතියේ පිළිසරණ සෙවීම, ඍජු අහිංසාවාදී ක්‍රියා මාර්ගයන් ගැනීම හා නීතියේ පරමාධිපත්‍යය යටතේ මූලික මානව සේවා නිදහස රැක ගැනීමට වෙනත් අප වැනි දේශපාලන බලය නැති, එහෙත් ධර්මයේ හා ජන ශක්තියේ බලය ගැන විශ්වාසය තැබූ ධෛර්ය සම්පන්න ලෝක සේවකයන්ගේ ආදර්ශයන් කෙරෙන් ඉගෙන ගෙන, නව මගකට පිවිසෙන්නට මේ තත්ත්වය විසින් මට බල කරන සුළු විය. එය දිවි පරදුවට තබා කළ යුත්තකි. විනෝබා භාවේතුමා මෙය හැඳින්වූයේ .ජීවන්දාන්. යනුවෙනි. එයට අවශ්‍ය ආධ්‍යාත්මික පාරිශුද්ධිය හා ධෛර්යය දැන් මා සතුය.

රාජ්‍ය නොවන ආයතන ගැන සෙවීමට ජනාධිපති කොමිසමක් පත් කිරීමෙන් පසු, ජනාධිපතිතුමා හමුවීමේ ප්‍රයත්නය අත් හැර දැමීමි. හේතුව එහි පරීක්ෂණවලට එය බාධාවක් විය හැකි බැවිනි. ස්වභාවික නීතියට පටහැනි නොවී එයින් යුක්ති ධර්මය ඉටුවීමට ඉඩ තැබිය යුතුය. බලවතුන්ගේ පිහිට සොයා, වසා ගැනීමට තරම් වරදක් මා කර නැත. ඒ නිසා විවෘතව එයට මුහුණ දීමට තීරණය කළෙමි. මෙම කොමිෂන් සභාව නිම වූ දිනෙක එතුමාට ලියන්නෙමි. නොවැම්බර් මස 17 වැනිදා ප්‍රකාශ වූයේ

සර්වෝදයට හෝ මට විරුද්ධව කිසිදු චෝදනාවක් නැති බවයි. රහස් පොලිස් පරීක්ෂණ 114 ක්, ලියවිලි දහදාහකට අධික ප්‍රමාණයක්, පුවත්පත් චෝදනා ලිපි 109 ක් සහ වෙනත් නිමක් නැති පරීක්ෂණවලින් පසුව අපට චෝදනා නැතිනම්, ශ්‍රේෂ්ඨ නායකත්වයක් පෙන්වීමට ජනාධිපතිතුමාට අනගි අවස්ථාවක් දැන් පැමිණ තිබේ.

මට මගේ වුවමනාවෙන් එතුමාට කතා කළ නොහැකිය. එක් දුරකතන පණිවුඩයකින් එතුමාට මේ තත්ත්වය වෙනස් කොට, සුහද පරිසරයක් ගොඩනැගිය හැකිය. එවිට සැක බිය හැර සැමටම සෙතක් වේ. හැමෝම එතුමාට ප්‍රශංසා කරාවි. මට ද සංවිධාන කටයුතුවලින් ඈත් වී, 1987 සිට මා සැලසුම් කර තිබුණු ජීවිතයට හැකි ඉක්මනින් පිවිසිය හැකිය.

රජයක් විසින්, මා පත් කරන ලද තත්ත්වයට ලෝකයේ මා වැන්නවුන් පත් කරන ලද මෙවැනි අවස්ථාවන් විරලය. මෙය ලෝකයේ බොහෝ විද්වතුන්ගේ මතයයි.

මේ තත්ත්වයට හේතු වූ මනෝ විද්‍යාත්මක, සාමාජික හා දේශපාලනික පැති ගැන ඔවුන්ගෙන් සමහරෙක් පර්යේෂණ කරති. ඒවා කවදා හෝ ලෝක ජනතා සංවර්ධන සංසද පිළිබඳ සාහිත්‍යයට එකතු වේ. එහි අවසන් පරිච්ඡේදයෙන් ඔවුනට එතුමාගේත් මගේත් පෞද්ගලිකත්වය වෙනුවට ජාතිය වෙනුවෙන් කැප වීම උද්දීපනය වේ නම් කෙතරම් අගේද? එකඟ වීමට නොහැකි නම්, එකඟ නොවීමට සාමයෙන් එකඟවීම තරම් තවත් මහත්මා කමක් ලොවැ තිබේද?

මම ද "Joyous Agony" නමින් පොතක් ලියා ගෙන යමි. එහි අවසන් පරිච්ඡේදය "Joyous End" නමින් අවසන් කිරීමට හැකි වේවා' යි යනු මගේ පැතුමයි. එවිට දයාවංශ ජයකොඩි සමාගම එහි බෙදා හරින්නා විය හැකිය.

දයාවංශ මල්ලී, සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යය යන බුදුවදන නිතර සිහි කරමු. එවිට මෙවැනි මතභේද හා ගැටුම් අතුරුදන් වේ. මෙතරම් දිග ලිපියක් ලියූ කලක් මතක නැත. ඒත් ඉන්දියාවේ දෙදිනකට ගිය නිසයි, ලියන්නට විවේකයක් ලැබුණේ.

මගේ බිහිසුණු අත්දැකීම්වලින් අධ්‍යාත්මය පොහොසත් විණි. එහි පින ඔබට ද ලැබේවා! මේ ලිපිය ඔබට පෞද්ගලිකව ලියූවකි. ඔබ, මා ගැන කරුණාවන්ත වීම ගැන නැවත පින්!

තෙරුවන් සරණයි! සැපවේවා!
මෙයට - අදරැති,

ඒ.ටී.ආරියරත්න.

මේ ලිපිය දයාවංශ ජයකොඩි මහතාට යැවීමෙන් පසු, ඔහු විසින් ප්‍රේමදාස මැතිතුමා හමුවී තිබේ. මෙහිදී මා විසින් ගාලු දිස්ත්‍රික්කයේ තවලම ගමේ දී කළ වේගවත් කතාවක කොටසක් දයාවංශ මහතාට ඇසීමට සලස්වා, ඊට පසු තර්ජන ස්වරයෙන් කළ කතාවකින් පසු දයාවංශ මහතා මේ මාතෘකාව ගැන තවත් කතා කර නැත.

මට සහ සර්වෝදයට එරෙහිව මේ යුගයේදී සිදු වූ කරදර හිරිහැර සිත් තැවුල් අලාබ හානි සියල්ල අමතක කොට, ආර්. ප්‍රේමදාස නැමැති මේ දක්ෂ ජනතා සේවකයාගේ හොඳ පැත්ත දෙස පමණක් බලා, සමගියෙන් එක්ව කටයුතු කිරීමට මා ගත් අවසන් ප්‍රයත්නය ද මෙසේ ව්‍යර්ථ විය.

මට කොතරම් හතුරුකම් කළත්, කිසිවෙකුට වෛර කිරීමට මගේ සිත හැඩ ගැසී නැත. සර්වෝදයට යමෙකු විරුද්ධකම් කරන විට එයින් ආරක්ෂා වීමට මා පියවර ගත්තේත් වරදට එරෙහිව මිස, වැරදි කරන්නාට එරෙහිව නොවේ. මේ නිසා ජනාධිපති ප්‍රේමදාස මහතා කෙරෙහි මා සිත තුළ නිතරම පැවැතියේ උපේක්ෂා සහගත

සිතිවිලිය. ඔහුගේ හොඳ පැත්ත දෙස බැලීම මිස, දුර්වලකම් දෙස බැලීම නොවේ.

1993 මැයි 01 දා එතුමාගේ අවාසනාවන්ත අවසානය සිදු විය. දවල් 12.45 ට පමණ ජනාධිපති ප්‍රේමදාස මහතා ඝාතනය කරනු ලැබූ බව 2.00 ට පමණ ජනක පුතාගෙන් ආරංචි විණි. බලයෙන් වියරු වැටුණු, විවේචනයක් නොඉවසන සුළු ආත්ම කේන්ද්‍රීය වූ, මිතුරන් අමතක කළ, පිරිසිදු අයට වඩා දූෂිත ආත්මාර්ථකාමීන් ළංකර ගත් හිතන දේ නොකියන, කියන දේ නොකරන උසස් තානාන්තරයක් ලැබුණත් දුර්වල ගති නැති කර ගැනීමට නොහැකි වූ එහෙත් විවිධ දක්ෂකම් තිබූ මේ පුද්ගලයාගේ අභාවයෙන් මට සතුටක් හෝ සංවේගයක් හෝ ඇති නොවුණි. ධර්ම නීතියේ ක්‍රියාකාරිත්වය පමණක් සිතට නැඟී උපේක්ෂාවෙන් මේ සිද්ධිය දෙස බැලීමි.

ඔහු බලයේ සිටි මාස 52 තුළ මා අපකීර්තියට පත් කොට විනාශ කිරීමටත්, සර්වෝදය ඔහු යටතට හර්ෂ මාර්ගයෙන් ගැනීමටත් ඔහු නොගත් මහන්සියක් නැත. සෑම නීතියක්ම යොදවා, සමහර නීති විකෘති කොට මැරවර බලය සහ රහස් පොලීසිය යොදවා ඔහු කළ පීඩනය අසීමිතය. එහෙත් ධර්මයෙන් පිට නොපැණ අපි ඒ සියලු දේ මෛත්‍රියෙන් හා උපේක්ඛාවෙන් ඉවසීමු. ඒ අතර ජන ශක්තියෙන් හා නීතියෙන් ගත හැකි ආරක්ෂාව පමණක් යොදා ගතිමු. අපට වූ පාඩුව ජනතාවට වූ පාඩුවකි. එහෙත් ඒ සියලු හතුරුකම් ඔහු කළේ මට කරන විනාශයක් හැටියටය. මම වෛරයෙන් තොරව නීතියෙන් සටන් කළෙමි. මෛත්‍රිය ම පැතුරුවෙමි.

මට අවසාන අපහාසය කළේ ඉන්දියාවේ වර්ධා නුවර ගාන්ධි ආශ්‍රමයට ගිය අවස්ථාවේදීය. සමහර ගාන්ධි අනුගාමිකයන් කෝටිපතියන් වී තිබේ යැයි කීමෙන් ඔහු අපහාස කිරීමට තැත් කළේ මටය. ඒ කතාව ගුවන් විදුලිය හා රූපවාහිනිය මගින් ප්‍රසිද්ධියට පත් කරන ලදී. මේවායින් ඔහු තවත් පිරිහුණි. කිසිම ජාතික නායකයෙකු

මැරුණු අවස්ථාවකදී ලංකාවේ සෑම තැනම මිනිසුන් සතුටින් නටමින් රතිඤ්ඤා පත්තු කළ අවස්ථාවක් මා දැක නැත. මෙය එක අතකින් අපේ සංස්කෘතියට පටහැනි ලජ්ජා විය යුතු කරුණකි. අනිත් අතින් දැහැමින් රට පාලනය කිරීමට ඉතිරි වී සිටින පාලකයිනට ද හොඳ පාඩමකි.

ප්‍රේමදාස මහතාගේ අභාවයෙන් රටට තිබෙන තර්ජනය අඩු නොවීය. මගේ අදහසේ හැටියට ඔහු මාෆියා කල්ලියක් විසින් මෙහෙය වන ලද රූකඩයකි. ඔහු ගියත් මාෆියා කල්ලිය ඉතුරුව ඇත. මෙය මැඩීමට මේ එක නායකයකුටවත් බුද්ධියක් හා ආත්ම ශක්තියක් තිබේද?

අගමැති කාලයේ මට කරුණාවන්තව සිටි රණසිංහ ප්‍රේමදාස මහතාට ලබන ආත්මය මීට වඩා දැහැමි බව ලැබේවායි පතමින් මම මගේ බුදු ගෙට ගොස් පහනක් පත්තු කොට පින් දුනිමි.

ප්‍රේමදාස මහතා මා හා උරණ නොවන්නට ඔහුත්, රටත් මීට වඩා වෙනස් මගකට ගමන් කිරීමට තිබිණි. ඔහු ජනාධිපති වීමෙන් පසු ත්‍රිකුණාමලයේදී තත්පර ගණනකට මුහුණට මුහුණ හමු වූවා හැර, කිසිම අවස්ථාවකදී දැක හෝ කතා කර හෝ නැත. ඔහු අගමැති කාලයේ මා කී වචනයක් ඉවත දැම්මේ නැත. මා දුන් අවවාද පිළිගත්තේය. සෑම වැඩක්ම කිරීමට ප්‍රථම ටැලිෆෝනයෙන් හෝ මා සමග කතා කර උපදෙස් ලබා ගත්තේය. ඔහුගේ සභ්‍ය භාෂාවල සමහර හැසිරීම් විලාශ, ග්‍රාමෝදය, ගම්උදාව, ජන හමුව, ජනසවිය ආදී සියලුම සංකල්ප හා භාෂාව 1990 වන තෙක් මා හා සාකච්ඡා කොට ගොඩනැගූ ඒවාය.

ඔහු අගමැති වූ අවස්ථාවේදී ඔහු ගැන පත්‍රයකට සඟරාවකට ලියන්න කෙනෙක් සිටියේ නැත. මට ටෙලිෆෝන් කර හෝ යමෙක් එවා හෝ ඒවා කරවා ගත්තේය. විවිධ උගතුන් මෙහෙයවා විවිධ දේ ඔහුට කර දුනිමි. සාමාන්‍ය මිනිසෙක් නිසාත්, දුප්පතාට ආදරේ නිසාත්, දක්ෂව කඩිසරව කටයුතු කරන නිසාත් මම ඔහුට ප්‍රිය

කළෙමි. ඔහුගේ අතීතය මම දන්නේ නැත. දැන ගැනීමට ඕනෑ වූයේත් නැත.

උදෙන්ම නීතා සමඟ ජනාධිපති මන්දිරයට ගියෙමු. පෝලිමේ පනහකට හැටකට වඩා සිටියේ නැත. අපි ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළු වී කෙළින්ම ඉස්සරහ දොරින් දේහය තැන්පත් කර තිබුණු පෙට්ටිය ඉදිරිපිටට ගියෙමු. ජීවිතයේ අනිත්‍යභාවය සිහි කොට මිනිත්තුවක් භාවනා කොට ඔහුට පින් දුනිමි. සෑම් විජේසිංහ මහතා පමණකි හඳුනන කෙනෙකුට සිටියේ. ආරක්ෂක සේවකයෝ අපව හඳුනා ගත්හ. මැතිනිය හෝ මැති ඇමතිවරුන් කිසිවෙක් ඒ වෙලාවේ සිටියේ නැත.

මම ධර්මයෙන් පිට නොපැන්නෙමි. මුළාවකට අසුව කටයුතු කළ හොඳ චේතනාවක් ඇති මිනිසෙකු ලෙස මම ප්‍රේමදාස මහතා දකිමි. නරක මාර්ගවලින් නරක පුද්ගලයන්ට මුළාව ආත්ම කේන්ද්‍රීයව කටයුතු කළ නිසා ඔහු විනාශ විය. ඔහු සමඟ ඔහුටත්, රටටත් කළ හැකිව තිබූ සේවාව කිරීමට මට ඉඩක් නොලැබිණි. ඔහු කෙරෙහි වෛරයකින් තොරව ඔහුගේ වැරදි ක්‍රියාවලට එරෙහිව හොඳ මාර්ග තුළින් මම ජීවිතය පරදුවට තබා නිර්භයව සටන් කෙළෙමි. බුදුන්, දෙවියන්, සාධූන්, මගේ මෑණියන් ඇතුළු සම්‍යක් බලවේග රැසක් මා ආරක්ෂා කළේය. අප කාගේත් ජීවිතයේ හොඳ සහ නරක පැති තිබේ. ජනාධිපති ප්‍රේමදාස මහතාගේත් එසේමය. එහි හොඳ පැතිවලින් පමණක් අපි ආදර්ශ ගනිමු. නරක අමතක කර දමමු.

යහපත් උදව්කාරයා දුර්ජනයෙක් වීම.

ඉන්දීය සාමසාධක හමුදාව උතුරට පැමිණ වැඩි කල් යාමට පෙර, ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර තත්ත්වය තවත් නරක අතට හැරුණි. එහි මුල් අවදියේදී විශේෂයෙන් නැගෙනහිර පළාතේ ජීවත් වූ සිංහල ජනතාවට විශාල කරදර හිරිහැර පැමිණෙමින් තිබුණි. වෙනදා මෙන් මේ කාලයේදීත් විශේෂයෙන් 1988 අග භාගයේදී සුපුරුදු පරිදි මම ත්‍රිකුණාමලයට ගියෙමි. අප ව්‍යාපාරයේ වැඩ කටයුතු පිරික්සීමට සිංහල මෙන්ම දෙමළ ගම්මානවලට ද ගිය මට එහි ඉතා උණුසුම් තත්ත්වයන් පැන නැඟී ඇති බව අවබෝධ විය.

ඉන්දියානු සාම හමුදාව මගින් මහ දවල් මරා දමා තිබුණ බෞද්ධ භික්ෂූන් වහන්සේගේ ආදාහනය සඳහා කොළඹින් කිසිවෙක් එහි පැමිණ සහභාගි වී නොසිටියෙන් මම එයට ද සහභාගි වීමි. ඉන්පසු විවිධ කුඩා රැස්වීම්වලට සහභාගි වූ අතර මගේ ජීවිතයට ද තර්ජනයක් එල්ල කර තිබුණ බවක් මා ඒ වන විටවත් දැන සිටියේ නැත. එදා මගේ ජීවිතය බේරුණේ එවකට හමුදාවේ මේජර්වරයෙකුව සිටි පසුව මේජර් ජනරාල් තත්ත්වයට උසස් වීම් ලැබූ සාලිය ඒ කුලතුංග මහත්මා නිසාය.

මේජර් ජෙනරාල් සාලිය ඒ. කුලතුංග මහතා

මෙම සිද්ධිය පිළිබඳව එතුමාගේ වචනවලින්ම විස්තර කර මට එවන මෙන් මා කිහිප වාරයක්ම දන්වා යැවීමි. ''විත්ඩ්‍රෝ කරෝ කල්ති කරෝ'' මාතෘකාවත් සමඟ පහතින් සඳහන් කර තිබෙන්නේ එතුමා විසින් මා වෙත එවනු ලැබූ එම විස්තරයයි.

යුද සමයේදී එක් අතකින් මානව අයිතිවාසිකම් උල්ලංඝනය නොකිරීමත් අනෙක් අතින් තමන්ගේ රාජකාරිය නිර්භයව ඉෂ්ට කිරීමටත් සමත් වූ යුද්ධ හමුදා නිලධාරීන් සෑහෙන පිරිසක් මට හමු විය. සෙන්පති ඩෙන්සිල් කොබ්බෑකඩුව මහතා මෙහිදී විශේෂ චරිතයක් ලෙස මා විසින් සලකනු ලබන අතර මේජර් ජනරාල් සාලිය ඒ කුලතුංග මහතා ද ඒ හැම දෙනා අතර පෙරමුණේ සිටී.

විත්ඩ්‍රෝ කරෝ කල්ති කරෝ

''ශාන්ත බවින් ප්‍රසන්න හා සුන්දරත්වයෙන් හෙබි නැගෙනහිර ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය නගරය සිනහ උපදවන සුළු යම් කලබලකාරී සිදුවීමක් හේතු කොට ගෙන තරමක කැළඹීමකට පත් විය. අතීතයේ සිට පරම්පරා ගණනාවක් ඔස්සේම එකමුතුකමින් ජීවත් වූ මේ රටේ ප්‍රජාවන් තුළ පුපුරා යන ගිනි කන්දක් මෙන් හිටිහැටියේම ඇති වූ ජාතිවාදී අවිශ්වාසයන් මත දිගටම කෙරී ගෙන ගිය බෙදුම්වාදී ආයුධ සන්නද්ධ ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස උද්ගත වූ ජාතිවාදී ප්‍රචණ්ඩත්වය මෙවැනි වාතාවරණයක් ගොඩනැඟීමට හේතුසාධක වී තිබුණි. මේ රටේ සිදුවූ ගැටුම් හා එවැනි අසමගිකම් මඟ හරවා සමාදානය තුළින් රටේ සමතුලිතතාවය නැවත ඇති කිරීමේ මුවාවෙන් ඉන්දියාවේ සිට මෙහි පැමිණි ඉන්දියානු සාම හමුදාව නිසා සිදු වූයේ එම තත්ත්වයන් තවත් භයානක අතට පෙරළීමය විපතේදී පිහිටවීමට පැමිණි ''යහපත් උදව්කාරයා-දුර්ජනයෙක්'' බවට පත්වීමේ හොඳම නිදර්ශනයකි මෙය.

1988 වර්ෂයේ අග භාගයේ එක් දවසක එදිනෙදා වැඩ කටයුතුවල යම් කසුකුසුවක් හා අසාමාන්‍ය කඩිනම් ස්වරූපයක්

පෙනෙන්නට වූ අතර ඉන්දීය සාම සාධක හමුදාව විසින් ඔවුන්ගේ මුර සේවාවන් ත්‍රිකුණාමලය නගරය පුරාමත් ඒ අවට ප්‍රදේශ දක්වාත් පුළුල් කර ගෙන ඇති බවට ආරංචි පැතිර යමින් තිබුණි. ඒ කාලයේ අපේ ශ්‍රී ලංකා යුද හමුදා කඳවුර පිහිටුවා තිබූ ෆෙඩ්රික් කොටුවෙහි රාජකාරියේ යෙදී සිටි මට මේ අමුතු කලබැගෑනියට හේතුව කුමක්ද යන්න ඉක්මනින් සොයා ගැනීමට හැකි විය.

එනම්, සර්වෝදය ව්‍යාපාරයේ නිර්මාතෘ ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතා ත්‍රිකුණාමලයට පැමිණ ඇති බවත්, ත්‍රිකුණාමලයේ බහු ජාතික ප්‍රජාවන් අතර මිත්‍රත්වය ඇති කිරීම සඳහා එවැනි මිශ්‍ර ජනතා කණ්ඩායමක් අමතා ඒ වන විටත් කතාවක් කර තිබීමත්ය.

තමන්ට පරිබාහිර වූ කිසිම ව්‍යාපාරයක් හෝ පුද්ගලයෙක් මගින් උතුරු නැගෙනහිර තමන්ගේ බල ප්‍රදේශය තුළ සාමය ගෙන ඒමට තැත් කිරීම ඉන්දියානුවන් නොරිස්සූ කාරණයක් විය. එනිසා ඉහතින් දක්වන ලද සිදුවීමට අනුව ආචාර්ය ආරියරත්න මහතා ඉන්දියානු හමුදාවේ විශේෂ අවධානයකට හසුවී තිබෙන බව වැටහී ගියෙන් හැකි ඉක්මනින් එතුමාව දිස්ත්‍රික්කයෙන් ඉවත් කළ යුතු බව අපි ඒත්තු ගතිමු. ඒ කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුළ දී ඉන්දියානු හමුදාවේ සියලු ක්‍රියාන්විතයන් භාරව සිටි අණදෙන නිලධාරී ලුතිනන් ජෙනරාල් කැල්කට් විසින් ආචාර්ය ආරියරත්න මහතාට රාත්‍රී ආහාරය සඳහා පැමිණෙන ලෙස ආරාධනා කර තිබුණි. ශ්‍රී ලංකාවාසී ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වී සිටින යුද්ධ හමුදා කටයුතුවල ප්‍රවීණයෙක් වූ ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව මහතා මගින් එම පණිවුඩය යවා තිබීම අපට හාස්‍යය මතු කරන කාරණයක් විය. ආචාර්ය ආරියරත්න මහතා සමඟ එතුමාගේ ආරක්ෂාව පිණිස මට ද එහි යන ලෙස කොබ්බෑකඩුව මහතා දන්වා එවීය. ඒ දිනවල චීන වරාය ප්‍රදේශයේ සිංහල ජනතාව ඉන්දියානු හමුදාවේ මහත් කරදර හිරිහැරවලට ලක් වෙමින් සිටි නිසා ඒ පිළිබඳව තම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට ත්‍රිකුණාමලයේ ඉන්දියන්

හමුදා අණදෙන නිලධාරී හමුවීම සඳහා සාම පා ගමනක් ගිය බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් මහ දවාලේ ඉන්දියන් හමුදාව විසින් ඝාතනය කරන ලදී. එවැනි වාතාවරණයකදී මේ රාත්‍රියේ කුමක් සිදු විය නොහැකි දැයි ඉදිරියේ ඇති අවදානම ගැන මම අවබෝධ කර ගතිමි.

එතුමා නැවතී සිටි ස්ථානයට ගොස් ආරියරත්න මහතාව වාහනයට නංවා ගත් මම රාත්‍රී 7.30 ට පමණ ඉන්දීය සාම හමුදා මූලස්ථානය පිහිටුවා තිබුණු ''ක්ලැපෙන්බර්ග්'' වෙත රිය පැදවීමි. ආරියරත්න මහතා වාඩි වී සිටියේ ඉදිරි අසුනේය නගර සීමාව වෙත අප ළඟා වූවා පමණි ස්වයංක්‍රීය රයිෆල් අප වෙත එල්ල කරමින් ඉන්දීය හමුදා මුර භටයින් පාර මැදට පැන අපේ වාහන නැවැත්වූහ. ඇස් නොපෙනී යන තරම් තීව්‍ර වූ පිරික්සුම් ආලෝක ධාරවක් අප සිටි වාහනය හරහා යැවිණ. ඉදිරි අසුනේ වාඩි වී සිටි ආචාර්ය ආරියරත්න මහතා හඳුනා ගන්නට ඇත. ක්ෂණයකින් ආලෝක ධාරව ක්‍රියා විරහිත කරන ලදී එතුමාගේ පැමිණීම පිළිබඳව ස්ථිර නිගමනයක් ගැනීම සඳහා පිරික්සුම සිදු කළ බව පැහැදිලිය. මුර සේවා අණදෙන නිලධාරියා විසින් යම් අත්‍යවශ්‍ය ගුවන් විදුලි පණිවුඩ නිකුත් කරනවා මා හොඳින් අසා ගෙනය. අපේ වාහනවලට ඉදිරියට යාමට ඉන්පසු අවසර ලැබුණි.

ආචාර්ය ආරියරත්න මහතා ආරක්ෂා කර ගැනීම සඳහා දැඩි උනන්දුවකින් යුතුව ඉතා කල්පනාකාරීව ක්‍රියා කළ යුතු බව ප්‍රත්‍යක්ෂ කර ගත් මා කැල්පෙන්බර්ග් වෙත යන තුරුම විශේෂයෙන් අශුභදායක කිසිවක් සිදුවීම වැළැක්වීම සඳහා අප සමඟ ගමන් ගත් අනෙක් ආරක්ෂක නිලධාරීන්ට ඒ සඳහා නිසි උපදෙස් දුනිමි. චීන වරාය පාරේ ගමන් කරමින් සිටි අප වංගුවක් පසු කළා පමණි .වේගය අඩු කර වහාම නවත්වනු. කෑගැසීමත් සමඟම ඉන්දීය සොල්දාදුවන් විසින් අපේ වාහන දෙවන වරටත් නවත්වනු ලැබීය. මාර්ග බාධක කල්තියාම අටවා ගෙන සිටි ඔවුන් මහත් කලබලයෙන් සංවිධානය වෙමින් ඒ අන්ධකාර රාත්‍රියේ යම් විශේෂ කාර්යයක් සඳහා සැරසුණු

බව අතිශයින් පැහැදිලි විය. කඩිනමින් වාහනවලින් බැස ගත් අපේ ආරක්ෂක භටයින් ද මා කලින් දී තිබුණු උපදෙස් පරිදි ආචාර්ය ආරියරත්න මහතා කිසිවෙකුට නොපෙනෙන පරිදි මුවා කර ගනිමින් වට කර ගත්හ. අවස්ථානුරූපව කරන්නට තිබූ එකම දෙය හැටියට කඩිනමින් වාහනයෙන් බැස ගත් මම මුලින්ම හින්දි භාෂාවෙන් ද පසුව ඉංග්‍රීසියෙන් හා දෙමළෙන් ද ඔවුනට කතා කළෙමි. හොඳින් කතා කිරීමෙන් මෙම ප්‍රශ්නය විසඳා ගත නොහැකි බව සිතූ මම එකම විකල්ප මාර්ගය ලෙස උපරිම ආයාසයෙන් අසභ්‍ය වචන පාවිච්චි කරමින් (ඒවා දන් ඉහළ තැන්වල පවා භාවිතා වන්නේ සභ්‍ය ලෙසටය) ඔවුන් පිළිබඳව ජෙනරාල් කල්කැට් වෙත රපෝර්තු කරන බව කියමින් තර්ජනය කර පරුෂ වචන යොදා කෑ ගැසීමි. මගේ රේඩියෝ කට්ටලය ක්‍රියා කරවන්නාට ද කතා කර වහාම එය රැගෙන එන ලෙස අණ කළෙමි. මගේ නිල ඇඳුමෙහි උරහිසෙහි ඇති නිල පදක්කම් ඔවුනට පෙන්වූ මම 'ශුද්ධ සිංහලෙන්ම' නපුරු වචන යොදා දිගටම කියාගෙන යන්නට වීමි. ඉන්පසු දෙවන පිරික්සුම් ආලෝක ධාරාවක් අප හරහා යවනු ලැබූ නමුත් ඔවුන් බලාපොරොත්තු වූ පරිදි ආචාර්ය ආරියරත්න මහතා එතැන සිටියේ නැත. ඇත්තෙන්ම මගේ උපාය මාර්ගය සාර්ථක විය.

ඉන්දීය හමුදා බාර නිලධාරියා භටයින්ට පසුබසින ලෙස තම නියෝගය නිකුත් කළේය. ''විත්ඩ්‍රෝ කරෝ කල්ති කරෝ'' අණට කීකරු වූ මුරභටයෝ ගනඳුර තුළින් සැඟවී ගියෝය.

අසරණ දිළිඳු ජනතාවගේ සුභ සිද්ධිය තකා ඉෂ්ට කරන්නා වූ මහඟු සේවාව තවදුරටත් නොකඩවා ගෙනයාම සඳහා අසහාය ශ්‍රී ලාංකික ආචාර්ය ඒ.ටී.ආරියරත්න මැතිතුමා තවමත් ජීවතුන් අතරය.

මෙම සිද්ධියෙන් පසු ආචාර්ය ආරියරත්න මහතා මට මුණගැසුණු හැම විටම එතුමාගේ මුවින් පිට වූ ''විත්ඩ්‍රෝ කරෝ කල්ති කරෝ'' හින්දි වචනය අප දෙදෙනාටම සතුට හා ආශ්වාදය ගෙන දෙන්නක් විය. වරින් වර මරණයට මුහුණදීමේ අවස්ථා මට

ලැබිණි. මේජර් ජනරාල් සාලිය කුලතුංග මහතා එදා මා බේරා ගත්තේය. ඒ සඳහා එතුමාට මා සදා ණයගැතිය.

පසුතැවිලි නොවී ලද යුතු අත්දැකීමක්
මිත්‍ර නිකේතන් නිර්මාතෘ ශ්‍රී විශ්වනාදන්

විශ්වනාදන් මහතා සහ රාජසේකරන් මහතා සමඟ කාලය ගත කිරීම මට වැදගත්ය. විශ්වනාදන්ගේ ජීවිත කතාව අසා සටහන් කරගෙන යමි. ඔවුන් දෙදෙනාම මැග්සයිසයි ත්‍යාගය ලැබීමට සුදුස්සෝ ය. මම ඔවුන්ගේ නම් යෝජනා කරමි. ඊයේ: එනම්, 1988 ඔක්තෝම්බර් 4 වැනිදා නයිරෝබි ගුවන් තොටුපොළේදී අපට හාස්‍ය



විශ්වනාදන් මහතා, මම සහ රාජසේකරන් මහතා

ජනක අත්දැකීමක් ලැබිණ අප්‍රිකානු රටවලට පැමිණ ආපසු යන විට බොම්බායේදී කහ උණ ප්‍රතිශක්තිකරණ සහතිකයක් නොතිබුණ හොත්, 'කොරන්ටයින්' උදෙසා (රෝග වැළැක්වීම සඳහා වෙන් කොට තැබීම) සතියක් තමන්ගේ වියදමින් රඳවා ගනු ලැබේ. විශ්වනාදන් මහතාට මේ සහතිකය නොතිබුණු අතර, රාජාට සහ මට තිබිණි. ලුසාකාවලට යන භාතිය පණ්ඩිතරත්න මහතාට ද සහතිකය නොතිබිණි. මේ අතර විශ්වනාදන් මහතා ගුවන් තොටුපළේ සෞඛ්‍ය අංශයේ කාන්තාවක් හා කතා කළ විට, මේ සහතිකය දිය හැකි බව ඇය කියා තිබේ. රාජා හා මට ද මේ ගැන

කතා කරන්නට කාමරයකට කැඳවිණි. ප්‍රතිශක්තිකරණ එන්නත නොදී, එක් කෙනෙකුට ඩොලර් 50 ගණනේ දුන්නොත්, සහතිකය දෙන බව එහි සිටි හොඳට ඇඳ පැළඳගත් තරුණ මහතෙක් සෞඛ්‍ය නිලධාරී ලවා කීය. පැයක පමණ සාකච්ඡාවකින් පසු අපි හතරදෙනාම ඩොලර් 15 ගණනේ දී සහතික පත්‍ර ලබා ගතිමු. රාජා හා මාද එය ලබා ගත්තේ විනෝදයටයි. අපත් අල්ලස් හා දූෂණයට. කොටස්කරුවෝ වීමු. බොම්බායේ සතියක් අතේ වියදමින් කොරන්ටයින් උදෙසා හසු වනවාට වඩා විනෝදාත්මක මේ අල්ලස දීම අපට වඩාත් පහසු විය.

ශ්‍රී විශ්වනාදන් මහතා මට වඩා අවුරුදු 4 ක් වැඩිමහල් පුද්ගලයෙකි. ඔහු තම ජීවිත කාලයෙන් වැඩි කොටසක් වැය කරමින්, විශේෂයෙන් කේරලයේ ජනතාව වෙනුවෙන් ඉෂ්ට කරන ලද සේවය විශිෂ්ට ගනයේ සමාජ මෙහෙවරක් ලෙස හැඳින්විය හැක. ඔහු සදාකාලික ලෙස ජනතාවගේ සිතෙහි ජීවත් වන පුද්ගලයෙකි ''මිත්‍ර නිකේතන්'' ආයතනය ඒ මහතාගේ ප්‍රධානතම නිර්මාණයයි අපි එහි අතීත වෘතාන්තය දෙස මොහොතකට හැරී බලමු.

* * *

මිත්‍ර නිකේතනය පිහිටා ඇති ප්‍රදේශය හඳුන්වන්නේ වෙල්ලනාඩ් යනුවෙනි. උසස් කුලවල අධිපතියන්ගේ පාලනයේ පැවැති වෙල්ලනාඩ් ප්‍රදේශයේ ජීවත් වූ විශ්වනාදන්ගේ පියා, අවුරුදු 120 කට පමණ පෙර එහි ආරම්භ වූ ශ්‍රී නාරයන ගුරුකුල ගෝත්‍රයන්හි ජන කොට්ඨාශයන්ට එරෙහිව සටන් කළ ශ්‍රේෂ්ඨ හින්දු ආගමික නායකයෙකි. ඔහු අඩු කුලයක වුවද ඉහළ පැළැන්තිවල අයගේ තර්ජනයන්ට යටත් වූයේ නැත. අඩු කුලවල කාන්තාවන් වෙනුවෙන් ඔහු විසින් ''ශ්‍රී නාරායන ධර්ම පරිපාලන යෝග ව්‍යාපාරය'' ආරම්භ කළේය. ඒ කාලයේ උස් පහත් කුලවලට අයත් ජනතාව අතර, තිබූ ආගමික විෂමතා හා අනෙකුත් විවිධ අත්දැකීම් සහිත පසුබිමක හැදුනු වැඩුනු ඔහුට, සමාජ සේවය සඳහා ඒවා මහත් ධෛර්යයක් හා ශක්තියක් විය.

විශ්වනාදන්ගේ සීයා ශ්‍රේෂ්ඨ ආයුර්වේද වෛද්‍යවරයෙකි. ආගම් සහ කුලභේද නොතකා, හැම දෙනාටම සහෝදරත්වයෙන් සලකා පොදු ජනතාව සඳහා ආගමික සිද්ධස්ථාන ගොඩනැගීමට යුහුසුළු වූහ. ඒවා නිර්මාණය කර තමන් විසින්ම විවෘත කර ගත්හ. ශිව කෝවිලක් තැනූ විශ්වනාදන්ගේ සීයා, එය තම සෙනඟට හඳුන්වා දුන්නේ මේ ඔබේ 'ශිව' යැයි කියමිනි. උසස් කුලවල අයගේ ශිව කෝවිල් ඔවුන්ගේ පමණක් ශිව විය.

තරුණ විශ්වනාදන් 1943 සිට 1945 දක්වා ගාන්ධිතුමාගේ නිදහස් ව්‍යාපාරයට සම්බන්ධ වී ගාන්ධි අනුගාමික ශ්‍රී රාමචන්ද්‍රන් මහතාගේ ආශ්‍රයට පත් විය. එහිදී කුල බේදයට හා අධිරාජ්‍යවාදයට විරුද්ධව තරුණ දේශපාලන ව්‍යාපාරයක් ශක්තිමත්ව ගෙන යාමට ඔහු සමත් වූ අතර, අධිරාජ්‍යවාදී පාලනය යටතේ වසා දමන ලද තේ කඩ සියල්ල නැවත විවෘත කිරීමටත්, සටන් කළේය. දේශීය කර්මාන්ත නගා සිටුවීමේ අදහසින් කපු ඇට එකතු කර, කපු වවා, රෙදි වියීමේ කර්මාන්තය ආරම්භ කර, එය ජනතාව අතර ප්‍රචලිත කරමින් එම රෙදි ඇඳීමට ඔවුන් පුරුදු කළේය වැඩිහිටි සර්ව බල ඡන්දය අනිවාර්ය අධ්‍යාපනය ආදී අංශ කෙරෙහි වැඩි උනන්දුවක් දක්වූ විශ්වනාදන් මහතා, පාසල් නොයන ළමුන් බලෙන් පාසල්වලට ඇතුළත් කිරීමට තරම් පෙළඹුණේය. නිවෙස්වලට ගොස් ඊට අකමැති දෙමව්පියන් ද ඒ සඳහා උනන්දු කරවූයේය.

විශ්වනාදන්ගේ පියා කොන්ත්‍රාත්කරුවෙකි. හෙතෙම තම වැඩ කටයුතුවලට විශ්වනාදන් පියාගේ උදව් උපකාර ලබා ගත්තේය. මුදල් ද ලැබුණි. ඒ කාලයේ රටේ ක්‍රියාත්මකව තිබූ අධ්‍යාපන ක්‍රමය වැරදි බවත්, මූලික අධ්‍යාපනය වෙනත් විදියකට දිය යුතු බවත් යෝජනා කරමින්, රටේ වරප්‍රසාද ලත් පන්තියේ බලය අතට ගත්තේය.

ගාන්ධිතුමාගේ 'සේවාග්‍රාම්', රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ශාන්ති නිකේතනය ආදී වූ ස්ථානවල ඇසුර ආභාෂය ලත්

විශ්වනාදන් මහතා, තරුණ කාලයේදීම උසස් දාර්ශනිකයෙකුගේ තත්ත්වයට පැමිණියේය. එම දර්ශනයට අනුව හැඩගැසුනු ඔහු, දිගටම ජීවත් වූයේ පොල්අතු සෙවිළි කළ ගෙයකය. ගාන්ධි දර්ශනය අනුව ආර්ථික විද්‍යාවක් ඉගැන්වූ ජේ.සී. කුමාරප්පා මහතා, දේශපාලන දර්ශනයක් බිහි කළ ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් ආදීන්ගෙන් ආභාෂය ලැබූ විශ්වනාදන්, 1953 දී ක්වේකර් ශිෂ්‍යත්වයක් ලැබ ඇමරිකාවේ පෙන්සිල්වේනියාවට ගොස් වැඩිදුර අධ්‍යාපනය ලැබීය. විවිධ රටවල ශිෂ්‍යයන් මුණගැසී බොහෝ දේ උගත්තේය. සමූපකාර ව්‍යාපාරය ණය දෙන සමිති, ඉඩම් ග්‍රාන්ට් කොලීජිය, වැඩිහිටි අධ්‍යාපන ආයතන පිළිබඳ පුළුල් සහ ගැඹුරු දැනීමක් ඇති කර ගත් ඔහු, සුප්‍රසිද්ධ දාර්ශනිකයෙක් සහ අධ්‍යාපනඥයෙක් වූ ඈනර් මෝගන් මහතා මුණගැසීමේ භාග්‍යය ද ලැබුවේය. ආපසු සිය රට බලා පැමිණි පසු, ශාන්ති නිකේතනයේ නැවතීමට ස්ථානයක් ඔහුට ලබා දුන් ජී. රාමචන්ද්‍රන් මහතා සහ ආශාදේවී ආරියනායකම් ජේ.සී. කුමාරප්පා යන අයගේ ඇසුර ලබා ගත්තේය. පසුව සේවාග්‍රාම් ගොස්, එහි වැදගත් සංකල්පයන් ශාන්ති නිකේතනයට ගෙනැවිත්, තම සමාජ සේවාවන් තුළින් ඒවා ජනතාව තුළ ප්‍රචලිත කිරීමට සමත් වු අතර, ගම්වලට ගොස් ග්‍රාම සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී නිකේතන් නමින් අලුත් මධ්‍යස්ථානයක් ඇති කළේය. විශ්වනාදන් මහතාගේ පෞද්ගලික 'විශ්ව භාරතී දර්ශනය' ඔහුගේ ජීවිත කාලයේදීමවත් අනෙකුත් සංකල්ප සමඟ එක් වූයේ නැත.

ශාන්ති නිකේතනයේ නිවාඩු කාලවල සෑම තැනම ඇවිද්ද ඔහු, උපාධි ලබා ගැනීම හෝ රාජ්‍ය සේවයට ඇතුළත් වීම වැනි අරමුණු ඇති කර ගත්තේ නැත. ඒ කාලයේ අධ්‍යාපන ඇමතිව සිටි අනිල් චන්ද්‍ර විසින් තම ගවේෂණයන් සඳහා අවශ්‍ය දේ සපයා දුන් අතර, සුප්‍රසිද්ධ දාර්ශනිකයෙකු හා අධ්‍යාපනඥයෙකු වූ ආතර් මෝගන් මුණගැසීමේ භාග්‍යය උදා වූයේ ද මෙම ගමන් බිමන්වලදීය. මෝගන් මහතා සමඟ වැදගත් සාකච්ඡාවන්ට ද විශ්වනාදන් මහතා යොමු වූ අතර, වයස 90 දි පමණ මෝගන් මහතා මිත්‍ර නිකේතනයට පැමිණ, විශ්වනාදන් මහතා සමඟ ගත කළේය. මහන්සි වී වැඩ කර,

විවිධ රැකියා කරමින් මුදල් ඉපයූ ඔහු, බෙරියා කොලීජියටත්, ෆෝක් උසස් විද්‍යාලයටත් ගොස් තවත් ඉගෙන ගත්තේය.

අවුරුදු එකහමාරක් අමෙරිකාවේ ගත කර, මාටින් ලූතර් කිං හමු වී ආතර් මෝර්ගන් ගේ පුහුණු මධ්‍යස්ථානය හා කොලීජියට ද, ඇන්ටියෝක් රසායනාගාරයට ද ගිය අතර, ඇපලේෂියන් කඳු ප්‍රදේශවල ජනතාව ද මුණගැසී එම ප්‍රජාවන් ඒකරාශී කළේය. නැවතත් එහි සංචාරයේ යෙදීමෙන් විවිධ කර්මාන්ත අරඹා එම ක්ෂෙත්‍රයේම නියැලී සිටීමෙන්, මුහුකුරා ගිය අත්දැකීම් සහිත වූ විශ්වනාදන් මහතා ඊළඟට කල්පනා කළේ විද්‍යානුකූලව ද යමක් කළ යුතුය යන්නයි.

ඉන්පසු ජූලියන් හක්ස්ලි වැනි ශ්‍රේෂ්ඨ විද්‍යාඥයින් ද හමු වූ ඔහු, එංගලන්තය හරහා ඩෙන්මාර්කයට පැමිණ, ස්කැන්ඩිනේවියානු රටවල ද යුරෝපයේ ද තිබූ උසස් ජනතා පාසල් සංස්කෘතීන් හා කලාව සමූපකාර ජීවිතය ගැන ඉගෙන ගෙන, 1956 දී නැවත තම ගමේ ම පදිංචි වී මිත්‍ර නිකේතන වැඩ සටහන ගම්මුන් සමඟ ම ආරම්භ කළේය.

මට අවශ්‍ය වන්නේ දැනීම හා අත්දැකීම් මිස උපාධි නොවේ. මා ජනතාව සමඟ වැඩ කළ යුතුය යනුවෙන් ප්‍රකාශ කළ විශ්වනාදන් මහතාට, තම පරමාර්ථයන් අනුව ක්‍රියාත්මක වීමට බාධාවක් වූයේ අවශ්‍ය සම්පත් නොමැති වීමය. සමාජ සේවයට අවශ්‍ය ඉඩකඩම් ගොඩනැගිලි නොමැතිවීම නිසා ගමේ පල්ලිය කුලියට ගැනීමට සිදුවිය. සැතපුම් 50 ක් පමණ දිනකට ඇවිද්දේය. නමුත් විනෝබා භාවේ සමඟ එකතු වූයේ නැත. කෙතරම් බාධක දුෂ්කරතා තිබුණ ද ගම අත් හැර නොගිය එතුමා, තමා වෙත ප්‍රදානය කරනු ලැබූ භාරත් සේවක සමාජ ලේකම් පදවිය ද ප්‍රතික්ෂේප කළේය. කුල භේදයට සහ ධනවත් ජන කොට්ඨාශ විසින් දුප්පත් ප්‍රජාවට විරුද්ධව කරන ලද අසාධාරණකම්වලට විරුද්ධව සටන් කිරීම නිසා කිහිපවරක් මරණීය තර්ජනවලට ද ඔහු මුහුණ දුන්නේය. ඉන්පසු ශාන්ති

නිකේතනයට යාමට පෙර ඔහු හරිජන් ජනයා (කුලහීන) සංවිධානය කරමින් සිටියේය. ඉන් කෝපාවිෂ්ට වූ උසස් පවුල්වල කණ්ඩායම් එක් රැස් වී, ගුණ්ඩා නැමැති මැරවරයා ලවා එතුමා මැරවීමටත් බසයක හැප්පවීමටත් උපාය මාර්ග යෙදූහ වෙල්ලනාඩි හන්දියේදී සතුරෙකුගේ පහර දීම නිසා ඔහුගේ එක් කනක් පැලීම නිසා ඒ කන නැසී ගියේය. පසුව ශාන්ති නිකේතනයට ගොස් ආපසු නොඑන බව කියා පිට විය. එසේ පහර දුන් මිනිසා දිනක් අතරමඟදී මුණගැසී අඬමින් තමා කළ වරදට සමාව ඉල්ලා ඇත.

* **

විදේශයන්හි ගොස් ආපසු පැමිණි විට ඔහුට පිළිගැනීම් ලැබෙන්නට විය. මගේ හදවතට එකඟව යමක් කළ යුතුය යන හැඟීමෙන් මම වැඩ පටන් ගතිමි. ඔවුන් සිතුවේ මා ගමින් පිට වී බලවත් පුද්ගලයෙක් වේය කියායි. මා අදහස් කළේ ගම තුළම සිටිමින් ගමට සේවයක් කිරීමටයි. මෙලෙස තම අදහස් ප්‍රකාශ කළ විශ්වනාදන් මහතා, ගමේ තිබුණු එකම ප්‍රාථමික පාසලේ ගුරුවරුනට නැවතී සේවය කිරීම සඳහා පියා ලවා ඉඩ සලසා ගත්තේය. ගුරු ආදරය නිසි අයුරින් ලැබුණු නිසා, ළමෝ පාසලට පෙර හා පසුව ද එහි ගියහ. ශාන්ති නිකේතනයත් විදේශයන්හි විස්තරත් පිළිබඳව ළමුන් දැනුවත් කිරීම නිසා, ඔව්හු පාසලත් ඉගෙනීම මෙන්ම, ගුරුවරුන් ඇසුරත් එක ලෙස ප්‍රිය කළහ.

''මම රෙදි වියා ගන්නවා දුටු ශිෂ්‍යයින්ට එය ඉගෙන ගැනීමට වුවමනා වුණා. මම ළමයින්ට නූල් කැටීම ඉගැන්වීම ආරම්භ කළ විට, නූල් කටින සමාජයක් බිහි කිරීමට ඉබේම හැකි වුණා. ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතුවලට මෙම කුසලතාවයන් පිටිවහල් වූවා සේම ඒ තුළින් නායකත්වය යන්න හඳුන්වා දී ඒ පිළිබඳව ඔවුන්ව පුරුදු පුහුණු කළා. නොයෙකුත් අත්හදා බැලීම්වල යෙදුණු දක්ෂ සිසුවෝ, තමන් උගත් දේ ගුරුවරුන්ටත් කියා දුන්හ. ළමයින්ට ශාරීරික මානසික වදහිංසා කිරීමෙන් වැළකී ඔවුන්ගේ බිය තුරන්

කර, ඒ වෙනුවට ආදරය කරුණාව ලබා දීමෙන් ගුරු-සිසුන් අතරේ අන්තර් සබඳතා හා විශ්වාසය වර්ධනය වීම නිසා ඕනෑම දෙයක් කළ හැකිය. මෙවැනි ප්‍රගතියක් ඇති වූ පසු සති අන්තවලදී ද ගුරුවරුන් පැමිණ, ළමුන්ගේ නිවෙස්වලට යාමට පෙළඹුණහ. මේ අවස්ථාවේදි මගේ පියා නිවස අසල තිබූ තවත් නිවසක් ලබා ගත්තා පුස්තකාලයක් හා සෙසු වැඩවලට මේ අතර පැමිණි පල්ලියේ ස්වාමිතුමා පල්ලියේ ගොඩනැගිල්ල අපට ලබා දුන්නා. පල්ලිය අපට ලැබුණේ ඒ විදියටයි.

ඒ කාලයේ ගාන්ධි නිධි සේවනයක් තිබුණා. මසකට රුපියල් පනහක් ඉන් අපට ලබා දුන් නමුත් මගේ දෙමාපියන් ඒ කාලයේ ආර්ථික දුෂ්කරතාවලින් පෙළුන නිසා, නොයෙක් දෙනා මුදලින් උපකාර කළා නමුත් ඒ මුදල් බාර නොගෙන ආපසු යැවූ මම, ඒ වෙනුවට ද්‍රව්‍ය හා ශ්‍රමය ඉල්ලා ගෙන ඒ අය තුළ ශ්‍රමභිමානය ඉපදෙව්වා. වර්ෂාව තිබෙන විට වැඩියෙන් වැඩ කළහැකි නිසා ගමට එන පාර සකස් කිරීම හා ගොවිතැන් වැඩ ආරම්භ කිරීම සිදු කළා.

විශාල අධිෂ්ඨාන ශක්තියකින් වැඩ කර ගෙන ගිය නිසා, වැඩි කල් යන්නට මත්තෙන් ඔහුගේ සතුරන් පවා ඔහුට ගරු කරන්නට විය. පෙර පාසල් දරුවාගේ සිට වැඩිහිටියා දක්වා පූර්ණ අධ්‍යාපනයක් ලබන අන්දමට ඔහු අධ්‍යාපන ආයතන පිහිටුවීය පරිසරය වෘක්ෂලතා ජලය පැරණි තාක්ෂණ ක්‍රම ආදිය ආරක්ෂා වන අන්දමින් සංවර්ධන කටයුතු ආරම්භ කළ ඔහු, පක්ෂ රහිත පංචයාත් දේශපාලන සංවිධාන ඇති කිරීමට ද පුරෝගාමී විය. විශාල වශයෙන් ඉතිරි කිරීම් ණය දීම් ව්‍යාපාරය සමූපකාර බැංකු ආදිය ද ඇරඹීය. දැන් ඒ ප්‍රදේශය ම මිත්‍ර නිකේතනය නිසා යාදෙන සංවර්ධන ක්‍රමයක ආදර්ශයක් හැටියට සැලකිය හැකිය.

ඉන් අනතුරුව සිදුවූයේ කුමක්ද? අප ලබා තිබූ ප්‍රගතිය දැක බියට පත්වූ එහි පැමිණි පල්ලිය අයිති ස්වාමිතුමා පල්ලිය ආපසු ඉල්ලා සිටියා. වහාම එය ආපසු බාරදුන් විශ්වනාදන් තම පියාගෙන් ඉඩම් අක්කරයක් ලැබුණු හෙයින් එහි වැඩ කටයුතු ක්‍රියාත්මක කළේය.

මිත්‍ර නිකේතනයේදී විශ්වනාදන් මහතා සමඟ

මහාචාර්ය ජී. රාමචන්ද්‍රන් මහතා හමුවීම

මිත්‍ර නිකේතනයේදී විශ්වනාදන් මහතා සමඟ

මිත්‍ර නිකේතනයට මම බොහෝ වරක් ගොස් ඇත්තෙමි. එතුමා ද සර්වෝදයට කිහිප වරක් පැමිණ තිබේ. මේ හැරුණු විට විවිධ රටවලදී අප දෙදෙනා මුණගැසී අපේ මිත්‍රත්වය වර්ධනය කර ගැනීමට ද අවස්ථාව මට ලැබිණි. ශ්‍රී විශ්වනාදන් පෞද්ගලිකව මා කල්‍යාණ මිත්‍රයෙක් හැටියට සලකන අතර මේ ශ්‍රේෂ්ඨ පුරුෂයාත්, මිත්‍ර නිකේතනයත් දක බලා ගැනීමට ඔබටත් කේරලයට යා හැකි නම් ඒ අත්දැකීම පිළිබඳව ඔබ පසුතැවිලි නොවනු ඇත.

මානව දයාවෙන් පිරි හදවතක්
දොස්තර ආර්.කේ. සෙත් මහතා

දේශනයක් පැවැත්විම සඳහා වරක් මා නවදිල්ලියට ගිය අවස්ථාවකදී එක්තරා මහත්මයෙක් මට කලින් දේශනය පවත්වමින් සිටියේය. එම කතාවට සවන් දීමේදී මට ඔහු ගැන ඇති වූයේ පුදුම පැහැදීමක් හා ලෙන්ගතුකමකි. මගේ සිත කෙතරම් ඔහු වෙත ඇදී ගියා ද කියතොත් මට හැඟී ගියේ සසර පූර්ව සබඳකමක් අලුත්වීමක් සිදු වේගෙන යන සැටියෙකි. එම දේශනය අවසන් කළ නිමේෂයකින් මම ඔහු ළඟට ගොස් කතා කළෙමි. කලකින් දුටු සොහොයුරෙකු මෙන් මා දෑතින් වැළඳ ගත් හෙතෙම ඉතාම ප්‍රීතියෙන් සෙනෙහසින් මා පිළිගත්තේය. නිදහසේ තොරතුරු කතාබස් කර ගැනීමට අපි ඉන්පසු එතුමාගේ 'වේණු' අක්ෂි ආයතනය වෙත ගියෙමු.

අක්ෂි විශේෂඥ වෛද්‍ය ආර්.කේ. සෙත් මහතා

වේණු ගොඩනැගිල්ලට ඇතුළු වන විටම මගේ කන වැකුණේ, ඉතාම වටිනා රස වින්දනයකට අප යොමු කිරීමට සමත් වූ භගවත් ගීතාවේ ගායනා රිද්මයයි. මෙම විද්වතාණන්, යම් ආධ්‍යාත්මික මාවතක් ඔස්සේ ගමන් කරන පුද්ගලයෙක් යන්න මම ඉන් පැහැදිලිව තේරුම් ගතිමි.

මට මුණගැසුණු මෙම ආගන්තුක විද්වතා උතුරු ඉන්දියාවේ විශාල ප්‍රසිද්ධියක් උසුලන අක්ෂි විශේෂඥවෛද්‍ය ආර්. කේ. සෙත් මහතාය. නවදිල්ලියේ පිහිටි එම වේණු අක්ෂි ආයතනය සහ පර්යේෂණ මධ්‍යස්ථානයේ නිර්මාතෘවරයාය. උතුරු ඉන්දියාවේ ප්‍රධාන ප්‍රජා අක්ෂි ආයතන ප්‍රධානීන් අතුරින් ප්‍රමුඛ ලෙස කැපී පෙනුන සෙත් දොස්තර මහතා සුවිශේෂ වූ උසස් මට්ටමකින් තම අක්ෂි ආයතනය ද ගොඩනගා ගෙන තිබුණි. දිළිඳු අසරණ ජනතාවට ආදරය කළ ඔහු, ශ්‍රේෂ්ඨ අක්ෂි වෛද්‍යවරයකු ලෙස නම් දැරීය. ඔවුන්ට පිළිසරණ වෙමින්, දහස් සංඛ්‍යාත ජනතාවකට සේවය කළ එතුමා තම ජීවිතය අවංකවම මිනිස් වර්ගයා වෙනුවෙන් කැප කළේය.

පන්ජාබ් ප්‍රාන්තයේ 'අම්රිට්සාර්' (Amritsar) වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය සමත් වූ සෙත් මහතා වර්ෂ 1966 දී නවදිල්ලියේ පිහිටි මෞලානා අසාඩ් (Moulana Azad) වෛද්‍ය විද්‍යාලයෙන් පශ්චාත් වෛද්‍ය උපාධිය ලබා ගත්තේය.

ඉන්පසු තිරාත් රාම් ජේසා රාම්, ශාන්ත ස්ටීවන් යන රෝහල්වල සේවය කළ එතුමා තවත් බොහොමයක් තදාසන්න ප්‍රදේශවල අක්ෂි සායන පැවැත්වීය. තම ජීවිතයේ දෛවෝපගත අත්දැකීමෙහි ප්‍රථම අවස්ථාවට ඔහු මුහුණ දුන්නේ තම වෘත්තීමය පූර්ණත්වයේ උච්චතම ස්ථානයට පැමිණ සිටින විටය. ජීවිතයේ අවසානයට ප්‍රවේශවීමට තව වැඩිදුරක් නැතැයි යන හෝඩුවාවක් ඔහුට දැනෙනන්ට ඇත. උග්‍ර හෘදයාබාධයකින් පෙළෙන්නට වීම එයට හේතුවයි. (Myocardial infarct) 1976 වර්ෂයේ මැයි මාසයේදී ප්‍රථම වරට ද, එම වර්ෂයේ ඔක්තෝම්බරයේ දෙවැනි වරට ද ඔහු හෘදයාබාධයට ගොදුරු විය. තවද ඒ වන විට ඔහු උසස් සමාජ ගෞරවයක්, නමක්, ප්‍රසිද්ධියක්, ධනයක් සමාජයෙන්ම අත්පත් කරගෙන තිබුණ බැවින් ඒ වෙනුවට තමා විසින් ද යමක් සමාජය වෙත ප්‍රදානය කළයුතු වාරය එළඹ ඇති බවක් අවබෝධ කර ගත්තේය. ඒ සඳහා ඇති සුදුසුම ක්‍රමය වන්නේ තම දැන උගත්කම්

භාවිතා කර අසරණ දුගී ජනතාවට සේවය කිරීම බැවින් සෙත් මහතා එම මාර්ගය තෝරා ගත්තේය. තම හිතමිත්‍ර වෛද්‍යවරු කණ්ඩායමක්, ජනහිතකාමී ව්‍යාපාරිකයින් කිහිපදෙනෙක් සහ පළපුරුදු නිලධාරීන් ඒකරාශී කර ගත් සෙත් මහතා විසින් 1980 වර්ෂයේදී 'වේණු පුණ්‍ය සංගමය' පිහිටවනු ලැබීය. වේණු ආයතනය පුණ්‍යායතනයක් බවට පරිවර්තනය විය. අක්ෂි ආරක්ෂක ප්‍රතිකාරයන්හි විශේෂ සුදුසුකම් ලත් වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් තම සේවය සඳහා නවදිල්ලි නගරයේ වෙනම ආයතනයක් පිහිට වීය. ගම්බද ප්‍රදේශ හා මුඩුක්කුවල ජීවත් වන දිළිඳු අසරණ ජනතාවට නගරයට සේන්දුවීමට අපහසු බැවින්, ඔව්හු තම සායන වැඩ සටහන් පුළුල් කරමින් වෙනත් විකල්ප මාර්ග ඒ සඳහා නිර්මාණය කළහ. මා ඔහු හමුවීමට ගිය හැම විටම, එතුමා මගේ ඇස් දෙක පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිකාර ඇත්නම් එවේලේම ලබා දුන්නේය.

1996 වන විට තව දුරටත් තම සේවා පුළුල් කිරීමෙන්, නවදිල්ලියේ මූලික රෝහලක් කේන්ද්‍ර කොට ගෙන ව්‍යාප්ත වූ වේණු ආයතන සේවාවන් තදාසන්න දිස්ත්‍රික්ක 20 ක් තුළ ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර, මෙම සේවා සඳහාම වෙනම නිවාසයක් ඉදි කිරීමට දිල්ලියේ Sheikh arai හිදී අත්තිවාරමෙහි මුල්ගල තැබීය. ඒ අවුරුද්දේම ජනවාරි 29 වැනි දින සෙත් මහතා සදහටම අප අතරින් වෙන් විය. එවිට එතුමාට වයස අවුරුදු 56 වූවා පමණි. එතුමාගේ අපේක්ෂාවන් අනුව සාමාජිකයින් විසින් එම සේවාවන් ඒ විදියටම පවත්වා ගෙන යනු ලැබේ.

වේණු පුණ්‍ය ආයතනයේ ගරු ලේකම් ලෙස කටයුතු කරන්නේ තනුජා ජෝසි මෙනවියයි. ඇය ඉන්දීය අක්ෂි බැංකු සංගමයේ සභාපතිනියයි. වේණු පුණ්‍ය ආයතනයේ වෛද්‍ය අධ්‍යක්ෂ ලෙස දොස්තර එස්.සී.ගුප්තා මහතා කටයුතු කරයි.

තනූජා ජෝසි මෙනවිය, වෛද්‍ය සෙත්, ගුරු මහරාජ් මහතා සමඟ

මම, තනූජා ජෝසි හා නීතා

මානව දයාවේ සංකේතයන් වූ එවැනි මිනිසුන් ඇත්තේ ටික දෙනෙකි. ඔවුන්ගේ මෙහෙවර මිනිස් සන්තානයෙන් කිසිදා ගිලිහී නොයනු ඇත. මා දයාබර සොයුරු වෛද්‍ය ආර්.කේ.සෙත් මහතා අපෙන් වියෝ වී දස වසරක් ඉක්ම ගොස් ඇතත්, මා නවදිල්ලියට යන හැම අවස්ථාවකදීම අදත් වේණු අක්ෂි ආයතනයට ගොස් තනුජා නංගී සහ වෛද්‍ය ගුප්තා මුණ ගැසීමට අමතක නොකරමි. අද නව ගොඩනැගිලි සංකීර්ණය සම්පූර්ණයෙන්ම ඉදි වී වේණු අක්ෂි සේවය ඉහළම තත්ත්වයෙන් ක්‍රියාත්මක වේ.

265

සාටෝ කිචිරෝ (Mr. Sato Kichiro)
සිල්වර් වොලන්ටියර්ස්

'ජපානයේ සිල්වර් වොලන්ටියර්ස්' සංවිධානයේ සාමාජිකයෙක් වූ සාටෝ කිචිරෝ මහතා බොහෝ කාලයක සිට අපේ මොරටුව සර්වෝදය මූලස්ථානයට ආව ගිය ජපානයේ අපේ පැරණි හිතවතෙකි. 1915 වර්ෂයේ අප්‍රේල් 13 වැනිදා ජපානයේදී උපත ලැබූ ඔහු ජපන් ජාතික බෞද්ධ බැතිමතෙක්. ලෝකයේ බොහෝ රටවල් වෙත අධ්‍යාපනික හා විවිධ අන්දමේ ආධාර හා ස්වේච්ඡා සේවා ප්‍රදානය කරනු ලබන සිල්වර් වොලන්ටියර්ස් හි විගනකාධිවරයෙක් හැටියට කිචිරෝ මහතා මුල සිටම සේවය කර ඇත. මෙම ස්වේච්ඡා සංවිධානය ආරම්භ කරන ලද්දේ 1981 පෙබරවාරි මාසයේ ටෝකියෝ නගරයේ චියෝඩා-කු නගරයේය. සංවිධාන සාමාජිකයන් දහසකටත් වඩා සිටින අතර ඔව්හු සංවර්ධනය වෙමින් පවතින රටවලට ගොස් ස්වේච්ඡා සේවාවන්හි යෙදෙති. එම සාමාජිකයින් පස් දෙනෙක් පසුගිය කාලයේ ලංකාවට පැමිණ කොළඹ සහ කැළණිය විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට ස්වේච්ඡාවෙන් ජපන් භාෂාව ඉගැන්වූ බව කිචිරෝ මහතා කියයි. කිචිරෝ ද අවුරුද්දකට වරක් වත් ලංකාවට පැමිණීම පුරුද්දක් ලෙස කර ගෙන ගිය දෙයක්. අපේ සර්වෝදයට පැමිණෙන ඔහු මෙහි ස්වේච්ඡාවෙන් බොහෝ සේවාවන්හි යෙදුණේය.

සර්වෝදයට පැමිණි විට ඔහු වඩාත්ම සමීප වූයේ අපගේ සර්වෝදය සුවසෙත නිවාසවල ආබාධිත ගැහැණු ළමුන් හා කාර්ය මණ්ඩලය වෙතය. අපේ වැඩිහිටි සහ ළමා නිවාසවලට ගොස් එහි හැමදෙනා සමඟ සතුටින් විනෝදයෙන් කල්ගත කිරීමට සාටෝ අතිශය ප්‍රිය කළා. රත්මලානේ වැඩිහිටි නිවාසයේ ආච්චිලා සමඟ සිංදු කියා නැටූ හැටි තවමත් ඉතා සතුටින් ඔහු සිහි කරයි.

ලංකාවට පැමිණෙන සාටෝ මෙහි නැවතී සිටින කාලයේදී මගේ ආධාර උපකාර මෙන්ම ආදර කරුණාව ද හදවතින්ම පැතූ, අගය කළ, කෙනෙක් විය. මගෙන් ලැබූ එවැනි අනුග්‍රහයත්, කරුණාවත්, ධෛර්යයත් නිසාම තම වැඩ කටයුතු නියම විදියට ඉෂ්ට කර ගන්නා බව ඔහුගේ ස්ථිර විශ්වාසය විය. සාටෝ කෘතවේදී පුද්ගලයෙක්. ලංකාවට පැමිණ ආපසු ජපානයට ගිය සැනෙකින් මට ලියුමක් ලියා තැපැල් කිරීමට අමතක නොකරයි. 'මම ආපසු ජපානයට පැමිණ, නැවත ස්වේච්ඡා සේවා ආරම්භ කළා'. වැඩ ආරම්භ කළ බව ඔහු හැමදාම ලීවේය. ඔහු වැඩ කළේ සිල්වර් වොලන්ටියර්ස් හි ටෝකියෝ සහ කන්ඩා සුඩාචිහෝ යන කාර්යාලවලට සම්බන්ධවයි. සාටෝගේ එවැනි සෑම ලිපියකම නොවැරදීම තිබුණු එක් කියමනකි. 'මම ප්‍රවේශමෙන් ගුවන් තොටුපළට පැමිණියා' ලංකාවේ මා නැවතී සිටි කාලයේ මට කළ උදව් උපකාර, දැක්වූ ආදර සංග්‍රහවලට ඔබට බොහොම ස්තුතියි!. ඔහුගේ ලියුම් කෙටියි. සතුට සොම්නස කෘතඥ බව එහි පිරී තිබිණි. සාටෝ ලංකාවට ඒමට සැලසුම් කර ලීවේ ද එවැනි එකම කියමනක් සහිත ලිපියකි. 'මා අසවල් දිනයේ නැවත ලංකාවට එනවා' මෙතෙක් කල් කළාක් මෙන් ඔබගේ උදව් උපකාර මට ලැබෙනවා නොවේද? මම එය අපේක්ෂා කරමි'. විවෘත හදවතකින් තම අදහස් ප්‍රකාශ කිරීමට ඔහු හැම විටම නිහතමානී විය. ලංකාවට පැමිණි විට සාටෝ නවාතැන් ගත්තේ ගල්කිස්සේ බාන්ස් මාවතෙහි අයිවරි ඉන් (Ivory Inn) තානායමේය.

පසුගිය මාර්තු මාසයේ අන්තිම සතියේදී සාටෝ නැවත සර්වෝදයට පැමිණියා. මා සොයා ආ ඔහු මගේ කාර්යාලයේදී මගේ ඡායාරූපයක් ගැනීමට අවශ්‍ය යයි ඉල්ලා සිටියා. මා එයට ඉඩ දුන්නා. තමාගේ පවුලේ ඡායාරූප කිහිපයක් ගෙනැවිත් මට පෙන්නුවා. සාටෝ සහ බිරිඳත්, දියණියත්, පුතා සහ ඔහුගේ බිරිඳත් එම ඡායාරූපවල පෙනී සිටියා. මීට අවුරුදු දෙකකට පෙර ඔහුගේ බිරිඳ මිය ගොස් ඇත. ඉන්පසු සිල්වර් වොලන්ටියර්ස් හි විගනකාධිකාරී තනතුරෙන් ඉවත් වී, ඔහු සාමාන්‍ය ස්වේච්ඡා සේවකයෙක් ලෙස වැඩ කරයි.

අඩි පහක් පමණ උසැති ඊට සරිලන සාමාන්‍ය ශරීර ප්‍රමාණයෙන් යුත් සාටෝ චාම් හා සරලය. වටකුරු මුහුණින් යුත් හෙතෙම නිතරම සිනාමුසු ප්‍රසන්න පෙනුමකින් යුක්ත විය. යාන්තමින් ඉංග්‍රීසි භාෂාවෙන් ද කතා කළ සාටෝ චතුර ලෙස කතා කළේ තම මව් භාෂාව වන ජපන් බසය. ඔහු හොඳ බෞද්ධයෙක් බව භක්තිමත් කතාවෙන් පැහැදිලි විය. ලංකාවෙන් සොයා ගත් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ බෝපත් කිහිපයක් තම පොතක් ඇතුළේ ප්‍රවේශම් කර තබා ගෙන සිටී. ඔහුගේ නිවසේ ද ලස්සන බුදු පිළිමයක් තිබෙන බව මතක් කළේ බොහෝ බැතියෙනි.

''ජපානයේ ගෙවල් පුංචියි. අපේ ගෙයත් පුංචියි. පුංචි ගෙවල් අපිට හොඳට පුරුදුයි. මගේ මිත්‍රයා තමයි ආරියරත්න මහත්තයා. අපි ඒ කාලයේ ඉඳන් හොඳ යාළුවෝ '' ඔහුගේ සතුට සොම්නස අන් අයට ප්‍රකාශ කළේ ඒ විදියටයි.

දැනට සාටෝගේ වයස අවුරුදු 88 ක්. නමුත් බැලූ බැල්මට ඒ බවක් පෙනෙන්නේ නැහැ. ශක්තිමත් ඔහු තවමත් නීරෝගීයි. අදත් මෙලෙස ඔහුගේ පැමිණීම දර්ශනය මට ගෙන දුන්නේ ප්‍රීතියක්. අපේ හිතවතුන් ගොඩට ඔහුත් භව තණ්හා පොතින් තවත් සමීප වී සිටී.

මා ජපානයට ගිය බොහෝ වාරවල ඔහුව පෞද්ගලිකවත්, පොදු සාකච්ඡාවලදීත් මුණගැසීම පුරුද්දක් විදියට සිදු වූ දෙයක්. නිවානෝ සාම පදනමේ, රිසෝකෝෂි කායි නිලධාරීන් සමඟ සාටෝ කිච්රෝ මා සමඟ සිල්වර් වොලන්ටියර් වෙනුවෙන් සාකච්ඡාවලට සහභාගි වුණා.

සාටෝ සාන් මා අවසන් වරට දුටුවේ අවුරුදු දෙකකට පමණ පෙරදීය. වෘත්තියෙන් ඡායාරූප ශිල්පියෙකු ලෙස ජීවත් වූ පසුව රිදී ස්වේච්ඡා සේවකයෙක් වූ ඔහු ගැන දැන් කිසිම තොරතුරක් ලැබෙන්නේ නැත. අවසානයේ අපේ ජීවිතය මතකයක් පමණක් ද?

266

ජපානයේ සිංහ සමාජ

ජපානයේ සිංහ සමාජ සමග අපේ පවතින හිතමිත්‍ර සබඳතාවය කිසිදා අමතක කළ නොහැකි සහෝදර උණුසුම් හැඟීම්වලින් පෝෂණය වූ ඒවාය. මා හා අප ව්‍යාපාරය පිළිබඳ අචල විශ්වාසයකින් හා පැහැදීමකින් අපට උදව් උපකාර ලබා දී ඇති ජපානයේ සිංහ සමාජ හිතවතුන් පිළිබඳව යමක් ලියා තැබීමට භව තණ්හාවෙහි පරිච්ඡේදයක් වෙන් කිරීම යුතුකමක් මෙන්ම කෘතඥතා පූර්වක දෙයක් යැයි මගේ හැඟීමයි. ප්‍රධාන වශයෙන් ෆුකුඕකා (Fukuoka Genkai) සහ වෙනත් නගරවල සිංහ සමාජයන්හි නිලධාරීන් හා ක්‍රියාකාරී සාමාජිකයින් සර්වෝදය ව්‍යාපාරයටත් එහි දර්ශනයටත් බොහෝ සේ ආදරය කළා පමණක් නොව, අපේ ප්‍රජා සංවර්ධන හා වෙනත් ව්‍යාපෘති, ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා නොමසුරුව උදව් උපකාර කිරීමට ඉදිරිපත් වූ අවංක පුද්ගලයින්ය. අපේ හිතවත්කම් වැඩිදියුණු වීමට පටන් ගෙන තිබුණේ 1990 දී පමණය.

ඒ කාලයේදී අපට ආර්ථික දුෂ්කරතා උපරිමව පැවැත්තේය. ශ්‍රී ලංකා රජය මගින් පරිපාලන නීති දැඩි කරමින් කරන ලද විවිධ අන්දමේ හිරිහැර තර්ජනවලට මුහුණ පෑ අපි ඉතා අමාරුවෙන් ඉදිරියට ඇදී ආවෙමු. එවැනි තීරණාත්මක කාල පරිච්ඡේදයක ඉතා ඉවසිලිවන්තව හා කාරුණිකව අපේ ගැටළුවලට සවන් දී ඉතා වටිනා උදව් උපකාර කළ නියම කල්‍යාණ මිත්‍රයින් හැටියට සිංහ සමාජයන් හඳුන්වා දිය හැක.

ෆුකුඕකා ගෙන්කායි (Fukuoka Genkai), ෆුකුඕකා සකුරා (Fukuoka Sakura), ෆුකුඕකා චිකුගෝ (Fukuoka Chhikugo), ෆුකුඕකා හෙන්කායි (Fukuoka Henkai) ජාත්‍යන්තර සිංහ සමාජයන්හි ද සියලුම සාමාජික මිත්‍රයින්ගෙන් වැඩි කොටසක් සර්වෝදය හා සම්බන්ධව සිටියහ.

ෆුකුඕකා ගෙන්කායිහි සභාපතිත්වය දැරූ කසුමි මූරා මහතා (Kazumi Miura), එහි ලේකම්ව සිටි ෂිරෝ මහතා (Shiro Shigematsu) සහ එමී යොෂිඩා මහත්මිය (Emi Yoshida) අප වෙනුවෙන් අතරමැදි වී, ස්වකීය කැමැත්තෙන් අපේ ගැටළු විසඳාදීමට මහත් කාර්ය භාරයක් ඉසිලූ අයය.

රටේ වියවුල් සහිත දේශපාලන වාතාවරණයත් සමඟ අප මුහුණ දී තිබුණ දහසක් ගැටළු මැද ඒ කාලයේ අපේ බොහෝ සංවර්ධන වැඩ කටයුතු පැවැතුණේ අඩාලව අතරමඟ නැවතෙන තත්ත්වයකය. එසේ වුවද, අත්‍යාවශ්‍යව තිබූ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ කිහිපයක්ම අපට සාර්ථකව නිම කර ගත හැකි වූයේ අපේ ජපන් සිංහ සමාජ මිත්‍රයින්ගේ කාලෝචිත වටිනා ආධාර මගිනි. හැකි වූ සෑම අවස්ථාවකදීම අපට මූල්‍යමය ආධාර සැපයීමට ඔව්හු මැලි නොවූහ. ජාත්‍යන්තර සාම මධ්‍යස්ථාන භූමියේ ආරම්භ කර තිබූ ශාන්ති සේනා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම, ශාන්ති සේනා පුහුණු මධ්‍යස්ථානයක් ගොඩනැගීම, රත්මලානේ වැඩිහිටි නිවාසය හා පෙර පාසල, විශ්ව නිකේතන ජාත්‍යන්තර සාම මධ්‍යස්ථානය ඉන් කිහිපයකි.

සිංහ සමාජවල පැවැත්වූ ත්‍යාග පිරිනැමීමේ උත්සවල සංවත්සර උත්සව, දේශන හා රැස්වීම් ආදී විශේෂ අවස්ථාවන්ට සහභාගිවීම සඳහා වර්ෂයකට වරක් දෙවරක් ඇරැයුම් මත මට එහි යාමට සිදු විය. අපේ සංවර්ධන වැඩවලට ආධාර උපකාර එහිදී ස්ථිර ලෙසම ලැබෙන නිසා එම ගමන් නොකර බැරි තත්ත්වයකට පත්ව තිබුණි. 1990 දෙසැම්බර් මාසයේදී සිංහ සමාජ රැස්වීමක් ඇමතීමට ජපානයට ගිය ගමන අද වගේ මට මතක තිබෙන්නේ මට ඇති වූ, විශේෂ හැඟීමක් නිසාය. එය ෆුකුඕකා ගෙන්කායි සිංහ සමාජයේ පවත්වන ලද රැස්වීමකි. කටුනායක ගුවන් තොටුපළින් පිටත්ව ෆුකුඕකා ගුවන් තොටුපොළින් බැස, මම ජපානයේ හිල්ටන් ජාත්‍යන්තර හෝටලයේ නැවතුන අවස්ථාවේදී පැය කිහිපයක් විවේකීව සිටියදී මට මතක් වූයේ අපේ ජනතාවය. 'මගේ රටේ

දුප්පත් ගමක ඉඳගෙන රටට සේවයක් කිරීමට ඉඩ නොදෙන අපේ දේශපාලන බලවතුන් නිසා නොවේ නම් මම මේවාට නොඑන බව මට සිතුණි'. ඒ කාලයේ රජය මගින් අපට හිරිහැර කරමින් අපේ සේවා අඩපණ කිරීමට උත්සාහ දැරීමත්, අපේ ආර්ථික අපහසුතාවයන් ද හේතු කොට ගෙන මම මෙවැනි ගමන්වලින් සම්පත් සෙවීමේ නිරතවීමි. අපගේ ව්‍යාපෘති සහ අත්‍යවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් බොහොමයක් අතරමග නවතා තිබූ ඒ කාලයේ ජපානයේ සිංහ සමාජවලින් මුදල් පරිත්‍යාග ලැබ සංවර්ධන වැඩ කලට වේලාවට කර ගතිමු. යෝෂීඩා මැතිනියගේ විශේෂ උනන්දුව මත ෆුකුඕකා ගෙන්කායි සිංහ සමාජයෙන් ලැබූ පරිත්‍යාගවලින් රත්මලානේ වැඩිහිටි නිවාසය හා පෙර පාසලේ ඉදිකිරීම් කර ගතිමු. එහි වැඩ අවසන් වූ පසු කෝබි මහතා (Croby) පැමිණ වැඩිහිටි නිවාසය උත්සවාකාරයෙන් විවෘත කළේය.

විශ්ව නිකේතන ජාත්‍යන්තර සාම මධ්‍යස්ථාන භූමියේ පවත්වා ගෙන ගිය ශාන්ති සේනා සාම හමුදා ගොඩනැගිල්ල අලුත්වැඩියා කර අද පවතින තත්ත්වයට ගෙන ඒමට අපට ආධාර කළේ ෆුකුඕකා ගෙන්කායි සිංහ සමාජයයි. පුදුම ලෙන්ගතුකමකින් සර්වෝදයට පූර්ණ සහයෝගය ලබා දුන්නේය. ශාන්ති සේනා ගොඩනැගිල්ලේ වැඩ කර ගෙන යද්දී ලැබුණු ආධාර මුදල් ප්‍රමාණවත් නොවන විට, නැවත නැවතත් අපට මුදල් එවීමට තරම් ඔවුන් කාරුණික වී සිටීම අප විසින් අමතක නොකළ යුතුය.

සිංහ සමාජ මිත්‍රයින් විසින් ඇස් කණ්ණාඩි තොගයක් ගෙනැවිත් අක්ෂි කඳවුරු පවත්වා අපේ ජනතාවට ඒවා බෙදා දීමෙන්, සිය ගණනක් පෙනීම ලබා සැනසීම උදා කර ගත්තෝය. ඉන් අනතුරුව තවත් ඔවුන්ගේ මිත්‍ර සිංහ සමාජ 7 ක් සමඟ එකතු වී ඇස් කණ්ණාඩි 1200 ක් හා යෙන් මිලියන 10 ක් අපට පරිත්‍යාග කරන ලදී. ඇස් කණ්ණාඩි සඳහා තවත් මුදලක් වියදම් කර තිබුණි. ගෙන්කායි සිංහ සමාජයේ 10 වන සමරු උත්සවය 1998 පෙබරවාරි 07 වැනි දින නිකෝ හෝටලයේදී (Hotel Nikko) පැවැත්වූ අතර,

සභාපතිව සිටි යෝෂිහිරෝ නෝර්කි මහතා විසින් එහිදී මා වෙත එම මුදල් සහ ඇස් කණ්නාඩි තොගය පරිත්‍යාග කරන ලදී. උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස මම සහභාගි වීමි. සභාපතිතුමා විසින් මා එය ලබා ගන්නා ඡායාරූපයක් ජපානයේ ප්‍රධාන පෙළේ පුවත්පතක් වන 'මයිනිචි' (Mainichc) හි පළ කර තිබුණි. ශාන්ති සේනා ආදී ගොඩනැගිලි පමණක් නොව, ඒ කාලයේ සිටි ශාන්ති සේනා තරුණ තරුණියන් 66000 කට වැඩි සංඛ්‍යාවක් ද, දහස් ගණන් ගැමි ජනතාවක් ද සඳහා සෞඛ්‍යය, ප්‍රථමාධාර ආදී විවිධ අවශ්‍යතා ඉටු කිරීම ද, ගැටුම් තත්ත්වයන්ට මැදි වූ අපේ ජනතාව පුනරුත්ථාපනය හා සංවර්ධනය කිරීමේ කාර්යයන් ද අපේ ප්‍රජා සංවර්ධන හා ගැමි ව්‍යාපෘති නඟා සිටුවීම, පවත්වා ගෙන යාම ආදී සියලු කාර්යයන්ට අපේ සිංහ සමාජ හිතවතුන් නොමසුරුව ආධාර සැපයූහ. ගෙන්කායි මිත්‍රයින් අපට පරිත්‍යාග කළ මුදල් වැඩි කොටසක් සමරු උත්සවයේදී සර්වෝදය සඳහාම එකතු කළ මුදල්ය.

ශාන්ති සේනා පුහුණු මධ්‍යස්ථානය 1999 ජූනි 08 වෙනිදා විවෘත කළෙමු. ගෙන්කායි සිංහ සමාජයේ ෂිරෝ මහතා ඇතුළු 16 දෙනෙක් උත්සවයට පැමිණ සිටියහ. අපට ඒ සඳහා තවත් ආධාර ලබාදුන් තායිලන්තයේ ක්වැං සිං හාමුදුරුවෝ ද පිරිසක් සමඟ පැමිණ සහභාගි වූහ.

ජපන් සිංහ සමාජ හිතවතුන්ගේ සමහර රැස්වීම් සිංහ සමාජ කිහිපයක් ඒකාබද්ධ වී පැවැත්වූ ඒවාය. 1993 අප්‍රේල් මාසයේ මා එවැන්නකට සහභාගි වූ අවස්ථාවේ ආහාර ගැනීමටවත් ඇඳුම් මාරුකර ගැනීමටවත් වෙලාවක් නොතිබිණි. ෆුකුඕකා ගුවන් තොටුපොළෙන් බැස කෙලින්ම ගියේ රැස්වීමටය. එය ෆුකුඕකා ගෙන්කායි හි ත්‍යාග ප්‍රදානෝත්සවයකි. සිංහ සමාජ පහකින් 100 ක් පමණ එහි පැමිණ සිටියහ. මම එහි ප්‍රධාන දේශනය පැවැත්වීමි. .දුප්පත් හා පොහොසත් යනුවෙන් ලෝක දෙකක් තිබිය නොහැකි බැවින්, දුක සැප සමසේ බෙදා හදා ගනිමින්, දිළිඳුකමින් තොර ලෝකයක් ගොඩනැඟීමට හැමදෙනා එකසේ උනන්දු විය යුතුය.

යන පණිවුඩය මම සභාවට දුනිමි. ලස්සන සිංහ කබාය ඇඳි 20 ක් පමණ ඉදිරි දෙපෙලේ වාඩි වී සිටියහ. ශ්‍රී ලංකා සහ ජපන් සිංහ කොඩි ඉදිරියේ සවි කර තිබූ අතර ඒවාට නමස්කාර කිරීමෙන් ඔව්හු වැඩ කටයුතු ආරම්භ කළහ. මෙහිදී ද ගෙන්කායි සමාජ හිතවතුන් මුදල් එකතු කර යෙන් මිලියන එකහමාරක් මා වෙත ප්‍රදානය කරන ලදී. සර්වෝදය මූලස්ථානයේ පෙර පාසල් ගොඩනැගිල්ල සෑදීම සඳහා මම එය සුවසෙතට බාර දුනිමි. මගේ ගමන් ගාස්තුව පමණක් අඩු කර ගතිමි. උත්සවය එදින රාත්‍රී රූපවාහිනියෙන් ප්‍රචාරය විය.

පසුදා සවස අපි කුරුමි නගරයේ නරීටා සාන් ආරාමයටත්, ජපානයේ උසම ප්‍රතිමාව බැලීමටත් ගියෙමු. මීටර් 62 ක් උස වූ එය මෛත්‍රී දෙව්දුවගේ ප්‍රතිරූපයක් ලෙස හැඳින්වෙයි. හිසෙහි බුදු පිළිමයක් ද, අතේ දරුවෙක් ද දරා සිටින එම ප්‍රතිමාවෙහි බුදුපිළිමයේ ඇස් බැම් අතරින් රැස් විහිදෙන බැව් මොව්හු කියති. මෙම ස්ථානය දුක නිවා සතුට ලබා දෙන තැනක් බව විශ්වාස කෙරේ. ජපානයේ මුහුදුබඩ උසම කුළුණ ෆුකුඕකා කුළුණත් ෂින්ටෝ ආරාමයකුත් බැලීමට ද අවස්ථාව ලැබුණි. දෙවන මහා ලෝක යුද්ධයෙන් පසු ජපානයේ බිඳ වැටීමත් සමගම අලුත් ආගම් බොහොමයක් ජපානයේ බිහි වී ඇත. දුර්වලව තිබූ සංවිධාන අනෙකුත් ආගමික සංවිධාන මගින් මැඩපැවැත්වූ අතර, හිස ඔසවමින් තරමක් දුරට නැග ආ සංවිධානයක් ලෙස ෂින්ටෝ ආගම හැඳින්විය හැක.

එදා මා ගුවන් තොටුපොළට ඇරලීමට නිෂි සාන් ඇතුළු මිත්‍රයින් අටදෙනෙක් පැමිණියහ. මොවුන්ගේ ආගන්තුක සත්කාරයත්, කරුණාවන්තකම සහ පරිත්‍යාගශීලිත්වයත් ජපන් ජාතිකයින්ගේ ගෞරවය හා දියුණුව පිළිබිඹු කරන්නකි. ඔවුන් අපට ආදර්ශයකි. ෆුකුඕකා ගෙන්කායි හි සභාපතිව සිටි කසුමි මූරා හා ඔහුගේ බිරිඳ විසින් මා ජපානයට ගිය හැම විටම මාහට ලබා දෙන ආදර සංග්‍රහ මෙහිදී සිහිපත්වේ. ඔවුන් මෙහි පැමිණි විට මා විසින් ද සත්කාර කරනු ලබන්නේ අවංක කරුණාවෙන් හැකි උපරිමයෙනි.

සර්වෝදය ව්‍යාපාරයත්, ජපානයේ සිංහ සමාජයත් අතර සමීප හා විශ්වාසවන්ත ඇසුරක් ගොඩනැගීමත්, එය එලෙසින්ම පවත්වා ගෙන යාමට හැකිව තිබෙන්නේත් මේ සියලු සිද්ධීන්හි ශක්තීන් තුළින් යයි කීම වරදක් නැත. ඊළඟ ඔක්තෝම්බරයේ ගෙන්කායි නියෝජිතයින් ලංකාවට එන විට අපි පෙර පාසල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර තැබීමු.

සිංහ සමාජ නියෝජිතයින් සර්වෝදය මූලස්ථානය ඉදිරිපිටදී පිළිගැනීම

සිංහ සමාජවල අනෙකුත් මිත්‍රයින් මෙන්ම අපට බොහෝ හිතවත්ව උදව් කළ යොෂීඩා මහත්මිය ගැන ද යමක් සඳහන් කළ යුතුය.

රත්මලානේ වැඩිහිටි නිවාසය ඉදිකිරීමේ කර්තව්‍යයට ෆුකුඕකා ගෙන්කායි සිංහ සමාජයේ ආධාර අපට ලබාදුන් අතර, ඒ සඳහා ප්‍රමුඛත්වයක් ගෙන අතරමැදි වී මහන්සි වී අපට උදව් කළ හිතවතියක් ලෙස යොෂීඩා මහත්මිය හඳුන්වා දිය හැකිය. 1991 වර්ෂයේ නොවැම්බරයේ මා ජපානයට ගොස් ගෙන්කායි නිලධාරීන්

සුවසෙත පෙර පාසල් දරුවන් විසින් පිළිගැනීම

සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කළ අතර, මා ආපසු ලංකාවට පැමිණි විගස ඇය මැදිහත් වී ෆුකුඕකා සිංහ සමාජයෙන් අපට උදව් කිරීමට කටයුතු යොදා තිබුණ අතර, ඊළඟ මාසයේම ඇය ලංකාවට පැමිණ අපේ වැඩිහිටි නිවාසයට රුපියල් 449870/=ක මුදලක් පරිත්‍යාග කළාය. ඉන්පසු ගෙන්කායි නියෝජිතයෝ ද සර්වෝදයට පැමිණ වැඩිහිටි නිවාසයට තවත් ආධාර මුදල් පරිත්‍යාග කළහ. එය විවෘත කිරීමට ක්‍රේබ් මහතා ද සහභාගි වීය.

එමී යොෂීඩා මහත්මිය සමඟ (වම්පස)

ජපානය තුළ සර්වෝදය ව්‍යාප්ත කිරීම සඳහා කණ්ඩායමක් සූදානම් කළ යුතුය යන යෝජනාවක් යොෂීඩා මහත්මිය විසින් ගෙන තිබුණා. යොෂීඩා මහත්මියගේ නායකත්වය යටතේ කණ්ඩායම තුළ ක්‍රියාත්මක වීමට කිහිප දෙනෙක් කැමති වී සිටීම මහත් ශක්තියක්. කුසුම් මූරා මහතා ජපානයට ගිය විට සෙවනැල්ලක් මෙන් මා පසුපස සිටින හිරානෝ සාන් සහ කමිසකමෝටෝ යන මහත්වරු ඇතුළු 12 දෙනෙක් ඒ සඳහා ඉදිරිපත් වුණා.

ෆුකුඕකා හේවායි සහ ෆුකුඕකා චිකුගෝ සිංහ සමාජවලින් අපට යෙන් 200,000 හා 100,000 බැගින් පරිත්‍යාග කළා. සුවසෙත පෙර පාසල් දෙකක් ඉන් ඉදි කළා. 1994 දී නැවතත් මා ජපානයට ගිය විට සිංහ සමාජ කිහිපයක දේශන පැවැත්වීමි. යෙන් 100,000 හා 50,000 බැගින් ඔවුන්ගෙන් පරිත්‍යාග ලැබිණ. සැම දෙනාගේම පොදු දර්ශනය වී තිබුණේ ප්‍රීතිමත් ලොවක් ගොඩනැගීමට දායක විය යුතු බව හා සමාජ සේවාවේ නිරතවීම ඉතා වටිනා අත්‍යාවශ්‍ය දෙයක් බවයි.

දෙවැනි දුව සදීවා සමඟ 1994 දී නැවතත් මම ජපානයට ගියෙමි. හිරෝෂිමා සහ නාගසාකි නගරවල ඇවිද රැස්වීම්වලට සහභාගි වී දේශන පැවැත්වූ අතර, මූරා මහත්මිය අපට ඉතා ආදරයෙන් සැලකුවාය. ඇය සදීවාට ඉතා ලස්සන වටිනා මල් කළඹක් තෑගි කළ අතර, සෙනෙහෙවත් හැඟීමෙහි පිවිතුරු සංකේතයක් බඳු වූ එය සදීවා විසින් නිතරම සිහිපත් කරනු ලැබුවා. එම සංචාරයේදීත් ෆුකුඕකා ගෙන්කායි හා සකුරා සමාජවලින් සර්වෝදය සේවාවන්ට ඇමෙරිකන් ඩොලර් 5000, 100000 හා 50000 බැගින් ත්‍යාග කරන ලදී. එම මුදල් මගේ නමින් අපේ විශ්ව නිකේතන පුණ්‍යායතනයට බැර කර අපගේ ජාත්‍යන්තර සාම මධ්‍යස්ථානය ගොඩනැගීමට යෙදවිණ.

ෆුකුඕකා ගෙන්කායි සිංහ සමාජය මුල්වීමෙන් 1996 වසරේ සියලු සිංහ සමාජ එක්වී සර්වෝදයට උදව් කිරීමට පුණ්‍යාධාර

ගොල්ෆ් ක්‍රීඩා උත්සවයක් පැවැත්විණ. සිංහ සමාජ හිතවතුන් විසින් එහිදී එකතු කරනු ලැබූ මුදල් අපේ සංවර්ධන වැඩවලට පරිත්‍යාග කෙරිණ. සකුරා සිංහ සමාජයේ සේවය කරමින් සිට අපට උදව් කිරීමට ගෙන්කායි වෙත රාජකාරී මාරුවක් ගෙන ඒ සඳහා බොහෝ වෙහෙස වූ ෆුකුසිමා (Fukusima) මහත්මිය විශේෂයෙන් ස්තුති පූර්වකව සිහිපත් කරමි. ඇය ඇස් කණ්නාඩි 1000 ක්ද පරිත්‍යාග කළාය. ඔක්තෝම්බර් 08 දින මම ද එහි ගොස් ප්‍රිය සම්භාෂණයට සහභාගි වී ෂිරෝ මහතාගේ ආරාධනය පරිදි දින තුනක් නැවතී සිටියෙමි.

විශ්ව සමාධි සම්මන්ත්‍රණ ශාලාවේ පැවති උත්සවයේ පොල්තෙල් පහන දැල්වීම

ජාත්‍යන්තර සිංහ සමාජ අතුරින් ෆුකුඕකා නගරයේ චූඕ-කූ Chuo-Ku හා Kitakyusyu නගරයේ පිහිටි සිංහ සමාජ දෙක මා සමඟ මිත්‍රත්වයක් ඇති කර ගෙන තිබුණේය. චූඕ-කූ සමාජයේ ප්‍රධානියා ආණ්ඩුකාර සුබුරෝ (Suburo) මහතාය. 1994 පෙබරවාරි 03 වෙනිදා මෙහි පැමිණි විසිදෙනෙකුගෙන් යුත් එහි නියෝජිත කණ්ඩායමත්, ජපානයේ KBC රූපවාහිනියේ නියෝජිතයින් ද

සර්වෝදයේ සමස්ත සේවා ව්‍යුහය අලලා රූපවාහිනී වැඩ සටහනක් ජෙන්ජින් මැන්බෝ නමින් නිපදවිණ. ජපානයේදී එය ඔවුන් ප්‍රචාරක වැඩ සටහනක් ලෙස ප්‍රසිද්ධ කරනු ලැබිණ.

සර්වෝදය නැරඹීමට පැමිණි සිංහ සමාජ සාමාජික සාමාජිකාවෝ
විශ්ව සමාධි සම්මන්ත්‍රණ මැදිරියේ දේශනයකට සවන් දෙමින්

සෙකයි කියුසෙයි පදනම
Seki Kusei Foundation

තමන්ගේ භෞතික අවශ්‍යතාවයන් හා එමගින් ලැබිය හැකි ප්‍රීතිය හා තෘප්තිමත් බවත් ගැනම වැඩිපුර සිතීමත්, තෘෂ්ණාව නිසා ඒ පසු පසම හඹා යාමත් මිනිස් වර්ගයා තුළ බහුලව දක්නට තිබෙන සාමාන්‍ය ස්වභාවයයි. භෞතික සංවර්ධනය මෙන්ම ඒ හා සමානව තමනට ආධ්‍යාත්මික සංවර්ධනය යන්නත් අවශ්‍ය බැව් බොහෝ දෙනා නොදනිත්. ආධ්‍යාත්මික විෂයය හා එහි වටිනාකම්, ඵල ප්‍රයෝජන පිළිබඳව මිනිසාගේ අවබෝධය උනන්දුව ඉතා අල්ප වී ඇත්තේ එබැවිනි. 'කියුසෙයි සෙකයි කියෝ' හෙවත් ලෝකය ගලවා ගැනීමේ 'ජගත් විමුක්ති සංවිධානය' පිහිටුවා ඇත්තේ මිනිස් වර්ගයා තුළ උසස්ම තත්ත්වයට පැමිණ තිබෙන භෞතික ශිෂ්ටාචාරය සමඟම ඊට සමාන්තරව වර්ධනය විය යුතු ආධ්‍යාත්මික ශිෂ්ටාචාරයක් ද නිර්මාණය කර එය වැඩි දියුණු කර ගැනීමට මිනිස් සංහතියට ආධාර කිරීමටය. ජපානයේදී ආරම්භ කර 1947 වර්ෂයේදී ආධ්‍යාත්මික සමාජ සේවා සංවිධානයක් ලෙස ජපන් රජයේ ලියාපදිංචි වූ සෙකයි කියුසෙයි සංවිධානයේ නිර්මාතෘවරයා වූයේ මොකිචි ඔකාඩා නම් ජපන් ජාතික දිළිඳු පවුලක උපන් තරුණයෙකි. ලෙඩ රෝග හා දිළිඳුකමත් වෙනත් ගැටළුවලට මුහුණ පෑමෙන් දුක්විඳින ජනතාව පිළිබඳව උණු වන හදවතක් තිබූ ඔහු ඉතා කරුණාවන්ත පුද්ගලයෙක් විය. 1882 දී ජපානයේ ටෝකියෝ නගරයට අයිති අසාකුසා දිස්ත්‍රික්කයේ හෂීබා ප්‍රදේශයේ උපත ලැබූ එතුමා තම ආධ්‍යාත්මික දර්ශනය හා එහි ක්‍රියාකාරිත්වය ලෝකයට උගන්වා 1955 දී මිය ගියේය. මිනිස් වර්ගයා දුකින් ගලවා ගැනීම සඳහා ඉවහල් වන තම දූත මෙහෙවර විශ්වමය ලෙස සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වන කාර්යක්ෂම අනුගාමිකයින් පිරිසක් ඒ වන විට එතුමා විසින් නිර්මාණය කර ගෙන තිබුණි.

මෙම සංවිධානය මා හඳුනා ගත්තේ එක්දහස් නවසිය අසූ ගණන්වලදීය. සංවිධාන මූලස්ථානය අද මෙන්ම ආරම්භයේදීත් පිහිටුවා තිබුණේ අටාමි නගරයේය. ටෝකියෝහි සිට බුලට් දුම්රියෙන් අටාමිවලට මිනිත්තු 45 ක ගමනකි. විවිධ ආරාධනා මත බොහෝ වාර ගණනක් මා එහි ගොස් තිබිණ. බුලට් දුම්රියෙන් ඕනෑම තැනකට යාමට ගත වනුයේ අඩු කාලයකි. පැයට කිලෝමීටර් 300 කට අධික වේගයෙන් යන නිසා මිල වැඩිය. අධික සංඛ්‍යාවක් මගීහු එහි ගමන් කරති. ජින් හිරානෝ සාන් සහ කලින් සභාපතිව සිටි වතනාබේ මහතා මා මුලින්ම හඳුනා ගත් අයය. ඒ කාලයේ පටන් අප අතර ගොඩනැඟී තිබුණේ ඉතා සමීප මිත්‍රත්වයකි. ජපන් වහරට අනුව ආධ්‍යාත්මික නායකයින්ට .සෙන්සේ. යන ගෞරවනීය පදය ආමන්ත්‍රණයේදී භාවිතා කරයි. එහිදී මගේ සෑම ගමනකදීම වාගේ හිරානෝ සාන් මා සමඟ විය. මට සෙවනැල්ලක් මෙන් සිටිමින් හැම විටම උදව් පදව් කළේය. ඔහු 1943 උපන් අයෙකි. ශාරීරික අධ්‍යාපන ගුරුවරයෙකු වූ ඔහුගේ පියා යුද්ධය නිම වීමට දෙමසකට පෙර 1945 යුද්ධයේදී මිය ගිය හමුදා නිලධාරියෙකි. මව ජපානයේ ප්‍රථම කාන්තා ප්‍රාථමික විදුහල්පතිනියයි. හිරානෝ සාන්, වතනාබේ මහතාගේ ඥාති පුත්‍රයෙකි.

1990 වර්ෂයේ අප්‍රේල් මාසයේදී මම ජපානයට ගිය විට සෙකයි කියුසෙයි සංවිධාන මූලස්ථානයට ගියෙමි. අද එය හඳුන්වනු ලබන්නේ සංවිධානය වෙනුවට පදනම යනුවෙනි. ජපන් වර්ෂ ක්‍රමයට අනුව අප්‍රේල් 23 වෙනිදා බුදුන් වහන්සේගේ උපන් දිනයයි. මේ වැදගත් ඓතිහාසික දිනය මා ගත කළේ අටාමි මූලස්ථානයේය. මොකිචි ඔකාඩා මහතාගේ ද උපන් දිනය වැටෙන්නේ දෙසැම්බර් 23 දිනටය. එම ගමනේදී මා ලැබූ විශේෂ ආධ්‍යාත්මික අත්දැකීම් විස්තර කිරීමට කලින් සංවිධානය හා එහි ක්‍රියාකාරිත්වයන් පිළිබඳව යම් විස්තරයක් ඉදිරිපත් කිරීම සුදුසු යැයි සිතමි.

මෙම පදනමෙහි අරමුණු හා ක්‍රියාකාරිත්වයන් සරලව විස්තර කරතොත්, මිනිස් වර්ගයා අනාදිමත් කාලයක සිට බලාපොරොත්තු වූ ගැටුම් අරගලයන් නොමැති සුන්දර ලෝකයක් හැදීමය. එම සෞභාග්‍යවත් ලෝකය මිහිපිට පාරාදීසයක් යැයි හඳුන්වනු ලබයි. ගෞතම බුදුන් වහන්සේගේ අනාගත වංශ කතාවේ දේශනා කළ කේතුමතී රාජ්‍යය හෙවත් මෛත්‍රී බුද්ධ ශාසනයත්, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ හා අල්ලා දෙවියන්ගේ ස්වර්ග රාජ්‍යයත් සකල මිනිස් වර්ගයා එක ලෙස පාරිශුද්ධත්වයට පත්ව විමුක්තිය ලබන්නා වූ පරමාදර්ශී තත්ත්වයක් ඇත්තේ මේ පාරාදීසය තුළම හා එයම බවත් මොකිචි ඔකාඩා මහතා ලෝකයට හඳුන්වා දුන්නේය. මෙම උත්තරීතර නායකයාව තම අනුගාමිකයින් විසින් පසුව හඳුන්වනු ලැබුවේ ගෞරවනීය ආධ්‍යාත්මික නායකයා යන අරුත ඇති 'මෙයිෂු සාමා' ලෙසටය.

සත්‍යය සදාචාරය හා සුන්දරත්වයෙන් පිරි එම සෞභාග්‍යවත් ලොව නිර්මාණය කිරීම සඳහා මිනිසා සසර දුකින් මුදවා ගැනීමට මෛත්‍රී බෝසතුන් විසින් උන්වහන්සේගේ ආශීර්වාදය සහිත ස්වභාවික විශ්ව ශක්තිය හෙවත් දිව්‍යමය ආලෝකය මෙයිෂු සාමාතුමාට ලබා දුන්නේය. එම ආලෝකය ප්‍රතිගහනය කිරීමෙන් දුකින් මිදී අනාගත පාරාදීසයේ උපත ලැබූ මනුෂ්‍යයාට ඉන්පසු තම ආත්ම විමුක්තිය ලබා ගත හැකිවීම මෙම ජගත් විමුක්ති සංවිධානයේ මුඛ්‍ය පරමාර්ථයයි. එම ආලෝකය සියලු ලෝකවාසී මනුෂ්‍යයින්ටත් ප්‍රදානය කිරීම සඳහා 1835 වර්ෂයේදී එතුමා තම අනුගාමිකයින්ටත් එම බලය පවරමින් විශ්ව සේවාවක් ආරම්භ කර විශාල සාමාජික සංඛ්‍යාවක් සමඟ තම සංවිධානය පුළුල්ව ගොඩනැගීය. දැනට දේවත්වයේ සිටින එතුමා, සේවය ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යයි. සංවිධාන සාමාජිකයෙකු විසින් කරේ පැළඳ ගන්නා 'ඔහිකාරිය' නමින් හැඳින්වෙන පෙන්ඩනයක් මගින් දිව්‍යමය ආලෝක ශක්තිය ඔහුට පැවරෙනු ඇත. ආලෝකය යන අරුත ඇති, දිව්‍යමය බලය සහිත ජපන් අක්ෂරයක් තුනී කොලයක ලියා ඔහිකාරිය තුළ තැන්පත් කර

ඇති අතර, සාමාජිකයා ඇසට නොපෙනෙන ආධ්‍යාත්මික රැහැන් මගින් එය හරහා මෙයිෂු සාමාතුමා විසින් එවනු ලබන දිව්‍යමය ආලෝකය සාමාජිකයෙකු විසින් අත ඔසවා තමා ඉදිරියේ වාඩි වී සිටින කෙනෙකුට අත්ල හරහා විකාශනය කරනු ලැබේ. මෙය ස්වාභාවික විශ්ව ශක්ති හෙවත් 'ජෝරේයි' ප්‍රතිකාරයයි. 'හිකරි' නම් ජපන් භාෂාවෙන් ආලෝකය ආගම් භේදයකින් තොරව සෑම මනුෂ්‍යයෙකුටම එම ආශීර්වාදය පොදුය.

ජපානයේ වෙසක් උත්සවය පවත්වන අප්‍රේල් මස 23 වෙනි දින සෙකයි කියුසෙයි අටාමි මූලස්ථානයේදී එවකට සභාපති මත්සුමොටෝ මහතා විසින් මට පූජනීය ඔහිකාරියක් පළඳවන ලදී. එය පැළඳගත් පසු පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික තත්ත්වය උසස් මට්ටමකට ඉබේම පැමිණෙයි. ඔහිකාරිය රන් ආලේපිතය. ඉතාම ලස්සනට දීප්තියක් ගෙන දුනි. ශ්‍රී ලංකාවෙන් ඔහිකාරියක් පැළඳ ගත් ප්‍රථම පුද්ගලයාවීමේ භාග්‍යය මට ඉන් ලැබී තිබේ. මා හට එය පළඳවනු ලැබුවේ එදින පස්වරුවේ 2.00 ට පමණ මා වෙනුවෙන්ම පවත්වනු ලැබූ විශේෂ පූජාවෙන් අනතුරුවය. ඔහිකාරියක් ලැබීමෙන් මගේ ජීවිතයේ එය ඉතා වැදගත් දිනයක් සේ සටහන් විය. සුවිශේෂ සන්ධිස්ථානයක් ද විය. රන් මෙඩලය මට පළඳවන අවස්ථාවේදී මා වෙතට දීප්තිමත් ආලෝක ධාරාවක් ගමන් කරනු තමා දුටු බව හිරානෝ සාන් මා සමඟ කීවේය. එම දිනය වැසි සහිත දිනයක් ලෙස බලාපොරොත්තු වුවද දවසම හිරු එළියෙන් ආලෝකමත් වී තිබුණි. ශ්‍රී ලංකා කොඩිය ද ජපන් කොඩිය සමඟ ලෙළ දුන්නේය.

ෆූජි හෙවත් ෆුජියාමා කන්ද බැලීමට අපි ගියේත් එදිනමය. අටාමිවලට එපිටින් පිහිටි සියෝකා ප්‍රදේශයට ෆුජි කන්ද හොඳින් පෙනේ. අතීතයේදී පුපුරා යාමෙන් විශාල විනාශයක් වූ එම ගිනිකන්ද දැන් නිවී ඇති හෙයින් සංචාරකයෝ විනෝදය පිණිස එය නගිති. භූමිතල කිහිපයක් ඇති එහි ඕනෑම මට්ටමකට නැඟිය හැක. නිතරම වළාකුල්වලින් වැසී පවතින නමුත් එවේලේ ඒවා ඉවත් වී තිබුණු බැවින් අපි මුදුන දුටුවෙමු.

ඔහිකාරිය ලබා ගැනීමට ප්‍රථම දිනයේදී මූලස්ථානයේ පුහුණුව ලබන ශිෂ්‍යයින්ට දේශනයක් කළෙමි. පසු දින පාන්දර 23 දා මා හදිසියේම අවදි වූයේ අලුත් අත්දැකීමක් සමගය. පුදුම අන්දමේ ඉතා ප්‍රසන්න දේව සුවඳක් මම එවේලේ ආඝ්‍රාණය කළෙමි. වෙලාව පාන්දර 3.00 ය. ලංකාවේ වේලාවෙන් මැදියම් රාත්‍රී 12.00 ය. ජින් හිරානෝ සාන් නිතරම සිනාමුසු මුහුණින් සිටින පුද්ගලයෙකි. මා ඔහිකාරිය ලබාගත් දිනට පසුවදා උදෑසන ඔහු මගේ කාමරයට පැමිණියේ වෙනදාටත් වඩා සතුටක් පෙන්වන සිනහවකින් මුව සරසා ගෙනය. 'ආරි සාන්' කර්ම දෙවියන් ඔබ වෙනුවෙන් ක්‍රියා කරනවා. ගරු සභාපති මත්සුමොටෝ මහතා උදේ මට ටෙලිෆෝන් කළා. ඔබව කෙසේ හෝ තව සතියක් නවත්වා ගන්න කියා. මැයි පළමු වෙනිදාට ජපානයේ සෑම තැනින්ම බැතිමතුන් අටාමි මූලස්ථානයට එක්වෙන නිසා ඒ හැමදෙනා වෙනුවෙන්ම ඔබගේ කතාවක් සභාපතිතුමා විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා. ඔබ හුඟක් කාර්ය බහුල බව ඔහු දන්නා නමුත්, මෙම ආරාධනය පිළිගන්නැයි කියා සිටියා. දිනපොත පෙරළා බැලූ විට, පුදුමයට මෙන් ඉදිරි සතිය තුළ බාර ගෙන තිබූ වැඩ සියල්ලම වාගේ නීතාට පැවරීමට තීරණය කළෙමි. හිරානෝ සාන් කී පරිදි කර්ම දෙවියන්ගේ ක්‍රියා කිරීම නිසා විය හැකියි, සතියක් වැඩිපුර නැවතීමෙන් කිසිවිටකත් මා බලාපොරොත්තු නොවූ ඵල ප්‍රයෝජනයක් අත්පත් කර ගැනීමට පුළුවන් විය.

කාල වේලාව ඕනෑ තරම් තිබෙන නිසා මම ටෝකියෝ හි පිහිටි ආර්ක් ජාත්‍යන්තර ආයතනයට ගියේ එහි සභාපති මාගේ මිත්‍ර රොබට් වයිට් හමුවීමටය. ඊට අවුරුදු පහකට පෙර රොබට් වයිට් සහ ඔහුගේ බිරිඳ ඩයනා ලංකාවට පැමිණ දින අටක් මෙහි ගත කරමින් අපේ සේවාවන් ගැන පැහැදී අපට උදව් කිරීමට පෙළඹුණේය. රොබට් මහතා මා ඉතා ආදරයෙන් පිළිගත්තේය. ඔහු සමඟ දිවා ආහාරය ගෙන එහි කාර්ය මණ්ඩල නිලධාරීන්ට කතාවක් ද කළෙමි. මා ආපසු ඒමට සැරසෙන විට රොබට් ලියුම් කවරයක් මා අතට දී

එය පෞද්ගලික වියදම්වලට තියා ගන්නැයි කීවේය. පසුව එය විවෘත කර බලන විට, යෙන් මිලියනයක් එහි විය. ඇත්තෙන්ම එය පුදුම එළවන සිද්ධියකි. ඉන් මගේ ණයතුරුස් ගෙවා දැමීමට හැකි වූයෙන් විශාල සැනසිල්ලක් ලැබුවෙමි.

මම සාමාන්‍යයෙන් විදේශ සංචාරවලදී ශ්‍රී ලාංකිකයින් ඇසුරු කිරීම ඉතා ප්‍රවේශමෙන් කරන දෙයකි. අප සංගමයේ උප සභාපතිවරයෙක් හැටියට කලක් කටයුතු කළ හර්ෂ ලියනගේ මහතා මට මුණගැසුනේ මේ ගමනේදීය. අපේ නිවසට ආව ගිය තිලක් හා හර්ෂ පැමිණි විට දුටු සැනින් ඔහු ගැන මට ප්‍රසාදයක් ඇති විය. ඔවුන් දෙදෙනා පැමිණියේ මා සිටි හෝටලයටය. ප්‍රසිද්ධ ලේඛක කේ.සී.ලියනගේ මහතාගේ එකම පුත්‍රයා වූ ඔහු, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ විද්‍යා උපාධිය නිම කොට බයෝ ටෙක්නොලොජි පශ්චාත් උපාධියක් සඳහා ටෝකියෝ විශ්ව විද්‍යාලයට ඇතුළත්ව සිටියේය. රටේ අනාගතයට ශක්තියක් විය හැකි වැදගත් තරුණ ජීවිතයක් බැවින් ඔහුට මග පෙන්විය යුතු යැයි මට සිතුනේ ඔහුගේ ඇසුරට පත් වූ මුල් කාලයේදීමය.



හර්ෂ ලියනගේ මල්ලී සමඟ ජපානයේදී

අප්‍රේල් 30 වන දින හිරානෝ සාන් සහ මම දුම්රියෙන් අටාමිවලට ගොස් අටාමි හෝටලයේ නැවතී සභාපතිතුමාගේ ආරාධනයට අනුව මැයි 01 වැනිදා සෙකයි කියුසෙයි මූලස්ථානයට ගියෙමු.

සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකින්ම පැමිණ සිටි වැඩිහිටි, ළාබාල, තරුණ දහස් ගණනක් සෙනඟ මූලස්ථානයේ රැස්වී සිටියහ. ඉතා ආදරයෙන් මුවපිරි සෙනෙහසින් මා පිළිගත් සභාපතිතුමා ඇතුළු නිලධාරීන් උදෑසන 10.45 පමණ වන තෙක් විශේෂ කාමරයක අප වාඩි කර නියමිත වේලාවට ප්‍රධාන ශාලාවට සහ වන්දනා ස්ථානයට කැඳවා ගෙන යන ලදී. පන්දාහකට අධික පිරිසක් ප්‍රධාන ශාලාවෙහි වාඩි වී සිටි අතර, තවත් දහස් ගණනින් ඉඩකඩ ඇති වෙනත් ශාලාවල රැඳී සිටි අයට රූපවාහිනියෙන් උත්සව කටයුතු නැරඹීමට ඉඩකඩ සලසා තිබුණි.

දේශන ඇතුළු උත්සවයේ වැඩ කටයුතු පූජාවෙන් අනතුරුව සිදු විය. 'ආලෝකයේ උත්තම දෙවියන්' යන අරුත ඇති විශේෂ ඝනකම් කඩදාසි වර්ගයක ජපන් අකුරින් ලියන ලද වචනයක් පූජාසනයට ඉහළින් බිත්තියේ එල්ලා ඇත. සංවිධානයේ සෙන්සේතුමන්ලා පූජාවට සහභාගිවීමට විශේෂ සුදු ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියහ. පූජාසනය ආවරණය කර තිබූ සුදු තිරය විවෘත වනවාත් සමඟම දොලොස් දෙනෙකුගෙන් යුත් සෙන්සේ කණ්ඩායම ඉතා ශාන්ත ස්වරූපයෙන් ඉදිරියට විත් අසුන් ගත්හ. සෑම ඉරියව්වකම ගැබ් වී තිබූ ආධ්‍යාත්මික ස්වරූපය මෙන්ම යම් කලාත්මක බවක් ද විදහා දැක්විණ. ගැහැණු ළමයි කණ්ඩායමක් ද පසෙකින් වාඩි වී සංගීතය හා ගාථා ගායනා කළහ. අපගේ බුද්ධ පූජා සහ දේව පූජා කරන විලාසයටම මෙතැනදී ද පැන්, ආහාර, අලුත් පළතුරු, එළවලු, රසකැවිලි ඉතා පිරිසිදු සහ ගෞරවනීය භක්තියෙන් යුතුව අතින් අත යවමින් පූජාසනය මත තබා පූජා කරන ලදී. එම එළවලු පළතුරු බොහෝ විට සංවිධානයේ ස්වභාවික ගොවිතැන් ක්‍රමයෙන් ලබාගත් අස්වැන්නය. ජපන් කලාවට සරසන

ලද ඉතා ලස්සන ස්වභාවික මල් සහිත බඳුන්වලට විශේෂ තැනක් හිමි වී තිබුණි. අවසානයේදී සියලුදෙනා විසින් ගාථා කියමින් වැඳුම් පිදුම් කරන ලදී.

ඉන් පසු සභාපති මත්සුමොටෝ මහතා නැගිට වේදිකාවට ගොස් පුදසුනට පූජා පැවැත්වූ පසු, අප සියලුදෙනාම නැගිට පූජාව මෙහෙය වූ සෙසු අය සමඟ ඊට එක්වීමු.

පූජාව අවසන් වීමෙන් පසු තරුණ කාන්තාවක් ඉදිරියට පැමිණ සුවපත්වීමේ කතාව ඉදිරිපත් කළාය. අසාධ්‍ය රෝගයකින් පෙළුන ඇයගේ මව වෛද්‍ය ප්‍රතිකාරවලින් සුව නොවෙමින් ජෝරේයි ක්‍රමය තුළින් සුව වූ හැටි එහිදී විස්තර කෙරුණි.

මත්සුමොටෝ මහතා විසින් හැමදෙනාටම ජෝරේයි ප්‍රදානය කිරීමත්, කාන්තාවක් විසින් මෙයිෂු සාමාතුමා පිළිබඳ ගීතයක් ගායනා කිරීමෙනුත් අනතුරුව ජින් හිරානෝ සහ ඔකාඩා සාන් සමඟ මම වේදිකාවට ගියෙමි. ජින් හිරානෝ මා හැඳින්වීමේ කතාව කළේය. ඉන්පසු පැය බාගයක් පමණ මගේ කතාව මම ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ විට ඔකාතෝ සාන් විසින් එය ජපන් බසට පරිවර්තනය කළේය. මගේ පැය බාගයේ කතාව අවසානයේදී මුළු සභාවම සැහෙන ආවේගයකින් යුතුව අත්පොළසන්දීම විශේෂයෙන් මගේ මතකයේ රැඳුනු දෙයක්. ශාලාවට පැමිණි පසු හැම දෙනාටම මගේ අත් අල්ලා සිප ගැනීමටත්, අත්සන ගැනීමටත් ඕනෑ විය.

ඊළඟට පැවැති සභාපති මත්සුමොටෝ මහතාගේ දේශනය සම්පූර්ණයෙන් සර්වෝදය ව්‍යාපාරයත්, මගේ ජීවිතයත් ගැනම විය. මා හමුවූවාට පසු ඔහුගේ හදවත ගිනි කන්දක් මෙන් වේගාත්මක වී ඇති බවත්, මෙම තනතුරෙන් විශ්‍රාම ගත් වහාම ශ්‍රී ලංකාවට ගොස් මා සමඟ සේවය කිරීමට ආශා කරන බවත් එතුමා ප්‍රසිද්ධියේම සිය කතාවේදී ප්‍රකාශ කළේය. මෙයිෂු සාමාතුමාගේ අභිප්‍රාය අනුව ලෝකයට සේවය කිරීමේ අවස්ථාව ද දැන් පැමිණ ඇතැයි ඔහු

කීවේය. උත්සවය අවසන් වූ පසු අපි සාතාකිබාරා සාන් සමඟ මූලස්ථානයේම පිහිටි ගතානුගතික ආපන ශාලාවට ගොස් ආහාර ගතිමු.

මීළඟට තිබුණේ පැරණි ජාතික නාට්‍යයක රඟපෑමකි. ජපානයේ ජාතික වස්තුවක් ලෙස නම් කර ඇති අසූ දෙහැවිරිදි ආද්සුමා ටෝකුගේ මැතිනිය ද එම නාට්‍යයට සහභාගි වී ප්‍රධාන චරිතය රඟපෑවාය. එහි කතාව ගෙතී තිබුණේ ගෝල්ඩන් ඩ්‍රැගන් සහ ජේඩ් ඩ්‍රැගන් අතර යුද්ධයයි. අවසානයේදී ජේඩ් ඩ්‍රැගන් පරදවා ගෝල්ඩන් ඩ්‍රැගන් ජය ගෙන ලොවට සාමය උදා කර දුන්නේය. සවස පැවැති සාදයේදී එම ටෝකුගේ මැතිනියත් හිටපු අධිකරණ ඇමති ආචාර්ය ඉනාබා මහතාත් හඳුනා ගතිමි.

එදා රාත්‍රියේ මත්සුමොටෝ මහතා මට යෙන් තුන් ලක්ෂයක් තෑගි කළේය. ඔහුට භාවනා ඉගැන්වීමට යයි කීවෙන් පැය භාගයක් පමණ ඔහුගේ කාර්යාලයේදීම භාවනා ඉගැන්වීමි.

සෙකයි කියුසෙයි සංවිධානයේ කලින් සභාපතිව සිටියේ වතනාබේ සෙන්සේය. ඒ වන විට අසූ වැනි විය පසු කරමින් සිටි එතුමා බැලීමට යාමට මෙවරත් අවස්ථාව ලැබුණි. කලින් එක් වතාවක් එතුමා මුණගැසී ඇතත්, දෙවන වතාවටත් මුණගැසී කතාබස් කිරීමට ලැබීම වාසනාවක්. සැක්සේනාද, හිරානෝ සාන් ද මා සමඟ වූහ. අතිවිශාල අත්දැකීම් සම්භාරයක් ඇති වතනාබේ සෙකයි කියුසෙයි සංවිධානයේ නිර්මාතෘ වන මෙයිෂු සාමාතුමාගේ ප්‍රථම ශිෂ්‍යයාවීමේ වාසනාව හිමි වීමෙන් අති විශේෂ පුද්ගලයෙක් වී සිටියේය. එතුමා ඔකාඩා සාන්ගේ සීයාය. වයෝවෘද්ධ තත්ත්වයට පැමිණ ඇති ඔහු හුඟක් අසනීප වී සිට ජෝරේ ශාන්තිය ලැබීමෙන් අප යන විට සුවපත්ව සිටියේය. ජනවාරි 01 දා එතුමා අසාධ්‍යව සිටියදී ඈත පිහිටි අටාමි ආරාමයේ ගත් පින්තූරයක සූර්යයා සහ ඔහුගේ ඡායාව වැටී තිබේ. එය ප්‍රාතිහාර්ය සිද්ධියකි. ඒ පින්තූරයේ පිටපතක් මම ලබා ගතිමි.

වතනාබේ මහතා තම ජීවිත කතාවේ කොටසක් අප හමුවේ විස්තර කළේය. කවදාවත් පාසල් ගොස් නොමැති ඔහු ඉතා වටිනා දාර්ශනික පොත් ලියා තිබේ. තරුණ අවදියේ ටෝකියෝ නගරයට පැමිණ එළවලු කඩයක් අරඹා එය වැඩිදියුණු කර ගෙන පොහොසතෙක් බවට පත් වී පසු කාලයක රන් ඔරලෝසු ද පැළඳි බව කීවේය. තම මවගේ අවවාදය නිසි පරිදි පිළිපැදීමෙන් ආධ්‍යාත්මික අංශයට යොමුවීම නිසා අද මෙවැනි උසස් තත්ත්වයකට පත් වී තිබෙන බව කීවේ මහත් සතුටකිනි. මුදල් ඉපයූ විට ඒවා වියපැහැදම් කරනවා මිස, නිකරුනේ ගොඩගසා ගැනීම නුසුදුසු බව ඔහුගේ මතයයි. ඒ දිනවල උප සභාපති තනතුර දැරුවේ එතුමාගේ පුත්‍රයා වතනාබේ සෙන්සේතුමාය.

ඒ අවුරුද්දේ සැප්තැම්බරයේදී මම ටෝකියෝහි එකම ලොවයි එකම ජනතාවයි ආයතනයේ උත්සවයකට සහභාගිවීමට ආර්ක් ජාත්‍යන්තර ආයතනයට ගිය අවස්ථාවේදී සෙකයි කියුසෙයි සංවිධානයේ උප සභාපති වතනාවේ මහතා ඇතුළු පිරිසක් මා හමුවීමට පැමිණ යෙන් මිලියන එක් ලක්ෂ හැත්තෑදහසක් මා වෙත පරිත්‍යාග කළේය. මා එය කිසිසේත් බලාපොරොත්තු නොවූවකි. එසේ කරනු ලැබුවේ කලින් අප්‍රේල් මාසයේදී මා එහි ගොස් ඔවුන් වෙනුවෙන් කළ දේශනයන්ට කෘතෝපකාරයක් ලෙසටය.

කලාවටත් පැරණි කලාත්මක භාණ්ඩවලටත් තද ඇල්මක් දැක් වූ මෙයිෂු සාමාතුමා විසින් නිර්මාණය කරන ලද දර්ශනීය කලා කෞතුකාගාරය තිබෙන්නේ අටාමිවලය. එය නැරඹීමට මා කිහිප වාරයක්ම ගොස් ඇත. සංවිධානය මගින් පාලනය හා ආරක්ෂා වන එය චිත්තාකර්ශනීය කලාත්මක බව මෙන්ම ජපන් සංස්කෘතික වටිනාකම් ඉස්මතු කරන්නකි.

කඳුවලින් ගහන අටාමි නගරය උණුදිය උල්පත්වලට ප්‍රසිද්ධය. උණුවතුර ලිං බහුලව ඇති යුගවාරා ප්‍රදේශයට ගිය මාත්, හිරානෝ සාන් සහ හර්ෂ මල්ලීත් ඒවායින් නැවෙමු. විනෝදය

සඳහා එහි යන එන විදේශ සංචාරකයෝ මෙන්ම ජපන් ජාතිකයෝ ද උණුවතුර ලිංවල නෑමට බොහෝ ප්‍රිය කරත්. උණුවතුර නෑමෙන් එදින රාත්‍රියේ ඇඟට අමුතු පණක් ලැබුණ අතර, මමත් ජල ටැංකියට බැස්සේ අන්‍යයන් මෙන් පුංචි තුවා කෑල්ලක් ඇඳගෙනය.

මෙයිෂු සාමාතුමාගේ ඉගැන්වීම් අනුව අනාගත මෛත්‍රී බුදු සමය තුළ බිහිවන සෞභාග්‍යවත් ලෝකය හෙවත් පාරාදීසයේ ආකෘතියක් එතුමා ජීවත්ව සිටියදී අටාමිවල නිර්මාණය කර ඇත. පිරිසිදු බවින් ඉහළම තත්ත්වයේ පවතින ස්වභාවික කෘෂිකර්මයෙන් සරු වූ සුන්දරත්වයෙන් පිරි මිනිසාට දුකින් තොරව ජීවත් විය හැකි පාරාදීසයක්ම යැයි කිව හැකි වටපිටාවක් එහි දක්නට ඇත. හාකෝනේ හා හෙයියන්කියෝ හිදී අනෙක් පාරාදීසයන් දැකිය හැකිය. පාරිශුද්ධ භූමි ලෙස සලකනු ලබන පාරාදීසයන් වෙත වන්දනාමාන කිරීමට ලෝකයේ සෑම පෙදෙසකින්ම බැතිමතුන් පැමිණේ. මෙයිෂු සාමාතුමා ජීවත්ව සිටියදී අටාමි පාරාදීසයේ (ක්‍රිස්ටල් හවුස්) බොහෝ ප්‍රාතිහාර්ය සිදු විය. අද දවසේත් බැතිමත්හු ඒවා අත්දකිති. ආරාම කෞතුකාගාර පාරාදීස බැලීම සඳහා දින ගණනක් ගතවේ. මා ඒ හැම ස්ථානයකටම ගොස් ඇත.

ඔහිකාරියක් ලැබීමෙන් පසු, මගේ අදහස වූයේ සර්වෝදයෙන් දෙදෙනෙක් ජපානයට යවා සෙකයි කියුසෙයි පදනමෙහි දර්ශනය හා ක්‍රියාකාරිත්වය පුහුණු කරවා, සර්වෝදය තුළින් ශ්‍රී ලංකාවේ එය ප්‍රචලිත කරන්නටය. ඔහිකාරිය ලබාගත් දිනයේ දවල් වරුවේ ගරු සභාපති මත්සුමොටෝ හා ගරු කොබයාෂි මහත්වරුන් සමඟ දීර්ඝ ලෙස සාකච්ඡාවක් පැවැත්වීමට හැකිවීම විශේෂ සතුටට කරුණක් විය. දින කිහිපයක්ම මා හමුවීමට විවේකයක් නොමැතිව සිටි මත්සුමොටෝ මහතා පැය දෙක තුනක් මා සමඟ එලෙස ගත කිරීම හිරානෝ සාන් සැලකුවේ විශේෂ ආශීර්වාදයක් ලෙසටය. ජෝරේ ඉගෙන ගැනීමට ළමයින් දෙදෙනෙක් සර්වෝදයෙන් එවන ලෙස කැමැත්ත දුන් එතුමා පැවසුවේ, ඊට අමතරව ස්වභාවික කෘෂිකර්මය ඉගැන්වීමට තවත් දෙදෙනෙක් බාර ගන්නා බවය.

සර්වෝදයට මා පෙළඹුණු හැටිත්, එදා දක්වා එය ගොඩනැඟී ඇති අන්දමත් මම විස්තර කළෙමි. ජෝරේ ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් මිනිස් වර්ගයාට අවශ්‍ය ආහාර නිශ්පාදනය හා සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීමේ වැඩ සටහන් පිළිබඳව වැඩිදුරටත් කතා කළ එතුමා සෙකයි කියුසෙයි කියෝ සංවිධානයත් සර්වෝදය ව්‍යාපාරයත් අද සිට සහෝදරත්වයෙන් ලෝක සේවය සඳහා කටයුතු කළයුතු බව ඉතා සතුටු මුහුණින් ප්‍රකාශ කළේය. එදා රාත්‍රියේ සංවිධානයේ මුදල් අධ්‍යක්ෂකව සිටි ගරු කමියාමා සාන්ගේ නිවසේ ශිෂ්‍යයින් එකතු වී අපට ආහාර පිළියෙල කර දුන්හ. කමියාමා මැතිනිය මගේ පින්තූරය අඳිමින් සිටියාය.

සෙකයි කියුසෙයි සංවිධානයේ නිර්මාතෘ මොකිචි ඔකාඩා මහතා විසින් කෝමියෝ (Komyo divine light) නම් පුවත්පතක් ආරම්භ කර තිබුණි. කෝමියෝ යනු, දිව්‍යමය ආලෝකයයි. මාසිකව ප්‍රකාශයට පත් කරනු ලැබූ එහි පිටපත් සංඛ්‍යාව මිලියනයකි. පසුගිය වර්ෂයේදී මෙන්ම ඉදිරි වර්ෂය සඳහාත් 'විසි එක්වන ශත වර්ෂය සඳහා මගේ සිහිනය' (My dreams for 21st Century) යන තේමාව යටතේ කෝමියෝ පාඨකයින්ට නව අවුරුදු පණිවුඩයක් සකස් කර යැවීමි. සංවිධානයේ විශේෂ ඉල්ලීමක් මත සිදු වූ ඒ සඳහා මට ඇමෙරිකන් ඩොලර් 500 ක පාරිතෝෂිත දීමනාවක් ගෙවනු ලැබීය.

සෙකයි කියුසෙයි පුහුණු පාඨමාලාව සඳහා කිංස්ලි කාරියවසම් සහ උපුල් ප්‍රියදර්ශන යන දෙදෙනා අපි තෝරා ගතිමු. කිංස්ලි වයස අවුරුදු 30 ක් වූ ගම්පහ ප්‍රදේශයේ මීතිරිගල පදිංචි තරුණයෙකි. සර්වෝදයේම හැදී වැඩී පාසල් ගිය උපුල්ට අවුරුදු 27 කි. 1991 වර්ෂයේදී ඔවුන් දෙදෙනා සෙකයි කියුසෙයි සංවිධානයේ ජපානයේ චූබා දිස්ත්‍රික් මධ්‍යස්ථානයට යවන ලදී.

කිංස්ලි ජෝරේයි ඉගෙනීමටත්, උපුල් ස්වභාවික ගොවිතැන හැදෑරීමටත් යොමු වී තිබුණි. සුව කළ නොහැකි පිළිකා, ස්නායු

රෝග හා විවිධ රෝග සෑදීමට කෘෂිකර්මයේදී භාවිතා වන රසායනික සංයෝග ප්‍රධාන හේතු සාධකයක් වන බැව් ස්ථිර ලෙස විශ්වාස කරන ජගත් විමුක්ති සංවිධානය ලෝකය මෙම ව්‍යසනයෙන් ගලවා ගැනීමට ජෝරේයි ශක්තිය උපයෝගි කර ගනිමින් ස්වාභාවික පොහොර, පළිබෝධනාශක ආදිය සඳහා ස්වාභාවික තාක්ෂණ ක්‍රමයක් ලෝකයාට හඳුන්වා දී තිබේ. එය සංවිධානයේ ස්වාභාවික ගොවිතැන් ක්‍රමයයි.

ජපන් භාෂාව මාස 3 ක් ඇතුළත හොඳින් හැදෑරූ කිංස්ලි මල්ලී ජෝරේයි වැඩ සටහන් ක්‍රමය ද සාර්ථකව ඉගෙන ලංකාවට පැමිණි නමුත්, උපුල් අධ්‍යාපනය අතරමඟ නතර කොට ආයතනයට හොරෙන් පැන ගොස් තිබුණි. ඒ කාලයේ සර්වෝදය මූලස්ථානයේ ශාන්තිසේනා අංශයේදී කිංස්ලි විසින් ජෝරේයි වැඩ සටහන සාර්ථකව කර ගෙන ගිය ද නොයෙකුත් ප්‍රශ්න උද්ගතවීම හේතුවෙන් කිංස්ලි ද ජෝරේයි ද යන දෙදෙනාම සර්වෝදයට ආයුබෝවන් කීහ. සර්වෝදය ව්‍යාපාරය හා ජෝරේයි ද එකිනෙකාගෙන් දුරස්ථවීම සිදුවූයේ එලෙසිනි. අවුරුදු කිහිපයකට පසු ජෝරේ සංවිධානය ශක්තිමත් කර ගත් කිංස්ලි නැවතත් සර්වෝදය සමඟ එක්ව කටයුතු කරයි.

ජපානයෙන් බිහි වී ප්‍රථමයෙන් ඇමරිකාවේ හවායි දූපතට ද, ඉන්පසු දැනට ලෝකයේ රටවල් අසූ ගණනක් තුළ ද ව්‍යාප්ත වී තිබෙන මෙම දිව්‍යාලෝක වැඩ සටහන, දැනට ලංකාවේ ද මධ්‍යස්ථාන 140 කට ආසන්න වෙමින් පැතිරී ගොස් තිබෙන්නේ කිංස්ලි විසින් පසුව වෙනම ශ්‍රී ලංකා මූලස්ථානයක් ගම්පහ නගරයේ පිහිටුවා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙසටය.

සෙකයි කියුසෙයි සමඟ අපේ හිතවත්කම් මෑතක සිට නැවතත් දළුලා වැඩීම සන්තෝෂයට කරුණකි. අප ව්‍යාපාරය මගින් ශ්‍රී ලංකාවේ ගම් 1000 ක් ග්‍රාමස්වරාජ්‍ය බවට පත් කිරීමේ ප්‍රතිඥාවක් සිදු කෙරෙන විශේෂ වැඩ සටහනක් 2004 නොවැම්බර් 11 දින මොරටුව ටිරොන් ප්‍රනාන්දු ක්‍රීඩාංගනයේදී පැවැත්වීමු.

අටාමි මූලස්ථානයේ තවමත් ක්‍රියාකාරීව සේවය කරන කොබයාෂි සෙන්සේතුමා එදා මගේ ආරාධනය පරිදි එහි පැමිණ, අපගේ ප්‍රාදේශීය නායකයින් හයදාහක් පමණ සහභාගි වූ සියලු සර්වෝදය සේවකයින්ට ජෝරේයි ප්‍රදානය කළහ. එතුමාගේ හෘදයාංගම ආශීර්වාදය අපට ලබා දුන්හ. එදා ඔහු ලංකාවට පැමිණි 4 වැනි වතාවයි. පළමුවරට ඇවිත් තිබෙන්නේ මීට අවුරුදු 12 කට පෙරයි. එතුමා අපේ සර්වෝදය මූලස්ථානයට පැමිණ මා හමුවී බොහෝ සතුටු විය. ශ්‍රී ලංකාවෙන් ප්‍රථම වරට ඔහිකාරියක් ලබාගත් පුද්ගලයා මා බව එදා උත්සවයේදී එතුමා ප්‍රකාශ කළා. ශ්‍රී ලංකාවේ ද පාරාදීසයක් ගොඩනැගීමට සංවිධානයේ සාමාජිකයන් ලක්ෂයක් බිහි කිරීමට හැකි වේවායි කොබයාෂි සෙන්සේතුමා ලංකාවේදී ප්‍රාර්ථනා කළ දෙයකි. නෙත්සුඕ වතනාබේ සෙන්සේතුමා සෙකයි කියුසෙයි පදනමෙහි වර්තමාන සභාපති ලෙස වැඩ කරයි.

1991 වර්ෂයේ හා නිවානෝ ත්‍යාගය ලබා ගැනීමට නැවතත් 92 වර්ෂයේ ද සෙකයි කියුසෙයි අටාමි මූලස්ථානයට ගිය අවස්ථාවලදී අපව ඉතා ආදරයෙන් පිළිගත් සංවිධානයේ ක්‍රියාකාරී යුවළක් වන කමිසකමෝටෝ දෙපළ ද අමතක කළ නොහැකි මිනිස්කම ඉස්මතු කරවන චරිතයන් බැවින් යමක් සඳහන් කළයුතු යැයි සිතමි.

මා ජපානයට ගිය හැම විටම මා සොයා එන කමිසකමෝටෝ දෙපළ කිහිපවිටක් ලංකාවට ද මා බැලීමට පැමිණියහ. ලංකාවත් ජපානයත් අතර සබඳතාවය බෞද්ධ ධර්මය තුළින් වැඩිදියුණු කළ හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව ඔවුන් නිතරම විශේෂ අවධානය යොමු කරමින් සිටියහ. ජපානයේදී මා හා නීතා සමඟ ඔවුන්ගේ පවුලේ උදවිය ද ඒ පිළිබඳ දීර්ඝ සාකච්ඡාවන්ට යොමු විය.

කමිසකමෝටෝ යුවළ ලංකාවට පැමිණි විට, මා පිළිබඳ සිත් බිඳවන සුළු අධෛර්යවත් කරන නොයෙක් ද්වේශ සහගත කතා සමහරු ඔවුන්ට කියා ඇත. නමුත් මා පිළිබඳ ස්ථාවර විශ්වාසයක්

නීතාට සහ මට පෝරේ ප්‍රතිකාරය ලබා දෙමින්

හා භක්තියක් ඔවුන් තුළ තිබුණි. එසේ කියන පුද්ගලයින්ට ඔවුන් පිළිතුරු දුන්නේ අමුතුම විදියකටය. 'බුදුන් වහන්සේගේ කාලයේ බිම්බිසාර රජ්ජුරුවෝ සිටියා. එහෙත් අද බුදුන් ගැන මිස, මිනිසුන් ඔහු ගැන කතා නොකරයි'. එමෙන්ම තව අවුරුදු 1000 ක් ගත වූවත් ආරියරත්න මහතා නම් අමතක නොවනු ඇත ලෙසටය.

ගුණදාස ලියනගේ ශූරීන් ලියූ දෙල්ගහයට ගෙදර විප්ලවය පොත ජපන් භාෂාවට පරිවර්තනය කොට ජපන් පාඨකයන් අතරට පත් කිරීම ඔහු කළ විශිෂ්ට සේවයකි.

ජෝරේයි වැඩ සටහන මිනිස් වර්ගයා තුළ ව්‍යාප්ත කිරීම සෙකයි කියුසෙයි පදනමෙහි දූත මෙහෙවර වේ. එහි කාර්යභාරය වන්නේ ජෝරේයි මගින් මිනිසාගේ අධ්‍යාත්මය උසස් තත්ත්වයට පත් කොට, නිවන් අවබෝධ කර ගැන්මට අන්‍ය ආගම්වල අයට තමාගේ අභිමත විමුක්තිය ළඟා කර ගැන්මට ආධාර කිරීමයි.

සහයෝගයෙන් එක්ව යමක් කිරීමේ ධනාත්මක සිතිවිලි

විශ්ව සමාධියට දායක වූවෝ

විශ්ව සමාධි සංකීර්ණය

1990 දශකය ජාතික වශයෙන් මෙන්ම, ජාත්‍යන්තර වශයෙන් ද සර්වෝදය කටයුතු බොහෝ ව්‍යාප්ත වූ කාල පරිච්ඡේදයක් විය. මේ නිසා අලුතින් ගොඩනඟන ලද 'දම්සක් මන්දිරයේ' පහසුකම් ප්‍රමාණවත් නොවීය.

දම්සක් ගොඩනැගිලි සංකීර්ණය පිටුපස තිබූ භූමිය ලඳු කැලෑවලින් යුක්ත වූ පල්ලමක් ලෙස ප්‍රයෝජනයට නොගෙන තිබුණේය. මේ කොටස දකින විට මට නිතරම කල්පනා වූයේ, මෙම ඉඩ ප්‍රමාණය තෙමහල් ගොඩනැගිල්ලක් තැනීමට ඉතාම සුදුසු බවය. එහෙත් ඒ සඳහා අවශ්‍ය මුදල් සොයා ගන්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයක් විය.

මේ අතර මගේ ඥාති සොහොයුරියක් එවකට ප්‍රසිද්ධියක් ලබා සිටි කොන්ත්‍රාත්කරුවෙකු වූ ඇගේ ස්වාමියා සහ ළමයින් සමඟ අපේ නිවසට පැමිණියහ. ඒ.එල්.එච්. පියසේන මහතාය 'දයා නංගී. යනුවෙන් අප ඇමතූ ඔහුගේ බිරිඳ, අපේ පුංචි අක්කා සමඟ පාසැල් නිවාඩු කාලවලදී අපේ මරදානේ නිවසෙහි බොහෝ විට නැවතී සිටි තැනැත්තියකි. මගේ මව් පාර්ශවයෙන් ද පුංචි අක්කා ලලනා විවාහ වූ සුගතදාස අයියාගේ ද කිට්ටු ඥාතිවරියෙකි.

සර්වෝදය මූලස්ථානයේ විවිධ අංශ නැරඹූ පියසේන මහතා, අප කරන සේවාවන් ගැන පැහැදී ඔහුට කළ හැකි යම් සේවයක් තිබේ දැයි මගෙන් ප්‍රශ්න කළේය. දැනට විශ්ව සමාධි තෙමහල් ගොඩනැගිල්ල පිහිටුවා ඇති ස්ථානයට ඔහු කැඳවා ගෙන ගොස්, යට තට්ටුව පුස්තකාලය සහ කාර්යාලවලට සුදුසු වන පරිදිත් දෙවැනි තට්ටුව දම්සක් භූමි මට්ටමේ සිට දහසකට වාඩි විය හැකි ශාලාවක් සඳහාත් උඩ තට්ටුව සම්මන්ත්‍රණ ශාලාවක් සහ සෙසු කාර්යාල සඳහා යොදා ගත හැකි වන විදියේ ගොඩනැගිල්ලක අවශ්‍යතාව ගැන ඔහුට සඳහන් කළෙමි.

මේ සඳහා මුදල් තිබේ දැයි ඔහු විමසු විට, මා ප්‍රකාශ කළේ දැනට මුදල් නොමැති බවත් ඔහු ගොඩනැගිල්ල හදාගෙන යන අතරේ මුදල් සොයා ගත හැකි බවත්ය.

පියසේන මහතාට ඒ යුගයේ අද තරම් විශාල වැඩ කොටස් තිබුණේ නැත. ඒ නිසා ඔහුම මෙම නව ගොඩනැගිල්ලේ සැලැස්ම සාදවා මට පෙන්වා අනුමත කර ගත්තේය. සති දෙකක් යෑමටත් පෙර භූමිය එළිපෙහෙළි කොට, නැකත් බලා, ගෙපල් කපා වැඩ කරන සේවකයිනට නැවතී සිටීමට මඩු කූඩාරම් ද ගසා, අවශ්‍ය සියලුම ගල් වැලි සිමෙන්ති ආදිය ද ගෙනැවිත් පියසේන මහතා විශ්ව කර්මයෙක් මෙන් වූ විශාල ගොඩනැගිල්ල සෑදීමට පටන් ගත්තේය. මුදල් ගැන කෙසේ වෙතත්, මගේ හිත වැඩ කළේ ජාතික වශයෙන් පමණක් නොව, ජාත්‍යන්තර වශයෙන් ද ප්‍රජා සේවකයින් පුහුණු කළ හැකි පහසුකම් සහිත ගොඩනැගිල්ලක් ඉදි වනු දැකීමේ සතුටකි.

සාමවිනිසුරු එල්.එච්. පියසේන මුදලාලි මහතා සමඟ

මගේ කැනඩා සංචාරවලදී මට මුණගැසුනු අතිශයින්ම අවංක, තුන්වන ලෝකයට සාධාරණත්වය ඉටු කිරීමට හදවතින්ම කැපවුනු පරණ කල්‍යාණ මිත්‍රයෙක් හඳුනා ගෙන සිටියෙමි. ඒ රොනල්ඩ් ලෙජේ මහතාය. ඔහුගේ මව් භාෂාව ප්‍රංශ භාෂාව වූ නමුත්, ඉංගිරිසි භාෂාවෙහි ද ප්‍රවීණයෙක් වු නිසා මා සිතේ වැඩ කළ සිහිනය පිළිබඳව ඔහු සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට කැනඩාවේ කළ සංචාරවලදී මට අවස්ථාව ලැබිණි. බොහෝ විට ඔහුගේ නිවසේ රාත්‍රිය ද මම ගත කළෙමි.

සර්වෝදය දැක බලා ගැනිමට ශ්‍රී ලංකාවට ඔහු පැමිණෙන බව කිහිප විටක්ම, රොනල්ඩ් මා සමඟ ප්‍රකාශ කර තිබුණේය. දිනක් කොළඹ ගෝල්ෆේස් හෝටලයේ සිට ඔහු මට දුරකතනයෙන් කතා කොට ඊට ටික වේලාවකට පෙර ලංකාවට පැමිණි බවත් කැනඩා මහ කොමසාරිස් කාර්යාලයට යෑමට පෙර මා සමඟ දින

චම්පස රොනල්ඩ් ලෙෂේ මහතා සහ මම

කිහිපයක් සර්වෝදය කටයුතු දැක බලා ගැනීමට යෑමට අවශ්‍ය කරන බවත් ඔහු පැවැසීය පසුදා උදෙන්ම ගෝල්ෆේස් හෝටලයට පැමිණ මගේ ජීප් රියෙන් ඔහු සමඟ දින කිහිපයක සංචාරයක් ඇරඹීමට ගිවිස ගතිමු.

වාහනයේ රියැදුරු හැටියට මා සිටි අතර, මට මතක හැටියට උදව්වට තවත් ළමයෙක් ද අප සමඟ ගමනට එකතු විය.

ජීප් රථය පණ ගැන්වූ මම, 'ඔබට යෑමට අවශ්‍ය කුමන දිශාවට' දැයි? ඔහුගේ අතේ ලංකාවේ සිතියම තබා ඇසුවෙමි. කුමන දිශාවකට ගියත් සර්වෝදය ස්ථානයක් බැලීමට වුවමනා වූ විට මට දන්වූවාම මිනිත්තු 5 ක් ඇතුළත සර්වෝදය ගමකට කැඳවා ගෙන යන බව මා කී විට, ඔහු විමතියෙන් මෙන් මා දෙස බැලීය.

'හොඳයි අපි බටහිර වෙරළ දිගේ ඉහළට යමු' යි ඔහු යෝජනා කළේය. ඒ අනුව පැයක් පමණ ගිය තැන, ඔහු මේ

ප්‍රදේශයේ සර්වෝදය ගමක් බලමු'' යි යෝජනා කළේය. ජීප් රිය නැවැත්වූ මම, එතැනම තිබූ කඩයකින් ඒ කිට්ටුව සර්වෝදය ගමක් තිබේ දැයි ඇසුවෙමි. සර්වෝදය ගමක් තිබෙන බවත් එතැනට යා යුත්තේ කෙසේ දැයි යන්න ඔහු පැහැදිලි කළේය. මිනිත්තු 5 ක් ඇතුළත අපි ඒ ස්ථානයට ළඟා වීමු. මුහුද පේන දුර තිබුණු මෙම ගම්මානයේ, ඒ වන විටත් පෙර පාසල පවත්වමින් තිබුණේය. අප විසින් පුහුණු කරන ලද පෙරපාසල් පාලිකාවක් එම පෙරපාසලේ ඒ අවස්ථාවේදී ළමයින් 35 දෙනෙක් පමණ සමඟ සෙල්ලම් කරමින් සිටියහ. පොදු මුළුතැන්ගෙයි මව්වරු කිහිප දෙනෙක් ළමයිනට ත්‍රිපෝෂ සහ දිවා ආහාරය සූදානම් කරමින් සිටියේය. යොවුන් හවුලේ තරුණ තරුණියන් ශ්‍රමදානයක යෙදී සිටි අතර, මේ සියල්ල දුටු රොනල්ඩ් ලෙපර්ට කිසිම දෙයක් තේරුම් කර දීමට මට අවශ්‍යතාවක් නොවීය. මෙම ගම්වාසී ලොකු කුඩා හැම දෙනාත් සමඟම පැයකට කිට්ටු කාලයක් ගත කළ ඔහු, ගමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ හොඳ අදහසක් ලබා ගත්තේය.

වාහනයට ගොඩ වූ පසු අපි මීගමුව පසු කර පුත්තලම පැත්තට ඇදෙන්නට වීමු. පැය භාගයක් යැමටත් පෙර වාහනය නතර කරන ලෙස ඔහු ඉල්ලා සිටියේය.

මා වාහනය නවත්වා තිබුණේ හරියටම නගර මධ්‍යයේය. වාහනයෙන් බහින ගමන්ම, වාහනය ඉදිරිපිට තිබූ උස් ගොඩනැගිල්ලට මගේ ඇස් පතිත විය. මා පුදුමයකට මෙන් දුටුවේ එහි උඩම තට්ටුවේ සර්වෝදය නීතිසහන සේවය යන නාම පුවරුවකි. රොනල්ඩ් ලෙපේ සමඟ මම වහාම එම ගොඩනැගිල්ලේ ඉහළම තට්ටුවට ගමන් කළෙමි. මගේ පුදුමයකට මෙන් මා එහි දුටුවේ නීතිඥවරු කිහිප දෙනෙක් නීති සායනයක් පවත්වන බවය. මාරවිල ප්‍රදේශයේ සර්වෝදය කටයුතු පිළිබඳව හොඳ අදහසක් ඔවුන් සමඟ කතා කොට ලබා ගැනීමට රොන් ලෙපේට හැකි විය.

මේ ස්ථාන දෙකටම කලින් දන්වා සැලසුම් කොට, මා ඔහු කැඳවා ගෙන ගිය තැන් නොවන බව ඔහු හොඳින් මේ වන විට අවබෝධ කර ගත්තේය.

එතැන සිට අප ගියේ පුත්තලම දිස්ත්‍රික්කයේ දුප්පත් ගම්මාන දෙකකටය. මේ ගම් දෙකේදීම ගමේ සිටි ජනතාව මුණ ගැසීමට ඔහුට පුළුවන් විය. ගම්මුන් විසින් එතෙක් කරන ලද දශවිධ මූලික මානුෂික අවශ්‍යතාවලට සම්බන්ධ වූ සේවාවන් රැසක් ම මේ ගමනේදි ඔහුට දැක බලා ගැනීමට හැකි විය. ගමේ පාරවල් ළිං වැසිකිලි ගෙවතු වගා කටුමැටි ගසන ලද ගෙවල් පාර දෙපස සිටුවන ලද ගස් ආදි වූ භෞතික සේවාවන් රැසක්ම ඔහුට දැක ගන්නට ලැබුණේය. මේ හැරුණු විට පැවැත්වූ විශේෂ පවුල් හමුවලදී පෙර පාසල්, සිඟිති හමු, යොවුන් හවුල්, මව් හවුල්, ගොවි හවුල් ආදියේ සාමාජික සාමාජිකාවන් මුණගැසීමට ද, ඔවුන්ගෙන් නොයෙක් දේ ප්‍රශ්න කොට තවත් කරුණු දැන ගැනීමට ඔහුට හැකි විය.

එදා රාත්‍රී අනුරාධපුර මධ්‍යස්ථානයේ ගත කොට පසුව දා දවසම ගම් බැලීමට ගියෙමි. ඒ ගමනේදි ශ්‍රමදානයෙන් ප්‍රතිසංස්කරණය කරන ලද ගැමි වැව් කිහිපයක් ද රොනල්ඩ් ලෙජේ මහතාට දැක ගැනීමට හැකි විය. ක්‍රිස්තු පූර්ව 6 වැනි සියවසේ සිට, ක්‍රිස්තු වර්ෂ 12 වැනි සියවස අතර කාලයේදී අනුරාධපුර අගනුවර මුල් කොට එදා අපේ මුතුන්මිත්තන් ගොඩනගා තිබූ ශිෂ්ටාචාරය පිළිබඳව ද විස්තර ඔහුට තේරුම් කර දුනිමි. ශ්‍රී මහා බෝධිය රුවන්වැලිසෑය අභයගිරිය, ජේතවනය, මිරිසවැටිය, ථූපාරාමය ලෝවාමහාපාය, මිහින්තලය ආදී ස්ථාන නැරඹීමෙන් පසු, ශ්‍රී ලංකාවටත් අනුරාධපුර දර්ශනයෙන් සහ සංස්කෘතියෙන් ආභාෂය ලබා ගෙන සර්වෝදය දියත් කර ඇති වැඩවලටත් ඔහු පුදුම විදියේ ගෞරවයක් සහ භක්තියක් දක්වන්නට පටන් ගත්තේය. ඊළඟ දවස මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ගත කොට, ලෙජේ මහතා ගෝල්ෆේස් හෝටලයට ඇරලූයෙමි. ඊට පසු දිනය යොදා ගෙන තිබුණේ කැනඩා තානාපති කාර්යාලයට යෑමටත්, අපේ මූලස්ථානය දැක බලා ගැනීමටත්ය.

රොනල්ඩ් ලෙජේ මහතාට මූලස්ථානය පෙන්වීමෙන් පසු, අපේ ජ්‍යෙෂ්ඨ සේවක සේවිකාවන් ද මුණ ගැස්සූවෙමි. අලුතෙන් ගොඩනැගෙන තෙමහල් ගොඩනැගිල්ල දුටු ඔහු එයට මුදල්

ආයෝජනය කරන්නේ කවරෙක් දැයි මගෙන් ඇසීය. මෙතෙක් කර ඇති සම්පූර්ණ වැඩ කොටසට මුදල් එල්.එච්. පියසේන මහතා විසින් ආයෝජනය කර ඇති බවත් ඔහුට එම ණය පියවීමට මම පොරොන්දු වී සිටින බවත් පැවැසීමි. එම ගොඩනැගිල්ලේ අවශ්‍යතාව ඇතුළු සියලු විස්තර සඳහන් කොට වියදම් ඇස්තමේන්තුවක් ද ඇතිව, වහාම එය ඔහුට ලැබෙන්නට සලස්වන මෙන් රොනල්ඩ් ලෙජේ මහතා ඉල්ලා සිටියේය. එම සියලු ලියකියවිලි සම්පූර්ණ කොට ඔහු ආපසු කැනඩාවට යෑමට පෙර මම බාර දුනිමි.

ඊට ටික දිනකට පසු කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය හෙවත් CIDA ආයතනයේ නිලධාරීන් පුහුණු කිරීමේ පාඨමාලාවකට දේශකයෙක් වශයෙන් පැමිණෙන මෙන් රොනල්ඩ් ලෙජේ මහතාගෙන් මට ආරාධනාවක් ලැබුණේය. එවකට CIDA ආයතනයේ රාජ්‍ය නොවන සංවර්ධන අංශය බාරව කටයුතු කළේ රොනල්ඩ් ලෙජේ මහතාය. මා කැනඩාවට ගිය විගස, එම දේශනවලට අමතරව තවත් රැස්වීම් ගණනාවක්ම ඔහු සංවිධානය කර තිබුණේය. CIDA ආයතනයේ අධ්‍යක්ෂවරයා ඇතුළු ප්‍රධාන නිලධාරීන් හමු වී, මට වඩා හොඳින් සර්වෝදය අරමුණු සහ ක්‍රියාමාර්ග පිළිබඳවත්, එයින් ලංකාවේ පමණක් නොව, ලෝක සංවර්ධනයට සිදුවන මෙහෙය ගැනත් ඔහු ඒ හැම දෙනාටම ඒත්තු ගැන්වීය.

මේ ගොඩනැගිල්ලට ගිය වියදම ඇස්තමේන්තු කිරීමට CIDA ආයතනයෙන් නියෝජිතයෙක් ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පියෙක් සමඟ එවන බවට ඔහු පොරොන්දු වූ අතර, ඔවුන්ගේ ඇස්තමේන්තු අනුව CIDA ආයතනය විසින් බර පැන දැරීමට ද පොරොන්දු විය. මා ලංකාවට පැමිණ ගත වූයේ දින කිහිපයකි. මේ අය පැමිණ මට මතක හැටියට, රුපියල් මිලියන 18 ක් සර්වෝදයට පරිත්‍යාග කිරීමට තීන්දු විය. එවකට ලංකාවේ සිටි කැනේඩියානු තානාපති ඩේවිඩ් මාටින් කොලැකොට් මහතා මාර්ගයෙන් ත්‍යාග ගිවිසුමට අත්සන් කර, එම මුදල ගෙන පියසේන මහතාගේ ණය පියවූයෙමි.

ඈන් සදර්ලන්ඩ් මහත්මිය, ශ්‍රී ලංකාවේ කැනේඩියානු තානාපති
ශ්‍රීමත් ඩේවිඩ් මාටින් කොලැකොට් මැතිතුමා සහ මම

විවෘත කිරීමේ උත්සවය

අන්තර් ජාතික පුහුණු අධ්‍යාපන ආයතනයක් සහ අන්තර් ජාතික සම්මන්ත්‍රණ ශාලාවක් යන දෙකම අපේ මොරටුව මූලස්ථානයට විශාල අවශ්‍යතාවක් වී තිබුණි. එම අංශ දෙකින්ම සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කිරිමට සම්පත් සෙවීමේදී අපි හුඟක් මහන්සි වුණෙමු. අන්තිමේදී අපේ අරමුණ ඉෂ්ට කර ගැනීමට ඉදිරිපත් වූයේ 'සීඩා' CIDA ආයතනයයි. එය කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය නම් විය අද අපේ මූලස්ථානයේ පිහිටි විශ්ව සමාධි ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව හා ශ්‍රවණාගාරය සහිත මෙම මන්දිරය සීඩා ආයතනයේ උත්කෘෂ්ට වූ පරිත්‍යාගයේ ප්‍රතිඵලයක් ලෙසට අප විසින් භුක්ති විඳින්නා වූ මහඟු ආශිර්වාදයයි. ශ්‍රවණාගාරය දහසක් දෙනෙකුට වාඩිවීමට පහසුකම් සහිතය. වායු

සමීකරණය කරන ලද අංග සම්පූර්ණ සම්මන්ත්‍රණ ශාලාව ඉහළ මාලයේය. වෙනත් රැස්වීම් හා දේශන ශාලා ද එහි ඇත. ආරම්භයේදී එම ගොඩනැගිල්ල තුළම පිහිටුවන ලද ජාත්‍යන්තර සංවර්ධන අධ්‍යාපනය ඒකකය, පුළුල්ව වැඩි දියුණු කිරීමෙන් පසුව දිවයිනේ වෙනත් මධ්‍යස්ථානයන් වෙත ගෙන ගොස් සාර්ථකව පවත්වා ගෙන යනු ලැබේ. එහිම වූ සර්වෝදය මධ්‍යම පුස්තකාලය ද දූන් ඉඩකඩ සහිතව බිම් මාලයේ පවත්වා ගෙන යන්නෙමු. විශ්ව සමාධියේ වටපිටාව සුන්දරය. ඒ කාලයේ අදටත් වඩා එහි ගහකොළ වෘක්ෂලතාදිය සශ්‍රීකව තිබුණි.

'විශ්ව සමාධි' යන්නෙන් අර්ථවත් වන්නේ කුමක්ද? ඉන් අදහස් වන්නේ ''සාමය උදා කර ගැනීමටත් මානව සම්පත් අත්පත් කර ගැනීම සඳහාත් අධ්‍යාපනය උපකාරී වේ. එමගින් ලබා ගත හැකි විශ්ව අවබෝධය වැඩි දියුණු කර ගැන්මට විශ්ව සමාධි මගින් ඉඩ ප්‍රස්ථාව සැලසෙන බවය''.

ශ්‍රී ලංකාවේ කැනේඩියානු තානාපති ශ්‍රීමත් ඩේවිඩ් මාටින් කොලැකොට් මැතිතුමා (HE.David Martin Collacott) අතින් 1985 මැයි මස 25 වැනි දින උත්සවශ්‍රීයෙන් විශ්ව සමාධි තෙමහල් මන්දිරය විවෘත කොට ගෙවදීම සිදු විය. එතුමා සමග උත්සවයට පැමිණ සිටි කැනඩා මහකොමසාරිස් කාර්යාලයේ සංවර්ධන අංශයේ උපදේශිකා ඈන් සදර්ලන්ඩ් (Mrs.Ann Sadarland) මහත්මියත් මොරටුව පාර්ලිමේන්තු මන්ත්‍රී සහ එවකට විදේශ කටයුතු බාර උප ඇමැතිව සිටි ටිරෝන් ප්‍රනාන්දු මහතාත් දේශන පැවැත්වූහ.

මොරටුවේ පිහිටි මූලස්ථානය පදනම් කර ගෙන, සර්වෝදය ව්‍යාපාරය විසින් රට පුරා සිදු කරනු ලබන ඉමහත් වටිනා සේවය අපට මහත් ආඩම්බරයට කරුණකි. රටවල් 48 ක නියෝජිතයින් අද සර්වෝදය ව්‍යාපාරයට සම්බන්ධ වී සිටීම හා අතහිත දීම සන්තෝෂයට කරුණකි. ඒ සබඳතාවයන් තුළින් අපේ ලෝකයේ

සාමය සහ මිත්‍රත්වය ගොඩනැඟීමට අපට පුලුවන් යනුවෙන් ටිරොන් ප්‍රනාන්දු මහතා තම කථාවේදී ප්‍රකාශ කළේය.

ඈන් සදර්ලන්ඩ් මහත්මියගේ කතාව:

සම්භාවනීය අමුත්තනි පෞද්ගලික වූ යම් වැදගත් කරුණු කිහිපයක් ප්‍රථමයෙන් මා ඔබ හමුවේ තැබීමට කැමතියි. ඒ අපේ මහ කොමසාරිස්තුමා ගැනයි. එතුමා ද ස්වේච්ඡා සේවා සංවිධාන පසුතලයකින් පැමිණි කෙනෙක්, මමත් මගේ මිතුරන් කිහිප දෙනෙකුත් සමඟ ජනතා සංවර්ධනය සඳහා මුදල් එකතු කිරීමේ මහජන ව්‍යාපාරයක වැඩ කරන කාලයේ 1969 - 70 වර්ෂවල එතුමාද, එම ආයතනයේ සේවය කළා. එම සංවිධානය මයිල්ස් ෆෝර් මිලියන්ස් "Miles for Milions" යන්නය. එම ව්‍යාපාරය සර්වෝදය වාගේ රටේ හැම තැනම ව්‍යාප්තව තිබුණේ නැහැ. කැනඩාවේ නගර හා ගම්මාන 120 ක පමණක් ක්‍රියාත්මක වූ එකක් නමුත් මයිල්ස් ෆෝ මිලියන්ස් ගණනින් ඇත්තටම ව්‍යාප්තව තිබූ ස්වේච්ඡා සේවකයින්ගෙන් සමන්විත වුණා. (සැතැප්ම ලක්ෂ ගණනින්) අවුරුදු දෙකක් එහි වැඩ කිරීමෙන් පසු මගේ ප්‍රේමණීය මිතුරියන් වූ විල්ෆ් ඇලන් (Wilf Allen) සහ ශීලා මැක්පර්සන් (Shela Mc.Person) දෙදෙනා ශ්‍රී ලංකාවට පැමිණ මහජන සහභාගිත්වය ඉතා සාර්ථකව පවත්වා ගෙන යන ආචාර්ය ඒ.ටී.ආරියරත්න මහතාගේ සර්වෝදය ව්‍යාපාරයට පැමිණ වැඩ කරන්නට තීරණය කළා. 1982 දී මා මේ තනතුරට පත්වූ පසු ඉතා සතුටට පත් වූවා. ඔවුන් මීට දශකයකටත් වඩා පෙරදී එදා මෙහි ඇවිත් හැම දෙයක් බලාකියා ගන්නට ඇති. 'සීඩා' ආයතනය මගින් කරන ලද පරිත්‍යාගයෙන් ගොඩනැගුණු මේ අලංකාර මන්දිරය දැකීමට අද මෙහි පැමිණීමත් අපරිමිත සන්තෝෂයක්. ආචාර්ය ආරියරත්න මහතාත්, එම මහත්මියත්, ඒ වාගේම සර්වෝදය ව්‍යාපාරයට සම්බන්ධ අනෙකුත් සියලු දෙනාමත්, මහත් විශ්වාසයකටත් ගෞරවාදරයටත් භාජනය වී තිබෙනවා සමස්ත ලෝක ජනතාව වෙතින්. ඔබලාගේ ආගන්තුක සත්කාරය ද ප්‍රශංසනීයයි. මෙම ප්‍රියජනක රැස්වීම ගැන අතිශයින් ස්තුතිවන්ත වෙමි.

මහ කොමසාරිස් ශ්‍රීමත් මාටින් කොලැකොට් මහතාගේ දේශනය

ගෞරවනීය ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා සහ මැතිනියනි, උප ඇමති ටිරෝන් ප්‍රනාන්දු මහතා සහ ආරාධිත අමුත්තන් සියලුදෙනාත් නෝනාවරුන් හා මහත්වරුන්ගෙන් අවසරයි:

සර්වෝදය ජාත්‍යන්තර මධ්‍යස්ථානය 'විශ්ව සමාධි' විවෘත කිරීමේ සුභ මොහොතට මා ද සහභාගි කරවා ගැනීම පිළිබඳව මගේ ස්තුතිය, මා ප්‍රථමයෙන්ම පුද කිරීමට කැමැත්තෙමි. එසේ සහභාගි වීමට ලැබීම ඉතා සන්තෝෂයක් සහ ගෞරවයක් ලෙස ද මම සලකමි. මෙම ජාත්‍යන්තර මධ්‍යස්ථානය මනරම් ගොඩනැගිල්ලක් පමණක් නොව, විදේශීය ජනතාවට ද අධ්‍යාපනය ලැබීමට මාහැඟි වටිනා ඉඩ ප්‍රස්ථාවන් සපයනු ලබන අධ්‍යාපනික ගොඩනැගිලි සංකීර්ණයකි. පොදු සිද්ධාන්ත ධර්මතාවයන් අධ්‍යයනය කිරීමට ද ලෝකයේ විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ආයතන අතර සර්වෝදය විසින් නිර්මාණය කළා වූ සබඳතාවයන් නිසා අදාළ වැඩ සටහන්වලට සහභාගිවීම සඳහා විශ්ව ප්‍රජාවටම ලැබී ඇති පහසුකම ද සුවිශේෂ ලෙස ඉතා වැදගත් වේ.

සර්වෝදය ගැන හැදෑරීමට ශ්‍රී ලංකාවට පැමිණෙන සංවර්ධන විශේෂඥයින් පර්යේෂකයින් බොහෝය. අවුරුදු ගණනාවක සිට විවිධ තරාතිරම්වල පුද්ගලයින් මෙහි පැමිණෙති. ඒ අය පමණක් නොව, විශාල සංඛ්‍යාවක් ස්වේච්ඡා සේවකයින් බොහෝ විට අඩු වියදම් ධාරිතාවයන් සමඟ සර්වෝදයේ වැඩ සටහන් හා මූලධර්ම ගැන ගැඹුරු අවබෝධයක් ලබා ගැන්මට මෙහි යන එන සියලුදෙනාම ආකර්ෂණය කර ගැන්මට එහි නේවාසික ඉඩපහසුකම් රැස්වීම් ශාලාව සම්මන්ත්‍රණ ශාලාව හා ජාත්‍යන්තර පර්යේෂණ පුස්තකාලය සහිත මෙම සම්භාවනීය විශ්ව සමාධි මන්දිරය සමත් වනු ඇත.

මෙම ජාත්‍යන්තර මධ්‍යස්ථානය ඇත්ත වශයෙන්ම සර්වෝදය ගොඩනැංවීම සඳහා 'සීඩා' ආයතනය මගින් මෙතරම්

අධික මුදල් ප්‍රමාණයක් වියදම් කිරීමට පෙළඹුණේ කෙසේ දැයි අද මෙතැනට පැමිණ සිටින අපේ විදේශික හා ශ්‍රී ලංකාවේ සිටින හිතමිතුරන්ගේ දැන ගැනීම පිණිස වචන ස්වල්පයකින් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. අවුරුදු ගණනක් කැනේඩියානු ජාතිකයින් කිහිපදෙනෙක් මගින් කැනඩාව සර්වෝදය සමඟ සම්බන්ධතාවයක් ඇති කරගෙන තිබූ අතර, ඒ තුළින් ඉන් පසුව රාජ්‍ය නොවන සංවිධානයන් දක්වා ඒ සබඳකම් වර්ධනය වූවා.

1970 මුල් කාලයේ පටන්ම, සර්වෝදය ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ පමණක් නොව ජාත්‍යන්තරව ද කීර්තිමත් නාමයක්, ජනප්‍රියතාවයක් දිනා ගැනීමට සමත් විය. ග්‍රාමීය ප්‍රජාවගේ ස්ව අවබෝධය වර්ධනය කරවීමෙන් තම තමන්ගේ ප්‍රජාවන් සංවර්ධනය කර ගැනීමට ජනතාව හුරුපුරුදු කරවීමෙන් අත්පත් කරගත් සුවිශේෂ ජයග්‍රහණය එයට හේතුවයි. පසු කාලයකදී අපේ කැනේඩියානු රාජ්‍ය නොවන සංවිධාන (NGO) නියෝජිතයෝ ද ශ්‍රී ලංකාවට පැමිණෙන්නට වූහ.

සර්වෝදයෙන් යමක් ඉගෙන ගන්නටත්, දැනුවත් බව ලබන්නටත්, ඒ අතරතුරේදී සර්වෝදය ව්‍යාපාරය විසින් දසදහස් ගණන් ග්‍රාමීය හා නාගරික ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවිතයන්ට ශුභදායී පරිවර්තනයක් ගෙන දීමේ ප්‍රයත්නයට සහභාගි වන්නටත් ඔවුන්ට හැකි වූහ.

ශ්‍රී ලංකාවේ මුළු සතර දිග් භාගයේම ක්‍රියාත්මක කරනු ලැබූ එම ක්‍රියාපටිපාටීන් සිදු වූයේ, බොහෝ අගහිඟකම් හා බාධක දුෂ්කරතා මැදින් බව ද කිව යුතුය. ව්‍යාපාරයේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යාමේ ශක්තිය බලය හා අධිෂ්ඨානයත් මුල් කාලයේ සිටම සර්වෝදයේ ජයග්‍රහණයට හේතු වූ අත්‍යවශ්‍ය හා වැදගත් සාධකයක් වුවද, ව්‍යාපාරය ටිකෙන් ටික වර්ධනය වෙත්ම, විසඳීමට පහසු වූවා හෝ නැතුවා විය හැකි එහි යම් යම් අපහසුතාවයන් හා ගැටළු පැනනැගී තිබුණි.

ප්‍රධාන හේතුව වූයේ ව්‍යාපාරය නඩත්තු කිරීමට අවශ්‍ය මූල්‍යමය සම්පත් හීනවීමය. ග්‍රාමීය ප්‍රජාව විසින් ඔවුනොවුන්ගේ ස්වශක්තිය භාවිතා කර ගනිමින්, සාමූහිකව සංවිධානය වෙමින්, තම ජීවනෝපාය හා සමස්ත ප්‍රගතිය උදා කර ගැනීමේ අරමුණු හා අදාළ වගකීම් දරා ගැනීම සර්වෝදයේ මූලික ප්‍රතිපත්තියක් වුවද, එහිදී ස්ව සංවිධානයන්හි අවශ්‍ය මුදල් ආයෝජනය කළ යුතුය. තිරසාර ලෝකයක් බිහි කර ගැන්මට ඔවුනට මුදල් ව්‍යාපාරය මගින් ලබා දිය යුතුය. ජනතා ව්‍යාපාරයක් ලෙස සර්වෝදයේ කාර්යභාරය උත්කෘෂ්ටය. භාරදූරය දනටමත් වැඩ සටහන්වලට යොමු වී සිටි ප්‍රජාවන්ට නිසි මාර්ගෝපදේශකත්වය ලබාදීම උනන්දු කරවීම එම වැඩ සටහන් නඩත්තු කිරිම මෙන්ම, සර්වෝදයේ ශුභසාධනය තමන් වෙත ප්‍රවේශ වන තෙක් මග බලා සිටින ජනතාවක් ද සිටිති. සර්වෝදය වැනි දීප ව්‍යාප්ත මෙවැනි සමාජසේවා ව්‍යාපාරයක් සඳහා එවැනි යටිතල ව්‍යුහයන් නිර්මාණය උදෙසා සෑහෙන මුදලක් වැය කළ යුතුව ඇත. පසුගිය කාලයේ අරමුදල් සම්බන්ධයෙන් උග්‍ර අවදානම් ප්‍රශ්නවලට සර්වෝදය මුහුණ දුන් බව මම දනිමි. වර්තමානයේ ලෝකයේ උද්ගත වී තිබෙන ආර්ථික වාතාවරණයට අනුව සම්පත් දායක සංවිධානයන් විසින් ද මුහුණ පෑ වර්ධනය වන අයවැය දුෂ්කරතාවයන් හේතුකොට ගෙන මෙතෙක් ලැබූ අරමුදල් හීන වීම එයට ප්‍රධාන හේතුවක් වුයේය.

මෙවැනි තත්ත්වයක් උද්ගත වෙද්දී 'සීඩා' ආයතනය සර්වෝදයට ආධාර වැඩි කරමින් උදව් කරන්නට කල්පනා කළේය. මෙතෙක් පවත්වා ගෙන ආ ආකාරයට සර්වෝදය සාර්ථකව ඉදිරියටත් කර ගෙන යාවි ද යන්න අප විසින් පරීක්ෂාකර බලා, එය තහවුරු කරගත යුතු විය. සියලුම අනෙකුත් රාජ්‍යයන්හි ආණ්ඩු සංවිධාන මෙන්ම, අපගේ ආයතනය ද එවැන්නක් සිදු කිරීමට පෙර හුඟක් දුරදිග සිතා බලන සුළුය. ඒ නිසා සර්වෝදයේ සියලුම ක්‍රියාකාරකම් වැඩ සටහන් ව්‍යුහය මුදල් පරිහරණය ආයෝජනය සහ අනෙකුත් සියළු වැදගත් කරුණු සම්බන්ධව පූර්ණ වාර්තාවක් අප විසින් ඉල්ලා සිටින ලදී. මේ සමඟම සඳහන් කළ යුතු තවත්

කරුණක් ඇත. එනම් සීඩා ආයතනයට අමතරව, අන්තර් ජාතික සංවර්ධනය සඳහා 'නොරාඩ්' (NORAD) නම් නෝර්වීජියන් ආයතනය ද සෞඛ්‍ය අංශය හා සර්වෝදයේ වෙනත් සේවා සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් දක්වූයේය. ආධාර කිරීමේ පරමාර්ථය මත වැඩදුරටත් කරුණු සොයා බැලීමට ඒ වාගේම පුළුල් විස්තරාත්මක වාර්තාවක් නොරාඩ් ආයතනය විසින් ද ලබා ගෙන තිබුණි.

මේ අනුව 1984 වර්ෂයේ අග භාගයේදී උසස් සුදුසුකම් ලත් ප්‍රවීන උපදේශක කණ්ඩායමක් කැනඩාවෙන් ශ්‍රී ලංකාවට පැමිණ ටික කාලයක් මෙහි නැවති සිටියේය. එම කණ්ඩායමේ පරමාර්ථය වූයේ මොරටුව සර්වෝදය මූලස්ථානයේ සංවිධානාත්මක ව්‍යුහය පමණක් පිරික්සීම නොව ලංකාව පුරා ඇවිද ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජාව වෙත ප්‍රවේශ වී, ඔවුන් කෙරෙහි සර්වෝදය ක්‍රියාකාරම් කෙතෙක් දුරට බලපා ඇත්දැයි සොයා බැලීමත්ය. සර්වෝදයේ මව් හවුල්, ගොවි හවුල්, සිඟිති හවුල්, යොවුන් හවුල්, වැඩිහිටි හවුල් ද ආදී විවිධ කණ්ඩායම් මුණගැසුණු සීඩා විමර්ශක කණ්ඩායම, සර්වෝදය ප්‍රජා නායකත්වය මූලිකව ක්‍රියාත්මක වූ ශ්‍රමදාන කඳවුරු වෙත ද ප්‍රවේශ වෙමින් සියල්ල හොඳින් බලා කියා ගත්හ.

සර්වෝදයේ ණය සඃහන ව්‍යාපෘති නිරීක්ෂණය කරමින් එම සංවිධාන මගින් ග්‍රාමීය සංවර්ධනය සඳහා දෙනු ලබන වටිනා දායකත්වය අවබෝධ කරගනු ලැබුණි. ලෝහ කර්මාන්ත පේෂකර්මය සහ ඇඳුම් මසන මධ්‍යස්ථාන ඉංජිනේරු වැඩ බතික් සහ අලුත් මුද්‍රණාලය වැනි ආදායම් උත්පාදනය කරන සර්වෝදය මධ්‍යස්ථාන, සීඩා ආයතන නිලධාරීන්ට දැක ගැනීමට ලැබුණි. මේ සියල්ලෙන්ම ඉතාම වැදගත් කරුණ නම්, සර්වෝදයට මුදල් අවශ්‍ය වන්නේ කුමන ආකාරයේ ප්‍රයත්නයන් සඳහාද යන්න ඉන් තේරුම් ගැනීමට හැකි වීමය.

එම විමර්ශක කමිටුව විසින් වාර්තා කරන ලද සියල්ලෙහිම සාරාංශය ඔබ ඉදිරියේ තැබීමට මා අදහස් නොකරන අතර, ඉන් වැදගත් කරුණු කිහිපයක් පමණක් සඳහන් කරමි.

ලංකාවේ සෑම තැනම ඇවිද බැලූ විමර්ශක කමිටුව විසින් සර්වෝදය ව්‍යාපාරයේ පුළුල් ව්‍යාප්තිය ගැන සිය විමතිය ප්‍රසාදය පළ කර තිබුණි. ගම්මාන හයදාහකට වඩා ගැමි ප්‍රජාවන් අඩු වශයෙන් ශ්‍රමදාන ව්‍යාපාරවලට පමණක්වත් සාර්ථකව යොමුවී තිබීමෙන්, තම ගම් ප්‍රදේශයන්හි ප්‍රශ්න අඩුපාඩු ඔවුනොවුන්ටම විසඳා ගැනීමේ ශක්තිය උපදේශක කමිටුවේ මහත් සතුටට හේතු වූ දෙයකි. ගමේ පාරවල් කැඩීබිඳී ගිය වැව් ඇල මාර්ග ඔවුන්ගේම සහභාගිත්වයෙන් ශ්‍රමදාන පළපුරුද්දෙන් ප්‍රතිසංස්කරණය හෝ නිර්මාණය කර ගන්නා ලදී. එම කර්තව්‍යයන්හි යෙදෙන අතරතුරදී, ඒවායේ ගැබ්ව ඇති වටිනාකම් සහ ශ්‍රමදානයේ අති මහත් සුබසෙත එම ග්‍රාමීය ජනතාව ඉගෙන තිබුණි. ඔවුන් ඒ වැඩවලින් ලබා තිබුණේ වටිනා අන්දමේ උචිත අධ්‍යාපනයකි. ළමුන්ගේ පෙර පාසල් කණ්ඩායම් පෝෂණ ව්‍යාපෘති ඉතිරි කිරීම් සහ නීති සහන වැඩසටහන් වැනි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ සටහන් ගම් තුන්දාහක පමණ දැකගත හැකි විණි.

ඉතාම ප්‍රසාදජනක වැදගත්ම ලක්ෂණයක් විමර්ශක කමිටුවේ නිරීක්ෂණයන්ට හසුවී තිබුණි. ඒ කුමක් ද යත්, ඉතාම දුෂ්කර ඈත ප්‍රදේශවල පවා ජනතාවගේ දක්නට ලැබුණු උද්යෝගීමත් අධිෂ්ඨානශීලී සහයෝගයෙන් එක්ව යමක් කිරීමේ ධනාත්මක සිතිවිලිය. අදහස් හා ආත්ම විශ්වාසයය මා හිතන්නේ එම ධෛර්යවත් ලක්ෂණය සර්වෝදය ව්‍යාපාරයේ මුල සිටම තිබූ දෙයක් ජනතාවට හුරුපුරුදු කළ සාර ධර්මයක් කියායි.

කැනේඩියානු උපදේශක කමිටුව අවබෝධ කරගත් තවත් කැපී පෙනෙන කරුණක් නම් ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතු වී තිබෙන මෙම 'ගැමි පුබුදුව' ව්‍යාපාරයේ මැද සිටින නිවැරදි ශක්තිමත් හා ඍජු නායකත්වය ආචාර්ය ඒ.ටී. ආරියරත්න නිසාම ඇති වූ බවය. ඔහුගේ මග පෙන්වීම සර්වෝදය මුළු සංවිධානයේම ව්‍යාප්තිය හා ඉදිරියට යාමට හේතුසාධක වී තිබේ. එම උපදේශක - යින්ගේ වාර්තාවෙන්ම උපුටාගෙනයි මා මෙය ප්‍රකාශ කරන්නේ .

එනම් සර්වෝදය කළමනාකරණයේ භක්තිය හා කැපවීමේ තරාතිරමත් වෙහෙස වී වැඩෙහි යෙදීමත් සියලු මට්ටම්වල කර්තව්‍යයන් පූර්ණ ලෙස ඉෂ්ට කිරීමේ අවධානයත්, අතිශයින්ම උසස් ප්‍රමිතියකින් යුක්තය.

තවද සර්වෝදයේ ගැමි ප්‍රජාව වෙත ණය නිකුත් කිරීම්වල දක්නට තිබුණු සාර්ථකත්වයන් සංඛ්‍යාලේඛන ඉදිරිපත් නොකර වුවද, පහසුවෙන් පැහැදිලි කළ හැක. රජයේ ණයදීම් සමඟ එහි විශාල පරතරයකි. ගැමි ප්‍රජාවන්ට රජයේ ණය නිකුත් කිරීමේදී ආපසු ගෙවීම් ඉතා අසතුටුදායක 10%ක් පමණය. එය මහත් අභියෝගාත්මක බලාපොරොත්තු සුන් වූ තත්ත්වයකි. නමුත් සර්වෝදයේ ණය මුදල් දීමෙන් ගැමිප්‍රජාව 89% ක් ආපසු ගෙවීම් පෙන්නුම් කළේය. තම සාමාජිකයින්ට නිවැරදි සැලසුම් මත එම මුදල් යෙදවීමට නිසි උපදෙස් හා ධෛර්යය දීමෙන් ඒවා සාර්ථක වී ඇත. ස්ව ශක්තිය ස්ව සුභසාධනය යන්න සර්වෝදයේ එම ආයතන මගින් ජනතාවට අවබෝධ කර දීම නිසා එම වැඩ සටහන් මනාව කළමනාකරණය වී තිබෙන බවක් විමර්ශක කමිටුව වටහා ගෙන තිබුණි.

එම උපදේශකවරුන් විසින් නිගමනය කරනු ලැබූ තවත් සුවිශේෂත්වයකි: සර්වෝදයේ සමස්ත මූල්‍යමය ඕනෑ එපාකම් ඇත්තටම සැලකිය යුතු තරමටම වර්ධනය වී පීඩාකාරී තත්ත්වයකම පවතින්නකි. එසේ වී නමුත් මෙතෙක් විය පැහැදම් කර තිබෙන මුදල් ප්‍රමාණයන් සමඟ සසඳන විට, ව්‍යාපාරය විසින් වැඩිමනත් ලෙස අත්පත් කර ගෙන ඇති ප්‍රතිලාභයන් හා ජයග්‍රහණයන් විශිෂ්ට වන්නක් බව පැහැදිලි දෙයකි. සර්වෝදය ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් වැඩිපුරම සිදු කෙරෙන්නේ ශ්‍රමදාන වැනි ස්වේච්ඡා සේවාවන් මගින් වන අතර, ඉතා කැප වීමෙන් සේවයේ යෙදෙන පූර්ණ කාලීන සේවකයන් ද ව්‍යාපාරය විසින් ගෙවනු ලබන අඩු මාසික දීමනාවකින් ජීවත් වන්නන්ය. වියදම් සඵලතාවය යන මිණුම මගින් තක්සේරු කළ විට, උපදේශක වාර්තාවෙන්

දක්වෙන පරිදි වියදම් අවම කිරීමෙන් ඉතා විශිෂ්ට උපරිමයක ප්‍රතිඵල අත්පත් කර ගැනීමට සර්වෝදය ව්‍යාපාරය සමත් වී තිබේ.

එම උපදේශක වාර්තාව සර්වෝදයේ ජයග්‍රහණයන් ගැන පමණක් ප්‍රකාශ කිරීමට සීමා වූවක් නොවේ. ගම් සංවර්ධනය වෙනස් වීමක් අවශ්‍ය යැයි අදහස් කළ තැන් ද නිර්දේශ කරනු ලැබීය. පැහැදිලියෙන් හැම කාරණයක්ම එහි සඳහන් වුණි. ලෝකයේ වෙනත් කිසිම සංවිධානයකින් ලබා ගෙන නොමැති විදියේ විශාල ධාරිතාවකින් සර්වෝදය ව්‍යාපාරය තම සේවා ප්‍රතිඵල අත්පත් කර ගනිමින් සිටී.

මා සමාව අයදිනවා, තවත් යම් උදාහරණයක් ඔබට මතක් කර දීමට සිදුවීම ගැන. ඒ කුමක්ද යත් යම් ව්‍යාපාරික සංස්ථාවක වාර්ෂික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව ගෙන බැලුවහොත් ඔබට පෙනේවි එම අලස හා දුර්වල ගනයේ වාර්තාවල සර්වෝදය ගැන ඉහත කී වාර්තාවකට වඩා කෙතරම් පිටු පසින් සිටින්නක් ද කියා. තවද අද මා මෙතැනට පැමිණ සිටින්නේත්, කැනඩාව මෙම ජාත්‍යන්තර මධ්‍යස්ථානයට විශාල දායකත්වයක් ලබා දී තිබෙන්නේත්, හදිසියේම ඇති වූ යම් උද්යෝගීමත් හැඟීමකින් හෝ සිතිවිලි තරංගයකින් නිසා නම් නොවන බව මා ස්ථිර ලෙසම ප්‍රකාශ කරන්නට කැමතියි.

එවැනි වටිනා සම්පත් දායකත්වයක් සර්වෝදයට ලබා දීමට හේතු වූයේ ඒ පිළිබඳ ඉතා ප්‍රවේශම් සහිත ගැඹුරු අධ්‍යයන විමර්ශනයක් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද තීරණයෙනි අපි කැනේඩියානු රජයේ පාර්ශවයෙන් සෑම කරුණක් ගැනම සලකා බැලුවෙමු. ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් යම් ධෛර්යයක් ශක්තියක් ප්‍රදානය කිරීමට අපට සත්‍ය ලෙසම අවශ්‍ය නම්, සර්වෝදය ව්‍යාපාරයට එය ලබා දීමෙන් විනා, වෙනත් විදියකින් එම මුදල්වල වටිනාකම අත්පත් කරගත හැකි වන්නේ නැති බවක් අපි පැහැදිලිව තේරුම් ගතිමු.

ශ්‍රී ලංකා රජයට ආධාර සපයන වෙනත් ආයතන ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ද අතහිත දීමට මාර්ග සොයති. එවැනි උපදේශක වාර්තාවක් ඔබ හොඳින් පිරික්සුවහොත්, ඔබට බොහෝ දේවල් දැන ගැනීමට එය ප්‍රයෝජනවත් වනවා ඇත.

ආර්ථික කළමනාකරණය පිළිබඳව සර්වෝදය ව්‍යාපාරයේ නිපුණත්වය ගැන අවධාරණය කරන විට එමගින් ලබා ඇති ජයග්‍රහණයන් සම්බන්ධයෙන් මිනිස් දෘෂ්ටියට අනුකූලවම, සත්‍යයම ප්‍රකාශ කරනවා විනා, කිසිම අන්දමකින් වසන් කර කතා කිරීමට මට අවශ්‍ය වන්නේ නැත. ඔබ දන්නා විදියටම කැනේඩියානු මහ කොමසාරිස් වන මම, කැනඩා රජයේ සේවකයෙක් සිවිල් නිලධාරියෙක් නවීන හෝ වේවා ඕනෑම රටක් සම්බන්ධයෙන් එහි මහජනතාවට ඔවුන්ගේ ඕනෑඑපාකම් ඉෂ්ට කර දීම වෙනුවෙන් කැනඩා රජය විසින් ඉෂ්ට කර දිය යුතු යම් කාර්ය භාරයක් වේද, මම මගේ රාජකාරී ධාරිතාවෙන් ඒ පිළිබඳව හොඳ පැහැදිලි අවබෝධයෙන් සිටින කෙනෙක්.

ඔබේ දැන ගැනීම පිණිස මා තව දෙයක් කියන්නම්: මම මගේ රැකියාව ආරම්භ කළේ රජයේ සේවකයෙක් ලෙස නොවේ. කැනේඩියානු රාජ්‍ය නොවන සංවිධානයක කාර්ය මණ්ඩල සාමාජිකයෙක් විදියටයි. මුලින් කටයුතු කළේ සර්වෝදයට බෙහෙවින් සමාන වූ පරමාර්ථයන් රාශියක් එම සංවිධානයට අන්තර්ගතව තිබුණා. එම අත්දැකීම නිසාම සර්වෝදය ව්‍යාපාරය විසින් වීර්ය දරනු ලබන්නේ කුමන විදියේ කර්තව්‍යයක් ඉෂ්ට කිරීමට ද යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබේ.

පූර්ණ ලෙස ආර්ථික විග්‍රහයක් කරන්නේ නම්, සර්වෝදය ගැන කිවයුත්තේ ශ්‍රී ලංකාවේ ගැමි ප්‍රදේශවල ජනතාවට මහඟු සේවයක් ඉන් ඉටු වන බවය. ශ්‍රී ලංකා රජයට එවැනි සේවයක් කිරීමට සම්පත් නොමැති බව ප්‍රකට කරුණකි. කෙසේ වෙතත් ඊටත් වඩා වැදගත් සංසිද්ධීන් සර්වෝදය තුළින් හඳුනා ගෙන

තිබුණි. එනම්, රජයේ කිසිම උදව් උපකාරයක් තබා, අඩු තරමින් එවැන්නක් සඳහා වෙන යම් මැදිහත් වීමක් වත් නොලබන්නා වූ අන්ත අසරණ අයවලුන් හා ඔවුන්ගේ ප්‍රජාවන්ට උදව් කිරීමේ අධිෂ්ඨානයත් තමන් සතු විය යුතු පරමාර්ථ මොනවා ද යන්න පිළිබඳව සර්වෝදය ව්‍යාපාරය විසින් තම සේවකයින්ට හොඳින් දැනුවත් කර එය සිතට කාවැද්දවීමය.

එවැනි ක්‍රියා කලාපයන් රජය සමඟ තරඟ කිරීමක් නොව, අර්ථ දැක්විය යුත්තේ රජයේ සේවාවන්ට ප්‍රසාද දීමනාවක් නැතහොත් ආශීර්වාදයක් ලෙසය. සර්වෝදයේ මෙම සේවාවන් විසින් යම් සේවාලාභී ප්‍රජාවන් වෙත සුහද එකමුතු භාවය සහ වගකීම ද ප්‍රදානය කරයි. එය ඕනෑම ශුභවාදී ප්‍රජාතන්ත්‍රවාදයකට පොදු වන්නකි.

මගේ කතාව අවසන් කිරීමට ප්‍රථමයෙන් නෝනාවරුනි, මහත්වරුනි, මා සර්වෝදයේ තවත් ක්‍රියා කලාප කිහිපයක් ගැන කෙටි හැඳින්වීමක් කිරීමට කැමතියි. සර්වෝදයේ ගැමි ප්‍රජා සංවර්ධන සේවා ස්ව අවබෝධ වර්ධනය සහ නායකත්වයේ ගුණාංග ගැන මා බොහෝ දුරට කතා කළා. මේ රටේ පසුගිය කාලයන්හි ඉතා අවදානම් සහිත තත්ත්වයන් පැන නැඟී තිබුණා. විවිධ ප්‍රජාවන් අතර ඇති වූ ආරවුල් හේතුකොට ගෙන, එය ඔබලා කවුරුත් පාහේ දන්නා දෙයක්. ශ්‍රී ලංකාවේ ජීවත් වන මනුෂ්‍යයින් අතර අන්‍යෝන්‍ය සහෝදර හැඟීම් ඉස්මතු කරමින්, සමගිය හා එකමුතු භාවය ඔවුන'තර ඇති කිරීමට ඒ.ටී. ආරියරත්න මහතා විසින් ගන්නා ලද උත්සාහය ගැන යමක් කෙටියෙන් හෝ සඳහන් නොකරමින් මෙම කථාව මේ අවස්ථාවේ නැවැත්වීම කළ නොහැක.

මෙම ව්‍යාපාරය පටන් ගත් කාලයේ සිටම, ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශයන්හි සියලුම ජාතිවලට අයත් ජනතාවට උදව් උපකාර කළා. අසූතුනේ කළකෝලාහල උද්ගත වෙද්දී මෙම ජාතිවාදී අරගල මැඩ පැවැත්වීමට යම් ක්‍රියා මාර්ගයක් ගතයුතු බව බොහෝ දෙනා කතා කළා. ප්‍රසිද්ධ කළා. නමුත් ඒ වෙනුවෙන් නොබියව ඉදිරියට

පැමිණි කිහිපදෙනාගෙන් එක්කෙනෙකි ආචාර්ය ඒ. ටී.ආරියරත්න මහතා.

ස්ථිරව යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඔහු සමත් වුණා. එදා ඒ කාලයේ මෙතැන සිටි අප කිහිප දෙනාටත් අමතකයි. ඒ අතීතය ආරියරත්න මහතා දීපව්‍යාප්ත සාම පා ගමනක් සංවිධානය කළා. එදා ඉතා ධෛර්යවන්ත ලෙස මේ මෑතකදී සර්වෝදය නැවතත් පෙරමුණට ආවා යාපනය ප්‍රදේශයේ සාගතය නිවීමට බඩු භාණ්ඩ ආහාර යැවීම සඳහා තවද, පදවිය, අම්පාර, මුලකලපුව, කිළිනොච්චිය, වව්නියාව හා පොළොන්නරුව යන ප්‍රදේශවල සරණාගතයින්ට ද එමගින් සර්වෝදයේ පිහිටාධාර ලබා ගැනීමට හැකි වූවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිදු වූ භයානක ත්‍රස්තවාදි සිදුවීම්වලින් පසු විපතට පත් වූවන්ට ආධාර කිරීමට ඉදිරිපත් වූ ප්‍රථම සංවිධානයන්ගෙන් එකක් ලෙස සර්වෝදය ව්‍යාපාරය කැපී පෙනුණා.

සර්වෝදය ව්‍යාපාරය විසින් මේ රටේ ජනතාව වෙත අද දවසේ ඉෂ්ට කරන්නා වූ මෙවැනි පරාර්ථකාමී උත්කෘෂ්ට සේවාවන් වනාහි, මෙතෙක් ගෙවී ගිය හැම කාල පරිච්ඡේදයකටත් වඩා අද ශ්‍රී ලංකාවට අනිවාර්ය වන අවශ්‍යතාවයකි. එනම්: සමස්ත ශ්‍රී ලංකා ජනතාවගේ ශුභසාධනය කෙරෙහි දක්විය යුතු එක සමාන උනන්දුව හා සැලකිල්ලය තවද සර්වෝදය ව්‍යාපාරය තුළ බබලවන්නා වූ එකමුතු සහෝදර හැඟීම මේ රටේ මුළුමහත් ජාතියම උද්යෝගීමත් කිරීමට දසත විහිදෙනු ඇතැයි මම ප්‍රාර්ථනා කරමි.

මෙම උත්කර්ෂවත් මොහොතට සහභාගිවීම සඳහා ආරාධනා කිරීමෙන් මා වෙත ලබා දුන් ගෞරවයට මා නැවත වතාවක් ඔබට ස්තුති කරන අතරම, සර්වෝදය ප්‍රතිපත්ති හා මූලධර්ම අවබෝධ කර ගනිමින් තිරසාර ලොවක් ගොඩනැඟීමට එම දැනුම භාවිතා කිරීමට ශ්‍රී ලංකාවේ පමණක් නොව, ජාත්‍යන්තර ප්‍රජාවට ද ඉදිරියේදී ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත.

ජගත් සම්මාන දෙකක් : අගැයුමක්

ජම්නලාල් බජාජ්තුමාගේ සහ මහත්මා ගාන්ධිතුමාගේ පිළිරුවට මල්මාලාවක් දැමූ අවස්ථාව

'ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර ත්‍යාගය' පිරිනමනු ලබන්නේ ඉන්දියාවේ බොම්බායේ පිහිටුවා තිබෙන ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර පදනම මගිනි. ජම්නලාල් යනු, මහත්මා ගාන්ධිතුමා ඉතා සමීපව ඇසුරු කළ සමාජය වෙනුවෙන් ඉමහත් උත්කෘෂ්ට සේවයක් ප්‍රදානය කළා වූ මානව හිතවාදී පුද්ගලයෙකි. ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකි. එතුමාගේ විශිෂ්ට සමාජ මෙහෙවර ස්තුති ප්‍රශංසාවෙන් සිහිපත් කිරීම හා එයට ගෞරව දැක්වීම සඳහා 'ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර ත්‍යාගය' පිරිනමනු ලැබේ.

ගාන්ධි මූලධර්ම හදවතින්ම වැළඳ ගත් ජම්නලාල් බජාජ් තම රටෙහි ස්වෛරී භාවය ආරක්ෂා කර ගැනීම සඳහා කරන ලද නිදහස් සටනේදීත් ගාන්ධිතුමාගේ අවිහිංසාවාදී අරගලයේදීත්, ඉතා ශක්තිමත් හා ඒ වෙනුවෙන් අවංකවම කැප වුන අතරමැදියෙක් විය.

විශාල ධනවත් ව්‍යාපාරිකයකු වූ හෙතෙම, රට බේරා ගැනීමේ නිදහස් සටනේදී තම ධනය ඒ සඳහා නොමසුරුව වැය කළේය. බජාජ් ස්කූටර් ත්‍රීවිල් රථ වැනි කාර්මික නිෂ්පාදනයන්හි ඉහළම ස්ථානයට නැඟ සිටි එතුමා, ඉන්දීය කර්මාන්තකරණයේ පුරෝගාමියෙකු ලෙස හැඳින්විය හැක.

ආරම්භයේදී මෙම පදනම පිහිටුවන ලද්දේ මහත්මා ගාන්ධිතුමාගේ සංකල්පයන් හා ඉගැන්වීම් අනුගමනය කරමින්, ඒ අනුව සාර්ථක සමාජ සේවාවන්හි යෙදෙන සිව් දෙනෙකු භාරතීය ජනතාව අතරින්ම තෝරා ඔවුනට ත්‍යාග පිරිනැමීමටත් වෙනත් සමාජ සේවා වැඩ කටයුතුත් සඳහාය. පසුව ගාන්ධි දර්ශනය හා සාරධර්ම ලෝක ප්‍රජාව තුළ ව්‍යාප්ත කරමින් සිටින අනෙකුත් පුද්ගලයින් සඳහා ද මෙම ත්‍යාගය පිරිනැමීම අරමුණු කොට ගෙන 1988 දී 'ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර ත්‍යාගය' පිහිටුවනු ලැබීය නිල වශයෙන් හා උත්සවාකාරයෙන් ප්‍රදානය කරනු ලැබූ ප්‍රථම ජාත්‍යන්තර ත්‍යාගය සඳහා 1990 වර්ෂය වෙනුවෙන් මා තේරී පත් වී තිබුණි. බජාජ්තුමාගේ සියවෙනි ජන්ම දිනය අනුස්මරණය කිරීම ද උත්සවයේ තවත් අංගයක් විය.

මේ සඳහා මා සුදුසුකම් ලබා ඇති බව ප්‍රථමයෙන්ම මට දැන ගැනීමට ලැබුණේ ද නොසිතූ විරූ පරිදි නමුත්, නිතැතින්ම මුහුණ දීමට සිදු වූ අහඹු සිද්ධියක් හරහාය. එනම් 1990වර්ෂයේ නොවැම්බර් මස 17 වැනි දින මා සහභාගි වූ ක්වලාලාම්පූර් සමුළුවේදී ඇති වූ සිද්ධියයි. නොවැම්බර් 15 වැනිදා සවස ලංකාවෙන් පිටත් වූ මම, සිංගප්පූරුව හරහා මැලේසියාවේ අගනුවර වූ ක්වාලාලාම්පූර් නගරයට ගියෙමි. එහි ජාත්‍යන්තර ප්‍රජා අධ්‍යාපන සංගමය මගින් සංවිධානය කරනු ලැබූ "ප්‍රජා අධ්‍යාපනය සහ ආසියානු උරුමය" යන තේමාවෙන් යුත් සමුළුවෙහි ප්‍රාරම්භක දේශනය මා විසින් පැවැත්වීමට නියමිතව තිබුණි. 17 වෙනි දා එහි ගොස් සහභාගි වූ මම, එය ඉටු කොට පසුවදා සිය රටට ආවෙමි. ක්වාලාලාම්පූර් කෙටි ගමනේදී මුහුණ පෑ එම අහඹු සිද්ධිය, ජීවිතයේ තවත් වැදගත් සන්ධිස්ථානයක් ලෙස සනිටුහන් කිරීමට හේතුසාධක වී තිබුණි.

එදා සමුළුවේදී ප්‍රාරම්භක දේශනය සඳහා මට ආරාධනා කරමින් කථා කළ මහාචාර්ය රාම්ලාල් පරීක් මහතා, විශේෂ නිවේදනයක් සභාවට ඉදිරිපත් කළේය. 1990 වර්ෂය සඳහා 'ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර සම්මානය' ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරයේ නිර්මාතෘ ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහත්මාට පිරිනමා ඇති බව ඔහුගේ මුවින් ප්‍රකාශ විය. ඉන් අනතුරුව එතුමා විසින් සභාව ඉදිරියේදීම ඒ බව සඳහන් වූ ලිපිය මට පිළිගන්වනු ලැබීය. හදිසියේ කඩාපාත් වූ මෙවැන්නක්, මා විසින් කිසි විටෙක අපේක්ෂා නොකළ දෙයකි. මුල් අවුරුද්දේ සිටම පදනම මගින් මගේ නම මේ සඳහා තෝරා ගෙන තිබුණ නමුත්, ඉන්දීය රජය විසින් ඒ සඳහා අනුමැතිය නොදුන් බවක් රාම්ලාල් පරීක් මහතා මට දිනක් රහසින් කියා තිබුණි. ඒ කාලයේ ඉන්දියාව මගින් ලංකාවට සාම හමුදාව එවීමට විරුද්ධව, මා ලංකාවේදී මෙන්ම, ඉන්දියාවේදීත් දිගින් දිගටම කතා කළ නිසා, එසේ වීමට හේතු වන්නට ඇත. සිසිලයේ ඩැනිලෝ ඩොල්චි ද අප්‍රිකාවේ නෙල්සන් මැන්ඩලා සහ ප්‍රංශයේ ලන්සාදාල් වස්තෝතුමාගේ කටයුතු ඉදිරියට ගෙන යන ප්‍රීඩ් පියතුමාට ද මේ නිසා මුදල් පරිත්‍යාගයන් පිරිනැමූ බව රාම්ලාල් පරීක් මහතා වැඩිදුරටත් මා සමඟ කීය.

කෙසේ නමුත් මගේ නම මෙවර සැප්තැම්බර් 12 වෙනිදා ඉන්දීය රජය වෙත ඉදිරිපත් කළ විට, වහාම එදිනම එය අනුමත කර එවා ඇත. ඉන්දීය අග්‍රවිනිශ්චකාරවරයෙකු සහ උප ජනාධිපතිව සිටි එම්. හිදයතුල්ලා මහතා ප්‍රමුඛ වූ සුවිශේෂ විනිශ්චය මණ්ඩලයක් මගින් මෙම තේරීම සිදු කර ඇත. ඒ සඳහා මා තෝරා ගෙන ඇත්තේ පුද්ගලයින් 40 දෙනෙකු අතුරින් ඒකමතික තීරණයක් ලෙසටය. 1990 නොවැම්බර් මාසයේ දෙවැනි දින බොම්බායේ පැවැත්වූ විශේෂ උත්සවයකදී මෙම ත්‍යාගය මා වෙත පිරිනමනු ලැබීය.

විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් නම්, මෙවැනි පිළිගැනීම් හා ත්‍යාග නිසා මා විසින් විශේෂ සන්තෝෂයක් භුක්ති

නොවිඳීමය. එසේ වීමට ද සැබෑ හේතුවක් තිබුණි. මා විසින් ඉෂ්ට කරනු ලැබූ සේවය තම රටෙහි නායකයින් ගණනකට නොගත්ත ද, ලෝකය විසින් එය සතුටින් පිළිගන්නා බව ප්‍රත්‍යක්ෂ කර ගැනීම නිසා ඇති සැනසීම, ත්‍යාග - සම්මාන ලැබීමෙන් ඇති විය හැකි යම් සතුටක් ඇත්නම් එය අභිබවා යන හෙයිනි.

* * *

එම අවුරුද්දෙහි ජූලි මස 08 වැනිදා ජාත්‍යන්තර අමද්‍යප සංවිධානයෙන් පිරිනැමෙන ඉහළම සම්මානය වන 'ඕගස්ට් ෆෝරල් ත්‍යාගය' ස්විස්ටර්ලන්තයේ කෝපන්හේගන් නුවරදී මට හිමි විය. එයද අති උත්කෘෂ්ට වූ සම්භාවනීය උළෙලකි. එහෙත් අප රටේ රජය මගින් පාලනය කරනු ලබන මාධ්‍ය විසින් ඒ පිළිබඳව කිසිම සඳහනක් නොකළේය.

ජම්නලාල් බජාජ් ත්‍යාගය පිළිබඳ ප්‍රවෘත්ති නිවේදනය රැගෙන කමල් වලේබොඩ මල්ලී ගුවන් විදුලියට හා රූපවාහිනියට ගිය විට දී ඇති පිළිතුර නම් ඉහළින් ලැබී තිබෙන නියෝගයට අනුව ආරියරත්න ගැන හෝ සර්වෝදය ගැන හෝ කිසිවක් ප්‍රකාශයට පත් කළ නොහැකි බවය.

එය එසේම වේවා'යි මම සිතුවෙමි. නමුත් ප්‍රශ්නය වූයේ මේ 'ඉහළය' කියන තැන තිබෙන්නේ කොතැන ද යන්නය. ජනාධිපතිවරයාද? අගමැතිද? වෙනත් දේශපාලන බලවතෙක්ද? නැත්නම් නිලධාරියෙක්ද? මෙම ගැටළු නිරාකරණය කිරීමට ඉදිරි අනාගතයට බාර කළෙමි. 1990 වර්ෂයේ ඔක්තෝම්බරයේදි මා චන්දිගා නුවරට යන ගමනේදී, අතරමග බොම්බායේදී බැස ජම්නලාල් බජාජ් පදනමට ගියෙමි. පදනම වෙනුවෙන් දේශායි මහතා ද, ශ්‍රී ලංකා මහ කොමසාරිස් හේරත් මහතා ද මා පිළිගත්හ. බොම්බාය හරහා සැම්බියාවට ගමන් කළ වෛද්‍ය හඩ්සන් සිල්වා සහ වෛද්‍ය උපාලි මෙන්ඩිස් මහතා මා සමඟ එම ගුවන්යානයේ ම ගමන් ගත්හ. එදා අපි සැම දෙනා සෙන්ටුවර් හෝටලයට ගොස්

ආහාර ගත්තෙමු. රාමක්‍රිෂ්ණ බජාජ් මහතාට මම දුරකතනයෙන් කතා කළෙමි. මා විසින් සකස් කර ගෙන පැමිණි මගේ පිළිගැනීමේ දේශනයේ පිටපත, දේසායි මහතාට බාර දී ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සූදානම් කර තිබූ වැඩ සටහන ද කියවා අනුමත කර දුනිමි.

මගේ චන්දිගා ගමන සිදුවූයේ පොදු රාජ්‍ය මණ්ඩල පුහුණු ආයතනයේ පැවැත්වූ පාඨමාලා අවසන් උත්සවයේදී ප්‍රාරම්භක දේශනය පැවැත්වීමටය.

ජම්නලාල් බජාජ් ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගි වීමට නීතාත්, මාත් ලංකාවෙන් පිටත් වූයේ ඔක්තෝම්බර් 31 වෙනිදාය. සවස 6.25 ට පමණ කටුනායක ගුවන් තොටුපොළින් පිටත් වූ අපි, පැය දෙකහමාරකින් බොම්බායට ළඟා වීමු. රාජ්භවන්වලින් පාටෙන් මහතාත් ජම්නලාල් පදනමෙන් දේසායි මහතාත් ශ්‍රී ලංකා මහ කොමසාරිස් හේරත් මහතාත් ගුවන් තොටුපළට පැමිණ අප පිළිගත්හ. එතැනින් අප ආවේ රාජ්භවන්වලටය.

ආණ්ඩුකාර සිසුබ්‍රමනියම් මහතා ශකුන්තලා මැතිනිය (හිටපු ආණ්ඩුකාරවරයකුගේ බිරිඳ) සමඟ පසු දින ගත කර, රාත්‍රියේදී රාමක්‍රිෂ්ණ බජාජ් මහතා හමුවී රාත්‍රී ආහාර ගතිමු. උත්සවය සඳහා විශේෂිත ආරාධිත අමුත්තා වූයේ ඔස්ට්‍රියානු උප ජනාධිපති ආචාර්ය හර්බට් ෆැම්බෙක්ය. එතුමා හා දියණියත් හිදයතුල්ලා මැතිනිය බජාජ් පවුලේ සාමාජිකයින්ද සමඟ නීතාත්, මමත් දෙවැනිදා උදෑසන එලිෆන්ටා ගුහා බැලීමට බෝට්ටුවෙන් ගියෙමු.

ජම්නලාල් බජාජ් ත්‍යාග උළෙල පැවැත්වූයේ ඔක්තෝම්බර් 2 වැනි දා සවස 5.00 ටය. බොම්බායේ නේරු ශ්‍රවණාගාරයේදී පැවැත්වූ උත්සවයට අටසීයක් පමණ දෙනා පැමිණ සිටියහ. මුලසුන හෙබවූයේ ජම්නලාල් බජාජ් පදනමේ සභාපති හිදයතුල්ලා මහතාය. එවකට පනස්වැනි වියේ සිටි එතුමා, විශාල සමාජ ගෞරවාදරයක් දිනා ගෙන සිටි ජාතික නායකයෙකි. විශේෂ

ආරාධිත අමුත්තා ලෙස පැමිණ සිටි ආචාර්ය හර්බට් ෆැම්බෙක් මහතා, ඔහුගේ දියණිය රූත් සමඟ සිටි අතර, රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රභූන්ද, විදේශීය අමුත්තන් රාශියක් ද උත්සවයට සහභාගි වූ අය අතර වූහ. මහාචාර්ය ඩබ්.එම්.කේ.විජේතුංග හා ආනන්ද ජයවර්ධන යන මහත්වරු ද දිල්ලියේ රැස්වීමක් අවසන් කර යන අතරමග මේ උළෙලට සහභාගිවීම මට විශේෂ ප්‍රීතියක් විය.

මුලින්ම පිළිගැනීමේ කතාව අවසන් වූ පසු, ඉන්දීය ත්‍යාගලාභීන්ට සහතිකයක් පදක්කමක් සහ මුදල් පරිත්‍යාග කිරීමත් ඔවුන්ගේ පිළිතුරු කතා පැවැත්වීමත් සිදුවිය. මවිසින් ජාත්‍යන්තර ත්‍යාගය පිළිගත යුතු නිසා අවසානයේදී එම ත්‍යාගය මා වෙත ප්‍රදානය කිරීමෙන් අනතුරුව, පිළිතුරු කතාව පැවැත්වීම ද මම කළෙමි. ඒ අවස්ථාවේදී නීතාට ද ඇරයුම් කොට, අප දෙදෙනා විසින්ම ත්‍යාගය පිළිගතිමු.

ජර්මනියේ උප ජනාධිපතිතුමා සහ රාමක්‍රිෂ්ණ බජාජ් මැතිතුමා අතින් නීතා සහ මා වෙත සම්මානය සහ ත්‍යාගය පිරිනැමීම

ජම්නලාල් බජාජ් සම්මානය පිළිගැනීමෙන් පසු

උත්සවයට සහභාගී වී සිටි සම්භාවනීය අමුත්තන්

මෙම උත්සවය අත්‍යාලංකාර එකකි එදින රාත්‍රී දූරදර්ශන් ඉන්දීය ජාතික රූපවාහිනියෙන් ද එය විකාශනය කරන ලදී උත්සවය අවසානයේදී පිළිගැනීමේ සංග්‍රහයක් ද පැවැත්විණි. එය අවසන් වූ පසු අග්‍රාණ්ඩුකාරතුමා හා සුබ්‍රමනියම් මැතිනිය සමඟ රාත්‍රී ආහාරය ගෙන රාජ්භවන්හි නැවතුණෙමු.

> 'මිනිස් වර්ගයාගේ ප්‍රගතිය උදෙසා ආර්ථික සෞඛ්‍ය හා සාමය යන ක්ෂෙත්‍රයන් තුළ සේවාවන් වැඩිදුරටත් සංවර්ධනය හා චිරස්ථායී කිරීම සඳහා ගාන්ධි මූලධර්ම හා චින්තනයන් තවදුරටත් ඉස්මතු වී වර්ධනය වන ආකාරයෙන්, මානව ශිෂ්ටාචාරයේ උසස් ගුණාංග භාවිතා කරමින්, මා විසින් ඉෂ්ට කරන ලද මහඟු වටිනා සේවාව, ජම්නලාල් බජාජ් ත්‍යාගය මා වෙත පිරිනැමීමට හේතු සාධක වූ බවක් උත්සව සභාවේදී ප්‍රකාශයට පත් කරන ලදී'.

තිරසාර ප්‍රබෝධයක් - උනන්දුවක් ඇති කිරීමේ දූත මෙහෙවර

'ජම්නලාල් බජාජ්' ත්‍යාගය පිළිගැනීමේ දේශනය

ගාන්ධි මූලධර්ම හා ඒවායේ වටිනාකම් වැඩි දියුණු කරමින්, ලොව ප්‍රචලිත කිරීමේ කර්තව්‍යය උදෙසා ප්‍රශංසනාත්මකව මා වෙත පිරිනමනු ලබන ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර සම්මානය, සර්වෝදය සමාජ ක්‍රමය ශ්‍රී ලංකාවේ ගොඩනැංවීම සඳහා ඇප-කැප වී සේවය කළ මාගේ සහෘදයින් සියලුදෙනා වෙනුවෙනුත් මේ අවස්ථාවේදී අනභිමානීයව මම පිළිගන්නෙමි. ශ්‍රී ලංකාවාසීන් වන අප, එහි විශේෂ වැදගත්කමක් තිබේ. මෙවැනි සම්මානනීය ජාත්‍යන්තර තිළිණයක් අප වෙත පිරිනැමුණේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාද ස්පර්ශයෙන් පාරිශුද්ධත්වයට පැමිණි, අප විසින් ජම්බුද්වීපය හෙවත් භාරතය නමින් හඳුන්වනු ලබන ඉන්දීය දේශයෙනි. මහත්මා ගාන්ධි පමණක් නොව මහාවීර ධර්මාශෝක අධිරාජ්‍යයා ස්වාමි විවේකානන්ද ආචාර්ය විනෝබා භාවේ ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් හා තවත් සුවිශේෂ වූ මිනිස් වර්ගයාට හිතෛෂී ජන නායකයන් ශ්‍රේෂ්ඨ පුරුෂයන් බිහිවූ භාග්‍යවත් භාරතයෙනි. මෙම සම්මානය අප වෙත ප්‍රවේශ වූයේ ඒ උත්තම පුරුෂයින්ගේ අනුභාවය නිසාය. අපගේ චින්තන ශක්තියේ හා සිතිවිලි තුළින් අප දෙරටෙහිත්, සමස්ත ජනතාවගේත් හිතමිත්‍ර සබඳකම්, තවත් ශක්තිමත් කරනු ඇත පරාජයෙහිදී නොසැලී, නොබියව මුහුණ දීමට එම සුහදතාවය රුකුලක් වනු නොඅනුමානය.

මෙම සම්මානය තේරීම වෙනුවෙන් ත්‍යාග මණ්ඩලයේ සභාපති විනිසුරු එම්. හිදයතුල්ලා මැතිතුමා ඇතුළු එතුමාගේ උපදේශක කමිටු සාමාජිකයින්ට මගේ කෘතඥතා පූර්වක උත්තමාචාර ස්තුතිය පුද කරන්නෙමි. ඒ සමඟම මහාචාර්ය රාම්ලාල් පරීක් මහතාටත්, රාමක්‍රිෂ්ණ බජාජ් පවුලේ සැම දෙනාටත්

මගේ හෘදයාංගම අවංක ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. 1982 වර්ෂයේදි ගුජරාට් විද්‍යා පීඨයේදී .කමලනායන් බජාජ් අනුස්මරණ දේශන මාලාව. පැවැත්වීම සඳහා මට ආරාධනා කිරීමට ඒ අය පුරෝගාමීව කටයුතු කර තිබෙනවා. ඒ කාලයේ සිටම ශ්‍රී ලංකාවේත්, අන්‍ය රටවලත් අපේ ව්‍යාපාරයේ සංවර්ධන සේවා කර ගෙන යාමට අපට මහත් ශක්තියක් එම හිතවතුන් විසින් ලබා දුන්නා.

''සර්වෝදය'' යන වචනය මා මුලින්ම ශ්‍රවණය කළේ ඉන්දියාවේදී ම යි. 1959 දී ආචාර්ය ජී. රාමචන්ද්‍රන් මහතා දිල්ලියේදී දේශනයක් පැවැත්වූවා. එම දේශනයෙන් මම ඒ වචනය ඉගෙන ගත්තා. රාමචන්ද්‍රන් මහතා 'ගාන්ධි ග්‍රාම්' විශ්ව විද්‍යාලයේ නිර්මාතෘවරයාය. යටත් විජිතවාදීන්ගේ පාලනයෙන් මිදී, නිදහස ලැබූ ඉන්දියාවේ නව සමාජ ක්‍රමය සඳහා ගාන්ධිතුමා තම නුවණින් සංකල්පනය කළ පැහැදිලි කිරීම ''සර්වෝදය'' යන නාමයයි. මට එවේලේම සිතට ආවේ බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනා පාඨයක් ''සබ්බේ සත්තා සුඛී හොන්තු'' වූ සියලු සත්වයෝ සුවපත් වේවා! යන්නය. සර්වෝදය හෙවත් සියලු දෙනාගේ උදාව සහිත වූ ලොවක් නිර්මාණය කිරීමේ සිතිවිල්ල එදා සිටම, මගේ අභ්‍යන්තරයේ තැන්පත්ව පැවතිණි. මා කරන සියලු කාර්යයන්හිදී එම සංකල්පය විසින් මා තවත් ඒ කෙරෙහිම ධෛර්යවත් කරන ලදී. අද දවසේ අපි දකින්නේ එහි ප්‍රතිඵලයන්ය. ශ්‍රී ලංකාවේ සමස්ත වශයෙන් ගම්මාන 23000 න්, ගම් 8200 ක්ම ග්‍රාමීය ජනතාව සර්වෝදය සංවර්ධන රටාව පිළිගෙන ඇත. ආධ්‍යාත්මික සදාචාරාත්මක හා සංස්කෘතික සමාජීය, ආර්ථික හා දේශපාලනික වශයෙන් තම ජීවිතයන් තම උත්සාහයෙන්ම පූර්ණ අවිහිංසාවාදී පරිවර්තනයක් කරා ගෙන ඒමට ඔවුන් සාර්ථක වු ප්‍රයත්නයක යෙදී සිටී. දේශපාලනික සහ ජාතිවාදී ප්‍රචණ්ඩත්වය 1983 සිටම අපේ රට වසා ගෙන සිටියා නමුත් අප විසින් තෝරා ගත් අවිහිංසාව හා ධර්මිෂ්ටකම යන අඩි පාරේ යාමට සිංහල දෙමළ හා මුස්ලිම් ජාතිවලට අයත් අපේ ජනතාවට බාධාවක් වූයේ නැත.

සියලු මනුෂ්‍යයන් විසින් සිහි බුද්ධියෙන් යුතුව අධිෂ්ඨානයෙන් වැඩ කළහොත් කුසගින්න රෝගය අරගලය අයුක්තිය හා යුද්ධය යන්නත් අපගේ පෘථිවි තලයේ සිදුවන පාරිසරික පරිහානියත්, සම්පූර්ණයෙන්ම උදුරා දැමිය හැකි බව අපගේ අවංක විශ්වාසයයි. එය මුළු මිනිස් වර්ගයාගේ චින්තන පරිවර්තනයකින් සිදුවිය යුත්තකි. ලෝකයේ වෙසෙන පොදු මනුෂ්‍යයා එනම්ඃ පුරුෂයා කාන්තාව ළමයින් ආදීන්ගේ නිහතමානී විශ්ව ප්‍රයත්නයක් තුළින්, එම පරිවර්තනය සිදුවිය යුතුව ඇත. ඔවුනොවුන් සමඟ බෙදාහදා ගනිමින් සුහද හැඟීමෙන් අප විසින් නියැලෙන්නා වූ නිර්මාණාත්මක ක්‍රියා කලාපයන් ඇත්තේන්ම එම පරිවර්තන සංසිද්ධියයි.

ශ්‍රී ලංකා සර්වෝදය ශ්‍රමදාන සංසදය එවැනි ක්‍රියාවලියන් මගින් සාමය හා සංවර්ධනය සඳහා මහා මාවතක් විවෘත කර දී ඇත. එවැනි කර්තව්‍යයන් මගින් අප විසින් ඉෂ්ට කරනු ලබන්නේ කුමක්ද? මෙතෙක් දශක ගණනාවක් තිස්සේ අපට බාධක හිරිහැර පමුණුවන ලද්දා වූ සමාජීය, දේශපාලන සහ ආර්ථික සංවිධානයන් වෙනුවට යම් විකල්ප ව්‍යුහයන් ඉදිරිපත් කිරීමත් මානුෂිකත්වය මිනිසුන් තුළ ආරෝපණය කිරීම සඳහා ආධ්‍යාත්මික විඥානයක් ගොඩනැඟීමත්ය.

උදාහරණයක් ලෙස ගෝලීය මට්ටමින්ම සලකා බලන විට, අප ජීවත් වන වායු ගෝලයත් භෞමික ජීව විද්‍යාත්මක හා මනුෂ්‍ය ජීවිතයට සෘජුවම බලපාන්නා වූ විවිධ ආධාරක පද්ධතීන් ද නොසිතූ විරූ අන්දමින් අප විසින්ම විනාශ කර දමන බවක්, අප හොඳින් දන්නා කරුණකි. මෙවැනි ව්‍යසනයක මූලාරම්භය පැන නඟින්නේ කෑදරකමටත්, බියසුළුකමටත් තෝතැන්නක් වූ මනුෂ්‍යයාගේම හදවතිනි. මෙම අධික තණ්හාව තම පංච ඉන්ද්‍රියයන් සන්තර්පනය සඳහා ම ය. සමහර විට අන්ධ භාවයට පත්ව කටයුතු කරන්නේ මෙම තෘෂ්ණාවය තවත් විටෙක තමන්ගේම සහෘදයින් විනාශයට, සූරා කෑමට භාජනය කරන කෑදර මිනිසා, ස්වභාව ධර්මය ද දූෂණය

කරයි. විශාල ජන සමූහයක් දිළිඳු භාවයට පත් කරමින්, ස්වල්ප දෙනෙකුගේ සමෘද්ධිය ළඟා කර ගැන්මට සිත් පිත් නැතිව වැඩ කරයි. මිනිසුන් කිහිප දෙනා බැගින් කල්ලි ගැසී ප්‍රචණ්ඩකාරී ව්‍යුහයන් ගොඩනගා, ආයුධ සන්නද්ධව සිටින අවස්ථා අප දන්නවා නොවේද? ආයුධ සන්නද්ධ භාවය නිසා බහුතර ජනයා ඊට ඉතා ඈතින් සිටීම එවිට ඉබේම සිදුවන්නකි. මේ ආකාරයෙන් ධනයත්, බලයත් එවැනි සුළු පිරිසක් අතර ඒකරාශී වන විට අසාධාරණය-අයුක්තිය සමාජය තුළ ක්‍රියාත්මක වන්නේ මහා පරිමාණයෙනි. එය හේතු කොට ගෙන මිනිසාගේ සිත හා මනස අවබෝධ කර ගැනීමේ සම්භාව්‍ය අරමුණට, එම උත්තරීතර වටිනාකම නොලැබ යයි. ඒ වෙනුවට අවිද්‍යාව මිනිසාගේ සිත තුළ රජයයි.

මෙම කනගාටුදායක තත්ත්වයන්ට පිළිතුර කුමක්ද? පසුගිය අවුරුදු 35ක් තුළ මා ලද අත්දැකීම් නිරීක්ෂණයන් හා මගේ අන්තර් දෘෂ්ටීන් ද, මගේ සියලු කර්තව්‍යයන් තුළින් ද මා අවබෝධ කරගත් විසඳුම කුමක්ද? මහත්මා ගාන්ධිතුමාගේ සත්‍යයේ වටිනාකම් තුළ ද අවිහිංසාවාදය සත්‍යග්‍රහය සහ ස්ව ප්‍රතික්ෂේපය. යම් නිර්මාණාත්මක ශක්තිමත් ක්‍රියා කලාපයක් බවට හරවා ගැනීමත් තුළ අවශ්‍ය විසඳුම ඇති බවය. එසේ වී නමුත්, මෙම සදාචාරාත්මක ගුණධර්ම විශාල පරිමාණයෙන් මධ්‍යගත ලෙස සංවිධානය කරගත හැකි වේ යැයි මා විශ්වාස කරන්නේ නැත. නමුත් සමහර විට පුද්ගලයාගෙන් ආරම්භ වී, පවුල තුළින් ප්‍රජාව වෙත ද ඉන්පසු විශ්ව ප්‍රජාව දක්වා ද සම්ප්‍රේෂණය වන පරිදි එම ගුණධර්ම මිනිසා තුළ වගා වීමට කටයුතු සැලසුම් කර, සංවිධානය කළ හැක. මෙම කුඩා ප්‍රජාවන් විශ්වය පුරාම එකිනෙක එකතු වන පරිදි අන්තර් සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය වන තාක්ෂණය අප අතට පත්ව ඇත පුද්ගලයාගේ සහ සාමූහික ප්‍රජාවගේ ගැලවීම පිණිස ඉහත සඳහන් පරිදි සමස්ත ජනතාවගේ උදාව ධෛර්යවත් කළ යුතුය. හැකි සෑම අන්දමකින්ම ආධාර කර නිසි අයුරින් ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා සාධාරණ වූ යම් පැවැරීමක් මගින් දැනට සුළු පිරිසකගේ අතට පත්ව ඇති දේශපාලන හා ආර්ථික බලපුළුවන්

කාරකම් ඉතා අසරණ තත්ත්වයට පැමිණ සිටින ගැමි ප්‍රජාවට අත්පත් කර දිය යුතුය ඔව්හු බල රහිත වීමෙන් හා දරිද්‍රතාවයෙන් පීඩා විඳින්නෝය.

ජනතාව සතු වූ ග්‍රාම ස්ව රාජ්‍යයන් සහිත පොදු සම්මත රජයක් ලෙස පශ්චාත් ස්වෛරී ඉන්දියාවක් බිහි කිරීමේ මහත්මා ගාන්ධිතුමාගේ සිහිනය දැන් මුළු ආසියාවටම ප්‍රචලිත කිරීමට හැකිව තිබේ. එම නිසා අප හැම දෙනාගේම උනන්දුවෙන් එම සිහිනය සැබෑ කර ගැනීමට මුළු ආසියාවම ග්‍රාමීය ජන රජයන්ගෙන් සමන්විත පොදු සම්මත රාජ්‍යයක් බවට පත් කර ගැනීමට ක්‍රියා කළ යුතුය. දිළිඳු බවත්, සමෘද්ධිමත් භාවයෙනුත් බැහැර වූ ඉන් අතරමැදි මධ්‍යස්ථ වූ සමාජයක් ගොඩනැංවීමේ කර්තව්‍යය උදෙසා කෝටි සංඛ්‍යාත ජනගහනයක් වෙසෙන දකුණු ආසියානු වාසීන් වන අප විසින් එම අභියෝගයට සාර්ථකව මුහුණ දී ක්‍රියා කළ හැකි නම්, එහි ප්‍රතිඵලයක් ලෙස එවැනි දර්ශනයකින් පෝෂණය වන මිනිස් වර්ගයා, එම උත්කෘෂ්ට පරමාර්ථයන් කෙරෙහි තවත් ධෛර්යවත් සහ ප්‍රබෝධවත් වනු ඇත.

මහත්මා ගාන්ධිතුමාගේ චරිතයත්, එතුමාගේ පරාර්ථකාමී මානව හිතෛෂී සංකල්පයත් සමඟ එවැනිම ජන හිතකාමී සානුකම්පික හදවත හා නිර්මල ගතිපැවතුම් ඇති ශ්‍රී ජම්නලාල් බජාජ්තුමා ද අපි අද අනුස්මරණය කරමු. එම නිසා මේ මොහොතේ ඒ උත්තම චරිත වෙනුවෙන් පිරිනමනු ලබන මෙම සම්මානය මිනිසාත්, සමස්ත මානව සමාජයත් එවැනි යහපත් පරිවර්තනයක් කරා ගෙන ඒමට ධෛර්යයක් ශක්තියක් වනු නොඅනුමානය.

සාමයට බාධා පමුණුවමින්, මනුෂ්‍ය වර්ගයා භේද වීමට තුඩු දෙන්නා වූ පාපකාරී සාධක දෙස ආපසු හැරී බලමු. අපගේ සිහි බුද්ධිය අවදි කර ගනිමින්, ඉදිරි ගෝලීය එක්සත් භාවය සඳහා කටයුතු කරමු. බිය හා කෑදරකම නිසා පාපතර ක්‍රියාවන් පසුපස හඹා යන මිනිසා, ඉන් මුදවා ගැනීමට හැකි වන පරිද්දෙන් සමාජීය

දේශපාලනික හා ආර්ථික සංවිධාන ආයතන ගොඩනගමු. ත්‍යාගවන්ත භාවය හා කරුණාව දයාවෙන් එම පාපී සිතිවිලි ඉවත් වනු ඇත. ගාන්ධිතුමාගේ ලෝක සේවා සංකල්පයන් අපි නැවතත් උනන්දුවෙන් ස්මරණය කරමු. ආදර්ශයට ගනිමු. බලයට ගිජු වී පක්ෂ දේශපාලනයේ නිරත වීමෙන් බැහැරව, ඉන් ඉවත් වී ඒ වෙනුවට ජනතාවගේ සාමූහික සහභාගිත්වයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා කලාපයන් වර්ධනය කර ගනිමු.

භාරත දේශයේත්, ලංකාවේත්, දූ පුතුන් ලෙස අපේ පෘථිවි තලයේ සාමය හා ධර්මිෂ්ටකම ස්ථාපිත කිරීමට තිරසාර ප්‍රබෝධයක්, උනන්දුවක් ඇති කිරීමේ දූත මෙහෙවර වෙනුවෙන් එකිනෙකා සමීප වී අධිෂ්ඨානශීලීව ක්‍රියා කරමු.

ස්තුතියි!

271

ශක්තිය සහ ධෛර්යයට
ඕගස්ට් ෆෝරල් සම්මානය

අන්තර් ජාතික යහපත් අමද්‍යපයින්ගේ ලෝක සමුළුව (IOGT) ස්විට්සර්ලන්තයේ සූරිච් නුවර පැවැත්වූ අවස්ථාවකදී, නව විශේෂ සම්මානයක් සඳහා සුදුස්සෙකු තෝරා ප්‍රදානය කළ යුතුය යන යෝජනාවක් අලුතින් සභාවට හඳුන්වා දෙන ලදී. එවැනි සම්මාන ප්‍රදානයක් මගින් මෙම රාත්‍රී භෝජන සංග්‍රහ වැඩ සටහනට යම් සම්ප්‍රදායානුකූල නැවුම් මුහුණුවරක් මුසු කිරීම එහි විධායක කමිටුවේ අදහස විය. එනමුත් ඕගස්ට් ෆෝරල් සම්මානය පිළිබඳ මුල් කතාබහ ඇති වූයේ 1985 නොවැම්බර් මාසයේදී කොන්ග්‍රසයේ විධායක කමිටුව මගින් ගන්නා ලද තීරණය අනුවය ප්‍රථම ත්‍යාගය පිරිනැමීම 1986 ජූලි 27 වැනි දින සූරිච් නුවරදී සිදු විය. එහිදී සම්මානය දිනා ගනු ලැබුවේ යුගොස්ලාවියානු ජාතිකයෙක් වන මහාචාර්ය වෛද්‍ය ලැඩිමීර් හියුඩොලින් මහතා විසිනි.

වෛද්‍ය ඕගස්ට් ෆෝරල් දුර්ලභ ගණයේ මානව හිතවාදියෙක් විය. මානසික රෝග විශේෂඥයෙකු ලෙස තම වෘත්තියට අමතරවත් ඔහු තම උත්සාහයෙන් අත්පත් කර ගත් ශක්තීන් බොහෝය. මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මිනිස් ජීවිතයට සිදු විය හැකි විනාශයත්, ඒ හා සම්බන්ධ විවිධාකාර ගැටළු බොහොමයක් ද පුළුල් පර්යේෂණවල යෙදී ඕගස්ට් දොස්තර මහතා මිනිස් දිවියේ යහපතට හේතු වන දැනුම් සම්භාරයක් එක්රැස් කර ගත්තේය. තම රට තුළ පමණක් නොව, ජාත්‍යන්තර වශයෙන් ද එම දැන උගත්කම නිර්ලෝභී ලෙස ප්‍රචලිත කළේය. සීමාන්විත මද්‍යසාර පාලන ප්‍රතිපත්තියක වටිනාකමත් එහි ප්‍රායෝගික ඵලදායීතාවයත් එතුමා ලොවට කියා දුන්නේය.

වෛද්‍ය ඕගස්ට් මහතාගේ විශිෂ්ට සේවාවට ගරු කිරීමක් හා ස්මරණය කිරීමක් වශයෙන් සෑම වර්ෂ හතරකට වරක් IOGT

ලෝක කොන්ග්‍රසය හා ඒකාබද්ධ 'ඕගස්ට් ෆෝරල් සම්මානය' එම විෂයෙහි සුදුස්සෙකු තෝරා ප්‍රදානය කරනු ලැබේ. පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළ කෙනෙකුට ත්‍යාගය සඳහා අයදුම් කළ හැක. එනම්: මින් එක් ක්‍රමයක් හෝ මගින් මද්‍යසාර භාවිතය අවම කිරීමෙහි ලා සැලකිය යුතු ප්‍රයත්නයන්හි යෙදී තිබිය යුතුය.

(1) මද්‍යසාර භාවිතය නිසා පුද්ගලයාට හා සමස්ත සමාජය වෙතම ඇති කරන්නා වූ අනිටු ප්‍රතිඵල පිළිබඳව යම් නවීන දැනුමක්.

(2) නිර්මාණශීලී පර්යේෂණයන් මගින් එම දැනුම සමාජය තුළ ව්‍යාප්ත කිරීම.

(3) මද්‍යසාර භාවිතය බෙදා හැරීම වෙළඳාම හා මද්‍යසාර නිෂ්පාදනයන්ට සහාය වීම යන සාධක පාලනය කිරීම පිණිස ඒ පිළිබඳව පනවා තිබෙන ව්‍යවස්ථා සංවර්ධනය හා වැඩ කිරීම.

(4) මත්පැන් භාවිතයෙන් ජනතාව වළක්වා ගැනීම රටක සිටින මත්පැන් භාවිතයෙන් වැළකී සිටින සංඛ්‍යාව වැඩි කිරීම. කාන්තාවන් රියැදුරන් තරුණයින් වැනි විවිධ ජන කොටස් තුළට මෙම දැනුවත් භාවය සම්ප්‍රේෂණය කිරීමට නව ක්‍රම ප්‍රයත්න භාවිතා කිරීම.

'ඕගස්ට්' සම්මානය පිළිබඳ මෙම විස්තර උපුටා ගනු ලැබූයේ උත්සවාරම්භයේදී හඳුන්වා දීමේ කතාව පැවැත්වූ IOGT සභාපති මහතාගේ ප්‍රකාශයන්ගෙනි. ඔහු ඇවරිඩ් ජේ. ජොන්සන්ය (Mr. Avrid J Johnson) ඉතිරි සියලු විස්තරත් ඒ අයුරින්ම ඔහුගේ වචනවලින්ම මෙසේය:

මේ වර්ෂයේ සම්මානය සඳහා අයදුම්කරුවන් කිහිප දෙනෙක්ම තරඟ වැදී සිටියා. සුදුසුකම් ලබා තිබූ සියලු දෙනාම තම

සාමාජික සංවිධාන හා විධායක කමිටුව මගින් ඉල්ලුම් කර ඇත. තම තමන්ගේ සේවාවන් සඳහා ඔවුනට කුමන අයුරකින් හෝ ගෞරව දැක්වීමට වෙනදා ඉඩකඩ තිබුණත්, ප්‍රදානය කිරීම සඳහා මේ අවුරුද්දේ සූදානම්ව තිබෙන්නේ එකම එකක් වූ 'ඔගස්ට් ෆෝරල් ත්‍යාගය' පමණය. එනිසා සම්මානලාභි සුදුස්සා සම්බන්ධයෙන් විධායක කොමිටිය පූර්ණ එකඟතාවයකට හා විශ්වාසනීය තීරණයකට එළඹිය යුතු විය. මේ වර්ෂයේදි 1990 දි මෙම සම්මානය ප්‍රදානය කළ යුතු වන්නේ තුන්වන ලෝකයේ මිනිස් පරපුර වෙනුවෙන් උත්කෘෂ්ට සේවාවක් ඉෂ්ට කළා වූ යම් පුද්ගලයෙකුටය. (ඇවරිඩ් මහතා එම පුද්ගලයා කව්රුදැයි සභාවට විස්තර කළේය.

අපේ මිනිහා ඉතිහාසයක්ම නිර්මාණය කළ කෙනෙක් මහත්මා ගාන්ධි ඉන්දියාවේදී කළාක් මෙන්, කුමන ක්‍රමයකින් හෝ ඔහු තමන්ගේ දිළිඳු මනුෂ්‍යයන්ගේ වගකීම තමන්ම බාර ගෙන වැඩ කළේය. ඇත්තෙන්ම තමන් සිටින තත්ත්වයත් ඔවුන් හැම දෙනාමත් එකිනෙකා වෙනුවෙන් ඉෂ්ට කළ යුතු යුතුකම් කාර්යභාරයන් ගැන අසරණ මනුෂ්‍යයාට කියා දුන්නේය. දැනුවත් කළේය. තමන්ගේ පැවැත්ම හා දියුණුව සඳහා ක්‍රියාශීලීව සහයෝගයෙන් එකට වැඩ කරන හැටි, ප්‍රතිඵල ලබන හැටි ග්‍රාමීය අසරණ ජනතාවට පුරුදු පුහුණු කළේය. තම තමන් ජීවත් වන සමාජයන් මනා ලෙස සංවිධානය කර ගනිමින්, දියුණුව කරා යාමට හැකි වන සේ ඔවුනට අධ්‍යාපනය ආත්ම ශක්තිය හා බලාපොරොත්තුව උත්පාදනය කළා.

එක්දහස් නවසිය තිස් ගණන්වලදී මහත්මා ගාන්ධි විසින් ඉන්දියාවේදී ආරම්භ කළ සර්වෝදය ව්‍යාපාරය ගැන අසා ඉගෙන ගැනීමෙන් පසු, මෙවන් උසස් සමාජ සේවයක් තම රට වෙනුවෙන් ඉෂ්ට කිරීමට ඔහු භාවිතා කළ ආම්පන්නය වූයේ 1958 වර්ෂයේදී තමා විසින්ම නිර්මාණය කර ගත් ශ්‍රී ලංකා සර්වෝදය ශ්‍රමදාන සංගමයයි. එය කුමන විදියේ ව්‍යාපාරයක් ද යන්න මා ඔබට කෙටියෙන් පැහැදිලි කරන්නම්. ප්‍රථමයෙන්ම ජේම්ස් එච් ක්‍රේග්

මහතාගේ නම ප්‍රකාශ කිරීමට අවසර පතමි. සර්වෝදය ව්‍යාපාරය යනු මුළු පොලෝ තලයේම මානව සංහතියේ ශුභදායී පරිවර්තනයක් ඇති කිරීමට තරම් ගම්‍ය වූ ශක්තීකරණය වෙමින් ක්‍රියාත්මක වන්නා වූ තුන්වන ලෝකයේ ප්‍රජාව ගොඩනැගීමේ සංවර්ධන ක්‍රියාවලියකි. මැකී ජොආනා විසින් එය විස්තර කරන අන්දමට, කිසිම භේදයකින් තොරව සැම දෙනාටම එක සේ ජීවිතයේ ආලෝකය හෙවත්, විමුක්තිය කරා එළඹිය හැකි මානව සංවිධානයකි. සර්වෝදය විසින් අනුගමනය කරන්නා වූ බෞද්ධ දර්ශනයේ ''සියලු සත්ත්වයෝ සුවපත් වේවා'' යන්න බෞද්ධ ප්‍රාර්ථනයයි. බහුතර ජනයාගේ සුභසාධනය වෙනුවෙන් ප්‍රකාශ කර ඇති ශෛලියන් ප්‍රතිපත්තියත්, තවදුරටත් ක්‍රේග් මහත්මයාගේ සංකල්පයත් සමඟ සසඳන විට බොදු ප්‍රාර්ථනයේ දක්නට ඇත්තේ කැපී පෙනෙන ලක්ෂණයකි.

සර්වෝදය ව්‍යාපාරය පුද්ගලයා සහ සමස්ත ප්‍රජාව යන දෙකොට්ඨාශයම අවදි කිරීම සහ ශක්තීකරණය කිරීම උදෙසා ක්‍රියාත්මක වන්නා වූ ගාන්ධි සංකල්ප හා බෞද්ධ ඉගැන්වීම් මත පදනම් වු සමාජ සේවා සංවිධානයකි. සමාජීය හා ආර්ථික ලෙස නොදියුණු ගම්මානවල ජනතාව සංවර්ධනය කෙරෙහි පෙළඹවීමත්, එම තත්ත්වයට ගෙන ඒමේත් අධිෂ්ඨානය මත සර්වෝදය ව්‍යාපාරය ආරම්භ කර ඇත. වර්තමානයේදී එකම විශ්ව ප්‍රජාවකගේ සහයෝගී සංවර්ධන ක්ෂේත්‍රයක් කරා එම ව්‍යාපාරය ගමන් කරමින් සිටී ඉන්දියාවේ 'ගාන්ධි සර්වෝදය ව්‍යාපාරයෙන්' වෙන් කර හඳුනා ගැනීම සඳහා එහි නාමය ''සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය'' ලෙස නම් කර ඇත.

ඉහතින් මා කී පරිදි එය 1958 දී ආරම්භ කර ඇත්තේ ලංකාවේ උසස් බෞද්ධ විද්‍යාලයක සේවය කරමින් සිටි විද්‍යා ගුරුවරයෙක් මගිනි. තම ශිෂ්‍යයන් උනන්දු කර කැමති කරවා ගත් හෙතෙම, සති දෙකක නිවාඩු කඳවුරක් පැවැත්වීම සඳහා ඈත පිටිසර ඉතාමත් අසරණ දිළින්දන් වෙසෙන ගම්මානයක් බලා

ගියේය. සේවය වෙනුවෙන් ඔවුන් වැඩ කරන ලදී. ඔවුන් ප්‍රථමයෙන්ම කළේ ගැමි ප්‍රජාවට ජීවිතයේ තෘප්තිමත් බව ලැබීමට අවශ්‍ය ඕනෑ එපාකම් මොනවාද යන්න අවබෝධ කර ගැනීමටත්, එය ලබා ගැනීමට ඉවහල් වන තමන් සතු තමන්ගේම සම්පත් වන ශක්තිය හා බුද්ධිය හඳුනා ගැනීමටත් උපකාර කිරීමයි. අවසානයේදි එම අසරණ ප්‍රජාවට එම ධර්මතාවයන් තේරුම් ගෙන ඒ අනුව ක්‍රියාකාරී වීමට පොළඹවන ලදී. එම ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස ඔවුනොවුන් එක්සත් වී, සුහදව පොදු යහපත සඳහා වැඩ කිරීමටත් තමන්ගේ ඉපැරණි සම්ප්‍රදායානුකූල සංස්කෘතික වටිනාකම් හඳුනා ගෙන ඒවා වැඩි දියුණු කර ගනිමින් ජීවිතයේ ගුණාත්මක භාවය වර්ධනය කර ගැන්මටත්, තම ශක්තිය-ඥානයම ප්‍රයෝජනයට ගන්නා අයුරු ඔවුහු ඉගෙන ගත්හ.

මෙවැනි වටිනා අත්දැකීමක් ගම්වාසීන්ට පමණක් නොව, ශිෂ්‍යයන්ටත් වටිනා පාඩමක් ශක්තියක් වූයෙන්, ඉන්පසු සිය ගණනින් පාසල් සිසුන් එවැනි ගම්මානවලට ගොස් මහන්සි වී වැඩ කළහ. මෙවැනි ජාතික ව්‍යාපාරයක් ගොඩනැගුණේ මෙවැනි පරාර්ථකාමි සමාජ සේවයන් වඩ වඩාත් පුළුල් වීමෙනි. අද දවසේ සර්වෝදය ව්‍යාපාරය නාගරික ප්‍රදේශ ඇතුළු ගම්මාන පන්දහසකටත් වඩා, තම සේවාවන්ගෙන් පෝෂණය කරමින් සිටී. දේශීය කර්මාන්ත කෘෂිකර්මාන්ත සෞඛ්‍යය අධ්‍යාපනය ආදී විවිධ ක්ෂේත්‍ර තුළින් නොයෙක් ප්‍රජා සංවර්ධන සේවාවන්හි නියැලී සිටින සර්වෝදය සේවකයන් අද ලක්ෂ දෙකකටත් වැඩි පිරිවරකි.

මනාව ස්ථාපිත වූ ශක්තිමත් සංවිධාන ව්‍යුහයක් සහිත විශාල ආයතනයක් ලෙස 'සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය' ඔබ හඳුනා ගත්තාක් මෙන්ම, එය තවත් අතකින් 'IOGT ADIC' සේවය වෙනුවෙන් අද්විතීය සේවයක් ප්‍රදානය කරමින් වෙනත් එවැනි සංවිධානයක් හා සංසන්දනය කිරීමට නොහැකි තරමේ උච්චම ස්ථානයට පැමිණ සිටි ලංකාවේ මුළු සතර දිග් භාගයේම ව්‍යාප්තව ඇති සර්වෝදය ව්‍යාපාරය විසින් මත්පැන් භාවිතයෙන් ප්‍රජාව වළක්වා ගැනීමේ වැඩ සටහන් සංවිධානයේ ප්‍රතිපත්ති අනුකූලවම සාර්ථකව දියත් කළෙමු.

ශ්‍රී ලංකා රජය මත්පැන් භාවිතය තව තවත් පැතිරී යන විදියේ නොයෙක් ක්‍රියා මාර්ගයන් හි නිරත වුවද සර්වෝදය එයට බියසුළු වූයේ නැත. නොබියවම එයට විරුද්ධව නැඟී සිටිමින් මත්පැනින් සමාජය වළක්වා ගැනීමේ ක්‍රියාපටිපාටීන් සඳහා ජනතාව තව තවත් උනන්දු කරවමින්, ඒ වෙනුවෙන්ම වැඩ කරන ලදී. සර්වෝදය මත්පැනින් වැළකී සිටීම අගය කරන සංවිධානයකි.

එහි නිර්මාතෘවරයා වශයෙන් ද, එය පිටුපසින් සිට සියල්ලම ක්‍රියා කරවන්නා නියමුවා කදිම ආදර්ශවත් මිනිසෙකි. අද මේ උත්සව රාත්‍රියේදි දෙවැනි ජාත්‍යන්තර 'ඕගස්ට් ෆෝරල් සම්මානය' අප විසින් ප්‍රදානය කිරීමට යන ගෞරවනීය අමුත්තාය. ඔහු ශ්‍රී ලංකාවේ ආචාර්ය ඒ.ටී. ආරියරත්නයි.

අපගේ ගෞරවනීය සාමාජිකයෙක් වූ මහාචාර්ය වෛද්‍ය ඕගස්ට් ෆෝරල් මැතිතුමාගේ නාමයෙන්, එතුමාට අපගේ කෘතඥතාවය හා ගෞරවය පිරිනැමීමටත් ඒ අතරම මිනිස් වර්ගයාගේ යහපත පිණිස අමද්‍යප ව්‍යාපාරය වෙනුවෙන් සුවිශේෂ වූ ශක්තිමත් ප්‍රයත්නයන්හි යෙදුණු අනෙකුත් සියලු දෙනාටමත් අපේ ගෞරවය පුද කිරීමට මෙම සම්මාන ප්‍රදානය ආරම්භ කරන ලදී. ආරියරත්න මැතිඳුනි මෙම සම්මානය ඔබ වෙත පිරිනැමීමට අවස්ථාව ලැබීම මහත් ගෞරවයකි අපරිමිත සන්තෝෂයකි.

'අන්තර් ජාතික යහපත් අමද්‍යපයින්ගේ සංවිධානය' සහ 'සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය' අතර පවතින සබඳතාවන් සඳහා ඔබෙන් ලැබී ඇති දායකත්වය හා 'FORUT' හා 'IOGT ADIC' ආයතන වෙනුවෙන් ඔබ පිරිනමා තිබෙන මහඟු සහයෝගයන් හා අවවාදයන් සඳහා අපි ඔබට කෘතඥවන්නෙමු.

අපගේ ප්‍රශංසාත්මක චින්තනයෙහි සලකුණක් ලෙස මෙම සම්මානය ඔබ විසින් පිළිගනු ඇතැයි අප බලාපොරොත්තු වන අතර, ඔබේ වැඩිහිටි දිවි ගමනේ වැඩි කාලයක් මිඩංගු කරමින් මෙහෙයවනු ලැබූ සුවිශේෂ කාර්යයන් සඳහාත්, ඔබටමත් ඉන්

යම්කිසි ධෛර්යයක් ශක්තියක් උත්පාදනය වේ යයි ද අපි විශ්වාස කරමු. ඔබටත්, ඔබගේ ව්‍යාපාරයටත්, අපි ශුභ ප්‍රාර්ථනය කරන අතරම අප ව්‍යාපාරයන් අතර සුහද මිත්‍රත්වය ඒ ලෙසම දිගටම පවතීවා යන්න අපේ පැතුමයි!

* * *

ඕගස්ට් ෆෝරල් සම්මානය ලබා ගැනීමට ස්විට්සර්ලන්තයට යාමට මා ලංකාවෙන් පිටත් වූයේ 1990 ජූනි 20 වෙනි දාය. ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වනු ලැබුවේ ජූලි මස 8 වෙනි දාය. මාස දෙකක දිග සංචාරයකින් අවසන් වූ එම ගමනේදී මා මුලින්ම ගියේ ජපානයටය. ජූලි 5 වනදා වන තුරු ජපානයේ ගත කර, ඉන්පසු ඩෙන්මාර්ක්, ස්වීඩන් හා ස්විස්ටර්ලන්තයට ද අමෙරිකාවට ද ගොස්, අවසාන වශයෙන් ඕලන්දය හා පිලිපීනය හරහා ගමන් කර ආපසු ලංකාවට ආවේ සැප්තැම්බර් 9 වනදාය. ස්විට්සර්ලන්තයේ කෝපන්හේගන් නුවර උත්කර්ෂවත් අන්දමින් පැවැත්වූ සම්මාන උත්සවයට සහභාගි වී සම්මානය ලබා ගතිමි.

ජූනි 20 වෙනි දා ටෝකියෝ ජාත්‍යන්තර ගුවන් තොටුපළින් බැස ගත් මම, 'සන්රූට්' හෝටලයේ නැවතුණෙමි. ඔසාමා මූරෝ සහ ජින් හිරානෝ මහත්වරුන්ද ඒ වන විට වැඩිදුර අධ්‍යාපනය සඳහා ජපානයට ගොස් සිට පසුව සර්වෝදයේ උප සභාපතිව සිටි හර්ෂ ලියනගේ මල්ලී ද මා හමුවීමට එහි පැමිණ සිටියහ. ජපානයේ නගෝයා සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ 'සාක්ෂරතාව' පිළිබඳ සමුළුවටත්, ටෝකියෝ නුවර රෝම සමාජ සමුළුවටත් සහභාගි වී, එහිදී මට නියමිතව තිබූ ප්‍රධාන දේශන පැවැත්වීමි. රෝම සම්මන්ත්‍රණයේදී 'මම සහ ළමයා' යන මැයින් මා විසින් කරනු ලැබූ දේශනයට බොහෝ ප්‍රශංසා ලැබුණු අතර කවුරුත් අගය කළාක් මෙන්ම පරිත්‍යාගයක් වශයෙන් යෙන් ලක්ෂයක් එකතු කර එවීමට

ඔව්හු පොරොන්දු වූහ. මුදල් ලැබුණු පසු ඒවා ළමා සංවර්ධන මධ්‍යස්ථානය ගොඩනැගීමට යෙදවීමි. ඉන්පසු අටාමිවලට ගොස් ජූලි 5 වන දින රාත්‍රී 9.30 ට ටෝකියෝ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට, ඇන්ටිගෝනිෂ් හරහා කෝපන්හේගන් බලා යන ගුවන් යානයට නැගුනෙමි. අතරමගදී දින රේඛාව පසු කර කෝපන්හේගන් නුවරට ළඟා වීමට පෙර මා දුටුවේ දේදුන්නකි. සියල්ල හොඳින් ඉටු වන බවට ලකුණකි. එය පසු දා ඕගස්ට් ෆෝරල් උත්සවයයි. පෙර දින දෙකම ස්කැන්ඩික් හෝටලයේ ගත කර, උත්සවයේ රාත්‍රී භෝජන සංග්‍රහයට සහභාගි වීමි. වෛද්‍ය දියනාත් සමරසිංහ හා මහාචාර්ය නන්දදාස කෝදාගොඩ යන මහත්වරු මා සමඟ එහි ගොස් සහභාගි වූ අයයි.

මා සම්මාන උළෙලට සහභාගි වූයේ සුපුරුදු පරිදි ජාතික ඇඳුමින් සැරසීගෙනය.වේදිකාවට ගොස් කොන්ග්‍රසයේ ජාත්‍යන්තර සභාපති අර්වින්ද් ජොන්සන් මහතා අතින් එම ත්‍යාගය ලබා ගතිමි. මගේ කතාව එවේලේම මිනිත්තු පහකට සීමා කළෙමි පසු දා 9 වෙනිදා ත්‍යාගලාභියාට නියමිතව තිබූ කතාව පැවැත්වීමි. මා විසින් කලින් සූදානම කර ගෙන තිබූ පිටපත ඉවත දමා, ඒ වෙලාවේ හිතට ආ අදහස් අනුව ''අපේ පොදු අනාගතය'' යන මැයෙන් කථාවක් කළෙමි. 10 වැනිදා සිට 13 වැනිදා තෙක් IOGT සංවිධානයේ වැඩ කටයුතු පිළිබඳවත් තවත් අනාගත වැඩ පිළිවෙල පිළිබඳව සාකච්ඡාවලට සහභාගිවීමි.

අවසාන දිනයේ කමල් වලේබොඩ මල්ලී විසින් මෙහෙයවන ලද 'අපේ ආසියාව' වැඩ සටහනට ෆස්රුල් හක් ද සමඟ සහභාගිවීමි.

ස්කැන්ඩිනේවියාවේ සිටින මගේ ඉතා සමීප මිතුරෙකි. ඉන්ගේ ග්‍රොස්ලන්ඩ් 1984 වසරේදී ඔහු පෝරුට් ආයතනයේ නියෝජිත ලෙස ලංකාවේ සේවය කරද්දී සර්වෝදයට එක් විය. ඉන්ග්‍රේ මේ අවස්ථාවේදී එහි උත්සවයට පැමිණ සිටි හෙයින්, ඔහුගේ රියෙන් කමල් මරික්කාර් සහ මම ග්ලොස්ටප් නම්

ස්ථානයෙන් පිටත් වුණෙමු. දෙමාපියන්ගේ ආභාෂය අනුව ඉගෙනගෙන, අමද්‍යප ව්‍යාපාරයට කැප වූ ඉන්ගේ 41 හැවිරිදි ඉතා දක්ෂ පුද්ගලයෙකි. ආධ්‍යාත්මික පදනමක් මත සියලු වැඩ කටයුතු කරන ඔහු, ඉතා නිහතමානී දාර්ශනික පුද්ගලයෙකු විය. ඔහු සමඟ හෙල්සිංගර් නම් ස්ථානයට පැමිණි අප පෝළිමේ සිට වාහනය බෝට්ටුවට ඇතුල් කර මිනිත්තු 45 කින් ඩෙන්මාර්ක් සීමාව පසු කර ස්වීඩනයට ප්‍රවේශ වීමු. දවසක් එහි ගත කර නැවත ඉන්ගේ ගේ බෙන්ස් රියෙන්ම නෝර්වේ බලා පිටත් වුනෙමු.



ඉන්ගේ ග්‍රොස්ලන්ඩ් මහතා සමඟ

දුර්ගුණ නොව යහගුණ මතු කර ගැනීම
60 පිරුණු දා

මගේ හැට වන වියේදී මා තුළ බල පැවැත්වූ අදහස් පිළිබඳ යම් හැඟීමක් දීම සඳහා 1991 නොවැම්බර් 05 වැනිදා මා කළ දේශනයක්:

ඒ.ටී. ආරියරත්න නමින් හැඳින්වෙන පටිච්ච සමුප්පන්නව සසර ගමන් කරන මේ පංච උපාදානක්ඛන්ධයට මේ උත්පත්තියේදී අදට හැට වසරක් පිරෙන බව සිහි කරවීමට මේ පවුල් හමුව සංවිධාන කළ ඔබ හැමදෙනාටත්, මහා සංඝරත්නයටත්, සෙසු ආගමික නායකයනටත්, ඒ සඳහා විශේෂ අමුත්තා හැටියට සහභාගි වන්නට තරම් කරුණාවන්ත වූ පාර්ලිමේන්තු මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, තානාපතිවරුන් ඇතුළු සියලුම ආරාධිත හිතවතුන්ටත්, සෙසු හැමදෙනාටත් මුලින්ම මගේ හෘදයාංගම කෘතඥතාවය පළ කරමි.

දිනේෂ් ගුණවර්ධන මහතා පිළිගැනීම



දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පිළිගෙන ශාලාවට කැඳවා ගෙන ඒම

මගේ පියතුමා වසර අනූවකුත්, මෑණියන් වසර අනූ දෙකකුත් ආයුෂ ලබා මෙලොව ජීවත් වූ නිසා, ඒ දෙදෙනාගේ ආයු කාලයෙහි සාමාන්‍යය ගතහොත් මට ද අනූඑක් වසරක් හෙවත් තවත් තිස් එක් වසරක් ජීවත් වීමට වාසනාව තිබිය යුතුය. එයින් හැඟෙන්නේ දශකයකට එක් වරක් බැගින් තවත් තුන්වරක් ඔබගේ ආශිර්වාදය ලැබීමට ඉදිරියේදී මට වාසනාව තිබෙන බවයි. මේ නිසා ප්‍රති ප්‍රණාමයක් වශයෙන් මම ඔබ හැමදෙනාටම ඔබගේ ඇසුර දිගින් දිගටම මට ලැබීමට යහපත් සෞඛ්‍යය, දීර්ඝායු සහ සතුට ප්‍රාර්ථනා කරන්නෙමි.

රැස්ව සිටි පිරිස අමතමින්

ආධ්‍යාත්මික අරමුණක්

නව උපන් දිනයක් යැයි කියන්නේ මිය යන දිනට තව වසරකින් ළංවීම යැයි බොහෝ අය පවසති. මේ ජීවිතය දෙස බැලිය හැකි එක් ක්‍රමයකි. මා බලන්නේ එසේ නොවේ. ජීවිතයට වසරක් එකතු වූවා යැයි කියන්නේ සංසාරික විමුක්තිය ලබා ගැනීමට තව වසරකින් ළං වූ බවයි. වියපත් වීම දෙස මේ අන්දමට බැලීමට අපට හැකි වන්නේ මිනිස් දිවිය පිළිබඳ සංසාරික විමුක්ති ඇසකින් බැලීමට අප පුරුදු වුවහොත් පමණකි. බෞද්ධ සංස්කෘතියක ආභාෂය ලැබූ නිසාත්, බෞද්ධ ධර්මය ගැන ඉගෙනීමට භික්ෂූන් වහන්සේගෙන්, දෙමාපියන්ගෙන්, ගුරුවරුන්ගෙන් හා වැඩිහිටියන්ගෙන් අවස්ථාව ලද නිසාත්, ජීවිතයේ සහ ජීවත් වීමේ අරමුණ ආධ්‍යාත්මික අරමුණක් කර ගැනීමට ලැබීම ඉමහත් වාසනාවක් කොට මම සලකමි.

අසරණයන්ට පිහිට වීම, නැති බැරිකම නැති කිරීමට උදව් වීම, සෑම මිනිසකුගේම නිදහස හා ආත්ම ගරුත්වය ආරක්ෂා කර

දීමට වෙහෙසීම, සමාජයේ සාමය සහ සාධාරණත්වය ගොඩනැංවීම ආදී වූ සර්වෝදයෙන් ඉදිරිපත් වන දහසක් අරමුණු මේ ආධ්‍යාත්මික අරමුණට දෙවැනි වූ අරමුණු වේ. ආධ්‍යාත්මික අරමුණක් නැති වුවහොත්, කරන සෑම සේවයක්ම නිස්සරණ බවින් වෙන් වේ. බලය, ධනය, නිලය, කීර්තිය, ප්‍රසංශාව ආදී වූ තණ්හාවන්ට යටත් වේ. එහි අවසාන ප්‍රතිඵලය වශයෙන් තාවකාලිකව රාජරාජමහාමාත්‍ය ධූර ලැබූවත්, මනුෂ්‍ය ජීවිතයක් හැටියට අවසන් මොහොතේ පසුතැවිලි වන්නට සිදුවේ.

මගේ වැඩිහිටියන්, නංගිලා, මල්ලිලා සහ හිතවතුන් සමගින් සර්වෝදය සේවාවන්හි නිරතවීම නිසා ජාතික වශයෙන් මෙන්ම, ජාත්‍යන්තර වශයෙන් ද බොහෝ පැසසුම්, ගුණ ගායනා ලබා ඇත්තෙමි. එසේම කුමන හේතූන් නිසා හෝ එම සේවාවන් අගය නොකරන අයගෙන් ඒ ප්‍රමාණයටම සරිලන නින්දා, ගැරහුම්ල අපහාස ලබා ඇත්තෙමි. දශක කිහිපයක් මහන්සි වී ගොඩනැගූ දුගී දුප්පත් ජනතාවට ප්‍රයෝජනවත් වැඩ සටහන් අඩාල කරන විදියේ බාධකවලට ද මුහුණ දුනිමි. විශේෂයෙන් පසුගිය දෙවසර ඇතුළත ජීවිතයේ කිසි දිනෙක නොලැබූ විදියේ අතිශයින්ම ද්වේශ සහගත වූ අපහාසවලට ලක් වූයෙමි. අටලෝ දහම අනුව ලැබෙන ලාභ-අලාභ, නින්දා-ප්‍රසංශා, යස-අයස, දුක-සැප උපේක්ඛා සහගතව පිළිගැනීමට මා හුරු වූයේ මේ ආධ්‍යාත්මික අරමුණ මාගේ මුඛ්‍ය අරමුණ වශයෙන් තබා ගත් නිසාය.

අපක්ෂපාතීවීම නිසා

ආධ්‍යාත්මික අරමුණක් පෙරමුණේ තබා ගෙන කටයුතු කරන තැනැත්තාට, යම් සනාතනික ධර්මවලට අනුව සියලුම කටයුතු කිරීමට සිදුවේ. සර්වෝදය සනාතනික ධර්ම අනුව ක්‍රියාත්මක වන පුද්ගලයාත්, සමාජයත් වෙනස් කිරීමට ප්‍රයත්න දරන ව්‍යාපාරයකි. අපට සාරධර්ම කඩමින් යම් කුලයකට, පන්තියකට, ගෝත්‍රයකට, ජාතියකට හෝ දේශපාලන පක්ෂයකට අවනත වී වැඩ කළ නොහැක්කේ ඒ නිසාය. මේ නිසාම කලින් කල බලයේ සිටින විවිධ පාලකයන්ගෙන් වරින් වර බරපතල හානි ඔවුන් විසින් පනවන

ලද බාධක තුළින් අපට ඇති විය. සමහර විට සිඟිති දරුවන් හැට ලක්ෂයක් ඉලක්ක කොට, අවුරුදු 20 ක පමණ කාලයක් ධනයත්, ශ්‍රමයත් යොදා අප ගොඩනැංවූ සිඟිති වැඩපිළිවෙලක් එක් පෑන් පහරකින් අඩපණ කිරීමට තරම් මෙම ආත්මාර්ථකාමී පාලකයෝ සමත් වෙති. අන්ත දුගී බවේ ගැලී සිටින වෙනත් කිසිදු හව්හරණක් නැති පවුල් දෙලක්ෂයක් ඉලක්ක කොට, අප දස වසරක් මහන්සි වී ගොඩනැගූ සුළු ආදායම් ඉපදවීමේ වැඩ සටහනක් අඩාල කිරීමට මොවුන්ට ගත වන්නේ නිල ලිපියක් ලියවා අත්සන් කිරීමට ගත වන මිනිත්තු කිහිපයක් පමණකි. පෞද්ගලික ධන කුවේරයන් අතලොස්සකගේ ග්‍රහණය නිසා, අඩු මිලකට පොතපතක් ගැනීමට පහසුකමක් නැති දුප්පත් දරුවනට අඩු මිලට දැනීම ලබා ගැනීම සඳහා පොතපත සැපයීමට විසි වසරක් මහන්සි වී ගොඩනැගූ මුද්‍රණාලයක් අඩපණ කොට විනාශ කිරීමට මොවුන්ට ගත වන්නේ දුරකතන පණිවුඩයකට ගත වන මිනිත්තු කිහිපය පමණකි.

ආධ්‍යාත්මික අරමුණකින් තොරව, පටු ඉලක්ක සඳහා ජීවිතය යොමු කළ බලවතුන්ගෙන් මෙවැනි දරුණු ප්‍රහාර ලැබෙන විට, ආධ්‍යාත්මික අරමුණකින් තොර ඕනෑම කෙනෙක් පරාර්ථ සේවයෙන් ඈත් වීමට තරම් අධෛර්යවත් වේ. එහෙත් මේ කිසිවකගෙන් මාත්, මගේ සහෝදර සේවක සේවිකාවනුත් අධෛර්යට පත් නොවූයේ මෙවැනි බාධක අපගේ සංසාරික විමුක්තිය සඳහා වූ ඉවසීම, වීර්යය, අධිෂ්ඨානය ආදී ගුණ සතුරු බාධක නිසා වඩාත් දියුණු කර ගැනීමට අවස්ථාව සැලසෙන නිසාය.

පසුගිය මාස කිහිපය තුළදී මරණීය තර්ජන විසිඑකකට පමණ ගොදුරු වීමි. ඒ හැම අවස්ථාවකදීම මෛත්‍රියත්, බිය නැති කිරීමත්, සමාව දීමේ ගුණයත් ප්‍රගුණ කොට, ජීවිතයේ සැබෑ ඇතුළාන්තය දැක ගැනීමේ අවස්ථාවන් ලෙසට මෙවැනි සිද්ධීන් හරවා ගැනීමට සමත් වීමි. අපේ ජීවිතයේ අන් සියලුම භෞතික

අරමුණු ආධ්‍යාත්මික අරමුණක් යටතට ගැනීමට අප පුරුදු වුවහොත්, අද අප සමාජය මුහුණ දෙන ප්‍රශ්න රාශියක්ම විසඳා ගැනීමට හැකි මඟක් අපට විවෘත වේ යැයි මම කල්පනා කරමි.

සැබෑ නායකයෝ

වත්මන් සමාජයේ බොහෝ බලවතුන් දේශපාලනය උපයෝගී කර ගන්නේ කෙළින්ම හෝ අනියම්ව ධන කුවේරයන් වීමටය. නිදහසට පෙර යුගයේ සිටි වීරෝදාර නායකයෝ දේශපාලනය කළෝ, තමා සතු සියලුම ඉඩකඩම්, ධනය සහ වරප්‍රසාද අහිමි කර ගනිමිනි. අධිරාජ්‍යවාදීන් අතින් මෙන්ම, ඔවුන්ට ගැතිව සිටි දේශීය බලවතුන් අතින් ද අපමණ ගැහැට විඳ, මේ අය අපේ ජනතාව නිදහස් කර ගැනීමට ජීවිතය කැප කළහ. එවැනි ශ්‍රේෂ්ඨතම නායකයකු වූ පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ පුත්‍ර රත්නයක් වන දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, මෙම උළෙලේ ප්‍රධාන අමුත්තා වශයෙන් කැඳවීමත් එම ඇරයුම බාරගෙන එතුමා මෙතැනට පැමිණීමත් මට ඉමහත් සතුටක් ගෙන දෙයි.

පාසල් යන දරුවකු ලෙස බොහෝ විට දිනේෂ් මල්ලීත්, ඔහුගේ සෙසු සොහොයුරන් දෙදෙනාත් සමඟ ඔවුන්ගේ දෙමාපිය හමුවට මා ගිය අවස්ථාව මට මතකයි. හාන්සිපුටුවක දිගා වී උවසුවකු මෙන් ශාන්තව තම ජනතාව පිළිබඳ සිතුවිලි දහසක් මවමින් 'බොරළුගොඩ සිංහයා' නමින් විරුදාවලිය ලත් පිලිප් ගුණවර්ධන මැතිතුමා, සිටි හැටි මට දැන් මෙන් මැවී පෙනේ. තමාගේ අතිජාත පුත්‍ර රත්නයක් එවැනිම පරිත්‍යාගයක් කරමින් එතුමා අගය කළ සාරධර්මවලින් සංයමය ලබා, අඳුරු දේශපාලන ගුවනේ පහන් තරුවක් මෙන් දිලිසෙනු දැකීම, හැට පිරෙන මට ජාතිය පිළිබඳ නව බලාපොරොත්තු ඇති කරවයි.

ධෛර්යයක්

මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ ප්‍රධානත්වයෙන්, ආචාර්ය ජෙහාන් පෙරේරා ආදී සර්වෝදය මල්ලිලාගේ සංවිධායකත්වයෙන්, ලොව පුරා සිටින මගේ මිතුරන් රැසකගෙන් ලිපි ලේඛන ලබා ගෙන සකස් කර පිරිනමන ලද මේ ග්‍රන්ථය, මම බෙහෙවින් අගය කරමි. මෙහි දැක්වෙන අදහස් තවත් තිස් වසරක් ලෝක සේවයෙහි යෙදීමට මට ධෛර්යයක් වන බව කිව යුතුය. එමෙන්ම මෙවැනි ඇගැයීම් තම සහෝදර ජනතාවට නිස්සරණාධ්‍යාශයෙන් සේවය කිරීම සඳහා ළාබාල තරුණ පෙළට ද ධෛර්යයක් වනු ඇත.



පිලිප් ගුණවර්ධන මැතිතුමා

නිදහස සීමා වීම

සර්වෝදය ශ්‍රමදාන සංසදය සඳහා ජීවිත කාලයක් කැප කිරීමේදී, මා නොසිතූ දේවල් රැසක් සිදු විය. ඉන් එකක් නම්, සංවිධාන ව්‍යුහයකට මා සිර වීමය. ව්‍යවස්ථාපිත සංවිධානයක ප්‍රධාන තිලයක් ඉසිලීම නිසා, මගේ නිදහස සීමා වී තිබේ. එම සංවිධානය තුළ සේවය කරන දස දහස් ගණන් අය රැකීම සඳහා අනවශ්‍ය බරක් මා පිට පැටවී තිබේ. ඒ බර සැහැල්ලු කිරීමට ටික දෙනෙක් මහන්සි වන අතර වැඩි දෙනෙක් මහන්සි වන බවක් නොපෙනේ. සමහර විට එසේ වන්නේ අප දෙස 'සුපිරි මිනිසුන්' හැටියට ඔවුන් බලන්නට පුරුදු වී තිබෙන නිසා යැයි හැඟේ.



තරුණ නායකත්වය

මගේ ජීවිතයේ අවසාන තුනෙන් එක් කොටස උදා වූ මේ අවස්ථාවේදී මුලින්ම අද තරුණ සහ මැදි වියේ සිටින අපේ නංගිලා මල්ලිලාට වචනයක් සඳහන් කිරීමට කැමැත්තෙමි.

සර්වෝදය සංසදයේ වර්තමාන ක්‍රියාකාරී නායක -ත්වය රැඳී ඇත්තේ ඔබ අතේය. නායකත්වය යන පටු හැඟීම ඔළුවට නො ගෙන, සංයමයෙන් යුතුව ආදර්ශවත් මග පෙන්වීමක් සර්වෝදය සංසදයට සම්බන්ධව සිටින ලක්ෂ සංඛ්‍යාත ළාබාල, වැඩිහිටි පිරිස ඔබගෙන් අපේක්ෂා කරයි. මේ සඳහා ඔබ කෙතෙක් දුරට සුදුසු වේ දැයි තමා දෙසම බලමින් නිරන්තරයෙන්ම ආවර්ජනය කළ යුතුය. යන්ත්‍ර සූත්‍ර මෙන් යොදාගත් වැඩ සටහන් ක්‍රියාවේ යෙදවීම ප්‍රමාණවත් නොවේ. කල්පනා කිරීම, පැහැදිලි අරමුණු මනසේ තබා ගැනීම, ප්‍රතිඵල සමාලෝචනය කිරීම, අඩුපාඩු සකස් කර ගැනීම, නායකත්වයක් විසින් නිතරම කළ යුත්තකි. ඒ සියල්ලම පදනම් වන්නේ තමා තුළ සිදුවන ආධ්‍යාත්මික පරිණාමය බැව් අමතක නොකළ යුතුය.

ඔබට අපි රටේත්, ලොවේත් හොඳ නමක් උරුම කර දී ඇත්තෙමු. ශිල්පීය ක්‍රම රැසක් ප්‍රගුණ කර දී ඇත්තෙමු. රටෙනුත්, ලොවෙනුත් ඉතා අමාරුවෙන් සොයා ගත් සම්පත් රාශියක්ම ඔබේ

පරිපාලනයට යටත් කර දී ඇත්තෙමු. මේ කීර්ති නාමය ආරක්ෂා කරගෙන, තවත් දියුණු කර ගැනීමත්, ක්‍රම විද්‍යාවන් තව තවත් ප්‍රගුණ කර ගැනීමත්, එම සම්පත් තවත් දියුණු කර ගැනීමත් ඔබේ වගකීමයි. මේ සෑම දෙයක්ම ඔබේ පෞද්ගලික ලාභාපේක්ෂාවන් හෝ සුරක්ෂිතතාවය දියුණු කර ගැනීමට නොව, සමාජ සම්පත් අහිනුත්, බලය අහිනුත්, අන්ත දුගී දුබල තත්ත්වයේ සිටින ජනතාවගේ උදාව සඳහා හෙවත් අන්තෝදය සඳහා කැප කළ යුතුය. මෙය කළ හැක්කේ මා මුලදී සඳහන් කළ ආධ්‍යාත්මික පරිණාමයක් සෑම මොහොතකදීම ඔබ තුළ සිදුවෙතොත් පමණකි.

ඔබ තුළ ඉමහත් වේගයකින් ගමන් කරන විඥ්ඥාණ ධාරාව හැකි තරම් දුරට 'ආනාපාන සති භාවනාව' තුළින් මෙල්ල කර ගෙන, තම තමන් කෙතෙක් දුරට සර්වෝදය මුඛ්‍ය අරමුණු ඉටු කර ගැනීමට උපස්ථම්භක වනවා ද, නැතහොත් ඒ අරමුණු ඈතට තල්ලු කරනවා ද යන්න ගැන ආවර්ජණය කළ යුතුය. එසේ නොකළහොත් ඔබේ නායකත්වය ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ඇත.

නීතිය අතට ගත්තවුන්

රාජ්‍ය නොවන සංවිධාන ගැන සොයා බැලීමට ජනාධිපති කොමිසම පත් කර තිබේ. මේ කොමිසම විසින් අපෙන් ඉල්ලන ලද සියලුම තොරතුරු අපි ඉතා මහන්සි වී සැපයීමෙන්, අපේ සහයෝගය දුනිමු. මෙතෙක් කොමිසම ඉදිරියට අප කැඳවා නැති අතර අපට ද අඩුම වශයෙන් දින 60 වත් සාක්ෂිදීමට අවස්ථාවක් දෙන හැටියට අපි ඉල්ලා ඇත්තෙමු. එම කොමිසමේ කාර්ය-භාරය නිම වීමටත් කලින් විවිධ බලධාරීහු නීතිය ඔවුන්ගේ අතට ගෙන, අපේ කටයුතුවලට දැනටමත් බාධා කර තිබේ. පවතින රාජ්‍ය නීතිය බලයේ සිටින අයගේ ඕනෑ එපාකම් අනුව, විකෘත කොට අවනීතියක් බවට පත් කිරීමට ඕනෑ තරම් ඉඩකඩ තිබේ. මේ නිසායි, නීතිය වනාහි 'බූරුවෙක්' යැයි ජනවහරේ තිබෙන්නේ. නමුත් ධර්ම නීතිය එසේ විකෘත කළ නොහැකිය. අවසාන විනිශ්චය දෙන්නේ ධර්ම නීතියයි. එතෙක් ධර්මයෙහි හැසිරෙන්නන් ඉවසීම පුරුදු කළ යුතුය. ඕනෑම පරිත්‍යාගයක් කිරීමට සූදානම් විය යුතුය.

අපේ මානව අයිතීන්

අප පක්ෂ සහ බලකාමී දේශපාලනයෙහි මෙතෙක් යෙදී නැත. අනාගතයේදී යෙදීමට ද අවශ්‍යතාවක් නොවනු ඇත. එහෙත් පුද්ගලයන් හා සමාජ වශයෙන් අපේ ප්‍රජාතන්ත්‍රික අයිතිවාසිකම් අපට අහිමි වන විට, ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා යම්කිසි දේශපාලන ක්‍රියා මාර්ගයක් ගැනීමට අපට සිදුවේ. එය පක්ෂ සහ බලකාමී දේශපාලනයක් නොවේ. අපගේ මුළු වෑයමම යොමු වී ඇත්තේ ජනතා සංවර්ධනයටයි. අහිංසාවාදීව සහ නිර්මාණශීලීව එම කටයුතුවල අප යෙදෙන විට ප්‍රජාතන්ත්‍ර විරෝධීව සහ නීති විරෝධීව අපට දේශපාලන අංශවලින් බාධා පැමිණෙන විට අපට යම් ප්‍රමාණයක දේශපාලනයට අත ගැසීමට සිදුවේ. කිසිවෙකුට මේ නිසා අපට දොස් කිව නොහැකිය. ඒ පක්ෂ සහ බලකාමී දේශපාලනය නොව, එය සංවර්ධන දේශපාලනය නිසායි. ඒ ජනතා දේශපාලනයයි. පෞද්ගලිකව සහ සාමූහිකව අපේ මානව අයිතිවාසිකම් රැක ගැනීමට ක්‍රියා කිරීම අපේ මානව අයිතියකි.

ඉදිරි කාලය

මගේ ජීවිත කාලයෙන් අඩකට වඩා මා සමඟ ජීවත් වෙමින්, මා මුහුණ දුන් සියලුම ප්‍රශ්නවලදී මෙන්ම, සතුටුදායක අවස්ථාවලදී මා සමඟ සිටි මගේ ආදරණීය භාර්යාව නීතාට ද, මගේ දරුවනට සහ මුණුබුරා සහ මිනිපිරියට ද මා ජීවිතයේ තෝරා ගත් මගෙහි යෑමට බාධා නොකොට මට උපස්ථම්භවීම ගැන මම කෘතඥවෙමි. මේ 33 වසර තුළදී මා සමඟ සේවය කළ ශ්‍රී ලාංකික මෙන්ම ලොව පුරා විසිරී සිටින මගේ මිතුරන්ට සහ සහෝදර සේවක සේවිකාවන්ට මා සදා ණයගැතිය. ඔවුන්ගේ සංඛ්‍යාව අති විශාල නිසා මට නමින් සඳහන් කළ නොහැකිය.

පෞද්ගලිකව ඉදිරි කාලයෙන් වැඩි කොටසක් මගේ අත්දැකීම් සහ අදහස් ලියා තැබීමටත්, වඩ වඩාත් ආධ්‍යාත්මික ජීවිතයකට ළං වීමටත් මම මහන්සි ගන්නෙමි. සර්වෝදය සංවර්ධන කටයුතුවලින් පුළුවන් තරම් මා නිදහස් කිරීමට ඔබ උත්සුක විය යුතුය.

අපේ රටත්, ලෝකයත් වෙනුවෙන් අප විසින් සාක්ෂාත් කළ යුතු කරුණු කිහිපයක් ගැන මෙම සම්භාවනීය සභාවේ හැම දෙනාගේම අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි.

අප ජීවත් වන්නේ දුප්පත්කමින් අසාධාරණයෙන් හා හිංසාවෙන් හති වැටුණු ලෝකයකය. අප විසින් මිනිස් ජීවිත වශයෙන්, සොබා සම්පත් වශයෙන්, සමාජ සාමය අතින් සහ භෞතික ධන සම්පත් අතින් ගෙවන ලද වන්දිය මිනිස් ජීවිත දස ලක්ෂ ගණනින් මෙන්ම, මුදල් වශයෙන් ඩොලර් ප්‍රකෝටි ගණනින් වැඩි වී තිබේ. මේ ප්‍රවණතාවය නතර කොට, මිනිස් ජීවිත, සොබා සම්පත්, සාමාජික සහ භෞතික වස්තූන් ආරක්ෂා වී සාමයත්, සාධාරණත්වයත්, සතුටත් තිර කෙරෙන ශ්‍රී ලාංකික සහ ලෝක සමාජයක් අප විසින් ගොඩනැගිය යුතුය. මේ සඳහා 1990 ගණන්වල ගෙවෙන දශකය අතිශයින් වැදගත්ය. ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරය විසින් අරමුණු කර ගත යුතු කරුණු හයක් මෙහිදී මගේ මනසට එයි. ඒවා නම්:

1. ග්‍රාමීය සහ නාගරික කුඩා ජන කොට්ඨාශ වශයෙන් ශ්‍රී ලංකාව පහසු අන්දමින් බෙදා ගෙන එම ජනතාවගේ ස්ව ශක්තිය සහ සාමූහිකත්වය මතු කොට, ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් සැපිරීමේ සහ මානව අයිතිවාසිකම් සුරැකීමේ ස්ථිර මගකට ඔවුන් යොමු කිරීම.
2. සියලුම දේශපාලන පක්ෂවල සහ සෙසු සංවිධානවල සිටින නායකයන් කිසිදු භේදයකින් තොරව දුප්පත්කම නැති කිරීමේ සහ දුප්පතාගේ මානව අයිතිවාසිකම් ලබාදීමේ මාර්ගයකට සර්වෝදය සංසදය තුළින් සහභාගි කරවීම.
3. විධායක ජනාධිපති ක්‍රමයත්, වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු ක්‍රමයත් වෙනුවට, ජනතාවගේ මූලික අවශ්‍යතා සහ මානව අයිතිවාසිකම් සුරකෙන ගැමි රජයන් පදනම් වූ අපටම ආවේණික සම්මුති දේශපාලන ක්‍රමයක්, කාගේත් සහයෝගයෙන් පරිණාමය වීමට හැකි වන විදියේ මගකට වර්තමාන පක්ෂ සහ බලකාමී දේශපාලනය හැරවීම.

4. සෑම ජනවාර්ගික කොට්ඨාශයකම අනන්‍යතාවය සුරකෙන අතර, ජාතිවාදී, හිංසාවාදී මගකට අපේ ජනතාව නැවත යොමු නොවන විදියේ ධර්මද්වීප මාර්ගයකට පිවිසීමේ අපේක්ෂාවෙන්, වත්මන් සිවිල් යුද්ධය සමථයකට පත් කිරීම සහ යුද්ධයෙන් වෙනත් හිංසාවාදී ගැටුම්වලින් විපතට පත්ව සිටින සියලු දෙනාටම නොපමාව සහන, පුනරුත්ථාපන සේවාවන් කාගේත් සහයෝගයෙන් ලබා දීම.

5. කුමන නමකින් හැඳින්වූවත් වැඩි දෙනෙකුට අසාධාරණය සලසන වත්මන් අර්ථ ක්‍රමය වෙනුවට, පෞද්ගලික අංශයටත්, රාජ්‍ය අංශයටත්, රාජ්‍ය නොවන ආයතන සහ සමූපකාර ආයතන මගින් නියෝජනය වන ජනතා අංශයටත්, සමාන පහසුකම් සහ වරප්‍රසාද ලබා දෙන අතර සමජීවන අර්ථ ක්‍රමයක සාරධර්ම පදනම් වූ සැබෑ ප්‍රජාතාන්ත්‍රික විවෘත ආර්ථිකයක් සඳහා අප සමාජය යොමු කිරීම සහ

6. සියලුම ජන මාධ්‍යය පාලක පක්ෂයේ හෝ වෙනත් වරප්‍රසාද ලත් සුළු පිරිසකගේ ග්‍රහණයෙන් මුදා ගෙන, ප්‍රජාතාන්ත්‍රික සමාජයකට ගැලපෙන සේ ප්‍රගතිශීලී මාධ්‍යය ලෙස හැරවීමයි..

මේ අංශ හය කෙරෙහි ගැඹුරට හිතන ලෙස මම මෙය කියවන සියලු දෙනාටම තරයේ ආයාචනය කරමි.

මුහුණ දිය යුතු - පමා කළ නොහැකි අභියෝගයක්

මගේ මෙම දේශනය නිම කිරීමට පෙර සර්වෝදයට වහාම මුහුණ දිය යුතු අභියෝගයක් පිළිබඳව සඳහන් කරනු කැමැත්තෙමි. සර්වෝදය විසින් ඉටු කළ යුතු මානව යුතුකම් පසුගිය 33 වසර තුළදීම නොඅඩුව ඉටු කර ඇත්තෙමු. සර්වෝදය අපට සාමූහිකව සහ පෞද්ගලිකව හිමි මානව අයිතිවාසිකම් මේ කාලය තුළ දී කඩ වූ අවස්ථා බොහෝය. එහෙත් පළමු කොට ඉවසා විඳ දරා ගැනීමේ ප්‍රතිපත්තියත් දෙවැනිව නිරපරාදේ අපට වරද කරන්නවුන්

මෛත්‍රියෙන් දිනා ගැනීමත්, අප අනුගමනය කළ ක්‍රියා මාර්ගය විය. පසුගිය වර්ෂ දෙකහමාර තුළදී අපගේ මානව අයිතිවාසිකම් අහිමි වීමේ තත්ත්වය අපට, අපේ සේවාවන් කර ගෙන යෑමට බැරි තත්ත්වයට උග්‍ර වී තිබේ. මේ නිසා අකමැත්තෙන් වුවද අපට අලුත් පියවරවල් කිහිපයක් ගැනීමට සිදුව තිබේ.

රජය සතු මාධ්‍යය උපයෝගී කරගෙන ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් අප ව්‍යාපාරය නිග්‍රහයට මෙන්ම, සැකයට භාජනය කරවීම.

රාජ්‍ය නීතිය වැරදි විදියට විග්‍රහ කොට, පරිපාලන රෙගුලාසි මගින් අපේ සේවා කටයුතු කර ගෙන යෑමට නොහැකි තත්ත්වයට බාධා කිරීම.

අපට නීත්‍යානුකූලව විදේශ ආධාර ලබා ගැනීමේ මාර්ග අවහිර කිරීම. අලුත් නීතිරීති පනවා මූල්‍යමය වශයෙන් අපව දුර්වල කිරීම.

අප ආනයනය කළ මුද්‍රණ යන්ත්‍රය රාජසන්තක කිරීම වැනි පහත් ක්‍රියාමාර්ගවලින් අපට කටයුතු කර ගෙන යෑමට නොහැකි තත්ත්වයට අපේ මුදල් තත්ත්වය විශාල වශයෙන් දුර්වල කිරීම. දණ්ඩ බලය වැරදි විදියට යොදවමින් අපට හිරිහැර කරදර කිරීම ආදී වූ ක්‍රියාමාර්ග රැසකින් අද අප මර්දනය කිරීමට සමහර රාජ්‍ය අංශවල නිලධාරීන් යොදවා තිබේ.

මේ කරුණු හේතු කොට ගෙන, අප ඉදිරියේදී අහිංසාවාදී සමාජ වෙනස්කම්වලට කැප වූ පුද්ගලයන් සහ ආයතන ඉවහල් කර ගන්නා තවත් මාර්ග දෙකක් අපේ මානව අයිතිවාසිකම් දිනා ගැනීමට උපයෝගී කර ගන්නවා ඇත.

ඒවා නම්: අධිකරණයේ පිහිට සෙවීම සහ අහිංසාවාදී සෘජු ක්‍රියාමාර්ග දියත් කිරීමයි. මේ පිළිබඳව පෞද්ගලිකව මා ගන්නා ක්‍රියාමාර්ග ළඟදීම ඔබට ප්‍රකාශ කරන්නෙමි.

මිනිස් දුර්ගුණ නොව, මිනිසාගේ යහ ගුණ මතු කොට, අප මුහුණ දෙන සියලුම ප්‍රශ්න අපට විසඳා ගත හැකිය. අවශ්‍ය වනුයේ චිත්ත සන්තානයෙහි ඇති වන මූලික වෙනසකි. මේ විඤ්ඤාණික වෙනස ඇති කර ගැනීමට අදට වඩා උචිත කාලයක් තවත් නැත.

මේ නිසා මගේ 60 වැනි උපන් දිනයට පැමිණි සම්භාවනීය අමුත්තන්ට ද, ප්‍රධාන ආරාධිතයා වූ පාර්ලිමේන්තු මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට ද මගේ හෘදයාංගම ස්තුතිය සහ ආශිංසනය පිරිනමමි.

අපේ ආධ්‍යාත්මික සබඳතාව අපේ රටත්, අපේ ලොවත් අඳුරෙන් එළියට ගෙන යෑමට උපස්ථම්භක වේවා.යි පතමින් මගේ කතාව සමාප්ත කරමි.



මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා සභාව අමතමින්



ජෙනරාල් සිරිල් රණතුංග මහතා සමඟ

පණ්ඩිත් විශාරද ඩබ්ලිව්.ඩී. අමරදේව ශූරීන් සමඟ

273

රටට සේවය කිරීමේ අයිතිය දේශපාලඥයන්ට පමණක් නොවේ.

- දිනේෂ් ගුණවර්ධන -

සර්වෝදය නායකතුමාගේ 60 වෙනි ජන්ම දිනය නිමිත්තෙන් මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා විසින් සම්පාදනය කරන ලද ''අංජලී ප්‍රණාම'' නැමැති අභිනන්දන ග්‍රන්ථය එතුමාට පිළිගැන්වීම සඳහා සර්වෝදය මූලස්ථානයේ 1991 නොවැම්බර් 05 වැනි දින සංවිධානය කරන ලද උත්සව සභාව අමතමින් මානව හිතවාදී ගුණය පෙරටු කොට මේ රටේ සෑම ජන කොට්ඨාශයකටම සුවිශාල සේවාවන් ඉටු කරමින් දශක තුනක පමණ කාලයක් මුළුල්ලේ දීප ව්‍යාප්තව පවත්වා ගෙන යන සර්වෝදය ව්‍යාපාරය මෙසා විශාල ජාතික සේවාවක් බවට පත් වී ඇත්තේ එහි නායක ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතාගේ ආධ්‍යාත්මික ශක්තිය නිසා යැයි ද, එය එසේ නොවී නම් පසුගිය කාලයේ මතු වූ තර්ජන ගර්ජන හා මර්දන හමුවේ මෙය විනාශ වී යන්නට ඉඩ තිබිණැයි ද මහජන එක්සත් පෙරමුණේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය.

මහජන එක්සත් පෙරමුණේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන මහතා සභාව අමතමින්

අප රට දේශපාලඥයන්ට හෝ දේශපාලන පක්ෂවලට පමණක් උරුම දේශයක් නොවේ යැයි ද, මේ රටට සහ මහජනතාවට සේවය සැලසීමට රාජ්‍ය නොවන ආයතනවලට ද අයිතියක් ඇති අතර සර්වෝදය ඒ අභියෝගය පිළිගෙන සාර්ථක ලෙස කටයුතු කර ගෙන යෑම සතුටට කාරණයක් යැයි ද කීය.

දේශපාලඥයන් බලයට එනවා යනවා බලයට ඒම සඳහා ඒ අය මහජනතාව ඉදිරියේ විවිධ දේ කියනවා. විවිධ පොරොන්දු දෙනවා. එහෙත් තුන්වන ලෝකයේ සාමාන්‍ය ජනතාව අද එදාට වඩා බුද්ධියෙන් ප්‍රබුද්ධ යැයි ද, දේශපාලඥයින්ගේ මිථ්‍යා මවාපෑම්වලට ඒ අය රැවටිය නොහැකි යැයි ද කියා සිටි දිනේෂ් ගුණවර්ධන මහතා අප අවට පිහිටි තුන්වන ලෝකයේ සෙසු රටවල සිදුවීම් දිහා බලන විට ඒ බව මනාව පෙනී යන්නේ යැයි ද කීය. අද අප සමාජය දේශපාලන, ආර්ථික මෙන්ම සාමාජික වශයෙන් ද අස්ථිර භාවයකට පත් වී තිබෙනවා. මෙය භයානක තත්ත්වයක් වන අතර වාර්ෂික ජාතික ආදායමෙන් 48% ක්ම භුක්ති විඳින්නේ මේ රටේ ඉහළම සුපිරි පන්තියේ 10% ක පමණ ජන කොටසක් බවක්, මේ රටේ 85% - 90% ක් අතර ජන කොටසකට ලැබෙන්නේ ජාතික ධනයෙන් 40% ක කොටසකි. මෙම හේතු නිසාම රටේ ජනගහන - යෙන් 60% ක් වූ තරුණ පරපුර වෙසෙන්නේ අදහස් සුන් වූ ජනකායක් වශයෙන් බැවින්, ඔවුන් ආයුධ අතට ගත්තේ මේ පසුබිම තුළය. මෙබඳු ප්‍රශ්න දෙපාර්තමේන්තු, සංකල්ප හෝ චක්‍රලේඛන මගින් හෝ විසඳිය නොහැක. ඒවාට විසඳුම් සැලසීමට විදේශීය පරිකල්පනා ඔස්සේ නොව, දේශීය දර්ශනයට අනුරූපව මානුෂික සංවර්ධනය පෙරදැරි කර ගෙන කටයුතු කරන සර්වෝදය වැනි ස්වේච්ඡා ආයතනවල සහාය ලබා ගත යුතුව තිබෙනවා.

අද රටේ ප්‍රධානතම සංවර්ධන සංකල්පය වී තිබෙන්නේ අනුකරණ වාදයයි. විරැකියාව, මන්දපෝෂණය, අසමගිය සහ මිනිස් ඝාතන ඇති වන්නේ මේ නිසයි. අනුකරණවාදී සංකල්ප ඔස්සේ යනවා ද නැත්නම් රටේ සංස්කෘතියට, පරිසරයට සහ දෛනික

ජීවන රටාවට ගැලපෙන සංවර්ධන සැලසුම් සකස් කර කටයුතු කරනවා ද යන්න විසඳා ගත යුතුව තිබෙනවා. සර්වෝදය අනුකරණ වාදය ඔස්සේ යන සමාජ සංස්ථාවක් නොවේ. එය අනගාරික ධර්මපාලතුමා, පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ නායකයන්, අමද්‍යප ව්‍යාපාරය මෙහෙය වූ විද්වතුන් ආදීන් අපට දායාද කළ නම මූලික කොට ගත්, අපේම සම්පත් පිළිබඳ විශ්වාසය තබා කටයුතු කරන, මිනිස් ජීවිත විනාශ කිරීමට නොව මිනිස් ජීවිත ආරක්ෂා කිරීමට කැප වූ අපේම දර්ශනයක් හා පිළිවෙතක් ඇති සමාජ බලවේගයක් වශයෙන් හඳුන්වා දිය හැකි ආයතනයකි. එසේ නොවුවහොත් මීටත් වඩා ප්‍රබල සමාජ අර්බුද රට තුළ ඇති විය හැකි යැයි ද ඒ මහතා කීය. රට ජාතිය වෙනුවෙන් අපේම විකල්ප වැඩ පිළිවෙලක් බිහි කොට දැඩි කැපවීමකින් අධිෂ්ඨාන පූර්වකව ක්‍රියා කරන සර්වෝදය නායකතුමා යුග පුරුෂයෙකු ලෙස හැඳින්විය හැකි බව ද තවදුරටත් ඒ මහතා පැවැසීය.

අග්ගමහා පණ්ඩිත පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රී නාහිමියන්සභාව ඇමතීම


පෝල් බිෂොප් මහතා

අනිකුත් කථිකයන් වූයේ අග්ගමහා පණ්ඩිත බලන්ගොඩ ආනන්ද මෛත්‍රී නාහිමිපාණෝ, පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිපාණෝ, සහ සර්වෝදය ශ්‍රමදාන ජාත්‍යන්තරයේ පෝල් බිෂොප් මහතා වූහ.

274

ලෙන්ගතුකමින් අපට උදව් කළ අය සහ
රොබට් වයිට් මහතා

ජපානයේ ටෝකියෝ නගරයේ පිහිටුවා තිබෙන 'ආර්ක් ඉන්ටර්නැෂනල්' ජාත්‍යන්තර සංවිධානය විශේෂයෙන් දකුණු ආසියාතික රටවල සංවර්ධන ව්‍යාපෘති වැඩ සටහන් සඳහා පුහුණුව ලබා දෙන ජාත්‍යන්තර සම්පත් දායක ආයතනයකි. 1991 කාලයේදී අපේ සම්පත් දායකයන් විසින් අප ව්‍යාපාරයට සපයා දී තිබුණේ රුපියල් මිලියන 196 ක් පමණය. රුපියල් මිලියන 71 ක හිඟයක් සහිතව වියහියදම් පියවා ගනිමින්, බොහෝ දුෂ්කරතාවයන්ට මැදි වී සිටි අපට, ආර්ක් ඉන්ටර්නැෂනල් ආයතනයෙන් ලැබුණේ නොමඳ උපකාරයන්ය. සර්වෝදය ළමා ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සඳහා අප විසින් ඒ වන විට දිගු කාලීන සැලැස්මක් සකස් කර තිබුණු අතර, 'ආර්ක්' ආයතනය මගින් පාලනය වන ජාත්‍යන්තර සංවර්ධන ව්‍යාපෘති ආධාර ලබා දෙන .එකම ලොවයි එකම ජනතාවයි. ඒකකය ද ඒ සඳහා ඉදිරිපත් වීමෙන් විශාල මෙහෙයක් සර්වෝදය ව්‍යාපාරය වෙනුවෙන් ඉෂ්ට කරනු ලැබූ බව කිව යුතුය.

විශේෂයෙන් උතුරු නැගෙනහිර ද ඇතුළුව, දිවයින පුරා අද සාර්ථකව පවත්වාගෙන යනු ලබන එම ව්‍යාපෘති පුහුණු වැඩ සටහන් හා පෙර පාසල් ද ළමා ප්‍රවර්ධන ව්‍යාපෘති, ආයතනය ද මෙවැනි දියුණු තත්ත්වයකට ගෙන ඒමට හැකි වූයේ එම නොමසුරු ආධාර උපකාර නිසාය. මූල්‍යමය ආධාර පමණක් නොව, භාණ්ඩ සහ වැඩමුළු සම්මන්ත්‍රණ සඳහා සම්පත් දායක දේශකයන් සැපයීම ඇතුළු විවිධ ක්‍රමවලින් 'ආර්ක් ආයතනය' අප ව්‍යාපාරයට මහත් ශක්තියක් විය.

ආර්ක් ආයතනයේ සභාපතිව සිටියේ රොබට් වයිට් මහතාය. අවංක මිත්‍රත්වය හා මිනිස් කමෙහි සංකේතයක් බඳු වූ, අප ව්‍යාපාරයේ ඉතිහාසය තුළින් සැමදා අප සමඟ හද බැඳි මටත්,

සර්වෝදය ව්‍යාපාරයටත් බොහෝ සේ ආදරය කළ සහෘදයාණන් කෙනෙක් ලෙස හඳුන්වා දිය හැකි පුද්ගලයෙකි, රොබට් වයිට් මහතා. 1992 වර්ෂයේ ජපානයේ ශ්‍රී ලංකා තානාපතිව සිටි චිත්තම්බරම් මහේන්ද්‍රන් මහතා විසින් සර්වෝදය හා මට විරුද්ධව කරන්නට යෙදුණ විරුද්ධවාදී, ද්වේශ සහගත ක්‍රියාකලාපයන්ට ඉඳුරාම එරෙහිව, නිසි වේලාවට උචිතම ආකාරයෙන් ඔහු ක්‍රියාත්මක වී සිටියේය. සර්වෝදය හා මා වෙනුවෙන් නිර්භීතව ඉදිරිපත් වූ රොබට් වයිට් මහතා, සර්වෝදයට මඩ ගසා එහි නම කැලැල් කිරීමට ඔහුට ඉඩ දුන්නේ නැත. අවංකවම මැදිහත් වී, සත්‍යය නිසි වේලාවට හෙළිදරව් කළේය. ඔහුගේ අදහස් හා ප්‍රතිපත්ති ස්ථාවරය මහෙන්ද්‍රන් එම සිද්ධියෙන් පසු ද පැමිණ, රොබට් වයිට් මහතා හමු වුවද, එතුමා විසින් ඉදිරිපත් කර තිබූ එකම ප්‍රශ්නයකටවත් පිළිතුරක් දීමට ඔහු සමත් වී නැත.

ඒ කාලයේ අපේ රට පාලනය කළ ආණ්ඩුව විසින් ද අපට නොයෙක් කෙනෙහිලිකම් කිරීම, තානාපති මහේන්ද්‍රන් පමණක් නොව තවත් නොයෙකුත් මහේන්ද්‍රන්ලාට ද, අප ව්‍යාපාරය හා මා කෙරෙහි ද්වේශ සහගතව එදිරිවාදිකම් කිරීමට රුකුලක් වී තිබුණි.

1986 වර්ෂය කාලයේදීත් අපට සංවර්ධන වැඩ සටහන් ඉදිරියට ගෙන යාමේදී බොහෝ ආර්ථික අමාරුකම් ඇති වූ බැවින්, ඒ පිළිබඳව යම් නිවේදනයක් මා විසින් අප ව්‍යාපාරයේ සේවකයන් වෙත අවධාරණය කරන්නට යොමු වුණෙමි. එනම් අප ව්‍යාපාරයේ සත්‍ය පරමාර්ථයන් දර්ශනය හා ඒවායේ වටිනාකම් කෙරෙහිත්, පූර්ණ අවධානය යොමු කරමින් දනට කෙරී ගෙන යන වියදම් අවම වන ලෙස, මහන්සි වී වැඩ කළ යුතුව ඇති බවය. රොබට් වයිට් මහතාට එය ආරංචි වී මට ශුභ පතමින් ධෛර්යවත් කළේය. නව සර්වෝදයක් ගොඩනැගීම සඳහා මගේ සංකල්පය ගැන ප්‍රසාදය පළ කළ එතුමා, ආර්ක් ආයතනය මගින් පළපුරුදු ජ්‍යෙෂ්ඨ පුහුණුකරුවෙක් සම්පත් දායකයෙකු ලෙස ලබා දෙන බව ද දන්වූයේය. මා වෙනුවෙන් කළ හැකි වෙනත් දේ මොනවා දැයි අසා තිබුණි. රොබට් හැම අතින්ම දක්ෂයෙක් විය.

රොබට් වයිට් මහතා

සැන්ප්‍රැන්සිස්කෝ නුවරදී ''විශ්ව සංසදය''සමුළුවට සහභාගි වූ ඔහු, ආර්ක් ආයතනයේ ක්‍රියාකාරිත්වයන් විස්තර කිරීමේදී, සර්වෝදය පිළිබඳව ද සඳහන් කර තිබුණි. ආර්ක්හි වැඩ කිරීමේදී ඔහු අත්පත් කර ගත් ඉතා වටිනා අත්දැකීමක් වූයේ සේවකයන් මෙන්ම, සේවාලාභීන් සමඟ සුහදශීලීව වැඩ කිරීමයි. තම සංවිධානයේ ජය තහවුරු වීමට එය ස්ථිර ලෙසම හේතු වූ බව පවසා තිබූ එතුමා, මට ද සර්වෝදය ව්‍යාපාරයේ ජයග්‍රහණය ලැබීමට එවැන්නක් උපකාරී වේ යැයි තමා ස්ථිර ලෙසම විශ්වාස කරන බව එහිදී ප්‍රකාශ කළේය.

ආසියානු රටවලට පරිබාහිරව වෙනත් පෞද්ගලික සංවර්ධන වැඩ සටහන් සඳහා තම ආයතනයෙන් ආධාර තිකුත් කිරීම කිසි විටෙකත් සිදු නොකරන බවත්, සර්වෝදය වෙනුවෙන් සිදු කරනු ලබන ආධාර උපකාර දිගටම කර ගෙන යන බවත් ඔහු ප්‍රකාශ කළේය. 1990 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ ටෝකියෝ නුවර හිල්ටන් හෝටලයේදී පවත්වන ලද 'එකම ලොවයි එකම ජනතාවයි' උත්සවයට සහභාගිවීමෙන් අපේ මිත්‍රත්වය මෙන්ම මගේ දැන හැඳුනුම්කම් ද තවත් පුළුල් ක්ෂේත්‍රයකට ගෙන ගියේය.



එකම ලොවයි එකම ජනතාවයි සංවිධානයේ සභාපති සුසුකි මහතා,
ලංකාව නියෝජනය කළ ජපානයේ කොන්සාල් ජනරාල්තුමා සහ මම

එම උත්සවය සංවිධානය කර තිබුණේ, ආර්ක් ඉන්ටනැෂනල් සමාගම භාර රොබට් වයිට් මහතා විසින්මය. සුප්‍රසිද්ධ ඇමරිකානු ගායක සංගීතඥජෝන් ඩෙන්වර් මට අමතරව උත්සවයේ එකම ආරාධිතයා ලෙස එහි සහභාගි වීමට ඇරැයුම් ලබා තිබුණි. ඔහු සමඟ පැය තුනහමාරක් එකම වේදිකාවේ ගත කිරීමේ භාග්‍යය මට ලැබුණි.



සංගීතඥජෝන් ඩෙන්වර් මහතා සමඟ වේදිකාවේ

මේ උත්සවයට රොබට් වයිට්ගේ බිරිඳ ඩයනාද , ඔවුන් හදා වඩා ගන්නා දරුවන් ද පැමිණ සිටියහ. මේ දෙපළ නවසිය අසූ දෙකේදී පමණ සර්වෝදය බැලීමට ශ්‍රී ලංකාවට පැමිණ ඇත.

ඒ දිනවල 48 වියැති අතිශයින් නිරහංකාර ජෝන් ඩෙන්වර් හීන්දෑරි උස පුද්ගලයෙක් වූයේය. ඉතා ගරුසරුව මා පිළිගනිමින්, මා ගැන බොහෝ දේ අසා ඇති බවත්, දැක බලා පෞද්ගලිකව කතා කිරීමට ආශාවෙන් සිටින බවත් පැවැසීය. ඔහු මගෙන් විශාල ආදර්ශයක් සහ ජීවයක් ලබා ගෙන මා ලොවට කරන සේවයෙන් බිඳක් හෝ කිරීමට බලාපොරොත්තු වන බැව් ද පැවැසීය. ළමයින් පරිසරය හා සාමය අළලා සංගීතය මගින් ඔහුගෙන් කෙරෙන සේවය දැන සිටි කෙනෙකු හැටියට මගේ ගෞරවය ඔහුට හිමි වන බවත්, ඔහු මුණගැසීමට ද කැමැත්තෙන් සිටි බවත් මම කීවෙමි.

හය දහසක් පමණ රසිකයින් ඉදිරියේ ජෝන් ඩෙන්වර් හා මම සංවාදයක යෙදුණෙමු. හාමත, පරිසර, දූෂණය, යුද්ධය, ළමා සංවර්ධනය ආදී මාතෘකා පාදක කර සාකච්ඡාවට භාජනය වූ අපගේ සංවාදය මෙහෙයවූයේ සුප්‍රසිද්ධ රූපවාහිනී නිවේදකයෙකු වූ යමාමෝටෝ මහතා සහ සුප්‍රසිද්ධ නිළියක විසිනි.

මාරුවෙන් මාරුවට පැය බාගයක් තුළදී යමාමොටෝ අප දෙදෙනාගෙන් ප්‍රශ්න කළ අතර, ඩෙන්වර් සෑම උත්තරයක්ම අවසන් කළේ මා ආදර්ශයට ගනිමින්ය. අප දෙදෙනා හොඳින් මිත්‍ර වීමු. ලංකාවට එන ලෙස මම ඔහුට ඇරයුම් කළෙමි. මෙම වැඩ සටහනට සහභාගි වීම වෙනුවෙන් ස්තුතියක් ලෙස රොබට් වයිට් මහතා මට යෙන් පන්ලක්ෂයක් තෑගි කළේය. ටෝකියෝ නගරයේ ප්‍රධානම හෝටලය වූ සකුරා හෝටලයේ සම්පූර්ණ වියදම ඔහු දැරුවේය.

රොබට් මහතා සහ ඔහුගේ බිරිඳ යන දෙදෙනාම ළමා අපයෝජනය වැළැක්වීම හා ඉන් විපතට පත් දරුවන් පුනරුත්ථාපනය කිරීම දැඩි උනන්දුවක් ඇතිව පොදු සමාජ සේවයේ යෙදී සිටි අයයි. ආර්ක් ආයතනය වෙනුවෙන්, සර්වෝදයේ ළමා

ශුභසාධන වැඩ සටහන් සඳහා විශේෂ අවධානයකින් ක්‍රියා කළ අයුරු අමතක කළ නොහැකි දෙයකි. අනුහත වර්ෂයේ අප විසින් ද එවැනි ළමා ශුභසාධන ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. අනාගත ලෝකයේ නායකයන් ළමයින් සහ තරුණයන් බැවින් ඒ අය වෙනුවෙන් ඇප-කැප වී උදව් කරන ආර්ක් ජාත්‍යන්තරය වැනි ආයතනයක ප්‍රධානියා හැටියට ඔහුටත් එහි සේවය කරන සියලුම කාර්ය මණ්ඩලයටත් අපගේ ආශීර්වාදය සහ පූර්ණ සහයෝගය ලබා දෙන බව මම ප්‍රකාශ කළෙමි.

ආර්ක් ආයතනය නියෝජනය කරමින් සර්වෝදයට බොහෝ උදව් උපකාර කළ රොබට් මහතා, කිහිප වාරයක්ම සර්වෝදයට පැමිණි අතර, වරක් සිය බිරිඳත් දරුවන් දෙදෙනාත් සමඟ ලංකාවට පැමිණ සර්වෝදයේ සති කිහිපයක් නතර වී සිටියහ. අපේ බොහෝ මධ්‍යස්ථානත් සේවා ක්ෂේත්‍රයන් නිරීක්ෂණය කළ එතුමා, සර්වෝදය දර්ශනයේ ප්‍රායෝගික භාවිතය පමණක් නොව සියලුම ක්‍රියාකාරී ව්‍යුහයන් පිළිබඳව මනා දැනුමක් එක්රැස් කර ගෙන තිබුණි. අපේ ගෙදරට පැමිණි විට ඔහු එහි නතර වී අප පවුලේ අය සමඟ ගැවසුණේ අපේම කෙනෙක් විදියටය.

'ලයිෆ් ඩයිනමික්ස්' (Life Dynamics) යනු ඉතා ක්‍රියාශීලී අන්දමට සර්වෝදයට ආධාර කළ සම්පත් දායක ආයතනයකි. ආර්ක් ආයතනයේ 'එකම ලොවයි එකම ජනතාවයි' වැඩ සටහන හරහා 'ලයිෆ් ඩයිනමික්ස්' ආයතනය විසින් රොබට් මහතා සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී (1990 දාන සඟරාවෙන් උපුටා ගන්නා ලදී) සර්වෝදය ව්‍යාපාරයේ දර්ශනය සහ පරමාර්ථයන් පිළිබඳවත් ක්‍රියාකාරී ව්‍යුහයේ සුවිශේෂ ලක්ෂණ ගැනත් පැහැදිලි විවරණයක් ඉදිරිපත් කිරීමට එතුමා සමත් වී තිබුණි. අප විසින් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබූ පුද්ගලයා තුළින් ආරම්භ කර, විශ්ව ප්‍රජාවම අවදි කිරීමේ වැඩ සටහන් රොබට් මහතාගේ අතිශය ප්‍රසාදයට හා විශ්වාසයට පාත්‍ර විය. දියුණු සමාජයක සුඛෝපභෝගී ජීවන ක්‍රමයක් සතුව තිබෙන තමා වැනි අය, එසේ අවදි කිරීමේ

ක්‍රියාවලියට භාජනය වීමේදී, එතෙක් හුරුපුරුදු වී සිටි ජීවන අවශ්‍යතා බොහොමයක වෙනස් වීම් ඇති වන බවත් සර්වෝදය විසින් කරන්නට යෙදෙන වැඩ කටයුතුවලට සහභාගිවීමට එවැනි සුඛෝපභෝගී සමාජයකම ජීවත් විය යුතු නැති බවත් ඔහු ප්‍රකාශ කළේය. ජපානය, අමෙරිකාව, යුරෝපය වේවා, අප ලෝකයේ කුමන රටක ජීවත් වුවද ප්‍රජාවන්ගේ සම්ප්‍රදායානුකූල හැඟීම් හා ආකල්ප අපට අහිමි වෙමින් පවතී. ඒ නිසා සර්වෝදය වැනි ව්‍යාපාරයකට අප විසින් ප්‍රදානය කළයුතු දෑ බොහෝ ඇත. ප්‍රජාව තුළ අන්‍යොන්‍ය ලෙස ගොඩනැගී තිබිය යුතු සරල හා ප්‍රායෝගික වූ දයාව කරුණාව වැනි ගුණාංග සර්වෝදය ව්‍යාපාරය තුළින් මනාව පිළිබිඹු වීම එහි සුවිශේෂත්වයක් ලෙස මම දකින්නෙමි. එවැනි දේ අප විසින් ආදර්ශයට ගැනීමත්, ඉගෙන ගැනීමත් කළ යුතුය.

සර්වෝදය විසින් ජාත්‍යන්තර ලෙස නිර්මාණය කිරීමට ප්‍රයත්න දරන්නා වූ 'අවදි කිරීමේ ක්‍රියාවලිය' සම්බන්ධයෙන් එහි වැදගත්කම ඉස්මතු වන යම් නිදර්ශනයක් ඔබට දිය හැකි දැයි අසන ලද ප්‍රශ්නයකට රොබට් මහතා විසින් ලබා දුන් පිළිතුර මෙසේයි: පාර්ශ්වික සන්නිවේදනය යන්න මේ සඳහා භාවිතා කළ හැකි උචිතතම තාක්ෂණය වන අතර ජාත්‍යන්තර හෙවත් විශ්වයේ උදාව යන විශ්වෝදය එහි ප්‍රතිඵලය වනු ඇත.

'මා ශ්‍රී ලංකාවට පැමිණි විට බොහෝ විට නතර වන්නේ ආරිගේ නිවසේ. එය ඉතා සරල චාම් ගෙදරක්. දිනක් මා එහි කුස්සියේ වාඩි වී සිටියා. අපි එදා සාකච්ඡා කළේ මෙම පාර්ශ්වික සන්නිවේදනය ගැනයි. ජාත්‍යන්තර අවදි වීම යන්න ඇති කළ හැක්කේ ලෝකයේ විවිධ රටවල, විවිධ ජාතීන් විසින් අන්‍යොන්‍ය මිත්‍රත්වය හා සුහදශීලී බව ඇති කර ගැනීම තුළින් බවත් අද ලෝකයේ එය දක්නට තිබෙන්නේ ඉතා අඩුවෙන් බවත් අපි සාකච්ඡා කළා. එම මිත්‍රත්වය යම් කොටස්වලට පමණක් සීමා වී ඇති දෙයක්. එනම් දේශපාලන නායකයෝ අදහස් හුවමාරු කර ගනිමින් ඇසුරු කරන්නේ ඔවුන්ගේම අනෙකුත් දේශපාලන

නායකයන් සමඟ පමණයි. ව්‍යාපාර නායකයින් ද එවැනි අනෙකුත් විශේෂ කණ්ඩායම් ද එසේම යි. නමුත් ලෝකයේ විවිධ රටවල ප්‍රදේශ ගම්මාන හා පවුල් අතර අදහස් අන්‍යොන්‍ය ලෙස හුවමාරු කර ගනිමින් මිත්‍ර වී සිටීම හෝ එවැනි දේකට හැඩගැස්මක් සිරිතක් අද ලෝකයේ පෙනෙන්නට නැත.

සර්වෝදය ව්‍යාපාරයේ එවැනි පුළුල් වැඩ සටහන් සාර්ථකව ක්‍රියාත්මක කර ගෙන යනවා. සාමය අධ්‍යාපනය ළමයින් වැනි පොදු ජනතාවට අවශ්‍ය බොහෝ කරුණු පිළිබඳව මිනිසුන්ගේ අවධානයත් උනන්දුවත් යන අවශ්‍යතාවය ලෝකයේ සැම දෙනාටම එක හා සමාන වන බැවින් මෙම වැදගත් අවශ්‍යතාවයන් ඉෂ්ඨ කර ගැනීම සඳහා ජනතාවගේ සාමූහික බෙදා හදා ගැනීම හා ක්‍රියාකාරිත්වය සර්වෝදය ප්‍රතිපත්ති හා භාවිතයේ අන්තර්ගත වන දෙයක්. එබැවින් සර්වෝදයේ දර්ශනයට අනුව තම අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට ජාත්‍යන්තර අවදි වීම කරා ළඟා විය හැක්කේ එවැනි සාමූහික එක්සත් වීම තුළිනි. එය පාර්ශ්වික සන්නිවේදනය තුළින් ළඟා කර ගත හැක.

සර්වෝදය සංකල්පයේ අඩංගු මූලික මානව අවශ්‍යතා දහය පිළිබඳව දැඩි පැහැදීමකින් කතා කළ රොබට් වයිට් මහතා, ජීවිතයට අවශ්‍ය හැම අවශ්‍යතාවයක්ම ඉන් සපිරෙන බව ප්‍රකාශ කළේය. වර්ෂ පහකට පමණ පෙර තුන්වන ලෝකයේ ජාතීන් අතර සැතපුම් දහස් ගණනක් තමා ඇවිද්ද බවත් තමා ඉන් ඉගෙන ගත් වැදගත් දෙයක් නම්, සර්වෝදය දර්ශනය අනුව තමා හා තම ගම පිරිසිදු කර ගැනීම උතුම් සංකල්පයක් වන බවයි.

සාමූහිකව වැඩ කිරීමෙන් ගම පිරිසිදු කර ගන්නා විට පුද්ගලයාගේ අභ්‍යන්තරය හෙවත් 'තමා' යන්න ඉබේම පිරිසිදු වන බවත් ප්‍රකාශ කළේය.

ලංකාවේ ගමකට අනුග්‍රහය දැක්වීමෙන් ඔවුනොවුන් අතර දයාව, කරුණාව, බෙදාහදා ගන්නා අයුරු අප නිරීක්ෂණය කළා.

ඒවා බොහෝ වටිනා අත්දැකීම්, පසුගිය වර්ෂ දෙක තුළ දී සර්වෝදයෙන් බොහෝ දේ ඉගෙන ගෙන තිබෙනවා. අපේ ලෝකයටම ලැබී තිබෙන සත්‍යමය තෑග්ගක් වන සර්වෝදය ප්‍රජා සංවර්ධනයේ නියම නිදර්ශනයක් ලෙස මා දකිනවා යයි අවසාන ලෙස තම අදහස් හෙළිදරව් කළේය.

ළමා ප්‍රවර්ධන වැඩ සටහනඃ

සර්වෝදය ගම්වල අපේ පෙරපාසල් ආරම්භ කර තිබුණ ද ඒවා පවත්වා ගෙන ගියේ බොහෝ අග හිඟකම් මධ්‍යයේය. නොකර බැරිකමටය. එනමුදු සැනසීමකට තිබුණේ අපේ සේවිකාවන් උනන්දුවෙන්, කැපවීමෙන් වැඩ කිරීමයි. එය ශක්තියක් මෙන්ම අනාගත දියුණුවේ පෙර නිමිත්තක් ද විය.

පෙර පාසල් සංවර්ධනය කිරීම සඳහා අප විසින් වැඩ සටහන් සැලසුම් සම්පාදනය කර තිබුණ ද, මූල්‍ය ප්‍රතිපාදන සොයා ගැනීමට බොහෝ උත්සාහ කළෙමු. අපේ සම්පත් දායකයන්ට හැකි වූයේ රුපියල් මිලියන 196 ක් වනතුරු පමණක් උදව් කිරීමටය. අපේ පෙරපාසල් ව්‍යාපෘතිය සඳහා පමණක් වර්ෂයකට රුපියල් මිලියන 71 ක් අවශ්‍ය වී තිබුණෙන් ආර්ක් ජාත්‍යන්තර ආයතනය හා ලයිෆ් ඩයනමික් ආයතනය වෙත අපට සහාය වන ලෙස දන්වා යැවීමි.

සර්වෝදයේ ගැමි වැඩ සටහන් ගැන පැහැදීමකින් සිටි ආර්ක් ඉන්ටනැෂනල් ආයතනය විශේෂ පෙර පාසල් ව්‍යාපෘතියක් සඳහා අරමුදල් ලබා දීමට එකඟතාවය පළ කර සිටියේය. ආර්ක් නියෝජිතයෙක් ලෙස ලංකාවට පැමිණි කොස්බි මහතා ඒ කාලයේ අප සංගමයේ ප්‍රධාන ලේකම් ඩී.ඒ. පෙරේරා මහතා සමඟ සර්වෝදය ගම්වලට ගොස් විස්තර සොයා බලා, අනතුරුව ආධාර දීමට ආර්ක් ආයතනය තීරණය කළේය. අපේ ක්‍රියාකාරිත්වයන් බැලීමට නිතර සර්වෝදයට පැමිණි කොස්බි මහතා නිසා අප සංවිධාන දෙක අතර හිතවත්කම් දියුණු වීමට තවත් රුකුලක් වීය.

රොබට් මහතාගේ ආරාධනය පරිදි මා 1990 සැප්තැම්බරයේදී ආර්ක් ජාත්‍යන්තර ආයතනයට ගිය අවස්ථාවේදී එහි සංවිධානය කර තිබූ උත්සවයකට සහභාගි වීමි. විශේෂ වූ උත්කර්ෂවත් පිළිගැනීමකට මුහුණ දීමෙන් අනතුරුව නොයෙක් පළාත්වල සිට ආර්ක් ආයතනයට පැමිණ සිටි පෙර පාසල් පුහුණු ගුරුවරුන් හාරසීයකට දේශනයක් කළෙමි. සර්වෝදයට උදව් කිරීමේ OWOP සංවිධානය තුන් අවුරුදු ව්‍යාපෘතියේ ආරම්භක පියවරක් වූ එම උත්සව අවස්ථාවේදී උපාධිධාරී ගුරුවරුන් වූ එම හාරසිය දෙනාට පෙර පාසල් හාරදහසක් බාර දීම සිදු විය.

සර්වෝදය පිළිබඳව ප්‍රදර්ශනයක් පැවැත්වීම එහි තවත් අංගයක් වූ අතර, 'එකම ලොවයි එකම ජනතාවයි' ආයතනයෙහි අපට හිතවත් යොෂිඩා මැතිනියත් ටකාරා සාන් ආදී අයත් මහන්සි වී කටයුතුවල යෙදුණහ. එදා උත්සවයේදී සංගීත සංදර්ශනයක් ද පැවැත්විණි. එවැනි නවීනතම සංගීත උළෙලක රසිකයෙකු හා සහභාගි වන්නෙකු හැටියට මා අත්විඳි ප්‍රථම අවස්ථාව විය. මට හැඟී ගියේ මෙය විශ්වෝදයේ ඉදිරි පියවරක් දැයි යන්නය.

පසු දිනයේ සසකාවා සාම පදනම වෙත ගොස්, රොයිචි සසකාවා සහ යොහෙයි සසකාවා මහත්වරු හමුවීමි. අපගේ ව්‍යාපෘතිවල වැඩ කටයුතුත් රටේ පවතින ප්‍රශ්නත් පිළිබඳව අපි සාකච්ඡා කළ අතර රොයිචි මහතා කීවේ අවුරුදු 200 දක්වා තමා ජීවත් වන බවත් සර්වෝදයට දිගටම උදව් කරන බවත්ය. සසකාවා පදනම අපේ සම්පත් දායකයන්ය. නිවානෝ සාම පදනම වෙත ගොස් නිකියෝ නිවානෝතුමා මුණගැසීමෙන් පසු යුනෙස්කෝ ආයතනයේදී දේශනයක් පවත්වා මම නැවත සිංගප්පූරුව බලා පිටත් වීමි.

අපගේ ළමා ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා මුදල් ආධාර ලබා දීමට මූලිකව ක්‍රියාත්මක වූයේ ආර්ක් ආයතනයේ විදේශාධාර ව්‍යාපෘතියක් වන 'එකම ලොවයි-එකම ජනතාවයි.' (One World

One People) යන විශේෂ වැඩ සටහනය. මුල් වරට අපට පෙර පාසල් 10 ක් සඳහා යෙන් මිලියන තුනක් එකතු කර එවා තිබුණි. එකම ලොවයි - එකම ජනතාවයි ව්‍යාපෘතිය මගින් මුදල් එකතු කරනු ලබන්නේ විවිධ වැඩ සටහන් විශේෂ අලෙවි කටයුතු සේල් පැවැත්වීමෙන් හා පෞද්ගලික ත්‍යාගශීලීන්ගෙනි. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 10 කින් තෝරා ගනු ලැබූ ගම් 10 කින්, පෙරපාසල් 10 ක් තෝරා ඒවායේ සංවර්ධන හා ඉදි කිරීම් කටයුතු සඳහා එම මුදල් යොදා ගැනීමට අපි තීරණය කළෙමු. සමහර පෙර පාසල් අලුතින්ම තැනීමටත් තවත් සමහර ඒවා අලුත්වැඩියා කර අඩුපාඩු සැකසුමටත් මෙම මුදල් වැය කරවීය.

කැප වී වැඩ කරන පෙර පාසල් ගුරුවරුන්ට ගෙවිය යුතු යම් දීමනාවක් පිළිබඳව එහි වගකීම ගම්වැසියන්ට භාර දීමට නොහැකි බැවින් ආර්ක් ආයතනයට එය විසඳීමට හැකි නම් ඔවුන් තවත් මහන්සි වී ඕනෑ තරම් වැඩ කරනු ඇතැයි මා කී නිසා ආර්ක් නියෝජිත රැස්වීමේදී ඒ අයගේ යෝජනාවක් මත යම් ස්ථිර තැන්පතුවක් බැංකුවක දමා එහි පොලිය එම වියදම් සඳහා ගැනීමට තීරණය කරන ලදී. ඉන්පසු ගුරුවරුන්ගේ දීමනාව සඳහා එක් පාසලකට රුපියල් 50,000.00 බැගින් භාරකාර අරමුදලක තැන්පත් කරන ලදී. සෑම පාසලකටම අනුබද්ධිත ප්‍රජා මුලුතැන්ගෙයක්, ක්‍රීඩා පිටියක්, ප්‍රජාශාලා අධ්‍යාපන වැඩ කටයුතු ආදිය සඳහා භාවිතා කළෙමු.

එකම ලොවයි එකම ජනතාවයි හරහා මෙම ගම් තේරීම සිදු කළ අතර ගොඩනැගිලි වැඩ සඳහා උපදෙස් දීම සංගමයේ ගැමි කාර්මික දිස්ත්‍රික් නිලධාරීන් විසින් ඉටු විය. ඒ කාලයේ ළමා ප්‍රවර්ධන අංශයේ ප්‍රධාන විධායක ලෙස ක්‍රියා කළ ආර්යා විරසූරිය මහත්මිය විසින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වයෙහි උපරිම වගකීම බාර ගෙන තිබුණි. මට එය ලොකු සහනයක් විය. මා ඉන්දියාවට ගොස් සිටි කාලයේත් ඇය සියලු වගකීම් බලා කියා ගත්තාය.

'' A People's Movement Under Siege'' පොත ප්‍රකාශයට පත් වූයේ මේ කාලයේය. ඉන් විස්තර වූයේ මහත් සේ පීඩාවට

පත්ව සිටි අපේ අයිතිවාසිකම් දිනා ගැනීමට අප විසින් කරනු ලබන සාධාරණ සටන ගැනයි. පිටු 200 ක් වූ එය අපි විදේශ රටවලට ඇමරිකානු ඩොලර් 5 ගණනේ ලබා දුන්නෙමු.

එකම ලොවයි එකම ජනතාවයි ආයතනයේ සභාපති සුසුකි මහතා ප්‍රධාන නියෝජිත පිරිසක් සමඟ මෙහි පැමිණ හැටන් බිබිලේ වැඩ අවසන් කළ පෙර පාසල් විවෘත කර ආපසු ගියහ. අපගේ පෙර පාසල් ව්‍යාපෘතියේ වැඩ කටයුතු බොහොමයක් අවසන් වීය. එකම ලොවයි එකම ජනතාවයි මගින් සර්වෝදය ගම්වල පාසල්වල ප්‍රාථමික අංශ සඳහා ද අපට උදව් කරන්නට කැමැත්ත පළ කර තිබීම ද මහත් පරිත්‍යාගශීලී ක්‍රියාවකි.

1994 වර්ෂයේ දෙසැම්බරයේදී මම ටෝකියෝ ගිය අතරවාරයේදී එකම ලොවයි එකම ජනතාවයි කාර්යාලයට ගොඩවුණෙමි. එදින ජපන් අධිරාජ්‍යයාගේ උපන් දිනයයි. එහි කාර්ය මණ්ඩලය අපට කෙතරම් හිතවත් ද කියතොත් ආර්ක් මධ්‍යස්ථානයේදී ඔවුන් විසින් නොයෙක් විසිතුරු බඩු වෙන්දේසියක් පවත්වා යෙන් 168000 ක් එකතු කර, සර්වෝදයේ ගම්වල ප්‍රාථමික පාසල් ගොඩනැගීමට තෑගි කළහ. දුන් පොරොන්දු ඒ ආකාරයටම ඉෂ්ට කිරීමටත් පරිත්‍යාගශීලි පිරිසිදු චින්තනයන් තුළින් උදව් කිරීමට අවංකව පෙළඹෙන්නටත් තරම් මානුෂික වූ රොබට් වයිට් මහතා ඇතුළු ආර්ක් ආයතනයේ සියළු සේවා නිලධාරීන්ට මම මෙහිදී කෘතවේදී වන්නෙමි. ඔවුන්ගේ සාමාජිකයින් කිහිප දෙනෙක් අපේ සර්වෝදය ගම්වලට ස්වේච්ඡා සේවා සඳහා යැවීමට සැලැස්මක් ද තිබුණි.

සෑම අවුරුද්දකම මැයි මස 3, 4 සහ 5 දිනයන් ජාතික නිවාඩු දින වූ අතර එම සතිය ජපානයේ 'රන්මය සතිය' ලෙස නම් කර තිබේ. ඒ දිනවල සෑම කෙනෙකුටම දිග නිවාඩු ලබා ගත හැකිය. ඒ නිසා මැයි මාසයේ ලංකාවට ඒමට සූදානම්ව සිටියහ. මා ඉන්දියාවට යාමට සිටි බැවින් ඉන්පසුව එන ලෙස දන්වන ලදී.

මම අප්‍රේල් 30 සිට මැයි 6 දක්වා ඉන්දියාවේ ගත කළෙමි. අපට ව්‍යාපෘති ආධාර වැඩි වැඩියෙන් ලබා දීමට හැම විටම උත්සුක වූ OWOP කාර්ය මණ්ඩලය අනූපහ වර්ෂයේදී ද පවත්වනු ලැබූ උපාධි ප්‍රදානෝත්සව කිහිපයකදී විශේෂ අලෙවි පොළ පවත්වා මුදල් එකතු කර යෙන් මිලියන 2 ක් අපේ ළමා ප්‍රවර්ධන කටයුතු සඳහා ලබා දුන්නේය. කමිසකමෝටෝ මහතා දෙසැම්බර් මාසයේ සර්වෝදයට ඇවිත් ගියේය. අපේ ළමා ප්‍රවර්ධන වැඩ කටයුතුවලට ඉතා ලෙන්ගතුකමකින් අපට උදව් කළ ඒ සැමදෙනා අදත් කෘතවේදීව සිහිපත් කරමි.

තනිව නොව, සාමූහිකව බොහෝ දේ කළ හැකිය
ගරු නිකියෝ නිවානෝතුමා

ජපානයේ පළමු පෙළේ ගිහි බෞද්ධ සංවිධානයක් වූ 'රිසෝ-කෝසි කායි' සහ 'නිකියෝ නිවානෝ සාම පදනමෙහි නිර්මාතෘ වන ජපන් ජාතික ගරු නිකියෝ නිවානෝ මහතා ලෝක සාමය සහ අන්තර් ආගමික සුහදතාවය ඇති කිරීමට වර්ෂ 25 ක පමණ කාලයක් තිස්සේ අපමණ ලෙස වෙහෙස වී වැඩ කළ මානව හිතවාදී ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි.

නොයෙකුත් ආකාරයේ යුද්ධයත් න්‍යෂ්ටික අවි භාවිතයේ හානියත් විශ්ව සම්පත් පරිහානියත් යන්නෙන් මිනිස් වර්ගයා බේරා ගැනීමටත්, ආගමික භේද තුරන් කර විශ්ව ප්‍රජාවට සාමය යහපත උදා කර දීමටත් තමාට හැකි හැම දෙයක්ම කිරීමට ඔහු එඩිතරව ඉදිරිපත් වී සිටියේය. තම අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇමරිකාව යුරෝපය, රුසියාව අරාබිය ආදී මහාද්වීපයන්හි සංචාරය කළේය. ආගමික හා ජාත්‍යන්තර සංවිධානවල නායකයින් හමුවී සාකච්ඡා සම්මන්ත්‍රණ සැලසුම් ක්‍රියාත්මක කළේය. ආගමික හා ජාත්‍යන්තර

ගරු නිකියෝ නිවානෝ මහතා සමඟ

සුහදතාවය ඒවායින් මුල පිරුණි. නිවානෝතුමාගේ හද පතුලේ මුල් බැස ගත් තම සමාජ සේවාවේ ප්‍රධාන අරමුණක් වූ අන්තර් ආගමික සහයෝගීතාවයේ ප්‍රතිඵලයක් ලෙස 'ආගම හා සාමය පිළිබඳ ලෝක සමුළුව' පිහිටුවනු ලැබීය.

බෞද්ධ දර්ශනයට අතිශයින් ගරු කළ නිවානෝතුමා, බොදු ඉගැන්වීම් Lotus සූත්‍රයට මුළු හදවතින්ම ආදරය කළේය. තරුණ අවදියේම Lotus සූත්‍රය තමන්ට හමුවූයෙන් ජීවිතයේ නියම මාර්ගෝපදේශකත්වය ඉන් ලබා ගත හැකි වූ බවත් තමා ගමන් කළ යුතු නියම මග ඉන් තීරණය වූ බවත්, ජීවිතයේ ප්‍රථම බාගයේදී එය ජනතාව අතර පැතිරවීමට සම්පූර්ණයෙන් කැප වී, දෙවන භාගයේදී එය ජාත්‍යන්තරව ද ප්‍රචලිත කිරීමට ඇප කැප වී සාම ව්‍යාපාරය සඳහා මුළු දිවියම කැප කළ බවත් නිවානෝතුමා ප්‍රකාශ කර තිබුණි . ලෝක සාමය තම එකම සිහිනය කර ගත් එතුමා, Lotus සූත්‍රය සාමය ලොව පුරා ගෙන යන වාහනය ලෙස හැඳින්වීය. ඊර්ෂ්‍යාව ක්‍රෝධය වෛරයෙන් තොරව ජීවත්වීමෙන් යහපත උදා කර ගත හැකි බව බුද්ධ චරිතය හා දෙව්දත් තෙරුන්ගේ කථාන්තරයන් තුළින් ඉස්මතු කර ජනතාවට කියා දුන්නේය.

''එක් ජන කොට්ඨාශයක් විසින් මුහුණ පාන්නා වූ ගැටළු ඔවුන්ගේම පමණක් නොව, හැම දෙනාගේම ගැටලුය'' යන Lotus සූත්‍රයේ අඩංගු කරුණු තදින්ම ප්‍රතිග්‍රහනය කර ගෙන සිටි එතුමා, හැම දෙනාටම පොදුවේ අවශ්‍ය වන සතුට හා සාමය සියලුදෙනා විසින්ම අත්පත් කරගන්නා තුරු, තනි පුද්ගලයෙකු විසින් එය හරිහැටි භුක්ති විඳීමට නොහැකි බව තම අත්දැකීම් ආශ්‍රයෙන් ජනතාවට ඉගැන්වීය. තම ජීවිතයේ සෑම වැදගත් කාර්යයකදීම බුද්ධ වචනය ශක්තියක් වූ බවත් සෑම කෙනෙකුටම ඉන් ජීවිතය සාර්ථක කර ගත හැකි බවත් ප්‍රකාශ කළ නිවානෝතුමා Lotus සූත්‍රයේ හා බොදු ඉගැන්වීම් ඇතුළත් කර පුවත්පත් සඟරාවලට ලිපි සැපයීය. දේශන පැවැත්වීය. ග්‍රන්ථ රචනා කළේය. 'සාමය සඳහා බෞද්ධ ප්‍රවේශය' යන ග්‍රන්ථය විශාල ප්‍රසිද්ධියක් දරූ එතුමාගේ කෘතියකි.

අන්තර් ආගමික සුහදතාවය වැනි ලෝකයට අවශ්‍ය වටිනා පරමාර්ථ වෙනුවෙන් මිනිසුන් සාමූහික ලෙස වැඩෙහි යෙදවීමට උනන්දු කරවීම තිරසාර සාමයක් උදෙසා පිළිපැදිය යුතු නියම මග බව එහි සඳහන් කර තිබේ. එසේ ක්‍රියාත්මක වීමෙන් බොහෝ අඩුපාඩුකම් දුර්වලකම් මගහරවා ඉතා සාර්ථක ලෙස සාමූහිකව ඉදිරියට යා හැකි බව ඉන් ප්‍රකාශ කර තිබේ. අත්‍යාවශ්‍ය වන්නේ මිනිස් වර්ගයාගේ කැපවීම හා භක්තිය බව එතුමා සඳහන් කර ඇත.

ලෝකයේ ස්වාභාවික සම්පත් ක්ෂය වී යාම සමගම නිරපරාදේ ඒවා නාස්ති කිරීම ගැන මහත් වේදනාවෙන් නිතරම ජනතාවට කරුණු කියා දුන් නිවානෝතුමා අධිකව සිදු කරන ද්‍රව්‍ය පරිභෝජනය අවම කරමින් ලෝකයේ ඉතිරි වී ඇති සම්පත් ඉදිරි පරපුර සඳහා ආරක්ෂා කර දිය යුතු බව අවධාරණය කළේය.

අප ජීවත් වන ලෝකය අභ්‍යාවකාශයේ පාවෙන යානයක් සමග සැසඳිය හැක. නැවකට බඩු පැටවීමේදී යම් උපරිම ධාරිතාවක් ඇත්තා සේම, පෘථිවියට ද ආහාර නිෂ්පාදනය කිරීමේ හා එය සතුව ඇති සම්පත් ප්‍රමාණයන්හි ද යම් සීමාවක් ඇත. ජනගහනයේ වර්ධනය අනුව අනාගතයේදී අපට ජීවිතයේ මෙතෙක් විඳි සැප විඳීමට නොහැකි වනු ඇත. මනුෂ්‍යයින් බොහොමයකට ජීවත් වීමේ වරම ද අහිමි වී යන බවක් පෙනෙන්නට තිබේ. අනාගත බාල පරපුර ගැන සිතා අප විසින් යාමට තිබෙන දිගු ගමන පිළිබඳව ප්‍රවේශම් හා කල්පනාකාරීව වැඩ කළ යුතුය. අපි අපේ ගැටළු විසඳා ගැනීමට දක්ෂ සංකල්ප භාවිතා කරමින්, ඒ සඳහා උත්සාහවත් විය යුතුය. මානසික ආකල්ප යහපත් අයුරින් වෙනස් කර ගත යුතුය. සුභවාදී ආධ්‍යාත්මික හුරුපුරුදු ඇති කර ගත්තේ නැති නම්, භය චකිතය හා අසහනකාරී තත්ත්වයන්ගෙන් කවදාවත් බේරී සිටීමට හැකිවන්නේ නැත.

ජපානයේ ජනතාව හුරු පුරුදු වී තිබුණේ නිවැරදි යයි සිතමින් හැකි තරම් ද්‍රව්‍ය පාරිභෝජනය කිරීමටය. එහි සාවද්‍ය බව

තේරුම් කර දී, ද්‍රව්‍ය නිරපරාදේ නාස්ති නොකරන ලෙස රටේ තත්ත්වය අනුව මා දුන් දූරදර්ශී අවවාදය නොසැලකූ ඔවුන්, පසුව ඇතිවූ ඵල විපාකවලින් දුක් වින්දා. එනිසා වරද හදා ගත්තා. ජීවිතයේ පිරිහීමට හේතු වන කරුණු බුදුදහමේ උගන්වා තිබෙනවා. විඥානය ඇති හෝ නැති සියලු ජීවීන්ට බුද්ධ ස්වභාවය තිබෙන බවත් එම ස්වභාවය නිසා ගස් කොළන්, මහ පොළොවට ද බුද්ධත්වය ලැබිය හැකි බවත් බුද්ධ දේශනාවේ උගන්වනවා.

''බුද්ධාගම සාමයේ ආගමයි මාද සාමයේ මිනිසෙකු යැයි නොබියව කියන්නෙමි. සොබා දහමේ සුන්දරත්වයෙන් පිරි ගම් ප්‍රදේශයක ඉපිද එහිම හැදී වැඩීමට මා ලබා තිබූ වරප්‍රසාදයත්, ප්‍රීතිමත් උණුසුම් හැඟුමින් පිරි සාමකාමී පවුලකින් පැවත ඒමත්, මා සාමකාමී මිනිසෙකු කිරීමට හේතු වී තිබුණි. ඊට අමතරව සඳහන් කළ හැක්කේ අතිශය උත්කෘෂ්ට වූ බෞද්ධ ඉගැන්වීම්වලින් පෝෂණය වී ඇති මනිපත්‍ර සූත්‍රයයි'' නිවානෝතුමා තම පරාර්ථකාමී ජීවිතයට විශාල පන්නරයක් වූ එයට දිවි හිමියෙන් ගරු කළේය. තම ලිපි ලේඛන ග්‍රන්ථවල එහි සාරය අඩංගු කළේය.

ප්‍රථම වරට එම සූත්‍රය තම ගුරුන් වූ සුකනෝබු අරායිගෙන් ඉගෙන ගත් ඔහුට ඇති වූයේ චකිතයකි. සිත ශරීරය පුද්ගලයා ගහකොළ කඳු ගංගා නිම්න සතා සිව්පාවා යන මේ සියල්ල අයිති ලෝකය එකම එකක්ම බවත් කිසිම භේදයකින් තොරව, මිනිස් වර්ගයා ආරක්ෂා වන යම් එකම නියමයක් තිබෙන බවත් එදා ඔහු උගත්තේය. මනිපත්‍ර සූත්‍රය ඉගෙනීමෙන් ජීවිතයේ යා යුතු නිවැරදි මගට පිළිපන් ඔහු සියලු බාධක ගැටළු බිඳ ජය ගැන්මට ඉන් ආත්ම ශක්තිය ලැබූ බවත්, ඉන්පසු සාමයේ ගැටළුව විසඳීමට පහසුවෙන් ක්‍රියා කළ හැකි වූ බවත් ඉහත සඳහන් ග්‍රන්ථයේ පළ කර ඇත. එය බුදුදහම මෙන්ම, සාමයේ ගැඹුරු ඉගැන්වීමකි. ඉවසීම - පළි නොගැනීමේ වටිනාකම හා අවිහිංසාව දෙව්දත් හා බුද්ධ චරිතවලින් ඉස්මතු කර පෙන්වයි.

සාමකාමී ලොවක් බිහි කිරීමේ ක්‍රියාත්මක බලවේගය උත්පාදනය කරගත හැක්කේ සන්නද්ධ හමුදාවලින් නොව, ආගම දහම පිළිපැද මිනිස් වර්ගයාට ගරු කිරීමෙන් බව එතුමාගේ ස්ථිර විශ්වාසය වූයෙන් එය මිනිසුන්ට ඒත්තු ගැන්වීමට වෙහෙස මහන්සි විය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානයට ඇති වූ විශාල පාඩුවත් සමඟම අලුත් ආගම් බිහිවීම ද සිදු විය. නොයෙකුත් විරුද්ධ බලවේගයන්ට ශක්තිමත්ව මුහුණ දීම සඳහා එම නව ආගමික සංවිධාන එක්සත් වී 'ජපානයේ නව ආගමික සංවිධානයන්ගේ ඒකාබද්ධ සංගමය' යනුවෙන් සංවිධානයක් පිහිටුවා ගන්නා ලදී. නිවානෝතුමා මුල් වීමෙන් එතුමාගේ නොපසුබට උත්සාහයෙන් එම නව සංවිධානයට සාර්ථක හා ඉක්මන් ගමනක් යාමට හැකි විය. පසුව 1965 දී එතුමා එහි සභාපති ධූරයට පත් විය.

''විශ්වයේ ඇති සියලු දෙයෙහි හා ප්‍රාණීන්ගේ සම්භවය එකම ශක්තියක් බවත් එය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වී සියලු දේ නිර්මාණය වී ඇති බවත්, අවබෝධ කරගත් නිවානෝතුමා මෙම මූලික ශක්තියට බෞද්ධාගමෙහි ශූන්‍යය යනුවෙන් ද සමහර විද්‍යාඥයෝ 'ෆැලෑන්ක් නියමය' යනුවෙන් ද ආදී විවිධ අයුරින් අර්ථ ලබා දුන්න ද එය විශ්වයේ එකම ජීවයමය''.

නිවානෝතුමා දිගු කලක් වෑයම් කළේ ආගම් අතර බෙත්ම යා කිරීමටය. ආගමික කාණ්ඩ පමණක් නොව සියලු ජන කොටස් අතර ද සුහද මිත්‍රත්වයක් ඇති කිරීමේ අරමුණ ඇතිව 'අන්තර් - ආගමික සහයෝගීතාවය' යන පදය එතුමා භාවිතය සඳහා යොදා ගත්තේය. එය තුළින් එතුමා ලෝක සාමයට සාර්ථක ප්‍රවේශයක් ලබා දීමට කටයුතු කළේය.

න්‍යෂ්ටික අවි තහනම් කිරීමේ ව්‍යාපාරයේ පුරෝගාමී වූ නිකියෝ නිවානෝතුමා ඒ සඳහා පිහිටුවා ගත් සංගමයේ නියෝජිත යෙක් හැටියට වෙනත් රටවලට ගියේය. බටහිර රටවල් වලදී ඒවායේ ආගමික ජනතාව සාමය සඳහා ඒකරාශී කළේය. පසුව

තවත් පහලොස් දෙනෙකු සමඟ නියෝජිත පිරිසක් රෝමයට ගොස් පාවුළු පාප් වහන්සේට ලෝක යහපත වෙනුවෙන් න්‍යෂ්ටික අවි නවත්වා සාමය ගෙන ඒමේ විශේෂ යෝජනාවක් බාර දුන්නේය. න්‍යෂ්ටික අවි පිපිරවීම පරීක්ෂා කිරීම නවත්වා, ජාත්‍යන්තර සුහදතාවය පදනම් කර ගෙන සැමට යහපත ගෙනෙන ආකාරයට පමණක් එය භාවිතා කිරීමේ යෝජනාවක් එහි අන්තර්ගත විය. එවැනි තහනමක් මගින් මනුෂ්‍යයා බේරා ගැනීමේ අයිතියක් අපට ඇතැයි නිවානෝතුමා තදින්ම විශ්වාස කළේය. පාප්තුමා එය පිළිගෙන ස්තුති කළ අතර, ඉන්පසු නියෝජිතයෝ වතිකානුවේ සිට ස්විස්ටර්ලන්තයේ ලෝක දේවස්ථාන කවුන්සලය වෙත සහ ප්‍රංශය, රුසියාව, බටහිර ජර්මනිය, බ්‍රිතාන්‍යය හා ඇමරිකාවට ද ගොස් එය බාර දුන්හ.

රුසියාවේ අගමැති කෘෂොව්, අමෙරිකාවේ ජෝන් එෆ් කෙනඩි වැනි ඒ ඒ රටවල නායකයන් හමු නොවූවද, නිවානෝතුමා ඒ රටවල බලවත් රාජ්‍ය නායකයින් මුණගැසී සාකච්ඡා කළේය. තවද බොහෝ ආගමික බැතිමතුන් මෙම සාම නියෝජිතයින්ගේ සංකල්පය තේරුම් ගෙන අපේක්ෂා කළාටත් වඩා ඒ දෙස නැඹුරුවීමට පටන් ගැනීම තවත් සතුටුදායක ප්‍රතිඵලයක් විය. ඒ දිනවල යම් පුද්ගලයෙක් නිවානෝතුමා සමඟ කී කතාවක් ඔහුගේ සිතේ බොහෝ කල් පැළපදියම් වී තිබූ බවක් සඳහන් කර ඇත.

'යමෙකුට තනියෙන් දෙයක් කළ නොහැක' නමුත් සාමූහික ආරම්භයක් ගතහොත් කළ නොහැකි දෙයක් නැත.

1965 මාර්තුවේදී ජපානයට පැමිණි වතිකානු මාලිගයේ පෝල් කාඩිනල්තුමා, ජපානයේ විවිධ ආගමික සංවිධාන නායකයන් හමුවී ජපානය නියෝජනය කරමින් විශේෂ අමුත්තෙකු හැටියට දෙවන වතිකානු කවුන්සලයට යාමට නිවානෝතුමා ආරාධනය කළේය. ලෝකයේ කතෝලික දේව සභාවේ උසස්තම සභාව වන වතිකානු කවුන්සලය පාවුල පාප්තුමා සහ ගරු බිෂොප්තුමන්ලා විසින් දේවස්ථාන පිළිබඳ තීරණයන් ගනු ලබන ස්ථානයයි.

කවුන්සලයට සහභාගි වූ නිවානෝතුමාට පාප් වහන්සේ සමඟ වැඩිදුර කතාබස් කිරීමට හැකි වූ දුර්ලභ අවස්ථාව ජීවිතයේ වටිනාම අවස්ථාවක් බව කියා තිබුණි.

''දෙවියන්ගේ ආශීර්වාදය ඔබට ස්ථිරවම ලැබෙනවා, එම ප්‍රශංසනීය ක්‍රියාවන් දිගටම පවත්වා ගෙන යාමට උන්වහන්සේ කියා ඇත. තවද ක්‍රිස්තියානි ආගමත්, බෞද්ධ දර්ශනයත් අතර අන්‍යොන්‍ය අවබෝධයක් අන්තර් ආගමික සහයෝගිත්වයේ වටිනාකමත් ඉස්මතු වූ එම මොහොත නිකියෝ නිවානෝතුමා එය තම ජීවිතයේ ලැබූ උපරිම ප්‍රීතියක් යැයි ලියා ඇත. බුදුන් වහන්සේ කියා ඇත්තේ සත්‍ය ඉගැන්වීම් තිබෙන්නේ දෙක තුනක් නොව එකක් පමණක් බවය. වතිකානුවේදී එය මා ප්‍රත්‍යක්ෂ කර ගතිමි. ලෝක ආගම් සමුළුව කවදා හෝ පැවැත්වීමට එදා මම අධිෂ්ඨාන කර ගත්තා. නිවානෝතුමාගේ අදහස් ඇති අය අමෙරිකාවේ ද සිටියහ''

ආගම හා සාමය පිළිබඳ ලෝක සමුළුව:

මේ වන විට නිවානෝතුමා ලෝකයේ බොහෝ රටවලට ගොස් විවිධ ආධ්‍යාත්මික නායකයින් මුණගැසී යම් සාර්ථක සබඳකමක් ඇති කර ගෙන තිබුණා. ජාත්‍යන්තර මෙන්ම අන්තර් විශ්වාසනීය සුහදතාවයක් වර්ධනය කර ගැනීමට ඉවහල් වන පරිද්දෙන් එතුමා 20 වන සමුළුවට ද ආරාධනා ලැබුවා. 1969 දී බොස්ටන්වල පැවැති එම සමුළුවට රිසෝ-කෝසි කායි සාමාජිකත්වය ලැබී තිබුණි.

1960 මුල් කාලයේදී න්‍යෂ්ටික අවි භාවිතයේ තර්ජනයට මුළු ලෝකයම මුහුණ පා සිටි බැවින් ආධ්‍යාත්මික සමුළුවක් පැවැත්වීමේ අවශ්‍යතාවය තදින් අවශ්‍ය විය. මාටින් බූබර් පොප් ජෝන් මාටින් ලූතර් කිං ඉන්දීය ජනාධිපති රාධ ක්‍රිෂ්ණන් ඇතුළු තවත් බොහොමයක් නායකයින් එක් වී නිවානෝතුමාගේ ප්‍රමුඛත්වයෙන් ප්‍රථම ලෝක ආගම් හා සාමය පිළිබඳ සමුළුව පවත්වනු ලැබීය.

1970 වර්ෂයේ ජපානයේ කියෝටෝ නගරයේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී එය පැවැත්විණි. ආගමික නායකයන්ගේ හමුවීමෙහි විශේෂ වූ වැදගත්කමක් තිබේ. එනම් සෑම මිනිස් සබඳකමක්ම මුණගැසීමකින් ආරම්භ වන බැවින්, එය ජීවිතයේ වටිනා වරප්‍රසාදයක් ලෙස සැලකිය යුතුය යන්න නිවානෝතුමා විශ්වාස කළ දෙයකි. අමුත්තන් දෙදෙනෙක් හදිසියේ හමුවී හඳුනා ගැනීමට ලැබීම හුදෙක්ම පෙර භවයක තිබූ සබඳකම් නිසාවෙන් සිදු වන දෙයකැයි ජපානයේ ප්‍රසිද්ධ කියමනක් ද තිබේ.

ජාත්‍යන්තර ලෙස බොහෝ රටවල පැවැත්වූ සම්මන්ත්‍රණ රැස්වීම්වලට සහභාගි වූ එතුමා ලෝකයේ ජාත්‍යන්තර සාම වාහනයේ රියැදුරාම විය. උසස් ආධ්‍යාත්මික සංවිධානයන්හි වගකිවයුතු නිලතල දැරීය. තම බිරිඳ සහ පුතාත් සමඟ ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන නැරඹීමට යාමට ද එතුමා අමතක කළේ නැත. විශේෂයෙන් ජපානයේ ෂින්ටෝ ජෝඩෝ ෂින් බුද්ධාගම කීටා හෝසෝ ආදී බොහෝ ආගම් පැතිරී තිබුණෙන්, රටේ අස්සක් මුල්ලක් නෑරම සංචාරය කළ නිවානෝතුමා ඒවායේ තොරතුරු සොයා දැන ඒවායේ එකමුතුකම ඇති කළේය. ජාත්‍යන්තර ලෙස අන්තර් ජාතික උපදේශකවරයෙක් ලෙස කටයුතු කළ එතුමා ජපන් - අමෙරිකා සුහදතාවය ඇති කිරීමට හවායි දූපතෙහි විශේෂ සම්මන්ත්‍රණයක් ද පවත්වා තම අදහස මුදුන්පත් කර ගත්තේය.

නිකියෝ නිවානෝතුමා මටත් සර්වෝදයටත් ඉතා ආදරය කළ කෙනෙකි. අප දෙදෙනාම නිර්මල බුදු දහමින් අපගේ සේවාවන් හා සංවිධාන සංකල්ප පෝෂණය කරගත් අයවලුන් වීම එවැනි සමීප සබඳතාවයකට හේතු සාධක වූවා විය හැක. මා කිහිප වාරයක්ම එතුමාව ජපානයේදී එතුමාගේ සංවිධානයන්හිදී මුණගැසී තිබේ.

1992 වර්ෂයේදී 'නිවානෝ සාම ත්‍යාගය' ලබා ගැනීමට ගිය අවස්ථාවේදී නිවානෝ සාම ත්‍යාග උත්සවයේදී එතුමා හමු වූ අතර ආපසු ලංකාවට පැමිණීමට පෙර රිසෝ- කෝසි කායි ආයතනයට

ගිය අපට එහිදී එතුමා සමඟ වැඩිදුර කතාබහ සඳහා අවස්ථාව ලැබුණි. සාම ත්‍යාග උත්සවය හමාර වූ පසු ලංකාවට ඒමට පෙර කියෝටෝ බලා ගියෙමු. එහි නැවතී පසුදා උදේ එහි පන්සල් හා උද්‍යාන නැරඹුවෙමි. ඉන්පසු සෙන්චරි හයට් හෝටලයේදී අපට හමු වූ වෛද්‍ය උවේකි මහතා විසින් පැය භාගයක් පමණ අපට ස්වභාව ශක්ති ප්‍රතිකාරය (ජෝරෙයි) ලබා දෙන ලදී. පැල්පොල විපස්සී හිමියන් ද අප හමුවීමට පැමිණ සිටි හෙයින් උන්වහන්සේ සමඟ කතා කිරීමෙන් පසුව අපි රිසෝ-කෝසි කායි මූලස්ථානයට ගියෙමු.

රිසෝ-කෝසි කායි මූලස්ථානයේදී

සාමයේ ප්‍රතිරාවය
නිවානෝ සාම පදනම

නිවානෝ සාම පදනම යනු ජපානයේ ටෝකියෝ නුවර පිහිටුවා තිබෙන සමාජ සේවා සංවිධානයකි. මූලික වශයෙන් විශ්ව ප්‍රජාව වෙත සාමය උදා කර දීමටත්, විවිධ සංස්කෘතික වටිනාකම් වර්ධනය කිරීම ඇතුළු මානව වර්ගයාගේ යහපත් පැවැත්මට අදාළ වන තවත් එවැනි ශුභවාදී අරමුණු බොහොමයක් සාක්ෂාත් කර ගැන්මට ලොව සෑම තැනම ජීවත් වන ජනතාව උනන්දු කරවීමටත් එහි කාර්ය භාරයන් නැඹුරු වී ඇත. කලින් සිටම ජපානයේ ස්ථාපනය කර තිබූ ජපන් ගිහි බෞද්ධ සංවිධානයක් වූ ''රිසෝ-කෝෂි කායි'' නිර්මාතෘවරයා වූ ගරු නිකියෝ නිවානෝ මහතා විසින් එතුමාගේම නමින් මෙම සාම පදනම ද ආරම්භ කරන ලදී. සංවිධාන දෙකෙහිම එතුමා සභාපතිවරයාය.

1978 වර්ෂයේ දෙසැම්බර් පළමුවනදා ආරම්භ කරනු ලැබූ නිවානෝ සාම පදනම මගින් ආගමික වටිනාකම් මුල් කර ගත් පර්යේෂණ කටයුතු හා සම්බන්ධ විවිධ සේවාවන් වැඩි දියුණු කිරීමත් සංස්කෘතිය, අධ්‍යාපනය, විද්‍යාව, දර්ශනය ආදී අංශවලට අදාළ සාම ක්‍රියාවලීන්ට අනුග්‍රහය දැක්වීමත් සිදු කරනු ලැබේ. මීට අමතරව පදනම මගින් සිදු කරන පරිත්‍යාගයන් ද ඇත. ඒවායින් යෙන් මිලියන 38 ක් පමණ නිවානෝ සාම ත්‍යාගයටත් ඉහත සඳහන් සේවා සහ දේශන සම්මන්ත්‍රණ ජාත්‍යන්තර හුවමාරු වැඩ සටහන්වලට ඉතිරිය වැය කරනු ලැබේ. මෙම පදනමේ මූලික පරමාර්ථය වන්නේ ලෝක සාමය ඇති කිරීම සඳහා විවිධ සංස්කෘතික වටිනාකම් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව මත ලෝක ප්‍රජාව කෙරෙහි යම් සේවයක් සාධාරණත්වයක් ඉටු කිරීමය. ආගමික සංකල්පයන් පදනම් කර ගෙන සිදු කරනු ලබන පර්යේෂණ හා අනෙකුත් ඊට අදාල ක්‍රියා පටිපාටීන් වැඩි දියුණු කිරීමේ නිරතව

සිටින නිවානෝ සාම පදනම සංස්කෘතිය, අධ්‍යාපනය, විද්‍යාව, දර්ශනය යන ක්ෂේත්‍ර තුළින් මිනිස් වර්ගයාගේ අන්‍යෝන්‍ය සාමය ප්‍රතිෂ්ඨාපනය කිරීම වෙනුවෙන් මහඟු සේවයක් ඉටු කරයි.

නිවානෝ පදනම මගින් සිදු කෙරෙන කාර්යභාරයන් ප්‍රචලිත කිරීමේ දේශන සම්මන්ත්‍රණ පර්යේෂණ ලේඛකයන් බුද්ධිමතුන්ගේ ක්‍රියාකාරකම්වලට හා ජාත්‍යන්තර සමගිය ආදී සියලු ක්‍රියාකාරීත්වයන් සඳහා පදනමේ මුදල් වැය කරනු ලැබේ. සම්මන්ත්‍රණ පැවැත්වීම ආරම්භ කර තිබෙන්නේ 1981 වර්ෂයේය.

පලස්තීන ඊශ්‍රායෙලය සඳහා ගොඩනගා ඇති ක්‍රිස්තියානි අරාබි ඊශ්‍රායෙල් විශ්ව විද්‍යාල නිවානෝ සාම පදනම මගින් අධ්‍යාපනය වෙනුවෙන් දෙන ලද ආධාරවල ප්‍රතිඵලයකි.

නිවානෝතුමා විසින් සාම පදනම පිහිටුවන ලද්දේ රිසෝ-කෝෂි කායි සංවිධානයට වර්ෂ 40 ක් පිරීම නිමිත්තෙනි. ලෝකය මුහුණ පා තිබෙන අවදානම් සහිත තර්ජනයක් වන න්‍යෂ්ටික යුද්ධය කුසගින්න පාරිසාරික දූෂණය වැනි කනගාටුදායක තත්ත්වයන්ගෙන් මිනිස් වර්ගයා බේරා ගැනීමට ආගමෙහි පිහිට මිනිසාට අවශ්‍ය වී ඇත. ලෝක සාමය ඇති කිරීම හා සියලු ජන කොටස් අතර සතුට හා ප්‍රීතියත් මානව සෞභාග්‍යයත් යන පොදු අරමුණු සාක්ෂාත් කර ගත හැක්කේත් අන්‍යෝන්‍ය අවබෝධය තුළින් අවංකව වැඩ කිරීමෙන් ය. යනුවෙන් සාම පදනම පිහිටුවීමේදී නිවානෝතුමා ලෝක ජනතාවට දුන් පණිවුඩයයි.

නිවානෝ සාම පදනම විසින් නිකුත් කරනු ලබන 'එකෝස් ඔෆ් පීස්' (Echoes of Peace) සඟරාවෙහි කර්තෘ ලෙස 2002 වර්ෂයේදී මා පත් කර තිබුණි 'ආගම ගැටුම් සහ සාමය ඇති කිරීම' යන මාතෘකාව යටතේ සඟරාවෙහි මා විසින් පළ කරනු ලබන ලිපිය හැම දෙනාම අගය කළ ලේඛනයක් විය. ඒ සඳහා මට යෙන් 20000 ක් ගෙවනු ලැබීය.

ලෝක සාමය ඇති කිරීම උදෙසා අන්තර් ආගමික සහයෝගිතාවය යන්න මිනිස් ප්‍රජාව තුළ ඇති කිරීම සඳහා සැලකිය යුතු මෙහෙවරක් ඉෂ්ට කළ පුද්ගලයින් හා සංවිධානවලට ගරු කිරීමක් සහ ධෛර්යය ගැන්වීමක් ලෙස නිවානෝ සාම පදනම මගින් නිවානෝ සාම ත්‍යාගය පිහිටුවනු ලැබීය. මෙවැනි ක්‍රියාවලියක් මගින් අන්තර් ආගමික සුහදතාවයෙහි වටිනාකම අවබෝධ කර, ලෝක සාමය උදෙසා සේවය කිරීමට මිනිසුන් නැඹුරු කරවීම ත්‍යාගය පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථයයි. ඒ අතරම පදනමෙහි මූලාශ්‍ර ක්ෂේත්‍රයන් හා සම්බන්ධ වන පදනමෙහි පරමාර්ථයන්ට අදාළ සේවාවන්හි යෙදෙන ලෝකයේ හැම ප්‍රදේශයකම සිටි පුද්ගලයින් හා සංවිධාන ආයතන පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් එම පුද්ගල සංවිධාන වෙත ලෝක ප්‍රජාවගේ ද විශේෂ සැලකිල්ල යොමු කරවීම ත්‍යාගයේ ද්විතීයික අරමුණ ලෙස හැඳින්විය හැක.

නිවානෝ ත්‍යාගය ආරම්භ කරන ලද්දේ 1983 වර්ෂයේදීය. ලෝක සාමය පරමාර්ථ කොට සමාජ සේවාවට අවතීර්ණ වී, ජාත්‍යන්තර ලෙස සම්මානයට පාත්‍ර වී සිටින බුද්ධිමතුන්ගෙන් නාම යෝජනා පත්‍ර කැඳවනු ලැබේ. මේ අයුරින් නිවානෝ සම්මානලාභී විශිෂ්ට වූ ජාත්‍යන්තර පිරිසට එක්වීමට මා ද හේතු වාසනා ලබා තිබුණි. Archbishop Helder P. Camara, Dr. Homer A. Jack, Rev. Zhao Pu Chu, Dr. Philip A Potter, The World Muslim Congress, Rev. Etai Yamadu, Prof. Norman Cousins සහ Dr. Hildegard Goss-Mayr යන අය මට පෙර සාම ත්‍යාගය ලැබූවෝවූහ.

නිවානෝ සාම ත්‍යාගය සඳහා වටිනා සහතිකයක් පදක්කමක් සහ ජපන් යෙන් මිලියන ගණනක් පිරිනමනු ලැබේ. මෙම ත්‍යාගය පිරිනැමීම සඳහා කිසිම ආගමකට හෝ ලෝකයේ විශේෂිත ප්‍රදේශයකට විශේෂ සැලකිල්ලක් දැක්වීම වැළැක්වීමට ලෝකයේ සෑම ප්‍රදේශයකින්ම පිළිගත් බුද්ධිමත් පරාර්ථකාමී සේවා ක්ෂත්‍රයන්හි යෙදී සිටින අයගෙන් නාමයෝජනා එවන ලෙස

නිවානෝ සාම පදනම මගින් විවෘත ඉල්ලීමක් කර තිබුණි. එයට ප්‍රතිචාර දැක්වීමක් ලෙස පුද්ගලයින් වශයෙන් 724 ක්ද රටවල් 111 ක් මගින් ද නාමයෝජනා පත්‍ර යවා තිබුණි. බෞද්ධ ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ඇතුළු ලෝකයේ ප්‍රචලිතව ඇති අනෙක් ආගම්වලින් ද ඉදිරිපත් වූ නියෝජිතයින් හය දෙනෙකුගෙන් සමන්විත විශේෂ කොමිටියක් මගින් ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සියලුම නාමයෝජනා අයදුම්කරුවන් පිළිබඳ සියලු කරුණු සුපරික්ෂාකාරී අධ්‍යයනයකට යොමු කරනු ලැබීය.

ආචාර්ය ඒ.ටී.ආරියරත්න නමින් වූ ශ්‍රී ලංකාවේ සර්වෝදය ශ්‍රමදාන සංගමය නියෝජනය කරමින් නාමයෝජනා ඉදිරිපත් කරන ලද මා, නිවානෝ සාම ත්‍යාගය පිරිනැමීමට තෝරා ගත්තේ මන්දැයි බොහෝ දෙනා විසින් නගනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් නිවානෝ සාම ත්‍යාග පදනම විසින් නිකුත් කරන ලද ප්‍රවෘත්ති ප්‍රකාශනයේ මෙම කරුණු අඩංගු කර තිබුණි.

''ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතා භක්තිමත් බෞද්ධයෙකි. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වටිනාකම් ආරක්ෂා කර ගැනීමේ අතිශය අවශ්‍යතාව හා වැදගත්කම තදින් ආවධාරණය කිරීමේ යෙදුණ තරුණ ගුරුවරයෙකි. ශ්‍රී ලංකාවේ පැරණි සම්ප්‍රදායික ආභාෂයෙන් බෞද්ධ ඉගැන්වීම් තුළින් හැඩ ගැසී තිබුණ ශ්‍රී ලාංකික ජීවන රටාව ශත වර්ෂ හතරකටත් වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ බලපවත්වන ලද යටත් විජිත සතුරු ආක්‍රමණයන්ගෙන් විනාශ වී ගොස් තිබුණි. මහත්මා ගාන්ධිගේ ඉගැන්වීම් වන සත්‍යග්‍රහ හෙවත් අවිහිංසා ධර්මතාවය මෙම ප්‍රයත්නයේදී සුවිශේෂ ලෙස මහෝපකාරී වේ යයි ආරියරත්න මහතා විශ්වාස කළේය. එම සංකල්පයන් ක්‍රියාවට නැංවීම පිණිස ආචාර්ය ආරියරත්න මහතා තම ශිෂ්‍යයන් කණ්ඩායමක් සමඟ රජයේ ශ්‍රී ලංකා සංවර්ධන වැඩ සටහන්වලට අයත් වි නොතිබුණ කාටත් අමතක වී ගිය දුරස්ථ නොදියුණු ගම්මාන වෙත පිය නැගීය. ස්ව අවබෝධයෙන් හා ශ්‍රමදානයෙන් සියල්ලන්ගේ සාමූහික ආත්ම විශ්වාසයෙන් මහන්සි වී වැඩ කරමින් ස්වයංපෝෂිත විය යුතුය යන පණිවුඩය හැමදෙනා අතර පැතිර වීය.

කුලමල භේදයන් නිසා තවමත් සමාජයේ ඉතා පහත් යැයි සැලකෙන අසරණ වූ ජන කොට්ඨාශයන් වෙත එතුමා විසින් ඉෂ්ට කරන ලද මහඟු ශ්‍රම සේවාවන් අතිශය ලෙස සම්මානනීය වේ. ගොවිපොළවල් පාරවල් වැව් ළිං පොකුණු තනා දීම, බෝග වගාවන් සාර්ථක කර ගැනීමට අසරණ දිළිඳු ජනතාවන්ට විවිධ අන්දමින්, ආධාර කිරීම, ගැමි දරුවනට ලියන්නට කියවන්නට ඉගැන්වීමෙන් විශේෂයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපනික ක්ෂෙත්‍රය තුළ විශාල කැළඹීමක් ඇති කළේය. ඔහුව ආදර්ශයට ගත් නාගරික ගුරුවරු ද තම ශිෂ්‍යයින් හා ඔවුන්ගේ දෙමාපියන් සමඟ එවැනි දිළිඳු ගම්වලට ගොස් එහි ප්‍රජාවන්ට උදව් කරන්නට උද්යෝගීමත් වූහ. මේ අන්දමට ක්‍රම ක්‍රමයෙන් ශ්‍රමදානය තුළින් ජාතිය ගොඩනැඟීමේ මහඟු ආශ්වාදජනක කර්තව්‍යයට ජනතාව පෙළඹීමේ සංසිද්ධිය ක්‍රමයෙන් පුළුල් වුණි. ශ්‍රී ලංකාවේ ජීවත් වන බෞද්ධ ක්‍රිස්තියානි මුස්ලිම් හින්දු ආගම්වල සියලු දෙනාම එක සේ සලකමින් ජීවත්වීමේ වටිනාකම, තම ව්‍යාපාර සංකල්පය තුළින්, ප්‍රායෝගිකව මේ ලෙස ක්‍රියාවට නංවමින් ඔහු විසින් ජනතාවට එය අවබෝධ කර දී ඇත.

ශ්‍රී ලංකා ජනතාවගේ ජීවන රටාවෙහි සුභදායී පරිවර්තනයක් ඇති කිරීමට ක්‍රියාත්මක වීමට අමතරව රාජ්‍ය නොවන සංවිධානයක් මගින් පිහිටුවන ලද ලෝකයේ විශාලතම ජනතා ව්‍යාපාරයක් බවට එය මේ වන තෙක් වර්ධනය වී තිබේ. එහි මූලධර්ම හා භාවිතාවන් ලෝකයේ අනෙක් රටවල්වලටත් පැතිරී ගොස් ඇත. තම ක්‍රියාකාරකම් ලෝකයේම ප්‍රශංසාවට ලක් වූවද, තවමත් ඔහුගේ සිරිත වී ඇත්තේ ශ්‍රී ලංකාවේ දිළිඳු ජනතාව අතරේම ගැවසීමය''

1992 වර්ෂය සඳහා පිරිනමනු ලැබූ 'නවවැනි නිවානෝ සාම ත්‍යාගය' ලබා ගැනීමේ භාග්‍යය මම ලදිමි. එතැන් සිට ජපානයේ පැවැත්වූ නිවානෝ සාම ත්‍යාග ප්‍රදානෝත්සවයන් කිහිපයකට මම සහභාගි වීමි. 2003 වර්ෂයේ විසිවැනි සංවත්සරයට සහභාගි වූ මම විශේෂ දේශනයක් ද පැවැත්වීමි.

බොරු චෝදනා ගෙනා තානාපතිට අමතක නොවන පාඩමක්

සිනිඳු පාවඩ හෝ මල් පියලි මතින් ඇවිද ආ සැප පහසු ගමනක් නොවේ සර්වෝදය මෙතෙක් පැමිණියේ, විවිධාකාර බාධක ගැටළු හා මහත් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ බොහෝ දුක්ගැහැටවලට මුහුණ දෙමින් පියවරෙන් පියවර හිස ඔසවමින් මහත් ආයාසයකින් ඉදිරියට පැමිණි ගමනකි. අසරණ හා දුප්පත් ජනතාව වෙනුවෙන් අපගේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙද්දී, හොඳින් දන්නා හඳුනන අය මෙන්ම නොදන්නා පුද්ගලයින් විසින් ද අප වෙත නොයෙකුත් නින්දා අපහාස අභූත චෝදනා එල්ල කරන ලද අවස්ථා එමටය. ඒ ඒ වකවානුවලදී රටේ බලය අල්ලා ගෙන සිටි ආණ්ඩු, එහි බලකාමී ඇමතිවරු හා නිලධාරීන් හා රාජ්‍ය පාක්ෂික මාධ්‍ය යන මේ සියලු මාර්ගයන් ඔස්සේ අපට කරන ලද තර්ජන එදිරිවාදිකම් නිසා බොහෝ කරදරවලට අපි මුහුණ පෑවෙමු.



ජපානයේ ශ්‍රී ලංකා තානාපති චිතම්බරනාදන් මහේන්ද්‍රන් මහතා

ජපානයේ ශ්‍රී ලංකා තානාපති ලෙස සේවය කළ චිතම්බරනාදන් මහේන්ද්‍රන් තානාපතිවරයා ගැන ද කිවහැක්කේ, ඔහු ශ්‍රී ලංකාවේ පාලන බලයට හේත්තු වී හැංගිමුත්තම් කරමින් අප ව්‍යාපාරයට අපහාස වන ආකාර බොරු ප්‍රචාරයන් පතුරුවමින්, මඩගැසීම්වල යෙදුණ අපට හිරිහැරයක් වූ පුද්ගලයකු බවයි.

අපට පහර ගැසීමට කුරුමානම් අල්ලමින් සිටි ඔහු, ඒ සඳහා භාවිතා කළේ සර්වෝදය ව්‍යාපාරයට අසත්‍ය චෝදනා එල්ල කරමින් 'ඩේලි නිවුස්' පත්‍රයේ ව්‍යාජ නාමයක් යටතේ පළ කර තිබූ ලිපියක පිටපතකි. මහේන්ද්‍රන් එසේ මෙසේ මිනිසෙක් නොව ඒ කාලයේ 1992 වර්ෂයේ ජපානයේ ටෝකියෝ නගරයේ සිටි ශ්‍රී ලංකා තානාපතිවරයාය. රොබට් වයිට් මහතාත්, මාත් අතර තිබූ සමීප හිතවත්කම් ගැන නොදැන සිටි මෙම තානාපතිවරයා එම 'ඩේලි නිවුස්' පත්‍රයේ තිබූ ලිපියේ පිටපතක් රොබට් වයිට් මහතාට ෆැක්ස් පණිවුඩයක් මගින් යවා, සර්වෝදයට උදව් කිරීම නවත්වන ලෙස කියා සිටියේය. වෙනත් අපට උදව් උපකාර කළ අනිත් අයවළුන්ගේ ලිපිනයන් සොයා ඔවුනට ද ඔහු මෙවැනි ෆැක්ස් පණිවුඩ යවා තිබුණේය. අප ව්‍යාපාරයට මඩ ගැසීමට ලැහැස්ති වූ ඔහුට සිදු වූයේ නයාට ගසා පොල්ල වරද්දා ගැනීමක් බඳු දෙයකි. චිතම්බරනාදන්ට, රොබට් වයිට් මහතාගෙන් පිළිතුරු ලිපියක් ලැබිණ. විලි ලැජ්ජාවක් ඇත්නම් එවැනි වැඩ නැවතත් නොකරන්නට කදිම පාඩමක් ඉන් උගන්වා තිබුණි.

ARC INTERNATIONAL LTD.

රොබට් වයිට්
සභාපති
අප්‍රේල් 9 1992

ගරු චිතම්බරනාදන් මහේන්ද්‍රන් මහතා,
ජපානයේ ශ්‍රී ලංකා තානාපති,
ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකා ජනරජය,
1-14-1 අකසාක,
මිනාටෝ,
ටෝකියෝ 107.

ශ්‍රී ලංකා තානාපති මහේන්ද්‍රන්

ශ්‍රී ලංකාවේ ''ඩේලි නිවුස්'' පුවත් පතෙහි 1992 අප්‍රේල් 06 වන දින සර්වෝදය පිළිබඳව පළ වී තිබූ ලිපියක ෆැක්ස් පිටපතක් ඔබගේ

තානාපති කාර්යාලය විසින් මා වෙත එවා තිබේ. පසුගිය මාස 18 ක් තුළදීම සර්වෝදය ගැන පුවත්පත්වල පළ කර තිබූ ලිපි මා විසින් කියවා තිබූ හෙයින්, එවැන්නක් ලැබීමෙන් මා සතුටට පත් වීමි.

එහි අන්තර්ගතයන් තුළින් මා දකින්නේ වාර්තාකරණයේ යුක්ති ධර්මය ද උල්ලංඝනය කරමින් ඉදිරිපත් කර ඇති දෙයක් ලෙසටය. මන්ද යත් පසුගිය මාස 18 තුළදීම ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය පාක්ෂික පුවත්පත් මගින් ආචාර්ය ආරියරත්න මහතාට කරන ලද එදිරිවාදීකම් ව්‍යාපාරය පිළිබඳව යන්තමින් හෝ එහි කිසිම තැනක සඳහන් වී නැති වීමය. එහි ප්‍රධාන ලෙසට ආචාර්ය ආරියරත්න මහතා විසින් වර්තමානයේදී ගෙන යනු ලබන ක්‍රියාමාර්ගයන් වැරදි ආකල්පයන් මත රජය විසින් සිදු කරනු ලැබූ එම වංචාසහගත හා කුමන්ත්‍රණකාරී ක්‍රියාපටිපාටීන්වල ඍජු ප්‍රතිඵලයන්මය.

තවදුරටත් කියතොත් මේ සියලු මාධ්‍ය වාර්තාවල අන්තර්ගත වන දෝෂාරෝපණයන් ඔවුනට සත්‍ය යැයි ඔප්පු කර පෙන්විය නොහැකි ඒවාය. ශ්‍රී ලංකාවේ දුප්පත් මිනිසුන් වෙනුවෙන් පසුගිය වර්ෂ 30 තුළදී සර්වෝදය විසින් ඉෂ්ට කර තිබෙන සේවාවන්හි සත්‍ය, ඵලදායීතාවයන් පිළිබඳ කිසිවක් ඒවායේ සඳහන් කිරීමට ඔවුන්ට නොහැකි වි ඇත. අප විසින් දෙනු ලබන පරිත්‍යාගශීලී ආධාර භුක්ති විඳින්නා වූ සංවිධාන ලෝකය පුරා ඇත. නමුත් පූර්ණත්වය හා කාර්ය සාධකතාවය ස්ථාපිත කර ගැනීම සම්බන්ධයෙන්, සර්වෝදය ව්‍යාපාරය අභිබවා යාමට ඒ කිසිම සංවිධානයක් හෝ ආයතනයකට ශක්තියක් නැත. සර්වෝදය ව්‍යාපාරයට මූල්‍යමය ආධාර ලබා දීම අපි දිගටම කර ගෙන යන්නෙමු. නමුත් ශ්‍රී ලංකා රජය හා සම්බන්ධව මෙතෙක් ලබා දුන් සියලු ආධාර සත්‍ය වශයෙන්ම අද සිට ක්‍රියාත්මක වන පරිදි, නවත්වනු ලැබේ. සර්වෝදය ව්‍යාපාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රතිචාරය කුමන ආකාරයේ දැයි දැන ගැනීමට, එම රජයේම නියෝජිතයෙක් ලෙස ඔබට ලැබෙන ඉඩප්‍රස්ථාව ද සීමාසහිත බව සාපේක්ෂ ලෙස මා දන්නා කරුණකි. රජයේ එම ක්‍රියාපටිපාටීන් කෙරෙහි මා සම්පූර්ණයෙන් විරුද්ධ වූවත්, මා එය ද අවබෝධ කර ගෙන සිටින දෙයකි.

මනුෂ්‍යයෙක් හා මහත්මයෙක් හැටියට ඔබේ රජය ගැන ඔබ ලැජ්ජා විය යුතුය. මා බලාපොරොත්තු වන්නේ නිශ්ශබ්දව ක්‍රියාකාරී වෙමින් ශ්‍රී ලංකාවට ඉතාමත් වටිනා මෙවැනි මානව සම්පත් කෙරෙහි නින්දාසහගත බොරු චෝදනා එල්ල කිරීම වැළැක්වීමට ඒ පිළිබඳව වගකිවයුතු පුද්ගලයින් වෙත යම් සාර්ථක බලපෑමක් ඔබ විසින් ගනු ඇතැයි යන්නය.

මෙයට

රොබට් වයිට්

පිටපත:
ආචාර්ය ඒ.ටී. ආරියරත්න

* * *

රොබට් වයිට් යනු කවුරුන් දැයි නොදන සර්වෝදය ව්‍යාපාරය හා මම ගැන සත්‍ය තතු වසන් කරමින් කරන්නට යෙදුණ එවැනි පහර ගැසීමකින්, ඔහු හොඳටම ලැජ්ජාවට පත් වන්නට ඇත.

නීතා, රොබට් වයිට් මහතා සහ මම

ඒ කාලයේ පමණක් නොව, දැනුදු කොතරම් අසාධාරණ වුවද පාලක ආණ්ඩු පක්ෂයට හේත්තු වී, සමාජයට හිතැතීන් අධෛර්යවත් කර ගල් ගසා පලවා හරින්නට වෙර දරන පුද්ගලයෝ එමට සිටිති. රොබට් මහතා විසින් මා වෙත එවන ලද මෙම පිළිතුරු ලිපියේ පිටපතක් ඒ දිනවල ජාත්‍යන්තර සබඳතා පිළිබඳව ජනාධිපති උපදේශකව සිටි බ්‍රැඩ්මන් වීරකෝන් මහතාට ද යවා තිබුණි.

රාජ්‍ය නොවන සංවිධාන විසින් දේශපාලනයේ යෙදීම විනාශකාරී ක්‍රියාවකි, යන මාතෘකාව යටතේ 'ඩේලි නිවුස්' පත්‍රයේ පළ කර තිබූ එම ලිපිය ඉදිරිපත් කර තිබුණේ මහින්ද සෙනෙවිරත්න යන ව්‍යාජ නාමයකිනි. ඒ නමින් පුද්ගලයෙක් නොසිටි බව අපට තහවුරු කර ගැනීමට වැඩි අපහසුවක් වූයේ නැත. මා ඇතුළු අපගේ සමස්ත ව්‍යාපාරය කෙරෙහිම ඊෂ්‍යා සහගත, ද්වේශ අදහස්වලින් පිරී තිබූ එම ලිපිය මගින් අප ව්‍යාපාරයේ ක්‍රියාපටිපාටීන් වැරදි හා ප්‍රතිවිරුද්ධ ආකාරයට තක්සේරු කර තිබුණි. ''NGO'' පෙඩරේෂන් සංයුතියක් ගැන එහි කියා තිබුණ නමුත් ඒ කුමක් දැයි යන්න පැහැදිලි හෝ කිසිවක් සඳහන් කර තිබුණේ නැත. එය ද යම් විදියක වංචාසහගත සැඟවීමකි එසේ කර තිබුණේ නම් ඩේලි නිවුස් පාඨකයින්ට පමණක් නොව, සමහර විට 'NGO' යන්නට සම්බන්ධ වී සිටින සියලුදෙනා විසින්ම ද, මහින්ද සෙනෙවිරත්න හා ඔහුගේ ව්‍යාජ තර්කයන් ලෝකයට සැබෑ කරවීමට උපයෝගී කර ගත් ලිපිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනවාට සැකයක් නැත. මගේ ඡායාරූපයක් එම ලිපිය සමඟ පළ කර තිබීම හාස්‍යයට කරුණකි. මගේ නොව පළ කරන්නට තිබුණේ ඔහුගේ ඡායාරූපයකි. එවිට ඔහු කවුදැයි හඳුනා ගැනීමෙන් යථාර්ථය තේරුම් ගැනීමට හැම දෙනාටම හැකි වනු ඇත. අනිත් අතින් බලන විට මහින්ද සෙනෙවිරත්න යන ව්‍යාජ ප්‍රතිරූපය පිටුපසින් සැඟවී සිට හැංගිමුත්තම් කරන ප්‍රතිවාදියා, ප්‍රසිද්ධ පුද්ගලයෙක්ම විය හැකි අතර ඔහුගේ පින්තූරය පළ කළා නම් සර්වෝදයට ගල් ගැසීම පසෙක තබා ඔහුට සිදු වන්නේ තමන්ගේම පරාජයත් නිවට-නියාලුකමත් තමන් විසින්ම ලෝකයට දිගහැර පෙන්වීමටය. මෙවැනි මිනිසුන්

ඇත්තටම බියගුල්ලන්ය. නමුත් චිතම්බරනාදන් තානාපතිවරයාට ඔහු මහා වීරයෙක් විය. ලොවටම ආදර්ශවත් වයිට් මහතාගෙන්, තම ජීවිතයටම වටිනා පාඩමක් ඔහු විසින් ඉගෙන ගත්තා යැයි මගේ විශ්වාසයයි.

මහින්ද සෙනෙවිරත්නගේ ලිපියට නිසි පිළිතුරු ඩේලි නිවුස් පත්‍රය වෙත මා ලියා යැවූ නමුත්, එය පළ වූයේ නැත. රජය විසින් පුවත් පාලනය කිරීම නිසා මුල සිටම අප විසින් යවන ලද ලිපි සාමාන්‍යයෙන් එම පත්තරවල ප්‍රසිද්ධ කළේ නැත. එසේ වුවද ඉහත සඳහන් බොරු චෝදනා සහ අවමන්වලට සම්පූර්ණ ලෙස ප්‍රතිවිරුද්ධ වූ ආකාරයේ යම් ප්‍රසිද්ධියක් දිගු කාලීනව හා සදාතනිකව ලබා ගැනීමේ වරප්‍රසාදය අප ව්‍යාපාරයට ලැබීම ගැන සැනසීමක් තිබෙන බව මම එම පිළිතුරෙහි සඳහන් කළෙමි.

ඒ කාලයේ හෝ ඊට පෙර කිසිම රජයක් විසින් අපට ප්‍රමාණවත් තරමින් හෝ ආධාරයක් විදේශ සම්පත් දායක ආයතනයකින් ආධාර ගැනීමට හැකි වන පරිදි එවැන්නකට හඳුන්වා දීමක් හෝ අනුමත කර දීමක් රජය හරහා එවැනි ආධාර ලබා ගැනීමේදී විශේෂ සහනයක් හෝ කවදාවත් ලබා දී තිබුණේ නැත.

පත්‍රයේ පළ නොවූව ද, සෙනෙවිරත්නගේ ලිපිය මගින් එල්ල කරනු ලැබූ චෝදනාවන්ට නිසි පිළිතුරු මගේ ලිපියෙන් සැපයී තිබුණි ''ගැමි ප්‍රජාව අවදි කිරීමේ රජයේ ව්‍යාපාරය සම්බන්ධයෙන් සර්වෝදයට වැඩි අවධානයක් ලැබුණා'' සර්වෝදයට තවත් චෝදනාවකි. කිසිවක් හරි හැටි නොදන කරන මෙවැනි චෝදනා ගැන ඔහු ලැජ්ජා විය යුතුය. රජය විසින් ගැමි ප්‍රජාව අවදි කිරීමේ ව්‍යාපාරය පටන් ගන්නා විට, සර්වෝදය විසින් අපේ ගම්මානවල එම වැඩ සටහන් ආරම්භ කර දශක දෙකක්ම ගත වී හමාරය. එබැවින් අප සිටින්නේ එම කියමනෙහි ප්‍රතිවිරුද්ධ පැත්තෙහි එනම්: සත්‍යය තුළයඃ සර්වෝදය මගින් ආරම්භ කරන ලද ගම්උදා ව්‍යාපාරය ද ඒ සමඟම එහි ප්‍රධාන සංචරකයක් වූ ගැමි ප්‍රජාව අවදි කිරීමේ ක්‍රියා පටිපාටියත් අප විසින් රජයට නිදර්ශනය කර දුන් අතර, එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය හා මඟ

පෙන්වීම ද රජය වෙත පිරිනැමූ අපි අපේ උදාගම් ව්‍යාපාරයේ නාමය ද ''ගම් උදාව'' යනුවෙන් රජයට ප්‍රදානය කළෙමු.

ඒ කාලයේ අප විසින් සෘජුවම රජය වෙනුවෙන් හැකි හැම සහයෝගයක්ම ලබා දුන් අතර, කුමන අවස්ථාවකදී වුවද රජය විසින් සර්වෝදයෙන් යම් උපකාරයක් ඉල්ලා සිටියේ නම්, කෙතරම් දුෂ්කරතා බාධකවලට මැදි වී සිටිය ද හැම විටම කැමැත්තෙන්ම උපරිම සහයෝගය ලබා දුන්නෙමු. බොහෝ අවස්ථාවලදී ප්‍රේමදාස අගමැතිතුමා විසින් ප්‍රසිද්ධියේම ඒ බව අප වෙත දන්වා තිබේ. රජය මගින් වෙනත් ක්‍රමවලින් ද ජනතාවට අවශ්‍ය උදව් උපකාර සර්වෝදය හරහා ලබා දී තිබේ. මගේ අදහස වූයේ ඇත්තෙන්ම එය සිදුවිය යුතු දෙයක් බවය. එම වර්ෂයේ අපට ලැබුණු වාර්ෂික ආධාර ප්‍රමාණය 50% කින් වැඩි වී ඇති විදියට, ඔහු විසින් ගණන් බලා ඇත. මගේ ප්‍රාර්ථනය වූයේ එය එසේම වේවා යන්නය.

මාධ්‍ය ක්ෂෙත්‍රයේ සමහර අංශවල පුද්ගලයින් බොරු ගොතමින් පතුරන අසත්‍ය කතාවන්ට අපේ සම්පත් දායකයින් මුලා නොවීම, මෙතැනදී අවධාරණයෙන් සඳහන් කළ යුත්තකි. ඒ අය සමඟ අප අත්සන් කර ඇති පොරොන්දු ගිවිසුම් ද කිසිවිටෙක අප විසින් උල්ලංඝනය කර නොමැත. හැම විටම අප ක්‍රියා කර ඇත්තේ නීතියට අනුකූලවය.

''පාද යාත්‍රාව'' ගැනත් ඔහු වරද්දා ගෙන තිබේ. මහින්ද රාජපක්ෂ ප්‍රධාන සෙසු වාමාංශික නායකයන් රජයට විරුද්ධව කොළඹ සිට කතරගම දක්වා පාදයාත්‍රාවක් සංවිධානය කළ යුගය වන විට ප්‍රේමදාස රජය විසින් සර්වෝදය කටයුතු ඉදිරියට ගෙන යැමට නොහැකි අන්දමට බාධක පමුණුවා තිබුණි. ඒ නිසා විරුද්ධ පක්ෂය විසින් ගෙන යන ක්‍රියාමාර්ගයට එකතුවීමට මම ද තිරණය කළෙමි. ඒ අනුව පාදයාත්‍රිකයන් පිරිස මොරටුවට පැමිණි අවස්ථාවේදී මොරටුවේදී කිසිවෙකුට ඔවුන් පිළිගැනීමට ඉඩ නොදෙන අන්දමට හිටපු ඇමතිවරයෙකු වූ ටිරෝන් ප්‍රනාන්දු මහතා තහංචි පනවා තිබුණේය. මෙය ආරංචි වූ වහාම මම රාවතාවත්ත

සිරිසේන ධර්ම මන්දිරය ඉදිරිපිටට ගොස් පාදයාත්‍රිකයන් පිළිගතිමි. ඔවුන් සමඟ ටික දුරක් ගමන් කළෙමි.

තංගල්ලේ බෝ මළුව යටදී භාවනා වැඩ සටහන පැවැත්වූයේ, නායකයන් කිහිපදෙනෙක් පැමිණ ඒ සඳහා මට ආරාධනා කළ නිසාය. එවැනි ආරාධනයක් කිරීමට මෙන්ම, මට එය පිළිගැනීමට ද එක හා සමාන අයිතියක් ඇත. එහිදී සහභාගි වූයේ අපගේම නායකයින් මිස, ඒ කිසිවෙකු විදේශිකයින් නොවේ. මහින්ද රාජපක්ෂ, දිනේෂ් ගුණවර්ධන, වාසුදේව නානායක්කාර, ධර්මසේකර, රාජිත සේනාරත්න, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ, මහින්ද අබේකෝන් යනාදී මහත්වරුන් එම අවස්ථාව නියෝජනය කළ මේ හැම දෙනාම අපගේම භූමි පුත්‍රයින්ය.

පාද යාත්‍රා රථය මොරටුව සර්වෝදය මන්දිරයට ළඟා වූ අවස්ථාවේදී සර්වෝදය නායක ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා ප්‍රමුඛ පිරිසක් විසින් පිළිගන්නා ලදී.

පාද යාත්‍රාවේ කැඳවුම්කරු හම්බන්තොට දිස්ත්‍රික පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මහතා, සර්වෝදය නායකයා විසින් ඉතා උණුසුම් අන්දමින් පිළිගනු ලැබූ අවස්ථාවයි මේ.

(ඡායාරූපය - කමල් ජයමාන්න)

පාදයාත්‍රාව මොරටුවේදී පිළිගැනීම



තංගල්ල බෝ මළුව ඉදිරිපිට භාවනාව මෙහෙයවීම

මහින්ද සෙනෙවිරත්න නැමති ලේඛකයෙක් චෝදනා කර තිබුණේ, මා එහිදී විදේශිකයින් ද සහභාගි කරවා ගෙන දේශපාලනය කළ බවය. නිලතල සීමාවන්ගෙන් බැහැරව ක්‍රියා කිරීමේ අයිතිවාසිකම ප්‍රජාතන්ත්‍රවාදයේ හරය වන බැවින්, මම එහිදී ඔහු කී පරිදි කිසි විටෙකත් භාවනාවට දේශපාලනය මුසු කර නොගත්තෙමි. ඩේලි නිවුස් පත්‍රය වෙත මගේ ලිපිය සමඟ භාවනා වැඩ සටහනේ කැසට් පටිය ද යැවූයෙන්, ලිපිය පළ කරනු ලැබුවා නම්, සැම දෙනාටම එහි දේශපාලනය ඇත්දැයි බලා ගැනීමට තිබුණි.

රාජ්‍ය නොවන සංවිධානවලට හිරිහැර කිරීමෙන් ඉන්දියාව, බංගලාදේශය, පිලිපීනය යන රටවලට ඇත්තටම සිදු වූයේ කුමක් ද යන්න සෙනෙවිරත්න මහත්මා නොදැන සිටීම ගැන මම කනගාටු වන අතර, ඔහු විසින් දී තිබුණ එම අවවාදය, ඇත්ත වශයෙන්ම තමා විසින් ආධාර කළ යුතු රජයක් වෙත ඉදිරිපත් කළ යුතු හිත මිතුරු උපදේශයක් නම් නොවන බව පැහැදිලිය.

සර්වෝදය විසින් මෙතෙක් කටයුතු කළාක් මෙන්, අප නිතරම ප්‍රකාශ කළ ආකාරයටම අපි ආණ්ඩු විනාශ කරන්නේවත් අලුතින් බිහි කරන්නේවත් නැත. එසේ කිරීම බලකාමී දේශපාලනඥයින්ගේ ක්‍රියා පටිපාටියයි. අපගෙ අවධානය යොමු වී තිබෙන්නේ ජනතාවගේ, විශේෂයෙන්ම දිළිඳු ජනයාගේ ඕනෑ එපාකම් කෙරෙහිය. අපගේ අරමුණ ජනතාව සඳහා ජනතාව සමඟ වැඩ කරමින් ජීවත් වන්නටය. අපි ආණ්ඩු විරෝධීන් ද නොවෙමු. නමුත් මහජනතාවට සත්‍යය ඒත්තු ගන්වමු. එම මූලික අයිතිවාසිකම නැවත ලබා ගැනීමට හෝ පාවිච්චි කිරීම සඳහා අපි ඕනෑම අලාභයක් විඳගන්නෙමු. විදේශාධාර සම්බන්ධයෙන් ද එසේමය.

තංගල්ල බෝ මළුවේ භාවනාව අවසානයේදී මා යමක් ප්‍රකාශ කළ බව සත්‍යයකි. ''කවදා හෝ මගේ අයිතිවාසිකම් මුළුමනින් උල්ලංඝනය කළහොත්, නීතියට අනුව ජනතාවට සේවය කරන්නටත් ජීවත් වන්නටත් එදාට මම පන්ලක්ෂයක සෙනඟක් සමඟ ඉදිරියට එන්නෙමි'' යන්නයි.

ඒ කාලයේදී සර්වෝදය තුළ අපේ බොහොමයක් අයිතිවාසිකම් අපට අහිමි වී තිබීම එයට හේතුවය. සෙනෙවිරත්න මහතා විසින් සම්පත් දායක ආයතන හා විදේශ අමාත්‍යාංශය වෙත යොමු කර තිබූ ප්‍රශ්නවලට පිළිතුරු දීම, ඒ අංශවලට බාර කළ මම, සර්වෝදය හා ඉහත කී වත්කම් හා බොහෝ දේවලුත් ආදරයෙන්, ස්වාධීනත්වයෙන් භුක්ති විඳිනු ලබන්නා වූ එහි කීර්තිමත් නාමයත්, මේ රටේ හා මුළු ලෝකයේමත් සිටින කෘතවේදී මනුෂ්‍යයනුත්, එක් දිනකින් නිර්මාණය වූ දේ නොවන බව මහින්ද සෙනෙවිරත්න මහත්මා සහ ඔහුගේ ඒකාබද්ධ බලමණ්ඩලයට නැවතත් මතක් කළෙමි. උපහාස-සමච්චල් හා අපයෝජන ක්‍රියාවලි, මැඬ පැවැත්වීම්වලින් අපව බිය වැද්දීමට හෝ අධෛර්යට පත් කළ නොහැකිය. සත්‍යය හා සාධාරණත්වය යනු කුමක් ද යන්න තරයේ ග්‍රහනය කර ගනිමින්, අප ජීවත් වී මිය යනවා මිස, රැවටීමෙන් බිය කිරීමෙන් අපේ සම්පත් කිසිවෙකුට අත්පත් කර ගැනීමට ඉඩ නොදෙන බව ද අවසාන ලෙස සඳහන් කළෙමි. ධර්මිෂ්ටකම හා සත්‍යය මත පදනම් වූ ජනතාවගේ ව්‍යාපාරයක, එහි සංකල්පයෙහි සාරය ද එයම වේ.

එදා මා විසින් මෙහෙයවනු ලැබූ භාවනාවේදී එහි මූලික පරමාර්ථයන් වන්නේ සම්පූර්ණයෙන් සිත එකග කර ගැනීම හා තමන් පිළිබඳව දැන ගැනීම බව මම ප්‍රථමයෙන් කියා දුනිමි.

එහි සත්‍ය පරමාර්ථය හෝ අර්ථය ගැන යන්තම් අවබෝධයක් ඇත්නම් මෙවැනි අගතිගාමී දෝෂාරෝපණ එල්ල නොකරනු ඇත. සමාජයට මෙන්ම, අපගේ ජීවිත කෙරෙහි ද යම් බලපෑමක් ඇති කරන්නා වූ යම් යථාර්ථයන් අවබෝධ කර ගැනීමට හා අපගේ සිත් සන්සුන් කර ගැන්මට භාවනාව උදව් කරන බව හැම දෙනාටම පැහැදිලි කළෙමි.

සත්‍යයට තදින් ග්‍රහණය වී සිටීම, සත්‍යග්‍රහය ලෙස ද සත්‍යයට තදින් ඇලී සිටීමෙන් අති විශාල ශක්ති ප්‍රමාණයක් ජනනය කරන නිසා එය 'සත්‍ය ක්‍රියා' ලෙස හැඳින්විය හැකි බවත් කියා දුනිමි.

දෙවනුව ජීවය පවත්වා ගැනීමට උපකාරී වන සමාජ ස්ථායීතාවය වැනි පද්ධතීන් විනාශ කරමින්, දිනෙන් දිනම මනෝ විද්‍යාත්මක සමාජීය හා ස්වභාවික පරිසරයන් දූෂණයට ලක් වනු ලැබේ.

තෙවනුව මනුෂ්‍යයින් වශයෙන් අපේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇත. අපේ නිදහස මැඩ පැවැත්වීම දවසේ කාර්ය භාරය වී ඇත.

සිව්වනුව ප්‍රචණ්ඩත්වය හා යුද්ධ හමුදාව යෙදවීම පුළුල්ව පැතිරී ඇත. එය අපේ ජනතාවගේ දුක තවත් වර්ධනය කරන්නකි.

මා විසින් රැස්වූ පිරිසට කියා දුන් මෙවන් සත්‍ය ධර්මතාවයකට දේශපාලනය පිවිස ඇත්නම් ඒ කෙසේ දැයි මම නම් නොදනිමි.

ඒ දිනවල අපේ ග්‍රාම සංවර්ධන සේවා සම්බන්ධයෙන් දුරස්ථ ප්‍රදේශවල ක්ෂෙත්‍රසේවා සඳහා මා බැහැරව ගොස් සිටි, නිසා ලොකු දුව චාරිකා විසින් වයිට් මහතාට ස්තුති කර පිළිතුරක් යවා තිබුණි.

මේ රටේ ආණ්ඩු පක්ෂය විවිධ කුමන්ත්‍රණ මගින් අපට හිරිහැර පමුණුවන මෙවන් අවස්ථාවක, මගේ පියා සහ සර්වෝදය ව්‍යාපාරය වෙත ඔබ වැනි ලොව වටා වෙසෙන අනිකුත් සාධාරණ වූ පුද්ගලයින්ගෙන් මෙවැනි අවංක සහයෝගයන් ලැබීම පිළිබඳව අපි සතුටු වෙමු. ඒ සඳහා අතිශයින් ස්තුතිවන්ත වන බව එහි සඳහන් කර තිබුණි. මහින්ද සෙනෙවිරත්න කෙනෙක් පමණක් නොව, රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ඒකාබද්ධ බලමණ්ඩලයක් යන්නක් ද කොහෙත්ම නැති බව එමගින් දන්වා යවා තිබුණි. මේ හැම දෙයකම අවසාන ප්‍රතිඵලය වූයේ, ආර්ක් ආයතනය හා අපේ හිතවත්කම් තව තවත් අලුත් වීමය.

තානාපති මහේන්ද්‍රන්ගේ අපට විරුද්ධව කරනු ලැබූ තවත් මඩ ගැසීමක් ජපානයේදී මට අසන්නට ලැබුණි. අනූදෙක වර්ෂයේ 'නිවානෝ සාම ත්‍යාගය' ලබා ගැනීම සඳහා මාත්, නීතාත් ජපානයට ගිය අවස්ථාවේදී ආසියා සංස්කෘතික සංවිධානයේ සභාපති කමිසකමූටෝ යුවළ සමඟ අපි ෂීබා ප්‍රදේශයේ සංචාරයක් සඳහා ගියෙමු. ජපන් තානාපති මහේන්ද්‍රන් ශ්‍රී ලංකා මිත්‍ර සංගමයේ මහ ලේකම් සමඟ කරනු ලැබූ ගුවන් විදුලි සාකච්ඡාවකට එහිදී අපි සවන් දුනිමු. මහේන්ද්‍රන් විසින් එහිදී ද සර්වෝදය ගැන බොරු ප්‍රචාරයක් ගෙන ගියේය එල්.ටී.ටී.ඊ. යට සර්වෝදය විසින් මුදල් දෙන බවක් එහිදී කියැවිණ.

නිවානෝ සාම ත්‍යාගයට තානාපති විරෝධය

1992 වර්ෂයේ අප්‍රේල් 06 වෙනිදා නීතා හා නිම්නාත්, මාත් ලංකාවෙන් පිටත් වී හත්වෙනිදා උදේ එයාර් ලංකා ගුවන් යානයකින් ටෝකියෝ බලා ගියෙමු. අප එහි ගියේ ජපානයේ නිවානෝ සාම පදනම මගින් පිරිනමනු ලබන නව වැනි නිවානෝ සාම ත්‍යාගය සඳහා මා තේරී තිබුණු බැවින් එය පිළිගැනීමටත් ඒ හා සම්බන්ධිත උත්සව වැඩ සටහන් මාලාවට සහභාගි වීමටත්ය. නිවානෝ සාම පදනමේ අධ්‍යක්ෂ, මීනාමි ව්‍යාපෘති නිලධාරීන් වන ඕනෝ හා හයාපි සහ ප්‍රකාශන අංශයේ නගායි යන මහත්වරු නරීටා ගුවන් තොටුපළේදී අප පිළිගත්හ. එතැන් සිට පැය එකහමාරක පමණ ගමනකින් පසු අපි දහවල් එකට පමණ සෙන්චරිහයට් හෝටලයට ළඟා වීමු. එහි හයවෙනි තට්ටුවෙහි 636 කාමරයේ අපට නවාතැන් පහසුකම් සලසා තිබුණි.

ඉදිරි වැඩ සටහන් පිළිබඳව සාකච්ඡා කිරීමට අප පිළිගත් නිලධාරීන් තිදෙනා ෆුජිටා (Fujita) මහතා ද සමඟ සවස 3.00 ට අප හා එක් වූහ. ආනන්ද හාමුදුරුවෝ, ක්‍රිස්ටියන් සොරෙන්සොට් මහතා පැමිණ අප සමඟ රාත්‍රී ආහාරය ගත්හ. මහාචාර්ය ජින් හිරානෝ මහතා අප බැලීමට පැමිණියේය.

නිවානෝ සාම පදනමේ ගරු එම්. නගාමුනා මහතා, මිනාමි ඕනෝ සහ හයාපි යන මහත්වරුන් සමඟ 8 වෙනිදා උදේ නිල වශයෙන් මා හමුවීමට පැමිණියහ. මීට පෙරද කිහිප වාරයක් මගේ නම යෝජනා කර තිබුණත්, මෙවර මෙම ත්‍යාගය මට ප්‍රදානය කිරීමට ලැබීම ගැන තමා ඉතා සතුටු වන බව නගාමුනා මහතා ප්‍රකාශ කළේය. උදේ දහයේ සිට දෙකහමාර දක්වා අපි පූජිමා හා නගායි මහත්වරුන් සමඟ ජපන් අධිරාජයාගේ මාලිගාව හා

කෞතුකාගාරය නැරඹීමට ගියෙමු. කොණ්ඩෝ මහතා සහ හර්ෂ ලියනගේ මල්ලී ද සවස පැමිණියහ.

කොණ්ඩෝ මහතා මා සමඟ පෞද්ගලික සාකච්ඡාවක් පැවැත්වූ අතර, එය ඉතා වැදගත් එකක් විය. වැළලී ගොස් තිබුණු යටගියාවෙන් යමක් මට එහිදී හෙළිදරව් විය. සර්වෝදය සඳහා ඩොලර් මිලියනයක සම්පත් දායක අරමුදලක් (Endowment) පිහිටුවීමට සසකාවා ආයතනය යෝජනා කළ විට, එවකට සිටි කරුණාසේන කොඩිතුවක්කු ශ්‍රී ලංකා තානාපතිවරයා එය විශ්ව විද්‍යාලයට ලබා දීමට යෝජනා කර ඇත. ඔහු මාරු වී ගිය විට එය අමතක වී ගියෙන් එම ලිපිගොනුව හදිසියේ දුටු ඊළඟට පත්වූ මහේන්ද්‍රන් තානාපතිවරයා සසකාවා ආයතනයේ නියෝජිතයෙක් ගෙන්වා, එම මුදල ජනාධිපති ප්‍රේමදාස අරමුදලට එක් කිරීමට යෝජනා කර තිබේ. සසකාවා පදනමින් එම අදහස ප්‍රතික්ෂේප කළ හැටි කොණ්ඩෝ මහතා කදිමට විස්තර කළේය. තවද ඉන් පසුව මහේන්ද්‍රන් මහතා සර්වෝදයට දෙනු ලබන ආධාර සියල්ල නවත්වන ලෙස සසකාවා පදනමට දෙවරක්ම බල කර ඇත. මෙවැනි පහත් ක්‍රියාවන්හි ප්‍රතිඵලය වී ඇත්තේ තානාපතිතුමාගේ හා ජනාධිපතිතුමාගේ නම කෙළෙසා ගෙන තිබීමත් සර්වෝදය කෙරෙහි පදනමේ තිබෙන ගෞරවය විශ්වාසය තවත් වර්ධනය වීමත්ය.

එම සාකච්ඡාවෙන් පසු එදා දවස මත්සුෂිටා ආයතනයේ ගත විය. එහි අධ්‍යක්ෂ ජෝකෝ හා ඔකාඩා මහත්වරුන් ද මගේ පැරණි මිතුරන් ද එහිදී හමුවූ අතර, නිවානෝ පදනමෙහි නිලධාරී මහත්වරුන් තිදෙනෙක් අප හා එහි ගියහ ''නව ලෝක ප්‍රවනතා'' යන මැයින් සියයක් පමණ පිරිසකට දේශනයක් පවත්වා, ශිෂ්‍යයින් සමඟ සාකච්ඡාවකට සහභාගි වීමි. මගේ දේශනය වෙනුවෙන් යෙන් ලක්ෂයක් මට පරිත්‍යාග කළ අතර, තවත් යෙන් 7200 ක් රැස්ව සිටි අය විසින් එකතු කර පරිත්‍යාග කරන ලදී.

මත්සුෂිටා ආයතනයේ අධ්‍යක්ෂ ජෝකෝ මහතා විසින් පරිත්‍යාගයක් කිරීම.
මගේ වම්පස සිටිනේනේ නීතා

එම රැස්වීම අවසානයෙන් පසු අපි කමාකුරා ආරාමය බැලීමට ගියෙමු. අඩි 44 ක් උස, අවුරුදු 720 ක් පැරණි වූ ලෝහ පිළිමයක් එහි ඇත. හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාට ස්තුති කිරීම සඳහා පන්සල පිටුපස කුළුණක් සාදා ඔහුගේ හිසේ පින්තූරයක් ද සමඟ ''නහී වේරෙන වේරානි'' ගාථාව ලියා ඇත.



කමාකුරා ආරාමයේ ස්වාමීන් වහන්සේලා සමඟ

පසු දින උදෑසන ඉන්දීය පළමුවැනි ලේකම් ගුර්ජිට් සිං මහතා පැමිණ පැය දෙකක් සාකච්ඡා කළේය. නිතාගේ පෑනේ මිතුරිය මුත්සුකො හිරෝසි මහත්මිය ඇයගේ ස්වාමියා හා දුව පැමිණ අවුරුදු 35 කට පසු පළමුවරට නිතා හමුවූවාය. ජපානයේ සමාජ සුභසාධක මණ්ඩලයේ උප සභාපති ෂිරෝ ඇබේ මහතා සහ මැතිනිය සමඟ අසෝක හෝටලයේදී රාත්‍රි ආහාරය ගතිමු.

ඉන්දීය පළමුවැනි ලේකම් ගුර්ජිට් සිං මහතා හමුවීම

එකොළොස් වෙනිදා උදේ වියෝඩා නම් වූ ස්ථානයේ ජපන් සමාජ සේවා ජාතික මණ්ඩලයේ සමුළුවකට සහභාගි වූ අතර තුන්සියක් පමණ වූ නියෝජිත පිරිස අමතා දේශනයක් පැවැත්වීමි. කොරියාව, තායිවානය, ඉන්දුනීසියාව, සිංගප්පූරුව, ලංකාව හා ජපානය යන රටවල නියෝජිතයෝ එහි පැමිණ සිටියහ. ආචාර්ය ෂිරෝ ඇබේ මහතා සමුළුව මෙහෙයවීය. සන්ධ්‍යාවේදී කමිසකමෝටෝ සාන් සහ පුතා පැමිණ 'දෙල්ගහයට ගෙදර' පොතේ ජපන් භාෂාවට පරිවර්තනයේ පොත් තෑගි කළහ.



කම්සකමෝටෝ මහතා විසින් ජපන් භාෂාවට පරිවර්තනය කරන
ලද දෙල්ගහයට ගෙදර විප්ලවය පොත නීතා පිළිගැන්වීම

සාම ත්‍යාග උත්සවයː

නිවානෝ සාම ත්‍යාග උත්සවයට පැමිණි අප තවමත් නියැලුණේ අතරමග සංවිධානය කර තිබූ අනෙකුත් වැඩ සටහන් උදෙසාය. අප පැමිණි ප්‍රධාන කාර්යය ආරම්භ වූයේ සවස 6.00 කණිසමටය. සාම පදනමේ පිළිගැනීමේ සාදය වූ එයට අපි සහභාගි වීමු. රිසෝකෝසි-කායි සභාපති නිචිකෝ නිවානෝ, කන්ජිරෝ නිවානෝ හා නගාමුනි ආදී මහතුන් ද තේරීමේ කමිටුවේ සාමාජික ගරු සදර්ලන්ඩ් (සාම ත්‍යාග ලැබූ) ආචාර්ය පිලිප් පොටර් ද එහි පැමිණ සිටියහ.

මේ වන විට ජීවන්, සදීවා, දියත් සහ උත්පල ද පැමිණ සිටි බැවින්, අප දෙදෙනාත්, නිම්නා බාල දුවත් යන සියලු දෙනා ඉතා අදරින් පිළිගෙන රාත්‍රි ආහාර සංග්‍රහයක් පිරිනමන ලදී.

සාම ත්‍යාග උළෙල පවත්වනු ලැබුවේ දොළොස්වෙනිදායි. 'ජැපැන් ටයිම්ස්' පත්‍රයේ මගේ පින්තූරයක් සමඟ පිටු භාගයක පමණ එහි විස්තරයක් පළ කර තිබුණෙන්, එය දුටු වහාම තානාපති මහේන්ද්‍රන් නිවානෝ පදනමට දුරකතනයෙන් කතා කර විරෝධය පළ කර තිබුණි. මෙවැනි මිනිසුන් තානාපති පදවි සඳහා සුදුස්සන් වන්නේ කෙසේ දැයි මම සිතුවෙමි.

උදේ දහයට අප උත්සව සභාව වෙත කැඳවා ගෙන යනු ලැබීය. නිවානෝ සාම පදනමේ ගරු සභාපති නිකියෝ නිවානෝ අප පිළිගත්තේය. එතුමා සහ කන්ජිරෝ නිවානෝ ආදී වූ නිවානෝ සාම පදනමේ හා රිසෝකෝසි-කායි ආයතනයේ සියලු නිලධාරීන් ද අධ්‍යාපන ඇමති මහාචාර්ය හිරානෝ ආගමික සම්මේලනයේ සභාපතිතුමා සදර්ලන්ඩ් පොටර් ආචාර්ය බාන් යන මහත්වරුන් ද එහි රැස්ව සිටි අය අතර වූහ. තුන්සීයක් පමණ දෙනා රැස්ව සිටි එම සම්භාවනීය සභාව වෙත අප අවතීර්ණ වූයේ ප්‍රීතිඝෝෂා මැද්දේ, නිවානෝතුමා සමඟමය.

ශ්‍රී ලංකා තානාපතිවරයා හෝ ඒ වෙනුවෙන් වෙන කිසිවෙකුවත් පැමිණ නොසිටීම හොඳින් කැපී පෙනුණි. නමුත් ගරු මාපලගම විපුලසාර හිමියන් ආචාර්ය හර්ෂ ලියනගේ මහතා සහ බිරිඳ, සමරනායක මහතා ආදී පිරිස ද ආචාර්ය රොබට් රසල් මහතා ද, ඉන්දීය ප්‍රථම ලේකම් ගුර්ජිත් සිං මහතා ද සතුටු කඳුළු හෙළමින් එහි සිටීම මට ලොකු සතුටක් මෙන්ම, ධෛර්යයක් ද විය.

ආගමික සංගීතයක් පසුබිම් කොට ගෙන සෑමදෙනාම නැඟිට, නිශ්ශබ්දව ආගම සිහි කිරීමෙන් උත්සවයේ වැඩ කටයුතු ආරම්භ වීමෙන් පසු, සභාපති නගාමුනා මහතා ත්‍යාග තේරීමේ කමිටුව මගින් මා තෝරා ගත්තේ මන්ද යන මැයින් පළමු දේශනය කළේය. රටවල් 117 කින්, හත්සිය ගණනක් අතරින් හොඳම සුදුස්සා හැටියට මා තෝරා ගත් බව ඔහුගේ දේශනයෙන් කියැවිණි.

තම තමන්ගේ ආගම සිහි කිරීම

ඉන් අනතුරුව මහාචාර්ය ඔසාමා මූරෝ මා පිළිබඳව දීර්ඝ විස්තරයක් කරමින් වෙනත් අය ඒ ගැන සිතන්නට දහ පහළොස් වසරකට පෙර ලොවට අවශ්‍ය සංවර්ධන මාර්ගය මා විසින් හෙළි කර ඇති බව පැවසීය. ආරියරත්නට කාගේවත් සහතික අවශ්‍ය නැති බවත්, ඔහුගේ මුහුණ සහ හදවතින්ම පැනනගින අව්‍යාජ සිනහව ඔහු කවුරුන් ද යන්න මිනීමට ප්‍රමාණවත් වන බවත් මූරෝ මහතා කීවේය.

නිවානෝ සාම ත්‍යාගයට හිමි සහතිකයත්, මුද්‍රාවත්, (මැඩලයත්) මුදල් යෙන් මිලියන විස්සක පත්‍රිකාවත් ගරු සභාපති නිකියෝ නිවානෝතුමා අතින් වේදිකාවේදී මා වෙත පිළිගන්වනු ලැබීය.



CITATION

Ahangamage Tudor Ariyaratne, you have demonstrated the practice of compassion and nonviolence based on a spirit of religion. In particular, your consistent teaching of the importance of self-awareness and sharing for all people and your devoted efforts in the cause of ethnic and religious reconciliation have given many people courage and hope.
In honor of your achievements, the Niwano Peace Foundation presents you with the ninth Niwano Peace Prize on the twelfth day of May, nineteen hundred and ninety-two.

Nikkyo Niwano, President

Motoyuki Naganuma, Chairman

Niwano Peace Foundation

表　彰　状

A.T.アリヤラトネ　殿

あなたは多年にわたり、宗教的精神に基づいた慈悲と非暴力の実践を示してこられました。特に民衆と共に全ての人々が自らの心に目覚め、分かち合うことの重要性を説き続けてこられました。また、異民族間と諸宗教間の和解にも尽力され、多くの人々に勇気と希望を与えてこられました。

よって永くその功績を讃え、第9回庭野平和賞を贈呈致します。

平成4年5月12日

財団法人　庭野平和財団

総裁　庭野日敬

理事長　長沼基之

ඉන් පසු කතා කළ නිවානෝතුමාගෙන් ප්‍රකාශ වූයේ මා කිසි විටෙක බලාපොරොත්තු නොවූ මගේ සේවා ඇගයීමකි. එනම් ඉහළ මට්ටමේ වර්ණනාවක් එතුමා වැනි යුග පුරුෂයෙකුගෙන් මම කිසි විටෙකත් බලාපොරොත්තු නොවූයෙමි. සිහියෙන්, ආනාපාන සතියෙන්, මෛත්‍රියෙන් මුළු රැස්වීම තුළදීම මම සිත පිරිසිදු කර ගනිමින් සිටියෙමි. ජපන් ආගමික සමුළුවේ සභාපතිතුමා සහ අධ්‍යාපන හා සංස්කෘතික ඇමතිතුමන් විසින් සුභ පැතීමේ කතා දෙක පැවැත්වීමෙන් අනතුරුව මගේ දේශනය කළෙමි.

ආගමික සංගීතයකින් පසු උත්සව කටයුතු හමාර වූයෙන්, ගරු නිකියෝ නිවානෝ සමඟ අප දෙදෙනා නැවතත් විශේෂ කාමරයට කැඳවා ගෙන ගොස්, ටික වේලාවකින් දිවා භෝජන සංග්‍රහය ඇරඹිණි. මහාචාර්ය කොබේ ඇතුළු ජපානය පුරා සිටි මගේ හිතවතුන් බොහොමයක් එදා දිවා ආහාරයට පැමිණ සිටියහ. ජින් හිරානෝ මහතා සව්දිය පුරමින් දිවා භෝජනය ආරම්භ කළ අතර, අවසානයේදී හැම දෙනාම පැමිණ ස්තුති කොට අපට සුභ පැතූහ.

මම, නිවානෝතුමා සහ නීතා



නිවානෝ සාම ත්‍යාගය මා වෙත පිරිනැමීමෙන් පසු පවත්වන ලද සාදයේදී මාත්, නීතාත්, දෙවැනි පුතා ජීවන්, තුන්වැනි පුතා දියත්, දෙවැනි දියණිය සදීවා සහ තුන්වැනි දියණිය නිමිනා

පසුදා සැන්දෑවේ 4.00 ට ටෝකියෝ දුම්රිය ස්ථානයෙන් බුලට් දුම්රියට ගොඩ වූ අපි, එහි පැය තුනක් ගමන් කිරීමෙන් රාත්‍රී 7.00 ට කියෝටෝ නගරයට පැමිණ, කියෝටෝ ග්‍රෑන්ඩ් හෝටලයේ නවාතැන් ගත්තෙමු. අපගේ ජපන් මිත්‍රයෝ කීපදෙනෙක් අප හා එහි පැමිණියහ. විශේෂ කාමරයක් අපට එහි වෙන් කර තිබුණි. ඊයේ ශ්‍රී ලංකාවේ ඔබසවර් පත්‍රයේ මුල් පිටුවේ පළ වී තිබූ ප්‍රවෘත්තියක් ලොකු දුව චාරිකා විසින් ෆැක්ස් පණිවුඩයක් මගින් එවා තිබුණි. "1.2m Yen advertisement for Ariyaratne" යන සිරස්තලය යටතේ එය පළ වී තිබුණි. යෙන් මිලියන දෙදාහෙන් යෙන් මිලියන 1.2 ක ප්‍රමාණයක් වියදම් කර තිබෙන්නේ ආරියරත්නට ජපෑන් ටයිම්ස් පත්‍රයේ දැන්වීමක් පළ කිරීමට බව එහි තේරුමයි. තවද ආරියරත්න ගැන ආරියරත්න විසින්ම පළ කර තිබෙන මෙම දැන්වීමෙහි, ඔහුගේ සේවය ගැන ද සඳහන් වේ යැයි එහි පවසා

තිබුණි. සර්වෝදය ගැන නිර්නාමික විවේචකයෙක් පැවසුවේ යයි කියන කරුණු වගයක් ද එහි පළ කර තිබුණි.

ද්වේශසහගත, අසත්‍ය ප්‍රචාරවලින් ජනාධිපතිවරයා සදාකාලික කරවීමට කල්පනා කරන බව මෙම ප්‍රවෘත්තියෙන් තවදුරටත් සනාථ කෙරිණි. පුදුමය වන්නේ මේවාට උල්පන්දම් දෙන තානාපතිවරුන් හා පුවත්පත් කතුවරුන් ද සිටීමය.



පුවත්පත් සාකච්ඡාව

එදිනම කියෝටෝ ග්‍රෑන්ඩ් හෝටලයේ පැවති පුවත්පත් සාකච්ඡාවකදී මේ ප්‍රවෘත්තිය පෙන්වා එහි පැමිණ සිටි 40 ක් පමණ ප්‍රවෘත්ති ලේඛකයනට ලංකාවේ පුවත්පත් කලාවට, මාධ්‍යවලට, රජය විසින් කර ඇති විපත පෙන්වා දී කතා කළෙමි. මෙම නියෝජිතයෝ මිලියන 40 ක් පමණ වන ඔවුන්ගේ පාඨකයන් අතර තමන්ගේ පත්‍ර හා සඟරා අලෙවි කරති. දින දෙකක් මෙම සිද්ධිය පත්‍රවල පළ විය.

විශ්ව ව්‍යාප්ත පුනරුදය සඳහා ජනතා ක්‍රියා මාර්ග
නිවානෝ සාම ත්‍යාග දෙසුම



නවවැනි නිවානෝ සාම ත්‍යාග දෙසුම පවත්වමින්

''සභාපති ගරු නිකියෝ නිවානෝතුමනි, නිවානෝ සාම සංස්ථාපනයේ සභාපති ධුරන්ධර ගරු මොතොයුකි නගනුමාතුමා ප්‍රමුඛ කොට ඇති මාණ්ඩලිකයිනි, අධ්‍යාපනය, විද්‍යාව හා සංස්කෘතිය පිළිබඳ අමාත්‍ය ධුරන්ධර කුනියෝ හතොයාමා මැතිතුමනි, ජපන් ආගමික මණ්ඩලයේ සභාපති තැන්පත් ගරු යසුරි හිරොසෙ හිමියනි, මහාචාර්ය ඔසාමි මූරෝතුමනි, තානාපතිවරුනි, සම්භාවනීය ආරාධිතයිනි, සොහොයුරු සොහොයුරියනි:

නවවැනි නිවානෝ සාම ත්‍යාග දෙසුමට සවන්දෙන පිරිස

නවවැනි නිවානෝ ජාත්‍යන්තර සාම සම්මානය පිරිනැමීමට සුදුස්සෙකු සේ මේ වර්ෂයෙහි මා තෝරා ගැනීම වෙනුවෙන් මම නිවානෝ සාම සංස්ථාපනයට බෙහෙවින් කෘතඥවෙමි. අහිංසාවත්, යුක්තියත් පිළිබඳ මා තුළ තිබූ භක්තිය තව තව දැඩි කොට වැළඳ ගනිමින් මම මේ සම්මානය පිළිගනිමි. සෑම මනුෂ්‍යයකුගේ සුව සෙත හා අභිවෘද්ධිය සැලසීම පරමාධ්‍යාශය කරගෙන, අප සර්වෝදය සමාජය වශයෙන් හඳුන්වන අභිනව සමාජයක් පිහිටුවීමට මා සමඟ අත්වැල් බැඳගෙන ස්වකීය කාලය, චින්තනය හා වීර්යය පුද කරන මගේ සහකාර මිත්‍රයින් සමඟ මේ ගෞරවය මා බෙදා ගත යුතු යයි මට මෙවේලේ සිතේ.

මේ ඉතිහාසගත වන උදාරතර උත්සවයට නීතා ධම්මචාරී නම් මගේ බිරිඳට ද සහභාගිවීමට අවස්ථාව සලසාදීම වෙනුවෙන් මම නිවානෝ සාම සංස්ථාපනයට කෘතඥතාවය ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි. සර්වෝදය ව්‍යාපාරය ඇරඹූ කාලයේ පටන් පෞද්ගලික වූත්, සාමාජික වූත්, පරිවර්තනයක් ඇති කිරීම සඳහා අප

දුරූ ව්‍යායාමයෙහි දී අපට මුහුණපාන්ට සිදු වූ උවදුරුවලට හා භයංකාර අවස්ථාවලට ද ඉඳහිට අපට ලැබුණු ප්‍රශංසාදියෙහි ද ඡායාව මෙන් (ඡායා ච අනපායිනී) ඇය මා අත් නොහැර මට දිරි දී, මා සමඟ හුන් බව මේ මොහොතෙහි දී මට සිහිවේ.

මට පෙර, මේ සම්මානය ලැබූ සම්භාව්‍ය පුද්ගලයෝ පරිත්‍යාගයෙන් හා කැපවීමෙන් සාමය සඳහා ක්‍රියා කළහ. ඒ අයගේ ආදර්ශය අනුගමනය කිරීමට වඩා, රිසෝ-කෝසිකායි නම් සාම ප්‍රතිෂ්ඨාව පිහිටුවූ අපේ අතිගරු නිකියෝ නිවානෝ අප ඉදිරියෙහි තැබූ උදාර පුරුෂාර්ථ අනුගමනය කිරීම වඩා දුෂ්කර කාර්යයක් බව කිව යුතුය. අප හැමදෙනා තුළ සහජයෙන් පිහිටි බෝධිසත්ව ගුණාංග වර්ධනය කිරීමෙන් මනුෂ්‍ය සංහතියට සේවය කිරීම එතුමා අප හැම දෙනාගෙන්ම අපේක්ෂා කළේය. මා විසින් මනුෂ්‍ය වර්ගයාට යම් සේවයක් කර ඇද්ද එය නිහතමානීව යළි තක්සේරු කිරීමටත්, පරාර්ථ සේවයෙහි උච්චස්ථානයට යාම සඳහා මගේ ජීවිතය කැප කිරීමටත් මෙය උචිත අවස්ථාවක් යයි මට සිතෙන්නේ එබැවිනි.

බුද්ධ වචනය පහසුවෙන් අසා වටහා ගත හැකි රටක උපදින්නට මට ලැබී ඇති වාසනා මහිමය මම අගය කරමි. ශ්‍රී ලංකාවෙහි රචනා කරන ලද මහාවංශය නම් පෞරාණික ඉතිහාස ග්‍රන්ථයෙහි පවසා ඇති පරිදි බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට තෙවරක් වැඩි සේක. අද දවසෙහි පවා උන් වහන්සේ විසින් ශුද්ධ භූමියක් කරන ලද ස්ථානවලට පුන්පෝය දිනවල දහස් ගණන් බැතිමත්හු වන්දනාවෙහි ගොස් දාන, ශීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍යකර්මයෙහි යෙදෙති.

අසෝක අධිරාජයාණන්ගේ පුත්‍ර මිහිඳු රහතන් වහන්සේ ශ්‍රී ලංකාවෙහි සංඝ ශාසනය පිහිටුවීමෙන් පසු ක්‍රි.පූ. පළමුවෙනි සියවසෙහි එතෙක් කල් මුඛ පරම්පරාවෙන් රැක ගත් බුද්ධ ධර්මය සංඝයා වහන්සේ විසින් ලේඛනගත කරන ලදී. මේ අයුරින් සම්භාව්‍ය බුද්ධ, ධර්ම, සංඝ යන ත්‍රිරත්නය අපේ රටේ බෞද්ධයන්ගේ තුන් සරණය බවට පත් විය.

මානව වර්ගයාටත්, සමාජයටත් අකලංක සන්තුෂ්ටිය ගෙන දෙන මංගල කරුණු තිස්අටක් බුදුරජාණන් වහන්සේ විසින් මහා මංගල සූත්‍රයෙහි දේශනා කොට ඇත. මේවා පතිරූපදේශ වාසය, යහපත් කර්මය, ආත්ම සංයමය, පඬිවරුන් හා ප්‍රාඥයන් ආශ්‍රය කිරීම, දෙමව්පියන් හා දූ-දරුවන් පෝෂණය කිරීම, පරාර්ථ සේවය, සම්‍යක් කර්මාන්තය, මද්‍ය පානයෙන් වැළකීම, ධර්මය හැදෑරීම, ධර්ම සාකච්ඡාවෙහි නිරත වීම, සිහි කල්පනාවෙන් හිඳීම යනාදිය වේ.

මා ප්‍රත්‍යවේක්ෂණයෙහි යෙදෙන විට සූත්‍ර ධර්මය කට පාඩමින් දන ගෙන, ස්වකීය දෛනික ජීවිතයෙහි ඊට අනුව හැඩගස්වා ජීවත්වීමට යත්න දරන දෙමව්පියන්, නැන්ද මාමලා හා වෙනත් වැඩිහිටියන්ගෙන් යුත් පවුලක ඉපදීමට මට තිබූ වාසනාව කෙතරම් දැයි මට සිතේ. මට ලැබුණු තවත් වාසනාවක් නම්, අපේ මුල් ගෙය උඩින් විනයගරුක සංඝයා වහන්සේ වැඩහිටි විහාරස්ථානයකට යාබදව පිහිටා තිබීමය. තතු මෙසේ වූ බැවින්

මගේ අධ්‍යාපනය හා හැදියාව බෞද්ධ පුරුෂාර්ථ හා පාරලෞකික පරමාර්ථවලින් පෝෂණය වූවක් විය. ඉන් මොබ්බෙහි පාසලෙහි දී මගේ මනස විද්‍යාව, තාක්ෂණය, අර්ථශාස්ත්‍රය, දේශපාලනය, ධනවාදය හා සමාජවාදය වැනි භෞතික ඥාන ක්ෂේත්‍රයට නැඹුරු කරන ලද නමුත් ආරම්භයෙහි සපයන ලද ප්‍රතිෂ්ඨාපනය සෙළවිය නොහැකි විය. මේ එක ඥාන විෂයකින්වත් අධ්‍යාත්ම තෘප්තියක් ලබා ගත නොහැකි බව මට පෙනුණි. තතු මෙසේ බැවින් මගේ සිතට සැනසුම ගෙන දෙන, ජීවන මාර්ගයක් හැම මොහොතෙහිම මට ජීවත්වීමේ තෘප්තිය ගෙන දෙන, මාර්ගයක් සොයා ගැනීම අවශ්‍ය විය. බුද්ධ, ධර්ම, සංඝ යන ත්‍රිරත්නයට මුළුමනින්ම කැපවීමට තිස්හතර අවුරුද්දකට පෙර මා තීරණය කළේ මේ නියායෙන්ය. මගේ රටෙහිත් ලෝකයෙහිත් සර්වෝදය සමාජ සංස්ථාවක් පිහිටුවන්නට මා තුළ හටගත් අධිෂ්ඨානයට හේතුභූත වූ අධ්‍යාත්ම තතු මේවාය.

පුබුදු කරවීමේ ද්විධ මාර්ගය

සර්වෝදය යන පදය මහත්මා ගාන්ධිතුමා විසින් යොදන්ට වූයේ ස්වකීය අවධියෙහි ප්‍රකටව තිබූ ධනවාදී හා සමාජවාදී ක්‍රමවලට හාත්පසින් වෙනස් වූ අභිනව සමාජ සංකල්පයක් ගැන සිතාගෙනය. එහි අර්ථය වනාහී සකල ජනතාවගේ අභ්‍යුදය යනුයි. මේ සංකල්පය මා දැනගත් විට මගේ බෞද්ධ චින්තනය අනුව මම එය ''සකල ජනතාවගේ උදය'' පතන්නා වූ අපි, හෙවත් ''බෝධිසත්වයෝ'' වූ කලී බුදුන්ගේ මාර්ගය ඔස්සේ ගමන් කරන බෝධිසත්වවරු වම්හ.

අන්‍යයන් උදා කරවීමෙන් මිස, මට මා උදා කරවිය නොහැකිය. මෙය මෙසේ බැවින් අප සර්වෝදයෙහි තෝරා ගෙන තිබෙන්නේ තමා උදාවීම හා සමාජය උදා කරවීම යන පරස්පරාපෙක්ෂ ද්වන්ද්ව මාර්ගයයි. පාලි බසින් කියතොත් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව මෙසේය.

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා
භයප්පත්තා ච නිබ්බයා
සොකපපත්තා ච නිස්සෝකා
හොන්තු සබ්බේ පි පාණිනො

මෙහි අරුත:

ශාරීරික දුකින් පීඩිත වූවන්ට ශාර්රික දුකින් මිදෙන්නට
භයෙන් පීඩිත වූවන්ට භයෙන් මිදෙන්නට
මනොව්‍යාධියෙන් පීඩිත වූවන්ට
මානසික පීඩාවෙන් මිදෙන්නට
සකල සත්ත්වයා හට පිහිට වන්න.

මෙය වූ කලී 'සර්වෝදය' යන්නෙහි පරිපූර්ණ අර්ථයයි. කුලය, ජාතිය, ආගම යනාදී වශයෙන් මනුෂ්‍යයා විසින් අටවා ඇති සියලුම වැටකඩොලු සියල්ල බිඳ හෙළා සර්වෝදය ආයතනය හැමදෙනාටම සේවය කරයි. මනුෂ්‍යයාගේ ශාරීරික දුක්, චිත්ත සන්තාපය, භය යන මේවා දුරු කිරීමට සර්වෝදය උත්සාහ දරයි. ආගම් භේද, ජාති භේද තුරන් කිරීමට, දාරිද්‍රයය මුලිනුපුටා දැමීමට, දිළිඳුන් බලවත් කිරීමට, ආගමික අධ්‍යාපනයෙන් හා අධ්‍යාත්ම ගුණධර්ම නිර්ධනයෙන්, සාමය පැවැත්වීමට දරන හැම වෑයමටම අත දීමෙන්, මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හා වෙනස් අයුක්ති සහගත ක්‍රියා අහිංසාවාදී උපාය මාර්ගයෙන් මැඩලීම් මේ සියල්ල සර්වෝදය ආයතනයේ කාර්යකෝෂයෙහි අන්තර්ගත වේ.

අන්‍යෝන්‍ය සාපේක්ෂතාව

සමාජය වූ කලී පුද්ගලයන්, පවුල්, ග්‍රාමීය සමාගම්, නාගරික සංස්ථා, ජාති වර්ග, ආදියෙන් යුක්තය. අපි සියලුදෙනාම වාසය කරන්නේ එක ග්‍රහලෝකයකය. එබැවින් යළි පුනරුත්ථාපනය කළ නොහැකි ලෙස හින වී යන සම්පත්, පරිසර විෂමතා, ඍතු විපර්යාස, මානසික හා සමාජීය පරාධීනතා, ශාක හා සත්ත්ව ජීවයේ පරිණාම යනාදිය මධ්‍යයෙහි අපේ ජීවනය හා පැවැත්ම රැක ගන්නට සිදුවේ. තතු මෙසේ බැවින් අප සියල්ලන්ටම ජීවී හෝ අජීවී වේවා පරතන්ත්‍රව විසීමට සිදුවේ.

සර්වෝදයේ උත්තරීතර පරමාර්ථය අනුව සියලු සත්වයන්ගේ සමස්ත උදාව සැපයීමට අප විසින් අරමුණු හයක් යෝජනා කොට ඇත. එනම්, පූර්ණ පෞරුෂෝදය, කුටුම්බෝදය, ග්‍රාමෝදය, නගරෝදය, දේශෝදය සහ විශ්වෝදයයි.

මේ සය වැදෑරුම් අරමුණු පරස්පරාපේක්ෂ වන අතර උනුන් පෝෂණය කරයි. ඒ කවරේද කියතොත් අධ්‍යාත්ම, සදාචාර, සංස්කෘතික, සාමාජීය, ආර්ථික හා දේශපාලන යන මේවාය. අපේ පරමාධ්‍යාශය වශයෙන් ගැනුනේ අති ඉෂ්ටාරම්මණය කරා යාමය. මෙය ඇසුරින් එක්දහස් නවසිය පනස් ගණන්වල ස්ථාවර කාර්යාවලියක් අපි තෝරා ගත්තෙමු.

සමාජ අර්බුදය

අපේ ව්‍යාපාරය දියත් කරන ලද අවධියෙහි පැවැති මනෝවිද්‍යාත්මක වූත්, සමාජීය වූත්, පරිසරයෙහි අනුකූල වූත්, ප්‍රතිචාරයක් අපට ලැබුණි. අනුකූල ප්‍රතිචාරය හටගත්තේ වඩාත්ම දුගී දුප්පත් වූත්, බෙලහීන වූත් කොට්ඨාශවලය. මේ කොට්ඨාශයේ වාසස්ථාන වූයේ ග්‍රාම ප්‍රදේශ හා නාගරික මුඩුක්කුය. විරෝධ ප්‍රතිචාරය පැනනැග්ගේ ධනාඪ්‍ය, බලවත් ජන කොට්ඨාශවලින්ය. මොවුන් අතර අධ්‍යාත්ම වර්ධනය රැකුල් දුන් ස්වල්ප දෙනෙක් ද සිටියහ. අවුරුදු හාරසීය පනහක් පමණ පැවැති යටත් විජිත බලපෑම් මධ්‍යයෙහි ගම්බද දුගී දුප්පත් ජනතාව ස්වකීය අධ්‍යාත්ම පුරුෂාර්ථ රැක ගෙන සිටියාහුය. යටත් විජිතවාදී ආර්ථිකයෙන් මොවුන් පිටුවහල් කොට තිබීම ස්වකීය පුරුෂාර්ථ රැක ගෙන සිටීමට ඔවුන්ට පිටුවහල් වූයේය. එහෙත් ඉහළ පන්තියට අයත් වූවෝ, මුළුමනින්ම වාගේ පාරම්පරික ජීවන ශෛලියට පිටුපා යටත් විජිතවාදී සමාජයට පිවිසුණෝය. මේ අය සර්වෝදයේ පරමාර්ථ මුළුමනින් ප්‍රතික්ෂේප කිරීම විස්මයට හේතුවක් වියයුතු නැත.

රාජ්‍ය බලය ලත් මේ ඉහළ පන්තිකයන්ගේ දේශපාලන හා ආර්ථික ධර්මය ද හැඩගැසුනේ, යටත් විජිතවාදීන්ගේ චින්තනයට

අනුකූලවය. එබැවින් බෞද්ධ පුරුෂාර්ථ මත පිහිටු වන ලද සර්වෝදය 'ප්‍රඥප්තිය' ඔවුන්ට රුචි නොවීය.

ආරම්භයෙහි දී මේ පුරුෂාර්ථ හැරුණු විට, අප සතු වූ අන් අය හා බෙදා ගත හැකි සම්පත් ස්වල්ප අතර වූයේ කාලය, සංකල්පනය හා එකට ගොනු කළ හැකි අපේ වීර්යය. මෙය අප හැඳින්වූයේ 'ශ්‍රමදානය' යනුවෙන්ය. එනම්: අප එකිනෙකාගේ ශ්‍රමය යෙදීමය. අපේ පළමු ඉලක්කය වූයේ කුලභේද හා පන්ති වශයෙන් දක්වන වෙනස්කම්ය. අපේ ව්‍යාපෘතියේ පළමු පියවරයෙහිදී අපේ කාර්යයට හසු වූයේ එවැනි ගම්මාන දෙසීයක් පමණය. ඉන් අනතුරුව අපට වෙනත් ගම්මානවලට ආරාධනා ලැබුණි. අපි ඒවාට ගියෙමු. අද දවසේ අපි දහස් සංඛ්‍යාත ගම්මානවල වැඩ කරමු. දස දහස් සංඛ්‍යාත තරුණ හා වයෝවෘද්ධ අය මේ ස්වයං ව්‍යායාමයට අද දවසේ සහභාගි වී සිටිති.

සර්වෝදයේ පරමාධ්‍යාශය වනුයේ, පොහොසත් නොවූත්, දුප්පත් නොවූත්, සෑම පුද්ගලයෙක්ම සෑම පවුලක්ම සෑම සමූහයක්ම සන්තුෂ්ටියට පත්ව සාමකාමී ධර්මිෂ්ට දිවිපෙවතක් ගත කරනු දැකීමය. යුක්තිසහගත, අහිංසාවදී සමාජයක් මේ කුඩා ඒකක මත නැංවිය යුතු යැයි අපි අදහන්නෙමු. යහපත් ලෝකයක් උදා වීමට නම්, මානව කේන්ද්‍රගත සමාජ ආදර්ශ කර ගෙන ජාතික හා ජාත්‍යන්තර දේශපාලන හා ආර්ථික සමාජ සංස්ථාන ප්‍රතිසංස්කරණය කළ යුතු යයි අපි විශ්වාස කරමු. සෑම දෙනාගේම පිබිදීමත්, සමෘද්ධියත් සඳහා නව විශ්ව සමාජයක් බිහි විය හැක්කේ මේ අයුරිනි. මෙකී සමාජය ධනවාදී සමාජයටත්, සමාජවාදී සමාජයටත් වෙනස්ය. සුභසාධක රාජ්‍යයක් පිළිබඳ සංකල්පය සර්වෝදය විසින් ප්‍රතික්ෂේප කරනු ලබයි. එහෙත් සුභසාධක සමාජය පිළිගනු ලබයි. දේශපාලන හා ආර්ථික බලය සර්වෝදය විසින් අනුමත නොකරන අතර, එකී ඉලක්කය වනුයේ ඉතා අවම වශයෙන් පරිපාලන ස්වයං පාලිත සමාජ බිහි කිරීමය. එබඳු සමාජයක් බිහි කිරීමේදී ප්‍රධාන වශයෙන් බලපාන්නේ තම තමන්ගේ

සම්පත් හා පරිසරය හැසිරවීමට ජනතාව විසින් යොදා ගනු ලබන ස්වකීය විභව්‍යතාවය. මේ අරමුණු සාදා දීම සඳහා සර්වෝදය විසින් මනා කොට ඒකාග්‍රතාවයෙන් යුත් කාර්යාවලීන් යොදා ගෙන ඇත. ශ්‍රී ලංකාවෙහි මෙන් වෙනත් රටවලත්, විශ්ව අර්බුදය සඳහා සර්වෝදය විසින් එවැනි මානව කේන්ද්‍රගත ක්‍රියාවලීන් දියත් කොට ඇත.

මෘදු අවවාදානුශාසනා

මේ පරමාධ්‍යාශය සාදාලීම සඳහා සර්වෝදය විසින් ශ්‍රී ලංකාවෙහි අවුරුදු තිස්හතරකට උඩදී අපේ කාලයත්, චින්තන ශක්තියත්, සම්පතුත්, පරිත්‍යාග කිරීමට පටන් ගනු ලැබීය. පුද්ගලයන් ද, පවුල්වලද, ජන සමූහවලද, උපරිම ශක්‍යතාව උදා කරලීමේ කාර්යයෙහි අපි නිරත වීමු. පරස්පර විරෝධී සමාජවාදී තාක්ෂණ ධර්ම හා දේශපාලන නිලධාරී සංස්ථාවලින් යුත් රටක, මෙය පහසු කාර්යයක් නොවීය. දශක හතරක් මුළුල්ලේ බලකාමී පක්ෂ දේශපාලනය රටේ අස්සක් මුල්ලක් නැර පැතිරී තිබුණි. මේ අය විසින් දියත් කරන ලද සංවර්ධන විරෝධී සංකල්පනාවලට පටහැනිව ක්‍රියා කිරීමට සර්වෝදයට සිදු විය. ස්වකීය යහපතට පටහැනිව ක්‍රියා කරමින් අපේ ජනතාව වාද විවාද, තර්ක විතර්ක ඉදිරිපත් කරමින් භේදභින්න වූයේය.

මේ රැල්ල පාලනය කරන්නට අපට හැකි වුයේ කවර පක්ෂයකට හෝ නොබැඳී අපේ ව්‍යාපාරය ජාතික තලයට පත් කිරීමෙන්ය. මෙයින් ලංකාවේ හැම ප්‍රදේශයකම ශතසහස්‍ර ගැමි ජනතාවගේ සිත් ගැනීමට අපට හැකි විය. දකුණු පළාතෙහි හටගත් ලේ තැවැරුණු කැරලි නිසා හෝ උතුරේ පැවැති සිවිල් යුද්ධය නිසා හෝ අපි නොපැකිළී හුන්නෙමු. හීන දීන අරමුණු ඉටු කර ගැනීම සඳහා අපි අවස්ථාවාදී ලෙස ද ක්‍රියා නොකෙළෙමු.

මනුෂ්‍යයා සහජ වශයෙන් සත් පුරුෂයෙකැයි අපි විශ්වාස කෙළෙමු. දේශපාලන හා වර්ගභේද නිසා ජාතිය සී-සී කඩව යන

හැටි දැක සියලු බාධා මැඩගෙන අධ්‍යාත්ම ප්‍රතිෂ්ටාවක් පිහිටුවන්නට අපි යත්න දැරුවෙමු. දේශපාලන පක්ෂයකට හෝ බලධාරියෙකුට ගැති නොවන්නට අපි උත්සාහ කළෙමු. යුක්තිය භුක්ති විඳිමින් සාමයෙන් විසීමට හැම රට වැසියෙකුටම තිබෙන අයිතිවාසිකම කෙරෙහි දැඩි විශ්වාසය අපි ප්‍රකාශ කිරීමට පසුබට නොවීමු.

වාද භේද සමනය කිරීම සඳහා අහිංසාවාදී උපායක් හා නීතිය යටතේ යුක්ති සහගත විනිශ්චය ලබා ගැනීම හැරුණු විට, අනිකුත් මාර්ගයක් නොමැතිය යනුවෙන් අප අදහස ප්‍රතිපත්තියට විරුද්ධව අපි කිසි විටෙක ක්‍රියා කර නොමැත්තෙමු. ජනතා සංවිධානයක් වශයෙන් අපේ ඉෂ්ටාර්ථය සිද්ධ කිරීම සඳහා අප විසින් යොදා ගෙන ඇත්තේ, සමාජ සුභසිද්ධිය, ආත්ම සම්‍යක්ප්‍රණිධානය හා උපදෙස් දීම යන මේ තුන් උපාය මාර්ගය. සර්වෝදය විසින් දියත් කරන ලද සුභසාධන ව්‍යාපෘති, මානව කේන්ද්‍රගත සංවර්ධනය යනාදිය නිසා, මේ ආයතනයට විශ්ව කීර්තියක් ලැබී ඇත. මේ අතර ප්‍රකටව පෙනෙන මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්, දේශපාලන හා ආර්ථික ක්ෂෙත්‍රවල කෙරෙන අයුක්ති සහගත ක්‍රියා යනාදිය සම්බන්ධයෙන් අප විරෝධය ප්‍රකාශ නොකිරීම වරදක් ලෙස සලකා ඇතැම් දේශපාලකයන් අපට දොස් නගා ඇත.

මෙකී විරෝධ ව්‍යාපාරවලට සම්බන්ධ නොවූ බව අපිදු පිළිගනිමු. එහෙත් අප විසින් කරන ලද්දේ ආචාරශීලීවල නිශ්ශබ්දව අවවාද කිරීමත්, ස්ථාපිත රජයෙන් බාහිර වූවත් නීතියට පටහැනි නොවන විකල්ප සමාජීය හා ආර්ථික සංස්ථාන පිහිටුවීමය. මේ විකල්ප සංස්ථානයන්ගේ ආධාරයෙන් ස්වකීය ආයතන පාලනය කිරීමට ජනතාවට හැකි විය. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය බැහැරින් ඔවුන් වෙත ආරෝපණය කිරීම වෙනුවට, තම තමන් විසින්ම සකස් කර ගන්නා ලද ප්‍රජාතන්ත්‍රවාදී විශේෂයකට ඔව්හු සහකාර උරුමක්කාරයෝ වෙති.

ශ්‍රී ලංකාවේ ගම් නියම්ගම් අටදාහකට වඩා අධික සංඛ්‍යාවක සර්වෝදය සංකල්පය හඳුන්වා දෙන්ටත්, ක්‍රියාවෙහි යොදවන්ටත්, අපට හැකි විය. පෙර පාසල් ළමයි ද, පාසල් යන වයසේ ළමයි ද, තරුණ තරුණියෝ ද, මව්වරු, ගොවියෝ, ශිල්පියෝ ද වෙනත් වැඩිහිටියෝ ද ස්වකීය මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමට සහභාගි වූහ. අපි සාර්ථක ලෙස සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවයක් ඇරඹුවෙමු. මේ වනාහි අතිශය දුප්පත් ජනතාව පුබුදුවා ආර්ථික වශයෙන් හා අධ්‍යාත්ම වශයෙන් වර්ධනය කිරීමට ඇති එකම මාර්ගය වේ.

ඉතා උත්කෘෂ්ට දේශීය පුරුෂාර්ථ මත ගොඩනගා ඇති මේ මාර්ගය ඔස්සේ අපි මහත් පරිශ්‍රමයෙන්, සමාජ සංස්කරණය අරමුණු කර ගෙන ගමන් කළෙමු. සෑම ආගමික සංවිධානයකින්ම දේශපාලනමය හා ආරක්ෂක අංශයකින්ම පවා අපට අප්‍රමාණ සහයෝගයක් ලැබිණි. මේ කාර්යය වූ කලී, උසස් දේශපාලන බල තනතුරක් ලබා ගැනීමට වඩා දුෂ්කර විය. මේ නිර්මාණාත්මක කටයුත්තෙන් ලබන තෘප්තිය බලය යෙදවීමෙන් ලැබෙන සන්තුෂ්ටියට වඩා සියක් වාරයක් විශාලය.

පුද්ගලයන්, පවුල් හා ග්‍රාමීය වූත්, නාගරික වූත්, සමිති සමාගම් සමඟ අප දියත් කළ කාර්යයන් කෙතරම් සාර්ථක වීද යත් ආර්ථික හා රාජ්‍ය බලය විඳින්නවුන් තුළ භයක්, ඊර්ෂ්‍යාවක් හට ගෙන ඇති බව පෙනේ. මේ වනාහි විස්මයට පත් වීමට හේතුවක් නොවේ. බටහිරින් අපේ රටට හඳුන්වා දෙන ලද සංවර්ධන රීතිය විෂමත්වයෙන් යුක්ත බව අපට පෙනුණි. එම සංවර්ධනයෙහි අධ්‍යාත්ම හෝ චර්යා ධාර්මික ඉෂ්ටාර්ථයක් නැත. එය මුළුමනින්ම ලෝකායත දෘෂ්ටියක් මත ගොඩනගා ඇත්තේය. මේ සමාජ ක්‍රමයේ පරමාධ්‍යාශය වනුයේ දුර්ලභ සම්පත්වලින් හැකි තාක් ප්‍රයෝජන උකහා ගැනීම, ලාභ ලබා ගැනීමට යොදා ගත හැකි තාක්ෂණ ක්‍රමවලින් මනුෂ්‍යයා පොළඹවා ලාභ ලබා ගැනීම, පංචේන්ද්‍රියන් පිනවීම ජීවිතයේ උසස් පුරුෂාර්ථයක් ලෙස සැලකීම

යන මේවාය. මේ සංවර්ධන න්‍යායයේ ප්‍රතිඵලයක් වශයෙන් කාර්මික රටවල ස්වල්ප දෙනෙකු ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ අතර, ලෝකයේ අධික සංඛ්‍යාවක් දුප්පත්කමින් පෙළී අබල දුබල දිවිපෙවෙත් ගත කරති. එහෙත් භෞතික වශයෙන් පොහොසත් වූවාහු අධ්‍යාත්ම දරිද්‍රතාවෙන් පෙළෙති. පොහොසත් තරුණ තරුණියෝ ආගම ධර්මය ප්‍රතික්ෂේප කොට ලෝකායන දර්ශනය වැළඳ ගෙන පසඳුරන් පිනවීමෙන් ජීවිතය ගෙවති. වගකීමෙන් මිදුණු ජීවිතයක් ගත කරන්නා වූ මොවුහු අන්‍යයන්ට සේවය කිරීමෙන් තොර වූ ජීවිතය නිස්සාර බව වටහා නොගනිති.

අද දවසේ මානව වර්ගයාට මුහුණ දෙන්නට තිබෙන අභියෝග සලකන විට වෙනස් සංවර්ධන න්‍යායක් අවශ්‍ය බව දේශපාලන හා ආර්ථික බලය ලබා ගෙන සිටිනවුන්ට නොවැටහීම ඛේදයකි. සර්වෝදය වූ කලී, එවැනි සංවර්ධන න්‍යායයකි. එහි සාර්ථකත්වය අත්හදා බලා ප්‍රත්‍යක්ෂ වූවකි. ආත්ම විශ්වාසය, සමිති සමාගම්වල කටයුතුවලට සහභාගිවීමට හා සාමූහික ස්වයං සංවර්ධනය යන මේවා ග්‍රාමීය සංස්ථානවලට ආවේනික වූ අධ්‍යාත්ම සාරධර්ම හා සංස්කෘතික සාරධර්මවලට හානියක් නොපමුණුවා ක්‍රියාවේ යෙදවිය හැකි බව අත්දැකීමෙන් පසක් වී ඇත. මේ සංවර්ධන න්‍යාය ක්‍රියාවේ යොදවමින්, අධස්ථලය සිට ඌර්ධවංගම වූ සංවර්ධන ක්‍රමයක් අනුගමනය කරමින් පමණි, කල් පවතින සංවර්ධනයක් දියත් කළ හැක්කේ. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ඌර්ධවස්ථලය සිට අධස්ථලය දක්වා ගමන් කළ සංවර්ධන ක්‍රමයට විපරීත ක්‍රමයක් අද දවසේ අවශ්‍ය බව වටහාගත මනාය.

අභිනව ආදර්ශයක් අවශ්‍යවීම

ධනවත් අය වඩා ධනවත් කරන අතර, දුප්පතුන් වඩා දුප්පතුන් කරවන මහා පරිමාණයේ සංවර්ධන ක්‍රමවලට විශාල ණය මුදල් මෙන් පරිත්‍යාග ද ආධාර වශයෙන් ලැබී ඇත. අපේ සමාජවල

ඌර්ධව තලයට මෙසේ මූල්‍ය ධනය ගලා ඒම හේතු කොට ගෙන ස්වල්ප සංඛ්‍යාවක් අතෙහි ධනයත්, බලයත් එක්රැස් වී ඇති අතර මුදල් හිඟය හේතු කොට ගෙන සමූහ ව්‍යාපාර දුර්වල වී ඇති බව පෙනේ.

සර්වෝදය වැනි සංවිධානවලට, රිසෝ-කෝසිකායි වැනි ස්වේච්ඡා සේවක ආයතනවලින් ආධාර ලැබේ. එහෙත් මෙවැනි ස්වේච්ඡා සේවක ආයතනවලින් ලැබෙන ආධාර වූ කලි, ස්ථාපිත සංවිධානවලට ලැබෙන අති විශාල ආධාර හා සසඳන විට බින්දු මාත්‍රයක් සේ පෙනේ. සමෘද්ධිමත් රටවල ළතෙත් පුද්ගලයෝ ද, ස්වේච්ඡා සේවා සමිති ද, ආණ්ඩු ද, දුගී දුප්පත් ජනතාවට උපකාර කරන සංවිධානවලට සම්බන්ධ වී දුප්පතුන්ට පිහිට වේ. එහෙත් ආක්‍රමණශීලී වාණිජ ආර්ථිකය, මධ්‍යගත දේශපාලන ආධිපත්‍යය, දැඩි නිලධාරී පන්තිය හා පාලනය කරන ලද විඥාපන මාධ්‍ය යන මේ බලකාය මගින් අපේ අසරණ ජනතාව මත එල්ල වන රාග, ද්වේශ, මෝහ සංඛ්‍යාත බලඇණිය සමග සටන් කිරීමට දුබල ආයුධ ප්‍රමාණවත් නොවේ.

මානසික වූත්, භෞතික වූත්, පරිසර දූෂණය, මානව අයිතිවාසිකම් නැතිවීම, පාරම්පරික සාරධර්ම හා සමාජ සමගිය බිඳ වැටීම, අභ්‍යන්තර යුද්ධයක් නිසා දිනපතා සිදුවන ජීවිත හානිය හා වටිනා ජාතික වස්තු විනාශ වීම, බිහිසුණු ලෙස රට යුද බිමක් බවට පත් වීම, මේ ආදී තතු දැක අපේ ජනතාවට කෙතෙක් කල් ඉවසා සිටිය හැකි ද? ශ්‍රී ලංකාවෙහි පමණක් නොව අසල රාජ්‍යවලත් තතු මීට වෙනස් නැත.

දකුණු ආසියාවේ රටවල් සංවර්ධනයේ සීමාවට පැමිණ ඇතැයි කිව හැකිය. අපේ ජනතාවගේ ඉරණම විනිශ්චය කරන ගතානුගතික චින්තකයන් මඩ වගුරක එරී ඇති බව පෙනේ. ප්‍රදේශය පුරා අභ්‍යන්තර යුද මඬුලු ප්‍රාදූර්භූත වී ඇත. මධ්‍යගත බලධාරීන්ට මේවා මැඩලීමට ශක්තියක් නැත. අපේ රටවල ඔජෝ

ගුණය උරා ගන්නා සැහැසිකම් නිසා දහස් ගණන් ජනතාව සරණාගත වූවන් බවට පත් වෙති. එසේ නැතහොත් තුවාල ලත් වූවෝ වෙති. නැතහොත් කුරිරු මරණයට ගොදුරු වෙති.

නිදර්ශනයක් ගතහොත් ශ්‍රී ලංකාවේ ඊසාන දිග්භාගයෙහිත්, කාශ්මීර, පන්ජාබය, ඇසෑම් රට හා නාගලන්තයෙහි ජනවාර්ගික ප්‍රශ්න විසඳිය නොහැකි තත්ත්වයට පැමිණ ඇති සැටියක් පෙනේ. ඒ සමඟම ඉහළ මට්ටමේ සංවර්ධනය ගැනත් මහා පරිමාණයේ ආර්ථික දියුණුව ගැනත් උදම් අනන නමුත් ලෝකවාසීන්ගෙන් අඩක් දරිද්‍රතාවයෙන් පෙළීම වැළකිය නොහැක්කක් සේ පෙනේ. පහළ මට්ටමේ 40% පමණ වූ ශ්‍රී ලාංකික ජනතාව 1973 දී ජාතික ආදායමින් 20% කට ස්වල්පයක් අඩු ආදායමක් ලබාගත් අතර, 1987 දී ඔවුන්ට ලැබුණේ 10% ක් පමණි. කෙටියෙන් කියහොත් යටත් විජිතවාදී පාලකයන්ගෙන් අපට දායාද කරන ලද දේශපාලන ආර්ථික ක්‍රමය අසාර්ථක වූ බව පිළිගත යුතුය. කලින් සෝවියට් දේශය නම් වූ රට සහ ඇයගේ අනුගාමික රටවල්වලට වූවාක් මෙන් මේ ක්‍රමය ද තවදුර යෑමට නොහැකි තත්ත්වයකට පත්ව තිබේ.

අවුරුදු දෙදහස් පන්සීයකට ඉහත දී බුදුරජාණන් වහන්සේගේ ධර්මය අපේ රටට දායාදයක් වශයෙන් ලැබිණ. පිරිනිවන් පෑමට පෙර බුදුරජාණන් වහන්සේ දෙවිවරුන් කැඳවා, තමන් වහන්සේගේ ධර්මය ශ්‍රී ලංකාවෙහි මුල් බැස ගන්නා බැවින්, එම රට ආරක්ෂා කරන මෙන් ඔවුන්ට පැවැසූ බව මහාවංශයෙහි කියැවේ. ශ්‍රී ලංකාවත්, බුද්ධ ධර්මයත් අතර සම්බන්ධය ලාංකිකයන්ගේ සිත් තුළට කිඳා බැස ඇත්තේ මෙකී බුද්ධ වචනය සිහි කිරීමෙනි. බුද්ධ ධර්මය භාරත දේශයෙහි පිරිහුණු අතර ශ්‍රී ලංකාවෙහි වැජඹේ.

එබැවින් නැවත වරක් භාරත දේශයෙන් මහත්මා ගාන්ධිතුමාගේ ධර්මයත් ආදර්ශයත් කෘතඥතා පූර්වකව වැළඳ ගෙන, සර්වෝදයේ මාර්ගයෙන් ඊට නව ප්‍රාණයක් දීමට සැරසීමෙහි අමුත්තක් නොපෙනේ. සර්වෝදයට අයත් වන අපට ඓතිහාසික

වශකීමක් හා අවස්ථාවක් අප ඉදිරියෙහි තිබෙන බව පෙනේ. මහා පරිමාණයේ අත්හදා බැලීමක් දියත් කිරීමට කුඩා ශ්‍රී ලංකාව ප්‍රමාණවත් යයි අපට සිතේ. මෛත්‍රියත් දානාභිරතියත්, පරිත්‍යාගශීලයත් අපේ රටේ ජනතාව තුළ සමගියත් සාමයත් ජනනය කිරීමට සමත් වෙතියි අපි විශ්වාස කරමු. ශ්‍රී ලංකාව තුළ අපට සාදාගත හැකි මේ ඉෂ්ටාර්ථ යළි භාරත දේශයටත්, දකුණු ආසියාවටත්, නව මගක් සොයන ලෝකයාටත් ප්‍රදානය කළ හැකියි අපට සිතේ.

යෝජිත කාර්යාවලිය

අහිංසාවල යුක්තිය හා සාමය පිළිබඳ විශ්වාසය තබා ඇති අප එක්සත් වැඩ පිළිවෙලකට කැප වී විශ්ව ව්‍යාප්ත පුනරුදයක් ඇති කිරීම සඳහා ක්‍රියා කළ යුතුය. මෙකී කාර්යාවලිය මතු දැක්වෙන අංශවලින් යුක්ත වුව මනාය.

පළමු අංගයඃ හැම රටකම, හැම ජන වර්ගයා අතර උනුන්ට හිමි වූ ඓතිහාසික, සංස්කෘතික හා ආගමික තත්ත්වය අනුව පූර්ණ පෞරුෂෝදය හෙවත් පෞද්ගලිකත්ව පුනරෝදය ක්‍රියාවලින් දියත් කිරීම.

පෞරුෂය හා පෞරුෂෝදය යනු කුමක්ද? ආගම හා සංස්කෘතිය අනුව මේ වචනවලට විවිධ අර්ථකථන තිබිය හැකියඃ

එහෙත් පෞරුෂෝදයත් පරමාර්ථ වශයෙන් එහි සාධනයත් අවසාන වශයෙන් යොමු වන්නේ නිර්වාණයට හෝ බ්‍රහ්මාස්වාදයටය. ස්වාත්මාවබෝධය පුද්ගලයන් තුළ වඩ වඩා පැතිරෙත්ම, අපේ සමාජයන් අභිබවා සිටින තෘෂ්ණාව, ද්වේෂය හා මෝහය වඩ වඩා දුබල වේ. වැදගත් වනුයේ ආගම් අතර විරෝධය නොව, මානව පෞරුෂය හා අධ්‍යාත්මය උදාරත්වයට පමුණු වන ආගම්වල අඩංගු වූ ආධ්‍යාත්මික හරයයි.

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය අනුව අනිත්‍ය වූ නාමරූප ද්වන්ද්වය අපේ තෘෂ්ණාවත් පරමාර්ථ සත්‍යය පිළිබඳ අපේ අවිද්‍යාවත් නිසා දුක් දොම්නස්වලට භාජනය වන බවය.

දාන, සීල හා සමාහිතතා යන මේ ගුණාංග ප්‍රගුණ කිරීමෙන් ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයට අනුකූලව උපදින පංච උපාදානස්කන්ධයන් පිළිබඳ සම්‍යක් ඥානය අපට ලබාගත හැකිය. භාවනාභියෝගීව හිඳීමෙන් මිස, බෞද්ධයෙකුට මේ පුද්ගල ප්‍රබුද්ධතාව පිළිබඳ ධර්මය ප්‍රත්‍යක්ෂ කොට ගත නොහැකිය. එහෙත් අපි යම් සමාජයක වෙසෙමු ද ඒ සමාජය අප පරිභෝජනයෙහි හෝ තරගයෙහි යෙදීමට පොළඹවයි ද භාවනාව සඳහා අපට විවේකයක් නැතැයි අපට සිතෙන්නට පිළිවන. එබැවින් භාවනාභියෝගය අපේ අධ්‍යාපන පද්ධතියේ අංගයක් විය යුතු යයි සිතමි. පෝෂ්‍ය ආහාරය, ශාරීරික මෙන්ම මානසික සෞඛ්‍යය, සමාජ ස්වස්ථතාව යන මේවා පුද්ගල ප්‍රබුද්ධතාවට අවශ්‍යය. පෙර පාසල්, ළමා සාත්තු මධ්‍යස්ථාන, පාසල් සිසුන්ගේ අභිවෘද්ධිය ගැන බලන ආයතන, මව්වරුන්ගේ සමිති, තරුණ උපදේශක සමාගම්, මත් ද්‍රව්‍ය හා මත්වතුර ධූර්තයන්ට සාත්තු සප්පායම් සලසන සංවිධාන, පෝෂ්‍ය ආහාර, ජලය හා සෞඛ්‍යය පිළිබඳ උපදේශක ව්‍යාපෘති, සාහිත්‍ය හා ආගමික අධ්‍යාපන ආයතන, සාම භට කණ්ඩායම් යනාදිය ද මෙවැනි ක්‍රියාවලීන්ට ඇතුළත් විය යුතුය. ජනතාවගේ සහයෝගයෙන් සර්වෝදය දියත් කරන වැඩ කටයුතුවලට ඉහත සඳහන් සියල්ල අඩංගු වන බව කිව යුතුය.

අනුන්ගේ සේවය සඳහා ඇපකැප වී සිටින අප වැන්නන් ස්වකීය ආධ්‍යාත්මික ආත්මාර්ථය අමතක නොකළ යුතුය. මා සර්වෝදය සඳහා උත්සුක වී ගත කළ මුළු ජීවිත කාලය තුළදී මට අපහාසය, අවමානය, නිග්‍රහය හා මර්දනය එල්ල වූ බව සඳහන් කළ යුතුය. මේ අතර මා දයාවට ද, සම්මානයට ද භාජනය වූ බව කිව යුතුය. පසුගිය අවුරුදු තුන ඇතුළත ආණ්ඩුව විසින් පාලනය කරන විවිධ මාධ්‍යයන් මගින් මා හා නෑසියන් වෙත එල්ල කරන ලද මරණ

තර්ජන ගණනාවක් මට ලැබුණි. සර්වෝදයට අයත් වස්තු කිහිපයක් අසාධාරණ ලෙස පැහැර ගන්නා ලදී. අපේ වැඩ කටයුතුවලට නොයෙක් බාධා බලසම්පන්න අයගේ නියෝගයන් තුළින් අප වෙත පමුණුවන ලදී. මෙවන් බාධා නිසා අපේ පෞරුෂය වඩ වඩා ශක්තිමත් වූ අතර, අධ්‍යාත්ම උදාවට අවශ්‍ය මානසික උපේක්ෂාව අපට ලැබුණි. කුමක් වෙතත් උප්පත්තියෙන් හා මරණින් යුත් සංසාර යාත්‍රාවෙහි අපි ගමන් කරමින් සිටිමු. අවසානයෙහි නිවන් සැප විඳින්නට අපි ප්‍රාර්ථනා කරමු. මේ සියලු අත්දැකීම් අප සලකන්නේ පරම ප්‍රබුද්ධත්වය කරා අප ගෙන යන මාර්ග ලෙසය. මෙවැනි දේ බුදුරජාණන් වහන්සේ හැඳින්වූයේ පාරමිතා කියාය.

අපේ ක්‍රියාවලියේ දෙවෙනි පියවර නම්, රටවල් තුළ හා රටවල් අතර අනුකූල හැම පුද්ගලයන්, සමාගම් හා සංවිධානවලින් යුත් දැලකට සමාන සන්ධානයක් සෑදීමය. එසේ වූ කල නොයෙක් රටවල නොයෙක් දෙනාට තම තමන්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීමට ද උනුන්ට උපස්ථම්භකවීමට ද අවස්ථාව ලැබේ.

අප අතර කුළුපග සම්බන්ධකම් ඇති කර ගත හැක්කේ ආසන්නතාව ඇසුරින් හෝ ආත්ම සමානතාව ඇසුරින්ය. කිසියම් පුරුෂාර්ථ සමූහයක් පිළිබඳ සම්මුතියක් ඇති කීපදෙනෙකු උනුන්ට සමීප වූ කල, අධ්‍යාත්ම විඥාන ධාරාවක් ඔවුන් තුළින් ජනිත වේ. මෙය යථාභූත සත්‍යයක් බවට පත් වී විශාල ජන සංඛ්‍යාවක් තුළට කා වැදේ. සර්වෝදයත් රිසෝ-කෝසිකායි නම් සංවිධානයත් අතර සහවාසතාව මෙවැන්නකි. සංවිධාන දෙකේ සාමාජිකයෝ උනුන් බැහැ දැකීමට ඔබ මොබ යති. අපි සම්පත් හුවමාරු කර ගනිමු. උනුන්ගෙන් ඉගෙන ගනිමු. උනුන් ශක්තිමත් කරමු. සර්වෝදයත් සමඟ සහෝදර සම්බන්ධකම් ඇති කර ගත් පළමුවැනි ජපන් ආයතනය .රිසෝ-කොසිකායි. නම් සංවිධානය වන අතර, වෙනත් පුද්ගලයන්' සමාගම් හා ආණ්ඩු නොවන ආයතන කිහිපයක් අප සමඟ අත්වැල් බැඳගෙන ක්‍රියා කරන්නට සූදානම්ව සිටින බව මා සඳහන් කරන්නේ සතුටින්ය. අප ප්‍රාර්ථනා කරන අභිනව සමස්ත ලෝක සංසදය පිහිටුවීමට ජපන් ජනතාවට ඉතා වැදගත් කාර්යයක් ඉටු කිරීමට තිබේ යයි මම විශ්වාස කරමි.

සර්වෝදය සන්දේශය ලෝකයේ කාර්මික වූත්, කාර්මික නොවූත්, රටවලට ගෙන යන්නට සර්වෝදයට හැකි වී තිබේ. නොයෙක් රටවලින් තරුණ අය විශාල සංඛ්‍යාවක් අවුත් සර්වෝදයෙහි වැඩ කරති. පසුගිය අවුරුදු විසිපහ තුළදී මගේ කාලයෙන් සැහෙන කොටසක් මා කැප කළේ අහිංසාව, සාමය හා යුක්තිය පිළිබඳ සන්දේශය නොයෙක් රටවලටත් ජාත්‍යන්තර සම්මේලනවලටත් ගෙන යාමටය. මේ සේවය නොකඩවා පවත්වාගෙන යා යුතුය.

අපේ කාර්යාවලියේ තෙවැනි අංකය වනුයේ, අපේ ගෙවල්වලත් සමිති සමාගම්වලත් විශ්ව සම්මත පුරුෂාර්ථ මත ගොඩනගා ඇති ජීවන රටාවන් පිළිගත හැකි අහිංසාවාදී බෙදා හැරීම් හා පරිභෝජන ක්‍රම දේශීය සීමා ඉක්මවා ව්‍යාප්ත කිරීමයි.

සර්වෝදය නිවාසයන්හිත්, සමිති සමාගම්වලත් මූලික දශවිධ අවශ්‍යතා සතැප්වීමේ වැඩ පිළිවෙල නමින් යුත් ක්‍රියාවලියක් අප දියත් කොට ඇත. අපේ අධ්‍යාශය වනුයේ දුප්පත්කමින් තොර, පිරිසිදු පරිසරයකින් යුත්, පිරිසිදු ජලය, පෝෂ්‍ය ආහාර, චාම් ඇඳුම් පැළඳුම් හා ඉඳුම් හිටුම්වලින් තෘප්තිමත් වන සෞඛ්‍යයට අවශ්‍ය මූලික සන්තර්පණය යන මේ අංගවලින් යුත් දිවි පෙවෙතක් සෑම දෙනාටම සපයා දීමත්, අධ්‍යාපන පහසුකම් හා සංස්කෘතික වර්ධනය සඳහා අවශ්‍ය වූ අවස්ථාවෙහිදී යම් ප්‍රමාණයක බලශක්ති හා සන්නිවේදන පහසුකම් සැපයීමත්ය.

අතිශය ප්‍රමාණයෙන් පංචේන්ද්‍රියන් පිනවීමේ අරමුණකින් යුත් ජීවන ශෛලියක් මේ ග්‍රහලෝකයට ඔරොත්තු නොදෙන වග පෙනෙන මේ යුගයේ, සර්වෝදය ජීවන රටාව අතිශයින් යෝග්‍ය බව කිව යුතුය. අනිත් අතට එබඳු ජීවන ශෛලියක් විඳීමට වාසනාව ලැබ සිටින ස්වල්ප දෙනාට වුව ජීවිතයක අගය පහදා දීම නොමැනවි දැයි සිතා බැලිය යුතුය.

සතුටට පත් මිනිස් සමාජයක් වූ කලී, ආධ්‍යාත්මික සන්තෘප්තියත් අරමුණු වූ සමාජයත් යැයි විශ්වාස කරන අපි, තෘෂ්ණාවට තුඩු දෙන අමුතු අමුතු දේ නිර්මාණය කොට, එම තෘෂ්ණාව නොයෙක් අයුරින් පිනවා ජීවිතය ගත කරන සුළු පිරිසකට වුව එයින් සතුටක් ලැබේ ද යන්න ගැන සැක කරමු.

අනිත් අතට, ස්වල්ප දෙනෙකු ගත කරන අතිශය සුඛෝපභෝගී ජීවිත දකින විට එය අනුකරණය කිරීමට සෙස්සන්ට සිතේ. සැම දෙනාගේම ජීවන රටාව අන්‍යෝන්‍ය සම්බන්ධයක් තිබෙන බැවින් දුප්පත් නොවූත් පොහොසත් නොවූත් ජීවන ශෛලියක් නිපදවීම අද දවසේ අවශ්‍යතාවක් බව පෙනේ. මෙසේ වූ කල ස්වල්ප දෙනෙකුගේ ජීවන ශෛලිය බහුතර ජනතාවගේ ජීවන ශෛලියට තර්ජනයක් නොවන්නට ඉඩ තිබේ.

සතරවෙනි පියවර නම්, පවුල් සියයකට වඩා විශාල නොවන ආධ්‍යාත්මික, මනෝවිද්‍යාත්මක හා සමාජමය අඩස්ථලයක් ග්‍රාමීය හා නාගරික සමාජවල පිහිටුවීමය. තරුණ වූත් වයෝවෘද්ධ වූත් සාමාජිකයන්ට අන්‍යයන් හඳුනා ගැනීමට හැකි වන ප්‍රමාණයට මෙවැනි සමාජ සකස් කළ යුතුය.

අපේ රටවල් ඇතුළතත්, රටවල් අතරත් අද දවසේ දක්නට ලැබෙන රෞද්‍ර ගති පැවැතුම්වලට හේතු දෙකක් තිබේ.

එක හේතුවක් රඳා පවතින්නේ නිතර තෘෂ්ණාව හා ද්වේෂය ජනිත කරවන අපේම මනස් තුළය. අනික් හේතුව නම්, තෘෂ්ණාව හා ද්වේෂය උපදවා සාමූහික කටයුතුවලට යොදා ගන්නා අපේ සමාජ, ආර්ථික හා දේශපාලන සංසදයයි. මේ දේශපාලන හා ආර්ථික සංසද විශාල වන ප්‍රමාණයට ස්වල්ප දෙනා අතේ රැඳෙන බලය ඒ තරමට ම විශාල වේ.

සත්‍යය, අහිංසාව, පරාර්ථකාමය, දානාභිරතිය, සදාචාරය, ආධ්‍යාත්මික ගුණ ධර්මය, දයාව යනාදී ගුණාංග අපේ පුද්ගල

ජීවිතයෙහිත් පවුල් ජීවිතයෙහි හා සමූහ ජීවිතයෙහිත් ප්‍රකට විය හැකි ගුණාංගය. කෙසේ වෙතත් එම ගුණාංග සිත් පිත් නැති රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවල මුල් බැස ගෙන වර්ධනය විය නොහැකිය. ජනාධිපතිවරු, අගමැතිවරු, රජවරු, බිසෝවරු, ඇමතිවරු, රාජ දූතයෝ, නිලධාරීහු, සේනාධිපතිවරු, සංස්ථා නායකයෝ මේ ආදීහු පිරිසිදු චේතනාවෙන් යුත් උදාර පුරුෂයන් විය හැකිය. එහෙත් රාජ්‍ය හෝ යුද හමුදා හෝ කාර්මික හෝ ආයතනවල විශාලත්වය හා යාන්ත්‍රිකත්වය නිසා උසස් පුරුෂාර්ථ අනුගමනය කරමින් ඒවා පාලනය කිරීමට ඔවුන්ට ඉඩ නොලැබේ.

සමාජවාදී හා ධනවාදී සමාජවල යම් මානුෂික ලක්ෂණ තිබුණ ද, ඒවා අද දවසේ අතුරුදහන් වී ඇත. පූර්ව දිග යුරෝපයේ රටවල මෙන් සෝවියට් දේශයේ ද කොමියුනිස්ට්වාදය බිඳ වැටෙන බව පෙනේ. එහෙත් ධනවාදයේ ජයග්‍රහණය ද වැඩි කලක් නොපවතී. හුදු ආයුධ බලයෙන් හෝ රෞද්‍ර පාලනයෙන් මහා පරිමාණයේ ආයතන හසුරුවා සිටින නායකයෝ අධර්මිෂ්ට වී පිරිහෙති. තාක්ෂණය හා නවීන ආයුධ වැරදි අයුරින් පාවිච්චි කිරීම හේතු කොටගෙන, පරිසරයේත්, ජීව ලෝකයේත් සෞඛ්‍යය පිළිබඳ ව්‍යසන හටගත් කල, මේ සියල්ල ඇස් පනාපිට බිඳ වැටෙනු ඇත. මේ හැම දෙයක්ම ආරක්ෂා කිරීමට විකල්පිත විසඳුම් සෙවීම මෙහි රැස්ව සිටින්නා වූ ඔබ වැනි සංවේදී විශ්ව පුත්‍රයන්ගේ කාර්යය භාරය බව මම මතක් කර දෙන්ට කැමැත්තෙමි.

විශ්ව ව්‍යාප්ත අධ්‍යාත්ම ප්‍රබෝධය ඇති කිරීම සඳහා මා යෝජනා කරන්ට කැමති පස්වෙනි උපාය නම්, ජනතාවගේ පාලනය යටතේ ක්‍රියා කරන ආධ්‍යාත්මික, සංස්කෘතික, සමාජයීය, ආර්ථික හා දේශපාලනමය සංස්ථා පිහිටුවීමය.

ස්වකීය භෞතික සාමාජික හා පාරිසරික කටයුතු පාලනය කරන මානව සමාජ ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලෝකය පුරා පිහිටුවීමෙන් පසු, අභිනව සමාජයක් බිහි කිරීමේ විශ්ව ව්‍යාප්ත ප්‍රවර්තනය අධෝ භාගයෙන් ආරම්භ වී සමාන්තරවත්, ඌර්ධාංගමවත් පැතිරී යනු ඇත.

මෙබඳු සමාන්තර උදාවක අවශ්‍යතාව අද දවසේ විශාල සමාජ සංස්ථාන පාලනය කරන ඇත්තන්ට වැටහෙන ප්‍රමාණයෙන් එම ප්‍රවර්ථනය සීඝ්‍ර ලෙස වර්ධනය වනු ඇත. ඒ සමඟම නාශක ආයුධ සෑදීමේ ව්‍යාපාරද ක්‍රමයෙන් පිරිහෙනු ඇත. එමෙන්ම පරිසරය දූෂණය කරන මාරක උපකරණවල පරිභූංජනය ද අඩු වී යනු ඇත.

තතු මෙසේ වූ කල, ජනතාව මර්දනය කොට පාලනය ගෙන යන රාජ්‍ය සංස්ථාන ද අනවශ්‍ය වී යයි. අපේ ග්‍රහලෝකයෙහි සහශ්‍ර සංඛ්‍යාත ස්වයං පාලන සමාජ සංස්ථා බිහි වේ. බොහෝ දුරට ඒවා ස්වයංපෝෂිත වනු ඇත. එම සංස්ථාන ස්වභාව ධර්මයට අවිරෝධව පවතී. හැම සංස්කෘතික ජන කොට්ඨාශයක්ම ආරක්ෂා කරනු ලැබ, සමාජය උද්දීපනය කිරීමට හේතු වේ. ආත්ම සංයමයෙන් හා උට්ඨාන වීර්යයෙන් යුක්ත වූ පුද්ගලයන්ට නායකත්වයක් ඉසිලීමට අවස්ථාව ලැබේ. මධ්‍යගතව වර්ධිත සමාජ සංස්ථාවල මෙන් ඔවුන් කොන් කරනු නොලැබේ. විශ්ව සමාජයකට අයත් වන්නා වූ අපි, නවීන විද්‍යාව හා තාක්ෂණික ව්‍යවහාරය පිළිබඳ විශාල ඥාන සම්භාරයක් හිමි වූවෝ වෙමු. අපේ අනුවණකම නිසා අප මෙය යොදා ගෙන ඇත්තේ අපේ තිරශ්චීන ආශා පිනවීම සඳහාය. මේ බලසම්පන්න ආයුධ මධ්‍යගත පාලන ක්‍රමවල පිහිටෙන් බලය ලබා ගන්නට හැකි වූ ආත්මාර්ථකාමී, තෘෂ්ණා සහගත, කෲර පුද්ගලයන්ගේ අතට පත් වූ විට, ඔව්හු සොබා දහම විනාශ කළෝය. නූතන විද්‍යා ඥානය හා තාක්ෂණය හිමි කර ගත නොහැකි වූවන් කොන් කළෝය. ලෝක සංග්‍රාම දෙකක් හා කුඩා සංග්‍රාම කිහිපයක් ඇරඹූවාහුය. ඒ කෙසේ වෙතත් විශ්වයේ වැසියන් වශයෙන් අපට මහඟු අධ්‍යාත්ම ඥාන සම්භාරයක් උරුම වී තිබේ. මේ ඥානය වඩාත්ම යොදා ගන්නේ අපේ සීමා සහිත ජීවන ක්ෂෙත්‍රයෙහි විශේෂයෙන් අපේ පවුල් ජීවිතයෙහි ඊළඟ ජන්මයෙහි හෝ දිව්‍ය ලෝකයෙහි සම්පත් විඳීමට පතමිනි. උදාර පුරුෂාර්ථ ඇති සන්තුෂ්ටියෙන් යුත් සාමකාමී විශ්ව සමාජයක් පිහිටුවීම සඳහා එක් අතකින් විද්‍යාව හා තාක්ෂණයත්, අනික් අතින් ලෝකෝත්තර ප්‍රඥාවත් සංයෝග කළ යුතු යුගය දැන් උදා වී තිබේ.

මගේ රටෙහි හා සමස්ත විශ්වයෙහි මගේ පංගුකාරයන්ගේ උපස්තම්භයෙන් මෙකී ආකාරයේ සමාජයක් පිහිටුවීම සඳහා ලෝකය පුරා අපේ සර්වෝදය සේවාව යොදා ගැනීමටත්, එම ඊප්සිතාර්ථය සාධාලීමටත් මගේ ජීවිතයේ ඉතිරි කාලය යොදවන බව මේ අනුස්මරණීය අවස්ථාවේ සම්භාවනීය ඔබතුමන් ඉදිරියේ මම ප්‍රතිඥා දෙමි. ඒ සමගම මා තුළ ඇති රාග, දෝෂ මෝහ යන නීවරණයන් හැකි තාක් පහ කිරීමෙන්, සම්‍යක් ඥානය ලබා ගනිමින් මේ මිහිපිට ම අප විසින් තනා ගත යුතු දිව්‍ය භවනෙහි විසීමට සුදුසු සාමාජිකයෙක් වෙම්වායි පතමි.

අවසාන වශයෙන් ධම්මපදයෙහි එන බුද්ධ වචනය මම උපුටා දක්වන්නට කැමැත්තෙමි.

ආරෝග්‍යා පරමා ලාභා
සන්තුට්ඨී පරමං ධනං
විස්සාසා පරමා ඥාතී
නිබ්බානං පරමං සුඛ.

ඔබ සැමට ත්‍රිවිධ රත්නයේ පිහිටයි!
දෙවිවරු ඔබ ආරක්ෂා කෙරෙත්වා!

1992.05.12
ටෝකියෝ - ජපානය.
(ඉංගිරිසියෙන් පවත්වන ලද කථාවේ සිංහල පරිවර්තනයකි.)

ප්‍රඥාවන්තයාට ලෝකය එකම පවුලකි.
නිවානෝ සාම ත්‍යාගය ලැබීමෙන් පසු පිළිගැනීමේ උත්සවය

නිවානෝ සාම ත්‍යාගය ලැබීමෙන් පසු උත්සවයක් සංවිධානය කිරීම පිළිබඳව සර්වෝදය විධායක මණ්ඩලයට ස්තුතිවන්ත වෙමි. අද දින ඔබ හැම දෙනාගේම පැමිණීම, මම බොහෝ සෙයින් අගය කරමි.

පිටස්තරදී ලබන ගරු සත්කාරවලට වඩා, තම ජන්ම භූමියේදී තමන්ගේම ඇත්තන්ගෙන් ලබන සැබෑ ආදරය සහ දයාන්විත ආශීර්වාදය අනන්ත වාරයක් අගනේය.

කෙසේ වෙතත් මීට පෙර ජාත්‍යන්තර සම්මාන හතක් ලබා සිටි මම, පසුගිය මැයි මස 12 වැනිදා ජපානයේ දී 'නිවානෝ සාම තිළිණය' ලැබීම මනෝවිද්‍යාත්මක වශයෙන් විශ්ව ප්‍රජාවත් සමඟ මගේ එක් වීම තවත් ළං කිරීමකි. මගේ පවුලට, සංවිධානයට හා රටට තිබෙන මගේ බැඳීම පටු බැඳීමක් නොවිය යුතුය. පටු සීමාවන්

උත්සව ශාලාවට කැඳවා ගෙන ඒම

උප සභාපතිනි සිතා රාජසූරිය මහත්මිය විසින් ගරු අග්‍රාමාත්‍ය
සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශාලාවට කැඳවා ගෙන ඒම.

ශ්‍රී රාමක්‍රිෂ්ණ බජාජ් මැතිතුමා අගමැතිනිය සමඟ කතාබහක යෙදීසිටි අයුරු



පොල්තෙල් පහන දැල්වීම



පොල්තෙල් පහන දැල්වීම

ඇතුළත, කොටු වී තිබෙන මනස, එයින් නිදහස් වීමෙන් තමන්ට ළඟින් ආදරයෙන් සිටි අයගෙන් ඈත් වීමකට වඩා ගැඹුරු සම්බන්ධයකින්, ගෞරවාන්විතව ළං වන බව කිව යුතුය.

නව හැවිරිදි කුඩා දරුවෙකු හැටියට .කළුකඩ වෙළඳාමෙන්. මුදල් ඉපයීමට මගේ පියා ප්‍රතික්ෂේප කළේ මන්ද.යි එම යුගයේ මට තේරුම් ගැනීමට නොහැකි විය. දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමත් සමඟ පාරිභෝගික ද්‍රව්‍යවල තිබූ හිඟකමෙන් ප්‍රයෝජනය ගෙන, බොහෝ අය අයථා ක්‍රමවලින් මුදල් ඉපයූහ. එහෙත් මගේ පියා කීවේ, වස්තු සම්භාරයක් එක් තැන් කිරීමට වඩා නිවැරදි ජීවන ක්‍රමය අපට වඩා වටිනා බවයි.

මගේ වැඩිහිටි ජීවිතයේදී මා ලැබූ ප්‍රථම ජාත්‍යන්තර ත්‍යාගය වූ 'රමන් මැග්සයිසයි' සම්මානයේ සෑම ශතයක්ම මා විසින් පරිත්‍යාග කළ යුතු යැයි, මගේ දෙමව්පියන් පවසන විට, එය තේරුම් ගැනීමට තරම් මගේ මනස මුහුකුරා ගොස් තිබුණේය. යමෙක් සතුට ලැබිය යුත්තේ කරන ක්‍රියාවෙන් පමණකි. එයින් ලැබෙන ප්‍රතිලාභ නිසා නොවේ. මෙය භගවත් ගීතාවේ දැක්වෙන අගනා උපදේශයකි.

මා කිසි දිනෙක ධනය හෝ බලය පසුපස නොයන බව, මගේ පියා ස්ථිරව දැන සිටි නිසා එතුමා මිය ගියේ අතිශය සන්තෝෂයෙනි. කිසි දිනෙක භෞතික වශයෙන් ආඪ්‍ය බවක් අපට නොතිබුණත්, පරිත්‍යාගශීලීත්වය සහ ආත්මහරණය පිළිබඳ මාවතේ යෑමට මා ධෛර්යවත් කළ දෙමව්පියන්ට සදා ණයගැති වෙමි.

අවුරුදු 92 ක් වූ මගේ මෑණියෝ දැනට වසරකට පමණ පෙර මෙලොව හැර යෑමට තීරණය කළහ. මේ වකවානුව වන විට පවතින ශ්‍රී ලාංකික බල ව්‍යුහය විසින් අප තෝරා ගත් සාරධර්ම පද්ධතිය පදනම් කර ගෙන ජීවත් වී සෑම දෙනා සඳහාම ආදරයත්, සේවයත් ලබාදීමේ ක්‍රියාවලියට බොහෝ බාධක පනවා තිබුණු

යුගයකි. අදත් අප විඳින මේ මානසික වේදනාවෙන්, අපේ මැණියන් ගැලවීම අපට සැනසීමකි. හොඳින් ජීවත්ව, හොඳින් පාඩම් ඉගෙන, හොඳින් අපට ඒවා උගන්වා, දිව්‍යමය ප්‍රතිඵල ලැබීම සඳහා ඇය අපෙන් වෙන් විය.

යමෙක් දුක් විඳින විට, තමා ගැනම සෙවීමට පෙළඹේ. තමන් ගැන සොයන විට අනුන්ගේ ස්වභාවයත් ලෝකයේ ස්වභාවයත් තේරුම් ගත හැකි වේ. දුක් විඳින්නේ නැතිව, දුක ඇති වන හේතු සොයා ගත නොහැකිය. හේතු සොයා ගත් විට, ඒවා ඉවත් කළ හැකි බවත් ඒ සඳහා පැහැදිලි මාර්ගයක් තිබෙන බවත් අවබෝධ වේ. ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේගේ විග්‍රහයත් ඉගැන්වීමත් එයයි.

බුදුරජාණන් වහන්සේගේ අනුගාමිකයෙක් හැටියට සත්‍යයේ සහ අහිංසාවේ මාර්ගයෙන් පිට නොපැන සංවිධානය වූ අසත්‍යයට සහ හිංසාවට මුහුණ දීමට අවශ්‍ය ආධ්‍යාත්මික ශක්තිය ගොඩනගා ගැනීමට මම වෙහෙසෙමි.

ඉන්දීය නිදහස් සටන පැවැති කලබලකාරී යුගයේදී, මනුෂ්‍ය වර්ගයාට ආදරය කිරීමටත් සේවය කිරීමටත් අවශ්‍ය නිදහස ලබා ගැනීම සඳහා මහත්මා ගාන්ධිතුමා මුවහත් කොට පාවිච්චි කළ සත්‍යය සහ අහිංසාව යන ආයුධ, අපට ද මේ අමාරු අවස්ථාවේදී සැනසීමක් සහ මඟ පෙන්වීමක් ලබාදෙයි.

අප කතා කරන හැම වචනයකම, අප ලියන හැම වචනයකම, ඉමහත් චිත්ත ශක්තීන් ගැබ්ව තිබේ. ඒවා ලෝභයෙන් සහ වෛරයෙන් නොපිරවීමට අපි පරෙස්සම් විය යුතු වෙමු. අප එසේ කළහොත් ලෝභකම සහ වෛරය පමණක් නොව, අපි මෝඩකම ද සංවිධානය කරන්නෝ වෙමු. පසුගිය අවුරුදු තුනහමාර තුළදී අපට මුහුණ දෙන්නට සිදු වූ කරදරවලට අප මුහුණ දුන්නේ මෙවැනි හැඟීම්වල පිහිටීමෙනි.

24 Pages

Daily News

Late City

The English Daily with the largest circulation in Sri Lanka

MONDAY, JUNE 14, 1982. PRICE Rs. 1/75

Ariyaratne, the man who built Sarvodaya

M.W. KARUNANANDA

President to congratulate Sarvodaya leader

スリランカに報道の自由を

指導者・アリヤラトネ氏に聞く


中傷記事の載った政府系新聞を掲げ、「スリランカに報道の自由を」と訴えるアリヤラトネさん＝京都市下京区のホテルで5月13日

第三世界での草の根の開発運動として世界のNGO（非政府組織）から高く評価されているスリランカのサルボダヤ運動。その指導者のアリヤラトネ会長(六〇)が庭野平和賞受賞のため来日した。受賞講演やインタビューのなかで、政府から圧力を受けていることを明らかにしてNGO関係者を驚かせた。いったい、何が起こっているのか。日本での講演、インタビューから抜き書きしてみた。

（社会部編集委員・佐竹通男）

サルボダヤ運動に圧力

＜いつごろから、どんな圧力が＞ 三年半ほど前にプレマダサ大統領になってからだ。国営のテレビ・ラジオ、政府系新聞による私への中傷がひどい。たとえば、五月十二日付の政府系新聞は、私が今回受賞した庭野平和賞の賞金二千万円のうち千二百万円を自己宣伝に使った、とデタラメを一面で報じている。私や家族を殺すという脅迫もある。サルボダヤの土地が不正なやり方で没収されたり、有形無形の圧力がかかっている。それだけに、今回の賞は大きな励ましだ。

＜政府との関係は良好とされてきたはずなのに、なぜ＞ 運動が始まって以来、特定の政党とかかわりを持たず、政府とも一定の距離を保ちながら人々のためになることなら政府と協力することも妨げないという姿勢をとってきた。政府はおおむね協力的で、ジャヤワルデネ前大統領時代は非常によい関係だった。

現政権がなぜ私を攻撃するのか、いまだにわからないが、おそらく、恐怖感、運動の成功に対するしっと心があるのだろう。政策批判に出るのではないか、大統領候補として政権奪取を狙っているのではないか、といったような。私に政治的な野心はなく、政党や権力政治にかかわるつもりはない。

＜スリランカの現状は＞ スリランカの人口は千六百七十万人。その四割に当たる最貧困層は一九七三年には国民総所得の二割弱を得ていたが、八七年には一割に。現在、国民の六五％が貧困ライン以下で政府支給の食券で暮らし、貧富の差が拡大している。植民地支配者から受け継いだ政治経済システムは、旧ソ連同様、行き詰まっている。

富と政治権力は少数者が握り、人々は民主的な自由を失い、基本的人権も侵害されている。シンハラ人とタミル人の民族対立による内戦、テロリズム、村落間の暴力事件、環境汚染が起こり、軍、警察が強化されている。こんななかで、民族的、宗教的に、一方にくみすることなく、民衆の社会参加による開発運動を進めていくのは非常に難しい。

庭野平和賞は励み

＜今後の運動は＞ 運動は年々拡大し、各国のNGOの支援を受けているが、予算が絶対的に不足している。保育園、身体・精神障害者、麻薬患者、アルコール依存症、内戦犠牲者などの救済に当たらなければならない。我々の役目はますます大きくなっている。

シンハラ、タミル間の紛争はイスラム教徒をも巻き込み、罪のない人が大勢死んでいる。これに対する政府の政策は警察、軍隊を強化するだけ。政党はノータッチという傾向がみられる。

我々は（和解調停の）チャンスを与えてくれと政府に訴えている。この問題は民衆で解決できる。幸い、サルボダヤに対して、軍隊もタミル人過激派「タミル・イーラム解放のトラ」（LTTE）もまったく危害を加えない。いま、カナダ、オランダ、英国の援助を受け、紛争地域で緊急援助を進めている。七月には、紛争地域をひと月かけて回り、民衆レベルで和解への話し合いを進めたい。

＜日本が協力できることは＞ 第一に、報道・表現の自由の回復に力を貸してほしい。スリランカのメディアはごく少数の勇気ある新聞を除いて、政府のいいなりだ。二つ目は基本的な人権の順守要求への協力を。一九八九年から一年間で七万人が逮捕後、行方不明になっている。非常事態の名の下に裁判を受ける権利が踏みにじられている。

三つ目はダムや発電所など大規模開発プロジェクトへの援助の中止。利益が国民に行き渡っておらず、多くの抗争や腐敗をうみ、環境破壊をもたらすだけだ。

最近、南部で火力発電所や超高級ホテル建設計画が持ち上がったが、私たちは反対した。建設でため池が壊され、仏教の聖域がおかされ、地域文化の破壊につながるからだ。援助はため池の修理など小規模なものを対象にしてほしい。これこそ貧しい人々の自立につながる。日本の皆さんとの連携を深めたい。

සර්වෝදය පිළිබඳව ජපන් පුවත්පතක් පළකළ වාර්තාවක්

මේ යුගයේ දිනපතාම වාගේ රහස් පොලීසිය, කම්කරු දෙපාර්තමේන්තුව, රාජ්‍ය නොවන සංවිධාන ගැන සොයන කොමිෂන් සභාව ආදී වූ ආයතන හා සංවිධානවලින් පැමිණෙන බොහෝ ශිෂ්ට මිනිසුන් මුණගැසෙන්නටත්, ඔවුන්ගේ විමසුම්වලට ලක්වන්නටත් අපට ස්වර්ණමය අවස්ථාවක් ලැබුණේය.

රජය විසින් පාලනය වන මාධ්‍යවල හැසිරීම් රටාව නිසා, සෑම තරාතිරමකම මහජනතාවගෙන් සර්වෝදයට මෙතෙක් නොලැබුණු විදියේ අනුකම්පාවක් ලැබී තිබේ. බියෙන් අවිශ්වාස යෙන් සහ සමහර විට අව සිහියෙන් පිරුණු වාතාවරණයක සිට, ලංකාවේ ගම් 8600 ක ජනතාව සමඟ අපට සේවය කළ හැකි එකම ක්‍රමය නිරන්තරයෙන්ම අපේ පෞරුෂයන්හි තිබෙන ආධ්‍යාත්මික අන්තර්ගතය වර්ධනය කර ගැනීමයි.

දිනපතා මා කරන භාවනාවෙහි දී සෑම දෙනෙක්ම ඇතුළත් කර ගැනීමටත්, කිසිවෙක් පිටස්තර නොකිරීමටත්, මම හැම මහන්සියක්ම ගනිමි. ''ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට වෛර කරන්නන්ට යහපත සලසන්න'' යන ජේසුස් වහන්සේගේ වචන මගේ හදවතේ සිට මගේ මනසට ගලා යයි.

මෙවැනි අවස්ථාවක 'නිවානෝ සාම ත්‍යාගය' ලැබීම අපේ සියලුම අවංක සේවක සේවිකාවන්ට විශාල ධෛර්යයකි. මෙහි අද රැස්ව සිටින ඔබ හැම දෙනා තුළ ඇති යහපත් බව කෙරෙහිත් විශාල හදවත් ඇති ලොව පුරා සිටින මිනිසුන්ගේ යහපත් බව ගැනත්, මා තුළ ඇති විශ්වාසය තවත් තහවුරු වීමකි.

මට පිරිනැමුනු සෑම ත්‍යාගයකටම සම්බන්ධ මුදල් මට පෞද්ගලිකව පිරිනැමූ ඒවාය. එහෙත්, එයින් එක් ශතයක්වත් අතීතයේදී මාගේ හෝ මාගේ පවුලේ කිසිවෙකුගේ පෞද්ගලික ප්‍රයෝජනයට නොගත් අතර, අනාගතයේදී ද එම ප්‍රතිපත්තිය මත පිහිටා කටයුතු කරන බව මෙම පූජනීය මහා සංඝරත්නය සහ

සෙසු ආගමික නායකයින් සහ මෙම සම්භාවනීය සභාව ඉදිරියෙහිදී නැවත වරක් මම ප්‍රකාශ කරමි.

අපේ මූලික අවශ්‍යතාවන් සපුරා ගෙන, සරල චාම් ජීවන රටාවක් පවත්වා ගෙන යාම සඳහා මටත්, මගේ පවුලේ සාමාජිකයන්ටත් වෙනත් සෑහෙන නීත්‍යානුකූල මාර්ග තිබෙන බව සඳහන් කරමි. ධන ආශාව ප්‍රතික්ෂේප කරන අතර, මම බල ආශාව ද ප්‍රතික්ෂේප කරමි. සමාජ සුභසාධන කටයුතු, සංවර්ධන කටයුතු සහ සමාජ ව්‍යුහයේ අහිංසාවාදී වෙනස්කම් ඇති කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීම යන ත්‍රිවිධ මාර්ගයක් සර්වෝදයේ අපි ඒකාබද්ධව ක්‍රියාත්මක කරමු.

ආගන්තුක සත්කාරය අතින් ඉහළ තැනකට පත්ව ඇති ජපානයේ ජනතාවගෙන් සහ ජපන් රටෙන් අපට බොහෝ පාඩම් ඉගෙන ගත හැකිය. පසුගිය සති තුන ඇතුළතදීත්, ඊට ප්‍රථමයෙනුත්, ජපානය ගැන මා ලත් අත්දැකීම්වලින් මතු වූ අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. ජපානය සමඟ එකතුව සංවර්ධන මාර්ගයෙහි අපට බොහෝ දුර ගමන් කළ හැකිය. ජපානයේ සිත් ගන්නා අංශ බොහෝය. ඔවුන් ගොඩනගා ඇති භෞතික පදනම අංග සම්පූර්ණය. තම ජනතාවගේ දුක දකින, හද වේදනාවට පත් වන ශ්‍රී ලාංකිකයෙකුට, ජපානයේදී දක්නට ලැබෙන ඉතාම වැදගත් ලක්ෂණයක් වනුයේ ජපන් සමාජයේ සියලුම පුරවැසියන්ගේ සුභසාධනය ඒකාකාරීව රැක බලා ගැනීම සඳහා ඔවුන් සමගියෙන් වැඩ කරන ආකාරයයි.

ජපානයේ සාමකාමී වීමේ රහස හැටියට මට පෙනෙන්නේ රට ඇතුළත සියලුම ජනතාවගේ සුභසාධනය මේ අන්දමින් ස්ථිර කර තිබීමයි. ලිඛිතව නැතත්, රට තුළ සැබෑ කැපවීමේ ප්‍රතිපත්තිය වනුයේ සංවර්ධනයට සහභාගි වන්නන් හැටියට සංවර්ධනයේ ප්‍රතිඵල භුක්ති විඳින්නෙක් හැටියට සියලුම මිනිසුනට තැනක් ලබාදීමට ඉඩ සලසා තිබීමයි. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු,

තමා සේවය කරන සමාගමේ හෝ තම රටේ සුභසිද්ධිය, ආත්මාර්ථකාමී බව අභිබවා ඔවුහු සැලකූහ.

මහත්මා ගාන්ධිතුමාගේ ජීවිත කාලය තුළ දී ප්‍රකාශ කළ දර්ශනය සමාජය සහ ආර්ථික ජීවිතය කෙරෙහි ජපානය ක්‍රියාවට නංවා තිබෙන බව පෙනේ. ගාන්ධිතුමා සියල්ලන් යන අදහස ඇති 'සර්ව' යන වචනයත්, යහපත යන වචනය තේරුම ඇතුව 'උදාව' යන වචනයත් එකතු කොට සර්වෝදය යන අලුත් වචනය නිර්මාණය කළේය.

එහෙත් අපේ බොහෝ රටවල මෙවැනි අන්දමට නොසිතා, අපි නමින් පමණක් ප්‍රජාතන්ත්‍රවාදීව ටික දෙනෙකුගේ සුඛෝපභෝගිත්වය පමණක් ස්ථිර කොට බලය යොදා රටවල් පාලනය කරන බව පෙනේ.

ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල වැඩි දෙනාගේ යහපත ස්ථිර කර තිබේ. එහෙත් ලොස්ඇංජලීස් නගරයේ ළඟදී සිදු වූ කැරලි කෝලාහලවලින් අපට පෙනෙන්නේ එයත් ප්‍රමාණවත් නොවන බවයි. කළු ජාතික සුළු ජනතාව පසුගිය දශකය තුළ ක්‍රියාත්මක වූ දක්ෂිණාංශික ප්‍රතිපත්ති නිසා ප්‍රධාන ජන ප්‍රවාහයෙන් වෙන් වූහ. ඔවුන් කළේ විශාල විනාශකාරී ක්‍රියා තුළින් විරෝධය දැක්වීමය.

අන් අයට වඩා ආඪ්‍ය ජීවිතයක් ගත කරන අය දක්ෂිණාංශික ප්‍රතිපත්තිවලට කැමති වෙයි. ඔවුන් පවසන්නේ වඩා අමාරුකම්වලින් පෙළෙන සහෝදර ජනතාවගේ දුක නිවීම ඔවුන්ගේ වගකීමක් නොවන බවයි. සමාජයේ ජීවත් වන්නවුන් එකිනෙකාට සම්බන්ධ වූ එකිනෙකාගෙන් යැපෙන සමස්තයක් බව ඔවුහු අමතක කරති. අපි නෙළුම් මල් වැනි වේ. ජලයට ඉහළ මතුපිටින් වෙන්ව තිබුණත් ජලය යට දී අප සියල්ලෝම එකිනෙකාට සම්බන්ධය. ලොස්ඇංජලීස් වර්ණ භේද කෝලාහලවලින් පසු

අමෙරිකා එක්සත් ජනපදයේ ජනතාව මෙය තේරුම් ගෙන, ඒවා නිවැරදි කර ගැනීමට අලුත් අදහසක් මත නව නායකත්ව මතු කිරීමට කටයුතු යොදන බව පෙනේ.

අනෙක් අතින් බලන විට අපේම රටේ ජනතා විමුක්ති පෙරමුණේ සහ එල්ටීටීඊ සංවිධානයේ කැරලි කෝලාහලවලින් ඇති වූ විනාශයේ සුලමුල නොසොයන අපේ නායකයෝ, පැරණි ක්‍රමයටම කටයුතු කරනු දැක්ම සංවේගයට කරුණකි. එකට වැඩ කිරීම ගැන ඔවුහු බොහෝ කතා කරති. එහෙත් සැම දෙනාගේම යහපත පිණිස සේවය කරන සර්වෝදය, අපට මෙන්ම වෙනත් අප වගේ අය ද මුහුණ දෙන කරදර හිරිහැර ගැන සිතන විට මෙය ක්‍රියාවෙන් සිදුවන බවක් නොපෙනේ.

ඔවුන්ගේ දේශ සීමාව ඇතුළත සැම දෙනාගේම සුභසාධනය තහවුරු වන අන්දමේ ආර්ථික සහ සාමාජික සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ ජපානය, සාර්ථක ප්‍රතිඵල ලබා තිබේ. අද දුප්පත් රටවල් ජපානය දෙස බලන්නේ විදේශ ආධාර සහ ආයෝජන මුදල් ලබාගත හැකි පොහොසත්ම රට හැටියටයි. ජපානය අප රටට ද ප්‍රධාන ආධාර සපයන රටකි.

කොතරම් ධනය තිබුණත් ජපානය බොහෝ ප්‍රශ්නවලට මුහුණ දී සිටී. ජපානය සහ සෙසු කාර්මික රටවල් අතර තිබෙන වෙළඳ ගැටුම් මෙයින් ප්‍රධාන ප්‍රශ්නයක් බව ඔබ දන්නවා ඇත. පොහොසත් කාර්මීකරණය වූ රටවල් ජපානයට බල කර සිටින්නේ, ජපානයේ මිනිසුන් අද තරම් මහන්සි වී වැඩ නොකළ යුතු බවත් බටහිරින් වැඩියෙන් ආනයනය කළ යුතු බවත් වැඩියෙන් පරිභෝජනය කළ යුතු බවත්ය.

මෙම උපදේශයෙන් ඔවුන් බලාපොරොත්තු වන්නේ පොහොසත් රටවල වෙළඳ ශේෂය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගැනීමටය. එහෙත් දුප්පත් රටවල දුප්පත්කම පිළිබඳ ප්‍රශ්න ඉන් විසඳෙන්නේ නැත. එමෙන්ම ජපන් ජනතාව විසින් වැඩි වැඩියෙන්

භාණ්ඩ පරිභෝජනය කිරීම, දැනටමත් අනතුරු සහිත තත්ත්වයකට පත්ව ඇති විශ්ව පරිසරයට යහපතක් සිදු නොකෙරේ.

අප අද දින මේ රැස්වීම පවත්වන මේ මොහොතේ .රියෝද ජැනෙයිරෝ. නුවර පෘථිවි මහා සමුළුව සඳහා ලෝක නායකයෝ එකතු වෙති. එය පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවයි.

මෙහිදී සාකච්ඡා වන ප්‍රධාන කාරණා නම්, පොහොසත් උතුර සහ දුප්පත් දකුණට සම්බන්ධ වූ ප්‍රශ්නයි. සියලුම පාරිසාරිකයන් සහ සාමයට ලැදි මිනිසුන් විසින් ගෝලීය පාරිසරික ප්‍රශ්න පිළිබඳ එකඟත්වයකට පැමිණ ඇති ප්‍රධානම කරුණ නම්, උතුරේ රටවල තිබෙන විනාශකාරී සුඛෝපභෝගී ජීවන රටාව වෙනස් කිරීමත් දකුණේ රටවල් වඩා ප්‍රජාතාන්ත්‍රික වීමත්ය.

වෙනත් ක්‍රමයකට මේ කාරණය ගැන සඳහන් කරනවා නම්, සියලුම ආගම්වලින් විශේෂයෙන් බුදු දහම විසින් පෙන්වා දෙනු ලබන සත්‍යයක් වූ පරිභෝජනය සහ පසිඳුරන් පිනවීම පදනම් වූ ජීවන රටාවකින් කවදාවත් සන්තෘප්තිය නොලැබෙන බවයි. මෙය වෙනස් කරන තුරු ජපානය සහ යුරෝපීය රටවල් ලෝකයේ දුප්පත්කම තුරන් කිරීමට තම නිෂ්පාදන ශක්තිය කෙතරම් යෙදවුවත්, එයින් වැඩි ප්‍රයෝජනයක් නොවනු ඇත.

පළමුවෙන්ම, අපේ රටවල් විසින් එවැනි ආධාර ලැබීමට සුදුසු යහපත් තත්ත්වයක් ඇති කළ යුතුය. ඔවුන් විසින් දෙනු ලබන ආධාර දේශපාලකයන්ගේ සහ ඔවුන්ගේ මිතුරන්ගේ සාක්කුවලට වැටේ නම්, නැතහොත් අනවශ්‍ය මහා පරිමාණ ව්‍යාපෘතිවලට යෙදේ නම්, ජපානය සහ වෙනත් ආධාරක රටවල් ආධාර වැඩි කිරීමට මැළිවන්නේ මේ පිළිබඳ ඔවුන්ගේ අවධානය යොමු වී තිබෙන නිසාය. තේරුම් ගත නොහැකි ජනවාර්ගික අරගලයක පැටලී තිබෙන අවස්ථාවක විදේශික අයගේ ජීවිත අනතුරුදායක

තත්ත්වයකට පත් වනු දැකීමට ඔවුන් අකමැති යැයි පවසතොත් එය ද සත්‍ය සාධකයෙකි. මේ නිසා පැරණි සිතිවිලි සහ ක්‍රම වෙනුවට අප විසින් අලුත් සිතිවිලි සහ ක්‍රියාමාර්ග නිර්මාණය කර ගත යුතු කාලය එළඹ තිබේ..

ශ්‍රී ලංකාවේ අපට ලෝකයේ තිබෙන දාරිද්‍රතාවය නැති කිරීම සඳහා ජපානය සහ වෙනත් පොහොසත් රටවලට අපේ රටෙන්ම පටන් ගෙන උදව් කළ හැකිය. ජපානය තමන්ගේ දේශ සීමාව ඇතුළත හැම දෙනාගේම සුභසිද්ධිය ස්ථිර කර තිබේ. දැන් ඔවුන් ජපානයෙන් එපිටට බැලිය යුතුය.

අපේ අරමුණ විය යුත්තේ ආධ්‍යාත්මික වටිනාකම් පදනම් වූ සර්වෝදය සමාජයක් ලංකාවේ ගොඩනැංවීමයි. අප සාර්ථක වුවහොත් ජපානයේ සහ වෙනත් පොහොසත් රටවලට අන් අය පිළිබඳව උනන්දු වී, ඔවුන්ගේ සුභසාධනය සඳහා උදව් වීමට කැප වීමේ අගය වැටහේ. තමන්ගේ රට තුළ පමණක් නොව, මුළු ලෝකයේම සිටින ජනතාවගේ සුභසිද්ධිය සඳහා ඇපකැප වීම පොහොසත් රටවල පරිමාර්ථය විය යුතුය. පුද්ගලයාගේ සහ සමාජයේ විමුක්තියට තිබෙන මාර්ගය එයයි.

'ප්‍රඥාවන්ත පුද්ගලයාට මුළු ලොවම එකම පවුලකි' යනු පැරණි හින්දු ඉගැන්වීමකි. ජපානයේ මෙන්, ශ්‍රී ලංකාවේ ද සියල්ලන්ගේම යහපත සැලසෙන සර්වෝදය සමාජයක් ගොඩනැංවීම සඳහා අරමුණු වූ මෙම ප්‍රබුද්ධ ප්‍රතිපත්ති සහ පුරුදු පළමුවෙන් අප-අප විසින්ම ක්‍රියාවට නැංවිය යුතුය. පසුගිය අවුරුදු 34 ක කාලය තුළදී සර්වෝදය සංසදය කළේත්, ඉදිරියට අප ජීවිත කාලය තුළදී කරන්නේත් මෙම අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වීමයි.

මේ සන්ධ්‍යාවේ ශ්‍රී රාමක්‍රිෂ්ණ බජාජ් මැතිතුමා අප සමඟ සිටීම ගැන මගේ බලවත් කෘතඥතාවයත් ස්තුතියත් පිරිනමමි. අද භාරතයේ ගාන්ධිතුමාගේ සාරධර්ම අනුව ජීවත් වන ශ්‍රේෂ්ඨ භාරත පුත්‍රයෙක් සිටී නම්, ඒ රාමක්‍රිෂ්ණ බජාජ්තුමාය. ඔහුගේ ශ්‍රේෂ්ඨ

පියාණන් වූ ශ්‍රී ජම්නලාල් බජාජ්තුමා මහත්මා ගාන්ධිතුමාගේ බාරයට ඔහු පවරා, එතුමාගේ අධීක්ෂණය යටතේ හැදුණු විරල පුද්ගලයෙකි. .ගාන්ධිතුමාගේ කුලීකරුවා. යනුවෙන් ඔහුට විරුද නාමයක් ද පටබැඳිණි.

කෙටි කාලයකට වුවත් ඔහුගේ ජ්‍යෙෂ්ඨ වැඩිමහල් සොහොයුරු වූ කමල්නායාන් බජාජ්තුමා, ලංකාවේ අධ්‍යාපනය ලැබීම අපට ගෞරවයකි. වසර කිහිපයකට පෙර අහමදාබාද් නුවර ගුජරාට් විද්‍යා පීඨයේදී කමල්නායාන් බජාජ් අනුස්මරණ දේශන මාලාව පැවැත්වීමේ භාග්‍යය මට ලැබිණි.

මහත්මා ගාන්ධිතුමාගේ අරමුණු වූ සමාජ භාරකාරත්වය ක්‍රියාවට නඟන ශ්‍රී රාමක්‍රිෂ්ණ බජාජ්තුමා, ඉතාමත්ම සාර්ථක ව්‍යාපාරික පවුලක ප්‍රධානියාය. ඉහළම ව්‍යාපාරික සදාචාර ධර්මය පිළි පදිමින්, තම සේවකයන්ගේ සුභසිද්ධිය ඇති කරමින්, විශාල වශයෙන් දරිද්‍රතාවය නැති කිරීමේ සංවර්ධන සහ ශුභසාධන කටයුතුවල යෙදෙමින් රජයට මෙන්ම, ස්වේච්ඡා ආයතනවලට ද, පෞද්ගලික ව්‍යාපාරවලට ද, සමාජ සංවර්ධනය සඳහා මඟ පෙන්වන ශ්‍රී රාමක්‍රිෂ්ණ බජාජ් මැතිතුමා ලෝකයේ අහිංසාවාදී සමාජ විප්ලවයකට කැප වූ අප කාටත් ලැබී ඇති ඉමහත් ශක්තියකි. ඔහු ඍජු ගෞරවාන්විත පුද්ගලයෙකි.

පෞද්ගලිකව පවසතොත් ඔහු දශක තුනක පමණ කාලයක සිට, සහෝදරයෙක්, මිතුරෙක් ලෙස මට දයාව, ආරක්ෂාව සහ මඟ පෙන්වීම දුන් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. මිනිස් වර්ගයාට සේවය කිරීම සඳහා මම ඔහුට සෞඛ්‍ය සම්පත්තිය සහ දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරන්නෙමි.

මෙහි වැඩ සිටින අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලා ප්‍රධාන මහා සංඝරත්නයට මගේ ගෞරව ප්‍රණාමය පුද කරමි. අපට ආශීර්වාද කළ හින්දු, ක්‍රිස්තියානි සහ මුස්ලිම් ආගමික උතුමන්ට ද හිස නමා මම ආචාර කරමි. මෙහි පැමිණ සිටින තානාපති උතුමන්ට

සහ සෙසු තානාපති කාර්යාලවල නියෝජිතයින්ට ද, සියලුම මගේ හිත මිතුරන්ට ද මම ස්තුතිවන්ත වෙමි. කිසිදු දේශපාලන භේදයක් නොතකා මෙහි පැමිණි අපට ආශීර්වාද දැක්වූ විරුද්ධ පක්ෂයේ නායිකා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ප්‍රධාන පක්ෂ නායකයන් ඇතුළු සියලුම පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ට මගේ කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමමි.



උත්සවයට පැමිණ සිට මහා සංඝරත්න



ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, ගාමිණී දිසානායක මැතිතුමා,
ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන්

පැමිණ සිටි සම්භාවනීය අමුත්තන්ගෙන් කොටසක්

මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා විසින් නීතා ආරියරත්න මැතිනියට තිළිණ ප්‍රදානය කිරීම

සරත් හේවාගම මහතා විසින් මා වෙත තිළිණ ප්‍රදානය කිරීම

කරදර හිරිහැර මැද්දේ වුවද අපට නොනවත්වාම උදව් උපකාර කරන රාජ්‍යයන්ටත්, රාජ්‍ය නොවන ආයතනයන්ටත්, වෙනත් සහෝදර කණ්ඩායම්වලටත් ඔවුන් අප කෙරේ තබා ඇති විශ්වාසයට ස්තුතිවන්ත වෙමි. බොහෝ ඈත පළාත්වල සිට මෙහි පැමිණි මගේ ආදරණීය ගැමි සහෝදර සහෝදරියන්ටත් ස්තුතිවන්ත වන අතර, ඔවුන්ගේ නිදහස සහ සුභසිද්ධිය පිළිබඳ ජීවිතාන්තය තෙක් සේවය කරන බවට මම ප්‍රතිඥා දෙමි.

ඔබ හැමදෙනාට තෙරුවන් සරණයි! දෙවි පිහිටයි!

අන්ධකාර වටපිටාවට ආලෝක ධාරාවක්
ශ්‍රී රාමක්‍රිෂ්ණ බජාජ් දෙසුම

ප්‍රධාන අමුත්තා වශයෙන් මෙම ප්‍රීතිමත් අවස්ථාවට සහභාගි වීමට ආරාධනා ලැබීමේ අතිශය ගෞරවය මා හට හිමිවීම සම්බන්ධයෙන්, මගේ සතුට සහ ප්‍රීතිය සමඟ හෘදයාංගම කෘතඥතාවය මෙහි සංවිධායකයින් සියලුදෙනා වෙත පුද කරමි. සමාජ වැඩ කටයුතුවලට සහභාගිවීම වෛද්‍ය උපදෙස් මත මා විසින් පසුගිය මාසවලදී සැලකිය යුතු තරමින් අත්හිටුවා තිබුණි. නමුත් මා සහ ආචාර්ය ආරියරත්න මහතාත් අතර පවතින මිත්‍රත්වයේ නාමයෙන්, සර්වෝදය සංගමයේ උප සභාපති මහවත්ත මහතාගේ ආරාධනයට පිටුපෑමට මට නොහැකි විය. ආචාර්ය ආරියරත්න මහතාට සුභ පැතීමේදී මා ද, ඔබ හා එක් වන අතර, ඉන්දියාවේ ස්වේච්ඡා සේවාවන්හි යෙදී සිටින අප සහෝදර ජනතාවගේ උණුසුම් සුභාශිංසනය ද මේ සමඟ ඔබ වෙත ප්‍රදානය කරන්නෙමි.

දීර්ඝ කාලයක සිට අප සැවොම දන්නා පරිදි, එතුමා විසින් ඉෂ්ට කරන ලද වටිනා සමාජ සේවාවන් සඳහා නිසි ජාත්‍යන්තර පිළිගැනීම ලැබී තිබේ. 1990 දී ඉන්දියාවේදී ලැබුණු .ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර සම්මානය. වෙනුවෙන් එහිදී අපි ඔහුට සුභ පැතුවෙමු. මේ වර්ෂයේදි නැවතත් එතුමා 'නිවානෝ සාම ත්‍යාගය' ද ජය ගත් හෙයින්, ඒ සඳහා ගෞරව ප්‍රණාමය පුද කිරීමට මෙලෙස එක් රැස් වි සිටින්නෙමු. නිවානෝ සාම ත්‍යාගය දිනා ගැනීමෙන් මිනිස් වර්ගයා තුළ සාමය හා මානව සහෝදරත්වය ඇති කිරීමට එතුමා විසින් ප්‍රදානය කරන ලද නිර්මල දායකත්වය, තව තවත් ඉස්මතු වී කැපී පෙනුණි. පසුගිය වර්ෂවලදි තමාගේ සේවාවන් තුළින් සාමය හා අවිහිංසාව ජනතාවගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළ පැහැදිලි හා විශාල බලපෑමක් ඇති කිරීමට සමත් වූවා මෙන්ම, ඒ සඳහා සැලකිය යුතු පිළිගැනීමක් ලැබී තිබීම ගැන මා අතිශයින්

සතුටු වෙමි. අනෙක් නිවානෝ සාම ත්‍යාගලාභීන් වන ආචාර්ය හෝමර් ජැක්, ආචාර්ය හිල්ඩගාඩ් ගොස්-මේයර් සහ මහාචාර්ය නෝර්මන් කුසින්ස් යන ප්‍රභූවරුන් පිරිස් අතරට 'ආරි' සම්බන්ධ වීම අපට මහත් ප්‍රීතියක් ගෙන දෙන්නකි.

මෙවැනි සම්මානයක් ප්‍රදානය කරමින් උසස් ගෞරවයක් පිරිනැමීම සඳහා ආරි වැනි ශ්‍රේෂ්ඨ පුරුෂයෙක් තෝරා ගැනීම පිළිබඳව නිවානෝ සාම පදනම වෙත මගේ ස්තුතිය පුද කිරීමට මෙම අවස්ථාව ප්‍රයෝජන ගැනීමට කැමතියි. ආරියරත්න මහත්මාට ඉදිරි අනාගතයේදී මෙවැනි සම්මාන තව තවත් ලැබේවි' යන්න මට ස්ථිරයි. ඒ සඳහා තවත් මෙවැනි සුභ පැතීමේ උත්සව පැවැත්වීමට සූදානම් විය යුතුයි.

මගේ පවුලේ සාමාජිකයන් ශ්‍රී ලංකාව සමඟ තිබූ සබඳකම් පිළිබඳව බොහෝ මතකයන් මේ අවස්ථාවේදී අවදි වෙයි. මගේ වැඩිමහල් සොහොයුරා කමල්යාන්ට කුඩා කාලයේදී වැඩිපුර ඉංග්‍රීසි දැනුමක් ලබා ගැනීමට වුවමනා විය. ඔහු ඉගෙන ගත් වර්ධා ප්‍රදේශයේ ආශ්‍රම් ජීවිතයේදී ඉංග්‍රීසි දැනුම සිසුනට ලැබී තිබුණේ නැත. මගේ පියා ගාන්ධිතුමා හමුවී මේ ගැන කතා කළේය. වෙනත් කෙනෙකුගෙන් ඇසුවා නම් කියාවි, ඉංග්‍රීසි ඉගෙන ගැනීමට එංගලන්තයට යා යුතුයි කියා. නමුත් මගේ පියාට එතුමාගෙන් ලැබුණේ ඊට වෙනස් උපදෙසකි. ගාන්ධිතුමා කියා සිටියේ ප්‍රථමයෙන්ම අවුරුද්දක් ලංකාවේ පාසලකට යා යුතුය යන්නය. ඉන් අනතුරුව මගේ අයියා ලංකාවට පැමිණ බර්නාඩ් අළුවිහාරේ මහතාගේ භාරකාරත්වය යටතේ එතුමා සමඟ නැවතී අවුරුද්දක් මෙහි පාසලකට ඇතුළත් වී ඉගෙන ගත්තේය. අළුවිහාරේ මහතා ගාන්ධිතුමාගේ ඉතා පක්ෂපාතී අනුගාමිකයෙක් . අළුවිහාරේ මහතා විසින් වපුරනු ලැබූ ගාන්ධි සංකල්පයේ බීජ සර්වෝදය ව්‍යාපාරයේ ක්‍රියාදාමයන් තුළින් ඵල ගැන්වෙනු දැකීම අපට ඉමහත් සන්තෝෂයකි.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින සබඳකම ගැඹුරු වූ ආධ්‍යාත්මික ස්වභාවයක් සහිත එකකි. බෞද්ධාගම ශ්‍රී ලංකාව තුළ පැතිරී යාම මගින් ඒ බව සුවිශේෂීව පැහැදිළි වේ. කරුණාව, දයාව සානුකම්පික බව හා අවිහිංසාව යන ගුණාංග බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් තුළ අන්තර්ගත ප්‍රධාන සංරචකයන්ය. අද දවසේ ලෝක සාමයට එල්ල වී තිබෙන තර්ජනයන් ගැන සිතන විට, මිනිසා තුළ ස්ථාපිත විය යුතු එවැනි ගුණ ධර්මයන්හි විශාල වැදගත්කමක් ඇති බව අප විසින් වටහා ගත යුතුයි. ශ්‍රී ලංකාවේ පුරවැසි ජනතාවගෙන් බහුතරය බෞද්ධයින් වීම හේතු කොටගෙන, විශ්වමය වූ සාමකාමී සහජීවනයක් මිනිස් ප්‍රජාව තුළ ගොඩනැඟීම සඳහා යා යුතු මාර්ගය ලෝකයටම කියා දීමට පෙන්වීමට ඔවුනට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි. අපගේ හිටපු ඉන්දීය අගමැති ජවහල්ලාල් නේරුතුමාත්, ඔබගේ හිටපු අගමැති බණ්ඩාරනායක මැතිතුමාත් යන දෙදෙනා විසින් ජනතාවට අවධාරණය කළ මෙම ධර්මතාවයන්, බෞද්ධ ඉගැන්වීමෙහි පංචශීලයෙහි පසුබිමයි. අප දෙරට අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාවයන් සහ නිරායාසයෙන්ම නියම වි ඇති අපගේ හවුල්, දෛවෝපගත ළයාන්විත හැඟීම නිසා ඇති වන චකිතයත්, ලංකාවට ඒම සඳහා රුකුල් දෙන අමුතු පෙළඹවීමක් වී තිබේ.

'නිවානෝ සාම ත්‍යාගය' ආරියරත්නයනට ලැබුණු පණිවුඩය මගේ කන වැකුණ විට, මට ඇති වූයේ විශාල සන්තෝෂයකි . නමුත් මම ඒ ගැන පුදුම වූයේ නැත. මෙවැනි ගෞරවයට පාත්‍ර වීමට සුදුසු තවත් කෙනෙක් සිටීද? ලෝකයේ සිටින නිර්මාණාත්මක ව්‍යාපාරයන්හි, ධර්මදූත සේවයන්හි, සාම ප්‍රයත්නයන්හි යෙදෙන සියලුදෙනා අතරින් උසස්ම තලයක සිටින කෙනෙකි ආරි. එතුමා සතුව ඇති විරල ගනයේ යහපත් ගුණාංග, තම සමාජ සේවා ක්‍රියාපටිපාටීන් තුළින් ඉස්මතු වනු දක්නට තිබේ. මා තුළ වැඩි වශයෙන්ම කා වැදී ඇත්තේ ශ්‍රේෂ්ඨත්වයේ සංකේතය වූ ඔහු සතු නිහතමානී ගුණයයි. සරල හා චාම් බව තුළින් තම සමීප යාළු මිත්‍රයින්ගේ සිට අසරණ දිළින්දා දක්වා සියලුදෙනාටම එක සේ

ආදරය කරුණාව දක්වා, තම සමාජ සුභසාධන කටයුතුවලදී ඒ හැම දෙනාම සහභාගි කරවා ගනිමින් තම පරාර්ථකාමී අධිෂ්ඨානයන් ඉෂ්ට කර ගත් පුද්ගලයෙකි. ඔහු ස්තුති ප්‍රශංසා පූර්වකව එතුමාව අගය කරනු ලබන යහපත් කිට්ටු හිතමිත්‍රයින් අධික සංඛ්‍යාවක් ලංකාවේ සර්වෝදයේ පමණක් නොව, ඉන්දියාවේ ද සිටිති. ඔහු ඒ හැම දෙනාගේම 'ආදරණීය ආරි' බවට පත් වීම පුදුමයක් නොවේ. බැංගලෝරයේ ගැමි සංවර්ධනය පිළිබඳ ආසියානු ආයතනය, මහත්මා ගාන්ධිතුමා විසින් පිහිටවනු ලැබූ අහමද්බාද්හි ගුජරාට් විද්‍යා පීඨය වැනි විවිධ වගකිව යුතු ආයතන සමඟ ආචාර්ය ආරියරත්න සමීපව සම්බන්ධව සිටී.

ආචාර්ය ආරියරත්න ශ්‍රී ලංකාවේ සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ පුරෝගාමියා වී සිටිය ද, ප්‍රථම අවුරුදු පහක සැලැස්මක් මත ජනතා සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් අපි ඉන්දියාවේදී සකස් කර ගෙන තිබුණි. ප්‍රජා සංවර්ධන වැඩ සටහනක් වූ එය විවෘත කරනු ලැබුවේ ගාන්ධිතුමාගේ උපන්දිනය අනුස්මරණ උත්සව පැවැත්වූ 1952 ඔක්තෝම්බර් මාසයේ දෙවෙනිදායි. එම වැඩ සටහනෙහි පසුබිම් අරමුණ වූයේ ඉන්දියාව වැනි රටක සංවර්ධන කර්තව්‍යයන්හිදී ශ්‍රම කුලිය සඳහා වියපැහැදම් කරන මුදල් සංවර්ධන විෂයෙහිම ගොඩනැගිලි යටිතල පහසුකම් වෙනුවෙන් උපරිම ලෙස භාවිතයට ගැනීම පිණිස ස්වේච්ඡා සේවයන්හි ඵල ප්‍රයෝජන ලබා ගැනීමයි. එහි සැලසුම් කොමිසම බලාපොරොත්තු වූ පරිදි සියලු දේ ඒ ආකාරයෙන්ම සිදුවූවා නම් අඩු වියදම් ප්‍රමාණයකින් ගැමි ප්‍රදේශ සංවර්ධනයේ මහත් වැඩ කොටසක් ඉෂ්ට කර ගන්නට හැකියාව තිබුණි. ඒ කෙසේ වෙතත් ඉන් අනතුරුව සිදුවූයේ, සමස්ත ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රමවේදය වෙනත් අතකට පෙරළීමය. ප්‍රජා සංවර්ධන වැඩ සටහනෙහි ආරම්භක අනුබලය නැතිව ගියේය.

මෙවැනි පසුබිමක් යටතේදී ආරි සහ තමා සමඟ සර්වෝදය ව්‍යාපාරය වෙනුවෙන් කැප වීමෙන් වැඩ කළ අනිකුත් සහෘදයින්ටත් කීර්ති නාමයක් ගෙන දෙමින්, ශ්‍රී ලංකාව තුළ සර්වෝදය ව්‍යාපාරය

සාර්ථක අන්දමින් මුල් බැස ගෙන තිබුණි. සර්වෝදය ව්‍යාපාරය කෙරෙහි මගේ සිත ඇදී යාමට හේතු වූයේ එම ව්‍යාපාරයේ සමාජ සේවා ක්‍රියාකාරකම් තුළ මා දුටු පැහැදිලිතාවය හා නිර්මලත්වයත්, විවිධ වැඩ සටහන් සැලසුම් කිරීමේදී ගන්නා ලද දැඩි උනන්දුව හා කැපවීමත් යම් ආකාරයක සුභදායී වෙනසක් දකීමට එහි සේවකයන් විසින් ගන්නා ලද අධිෂ්ඨානශීලී හැඟීමත්ය.

අඩු ආර්ථික දියුණුවක් ලබා ඇති රටකට, ඕනෑම විදියක සංවර්ධන ක්‍රම තාක්ෂණයක් ඉතා වැදගත්ය. ඒ සම්බන්ධයෙන් එහි ජනතාවගේ ඇති වන උද්යෝගය ද වැඩිය. එමෙන්ම සංවර්ධන විෂයෙහි තිබුණාට වඩා පැහැදිලි දියුණුවක් ලබා ගැනීමට ජනතාව තුළ විශේෂ උනන්දුවක් ඇති වීම පමණක් නොව, එම ජයග්‍රහණය අත්පත් කර ගැනීම සඳහා තම උපරිම සහභාගිත්වය ලබා දීමට ඔවුන් සූදානම්ව සිටීම ද අත්‍යවශ්‍ය කාරණයකි. සමාජ සංවර්ධනය වෙනුවෙන් ඔබ විසින් එවැනි සමාජ සේවාවක් ඉටු කරන විට, ජනතාව විසින් ඔබ කෙරෙහි තැබූ විශ්වාසනීයත්වයේ සතුට - ප්‍රීතිය ඔබ විසින් අනිවාර්යයෙන්ම භුක්ති විඳිය යුතුය. ජනතාවගේ සිත් දිනා ගැනීමේ පරාර්ථකාමී ක්‍රියාවන්හිම නියැලී සිටින ආචාර්ය ආරියරත්න මෙවැනි වැදගත් කරුණු පිළිබඳව ඉතා හොඳින් දැනුවත් වී සිටින බවක් ද පෙනේ. ඔහුගේ සමාජ සේවාවන් ඇතුළු මෙවැනි සියලුම චරිත ලක්ෂණයන්ටත්, ගාන්ධි සංකල්පයේ අන්තර්ගත වන දයාව කරුණාව සත්‍යය හා සාමය අවිහිංසාව විශාල වශයෙන් දායක වී ඇති බව මට ස්ථිර ලෙසම කිව හැක. ශ්‍රී ලංකාවේ තුනෙන් එකක් පමණ වන ගම්මාන අටදාහකටත් වඩා නියෝජනය කරමින්, පූර්ණ කාලීන සේවකයින් තුන්දාහක් ඉක්වමින් සර්වෝදය ව්‍යාපාරය වඩ වඩාත් පුළුල්ව ව්‍යාප්ත වීම ඇත්තෙන්ම පුදුමයට කාරණයකි.

තවද ශ්‍රී ලංකාව තුළදී පමණක් නොව, සර්වෝදය ව්‍යාපාරය විසින් ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් මොනවා ද යන්න ශ්‍රී ලංකාවෙන් බැහැරව ජීවත් වන ප්‍රජාවන් විසින් ද දැනුවත් වී

තිබේ. ලෝකයේ විවිධ රටවල් අතර සර්වෝදය ව්‍යාපාරය පිළිබඳ ප්‍රචලිත කිරීමේ කර්තව්‍යයන්ද ආරි විසින් තමන්ගේ වගකීම යටතේ ඉටු කරනු ලබයි. ඔහුගේ විශාරද දැනුම හා අවබෝධයත් සන්නිවේදන කුසලතාවයත් නිසා තමා විසින්ම ආරම්භ කරන ලද සඟරා හා රචනා කරන ලද වටිනා පොත්පත් ආදිය විදේශයන්හි ප්‍රසිද්ධය. සඟරාවලට ලිපි සපයනු ලැබුවේ ඉතා දක්ෂ ලෙසය.

'Economics as if Pecple Mattered' යන්න ගැන කල්පනා කළ ආචාර්ය ෂූමාකර්ගෙන් ලබා ගත් යම් ප්‍රබෝධවත් අදහස්, ආරිගේ වැඩ කටයුතු තුළින් මම දකින්නෙමි. ෂූමාකර්ගේ 'Small is beuatiful' යන කෘතිය 'පුංචි නම් ලස්සනයි' යනුවෙන් මීට වසර හතළිහකට පෙර එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා සිංහලයට පරිවර්තනය කර ඇත. ආරිගේ වැඩ කටයුතුවල ප්‍රධාන අරමුණ වූයේ ජනතාව හා ඔවුන්ගේම ඕනෑ එපාකම්ය. සමාජ සේවයට අවතීර්ණ වීමට පෙරාතුව ආරි එතෙක් නියැලී සිටි සුව පහසු රක්ෂාව වූ ගුරු වෘත්තියෙන් ඉවත් විය. සමාජීය හා ආර්ථික වශයෙන් ජන ජීවිතය දියුණු කළ හැකි පුනරුත්ථාපන ක්‍රියා දාමයක් ආරම්භ කිරීම සඳහා ඔවුනොවුන් විසින්ම ඒකරාශී වෙමින් සංවිධානය වීමට සූදානම් වන ලෙස ජනතාවට දැනුම් දුන්නේ ඉන් පසුවය. බෞද්ධ ඉගැන්වීම් නිවැරදිව අනුගමනය කළ ආරි, ඉන් ආධ්‍යාත්මික ආලෝකය උකහා ගත්තේය. තරුණ අවදියේදීම ඔහු මහත්මා ගාන්ධි විනෝභා බාවේ ජයප්‍රකාශ් නාරායන් වැනි ශ්‍රේෂ්ඨ චින්තකයින්ගේ අදහස්වලින් පෝෂණය වීම ගැන මම ද ආඩම්බර වෙමි.

මිත්‍රවරුනි, අප ජීවත් වන ලෝකය පිළිබඳව අදහස් ස්වල්පයක් ඔබ සමඟ බෙදා ගන්නටත් අවබෝධ කර ගැනීමෙන්, පවතින ගැටළු සඳහා යම් විසඳුම් ලබා ගැන්මට අපේ අහිංසක උත්සාහයන්, ඔබ ඉදිරියේ තැබීමටත් මම බලාපොරොත්තු වෙමි. ලෝක සාමයට එල්ල වූ තර්ජනයන් සම්බන්ධයෙන් මා මුලින් අවධානය යොමු කළෙමි. ඒ කවුරුන්ගෙන් ද කියා ඔබ ප්‍රශ්න කරාවි.

ඇත්තෙන්ම එවැනි අභියෝගයන් එල්ල වූයේ පිටස්තර වෙනත් රටකින් හෝ ප්‍රජාවකගෙන් නොවේ. එය වනාහි ලෝකය පුරාම ව්‍යාප්තව ඇති දුප්පත්කම හා ඉවක් බවක් හැඟීමක් නොමැතිව භාවිතා කරනු ලබන විද්‍යාව හා තාක්ෂණය මගිනි. අනිත් අතින් බලන විට, මිනිසාගේ යහපත වෙනුවෙන් විද්‍යා හා තාක්ෂණය මගින් අති විශාල දායකත්වයක් ලබා දී ඇති බව, අප කවුරුත් දන්නා කරුණකි. තම තමන්ගේ රටවල ජනතාව අතර අන්‍යොන්‍ය ලෙස හුවමාරු කර ගැන්මට හැකි වන පරිදි, තොරතුරු හා මහත් දැනුම් සම්භාරයක් වර්තමාන මිනිසා තුළ එක් රැස් වී තිබේ. නවීන තොරතුරු තාක්ෂණය සහ සන්නිවේදන ක්‍රම නිසා ලෝකය එකම විශ්ව ගම්මානයක් බවට පත්ව තිබේ. නිෂ්පාදනයේ වැඩි වීම නිසා ආර්ථික දියුණුව සඳහා ද ඉඩ ප්‍රස්ථාව පහසු වී තිබේ.

කෙසේ වුවද පැහැදිලි ලෙස පෙනී යන්නේ, තමන්ට අවශ්‍ය ප්‍රමාණය හෙවත් 'තරම' ගැන තිබිය යුතු හැඟීම ද සාමාන්‍යයෙන් තිබිය යුතු විචාරාත්මක හැකියාව ද ගමන් කළ යුතු නියම මාර්ගය ද යන මේ සියලු දේ තාක්ෂණික හා විද්‍යාත්මක ප්‍රගතිය අත්පත් කර ගැනීමත් සමඟම, මිනිසාට අහිමි වී ඇති බවකි. ස්වභාවික සම්පත් වේගයෙන් ශුන්‍ය වී යාම පාරිසාරික වාතාවරණයන්හි පැවැත්මට බාධා වන පරිදි එල්ල වන විවිධාකාරයේ අභියෝගයන් ආර්ථික හා සමාජීය වශයෙන් ස්ථාවර වූ ව්‍යුහයන්හි බිඳ වැටීම් ප්‍රචණ්ඩත්වයේ වර්ධනය හා නිතර දක්නට ලැබෙන මිනිසාගේ කලකිරීම් ස්වභාවය යන සිද්ධීන් හැම කෙනෙකු විසින්ම නිරීක්ෂණය කරනු ලබන්නකි. මේ අයුරින් කරුණු සිදුවී ගෙන යන විට මිනිස් දිවියේ සුන්දරත්වය මෙන්ම විවිධ වූ වටිනාකම් ද සීඝ්‍රයෙන් පිරිහී යාමට හේතුවේ.

මිනිස් වර්ගයා දිගටම ජීවත් වන්නේ න්‍යෂ්ටික ව්‍යසනයක අවදානම කරපින්නා ගෙනය. අනිත් පැත්තෙන් බලන විට සෑම තැනම පුළුල්ව පැතිරී තිබෙන්නේ අසාධාරණයයි, අසමානත්වයයි. ධනපති පන්තිය හැම පැත්තෙන්ම හිස ඔසවනු පෙනෙන නමුත්, සමාජීය වශයෙන් යම් කැප වීමක් හෝ වගකීමක් සහිත පරාර්ථකාමී

ක්‍රියාවලියක් ඔවුන්ගෙන් ඉෂ්ට වන්නේ නැත. ජීවත්වීමට වුවමනා කරන මූලික අවශ්‍යතාවන්වත් නොලැබෙමින්, හාමතේ දුක් විඳින ලක්ෂ ගණන් ජනතාව අපේ රටේත් සිටිති.

ප්‍රබල ලෙස බලපැවැත් වූ මෙවැනි අවදානම් තත්ත්වයක් යහපත් අතට පෙරළීමේ අවශ්‍යතාවය මත, මහත්මා ගාන්ධිතුමාට ඕනෑ වූයේ විද්‍යාව හා තාක්ෂණය පසුපස හඹායාමේ ප්‍රවණතාවය ඉන් මඟ හරවා ආධ්‍යාත්මික අරමුණු කෙරෙහි සමාජය යොමු කරවන්නටයි. විනාශකාරී අන්තයන් කෙරෙහි පහසුවෙන්ම නැඹුරුවෙමින්, පාපතර ක්‍රියාවන්හි යෙදී සිටින එම සමාජ කොට්ඨාශයන් ආධ්‍යාත්මික අරමුණු තුළ නොනැවතී ගමන් කිරීමට සැලැස්වීම එහිදී අපේක්ෂා කරන ලදී. වර්තමාන තත්ත්වය කුමක් ද යන්න ගාන්ධිතුමා විසින් ගණිතමය සූත්‍රයකින් නිරූපණය කර පෙන්වූයේ මෙසේය:

විද්‍යාව + ආධ්‍යාත්මය = සර්වෝදය
විද්‍යාව + අනධ්‍යාත්මය = පූර්ණ විනාශය

මින් අර්ථ දක්වෙන්නේ විද්‍යාවෙන් ඵල ප්‍රයෝජන ලැබීමට නම්, ආධ්‍යාත්මික ශක්තිය අත්‍යාවශ්‍ය බවත්, එය නොමැතිව භාවිතාවේ යොදා ගන්නා විද්‍යාව නිසා මිනිසා විනාශය කරා ළංවන බවත්ය.

මේ නිසා විද්‍යාවත්, ආධ්‍යාත්මික විෂයයත් සම්මිශ්‍ර කර වැඩ කටයුතු කිරීම ඉතා වැදගත් මෙන්ම අනිවාර්ය දෙයක් බවට පත් වී තිබේ. ඇත්ත වශයෙන්ම මේ දෙකෙහි අරමුණු එක හා සමාන බවක් දැකිය හැකිය. එනම්: මනුෂ්‍ය ජීවිතයේ ගුප්ත ස්වභාවය හෙළිදරව් කර ගැනීමටත්, මිනිසාගේ පැවැත්මෙහි යථාර්ථය ගැන අවබෝධමත් වීමටත්, මෙම අංශ දෙකම යොදා ගැනීමට හැකි වීමය. නමුත් එම පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ගයන් එකිනෙකට වෙනස්ය.

විද්‍යාවේදී තොරතුරු සෙවීම සඳහා පරීක්ෂණ හා නිරීක්ෂණ ඔස්සේ ගමන් කරන අතර, ආධ්‍යාත්මික ප්‍රයත්නයේදී භාවනාවත්, ප්‍රතිභා ඥානයේත් පිහිට ලබා ගනී. මෑතකදී සිදු කරන ලද සමහර විද්‍යාත්මක අධ්‍යයනයන්හි අවසාන නිගමනයන්හි ආධ්‍යාත්මික මාර්ගයන්හි ගමන් කරන අය විසින් ලබා ගත් දැනුම සමඟ කැපී පෙනෙන සමානත්වයක් දක්නට ලැබීම විශේෂ අවධානය යොමු කළ යුතු වැදගත් සංසිද්ධියකි. විද්‍යාව හා ආධ්‍යාත්මික විෂයය පිළිබඳව යම් විශ්ලේෂණාත්මක හැදෑරීමක් සිදු කිරීම සඳහා වෑයමක් ගැනීමට විශේෂ වූ ආයතනයක් ඉන්දියාවේ පිහිටුවීමට අපි තව තවත් ධෛර්යවත් වූයේ මේ නිසාය.

මෙම අවශ්‍යතාවය ඉටු කර ගැනීමට විද්‍යාව හා මානව හිමිකම් සඳහා ගාන්ධි මධ්‍යස්ථානයක් බැංගලෝරයේ පිහිටුවීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා අපගේ ජම්නලාල් බජාජ් පදනමත් භාරතීය විද්‍යා භවන් ආයතනයත් එක් වී ක්‍රියා කරන්නෙමු. මෙම ව්‍යාපෘතිය මගේ පියා ජම්නලාල් මහතාගේ උපන් දින අනුස්මරණ සංවත්සරය වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

මා රෝමයට ගිය අවස්ථාවේදී දෙවන ජුවාන් පාවුලු පාප් වහන්සේ පුද්ගලිකව බැහැදකීමේ භාග්‍යය ලැබුණි. අපගේ මෙම අහිංසක ප්‍රයත්නයන්ට උන්වහන්සේගේ ආශීර්වාදය ලබා ගැන්මට හැකි වූ බව මම ප්‍රීතියෙන් කියමි. මගේ පියාත්, මහත්මා ගාන්ධිතුමාත් අතර ඉතා සමීප හිත මිත්‍රකමක් පැවැතුණ බව කවුරුත් පාහේ දන්නවා ඇත. ඇත්තෙන්ම ඔහු සලකන ලද්දේ ගාන්ධිතුමාගේ පස්වන පුතා හැටියටයි. ගාන්ධිතුමා මගේ පියා නිසාම වර්ධාවලට පැමිණ එහි නතර වුණා. අපේ පවුලේ සියලු දෙනාටම ගාන්ධිතුමාගේ සමීප ඇසුරේම ජීවත්වීමට ඉතා විරල වූ වරප්‍රසාද ලැබී තිබුණේ ඒ නිසයි. ගාන්ධිතුමා හා විනෝබා භාවේතුමා යන දෙදෙනාගෙන්ම අපි උගත් දේවල් හේතුකොට ගෙන, ගාන්ධි ඉගැන්වීම්වලින් මිනිස් වර්ගයාට සාමයෙන් එකමුතුකමින් හා ආධ්‍යාත්මික මෙන්ම භෞතික තෘප්තිමත් බව

භුක්ති විඳිමින් ජීවත් විය හැකි වේ යැයි අප විශ්වාස කරමු. මෙම අදහසට අනුව ගාන්ධිතුමාගේ උපන් දින අනුස්මරණ වැඩ සටහන්වල අංගයක් ලෙස ගාන්ධි චින්තනය, යම් ක්‍රමානුකූල ක්‍රමයකට ව්‍යාප්ත කිරීමට අපි අදහස් කළෙමු. ගාන්ධි සිතුවිලි ප්‍රචලිත කිරීමටත් ඒ පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයනයන් පැවැත්වීමටත් ගාන්ධි අධ්‍යයන ආයතනය අප විසින් වර්ධාවල පිහිටුවන ලදී. සමාජ සේවකයන් වෙළඳ සංගම් සාමාජිකයින් කාන්තාවන් තරුණ කණ්ඩායම් හා අනෙකුත් සියලුම අංශවල නිර්මාණාත්මක ශිල්පීන් සඳහා මෙම ආයතනය විසින් පාඨමාලා පවත්වනු ලැබේ. ග්‍රාමීය ප්‍රදේශවල සේවකයන් ගාන්ධි අධ්‍යයන ආයතනයට යැවීමෙන් එහි පුහුණුව ලබා දෙන්නට සමහර විට ඔබේ සංවිධානයත් එකඟත්වය පළ කරතියි සිතමි.

''ස්ව ශක්ති'' ධර්මතාවය තුළ ජීවත් විය හැකි පුරවැසියෙකු බිහි කරවීමට හොඳටම ප්‍රමාණවත් වන ස්වේච්ඡා සේවය පිළිබඳව අවධාරණය කර තිබීම ගාන්ධි ඉගැන්වීම්වල අන්තර්ගත වන්නා වූ මූලික ලක්ෂණවලින් එකකි.

'පාලනය' යන කර්තව්‍ය අඩුවෙන්ම සිදු කරනු ලබන ප්‍රශස්තම පාලන තන්ත්‍රය රජය බව ගාන්ධිතුමාගේ විශ්වාසයයි. නමුත් අවාසනාවකට සිදුව ඇත්තේ ඊට වෙනස් දෙයකි. එනම් මෙතෙක් අවුරුදු කිහිපයක් වන තුරුම දෙපැත්තට වැනෙමින් තිබුණ නිවුන් සංකල්පයන් වන සමාජවාදය සහ රජයේ සමාජ සේවයෙහි බලපෑම නිසා ජනතාව විසින් තමන්ට අවශ්‍ය හැම දෙයක්ම රජයෙන් බලාපොරොත්තු වීම එන්ට එන්ටම වැඩිවුණි. එවැනි තත්ත්වයක ප්‍රතිඵලයක් වශයෙන් අකාර්යක්ෂමතාවය නාස්තිය හා ජන ජීවිතයේ බිඳ වැටීම යන අයහපත් තත්ත්වයන් සෑම තැනම පුළුල් ලෙස පැතිරී යන්නට වූයේය. රජයේ නිලධාරී පාලනයන් තුළ එන්ට එන්ටම බලය පොදි ගැහෙන්නට පටන් ගත්තේය. නමුත් කුමන හෝ භාග්‍යයකට යුරෝපයේ කොමියුනිස්ට් අත්හදා බැලීම ව්‍යර්ථවූයෙන්, එමගින් හැම දෙනාගේම අදහස්

වෙනස් වීමට හේතු විය. පුද්ගලයා හෝ සමාජීය ලෙස හෝ ප්‍රගතියක් සඳහා රජය කෙරෙහි වැඩිපුර විශ්වාසය තබා වැඩ කිරීම නිශ්ඵල බවයි, ඉන් වටහා ගත්තේ. එහි ප්‍රතිඵලයක් ලෙස දැනට ඉස්මතු වී තිබෙන අවශ්‍යතාවය හා නැඹුරුව නම්, ජාතික ප්‍රයත්නයන්ට අනුයුක්ත වන විවිධ ක්ෂේත්‍රයන් තුළ පුද්ගලයා හෝ ස්වේච්ඡා ක්‍රියා දාමයන් සහ ආරම්භක පියවර ධෛර්යවත් කිරීමය.

විවිධ ස්ථාවර සංකල්පයන්ගේ බලපෑමෙන් වසර ගණනකට පසුව ගාන්ධි චින්තනයේ සාරය වශයෙන් සලකනු ලබන ස්වේච්ඡාව දෙසට, මුළු ලෝකයම දැන් හැරෙමින් සිටී.

තම ක්‍රියාකාරිත්වයන් මෙන්ම පරමාර්ථයන් තුළින් තවත් ගාන්ධි කෙනෙක් වූ ආචාර්ය ආරියරත්න, ස්වේච්ඡාව යන්න ස්වභාවයෙන්ම ස්ථිර ලෙස විශ්වාස කරන්නෙකි. අවශ්‍යතාවය අනුව නිසි පෙළඹවීමෙන් නිවැරදි ලෙස ක්‍රියාත්මක වීමේ පුරුද්දක් නොමැති වීම හා ක්‍රමානුකූල නොවීමේ සිරිත, නිලධාරී පාලන ක්‍රමය තුළ පවතින අඩුපාඩුවකි. එබැවින් ඕනෑම රජයක් තුළ යහපත් පරමාර්ථ හා අවශ්‍යතා කෙතරම් තිබුණ ද, විශේෂයෙන් සමාජ සුභසාධනය හා ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රයන් තුළ නිසි පරිදි භාණ්ඩ බෙදා හැරීම සිදු කළ නොහැක්කකි. ඇත්ත වශයෙන්ම කියතොත්, ඒවා තම තමන්ටම පාඩු සිද්ධ කරගන්නා මිනිසුන්ගේ වැඩය. සංවර්ධන ක්‍රියා දාමයන්හිදී ඒ සඳහා ජනතාවගේ මැදිහත් වීමේ වැදගත්කම ඔවුන් විසින්ම අවබෝධ කර ගැනීමේ ප්‍රවණතාවය, වාසනාවකට මෙන් දැන් වර්ධනය වෙමින් පවතින අතර, රජය හා ස්වේච්ඡා සංවිධාන අතර පවත්වා ගෙන යන සබඳතාවයන්හි යහපත් වර්ධනයක් ඇති වීමට ද තරම් ඉන් සෑහෙන බලපෑමක් ඇති වී තිබේ. යම් සුහදතාවයක් එම දෙපාර්ශවයන් අතර තිබේ. ඉන්දියාවේ මේ සම්බන්ධයෙන් අප පරමාර්ථයන්ට වාසිදායක අන්දමට වැඩ කටයුතු කෙරී ගෙන යාම සතුටකි. සෑම තැනම සිදුවෙමින් පවතින අක්‍රමිකතාවයන් පමණක් නොව, ඒ සඳහා භාවිතයේ යෙදෙන අසීමිත නිදහස ද මැඬ පැවැත්වීම සඳහා

අප රජය විසින් නීති හා සැළසුම් ක්‍රියාමාර්ග සකස් කර ඇත. තවද ආර්ථික හා සාමාජයික ක්ෂෙත්‍රයන්හි ක්‍රියාකාරිත්වයන්හිදී, රාජ්‍ය අංශයේ මැදිහත් වීම අවම කරවීමටත් සංවර්ධන ක්‍රියාවලින්හිදී ස්වේච්ඡා ආයතනයන්හි සහභාගිත්වය ධෛර්යවත් කරන්නටත් රජය මගින් තීරණය කර තිබේ.

ඒ සඳහා උදාහරණයක් ලෙස ගත් විට, අටවන පස් අවුරුදු සැලැස්මට අනුව රටේ සම්පත්වලින් 51% ක ප්‍රමාණයක් වෙන් කර තිබෙන්නේ පෞද්ගලික අංශයටය. මෙවර ජාතික අයවැය ඇස්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන වැඩ සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය ද රජය මගින් වැඩි කර ඇත.

විවිධ සුභසාධන හා සංවර්ධන වැඩ සටහන්වලදී, රජයේ නිලධාරි පාලනයේ මැදිහත් වීම ඉවත් කිරීමට ක්‍රියා කළ යුතු බව කියමින්, අපේ අගමැතිතුමා ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කළේය. එනම් දේශීය ස්වේච්ඡා සංවිධානයන් වැනි සමාජ සේවා සංවිධාන සමූහ ව්‍යාපාර අංශ රාජ්‍ය අංශ සහ ඉහත කී ස්වේච්ඡා සංවිධාන සියල්ලම ඒකාබද්ධ කිරීමෙන්, යම් ක්‍රමානුකූල අන්දමකට ඒවායේ ක්‍රියාකාරිත්වයන් සම්බන්ධීකරණය කිරීමය. මෙම වුවමනාව මත අපි පසුගිය වර්ෂයේදී 'සුභද ජනහිතකාමිත්වය' යනුවෙන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සංවිධානය කළෙමු. අපගේ අවධානය යොමු වූ මූලික කරුණු සම්බන්ධයෙන් නවතම තත්ත්වය අවබෝධ කර ගැනීමට එහිදී විශේෂ සැලකිල්ල යොමු කරනු ලැබූ අතර, රජයත් ව්‍යාපාර හා ස්වේච්ඡා සංවිධානයන් අතර අන්තර් සබඳතාවයන් ශක්තිමත් කිරීම සඳහා ස්ථාවර පියවර ගැනීමට එහිදී හැකි විය.

මෙම අරමුණු සිත්හි තබා ගෙන අපගේ භාරත දේශයේ අභිවෘද්ධිය තකා 'ජාතික පදනම් ආයතනයක්' දිගටම ක්‍රියාත්මකවීම සඳහා මෑතකදී පිහිටුවනු ලැබීය. මේ සම්බන්ධයෙන් සාගිනි නිවීමේ

ව්‍යාපෘතිය අනුග්‍රහය යටතේ ඉන්දියාවේදී ක්‍රියාත්මක වනු ලබන තවත් වගකිව යුතු ස්වේච්ඡා ක්‍රියාදාමයක් පිළිබඳව මතක් කිරීමට කැමතියි.

''සාගිනි නිවීමේ ව්‍යාපෘතිය'' යනු මෙම ශත වර්ෂයේ අග භාගය වන විට, කුසගින්න යන අවාසනාවන්ත තත්ත්වය ලෝකයෙන් තුරන් කිරීමේ පරමාර්ථය මත ඉතා කැපවීමෙන් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ස්වේච්ඡා ව්‍යාපාරයකි. මෙවැනි කර්තව්‍යයන්හිදී ඒවායේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ පරමාර්ථයෙන්ම සංවිධානාත්මකව වැඩ කිරීමේ අවශ්‍යතාවය පුරෝගාමී විය යුත්තකි. ලෝක වාසී සමස්ත ජනතාවගෙන් විශාල සංඛ්‍යාවක් සාගින්නෙන් පීඩා විඳින අතර. ලක්ෂ 13 සිට 18 දක්වා සංඛ්‍යාවක් කුසගින්න හා එය හේතුකොට ගෙන ඇති වන වෙනත් රෝගාබාධවලින් වර්ෂයක් පාසා මිය යන බවත් තිස්දහසක් දෙනා දිනපතා මිය යන බවත්, ඇස්තමේන්තුවලින් ගණන් බලා තිබේ. ඉන්දියාව තුළ සාගිනි නිවීමේ ව්‍යාපෘතිය මගින් මෙම ගැටළුව සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ කාර්ය භාරයට අමතරව, සාගින්නට විරුද්ධව සටන් කිරීමේ ස්වේච්ඡා ක්‍රියාදාමයන් ද ශක්තිමත් වෙමින් පවතී.

සංවර්ධනය වෛද්‍ය සේවා පෝෂණය පවුල් සැලසුම් හා ශාස්ත්‍රීය කටයුතු වැනි විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සමාජ සේවාවන්හි නියැලී සිටින ස්වේච්ඡා සංවිධානයන්හි ක්‍රියාකාරිත්වයන්ට ආධාර කිරීමේ ප්‍රයත්නයක් පසුගිය අවුරුදු කිහිපය තුළදී සාගිනි නිවීමේ ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලැබීය. තවද මෙම ව්‍යාපෘතිය විසින් මීට අවුරුදු දෙකකට පමණ පෙර, රාජ්‍ය අංශයේ සුභසාධනය හා විශේෂිත වූ ක්ෂේත්‍රයන් හා සම්බන්ධ සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ස්වේච්ඡා සංවිධාන රාශියක් හා ඒකාබද්ධව වැඩ සටහන් දියත් කරන ලදී. ඒ අනුව මහාරාෂ්ට තමිල්නාඩු ගුජරාට් හා බටහිර බෙංගාලය යන ප්‍රාන්තවල රාජ්‍ය මන්ත්‍රණ සභා මධ්‍යස්ථාන ද පිහිටුවනු ලැබීය. අපේ සේවාවන් ශක්තිමත්

කෙරෙන්නා වූ මහාරාෂ්ට ප්‍රාන්තයේ රාජ්‍ය මන්ත්‍රණ සභාව සමඟ මම පෞද්ගලිකව සම්බන්ධ වී සිටින්නෙමි. ස්වේච්ඡා සංවිධාන අධ්‍යාපන ආයතනයන් සමාජ සේවා සංවිධානයන් හා ව්‍යාපාර ක්ෂේත්‍රයට අදාළ වන්නා වූ රාජ්‍ය දෙපාර්තමේන්තු යන මේ ආයතනවල නියෝජිතයන්ගෙන් රාජ්‍ය සභාව සමන්විත විය. රාජ්‍ය ආණ්ඩුව විසින් මෙම සභාවට විවිධ වූ සංවර්ධන යෝජනා ක්‍රම 40 ක් අනුයුක්ත කර ඇති අතර, සභාව මගින් අනුමත කරන ලද ස්වේච්ඡා සංවිධානවලට ඒවායේ ක්‍රියාත්විතය ලබා දෙමින් නිසි අරමුදල් ද ලබා දෙනු ඇත. දැනට අප විසින් ස්වේච්ඡා සංවිධාන 25 ක් පමණ අනුමත කර ඇත. අතරමග තවත් විසිපහකි.

ලෝක සාගිනි ව්‍යාපාරයේ 'ග්ලෝබර්' අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් හැටියට ආචාර්ය එම්.එස්. ස්වාමිනාදන් සමගින්, මා ඔබට මගේ පුද්ගලික අත්දැකීම් තුළින් යමක් කියනු කැමැතියි. එනම් මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම කණ්ඩායම් එක්රැස් කිරීමට යම් ඵලදායී පියවර ගැනීමට අපට හැකි වී ඇති බවයි. එම අවස්ථාවන් වට මේස සාකච්ඡාවන්ට පමණක් සීමා වන සංසිද්ධියක් නොව, යම් ස්ථිර ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉවහල් වන ස්ථාවර සැලැස්මක් බවත් සඳහන් කරමි. අපගේ මෙම ප්‍රයත්නයත් ඔබ සැමගේ සිතිවිලි හා ක්‍රමවේදයත් අතර පවතින්නේ සම කම්පනයක් බව මගේ හිතමිත්‍ර ආරිත්, ඔබ සියලු දෙනාමත් අවබෝධ කර ගනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මිත්‍රවරුනි,

තොරතුරු තාක්ෂණ යුගයක් වර්තමානයේදී උදා වී තිබුණ ද, මහත්මා ගාන්ධිතුමා විසින් පෙන්වා දුන් මගෙහි ගමන් කිරීම හැර, වෙනත් විකල්පයක් නොමැති බව ලෝකය දැන් අවබෝධ කර ගනිමින් සිටී. චීනය, පිලිපීනය, බුරුමය, දකුණු අප්‍රිකාව හා සෝවියට් සංගමය යන රටවල වෙසෙන ජනතාවගේ මෑත කාලයේ අත්දැකීම්වලින් හොඳින්ම සනාථ වන්නේ, ගාන්ධිතුමා විසින් ඒකමතිකව උගන්වා තිබෙන සාමකාමී හා අවිහිංසාවාදී සටනෙහි ඵලදායී බවයි. නවීන ලෝකයේ ප්‍රචලිතව පිළිගෙන තිබූ අනෙකුත්

විද්‍යාත්මක මූලධර්ම, පරස්පර විරෝධීතාවයන්ට හසු වී සුන්බුන් බවට පත්ව ඇති අතර, ගාන්ධිතුමාගේ ඉගැන්වීම් මෙන්ම, ක්‍රියාකාරී තාක්ෂණයන්හි ද වටිනාකම් මිනිසා විසින් ඒත්තු ගනිමින් සිටී. එබැවින් ගාන්ධි චරිතය හා එතුමාගේ චින්තනය පිළිබඳව ලෝක වාසී ජනතාව විශේෂයෙන් බාල පරපුර විසින් දක්වන්නා වූ උනන්දුව වර්ධනය වීම පුදුමයට කාරණයක් නොවේ. ගාන්ධි දර්ශනය පමණක් නොව, එතුමාගේ ඉගැන්වීම් මහත් කැප වීමෙන් ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කරමින් ජාත්‍යන්තර සර්වෝදය ව්‍යාපාරයේ පුරෝගාමී වූ ආචාර්ය ආරියරත්න වැනි පුද්ගලයන් විසින් ලෝක ප්‍රජාව වෙතම ප්‍රදානය කරනු ලබන වටිනා සේවාවන් අන්ධකාර වටාපිටාවට ආලෝක ධාරාවක් සමඟ බලාපොරොත්තුවේ සේයාවන් ගෙන එන්නාක් මෙනි.

ආචාර්ය ආරියරත්න මැතිතුමා වෙත පිරිනමනු ලැබූ ගෞරවය පිළිබඳව මගේ හද පිරි සතුට නැවතත් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එය ඇත්ත වශයෙන්ම ඔහුගේ සාධාරණ වූ දර්ශනයත්, මිනිස් වර්ගයා වෙනුවෙන්ම කරන ලද සේවයේත් පරාවර්තන ප්‍රතිඵලයන්මය.

සතුට හා තෘප්තිමත් බව සැම දා භුක්ති විඳමින් නිරෝගී භාවය සමගින් ක්‍රියාකාරී හා වැඩදායී අන්දමින් චිරාත් කාලයක් ජීවත් වේවායි මම ඉතසිතින් එතුමාට ශුභාශිංසනය කරන්නෙමි.

(නිවානෝ සාම ත්‍යාගය පිරිනැමීම නිමිත්තෙන් 1992 ජූනි මස 03 වැනි දින කොළඹ පැවැත්වූ සුභ පැතීමේ උත්සවයට සහභාගිවූ ශ්‍රී රාමක්‍රිෂ්ණ බජාජ් මහතාගේ දේශනයේ පරිවර්තනයකි)

විශ්ව නිකේතන් ජාත්‍යන්තර සාම නිවහන සහ භාවනා මධ්‍යස්ථානය

දෙවසරක් පඩි රහිතව නාලන්දාවේ ගුරු සේවයෙන් නිවාඩු ගෙන සර්වෝදය ශ්‍රමදාන පණිවුඩය රට පුරා විද්‍යාස්ථානවලට රැගෙන ගොස් ව්‍යාප්ත කිරීම මගේ ප්‍රබලතම ආශාව විය. ඒ සඳහා ගත් ප්‍රයත්න ව්‍යාප්ත වූයෙන් 1972 ජනවාරි 01 දා සිට මම සේවයට නොපැමිණෙන බව අධ්‍යාපන අමාත්‍යාංශයට දැන්වූයෙමි. එමෙන්ම සේවය හැර යෑමේ වරද උඩ මා සේවයෙන් පහ කරන ලෙස ද ඔවුන්ට දැනුම් දුන්නෙමි. කෙසේ නමුත් එදා සිට මට වේතනයක් හෝ වැටුපක් ලැබුණේ නැත. සර්වෝදයෙන් ද වේතනයක් හැටියට කිසිවක් ලැබුණේ නැත. මේ නිසා වරින් වර සර්වෝදය කටයුතුවලට පාඩු නොවන හැටියට එක්සත් ජාතීන්ගේ සංගමයේ හෝ ලෝක බැංකුවේ හෝ වෙනත් විදේශ ආයතනයක යම් යම් විශේෂ සේවාවන් සඳහා සහභාගි වී මම යම් ආදායමක් ලබා ගතිමි.

යුගැන්ඩාවේ බිහිසුණු යුද්ධයකින් පසුව විනාශවීමෙන් සිදු වූ තත්ත්වයෙන් ඒ රට පුනරුත්ථාපනය කිරීමට පත් කළ විශේෂ මණ්ඩලයේ කෙනෙක් හැටියට සේවය කිරීමට ලෝක බැංකුවෙන් මට ආරාධනයක් ලැබී තිබුණි. මාස තුනක් එම සේවයේ යෙදී සිටි නිසා ලෝක බැංකුව විසින් මට සෑහෙන මුදලක් ගෙවන ලදී. එම මුදල මා ලබා ගෙන දින කිහිපයක් යන විට අක්කර දෙකහමාරක පමණ ඉඩමක් මිලට ගන්නා ලෙස ඉඩම් හිමියෙක් බලෙන්ම වාගේ මගෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව එම ඉඩමට මුදල් ගෙවා සර්වෝදය සංගමය නමින් ඔප්පු ලීවෙමු. එම ඉඩමෙන් පර්චස් 10 බැගින් කොටස් කිහිපයක් අපේ පූර්ණකාලීන සේවකයන්ට දී ඉතිරි ඉඩම් කොටස හිස්ව තිබුණේය.

සර්වෝදය මූලස්ථානය සහ පර්යන්ත දිස්ත්‍රික් මධ්‍යස්ථානයන් මගින් විවිධ ප්‍රජා සේවාවන් ඉෂ්ට වුවද මනුෂ්‍යයින්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය වෙනුවෙන් ද ඊට සරිලන යම් ඵලදායී සේවයක් ප්‍රදානය කළ යුතු බවත් කාලයක් තිස්සේ මා තුළ වැඩෙන්නට වූ සිතුවිල්ලකි. ලෞකික ජීවිතයේ ඕනෑ එපාකම් මත දහසකුත් බර කරපින්නා ගෙන වෙහෙසට පත් වන අපගේ දේශීය ප්‍රජාවන්ටත්, විදේශීය රටවල සිට මෙහි පැමිණෙන ප්‍රජාවන්ටත් ආධ්‍යාත්මික සුවපත් භාවය අත්පත් කර ගැන්මට, රටට සමාජයට විශ්වමය වශයෙන් සාමය ශුභසාධනය ගෙන ඒමේ අරමුණින් යම් වැඩ පිළිවෙලක් කළයුතු යැයි යන සිතුවිල්ල දිනෙන් දිනම මා තුළ වැඩෙන්නට විය.

මට ඉඩ ලැබුණු සෑම අවස්ථාවකදීම සර්වෝදය ගරාජය අසල තිබුණු අලුතින් මිල දී ගත් මෙම හිස් ඉඩමට ගොස් ඒ දෙස බලා ගෙන සිටිමින් එතැන මගේ සිතුවිල්ල ක්‍රියාත්මක කිරීමට සුදුසු භාවනා මධ්‍යස්ථානයක් ගොඩනැගීමට මම සිතෙන් සැළසුම් කළෙමි. දවසක් දා මම එම ඉඩම ඉදිරිපිට සිටින විට කවුදෝ මට පිටුපසින් විත් මගේ පිටට තට්ටු කළේය. මා දුටුවේ මහා දානපතිනියක් වූ මා මිත්‍ර ඇමෙරිකානු ජාතික ජැකලින් බෙනට් මැතිනියයි.

මා එතැන සිටගෙන සිට කුමක් කරන්නේ දැයි ඇය ඇසූ ප්‍රශ්නයට මා පිළිතුරු දුන්නේ එම ඉඩමේ ගොඩනගන භාවනා මධ්‍යස්ථානය හිතෙන් ගොඩනගන බවයි.

ඇත්ත වශයෙන් එය ගොඩනැගීමට මුලින් කළ යුත්තේ කුමක් දැයි ඇය මගෙන් ඇසුවේය.

මා කීවේ, මුලින්ම මේ මඩ ගොහොරුව ගොඩ කළයුතු බවත්, ඒ සඳහා රුපියල් මිලියනයක පමණ මුදලක් වැය කළයුතු බවයි.

සිනහ මුසු මුහුණින් ඒ මුදල මම දෙන්නම් කියා ඇයගේ අත්බෑගය විවෘත කර ඕ චෙක්පතක් ලියා මා අත තැබුවාය. දින දෙක තුනකින් ගොඩ කිරීමේ වැඩය පටන් ගත්තෙමු.

මේ අතර කැනඩා ජාතික ගෘහ නිර්මාණ ශිල්පියෙක් ලවා භාවනා මධ්‍යස්ථානයට සුදුසු සැළසුමක් අන්දවා ගතිමි. එහෙත් එයට විශාල වියදමක් යන බව මට අවබෝධ විය. ඊට පසු ගෘහ නිර්මාණ ශිල්පී චන්දන එදිරිසූරිය මහතා ලවා අවශ්‍ය සැළසුම සූදානම් කර ගතිමි. ඒ අතරම මුදලක් අතේ නැතත් මගේ ඥාතිවරයකු වූ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වන එල්.එච්. පියසේන මහතාට මෙම ජාත්‍යන්තර සේවා ආයතනය නිර්මාණයේ මගේ අරමුණත් මෙම කර්තව්‍යයෙහි ගැබ්ව ඇති ආධ්‍යාත්මික වටිනාකමත් ගැඹුරත් පැහැදිලි කර දී මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු එතුමාට බාර කළෙමි.

1992 වසරේ ජපානයේ නිවානෝ සාම ත්‍යාගය සඳහා මට ලැබුණු මුදල සම්පූර්ණයෙන්ම ''ඒ.ටී. ආරියරත්න පුණ්‍ය භාරය'' නමින් අරමුදලක් පිහිටුවා එහි තැන්පත් කළෙමි. 1994 දෙසැම්බර් මස 24 වැනි දින නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් බී.ඒ.පී.එම්. ධර්මසිරි මෙනවිය ඔප්පුව ලියූවාය. එහි සභාපති මා වූ අතර, නීතා ධම්මචාරී ආරියරත්න මහත්මිය, සාමියා චාරිකා ආරියරත්න මහත්මිය, වෛද්‍ය වින්යා ශාන්තිදාස් ආරියරත්න, ජීවන් ධම්මික ආරියරත්න මහතා, සදීවා සාමදීපා ආරියරත්න මෙනවිය, දියත් සමන්ත ආරියරත්න මහතා, නිම්නා හයන්ති ආරියරත්න මෙනවිය, වෛද්‍ය උපාලි මාරසිංහ මහතා, හසන්ති ආරියරත්න ඉද්දමල්ගොඩ මහත්මිය, අධිනීතිඥ වෝල්ටර් පීරිස් මහතා, දයානන්ද මුතුකුමාරණ මහතා ආදීහු ආරම්භක භාරකාර මණ්ඩලයේ සාමාජිකයෝ වූහ.

මේ අතර මගේ බලාපොරොත්තු මුදුන්පත් කරමින් 1996 වසරේ මහත්මා ගාන්ධි සාම ත්‍යාගය මට හිමිවීමත් එයට ලැබුණු ත්‍යාග මුදල සම්පූර්ණයෙන් පුණ්‍ය භාරයට පරිත්‍යාග කිරීමට හැකි විය.

විශ්ව නිකේතන ජාත්‍යන්තර සාම නිවහන ඉදිකිරීම පමණක් නොව අද දවසේ පවතින සාර්ථකත්වය කරා ගෙන ඒමට සියලු අයුරින් ආධාර උපකාර කළ ලොකු කුඩා සැම දෙනාම මම ඉතා සතුටින් කෘතවේදීව සිහිපත් කරමි. ඒ සැමදෙනාටම පින් දෙමි. තයිවානයේ බෞද්ධ සංගමයේ සභාපති සහ ධර්ම චක්‍ර පදනමේ සභාපති ගරුතර කුවාන් හ්සින් (Ven.Kuang Hsin) ස්වාමීන් වහන්සේගෙන් අපට ලැබුණු අනුපමේය සහාය සැමදා අගය කරමු. ඉදිකිරීම් සඳහා ප්‍රථමයෙන් රුපියල් මිලියන 10 කට ආසන්න මුදල් පරිත්‍යාගයක් අපට ලබාදුන් උන් වහන්සේ ඉන් පසුවත් අපගේ ඉදිකිරීම් කටයුතු මුදල් නොමැතිව නවතා තිබියදී ඇමෙරිකානු ඩොලර් ලක්ෂ දෙකක් නොමසුරුව පරිත්‍යාග කළහ. ජපානයේ කියෝටෝවල එමී යෝෂීඩා මෙනවිය (Ms. Emi Yoshida) විශේෂ තැනක් ගනී. ඇය මුදලින් පමණක් නොව නොබෝ සිරසුනා මහතාගේ (Mr. Nobuo Shirasuna) සේවය ද අපට ලබා දුන්නාය. ජැකලින් බෙනට් මැතිනිය, ජපානයේ තොයිමිකෝ ඉවසාකි මහත්මිය, තායිවානයේ බෞද්ධ සංගමයේ සභාපතිතුමා, අම්පාර නිපොන් මියෝජි ආරාමය භාරව සිටි ජපන් ජාතික ගරු ජී. අසාමි හිමියන් ද, ෆුකුඕකා ගෙන්කායි ලයන්ස් ක්ලබ් ආයතනය ද අපට මුදල් පරිත්‍යාග කළ අනෙකුත් පින්වතුන් අතර වූහ.

මුදල් අඩුපාඩුකම් නිසා වරින් වර ඉදිකිරීම් කටයුතු නතර කිරීමට සිදු වුවත් එල්. එච්. පියසේන සහ සමාගම විසින් දිගටම ඉදිකිරීම් කටයුතු කර ගෙන ගියේය. එල්. එච්. පියසේන සහ සමාගමට අපි ණය වී තිබුණ ද ඉදිකිරීම් කටයුතු දිගටම කර ගෙන ගිය අතර 2006 වර්ෂය වන තෙක්ම එකී ණය ඉතිරිව තිබුණි. ආරම්භයේ සිටම විශ්ව නිකේතන ආයතනය මගින් ලෝකයට සිදුවන වටිනා සේවය වෙනුවෙන් එල්.එච්. පියසේන මහතා තම මිය ගිය දෙමව්පියන්ටත්, තම භාර්යාවටත් පිං පිණිස ඒ.ටී. ආරියරත්න පුණ්‍ය භාරයෙන් අය විය යුතුව තිබූ රුපියල් ලක්ෂ අටක (08) ණය මුදලින් රුපියල් ලක්ෂ තුනක් (03) කපා හැරියේය.

භූමිය සකස් කිරීම සඳහා ලංකාවේ සුප්‍රසිද්ධ භූමි අලංකරන ශිල්පියෙකුට මම ආරාධනා කළෙමි. ඔහු ඒ සැලැස්ම සාදා දීම සඳහා රුපියල් මිලියනයක් ඉල්ලා සිටි නිසා මම ම භූමියේ සැලැස්ම හැදුවෙමි. ජපන් ජාතික උද්‍යාන නිර්මාණ ශිල්පියෙක් වූ සිරසුනා මහතා පොකුණු තුනක් සෑදීමට ස්ථාන තුනක් ලකුණු කර දුන්නේය. ඒ පිටුපස තිබෙන කඳු වැටිය එතුමා මා සාදා තිබූ සැලැස්මට විශේෂයෙන් එකතු කළේය. එම ශිල්පියා ලංකාවට ගෙන ආවේ එමී යොෂීඩා මහත්මියගේ වියදමිනි.

විශ්ව නිකේතනයේ උද්‍යානය

සර්වෝදය ගම්මානවලින් බොහෝ කණ්ඩායම් පැමිණ අපේ වැඩට ශ්‍රමදානයෙන් උදව් වීය.

විශ්ව නිකේතනය යනු මගේ අදහසේ හැටියට සොබා දහමෙහි සුන්දරත්වය මෙන්ම එහි ආකර්ශනීය නිහැඬියාව තුළින් සිත් සතන්වලට සතුට සාමය අත්විඳීම සඳහා මොහොතක් හෝ ගත කළ හැකි සුවිශේෂී ස්ථානයකි. එය සාමකාමී නවාතැනක් ද වේ.

ඕනෑම කෙනෙකුට විශ්ව නිකේතනයට පැමිණ භාවනා කළ හැක. තනිව හෝ කණ්ඩායම් වශයෙන් භාවනා කිරීම, ආධ්‍යාත්මික සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු පාඨමාලා, සාම වැඩ සටහන් ආදිය පැවැත්වීමට එළිමහනෙහි සහ ඇතුළත ද විවිධ ආකර්ශනීය ස්ථානයන් එහි නිර්මාණය කර ඇත. පරිසරයේ පවතින සුවදායක බව භුක්ති විඳීමටත්, නෙළුම් පොකුණක්, සක්මන් භාවනාවට සුදුසු එළිමහනේ පිහිටි වැලි ඇතිරූ පටු මාවත් සහ තුරුලතා සෙවනින් ආවරණය වූ ඉස්තෝප්පු සහ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනුවෙන් එකිනෙකට ආසන්නව ඉදිකර ඇති සියලු පහසුකම් සහිත භාවනා කුටි හතරක් ද එහි දැකිය හැකිය. පරිශ්‍රයෙහි උතුරු කොණෙහි ගස්වැල්වලින් පිරි පුංචි කැලයකි.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා භාවනා කුටි

සිත එක්තැන් කර ගැනීමට මාහැඟි පරිසරයක් නිර්මාණය වී ඇති එහි කොණක මගේ බලවත් ආශාවක් වූ අනුරාධපුර ශ්‍රීමහා බෝධීන් වහන්සේගේ අංකුරයක් ලබා ගෙන රෝපණය කිරීමයි. මේ සඳහා අපේ රටේ ශ්‍රේෂ්ඨතම බෞද්ධ සංස්කෘතික නායක උතුමකු වන අතිපූජ්‍ය මාපලගම විපුලසාර නාහිමිපාණන්

වහන්සේගේ සහාය මම පැතුවෙමි. උන් වහන්සේ අනුරාධපුරයට වැඩම කොට ශ්‍රීමහා බෝධීන් වහන්සේ බාර නාහිමිපාණන් වහන්සේගෙන් බෝධි අංකුරය ලබා ගෙන විශ්ව නිකේතනයට මහ පෙරහරින් වඩමවා උන් වහන්සේ විසින්ම සැළැස්ම ඇඳ සකස් කරනු ලැබූ ස්ථානයක රෝපණය කළෙමු.

බෝධි අංකුරය වැඩමවීම

උන් වහන්සේ විසින් ම විශේෂ සමාධි ප්‍රතිමාවක් ද ඒ ස්ථානයේ ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. මේ අතර බෝධි මළුව ආධ්‍යාත්මිකව ශක්තිමත් කිරීම සඳහා ලංකාවේ නොයෙක් තැන්වලින් මා සොයා ගත් අටවිසි බෝධීන් වහන්සේලාට අයත් බෝධීන් වහන්සේලා විසිහතර නමක් මෙම බෝධිය වටා රෝපණය කිරීමට මම සමත් වීමි. මේ සියලු කටයුතු මගේ උපදෙස් අනුව, ශ්‍රමදාන මගින් වලවල් කපා දුන් අතර මගේ අතින්ම සියලුම පැළ රෝපණය කළෙමි. අද විශ්ව නිකේතන භූමිය පුරා විශාලව වැඩී ඇති ගස් ඒ කාලයේ මා විසින් රෝපණය කළ ඒවාය.

විශ්ව නිකේතනයෙහි වැදගත් ස්ථානයක් හිමි වන පුස්තකාලය, කෞතුකාගාරය සහ ලේඛනාගාරයේ සැකසුම් සඳහා විශේෂඥ උපදෙස් ලබා දුන් විද්වතුන් අතර ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂතුමා විශේෂයෙන් සඳහන් කළ යුතුය. මේ සඳහා රැමන් මැග්සයිසයි පදනමේ විශේෂ ව්‍යාපෘති අංශය විසින් මුදල් පරිත්‍යාගයක් කළේය. කෞතුකාගාරය තුළ සර්වෝදයේ මෙතෙක් ප්‍රගතිය ද, මා ජාත්‍යන්තර සහ දේශීය වශයෙන් ලබා ඇති සම්මාන සහ ඒවායේ විස්තර ද ප්‍රදර්ශනය කර ඇත. භාවනාව, සාමය, ගැටුම් සමථකරණය සහ ආධ්‍යාත්මික විෂයය පිළිබඳව පොත්පත් විශාල සංඛ්‍යාවක් සහිත පුස්තකාලයක් ද සර්වෝදයේ ඓතිහාසික ලියකියවිලි ඇතුළත් ලේඛනාගාරය ද එකම ගොඩනැගිල්ලක පිහිටා ඇත. මේ සියලුම ආකාරයෙන් විශ්ව නිකේතනය වූ කලී සොබාදහමේ සුන්දර වටපිටාව හා එක්ව මිනිසුන්ගේ සිත් සතන් සැනසීමට ප්‍රබෝධවත් කිරීමට බලා සිටින ජීවමාන දැනුම් සම්භාරයකි. නිසංසල නවාතැනකි. මෙම ස්ථානය නැරඹීමට අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සංඝ පීතෘවරයන් වහන්සේලා රැසක්ම වැඩියහ.



උත්සවයට සහභාගී වූ සැදැහැවතුන්

1999 වර්ෂයේ පෙබරවාරි 28 දා විශ්ව සාමය සඳහා කැප වූ ''විශ්ව නිකේතන්'' මෙම ජාත්‍යන්තර සාම මධ්‍යස්ථානය උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. ප්‍රධාන අමුත්තා ලෙස මෙම කර්තව්‍ය සඳහා අපට අනුපමේය සහයෝගයක් ලබා දුන් ගරු කුවාන් හ්සින්තුමා, මහාචාර්ය චෙන්ග් චෙන් මහතා පැමිණියේය. මහාචාර්ය චෙන්ග් මහතා තායිවානයේ ටෝර්ච් ඔෆ් විශ්ඩම් ආයතනයේ සභාපති ලෙස ද කටයුතු කරමින් සිටියේය. විශ්ව නිකේතන් සාම නිවහනේ මූලික පරමාර්ථය සිත සුවපත් කිරීම, සමාජය සුවපත් කිරීම, පරිසරය සුවපත් කිරීම වන අතර වැඩි දුරටත් එහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

* පුද්ගලයින් සතු ආධ්‍යාත්මික ශක්තිය අවදි කිරීම.

* සමස්ත ජීව ලෝකයට මෛත්‍රිය පැතිරවීම.

* අන්තර් ආගමික, අන්තර වාර්ගික, අන්තර් ශ්‍රෝත්‍රීය, අන්තර් දේශපාලනික සහ අන්තර් රාජ්‍යමය අවබෝධය වඩවාලීම.

* මානව අයිතිවාසිකම් හා මානව හිමිකම් සුරක්ෂිත කිරීම.

* ලෝක සාමය උදා කිරීමට ක්‍රියා කිරීම.

මෙම මෙහෙවර දියත් කිරිම සඳහා විශ්ව නිකේතන් සාම නිවහන තුළ සේවාවන් හතරක් පවත්වා ගෙන යාමට යෝජිතය.

* ජීවන විද්‍යගරය
* සාම පුස්තකාලය
* සාම කෞතුකාගාරය
* මෙත්සිත් වැඩ සටහන

මේ වන විට විශ්ව නිකේතන් සාම නිවහන මුල් කර ගෙන වැඩ සටහන් 10 ක් ක්‍රියාත්මක කරනු ලැබේ.

I. මව් පදවියට දහම් ප්‍රවේශයක්
II. ළමයින් සඳහා ආධ්‍යාත්මික වටිනාකම් හා සාම අධ්‍යාපනය
III. පාසැල් දරුවන් සඳහා පාසැල් දිවියට ආධ්‍යාත්මික ප්‍රවේශයක්
IV. තරුණ තරුණියන් සඳහා ජීවිත අධ්‍යාපන වැඩසටහන
V. විවාහ යෝජිත පිරිස් සඳහා විවාහ දිවියට ආධ්‍යාත්මික ප්‍රවේශය
VI. වෘත්තිකයන් උදෙසා කළමනාකරණයට ආධ්‍යාත්මික ප්‍රවේශයක්
VII. චිත්ත ආධ්‍යාත්මික සුවතා වැඩසටහන (බන්ධනාගාර රැඳවියන් උදෙසා)
VIII. මනෝ කායික සුවතා වැඩසටහන
IX. ත්‍රිපිටකාශ්‍රිත ධර්ම සාකච්ඡා සහ භාවනා
X. භාවනා ගුරුවරු / සම්පත් දායක /නායකත්ව පුහුණු

මව්වරුන් උදෙසා මව් පදවියට දහම් ප්‍රවේශයක් වැඩසටහනඃ

විශ්ව නිකේතන් සාම නිවහන මෙහෙය වන ප්‍රධානතම වැඩ සටහන ලෙස මාතෘත්වයට දහම් ප්‍රවේශයක් වැඩ සටහන හඳුන්වා දිය හැක. ගර්භනී සමයේ පටන්ම දරුවාගේ පෞරුෂ සංවර්ධනයට බලපාන සංජානනය, ප්‍රජනනය, සන්නිවේදනය, ධනාත්මක සිතිවිලි ආදිය දරුවාට අවරෝදනය කිරීමට මවකට පමණක් ඇති හැකියාව සහ අවස්ථාව පිළිබඳ මෙම වැඩ සටහනේදී සාකච්ඡා කෙරේ. නූතන විද්‍යාත්මක සොයා ගැනීම් සහ පර්යේෂණ ඇසුරින් සුවසපිරි ගුණගරුක දරුවෙක් ලොවට දායාද කිරීමේ ක්‍රමවේදය ඉගැන්වෙන වැඩ සටහනකි. එසේම මෙම වැඩ සටහන තුළින් හඳුන්වා දෙන මාතෘ භාවනාව තුළින් දරුවාගේ මනස ප්‍රවර්ධනය කරන අයුරු පරිසරය සුන්දරත්වය අත්විඳින අයුරු අත්දැකීම් සහ පර්යේෂණ ඇසුරෙන් විග්‍රහ කෙරේ.

සර්වෝදය මාර්ගෝපදේශකතුමන්ගේ දාර්ශනික මඟ පෙන්වීම සහ විශේෂඥ වෛද්‍ය උපාලි මාරසිංහ මහතාගේ වෘත්තීය අත්දැකීම් තුළින් මෙම වැඩ සටහන අර්ථ ගැන්වී ඇත. 2000 වසරේ DSI සමූහ ව්‍යාපාරයේ අනුග්‍රහය ඇතිව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලවේ ආරම්භ කළ මෙම වැඩ සටහන මේ වන විට ප්‍රබල ජාතික මට්ටමේ වැඩ සටහනක් බවට පත් වී ඇත. පදවිය, අනුරාධපුරය, පොළොන්නරුව, ගාල්ල, මහනුවර, මොනරාගල, කළුතර, කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල ජාතික මට්ටමින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක වී ඇත. මාස් පතා විශ්ව නිකේතන් සාම නිවහන කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩ සටහන පැවැත්වේ. රජයේ පවුල් සෞඛ්‍ය නිලධාරි කාර්යාලවල සහාය ඇතිව ප්‍රාදේශීය මට්ටමින් සහ ග්‍රාමීය පදනමින්ද මෙම වැඩ සටහන පැවැත්වේ.

බන්ධනාගාර රැඳවියන් උදෙසා චිත්ත ආධ්‍යාත්මික සුවතා වැඩසටහන:

විශ්ව නිකේතන් සාම නිවහන මෙහෙයවීමෙන් ආරම්භ වූ මුල්ම වැඩ සටහන ලෙස මෙය හැඳින්විය හැකිය. ඉන්දියාවේ නියෝජ්‍ය පොලිස්පතිනියක් වූ කිරාන් බෙඩි මැතිනිය විසින්, ඉන්දියාවේ සිර මැදිරි රැඳවියන් පිරී ඉඩ කඩ ඇහිරි යන අවස්ථාවක ඔවුන් පුනරුත්ථාපනය කර නැවත සමාජගත කිරිම සඳහා ආරම්භ කළ වැඩ සටහන අධ්‍යයනය කිරීමෙන් අනතුරුව සර්වෝදය මාර්ගෝපදේශකතුමා සහ ආචාර්ය චාරිකා මාරසිංහ මහත්මියගේ මඟ පෙන්වීම යටතේ මෙම වැඩ සටහන ලංකාවේ ද ආරම්භ විය.

බන්ධනාගාර නිලධාරීන්, සුභසාධක නිලධාරින්, ඉහළ කළමණාකාරිත්වය උදෙසා ද මෙයට අදාල භාවනා කළමනාකරණ පුහුණු සහ විවිධ වැඩ සටහන් පවත්වා ඇත. වැලිකඩ, අලුත්කඩේ, මහර, ගාල්ල, කළුතර, වටරැක යන බන්ධනාගාර ප්‍රධාන කොට රට පුරා සෑම බන්ධනාගාරයකම මෙම වැඩ සටහන ආරම්භ කිරීමට

අවශ්‍ය පදනම ගොඩනැගී ඇත. වැලිකඩ බන්ධනාගාරයේ සෑම මසකට වරක් තෙදින භාවනා වැඩ සටහන් සහ වාර්ෂිකව දස දින විපස්සනා භාවනා වැඩ සටහන් සහ සාමූහික භාවනා වැඩ සටහන් පැවැත්වේ. බන්ධනාගාර රැඳවියන් පවා අතිශයින් කැමැත්තක් දක්වන මෙම වැඩ සටහන සඳහා දරුණු අපරාධ, වංචා, දූෂණ, බාලඅපරාධ, අපචාර ක්‍රියාවනට සම්බන්ධ නේවාසිකයින් පුනරුත්ථාපනය කිරීමට හැකියාව ලැබී ඇත.

මනෝ කායික සුවතා වැඩසටහන:

ජන සමාජය පුරා පැතිරී පවතින සුලබ රෝග සුව කර ගැනීමේදී ඖෂධ ප්‍රතිකාර මෙන්ම මානසික ප්‍රතිකාර ක්‍රමයන් පිළිබඳව ද මිනිසුන් තුළ විශ්වාසය ගොඩනඟන වැඩ සටහනක් වශයෙන් මෙම වැඩ සටහන හැඳින්විය හැකිය. දියවැඩියාව, ඉරුවාරදය අධික තරබාරුව, හෘදාබාධ, ප්‍රමේහය, හන්දිපත් ඉදිමීම, රුධිරයේ තෙල් වර්ධනය ආදි රෝග පාලනය කිරීමට මෙම මනෝ කායික සුවතා වැඩ සටහනින් උගන්වයි.

කායික ව්‍යායාම, භාවනා ක්‍රම, සුදුසු ආහාර නිවැරදිව ගැනීම, ප්‍රමාණවත් ලෙස ජලය පානය, සහ සංගීතය මගින් රෝග අවම කර ගන්නා අයුරු මෙම වැඩ සටහන තුළින් පැහැදිලි කරයි. විශේෂඥ වෛද්‍ය උපාලි මාරසිංහ මහතා විසින් මෙම වැඩ සටහන මෙහෙයවයි. මෑතකදී හඳුන්වා දෙනු ලැබූ සුවිශේෂී වැඩ සටහනක් වන මෙම වැඩ සටහන දැනට ආයතනීය මට්ටමින් පමණක් පවත්වා ගෙන යනු ලබයි.

ළමා දිවියට ආධ්‍යාත්මික වටිනාකම් සහ සාම අධ්‍යාපනය:

යුද්ධය, හිංසාව, ප්‍රචණ්ඩත්වය සහ ඇතැම් ජන මාධ්‍යය ආදී සමාජ ව්‍යවසන මෙන්ම සුනාමිය වැනි ස්වාභාවික විපත් නිසා අසාමාන්‍ය චර්යා ඇති දරුවන් උදෙසා මෙම වැඩ සටහන නිර්මාණය විය. වයස අවුරුදු 06 - 11 දක්වා දරුවන්ගේ දෛනික ජීවිතවලට එකතු කර ගත හැකි ආධ්‍යාත්මික වටිනාකම්, ගුණධර්ම

හා සාරධර්ම සහජීවනය සමාජානුයෝජනය, අන්තර් පුද්ගල සම්බන්ධතාවය සහ නායකත්ව කුසලතා වර්ධනයට තුඩු දෙන අභ්‍යාස හා ක්‍රියාකාරකම් මගින් දරුවන්ගේ මානසිකත්වය සංශෝධනයට ලක් කිරීම අරමුණු කර ඇත. විශ්ව නිකේතන් සාම නිවහන් පර්ෂදය තුළත් ගම්මානවලදී කඳවුරු ආකාරයෙනුත් මෙම වැඩ සටහන් පැවැත්වේ.

පැසල් දරුවන් උදෙසා පාසැල් දිවියට ආධ්‍යාත්මික ප්‍රවේශයක්:

පාසල්වල ඉල්ලීම පරිදි පවත්වා ගෙන යනු ලබන මෙම වැඩ සටහන වයස 11-18 දරුවන් උදෙසා නිර්මාණය වී ඇත. අධ්‍යාපනයේ වැදගත්කම, ජීවිතයේ ඇති අගය සහ ජීවිත අරමුණ හා අභිලාෂයන් සාධනය කර ගැනීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙලක් දරුවන්ට හඳුන්වාදීම මෙම වැඩ සටහනේ අරමුණයි. ධාරණය, ස්මරණය, සිසු විනය යහපත් මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය උපාය මාර්ග මෙහිදී සාකච්ජා කෙරේ.

මව්පිය, ගුරුවරු සහ සිසු සම්බන්ධතා මනාව පවත්වා ගෙන යාමට අවශ්‍ය සිසුවිනය වර්ධනය කෙරේ. පුද්ගලාන්තර සම්බන්ධතා වර්ධනය පිළිබඳව සාකච්ජා කෙරේ. මෙම වැඩ සටහනට සමගාමීව දෙමව්පියන් උදෙසාත් ගුරු සේවයේ නියැලෙන වෘත්තිකයින් උදෙසාත් විශේෂ සම්මන්ත්‍රණ පැවැත්වේ. එමෙන්ම ශිෂ්‍ය නායකයින් උදෙසා නායකත්ව කුසලතා සංවර්ධන වැඩමුළු පාසල් තුළ පවත්වා ගෙන යනු ලබයි. මෙම සැම වැඩ සටහනකදීම චිත්ත ආධ්‍යාත්මික සුවය උදෙසා භාවනා සහ යෝගභාවනා අභ්‍යාස මගින් කායික මානසික නිරෝගී භාවය ළඟා කර ගන්නා අකාරය පිළිබඳව දැනුවත් කෙරේ.

තරුණ තරුණියන් උදෙසා ජීවිත අධ්‍යාපනය සහ ආධ්‍යාත්මික සම්පත් කළමනාකරණ වැඩසටහන:

පාසල් අධ්‍යාපනය නිමා කළ රැකියා විරහිත අවිවාහක තරුණ පිරිස් සඳහා මෙම වැඩ සටහන සංවිධානය කර ඇත.

යොවුන් වියේ ගැටලු, වෘත්තීය මාර්ගෝපදේශනය, නායකත්වය, ජීවිත කළමනාකරණය, කාල කළමනාකරණය සහ චිත්ත ආධ්‍යාත්මික සුවය උදෙසා භාවනා, යෝගා අභ්‍යාස ආදී මාතෘකා ඔස්සේ මෙම සංවාදශීලි වැඩ සටහන පැවැත්වේ.

වෘත්තිකයන් උදෙසා කළමනාකරණයට ආධ්‍යාත්මික ප්‍රවේශයක්:

රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සේවක සේවිකාවන් සඳහා මෙම වැඩ සටහන ආරම්භ කර ඇත. පෞද්ගලික ජීවිතය, පවුල් ජීවිතය, වෘත්තීය ජීවිතය, සමාජීය ජීවිතය, ආධ්‍යාත්මික ජීවිතය මනාව සංවිධානාත්මකව, සැලසුම් සහගතව හැසිර වීමට අවශ්‍ය උපදෙස් මඟ පෙන්වීම් ලබා දෙන වැඩ සටහනකි. මිනිස් ජීවිතයක අගය සහ වගකීමකින් සිය වෘත්තීය කටයුතු කිරිමෙන් ජීවිතයට උදා වන අනපේක්ෂිත ප්‍රතිලාභ පිළිබඳව සාකච්ඡා කෙරේ. ඉතාම සාර්ථක තීරණ ගැනීමේ ක්‍රියාවලියකට මග සලසන භාවනාක්‍රම යෝග අභ්‍යාස ආදිය ප්‍රායෝගිකව පැවැත්වේ.

භාවනා හා ධර්ම සාකච්ඡා:

වයස් භේදයකින් තොරව සෑම කෙනෙකුටම සහභාගිවීමට හැකි වන වැඩ සටහනක් වශයෙන් මෙම වැඩ සටහන හඳුන්වා දිය හැකිය. පස් දින, තුන් දින, එක් දින ආදී වශයෙන් පැවැත්වෙන භාවනා වැඩ සටහන්වලට සහභාගි විය හැකිය. විවිධ ධර්ම කථික ස්වාමීන් වහන්සේලා ගෙන්වා මාසිකව පැවැත්වෙන ධර්ම දේශනා වැඩ පිළිවෙල ආයතනය තුළ ක්‍රියාත්මක කෙරේ. දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදුවන ගැටළුවලට ආගමෙන් දහමෙන් ලැබෙන විසඳුම් පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරේ.

කුණු කූඩයට ගිය වනසුන්දර කොමිසන් වාර්තාව

රටක ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් එහි රජය විසින් ඉෂ්ට කරනු ලබන සියලු අන්දමේ ක්‍රියාකාරිත්වයන්ට පරිබාහිරව, එම රටෙහි ජන ජීවිතයේ ගුණාත්මක භාවය හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සමාජ සේවාවන්හි යෙදී සිටින පෞද්ගලික ආයතන හා විවිධ සංවිධාන රාජ්‍ය නොවන සංවිධාන ලෙස හැඳින්වේ වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල 'එන්ජීඕ' පුළුල් ලෙස ව්‍යාප්තව ඇත. සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය හා වෙනත් අත්‍යවශ්‍ය විවිධ ක්ෂෙත්‍ර යටතේ පුහුණු කිරීම් උපදෙස් ලබා දීම හා ආධාර සැපයීම් ඇතුළු විවිධ අන්දමේ වැඩ සටහන් ව්‍යාපෘති එම ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. අවශ්‍ය සම්පත් සොයා ගනු ලබන්නේ දියුණු රටවල සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර ලබා දෙන විවිධ ආයතන මගිනි.

මහජනයාට සෙත සැලසීමේ අරමුණුවලට අමතරව ආත්මාර්ථකාමී පරමාර්ථ අනුව දේශපාලන බලපුළුවන්කාරයන් විසින් සාදා ගත් සහ විදේශකයින් විසින් ආරම්භ කර පවත්වා ගෙන යන වෙනස් මාදිලියේ 'එන්ජීඕ' සංවිධාන ද දක්නට ඇත. දේශපාලනය හා කෙලින්ම සම්බන්ධ වූ රාජ්‍ය නොවන සංවිධාන විසින් මුල් තැන දී ඇත්තේ දේශපාලන පක්ෂපාතිත්වයටය. ඒවායින් රටේ ජනතාවට මෙහෙවරක් ඉෂ්ට වනු පෙනෙන්නට නැත. ඒවා ඔවුනොවුන්ගේම ආදායම් මාර්ග බවට පත් වී ඇති බැවිනි. සර්වෝදය ව්‍යාපාරය ද රජය විසින් වර්ග කර තිබෙන්නේ 'එන්ජීඕ' ගණයටය.

ශ්‍රී ලංකාවේ යටත් විජිත සමයේදී ජාතික නිදහස පිණිස සටන් කිරීමට එවකට සිටි, නායකයෝ විවිධ ජාතික සංවිධාන

පිහිටුවා ගත්හ. අමද්‍යප ව්‍යාපාරය, මහාබෝධි සමාගම, පරම විඥානාර්ථ බෞද්ධ සංගමය, බෞද්ධ මහා සම්මේලනය, තරුණ බෞද්ධ සමිති ව්‍යාපාරය ආදිය ඉන් සමහරකි. මේවා අනුවය 1950 ගණන්වලදී ලත් ජනතා ජයග්‍රහණය ඉදිරියට ගෙන යෑම සඳහා අපේම සාරධර්ම පදනම් වූ ජනතා සංසදයක් හැටියට 'සර්වෝදය

කොමිසමේ සභාපති
විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
ආර්. එස්. වනසුන්දර මහතා



Members of the Presidential Commission of Inquiry on Non-Governmental Organisations in Sri Lanka

The following are other Members of the Presidential Commission of Inquiry on Non-Governmental Organisations in Sri Lanka, appointed by President Premadasa.

Mr. M. N. Junaid

Mr. Wimaladharma Ekanayake

Mrs. Priyani Soysa

Mr. J. F. A. Soza

Dr. K. Velauthapillai

Mr. E. Eramudugolla

Mr. Irwin Weerackody

එන්ජීඕ කොමිසමේ කමිටු සාමාජිකයින්

ශ්‍රමදාන සංසදය' බිහි වූයේ. මේ කාලය වන විට රාජ්‍ය නොවන සංවිධාන යන වචනය භාවිතයේ තිබුණේ නැත. එහෙත් 'එන්.ජී.ඕ.' ගණයට සර්වෝදය ද ඇතුළු කිරීමෙන් රජය සර්වෝදයට එරෙහිකම් කිරීමට පටන් ගත්තේය.

එදා සර්වෝදය පිළිබඳ සාමාන්‍යයෙන් හඳුන්වතොත් රජය මගින් අනුමත කෙරුණු එක්සත් ජාතීන්ගේ මණ්ඩලය හා එහි ඒකාබද්ධ ආයතනයන් ඇතුළුව විදේශීය වශයෙන් උසස් පිළිගැනීමක් ඇති ජාත්‍යන්තර සංවිධානයක් විය. රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස හැඳින්වුවද සර්වෝදයට වඩාත් උචිත අර්ථ දැක්වීම වන්නේ එය 'ජනතා සහභාගිත්වක ස්වසංවර්ධන. ආයතනයක් බවය'.

ජනතාවගේ විනිශ්චය එය ම ය. පුද්ගලයා ද ඒ තුළින් සමස්ත විශ්ව ප්‍රජාව ද අවදි කිරීමට අරමුණු වූ ව්‍යාපාරයකි සර්වෝදය.

1972 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනත් අංක 16 යටතේ ස්වාධීනව ක්‍රියාත්මක වන නීත්‍යානුකූල සංවිධානයක් ලෙස සර්වෝදය නීතිගත වී ඇත. එහි ක්‍රියාත්මක ජවය ජනතාව ම ය.

රටේ අසරණ දුගී ජනතාව බේරා ගැනීමට අප කොතෙකුත් මහන්සි වී වැඩ කළ ද එවකට බලයට පත්වූ ශ්‍රී ලංකා රජය විසින් අප ව්‍යාපාරයේ සේවාවන් දෙස බැලීමට නැඹුරු වූයේ එහි සත්‍ය ස්වභාවයට ප්‍රතිවිරුද්ධ දෘෂ්ටි කෝණයකිනි.

මා මෙන්ම අප ව්‍යාපාරයේ සේවකයන් ද තම ජීවිතවල වටිනාම කොටස කැප කර තිබුණේ ජනතාවගේ අභිවෘද්ධිය පිණිස වැඩ කිරීමට බව නොරහසකි. දේශපාලන වේදිකාව මත සිදු වූ විවිධ මහජන සේවාවන්ට වඩා අපේ සේවාවන් හාත්පසින්ම වෙනස් විය. හුදෙක්ම අසරණ දුප්පත් ජනතාව වෙනුවෙන් ප්‍රදානය වූ

එහි සේවාවල තැවරී තිබුණේ ආත්මාර්ථය මුදුන් පත් වී ඇති දේශපාලනික බලකාමී චේතනාවන් නොව අපේම සේවකයින්ගේ දහඩිය මහන්සිය සහ සානුකම්පික දයාවෙන් පිරි පරාර්ථකාමී හැඟීම්ය.

ජනාධිපති පදවියට අලුතෙන් පත්වූ ආර්. ප්‍රේමදාස මහතාගේ රජය 1990 දෙසැම්බර් 17 වැනි දින විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කළේය. ශ්‍රී ලංකාවේ සියලුම එන්.ජී.ඕ. සමීක්ෂණය කිරීම සඳහා .ජනාධිපති කොමිසම හෙවත් එන්.ජී.ඕ. කොමිසම යනුවෙන් නම් කරනු ලැබූ සුවිශේෂ පුද්ගලයින් හය දෙනෙකුගෙන් යුත් කමිටුවක් නව ජනාධිපති විසින් තෝරා පත් කර තිබුණි. ඒ වන විට ප්‍රේමදාස මහතා නව ජනාධිපති ධූරයට පත් වී හරියටම සතියක් ඉක්ම ගියා පමණි. විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ආර්.එස්. වනසුන්දර, විමලධර්ම ඒකනායක, වෛද්‍ය ප්‍රියානි ද සොයිසා, විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජේ.එෆ්.ඒ. ද සෝසා ඊ. එරමුදුගොල්ල, කේ. වේලායුදපිල්ලේ, අර්වින් වීරක්කොඩි යන මහත්ම මහත්මීහු කමිටුව නියෝජනය කළහ. වනසුන්දර මහතා එහි සභාපති නිසා වනසුන්දර කොමිසම යනුවෙන් එය හැඳින්වුනි. විමලධර්ම ඒකනායක මහතා ලේකම් හැටියට කටයුතු කළේය.

ශ්‍රී ලංකාවේ අනෙකුත් එන්.ජී.ඕ. පිළිබඳව කෙසේ වෙතත් කොමිසම පත් කරන ලද්දේ අප ව්‍යාපාරයේ අඩුලුහුඩුකම් සොයා චෝදනා ඉදිරිපත් කිරීමෙන් මා සිරබාරයට ගෙන සියලු සේවාවන් නවතා අප මර්දනය කිරීමට බව තතු දන්නෝ හොඳීන් ප්‍රත්‍යක්ෂ කර ගත්හ. වැඩි කල් නොගොස් ව්‍යාපාරයේ නායකයා වශයෙන් මට ද මගේ පවුලේ සාමාජිකයින්ට ද නොයෙක් හිංසා පීඩා මරණීය තර්ජන හා නොපනත්කම් කෙළවරක් නොමැතිව එල්ල වූයේ අප සාමාන්‍ය අපරාධකරුවන් ලෙස සලකමිනි. 1989 දී පැවැත්වූ ජනාධිපතිවරණය අවසන් වීමත් සමඟම සර්වෝදය කෙරෙහි රජයේ තියුණු අවධානය යම් කැපී පෙනෙන ආකාරයට යොමු වී තිබීම ඉදිරි මහා කරදරයක පෙර ලකුණු විය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් මගින් මාස 18 ක් තිස්සේ කල් තියාම පරීක්ෂණ පවත්වමින් තිබුණ අතර කොමිසම විසින් දිගු ප්‍රශ්නාවලි නවයක් පිළිතුරු හා අදාළ සාක්ෂි සැපයීම පිණිස සර්වෝදය වෙත එවනු ලැබීය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රේගු අයබදු අංශය ආදායම් බදු දෙපාර්තමේන්තුව, කම්කරු අමාත්‍යාංශය, අල්ලස් කොමසාරිස් ඇතුළු රාජ්‍ය අංශයේ විවිධ ආයතන මගින් සර්වෝදය පිළිබඳ පර්යේෂණ පැවැත්වීමට පටන් ගත්තේ අප මානසිකව හා කායික පීඩාවට පත් කිරීමට පමණක් නොව එතෙක් අප ව්‍යාපාරය විසින් ඉතා දුක් මහන්සියෙන් අත්පත් කර ගෙන තිබූ යහපත් ප්‍රතිඵල ද ශූන්‍යත්වයට පත් කිරීමේ පරමාර්ථයෙනි .

කොමිසමේ ප්‍රශ්නාවලියට පිළිතුරු වශයෙන් පිටු දහ දාහකට වැඩි ලිපිලේඛන සංඛ්‍යාවක් සර්වෝදය ශ්‍රමදාන සංගමයෙන් අපි ලබා දුන්නෙමු. සැඟවීමට කිසිවක් අපේ පිළිතුරුවල තිබුණේ නැත.

ගෙදර තිබූ කෝට්ට මෙට්ට ගැනත් ලැයිස්තු දෙන්න අපට සිදු වුණා

ඒ කරදර දැන් ඉවරයි:
සර්වෝදය නායක ජනපතිට තුති පුදයි

1992 සැප්තැම්බර් 29 වැනි දින අපේ නියෝජිතයෝ කොමිසම ඉදිරියට ගොස් සාක්ෂි දුන්හ. ඔව්හු කොමිසමේ නිලධාරීන් සමඟ විනයානුකූල සුහදතාවයෙන් කටයුතු කළහ. සර්වෝදය තුළ ගැබ්ව තිබෙන විශ්වාසනීයත්වය හා විවෘතභාවය යන කැපී පෙනෙන ගුණාංග කොමිසමේ නියෝජිතයින්ට එහිදී මනාව වැටහෙන්නට ඇත. සර්වෝදයට විරුද්ධව ගොනු කළ යුතු චෝදනා ඇතොත් ඒ මොනවාද යන්නවත් හරිහැටි නිශ්චය කර ගැනීමට අසමත් වූ කොමිසමේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු අපේ හැම ලියවිල්ලකටම එබිකම් කළහ. ඇඟිලි ගැසූහ. දිවා රෑ නොබලා ඡායා පිටපත් ලබා ගනිමින් අවශ්‍ය ලියකියවිලි සපයනු ලැබූ අතර උපරිම හැකියාවෙන් සුදුසු ලිඛිත සාක්ෂි ද අපි ඉදිරිපත් කළෙමු. පුද්ගලයින් 112 දෙනෙකුගෙන් ප්‍රකාශන ලබා දුනිමු. 1970 - 1980 කාලවල ගනුදෙනු, ලිපිලේඛන ද මගේත්, අප පවුලේ සියල්ලන්ගේත් බැංකු ගිණුම් අනේවාසික විදේශීය ගිණුම් ආදී සියලු තොරතුරුත් ඉල්ලා තිබුණේ කුමක් හෝ වරදක් සොයා ගැනීමටය.

වනසුන්දර ප්‍රශ්නාවලියත් සමඟ අපට එවන ලද ලිපියේ අන්තර්ගතව තිබූ පරමාර්ථයන් කොමිසමේ මෙවැනි ක්‍රියාකාරිත්වයන්ට හාත්පසින්ම වෙනස් විය. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ නියමය පරිදි ශ්‍රී ලංකාවේ එන්.ජී.ඕ. සංවිධානවල ක්‍රියාකාරිත්වයන් හා අනෙකුත් විස්තර සොයා බලා රජයත් එම ආයතනත් අතර සමීප සබඳතාවයක් ඇති කර ගැනීමටත්, එන්.ජී.ඕ. සංවිධානවල දක්නට ඇති අනුචිත ක්‍රියා කලාපයන් නීති කඩ කිරීම් ආධාර මුදල් භාවිතය ආදිය විමර්ශනය කර ක්‍රමවත් කිරීමට මෙම පරීක්ෂණය පවත්වන බවත් එහි සඳහන් වී තිබුණ කාරණාය. සති තුනක් වැනි කෙටි කාලයකින් සියලු පිළිතුරු අවශ්‍ය වී තිබුණු බැවින් අපට බොහෝ වෙහෙස මහන්සි වීමට සිදුවුණි. සියලු මනුෂ්‍යයින්ගේ යහපත ප්‍රාර්ථනය කරන සර්වෝදය ව්‍යාපාරය වෙනුවෙන් සත්‍යය අනුගමනය කරන අපි කිසිවකට බිය නොවීමු. අප ව්‍යාපාරයේ යම් වැරදි හෝ වංචා සහගත දූෂණ ක්‍රියාකලාපයන් මොනවා හෝ කොමිසම මගින් ඉදිරිපත් කරන්නේ නම් ඒවා පිළිගැනීමට ද සූදානම් වූ අපි එඩිතර වීමු.

ජනාධිපතිතුමාගේ විශේෂ කොමිසමෙහි ක්‍රියා කලාපය මෙසේ වූ අතර රජයේ පාලනය යටතේ පවත්වා ගෙන යන ලේක්හවුස් ආයතනය ද මුළු වීර්යයම යොදා ඉතා නිර්දය අන්දමින් මටත් අපේ ව්‍යාපාරයටත් පහර දීමට ඉදිරිපත් වී සිටීම මෙහිදී සඳහන් කළ යුතු කරුණක් වේ.

මේ හැම දෙයක්ම සිදුවූයේ ආර්ථිකය පමණක් නොව සියලුම අංශවලින් අපේ රට මහත් අර්බුදයකට මුහුණ දී අගාධයක ගිලෙමින් තිබුණ අවදියකය. කිසිම සෙවිල්ලක් බැලිල්ලක් නොමැතිව අසන - කියවන දෑ ඒ ලෙසටම පිළිගැනීමට මිනිසා විසින් දක්වන සහජ නැඹුරුතාවය නිසා මෙවැනි ඒක පාක්ෂික පුවත්පත්වලින් සිදුවන්නේ අච්චු ගසා ඇති කුමක් හෝ සාවද්‍ය පුවත් සත්‍යයක් බවට පරිවර්තනය කිරීමය. මෙවැනි තත්ත්වයක් හැම පුවත්පතකම දක්නට නොතිබුණි. සාධාරණ පුවත්පත් ද ඒ කාලයේ තිබුණි. ලේක්හවුස් පිළිවෙත් ඔවුන් විසින් සෘජුවම හෙළා දකින ලදී.

පුවත්පත් විසින් වගකීමක් නොමැතිව බලය භාවිතා කිරීම තමන්ට ඕනෑ විදියට තම වරප්‍රසාදයන් භාවිතා කරන වෙසඟනන් මෙන් හැම විටම දක්නට තිබෙන දෙයක් බව එකල බ්‍රිතාන්‍ය අගමැති ස්ටැන්ලි බෝල්ඩ් ප්‍රකාශ කර තිබුණි. පුවත්පත් පමණක් නොව රජයේ අනෙකුත් මාධ්‍ය මගින් ද අපට තර්ජන, නින්දා, අපහාස සිදු කළ අතර ඊට පසුගිය අවුරුදුවලත් පාලක රජයේ නිලධාරීහු මටත් සර්වෝදයටත් බොහෝ කරදර පැමිණවූහ. ජනාධිපතිතුමා පත් වූ දා සිට අපෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය භාර දී තිබුණු බුද්ධිමය අංශය දිගටම එය කර ගෙන ගියේය. 1990 දී අල්ලස් දූෂණ කොමසාරිස්ගේ ප්‍රශ්නාවලියකට මට උත්තර දීමට සිදුවිය. වර්ෂ ගණනාවක් තිස්සේ අප විසින් මෙහෙයවනු ලැබූ ''සර්වෝදයයි ඔබයි'' ගුවන්විදුලි වැඩ සටහන හදිසියේ නවත්වන ලදී. අගමැති හා රජයේ සමහර මැති ඇමතිවරුන්ගේ මැදිහත් වීමෙන් ගුවන් විදුලියෙන් ප්‍රචාරය කළ සර්වෝදය පිළිබඳ වැදගත් තොරතුරු අඩංගු වෙනත් වැඩ සටහන් ද නවත්වා දමන ලදී.

ඒ කාලයේ අපගේ ව්‍යාපාරය දීප ව්‍යාප්තව බැබලෙමින් ඉදිරියට යමින් තිබූ අතර ලංකා ඉතිහාසයේ එතෙක් දක්නට නොතිබූ අන්දමින් වර්ධනය වූ ජනතා ව්‍යාපාරයක් බවට පත්ව තිබුණි. විදේශ මාධ්‍ය හරහා අප ව්‍යාපාරයට උසස් පිළිගැනීමක් ලැබුණ ද අපේ රටේ සමහර මාධ්‍යය විසින් ඒ වෙනුවට කළේ නිග්‍රහ කිරීමය. අපේ යහපත් කාර්යයන් එකකුදු හඳුනා ගැනීමට ඔවුනට හැකියාවක් තිබුණේ නැත. 1990 වසරේදී මා විසින් දිනාගත් ''ඕගස්ට් ෆෝරල් සහ ජම්නලාල් බජාජ් ජාත්‍යන්තර සම්මාන'' පිළිබඳව එකම තොරතුරක්වත් ජනතාව අතර ප්‍රචලිත කිරීමෙන් රජයේ මාධ්‍ය වැළකී සිටියහ.

සඳහන් කිරීමට නොහැකි තරමේ සී.අයි.ඩී. පරීක්ෂණ ගණනාවකට අපි මුහුණ දුන්නෙමු. සිළුමිණ, දිනමිණ, සන්ඩේ ඔබ්සවර් ආදී සියලුම ලේක්හවුස් පුවත්පත් මගින්, මා හා සර්වෝදය වෙත අසත්‍ය චෝදනා අපහාස එල්ල කිරීම දිගටම සිදුවිය. අපට සිදුවූ අසාධාරණකම් නිසාම ව්‍යාපාරයේ නායකයා වශයෙන් මම රජයට ප්‍රකාශයක් යැවීමි. මා විසින් එවැන්නක් සිදු කරනු ලැබුවේ රටේ බලවත්, රජයේ දේශපාලඥයෙකුගේ පූර්ණ මෙහෙයවීම මත අපට එරෙහිව දියත් වෙමින් තිබූ ක්‍රමවත් ක්‍රියාවලියකට ප්‍රතිචාරයක් ලෙසටය.

''ජනතාවට සේවය කිරීමට මෙලෙස බාධා පමුණුවන විට එහි ප්‍රතිඵලවලින් පීඩාවට පත් වන්නේ එම සේවය බලාපොරොත්තුවෙන් සිටින අසරණ ජනතාව ම ය. මම මගේ රටට උපරිමයෙන් සේවය කර ඇති අතර මට ලැබුණ ජාත්‍යන්තර ත්‍යාග මුදල් පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන නොමැත. මැග්සයිසයි ත්‍යාග මුදල් සර්වෝදයට පරිත්‍යාග කළ අතර ජම්නලාල් බජාජ් ත්‍යාග මුදල් රට ජාතිය වෙනුවෙන් සේවය කළ අය සඳහා වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය වෙනුවෙන් තැන්පත් කර ඇත. 1984 පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා 31 යටතේදී මිස එම මුදල් කිසිවෙකුට ණයට දී නොමැත. සර්වෝදය සම්බන්ධව 1972 ව්‍යවස්ථාවේ අංක 16 යටතේදී එවැනි ණයට දීමේ කාර්යයන් සම්පූර්ණයෙන්ම

තහනම්ය. අපට විරුද්ධව සිදු කෙරෙන පුවත්පත් මඩ ගැසීම් කෙසේ වුවද මෙම ජනාධිපති එන්.ජී.ඕ. කොමිසම අප විසින් පිළිගනු හා සලකනු ලැබුවේ යම් සාධාරණ වූ නීතියක් අනුව ක්‍රියා කරනු ලබන යුක්තිගරුක කණ්ඩායමක් ලෙසටය. නමුත් සමහර පුද්ගලයින් අවස්ථාවාදී ලෙස කොමිසමේ වැඩ කටයුතු ප්‍රයෝජනයට ගෙන රජයට සමාන්තරව අපට නිග්‍රහ කිරීමට පෙළඹී සිටියහ.

ගාන්ධි සංකල්පය අනුගමනය කරමින් නින්දා අපහාස තර්ජනයන්ට එක සේ මුහුණ දෙමින් සිටි. මම දශක හතරකට ආසන්න කාලයක් තිස්සේ දේශපාලනයෙන් තොර සමාජ සේවයේ යෙදී සිටියෙමි. කිසිවෙකුට දෝෂාරෝපණය කිරීමට මා සූදානම් නැත. මා ජීවත් වූයේ යම් පරමාර්ථයක් උදෙසාය. මට නැති වන්නට රැකියාවක් නැත. නමුත් සදාචාරාත්මක නීතියට අනුව මගේ ජනතාවට සේවය කිරීමේ අයිතිවාසිකම නැතිවුවහොත් මට හැම දෙයම නැති වනු ඇත'' මා විසින් රජයට යවනු ලැබූ ප්‍රකාශයේ එසේ සඳහන් කළෙමි.

එන්.ජී.ඕ. කොමිසමෙහි අරමුණු කුමන ආකාරයෙන් ඉදිරිපත් කර තිබුණද සර්වෝදය හා කොමිසම අතර යම් සුහදතාවයක් ඇති වීම වළක්වා ගැනීම පිණිස එනම්, අපට අපහාස කිරීමට ඉඩ ප්‍රස්ථාව පාදා ගැනීමට මුල සිටම එය අපෙන් ඈත්ව සිටි බවක් පැහැදිලිවම පෙනුණි. මෙම අසාධාරණ තත්ත්වයන් සමඟ අනාගතය වෙත මුහුණ දීමට සෑම පුද්ගලයෙකුටම එන්.ජී.ඕ. ප්‍රජාතන්ත්‍රවාදී රටවල් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතන සියල්ලම ද එක්සත් විය යුතු බව මගේ අදහසයි. රජය විසින් කරනු ලබන මෙවැනි පහත් අමානුෂික ක්‍රියාවන් තවත් දිගටම ගෙන යන්නේ නම්, සිදුවන්නේ ලක්ෂ සංඛ්‍යාත අසරණ ජනතාවකගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා කරනු ලබන සේවාවන් ඔවුනට නොලැබී යාම බව අවසාන ලෙස එම ප්‍රකාශනයේ මම සඳහන් කළෙමි.

නීතිඥ නිරංජන් සින්නතම්බි මහතාගේ ප්‍රධානත්වයෙන් අපේ නීතිඥවරු කොමිසම ඉදිරියේ පෙනී සිටියහ. සර්වෝදයට

විරුද්ධව තිබෙන චෝදනා අපට දැන්වීමෙන් පසු ඒවාට සාක්ෂි ඉදිරිපත් කරන තුරු මා සාක්ෂි දීමට කොමිසම ඉදිරියට නොකැඳවන මෙන් සින්නතම්බි මහතා විසින් කොමිසම වෙත කරන ලද ඉල්ලීම නිශ්ප්‍රභා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නොවැම්බර් මස 17 වැනි දින මා ඇතුළු අප ව්‍යාපාරයේ නිලධාරීන් කිහිපදෙනෙකු සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබීය. සින්නතම්බි මහතා එයට විරෝධය පළ කළේය.

අප විසින් සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු කොමිසම විසින් එහි තීන්දුව 1993 පෙබරවාරි 12 වැනි දින නිකුත් කරන ලදී. එය පිටු 67 කින් යුත් දිගු ලියවිල්ලකි. නියම තීන්දුවත් එන්.ජී.ඕ. විමර්ශනය කිරීමේ කොමිසම පත් කිරීමට තුඩුදුන් හේතුත් සර්වෝදය ව්‍යාපාරය වෙත එල්ල කරනු ලැබූ මූලික විරෝධතා පිළිබඳ නීතිමය විග්‍රහයත් හා එහි අඩුපාඩුකම් පිළිබඳ උපග්‍රන්ථයක් ද එම තීන්දුවෙහි අන්තර්ගත විය. අපට ඇති චෝදනා කලින් දන්වන ලෙස කළ ඉල්ලීමට උත්තර දී තිබුණේ කොමිසම විසින්ම සකස් කරනු ලැබූ ක්‍රියා මාර්ගයට අනුවම මිස, සාමාන්‍ය නීතිය යටතේ එය කළ නොහැකි බවය.

සර්වෝදය ව්‍යාපාරය පිළිබඳ විමර්ශනය, කළමනාකාරිත්වය මුදල් ගනුදෙනු ක්‍රියාකාරකම් හා සම්බන්ධ කරුණු ද, කරන ලද වැරදි හා දූෂණ ද ඇත්දැයි යන්න විමර්ශනය කර බැලීමට කොමිසම සැලසුම් කර තිබුණු අතර, බලාපොරොත්තුව වූයේ ඒවා සොයා ගෙන, මහජනතාව ඉදිරියේ සර්වෝදයට විරුද්ධව ප්‍රසිද්ධියේ වැඩ කටයුතු කිරීමටය. තවත් පැත්තකින් කියතොත් තීන්දුවෙහි සමහර තැන්වල දකින්නට තිබුණේ, උපහාසාත්මක භාෂාවය. කොමිසම ඉදිරියේ සාකච්ඡා කරන ලද සත්‍ය කරුණු තර්ක හා රීතිය පමණක් මෙවැනි තීන්දුවක අඩංගු වියයුතු වුවත්, එහි විශේෂ ලක්ෂණය වූයේ එය සර්වෝදයේ ඇතැයි කියන අඩුපාඩුකම් 49 ක ඇමුණුමක් වීමය. ලේක්හවුස් පුවත්පත්වල එය සම්පූර්ණ ලෙස පළ කරනු ලැබුවේ අපේ වැරදි රටේ ප්‍රසිද්ධ කිරීමටය. එම වැරදි සියල්ල ලබා ගෙන තිබුණේ අප විසින්ම කොමිසමට බාර දුන් අභ්‍යන්තර විගණන වාර්තාවලිනි.

කොමිසමේදී සාකච්ඡාවට භාජනය නොවූ නමුත්, තවදුරටත් පරීක්ෂාවට ලක් කළ යුතු අංශ හැටියට සර්වෝදය ජාත්‍යන්තරය, විශ්වලේඛා ආයතනය හා පුනරුත්ථාපන වැඩ සටහන්, ස්ථාවර වත්කම් සහ සංවිධානයේ ව්‍යාපෘති ද තීන්දුවේ සඳහන් කර තිබීම සර්වෝදයේ පුදුමයට හේතු වූවකි. තවද කොමිසමේ තීන්දුවෙහි අඩංගු කරුණුවලට සාක්ෂි දීමට සුදුසු වූයේ මා නොව, ව්‍යාපාරයේ එදිනෙදා ක්‍රියාත්මක වූ පරිපාලනයටය. විවිධ අංශ හා ගිණුම් කටයුතු බාර අදාළ නිලධාරීන් විසින් ඒවා තේරුම් කර දිය යුතුව තිබුණි. තීන්දුවෙහි විශාල වැදගත්කමක් ලබා දී තිබුණේ අපේ අවාසියටම මිඩංගු කළ කරුණු මිස, කොමිසමේදී ඒත්තු ගැන්වූ සර්වෝදයට හිතකර කරුණු කිසිවක් එහි දක්නට තිබුණේ නැත. මූලික පරීක්ෂණ රහසේ පැවැත්වීමට සින්නතම්බි මහතා විසින් කරන ලද ඉල්ලීමට ද ඉඩ ප්‍රස්ථාව ලැබී තිබුණේ නැත.

මහජන පරීක්ෂණයක් ඉදිරියට සර්වෝදය කැඳවීමේ ක්‍රියා කලාපය ස්වාභාවික යුක්ති මූලධර්මය අනුගමනය කර නැති බවත් තමාට විරුද්ධව තිබෙන නඩුව පිළිබඳව තමාට දැනුම්දීමෙන් පසුව අදාල ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව කොමිසමක් මගින් නිගමනයන්ට එළඹිය යුතු බවටත් ප්‍රකාශ කළ අපගේ නීතිඥ සින්නතම්බි මහතා 'ජයරත්න නඩුතීන්දුවෙහි ප්‍රනාන්දුට එරෙහිව' ශර්වානන්ද විනිසුරුතුමා විසින් ඉදිරිපත් කරන ලද මතය ඊට උදාහරණයක් ලෙස උපුටා දැක්වීය.

වේඩ් ගේ 'Wade' පරිපාලන නීතිය පිළිබඳ ග්‍රන්ථයෙහි අඩංගු විමර්ශනාත්මක අර්ථ දැක්වීමක් ප්‍රකාශ කළ සින්නතම්බි මහතා, ''මෙවැනි පුළුල් පරීක්ෂණ ප්‍රසිද්ධියක් දෙමින් පැවැත්වෙන විට, එමගින් ඉතා හානිදායක චෝදනාවන් පුද්ගලයාට විරුද්ධව ඉදිරිපත් විය හැකි අතර, එවිට ඔවුනට නිසි පිළිතුරු සකස් කර ගැනීමට ලැබෙන්නේ අවම ඉඩ ප්‍රස්ථාවකි'' යන පාඨය දක්වමින් තවදුරටත් තම දේශනයේදී කරුණු කීවේය.

''කොමිසමේ ක්‍රියා කලාපයට විරුද්ධ පැත්තෙන් කරුණු සලකන විට, එන්. ජී. ඕ. ජනාධිපති කොමිසම පත් කර ඇත්තේ

එක්තරා වාර්තාවක් පදනම් කර ගෙනය. එම වාර්තාව පිළිබඳව කිසිවෙකු නොදන්නා අතර, ආණ්ඩුව විසින් එන්. ජී. ඕ. පිළිබඳව කරන ලද එකම අධ්‍යයනය සිදුකර තිබුණේ, ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අනුග්‍රහයෙනි. එය සර්වෝදය පිළිබඳව ඉතා හොඳ වාර්තාවකි සින්නතම්බි මහතා ප්‍රකාශ කළේය.

කොමිසමේ කටයුතුවලට අමතරව, අපට සිදුවූ අකටයුතුකම් කෙළවරක් නොමැත. එම කාලය තුළ මා හා සර්වෝදය විවේචනයට ලක් කරමින් පුවත්පත් ප්‍රවෘත්ති 109 ක් පළකර තිබුණි. ඒ කිසිවක් කොමිසම මගින් පරීක්ෂා කළේ නැත. ස්වේච්ඡා නීතිඥයින් උපදේශන සේවාවේ නියුතු වූවන්, පොලිස් හා රජයේ නිලධාරීන් එක් වී දුප්පත් ජනතාවට නීති සහන සේවය නොමිලේ ලබා දීමට කටයුතු කළ 'සර්වෝදය නීති සහන අංශයට' අනුග්‍රහය දැක්වූ ආසියානු පදනම මගින් සපයමින් තිබූ ආධාර සියල්ල සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මගින් නවත්වනු ලැබීය. එම පදනම මගින්ම ආධාර ලැබූ අපේ අනෙක් වැඩ සටහන වන 'පාරිසරික සමාජ වන ව්‍යාපෘතිය' සඳහා මෙහි වැඩ කිරීමට පැමිණි බ්‍රිතාන්‍ය ස්වේච්ඡා නිලධාරියාට, ඒ සඳහා ජනාධිපති කාර්යාලයෙන්ම ඉඩ දුන්නේ නැත. ඉන් පාඩුව සිදු වූයේ අන්ත අසරණ දුප්පතාටය. කොමිසම යටතේ පරීක්ෂාවට ලක් වූ අනෙක් එන්. ජී. ඕ. සංවිධානවලට කිසිම බාධාවක් නොමැතිව තම වැඩ කර ගෙන යාමට එම අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා දී තිබීමෙන්, පැහැදිලිව පෙනී ගියේ සර්වෝදය පමණක් මර්දනය කිරීම රජයේ පරමාර්ථය වූ බවය.

හම්බන්තොට අප විසින් අවුරුදු 10 ක් තිස්සේ ආබාධිත තරුණයන් සඳහා පුහුණු වැඩ සටහන් පවත්වා ගෙන ආ නිවාසය, හිටිහැටියේ දින අටක දැනුම් දීමකින් ආපසු අත් කර ගැනීමට වැඩ කටයුතු සලස්වා තිබුණි.

වාණිජ සමාගම් (කොම්පැණි) පනත යටතේ ග්‍රාමීය වැඩ සටහන්වලට සම්බන්ධ දුගී ළමුන් සඳහා ඉතිරි කිරීම් ගිණුම් ක්‍රමයක් ආරම්භ කර තිබුණි. ලංකාවේ ඉතා දුප්පත් ගැමි ප්‍රජාව තුළ ආරම්භ

කර, අවුරුදු 15 ක් තිස්සේ බොහෝ මහන්සි වී ගොඩනඟා ගත් එම ගිණුම් ක්‍රමයට ළමුන් දෙලක්ෂයකගේ පමණ රුපියල් 50/= තැන්පතු ඇතුළත් වී තිබුණි. එම අසරණ දරුවන්ගේ අභිවෘද්ධියට අදාළ වන මෙම සේවාවට ඉතා නිර්දය ලෙස පහර දුන් රජය, එයට විරුද්ධ ඉතා ඉක්මණින් නිසි පියවර ගන්නා බව ප්‍රකාශ කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අපට ලිඛිතව දැනුම් දීමක් කර තිබුණි. ආණ්ඩුව මගින් සිදු කළේ එවැනි දුගී ජනතාවට සර්වෝදය විසින් සැලසූ සේවාවන් හිටි තැනම කඩාකප්පල් කිරීමය.

දිනක් මධ්‍යම රාත්‍රියේ නොහඳුනන පුද්ගලයෙකු විසින් කරනු ලැබූ අටවන මරණ තර්ජනයෙන් පසු, මම දෙවන වරටත් ප්‍රකාශයක් රජය වෙත ඉදිරිපත් කළෙමි. අප පවුලේ සියලුදෙනාම ඉතා චකිතයෙන් යුතුව එවැනි අත්දැකීම්වලට දිගටම මුහුණ දෙමින් සිටියෙමු. අප සර්වෝදයේ ළමයින් විකුණන බව හා පිටරටවලටත් ළමුන් විකුණනවාය යන අසත්‍ය චෝදනා කරමින් අපගේ චරිත ඝාතනයේ යෙදුන ලේක්හවුස් පුවත්පත් පිළිබඳවත් මම එහි සඳහන් කළෙමි. සර්වෝදය ඉතිහාසයේ කිසි දිනෙක අප විසින් ළමයින් විකුණා නැත. ලක්ෂ සංඛ්‍යාත ලෙස ග්‍රාමීය ජනතාව සර්වෝදය හොඳින් හඳුනා ගෙන සිටින බැවින්, දේශපාලනමය බොරු ප්‍රචාරයන්ට ඔවුන්, රැවටීම කළ නොහැකිය. දශක කිහිපයක සිටම අප වෙතම හැරී සිටින ඔවුන් අපට හැමදාම ශක්තියකි.

නීතිය හා සාධාරණත්වය අතර වර්ධනය වන පරතරය තුළින් අප තුළ පැවති සත්‍ය, ධාර්මික නීතිය කෙරේ ඇති විශ්වාසය වැඩි දියුණු කළේය. ධාර්මික මිනිසා ධර්මයෙන්ම ආරක්ෂා කරන බැව් අපි තදින් විශ්වාස කළෙමු.

1991 දී ජපානයේ නිවානෝ සාම පදනම මගින් 'නිවානෝ සාම ත්‍යාගය' සඳහා මා තේරී පත් වී තිබෙන බව හෙළිදරව් වූ විගසම, එකල ජපානයේ ශ්‍රී ලංකා තානාපතිව සිටි සී. මහේන්ද්‍රන් මහතා ඊට විරුද්ධව නිවානෝ සාම පදනමට පෙත්සමක් යැවීය. ශ්‍රී ලංකාවේ ආචාර්ය ඒ. ටී. ආරියරත්න දේශපාලනයට පිවිසීමට තැත්

කරන බවත්, ජනාධිපති කොමිසමක් මගින් පරීක්ෂණයට භාජනය වී, සර්වෝදය විශාල ප්‍රශ්නයකට මුහුණ දී ඇති බැවින්, නිවානෝ සාම ත්‍යාගය සඳහා ඔහු සුදුසු නැතැයි ඉන් කියැවිණ.

1992 මැයි මාසයේ මමත්, නීතාත් සාම ත්‍යාගය ලබා ගැනීමට ජපානයට ගියෙමු. ජූනි මාසයේදී ආගමන විගමන පාලක විසින් අත්සන් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවෙන් එවන ලද ප්‍රශ්නාවලියක් මට ලැබුණි. ජපානයෙන් මට ලැබුණු ත්‍යාග මුදල් ලංකාවට ගෙනාවේද? එසේ නම් ඒවා හෙළිදරව් කිරීමටත්, නැතිනම් විදේශයක ඒවා තැන්පත් කර ඇත්තේ නම් ඒ කිනම් ස්ථානයක ද යන්න එහි කෙලින්ම ප්‍රශ්න කර තිබුණි. ඒ වන විට මුදල් පාර්ශවය හැර, ත්‍යාගයේ සහතිකය හා පදක්කම පමණක් ලබා ගෙන ඇති බව දන්වා යැවීමි.

රටේ තත්ත්වය යහපත් අතට හැරුණු විට, එම ත්‍යාග මුදල් මා වෙත ලබා දෙන පරිදි පදනම එකඟ වී තිබුණි. මෙවැනි ත්‍යාගවල මුදල් මගේ පෞද්ගලික ප්‍රයෝජනයට නොගන්නා බව ඒ සමඟම කියා යැවීමි. පෙබරවාරි 12 වැනි දින කොමිසම විසින් එහි තීන්දුව නිකුත් කරත්ම, අනෙක් ප්‍රතිචාරය වූයේ ඒ වන විට රේගුවෙහි තිබූ අපට විදේශයකින් තෑගි ලැබුණු මුද්‍රණ යන්ත්‍රය රාජසන්තක කිරීමය. නමුත් ඒ පිළිබඳ ඉහළ උසාවියට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු, වහාම ක්‍රියාත්මක වන පරිදි එය මුදා හැරීමට නියෝගය කෙරිණි.

ජනාධිපතිතුමාගේ එන්.ජී.ඕ. කොමිසම මගින් සර්වෝදය වෙත දක්වන ලද පක්ෂපාතී ආකල්පයට වඩා, සානුකම්පික අවධානයක් ඉහළ උසාවිය ඉදිරියේදී අප විසින් ඉදිරිපත් කළ පැමිණිලිවලට ලැබී තිබුණි. සුප්‍රීම් උසාවියේ අගවිනිසුරුතුමා විසින් මුලසුන හොබවන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරන ලද්දේ, රේගුවේ ක්‍රියා කලාපය ඒ සම්බන්ධයෙන් අපක්ෂපාතී නොවන බවත්, නීතිය යටතේ සමාන අයිතිවාසිකම් ලැබීමට ඇති සර්වෝදය ව්‍යාපාරය සතු අයිතිවාසිකම එමගින් උල්ලංඝනය කර ඇති බවත්ය.

අප විසින් ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ නඩු තුනෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිට රාජකාරී කටයුතු සඳහා මොරටුව සර්වෝදය මූලස්ථානයට පැමිණි දිස්ත්‍රික් සේවිකාවන් දෙදෙනා, චෝදනා රහිතව අත් අඩංගුවට ගෙන රඳවා ගැනීම, එක් සිද්ධියකි. ඒ කාන්තාවන්ට මේස මත නිදා ගැනීමට හා වෙනත් හිරිහැර පීඩාවන්ට භාජනය වීමට සිදු වූ අතර, මාස දෙකක කාලයක් තිස්සේ රඳවා ගෙන තිබූ සිරමැදිරියේ දී ඉන් එක් කාන්තාවකට ගබ්සා වීමක් සිදු වී රෝගාතුර වී ඇත. ඉහළ උසාවියේදී පැමිණිල්ල ඉදිරිපත් කළ මොහොතේදීම එම සේවිකාවන් දෙදෙනා නිදහස් කිරීමට විධාන කරන ලදී.

ඒ කාලයේදීත්, මා හට ලැබී තිබුණ විදේශීය පිළිගැනීම හා ශක්තිය මගේ ලේඛන හැකියාව හා දේශන නිසාත්, අපේ අසරණ ගැමි ජනතාව වෙනුවෙන් මා විසින් ඉෂ්ට කරනු ලබන සේවාව අවබෝධ කර ගත් බුද්ධිමතුන් ද හේතුකොට ගෙන, නිරායාසයෙන්ම මා වෙත ප්‍රවේශ වූවක් මිස, අසාධාරණයෙන් හෝ බලකාමිත්වය උපයෝගී කර ගනිමින් අත්පත් කර ගත් දෙයක් නම් නොවේ. එම අසරණ ජනතාව සැම දා අප සමඟ සිටින අතර, ඔවුන් රැවටීම කළ නොහැක.

ශ්‍රී ලංකාවේ බලවත්ව සිටි සමහර පුද්ගලයින් විසින් මා හා අපේ ව්‍යාපාරයත් ගැමි සේවාවනුත් අවබෝධ කර ගෙන සිටියේ තමන් කරා එල්ල වී ඇති මහා භයානක අභියෝගයක් ලෙසටය. විශේෂ කොමිසමක් පිහිටුවා ඒ තුළින් අප ව්‍යාපාරයට හිංසා පීඩා කිරීම සම්බන්ධයෙන් සර්වෝදය පිළිබඳ සත්‍යය දන්නා හා සාධාරණත්වයට ගරු කරන බොහෝ දෙනා අප්‍රසාදය පළ කළහ.

සාමාන්‍යයෙන් රජයක් බලයට පත් වූ විට, සියලු ජනතාවගේ ආකර්ෂණය රජය වෙත ලබා ගැනීමෙන් ආණ්ඩු කිරීම පරමාර්ථය වන බැවින්, රටේ බහුතර ජනතාවගේ ප්‍රසාදය දිනූ සහ රජයට අතිරික්ත සුවිශේෂ සේවාවන් අසරණ දුගී ජනතාව වෙත ඉෂ්ට කරනු ලබන සර්වෝදය වැනි ව්‍යාපාරයක්, ආණ්ඩුවෙන් පිට තවත්

ආගන්තුවක් ලෙස රජයේ පාර්ශවයට පෙනී යාම මෙවැනි හිරිහැර අඩත්තේට්ටම් කිරීමට එක ප්‍රධාන හේතුවක් වන බව ඇතැමෙකුගේ මතය විය. අපගේ අවංක සේවයට ද්වේශ කරමින්, අප ව්‍යාපාරය මැඩ පැවැත්වීමට උත්සාහ කරන්නේ, බලකාමී දේශපාලනඥයන්ගේ පටු අභිමතාර්ථයන් ඉෂ්ට කර ගැනීමට අප බාධාවක් වන හෙයිනි.

'සීඩ්ස්' ආයතනයේ දුලාන් ද සිල්වා, කුලඟන සංසදයේ සීතා රාජසූරිය, ෆෙඩ්රික් නවුමාන්හි පෝල් බිෂොප්, සාමෝදයෙහි පූජ්‍ය කුප්පියවත්තේ බෝධානන්ද හාමුදුරුවෝ සහ සුවසෙත භාරව වැඩ කළ නිතා ආරියරත්න යන මහත්ම මහත්මීහු ද වනසුන්දර ප්‍රශ්නාවලිය සඳහා සාක්ෂි ලබා දුන් සර්වෝදය පාර්ශවයේ අයගෙන් කිහිප දෙනෙකි.

1993 අගෝස්තු මස 2 වනදා දිවුරුම් පෙත්සමක් මගින් අවසාන වශයෙන් වනසුන්දර කොමිසම විසින් අප වෙත එල්ල කර තිබූ චෝදනා සියල්ලටම උත්තර සැපයීමු. මේ වන විට වනසුන්දර කොමිසම කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු විනිශ්චයක් බව අපට හොඳටම පැහැදිලි වී තිබූ අතර මම මෙය ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළෙමි. ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ අභාවයෙන් පසු ඒ තනතුරට පත් වූ ඩී. බී. විජේතුංග මැතිතුමා හෝ එතුමාගේ කැබිනට් මණ්ඩලය මේ එන්.ජී.ඕ. කොමිසම ගැන කිසිම තැකීමක් නොකළේ එය පෞද්ගලික පළි ගැනීමක් සඳහා ක්‍රියාත්මක කළ අසාධාරණ කාර්යයක් බව ඔවුන් දැන සිටි නිසාය. කෙසේ නමුත් වනසුන්දර මහතාටත් එතුමා සමඟ ජනාධිපතිවරයාට බලයෙන් ක්‍රියා කළ එක් අයෙකු හැර කොමිසන් සභාවේ අනෙක් සාමජිකයන්ටත් කොමිසමේ වැඩ නිම කිරීමේ අවශ්‍යතාව වැටහී තිබිණි.

ඒ නිසා කොමිසමේ වාර්තාවක් සකස් කොට විජේතුංග ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන ලදී. එම කොමිසමේ නිර්දේශවලට පටහැනිව හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මහතා විකල්ප වාර්තාවක් ඉදිරිපත් කළේය. සෝසා මහත්මා එම වාර්තාවෙන් මතු කර තිබූ සියලුම චෝදනාවලට පිළිතුරු ලබා දී

සියලුම චෝදනාවලින් අප නිදහස් කළා පමණක් නොව සර්වෝදය සේවය ද අගය කළේය.

සෝසා විනිසුරුතුමාගේ විකල්ප වාර්තාවෙන් ප්‍රකාශ කර තිබුණේ අවුරුදු දෙකහමාරක කාලයක් තිස්සේ ආචාර්ය ඒ.ටී. ආරියරත්නයන් සහ සර්වෝදය ඉහළින් අටවා තිබුණු ඩැමොක්ලීස්ගේ කඩුව තව අවුරුදු දෙකහමාරක් ඔවුන්ගේ හිස මතට එල්ල කර තිබීම තමා සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන බවටත්, එල්ල කරන ලද චෝදනා වනසුන්දර වාර්තාවෙන් තවත් අවුරුදු දෙකහමාරක කාලයක් සර්වෝදය පරීක්ෂා කිරීමට ඉල්ලා තිබීම ද සෝසා විනිශ්චයකාරතුමා ප්‍රතික්ෂේප කළේය.

ඩී.බී.විජේතුංග ජනාධිපතිතුමා ග්‍රාමීය භාෂාවෙන් කිවහොත් වනසුන්දර වාර්තාව කුණු කූඩයට විසි කළේය. එය නිල කොමිසන් වාර්තාවක් හැටියට පිළිගත් බවක් අද වනතුරු අපට දැන ගන්නට නැත.

ප්‍රේමදාස දැමූ තහංචි විජේතුංග ඉවත් කරයි

සර්වෝදය නායකයාගෙන් පැසසුම්

කරුණු මෙසේ වුවත් මෙම කොමිසම අහෝසි වූයේ අවුරුදු 14 කට පසුව වුවත්, සර්වෝදයට තදින් ඊර්ෂ්‍යා කරන අසත්‍ය චෝදනා ඉදිරිපත් කරමින් ඒවා කොමිසමේ තීරණ හැටියට පෙන්වා සර්වෝදයටත් මටත් අප්‍රමාණ අපහාස කරන අය අදත් සිටිති. නැවත වරක් ලේක්හවුස් පුවත්පත්ම යොදා ගෙන අපට නොනැවතීම අපහාස කරති. ඒවාට පිළිතුරු දීමට කාලය ගත නො කොට, අප අපගේ ව්‍යාපාරය වෙන කවරදාටත් වඩා හොඳින් ඉදිරියට ගෙන යන්නෙමු. අප ඔවුන්ට පිළිතුරු දෙන්නේ අප කරන සත් ක්‍රියා මගිනි.

අනුන්ගේ කුණු කුඩ අවුස්සන අමුතු විදියේ සමාජ විද්‍යාඥයෙකැයි කියා ගන්නා එක්තරා බුද්ධිමතෙක් සිටී. මොහු කිසිවෙකුගේ හොඳක් නො දකින පුදුම විදියේ අමනෝඥ පුද්ගලයෙකි. ඔහු කවදාවත් මා සමඟ කතා කර නැත. එහෙත් අඛණ්ඩව අවුරුදු තිහකට අධික කාලයක් මොහු මටත් සර්වෝදයටත් අපහාස කරමින් පත්‍රිකා රැසක් පළ කර තිබේ. ඔහුගේ අලුත්ම ප්‍රයත්නය පොතක් ලියා ඉන්දියාවේ පළ කොට වෙළඳ පොළට දැමීමයි. වනසුන්දර කොමිසමට එක් එක් පුද්ගලයින් එවන ලද කැලෑ පත්තර, පෙත්සම් ආදිය මේ පොතේ සර්වෝදය ගැන ලිවීමට ඔහු පාවිච්චි කළ මූලාශ්‍රයන්ලු. ඒ පොත පළ වී වසර කිහිපයක් ගත වූවත් ඒ පොත කියවූ කෙනෙක් හෝ ඒ ගැන කතා කරන කෙනෙක් මෙතෙක් මට මුණ නොගැසිනි.

මේ පුද්ගලයාට මා හිතින් සමාව දී සිටියත් එක්තරා විදියක ඔහු පිළිබඳ තද කලකිරීමක් මා තුළ තිබිණි. ඒ මගේ පෘථග්ජන ස්වභාවය නිසා විය හැකිය. මේ අතර මා බලාපොරොත්තු නොවූ විශාල රැස්වීමක ප්‍රධාන අමුත්තාගේ පැමිණීම ප්‍රමාද වූ හෙයින් එතුමා එන තෙක් දේශනයක් කිරීමට මට ආරාධනාවක් ලැබුණි. මගේ දේශනයට පෙර මා හඳුන්වා දුන්නේ මා ඉහතින් සඳහන් කළ මහතාගේ බිරිඳයි. එතරම් ප්‍රශංසාත්මක හැඳින්වීමක් මා අසා ඇත්තේ කලාතුරකිනි. එතුමියගේ ගුණ කථනයෙන් පසු ඇගේ සැමියා කෙරෙහි තිබූ අසතුටුභාවය ද මගේ සිතින් ඉවත් විය.

284

ලෝක ආගමික පාර්ලිමේන්තු සම්මේලනය - 1993

1893 චිකාගෝ නුවරදී පැවැත්වූ පළමු ලෝක ආගම් සමුළුවට සිය වසරක් පිරීමේ උළෙල 1993 අගෝස්තු මාසයේ 28 වැනි දින සිට, පුරා සතියක් තිස්සේ පැවැතියේය. දෙවන ලෝක ආගම් පාර්ලිමේන්තු සමුළුවට මට ද සහභාගිවීමට ලැබීම මගේ ජීවිතයේ අමරණීය සිද්ධියක් ලෙස සලකමි. මෙම සමුළුවේ මහ ලේකම් වශයෙන් කටයුතු කළේ ආචාර්ය ඩැනියෙල් ගෝමස් ඉබනිස් මහතාය.

සම්මේලනයට සහභාගි වී එහි ප්‍රධාන දේශනයක් කිරීමටත්, තවත් විශේෂ සැසිවාරවල දේශන පැවැත්වීමටත්, එතුමා මට ආරාධනා කර තිබුණේය. මෙම ලෝක ආගම් පාර්ලිමේන්තු සම්මේලනයට දලයි ලාමාතුමා ඇතුළු සභාපතිවරු විසිදෙනෙකු තෝරා ගෙන තිබුණි. එයින් එක් අයෙකු ලෙස මාද තෝරා ගෙන තිබුණි.

සමුළුවට කලින් මා නිව්යෝර්ක් නුවරට පැමිණ දෙතුන් දිනක් ගත කළේ, මගේ මිත්‍ර ඇබී හා මර්ට් මේසන්ගේ ගෙදරය. මර්ට්ගේ මව වූ ජූලියට් සහ ඇයගේ කුඩා කළ සිට ළඟම මිතුරිය වූ ගෝඩා ද නැවත වරක් මට මුණගැසුණහ. ඔව්හු 89 හැවිරිදිය. ඒ හැම දෙනාටම ආයුබෝවන් කියා, 28 වැනිදා ලාග්වාසියා ගුවන් තොටුපලේ සිට ඇමෙරිකන් එයාර් ලයින් යානයකින් මම චිකාගෝ නුවරට ළඟා වීමි. ඒ වෙලාවේම මහාචාර්ය ඩේවිඩ් කලුපහන සහ ආචාර්ය පැට් මාස්ටර් මහත්මිය ද ගුවන් තොටුපළට පැමිණ සිටියෙන්, අප තිදෙනාම පිළිගනු ලැබුවේ මහාචාර්ය ජෝර්ජ් බොන්ඩ් මහතා විසිනි. පාමාහවුස් ක්ලින්ටන් හෝටලයේ අපි නවාතැන් ගතිමු.

ගරු මාපලගම විපුලසාර හිමි, ගරු හැවන්පොල රතනසාර හිමි, ගරු මැදගම වජිරඥාන හිමි, ගරු හැගල්ලේ මහින්ද හිමි, ගරු වල්පොල පියනන්ද හිමි සහ ගරු ගෝනවල ජිනරතන හිමියන් ද මේ සමුළුවට වැඩම කර සිටීම සතුටකි. මගේ පැරණි මිතුරෙකු වූ ආචාර්ය සු.හැ.ජ.සුගුණසිරි මහතා සහ ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා පැමිණ සිටි සෙසු සාමාජිකයන් අතර වූහ.

29 වැනි දා පස්වරුවේ උත්සවශ්‍රීයෙන් පන්දහස් පන්සීයකට අධික වූ නියෝජිතයෝ විශාල ශාලාවේ අසුන් ගත්හ. ශ්‍රෝත්‍රීය ඇමෙරිකානු සංස්කෘතියේ සිරිත් විරිත් සහ පුද පූජාවලට පැයක පමණ කාලයක් වැය විය. ලෝක ආගම් පාර්ලිමේන්තුවේ අන්තර් ආගම් සහයෝගිතා පණිවුඩය නිකුත් කරන ලදී. ශ්‍රී ලංකාව වෙනුවෙන් අපේ තානාපති ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා පණිවුඩයක් නිකුත් කළේය. පළමුවැනි පාර්ලිමේන්තු සමුළුවේදී විශේෂත්වයක් දැරූ අනගාරික ධර්මපාලතුමා ගැන ද එතුමා සිය කතාවේදී සඳහන් කළේය.

සෑම දිනකම තේමා දේශනයක් පැවැත්වූ අතර, අප කුමක් කරමු ද? යන මැයෙන් මිලේනියම් ආයතනයේ අධ්‍යක්ෂ ජෙරල්ඩ් ඕ. බානි මහතා අගනා කතාවක් කළේය. මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම මහතා ද දේශනයක් කළේය. ආචාර්ය විලියම් වෙන්ඩිලිගේ හැඳින්වීමෙන් පසු .ආගම සහ අර්බුද විසඳීම. යන මැයෙන් මූලික දේශනයක් මවිසින් කරන ලදී. පසු දින මගේ ප්‍රාරම්භක දේශනය පැවැත්විණි. ශ්‍රී ලංකාවෙන් පැමිණ සිටි හේමා ගුණතිලක මැතිනිය ද දේශනයක් කළාය.

ලෝකයේ උසම ගොඩනැගිල්ල හැටියට සැලකෙන සියර්ස් ටවර් එක නැරඹීමේ අවස්ථාව ද මා හට හිමි විය. විද්වතුන් සෑහෙන පිරිසක් හමුවීමට ද මට අවස්ථාව ලැබුණි.

ගතවූ අතීතයේ වර්ෂ 2500 ක් තුළ දී ලෝකයේ විවිධ ආගම් පැතිර ගිය අතර ලක්ෂ ගණනින් ජනයා ඉන් කුමක් හෝ ආගමක්

වැළඳ ගත්හ. උපතේ සිට මරණය දක්වාත්, ඉන් ඔබ්බටත් මිනිසාගේ ජීවිතය නිසියාකාරව හසුරුවන්නා වූ ආගම විසින් ඔහුට ජීවිතයේ අර්ථවත් බව උගන්වයි. එමගින් සිතෙහි සාමය උදා කර ගනිමින්, එය රැක ගැනීමටත් මාර්ගෝපදේශකත්වය දෙනු ලබයි. එපමණක් නොව, මිනිසා දුකෙන් මුදවා සත්‍යාවබෝධය කරා ගෙන යාමට තරම් මහා බලවේගයකි. ආගම මිනිසාගේ බුද්ධියේත්, වාසනාවේත් මහිමයෙන් පසු කාලයකදී සංවිධානය වූ ආගම් ඔවුනතරට ප්‍රවේශ විය. මෙයින් යහපතක් මෙන්ම අයහපතක් ද සිදු වූ බව මගේ හැඟීමයි.

ආගම් මුල් කොට ගෙන අතීතයේ සිටම මිනිසුන් අතර ඇති වන ආරවුල් අපි සැමදා කොතෙකුත් අසන්නෙමු. නමුත් ආගම යනු සාමයත් මිනිසාගේම ප්‍රගතිය හා සමාජ යහපත ආරක්ෂා කර ගැන්මේ බලසම්පන්න ආයුධයක් බැව් ඔවුනටම අමතක වී යාම එයට හේතුවයි. මෙම අතිශය වටිනා ආයුධයේ අගය ලෝකයට අවධාරණය කරමින්, විශ්ව සාමයක් ගොඩනැගීම උදෙසා දරනු ලබන මූලික ප්‍රයත්නයක් ලෙස ලෝකයේ විවිධ ආගමික හා ජනනායකයින් ගේ සහභාගිත්වයෙන්, ලෝක ආගමික ඉතිහාසයේ නව පිටුවක් පෙරළමින් ලෝක ආගමික පාර්ලිමේන්තුවක් ප්‍රථම වරට ඇමරිකාවේ චිකාගෝ නගරයේදී 1893 දි රැස් වූහ.



දලයි ලාමා සමඟ

ආගමේ සහ සාමයේ නාමයෙන් පංච මහා ද්වීපයන්හි සිට පැමිණ, චිකාගෝ නගරයට රැස්වූ විවිධ ආගමික හා ජන නායකයෝ එදා ප්‍රථම වරට එකම පොදු වේදිකාවක එකට අසුන් ගත්හ. මීට වර්ෂ හාරසියයකට ඉහතදී කොලොම්බස් විසින් අමෙරිකාව සොයා ගත් සිද්ධිය ස්මරණය කිරීමේ වැදගත් අවස්ථාව ද මෙම ප්‍රථම සම්මේලනය පැවැත්වීමට පාර්ශ්වික ලෙස හේතුසාධක වි තිබිණ.

විවිධ ආගමික සම්ප්‍රදායන්ට අයිති වූ (බහු ආගමික) නායකයන්, ජනතා නායකයන්, කලා ලේඛන මාධ්‍ය, වෛද්‍ය තාක්ෂණික සංගීත වැනි විවිධ ක්ෂෙත්‍රයන්හි නියැළුනු ආගමික විෂයෙහි උනන්දුවක් දක්වන සේවාවන්හි යෙදෙන විශේෂඥයින් ලොව සෑම ප්‍රදේශයකින්ම ආරාධනා ලැබීමෙන්, එහි සම්ප්‍රාප්ත වි සිටියහ. චිකාගෝ නගරය පිහිටියේ ඇමරිකාවේ ඉලිනොයිස් ප්‍රාන්තයේය. කොලොම්බියා එක්ස්පොසිෂන් සංවිධානය. (Colombia Exposition) සමඟ ඒකාබද්ධව හා යුනිෆිකේෂන් පල්ලිය (Unification Church) මූලික වීමෙන් පිහිටුවනු ලැබූ අන්තර් ජාතික ආගමික පදනම අනුග්‍රහයෙන් මෙම සමුළුව පවත්වන ලදී. මෙම ලෝක ආගම් සමුළුවෙහි සංවිධානය, සංවර්ධනය හා ක්‍රියාකාරිත්වය සිදුවනුයේ ව්‍යාපෘති දෙකක් වන ඉකියුමෙනිකල් පර්යේෂණ සංගමය (Ecumenical Research Forum) හා ආගම් පිළිබඳ තරුණ සමුළුව මගිනි.

මේ සියලු සංවිධානයන්හි සමස්ත වු අරමුණු හා සැලසුම්වල ප්‍රතිඵලයක් ලෙස පිහිටුවනු ලැබූ ප්‍රථම ලෝක ආගම් පාර්ලිමේන්තුව හා එහි ප්‍රථම රැස්වීම තුළින් මානව සංහතියේ ජාති ආගම් සංස්කෘතික හා සමාජීය ක්ෂෙත්‍රයන් හි නව ප්‍රබෝධයක් උද්යෝගයක් ඇති කරලීමට සමත් විය.

දෙවන ලෝක ආගමික සමුළුව 1985 දී (නොවැම්බර් 15 - 21) අමෙරිකාවේ නිව් ජර්සි නම් ස්ථානයේ 'අමෙරිකානා ග්‍රේට් ජෝර්ජ් සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ අතර, ඉන්පසු 1989 දිත්, අවසාන

සමුළුව 1993 දීත් චිකාගෝ නගරයේදීම පවත්වනු ලැබීය. 1985 අපේ රටේ ජාතිවාදී අරගල අවදානම් තත්ත්වයක පැවතියෙන්, මට සහභාගි වීමට යාමට නොහැකි විය.

සමුළුවේ විෂය මූලය හා සම්බන්ධව සැලසුම් කරන ලද තේමාවන් නියෝජිතයින් වෙත යවා තිබුණෙන්, මාතෘකා අනුව සාකච්ඡා හා විමර්ශනයන් සිදු කරන ලදී. එය පොදුවේ සියලුම සම්මේලනයන්හිදී අනුගමනය කරනු ලැබූ ක්‍රියා පටිපාටියයි. තවද මෙම සම්මේලනය පිළිබඳව පොදුවේ කතා කරන විට, ලෝකයේ නැගෙනහිරත්, බටහිරත් ප්‍රචලිතව ඇති සියලු ආගමික විශ්වාසයන්, සංස්කෘතීන්, සම්ප්‍රදායයන් මුහුණට මුහුණ ලා හමුවූ අවස්ථා උදා කර දුන්නේය.

ලෝකයේ ආගම් පිළිබඳව සුවිශේෂ වශයෙන් බෞද්ධ දර්ශනයේ සංක්ෂිප්ත හරයත්, වේදය සමඟ එහි පවතින සමානාත්මතාවයත් ඉතා දක්ෂ හා චතුර ලෙස සභාව ඉදිරියේ තැබූ භාරතය නියෝජනය කළ විවේකානන්ද ස්වාමිතුමා, ප්‍රථම ලෝක ආගම් සම්මේලනය තුළින් ඓශ්චර්යවත් ලෙස විශ්ව කීර්තියට පත් වූයේය. සමස්ත ආගම් විෂයෙහි අතිශය පුළුල් විග්‍රහයක් සහිතව එතුමා බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම් ආදි ආගම් පිළිබඳව කතා කළේය. අද දවසේ ද ලෝක ආගමික හා ජාතික නායකයන් විසින් මහත් පරිශ්‍රමයක් දරන්නා වූත් ලෝක ආගම් සම්මේලනය තුළ ඊට පසුත් දෝංකාරය දෙන්නා වූත් සමස්ත ආගමික සාමය හා ඒකාග්‍රතාවය ප්‍රථමයෙන්ම ලෝකයට අවධාරණය කරන ලද්දේ ආදි වෛදික ඍෂිවරුන් විසිනැයි එදා එතුමා විසින් ප්‍රකාශ කර ඇත.

සමස්ත මිනිස් වර්ගයාගේ එක්සත් භාවයේත්, ලෝක ආගම් සංස්කෘතිය යන්නෙහිත් නියම අර්ථය අවබෝධ කරගැනීමේ ආම්පන්නය වන භාවනාව, යාඥාව, අධ්‍යයනය හා සාකච්ඡා චිත්‍රපට, දේශන යන සියලු ආධ්‍යාත්මික අභ්‍යාසයන්ගෙන් සමන්විත වැඩ සටහන් මෙම ආගමික සම්මේලනයේදී සංවිධානය කර තිබුණි. ගෝලීය ආගමික වටිනාකම් සවිස්තරව හුවමාරු කර ගැනීම මගින්

ජාත්‍යන්තර එකමුතුව පෝෂණය කිරීමටත් සමස්ත මානව සාධාරණත්වය ඇතුළුව මානව සංවර්ධනයක් ගොඩනැංවීම සඳහාත් සැලකිය යුතු දායකත්වයක් ලැබේ යැයි අපේක්ෂා කරන ලදී. ආගමික හා ජාතික සංස්කෘතික ජ්‍යෙෂ්ඨ ජන නායකයන් දේශන සඳහා තෝරා පත් කර ගෙන තිබුණි. ගැඹුරු හා ප්‍රාණවත් ආධ්‍යාත්මික පරිපූර්ණ ජීවිතයක් සඳහා සමකාලීන ගැටලු නිරාකරණය කර ගැන්මට අප සතු විවිධ ආධ්‍යාත්මික සම්පත් භාවිතා කළ යුත්තේ කෙසේද? වර්තමානයත් අනාගතයත් යන දෙකම සඳහා මෙම ආධ්‍යාත්මික සම්පත් සෑහේද? මිනිසාට උරුම වී තිබූ වටිනා සම්ප්‍රදායන් නැවත අත්පත් කර ගැනීමට ඒවා නිර්මාණාත්මකව වෙනස් විය යුතු නොවේද? එම අගයන් විසින් අප වෙත ප්‍රදානය කර ඇති ශක්තීන් මොනවාද? යන ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමට, යම් විවේචනාත්මක ඇගැයීම් කාර්යයක් සඳහා හිතකර වාතාවරණයක් උදා කර ගනිමින් එම සම්භාව්‍ය උරුමයන් භුක්ති විඳීමට අවශ්‍ය සාධක ඉස්මතු කරගත යුතුව ඇති බැවින්, ඒ සඳහා ඉවහල් වන ප්‍රශස්ත මාතෘකා සම්මේලනය සඳහා තෝරා ගෙන තිබුණි.

මෙම පරමාර්ථයන් සඳහා පවත්වනු ලැබූ පාර්ලිමේන්තු සමුළුවලදී 1985 අවස්ථාවේදී අතීතය පිළිබඳවත්, 1989 දී වර්තමානය ගැනත්, 1993 දී අනාගතය පිළිබඳවත් සැලකිල්ල යොමු කරන ලදී. එහිදී තවද කලින් සියලු සමුළුවල සාකච්ඡා ප්‍රතිඵලයන් ඒකාබද්ධ විමර්ශනයට ලක් කරන ලදී. එලෙස සමස්තයක් ලෙස ගත් විට, වර්තමානයට උචිත පරිදි සාපේක්ෂ ලෙස නැවත අලුත් කර ගත් අතීතයේ හා වර්තමානයේම සරල විවේචනාත්මක නිදර්ශන ලෙස එම ප්‍රතිඵලයන් අර්ථ දක්වනු ලැබීය.

තම ආගම් සම්ප්‍රදායන් විසින් අන්‍ය ආගම්වල එම අගයන් ගෞරවයකින් යුක්තව පිළිගැනීමටත් ජාත්‍යන්තර ආගමික සාකච්ඡා සාර්ථකව දිගටම පවත්වා ගැනීමටත් තම තමන් සතු සම්පත් සංකල්ප මූලධර්ම වැඩි දියුණු කර ගැනීම ආධ්‍යාත්මික දැනුවත් බව වර්ධනය කර ගැනීම වැනි ඒ හා සම්බන්ධ කොතෙකුත් දේ ගැන පාර්ලිමේන්තු සාමාජිකයින් දැනුවත් කිරීමට සැලැස්වීම එහි කැපී පෙනෙන ක්‍රියාකාරකම් ලෙස හුවා දැක්විය හැක.

මෙම ලෝක ආගම් පාර්ලිමේන්තුවේ විශේෂ අවස්ථාවක් වශයෙන් මට මතක් වන්නේ චිකාගෝ නගරයේ ග්‍රෑන්ඩ් පාර්ක් නම් ස්ථානයේ එළිමහනේ පනස්දාහකට අධික පිරිසක් අමතා දලයි ලාමාතුමා සමඟ එකම වේදිකාවේ සිට මිනිත්තු කිහිපයක් හෝ කතා කිරීමට මට ලැබුණු අවස්ථාවයි. අනිත් සභාපතිවරුන්ට ද එම අවස්ථාව ලැබිණි.

දින කිහිපයක් හෝ කැප කිරීමෙන් තමන් තුළ ඇති තෘෂ්ණාව, ක්‍රෝධය, අවිද්‍යාව යන කෙලෙස් පහ කිරිම සඳහා යම් ආධ්‍යාත්මික ප්‍රයත්නයක යෙදිය හැකි නම්, ඉන් ලැබෙන කරුණාව දයාව හා අවබෝධය මහඟු ආශීර්වාදයක් වනු ඇත. මීට වර්ෂ සීයකට ඉහතදි ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨ පුත්‍රයෙක් වූ අනගාරික ධර්මපාල තුමා හා භාරතයේ මහා ශාන්තුවරයෙක් වූ ස්වාමි විවේකානන්දතුමා විසින් මෙම නගරයේදීම ලෝක ආගම් සම්මේලනය අමතන ලදී. ඒ 1893 දීය. එදා එම ශ්‍රේෂ්ඨවන්තයින් මිනිසාට දේශනා කළ ධර්මය කෙතරම් එලදායි වුවද, දියුණුවෙන් දියුණුවට පත් වෙමින් තිබූ කාර්මික ශිෂ්ටාචාරය ගැන තිබූ විශ්වාසය නිසාම, ඒ කියූ දේවල් අරුම පුදුම හා කිසි සේත් අදාළ නොවන කාරණා හැටියට මිනිසාට පෙනෙන්නට ඇත.

1893 දි අනගාරික ධර්මපාලතුමා මෙසේ කීවේය: ''මනුෂ්‍යයෙක් හැටියට මෙලොව උපත ලැබීම ඓශ්චර්යවත් වරප්‍රසාදයක්. මිනිසාගේ උත්කෘෂ්ටභාවය රඳා පවතින්නේ විචාරාත්මකව සිතීමටත් ශාන්ත වූ චින්තනයෙන් හා ප්‍රඥාවන්තව පාරිශුද්ධ වූ උසස් පරමාදර්ශී ජීවිතයක් ගත කිරීමටත් ඔහු සතු වන්නා වූ ධාරිතාව මතය.'' මනුෂ්‍යත්වයේ උත්තරීතර භාවය ළඟා කර ගත හැක්කේ අතිශය නිහතමානීභාවයෙන් ය යන්න එම කියමන මගින් සනාථ කරයි. ධනයත්, රාජකීයත්වයත් අභිබවා විශිෂ්ට වූ ස්ථානයකට ඔහුව රැගෙන යනු ලබන්නේ ඉහතින් සඳහන් වූ ක්ලේශයන් විනාශ කිරීම නිසාවෙනි. පසුගිය ශත වර්ෂය තුළදි මිනිසා විසින් තම දැනුම විශාල වශයෙන් පුළුල් කර ගත් අතර,

විශ්වය තුළ පමණක් නොව ඔහු තම ආධිපත්‍යය අනෙක් චක්‍රාවාටයන්හි ද පැතිරවීය. එය එසේ වුවද කරුණාව, දයාව, සානුකම්පික බව වැනි මිනිස් ගුණාංග සම්බන්ධයෙන් එවැනි පැතිරවීමකින් ලැබෙන ප්‍රතිඵල ඊට හාත්පසින්ම වෙනස්ය.

චිකාගෝ නගරයේ පැවැත්වූ ලෝක ආගම් පාර්ලිමේන්තු සම්මේලනයට සහභාගි වීමෙන් මා ලැබූ අත්දැකීම් සම්භාරය ලෝක ආගමික විෂය පිළිබඳව මගේ දැනුමත්, ඒ සම්බන්ධව මගේ තිබූ උනන්දුවත් යන දෙකම වර්ධනය වීමට හේතු විය. සෛධාන්තික වශයෙන් පුළුල් හා ගැඹුරු වූ විවිධ ආගමික ක්ෂේත්‍රයන් එහිදී මනා ලෙස හැසිරවීම හා කළමනාකරණය වනු දැකීම මට මහත් සන්තෝෂය ගෙන දුන් කාරණයක් විය. මා විසින් පවත්වනු ලැබූ දේශනයට ද ලැබුණු පැසසුම් නිසා එම සතුට දෙගුණ තෙගුණ විය. සමාජ සාමය හා සුභසිද්ධිය තකා එවැනි සම්මේලනයකින් උදා කර ගත හැකි ආශිර්වාදය දැක දැකත් නිශ්ශබ්දව සිටීම අකටයුතු දෙයකැයි මට සිතුණි. අප ද එතැනින් නතර නොවී අපේ රට දය මහජනතාව

1993 දෙසැම්බර් 19 වැනිදා කොළඹ නාලන්දා විද්‍යාලයීය ශාලාවේ පැවැති රැස්වීම මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි, මම, මහාචාර්ය ඩබ්.එන්.කේ.බී. විජේතුංග, සීතා රාජසූරිය මැතිනිය, ජෙසීමා ඉස්මයිල් මැතිනිය, ස්වාමි ආත්මානන්දජී මහාරාජ් ආදීහු වෙති.

වනුවෙන් යම් කැපවීමක් විය යුතු බවක් මම කල්පනා කළෙමි. මා මේ විදියට සිතන්නට පටන් ගත්තේ චිකාගෝ නගරයේදීමය. ඉන්දියාව නියෝජනය කිරීමට එහි පැමිණ සිටි ආචාර්ය එම්. අරම් මැතිතුමාට මගේ අදහස ප්‍රකාශ කරමින් ආරාධනයක් කළෙමි. එනම්, මා ආපසු ලංකාවට ගොස් මෙය සිහිපත් කිරීමට පුංචි ආගමික පාර්ලිමේන්තු සමුළුවක් සංවිධානය කරන බැවින්, ප්‍රධාන දේශනය පැවැත්වීමට එහි පැමිණෙන ලෙසටය.

ලෝක ආගම් පාර්ලිමේන්තුව ලෙස නම් කරනු ලැබූ අපේ පුංචි පාර්ලිමේන්තුව එම වර්ෂයේම 1993 දෙසැම්බර් 19 වැනි දින ඉතා සාර්ථක අන්දමින් පැවැත්වූයෙමු. ''ආගම් තුළින් ආධ්‍යාත්මික එක්සත් බව' යන්න වැඩ සටහනේ දවසේ තේමාව ලෙස නම් කරන ලදී. ස්ථානය ලෙස අප තෝරා ගත්තේ සර්වෝදය ව්‍යාපාරය මුලින්ම ආරම්භ කරනු ලැබූ කොළඹ නාලන්දා විද්‍යාලයීය ශාලාවයි. බෞද්ධ හින්දු ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගම් දර්ශනයන් සම්බන්ධ දේශනා පැවැත්වීමට ගරු බෙල්ලන්විල විමලරතන ස්වාමීන් වහන්සේ, ස්වාමි ආත්මානන්ද්‍රජී මහාරාජ්, ජෙසීමා ඉස්මයිල් මහත්මිය හා ගරු ඔස්වල්ඩ් පර්ත් පියතුමා ගරු ආරාධිත දේශකයින් ලෙස කැඳවනු ලැබීය. ආගම් තුළින් ඒකීයභාවය ඇති කිරීම සඳහා බලපාන අභියෝග හා ප්‍රවනතාවයන් යන තේමාව යටතේ සමුළුවේ අනෙකුත් දේශන යොමු වී තිබුණි. සිවානන්දනී දුරෙයිසාමි මහත්මිය විසින් ''විශ්ඥාණවාදයේ පිරිහීම'' යටතේ ද, මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා විසින් ''ලෝකය එහි අවසානය කරා ගමන් කරන්නේද?'' ගැන ද කතා කළහ. මගේ දේශනය ''චිකාගෝ සිට ලෝකය දෙස'' නම් විය.

ඉල්ගා අනුස්මරණ ජාත්‍යන්තර සම්මානය

ඉල්ගා යන ජනප්‍රිය නමින් හැඳින්වූ කොරියානු ප්‍රබෝධයේ පුරෝගාමී නායකයකු වූ ආචාර්ය යොන්ග් කී කිම් මහතාට ගෞරව පිණිස මෙම පොදු ජන සේවා ජාත්‍යන්තර ත්‍යාගය ප්‍රදානය කරනු ලැබේ. කොරියාවේ සෝල් නුවර ඉල්ගා අනුස්මරණ ජාත්‍යන්තර සම්මාන පදනම මගින් 1987 දී මෙම ත්‍යාගය ස්ථාපනය කර ඇති අතර, එය සමාජ අධ්‍යයනය වෙනුවෙන් උසස් සේවාවක් ඉටු කරනු ලබන කොරියාවේ පිහිටුවා ඇති වඩාත්ම ප්‍රකට ආයතනයකි. ඉල්ගා අනුස්මරණ පස්වන ත්‍යාගය සඳහා 1995 වර්ෂයේදී පොදු ජන සේවය වෙනුවෙන් ත්‍යාගලාභියා ලෙස මා තෝරා ගෙන තිබුණි. කොරියාවේ ජුන්ලොන්ග් සංගමයේ සභාපති ඕ ජෝ ගීල් මහතා ද කෘෂිකාර්මික අංශයෙන් ඒ සඳහා සුදුසුකම් ලැබ සිටියේය. මෙම සම්මාන ප්‍රදානෝත්සවය 1995 සැප්තැම්බර් මස 02 දින කොරියාවේ හැනාන් නගරයේ පිහිටි ගොවීන්ගේ පාසලේදී උත්සවාකාරයෙන් පැවැත්වීය.

සම්මාන ප්‍රදානෝත්සව ශාලාවේදී

මෙය මට ලැබුණු දහ වන ජාත්‍යන්තර සම්මානය වන අතර ඉල්ගා අනුස්මරණ ත්‍යාගය ලැබීමෙන් පසු කොරියාව සමඟ අප විසින් ගොඩනඟා ගෙන තිබූ හිතමිත්‍රකම් තවත් වර්ධනය වීමට හේතු වූවා මෙන්ම සර්වෝදය සමඟ අන්‍යොන්‍ය සුහදතාවය තව දුරටත් ශක්තිමත්ව පවත්වා ගැනීමට ඒ අය තුළ තිබූ උද්‍යෝගය මම තව අතකින් ප්‍රබෝධවත් කළෙමි. ආචාර්ය යොන්ග් කී කිව් මහතා විසින් කොරියාවේ සංවර්ධනය වෙනුවෙන් ඉටු කර ඇති සේවයත් එමගින් පසුගිය වර්ෂ කිහිපය තුළ එම රටෙහි ජනතාව විසින් ළඟා කර ගෙන තිබූ ප්‍රගතියත් අප සියලුදෙනාටම කදිම ආදර්ශයකි. උත්සාහයෙන් කටයුතු කිරීම නිසා ඔවුන් විසින් උදා කර ගෙන ඇති එම තත්ත්වය පිළිබඳව ආසියානු රටක් හැටියට අප ආඩම්බර වන බවත් ඒ සමඟ යටත් විජිත පාලනයන් නිසා අහිමි වූ ආධ්‍යාත්මික හා සංස්කෘතික වටිනාකම් නැවත ලබා ගැනීමට ඔවුන් විසින් දරනු ලබන ප්‍රබල වෑයම තව දුරටත් අගය කළ යුත්තක් බවත් ඉල්ගා ත්‍යාග පදනමෙහි මහලේකම්තුමාට යැවූ ලිපියක මම සඳහන් කළෙමි.

ආචාර්ය යොන්ග් කී කිම් මහතා

ජපාන යටත්විජිත සමයේදී කොරියාවේ නිදහස් ව්‍යාපාරයට උරදුන් ශ්‍රේෂ්ඨ නායකයින් අතරින් කෙනෙකු වූ ආචාර්ය යොන්ග් කී කිම් මහතා කොරියාවේ ගොවීන්ගේ පියාණෝය. කොරියාව නිදහස ලැබූ පසු එතුමා ජනතාවගේ කැපවීමෙන් ක්‍රියාත්මක වූ ගම් සංවර්ධන ව්‍යාපාරයක් ආරම්භ කළේය. 1931 දී ආරම්භ කළ මෙම ව්‍යාපාරය මගින් රටේ මුඩු බිම් වගා කර සංවර්ධනය කරමින් රට ඉදිරියට ගෙන ගිය අතර වේගයෙන් කාර්මීකරණය වෙමින් තිබූ කොරියානු සමාජය උසස් තත්ත්වයකට පත් කිරීමට එතුමා සමත් වූ බැවින් ජාත්‍යන්තර පිළිගැනීම තුළින් 1966 වර්ෂයේදී මහජන සේවය සඳහා පිරිනමනු ලැබූ මැග්සයිසයි ත්‍යාගයට හිමිකම් කීවේය.

කී කිම් මහතාගේ පියා මිය යන අවස්ථාවේදී ඓශ්වර්ය යමත් ගොවියකු වන්නැයි ප්‍රකාශයක් කර තිබුණු බැවින් ආදර්ශවත්

ගොවියෙකු වීමේ අධිෂ්ඨානය මුදුන් පත් කර ගැනීමට ඔහු මුළු දිවියම කැප කළේය. කොරියානු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීමට අධ්‍යාපනය ලැබීමේ පුරුද්ද ඔවුනට හුරු කර වූ අතර, ඉල්ගා ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වූ ගොවි පාසල ඒඕන් පල්ලිය හා ගොවිපල ගොවීන්ගේ උසස් පාසල යන ආයතනයත් එතුමාගේ නිර්මාණයන්ය. 1988 දී එතුමා මොළොවින් සමු ගත්තේය.

ත්‍යාග ප්‍රදානෝත්සවය ඇතුළු විවිධ උත්සව අවස්ථා වෙනුවෙන් 1996, 1997 වර්ෂයන්හි මම කොරියාවට ගියෙමි. එහිදී හදවතින් ඉතාම සමීප වූ සුවිශේෂී පුද්ගලයින් කිහිපදෙනෙකුම මුණ ගැසීමට හැකිවීම විශේෂත්වයක් ලෙස මම දකිමි. ''ආසියාවේ මාතාව'' යන විරුදාවලියෙන් හඳුන්වනු ලබන මහාචාර්ය පාර්ක් චුන් සූ නම් බෞද්ධ මව්තුමියට ඉන් විශේෂ තැනක් ලැබේ. අසරණ දුගී ජනතාවන්ගේ දුක් කන්දරාවන් නිවීමට දුගීකම, රෝගපීඩාවන් තුරන් කිරීම, අන්තර් ආගමික සහජීවනය, ලෝක සාමය වෙනුවෙන් මුළු දිවියම කැප කළා වූ එතුමිය තෙරේසා මව්තුමිය වැනිම වූ විරල ගණයේ ශ්‍රේෂ්ඨ කාන්තාවක් වූවාය.

විසිවන ශත වර්ෂයේදී කොරියාවේ උපත ලැබූ දේශීය ආගමක් වන පරිපූර්ණ බෞද්ධාගම (Won Buddhism) නම් වන නව බෞද්ධ නිකායට අයත් වූ එතුමිය ජාත්‍යන්තර ලෙස ප්‍රකට සේවා සංවිධාන කිහිපයකම උසස් තනතුරු දැරීය. එම නිකාය සංකල්පය වූ ''ලෝකය බේරා ගැනීමට ඇති එකම මඟ වනුයේ සත්‍යය ආගමක් ආශ්‍රිතව ජනිත වන්නා වූ ශක්තිය තුළින් මිනිසුන් අතර ආධ්‍යාත්මික ශක්තිය බෙදා හැරීම සහ සදාචාරාත්මක සිරිත් විරිත් පුරුදු පුහුණු කිරීමත්ය'' යන්න ප්‍රචලිත කිරීමට එතුමිය බොහෝ මහන්සි ගත්තාය. එතුමියගේ නමින් ආරම්භ කරන ලද පුණ්‍ය භාරය මගින් කරුණා රෝහල් ව්‍යාපෘතියක් ද පවත්වා ගෙන ගිය අතර එය දියුණුවෙන් දියුණුවට නැඟී ආවේය. ආගමික සහජීවනය වෙනුවෙන් කතෝලික ආදී සියලු ආගම්වලට උදව් කළාය. මා හඳුනා ගැනීමට ලැබීම ගැන බොහෝ සතුටු වන බවත්,

මා දුටු ප්‍රථම මොහොතේදීම බොහෝ හුරු පුරුදු බවක් හැඟී ගිය බවත් එතුමිය විසින් මා වෙත එවන ලද ලිපියක සඳහන් විය. ඇයගේ නම යෝජනා කර තිබූ ජාත්‍යන්තර සම්මානයක් සඳහා සූදානම් කර තිබූ ලිපි ගොනුවක් මට එවා තිබූ අතර, අඩුපාඩු බලා නිවැරදි කර යම් අදහසක් ලියා එවන ලෙස එහි සඳහන් කර තිබුණි. එතුමිය සර්වෝදය සුවසෙත ආයතනය සඳහා පරිත්‍යාගයක් කිරීමට තරම් කාරුණික වූ බව සිහි කළ යුතුය.

කොරියානු බෞද්ධ හවුල් සංවිධානයේ මහලේකම් ලෙස කටයුතු කළ ගරු පොම්නිම් යුන් තුමා ද එහිදී මා සමඟ හිතවත් වූ අයෙක් විය. 1997 වර්ෂයේ උතුරු කොරියාවේ උද්ගත වූ සාතනය ඉතා ශෝචනීය සිද්ධියක් වූ අතර මිනිසුන් සිය දහස් ගණන් දිනපතා කුසගින්නේ මිය ගියහ. මරණයෙන් යන්තම් දිවි ගලවා ගත් දෙසීය හතරදෙනෙකුගේ අත්දැකීම් සහිත වාර්තාවක් එතුමාගේ සංවිධානය විසින් සකස් කර එය පෙත්සමක් ලෙස එක්සත් ජාතීන්ගේ සංගමය, සරණාගතයින් සඳහා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය ආදී ජාත්‍යන්තර සංවිධාන වෙත ආධාර පතා යවා මට ද පිටපතක් එවා තිබුණි. ඉල්ගා ජාත්‍යන්තර ත්‍යාග පදනමෙහි සභාපති සැන්ග් වොන් කිම් මහතා, මහලේකම් දූන්රන් කිම් මහත්මිය, සෝල්හි ජාතික විශ්ව විද්‍යාලයේ මහාචාර්ය චෙන් මහතා, කැනාන් ගොවියන්ගේ පාසලෙහි ප්‍රධානාචාර්ය වොන්ජු මහතා, ජෙනී පාර්ක් මහත්මිය මෙම සංචාරයන්හිදී මට ඉතා ආදරයෙන් සත්කාර කළ මා හා හිතවත්කම් ඇති කරගත් තවත් කිහිප දෙනෙකි. ත්‍යාග ප්‍රදානෝත්සවයෙන් පසු ද අපගේ මිත්‍රත්වය එසේම පැවැතියේය.

ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වනු ලැබුවේ 1995 සැප්තැම්බර් මස 02 වැනිදාය. මාත් නීතාත් කලින් දින සෝල් නුවරට ගියෙමු. ඒ දිනවල මම තවත් විදේශ සංචාරයන් කිහිපයක් සඳහා සූදානම්ව සිටි බැවින් එම ගමන දින 03 කට පමණක් සීමා විය. සෝල්හි ඔලිම්පික් පාර්ක් හෝටලයෙහි අපට නවාතැන් සපයා තිබුණි.

සියොල් ජාත්‍යන්තර සෙන් මධ්‍යස්ථානයේ කළ්‍යාණවංශ ස්වාමීන් වහන්සේ ඇතුළුව කොරියාවේ සිටි තවත් මගේ හිතවතුන් කිහිප දෙනෙකු එහිදී අපට මුණගැසුණි. එදින පුවත්පත් සාකච්ඡාවක් සහ රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගි වීමු.

ඉල්ගා අනුස්මරණ ශාලාව වෙත අප කැඳවාගෙන යාම

අප පිළිගැනීම

කොරියාවේ හිටපු අගමැතිතුමා විසින් නීතා සහ මම පිළිගැනීම



කොරියානු ජනාධිපති කිම් යන්ග් මැතිතුමා විසින් ත්‍යාග ප්‍රදානය කිරීම

දෙවෙනි දින කැනාන් හි පිහිටි ගොවියන්ගේ පාසලෙහි ඉල්ගා අනුස්මරණ ශාලාව වෙත අප කැඳවා ගෙන යන ලදී. ත්‍යාග ප්‍රදානෝත්සවය සවස 4.30 සිට පැයක් පුරාවට පැවැත්විණි. කොරියානු ජනාධිපති කිම් යන්ග් සෑම් මහතා විසින් ත්‍යාග ප්‍රදානය සිදු කරන ලදී. ත්‍යාගයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 20000 කි.

සම්මාන ප්‍රදානෝත්සවය තුළ විශේෂ අමුත්තන් සමඟ

සම්මාන පිළිගැන්වීමෙන් පසු

ඒ වන විට ශ්‍රී ලංකාවේ ගම්මාන 24,000 න් ගම්මාන 10,000 ක සංවර්ධන කටයුතු සර්වෝදය මගින් ආරම්භ කර තිබුණු අතර අපගේ ප්‍රජා සංවර්ධන කටයුතු එහි සෑම කෙනෙකුගේම විශේෂ අවධානයට යොමු වී තිබුණි. ත්‍යාග පදනමෙහි අවශ්‍යතාවයට අනුව මගේ සේවාවන් පැහැදිලිව ඉස්මතු කෙරෙන පරිදි ඡායාරූප 30 ක් උත්සව ශ්‍රවණාගාරය ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීමට සලස්වා තිබුණි. ඉල්ගා ත්‍යාග කමිටුවෙහි සභාපති ලෙස වසර කිහිපයක් කටයුතු කළ කිම් ෂිනිල් මහතා එවකට ඇස්බේ සංවිධානයෙහි මහලේකම්ව සිටි මහාචාර්ය ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග මහතාට ලිපියක් ලියමින් ප්‍රකාශ කර තිබුණේ කරුණු බොහොමයක් මත ආචාර්ය කිම් මහතා (ඉල්ගා) කොරියාවේ ආරියරත්න වන බවය. සෝල්හි කොරියානු නගර සහ පරිසර විද්‍යාත්මක පර්යේෂණ මධ්‍යස්ථානයේ මහාචාර්ය ෂින් මියොන් සහ මහාචාර්ය තෙදෙස්කෝ මහතා 1996 ඔක්තෝම්බර් මාසයේ සංචාරයේදී මගේ දේශන සංවිධානය කර තිබුණි. ජොයින්ට් ටු ගෙදර් සංගමයේ විවෘත කිරීමේ උත්සවයට ද සහභාගි වූ අතර සර්වෝදය සමාජ සේවා පිළිබඳව ලියැවුණු ලිපි හඳුන්වා දීමක්ද එහිදී සිදු විය.

සැප්තැම්බර් 3 වැනිදා අපි එතුමාගේ සොහොන බැලීමට ගියෙමු. කොරියානු ජනාධිපතිතුමාගේ නිල නිවාසය වන ''බ්ලූ හවුස්'' වෙත කැඳවා එතුමා සහ යුනෙස්කෝ ආයතනයේ මහාචාර්ය ෂිම් මහතා ද සමඟ එහිදී දිවා භෝජන සංග්‍රහයට සහභාගිවීමත් එදිනම සිදු විය. පසු දින අපි ආපසු ලංකාව බලා පිටත් වීමු.

ඉල්ගා අනුස්මරණ ජාත්‍යන්තර සම්මානය පිළිගනිමින් පැවැත්වූ දේශනය

අද සමාජයේ වඩාත්ම කැපී පෙනෙන ප්‍රවනතාවයක් ලෙස දැක්විය හැක්කේ මිනිසාගේ තිරිසන් ස්වභාවයේ ලක්ෂණයන් වන ධනය, බලය අත්පත් කර ගැනීම හා තමාගේම සන්තෘෂ්ටිය කෙසේ හෝ ළඟා කර ගැනීම සඳහා මිනිසුන් දරණ උත්සාහයයි. එවැනි පරමාර්ථයන්ගෙන් උද්දීපනය වූ ආශාවන් සහ දැඩි ආත්මාර්ථයෙන් මිනිසාගේ සිත වෙලා ගෙන ඇති අතර ඒවායේ ප්‍රතිඵලයන් ලෙසින් නිරතුරුව පවතින යුද්ධ සහ මිනිස් සංහාරයන්, පුද්ගල ඝාතන සහ ඒඩ්ස් වැනි මාරාන්තික රෝග යනාදිය හේතුකොට ගෙන මිනිස්සු විශාල දුක් පීඩාවන්ට ගොදුරුවෙමින් බියෙන් ජීවත් වෙති.

මෙවැනි අන්ධකාරයක් තුළ තමා වටා සිටින සුළු පිරිසකට හෝ යම් ආලෝකයක් දිම සඳහා කාලයෙන් කාලයට සුවිශේෂී පුද්ගලයෝ ලොව උපදිති. මනුෂ්‍යයින්ගේ සිත්සතන් හි සැඟවී ඇති දයාව කරුණාව හා සත්පුරුෂභාවය ඉස්මතු කර ගන්නා අය සැබෑ ශ්‍රේෂ්ඨයින්ය.

තම ජීවිතය කැප කිරීමෙන් මනුෂ්‍යයාට අනුපමේය සේවයක් ප්‍රදානය කළ ආචාර්ය යොන්ග් කී කිම් ශ්‍රීමතාණන් අද දවසේ අනුස්මරණය කරනු ලැබේ. මෙම උත්කර්ෂවත් අවස්ථාවේදී මෙතැනට පැමිණීමට මට ද ආරාධනය කර තිබීම මගේම භාග්‍යයක් සේ සලකමි. එතුමා හඳුන්වනු ලබන ආදරණීය නාමය ''ඉල්ගා'' නාමයෙන්ම අපගේ සමාජසේවා කාර්යයන් ඉෂ්ට කිරීමම මහත් සන්තෝෂයකි. ප්‍රබෝධයකි. මෙම උතුම් පුරුෂයා ගෞරවාදරයෙන් සිහිපත් කිරීමත්, එතුමාගේ මෙහෙවර අඛණ්ඩව ගෙන යෑමට ප්‍රයත්න දැරීමත් වෙනුවෙන් ඉල්ගා අනුස්මරණ පදනමෙහි භාරකාර මණ්ඩලයට මගේ ප්‍රණාමය පුද කරමි. 1995 වර්ෂය වෙනුවෙන්

උත්සව ශාලාව

මෙම අනගි ඉල්ගා අනුස්මරණ ත්‍යාගය සඳහා මා තෝරා ගැනීම පිළිබඳව සියලු දෙනාටම මෙම අවස්ථාවේදී මම කෘතඥවෙමි. ආචාර්ය කිම් මහතා විසින් අනුගමනය කළා වූ දයාව, කරුණාව, සාධාරණත්වය සහ අවංක සේවය වැනි මානව ගුණාංගයන් පාදක කර ගනිමින් තිරසාර සාමකාමී සමාජයක් ගොඩනැගීමට වෙර දරන

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශයන්හි ජීවත් වන මගේ සහෝදර සහෝදරියන් දස දහස් සංඛ්‍යාවන්ට මෙම පිළිගැනීමත් ගෞරවයත් ප්‍රදානය කළ යුතුය. එතුමා මට වඩා අවුරුදු 22 ක් වැඩිමහල්. 1969 දී ප්‍රජා නායකත්වය වෙනුවෙන් මට රැමන් මැග්සයිසයි ත්‍යාගය ලැබුණා. ඊට අවුරුදු තුනකට කලින් එතුමා මහජන සේවය සඳහා එම ත්‍යාගයෙන් පිදුම් ලැබුවා.

ක්‍රිස්තියානි පවුලක උපත ලත් එතුමා ජේසුස් වහන්සේ කෙරෙහි අවංක භක්තියකින් සමාජ සේවාවන්හි නිරත වූයේ ජාති ආගම් ආදී කිසිම භේදයකින් තොරවය. මා බෞද්ධ පවුලක ඉපද බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් අනුව කිසිම භේදයකින් තොරව සියලු ප්‍රාණීන් කෙරෙහි කරුණාව දැක්වීමේ ප්‍රයත්නයෙහි යෙදෙමින් සේවය කළා. ගැමි ජනතාවන් කෙරෙහි ස්ථිර විශ්වාසයක් ආචාර්ය කිම් මහතා තුළ තිබුණා. මහත්මා ගාන්ධිතුමා මෙන්ම, අධ්‍යාපනය යන්නට මානව සංවර්ධනයෙහි ප්‍රමුඛ ස්ථානය ලබා දුන් එතුමා කය වෙහෙසා වැඩ කිරීම එහි වැදගත්ම අංගය වශයෙන් සලකා එය තුළින් මිනිස් පෞරුෂය පූර්ණ ලෙස ප්‍රබෝධවත් වන බැවින් එවිට අධ්‍යාපනය අර්ථවත් වන බව විශ්වාස කළා. මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් සත්‍යවාදීව ජීවත්වීම සඳහා නිසි මග සෙවීමට ඇති කැමැත්ත යන මූලධර්මය එතුමා කොරියාවේදී ද, මා ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරය තුළින් ද ගොඩනඟා ගත් සංවිධාන දෙකටම පොදු වන්නක් බව කිව යුතුව තිබේ.

භෞතික, සමාජීය, සදාචාරාත්මක, සංස්කෘතික, ආර්ථික, දේශපාලන යන සියලු අංශයන්ගෙන් සියලුදෙනා තුළ ඇති වන අවදිවීම සර්වෝදය ලෙස අර්ථවත් වන අතර ඒ සම්බන්ධයෙන් සෑම මනුෂ්‍යයෙකුටම යහපතක් සිදු විය යුතුය. ජීවිතයේ උපරිම සතුට භුක්තිවිඳීම සඳහා මෙහිදී ඔහු හෝ ඇයගේ පෞරුෂය පූර්ණ වශයෙන් අවදි කළ හැක. ඉන්පසු ප්‍රජාව අවදි කරවීම ද එය මත ජාතික සහ විශ්වමය වශයෙන් අවදි කරවීම ද ප්‍රජා සංවිධානයන්හි තිබිය යුතු බවට මම විශ්වාස කරමි. මීට අවුරුදු 38 කට පෙර

සර්වෝදය ශ්‍රමදාන සංගමය දියත් කරනු ලැබුවේ මෙම උසස් සංකල්පයන් ඔස්සේ ක්‍රියාත්මක වීමෙනි. ශ්‍රී ලංකාවේ ගම්මාන විසිහතර දාහෙන් ගම්මාන 10000 ක ජීවත් වන ගැමි ප්‍රජාවට අද අපි කිසිම වෙනසකින් තොරව සේවය කරමු.

සියලු දෙනාටම සාමය, සෞභාග්‍යය භුක්ති විඳීමට හැකි සමාජයක් බිහි කිරීමේදී අප විසින් සත්‍යය අවිහිංසාව සහ ආත්ම පරිත්‍යාගය වෙත උසස්ම ප්‍රමුඛත්වය දිය යුතුය. ඉතා දුප්පත් බෙලහීන ජනතාවන් එම තත්ත්වයෙන් මුදවා ගැනීමට අපේ විශේෂ අවධානය යොමු විය යුතුව ඇත. සමාජයේ ඉතාම පහළ මට්ටමේ සිටින ප්‍රජාවන් ශක්තිමත් කිරීම සඳහා සමාජීය, ආර්ථික සහ තාක්ෂණික වශයෙන් ඔවුන් බලාත්මක කරනු ලබන වැඩ සටහන් දියත් කළයුතු අතර ආධ්‍යාත්මික, සදාචාරාත්මක, සංස්කෘතික යන ක්ෂෙත්‍රයන්ටත් සමාන සමතුලිත අවධානය ලැබෙන අයුරින් වන ඒකාබද්ධ වැඩ සටහන් ඉන් අර්ථවත් කෙරේ. ශ්‍රී ලංකාවේ ජීවත් වන එවැනි අසරණ දුගී ජනතාවන්ට, ඔවුන්ගේ ස්වශක්තිය, ජනතා සහභාගිත්වය සහ තමන්ගේ සංවර්ධන වැඩ සටහන් විද්‍යාත්මක ලෙස සැළසුම් කිරීම යනාදිය ශක්තිමත් කර ගැනීම සඳහා මනා පෙළඹවීමක් ඇති කිරීමට සර්වෝදය සංවර්ධන වැඩ සටහන්වලට හැකි වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සියලු මනුෂ්‍යයින්ගේ පෝෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනික, සමාජයීය සහ ආධ්‍යාත්මික තත්ත්වයන් නංවාලීමට අපේ රටේ දහස් ගණන් ගම්මානයන්හි වැඩ සටහන් දියත් කර ඇත. ළමුන් සහ කාන්තාවෝ ධර්මිෂ්ට තිරසාර සමාජයක් නිර්මාණය කර ගැන්මේ අධිෂ්ඨානයෙන් පිරිමින් සමඟ උරෙන් උර ගැටී වෙහෙස වී වැඩ කරති.

අද දවසේ මා වෙත මෙම ත්‍යාගය ප්‍රදානය කිරීම තවත් විශේෂිත සිද්ධියක් ලෙස මම දකින්නෙමි. ඔබේ රටට මෙන්ම මගේ රටටත් බොහෝ පොදු සංස්කෘතික මූලාශ්‍රයන් තිබේ. අප දෙරටෙහි ජනතාවන් ඒකරාශී විය යුතුය. අපගේ රටවල් දෙකෙහි ආණ්ඩු ද දැනටම මිත්‍රත්වයක් ගොඩනගා ගෙන ඇත. අපගේ මිත්‍රත්වය ශක්තිමත් කර ගැනීම සඳහා හැකි යමක් කිරීම මගේ අපේක්ෂාවයි.

ඔබගේ ජනතාව යුද්ධ දැක තිබේ. අපේ ජනතාවන්ට ද රටේ උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි පවතින සිවිල් යුද්ධයෙහි අත්දැකීම් ඇත. ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය සහ ආධ්‍යාත්මික තත්ත්වය ඉහළ නැංවීම පමණක් නොව ප්‍රථමයෙන්ම අපේ ජනතාවගේ හදවත් තුළ අන්‍යොන්‍ය සාමය සහෝදරත්වය වගා කර ගත යුතුය. දෙවනුව විශ්වමය වශයෙන් එය ස්ථාපනය කර ගත හැක. ලෝකයේ විවිධ තැන්වල ජීවත් වන මනුෂ්‍යයින්ගේ ලේ වැගිරීම් සහ දුක් කන්දරාවන් අනන්ත අප්‍රමාණව දස ලක්ෂ ගණන් මනුෂ්‍යයෝ අනාථ, වැන්දඹු, ආබාධිත සහ අවතැන් තත්ත්වයට පත්ව සිටිති. ප්‍රචණ්ඩත්වය සමඟ හැප්පීමට ඔවුන්ට නොහැකිය. ඔව්හු සංකල්පිත වර්ගවාදී සහ තවත් විවිධ අන්දමේ අපරාධයන්ට මැදි වී දුක් විඳිති. බෙදී වෙන්ව යාමේ බීජයන් මිනිස් සන්තානයෙන් බැහැර කරවීමට අප විසින් මහන්සි වී යමක් කළ යුතුය. සියලු මනුෂ්‍යයින් එකම විශ්වමය පවුලකට අයත් වූවන් බවත් මිනිස් වෙනස්කම් මිනිසා විසින්ම නිර්මාණය කරනු ලැබූ ඒවා බවත් හැකි සෑම අයුරින්ම ප්‍රජාවන්ට පැහැදිලි කළ යුතුය.



උත්සවය ආරම්භ කරමින් සාංඨාරය නාද කිරීම

උසස් සන්නිවේදන තාක්ෂණය සහ ආධ්‍යාත්මික රැහැන් මගින් අන්‍යොන්‍ය ලෙස එකිනෙකා හදවතින් බැඳ තබන්නා වූ අවිහිංසාවාදී ප්‍රජාවන්ගෙන් සැදී සාමකාමී විශ්ව සමාජයක් ගොඩනැගීමට අපි ප්‍රයත්න දරමු. මෙම ශත වර්ෂය අවසන් වෙද්දී ධනයත්, ආධ්‍යාත්මික ශක්තියත්, දියුණු ආර්ථිකයක්ද සතු වන්නා වූ කොරියාව ආසියාවේ අන් රටවලට ද පරමාදර්ශයකි. මෙවැනි තත්ත්වයක් අත්පත් කර ගැනීමට දායක වූ මිනිස් වර්ගයාගේ පරම සේවකයා වූ ආචාර්ය යොන්ග් කී කිම් ශ්‍රීමතාණන් ගෞරවයෙන් සැමදා සිහිපත් කරමු. ගෞරව කරමු.

287

ගාන්ධි සාම ත්‍යාගය

මහත්මා ගාන්ධිතුමාගේ 125 වන ජන්මෝත්සවය සැමරීම නිමිත්තෙන් ඉන්දිය රජයේ අනුග්‍රහයෙන් ඉන්දිය සංස්කෘතික අමාත්‍යාංශය මගින් වාර්ෂික ජාත්‍යන්තර ගාන්ධි සාම ත්‍යාගය ස්ථාපිත කරනු ලැබීය. 1996 වර්ෂයේදී දෙවන ගාන්ධි සාම ත්‍යාගය මා වෙත ප්‍රදානය කෙරුණි. 1995 වර්ෂයේදී එවකට දකුණු අප්‍රිකාවේ ටැන්සානියාවේ ජනාධිපතිව සිටි ආචාර්ය ජූලියස් කේ. නියරේරේ මැතිතුමා ප්‍රථම ගාන්ධි සාම ත්‍යාගයෙන් පුද ලැබ සිටියේය. ගාන්ධිතුමා විසින් අගය කරනු ලැබූ අවිහිංසාව ලොව පුරා ප්‍රචලිත කිරීම, අවිහිංසාවාදී ක්‍රම තුළින් සමාජ, ආර්ථික සහ දේශපාලනික වෙනස්කම් ඇති කිරීමට ක්‍රම උපායන් නිර්මාණය කිරීම, ලෝක ජනතාව විසින් මුහුණ දෙන්නා වූ දුෂ්කර ප්‍රශ්නයන්ට විසඳුම් සෙවීමට ගාන්ධිතුමා විසින් අනුගමනය කළ මාර්ග ඔස්සේ කටයුතු කිරීම, සාමය හා අවිහිංසාව වෙනුවෙන් කැප වී අඛණ්ඩව සේවය කිරීම හා සමාජයේ අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතා කොට්ඨාශයන් සඳහා මානව අයිතිවාසිකම් සහ සංවර්ධනය ඇති කිරීමට ජීවිතය කැප කොට සේවය කිරීම යන කරුණු සැලකිල්ලට ගනිමින් මෙම ජාත්‍යන්තර ත්‍යාගය සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබිණ. මෙම තේරීම යම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් සඳහා කරනු ලබන අතර ජාති, ආගම්, කුල, ගෝත්‍ර යනාදී භේද කිසිවක් එහිදී සලකනු නොලැබේ.

ඉන්දිය අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන ලද විරුද්ධ පක්ෂයේ නායකතුමිය, උප ජනාධිපතිතුමා, අගවිනිසුරුතුමා ඇතුළු විශේෂ ජූරි සභාවක් මගින් ලොව සෑම ප්‍රදේශයකින්ම එවන ලද නාමයෝජනා 60 කට ආසන්න සංඛ්‍යාවක් අතුරින් මා තෝරා ගෙන තිබුණි. ඉන්දීය රජයේ සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් බී.පී. සිං මහතා විසින් නිකුත් කර තිබුණු ප්‍රවෘත්ති ප්‍රකාශනයේ මෙසේ සඳහන් විනි.

ඉන්දීය ජනාධිපතිතුමන් සමඟ

''1996 වර්ෂය සඳහා ගාන්ධි සාම ත්‍යාගයට මෙවර හිමිකම් ලබා ඇත්තේ ශ්‍රී ලංකාවේ ආචාර්ය ඒ.ටී.ආරියරත්න මහතාය.

හැටපස් වියැති ශ්‍රී ලාංකික සමාජ විද්‍යාඥයෙකු සහ සමාජ සේවකයෙකු වූ ආරියරත්න මහතා මෙම උසස් ජාත්‍යන්තර සම්මානය සඳහා ඒකමතිකව තෝරා ගන්නා ලද්දේ සාමාජික, ආර්ථික සහ දේශපාලන පරිවර්තනයක් සඳහා අහිංසාවාදීව කරන ලද සේවාව නිසාය. ලොව පුරාම සිටින පුද්ගලයන් සහ ආයතනවලින් නාම යෝජනා පත්‍ර කැඳවන ලදී. මන්ත්‍රීවරුන්,

නොබෙල් ත්‍යාගලාභීන්, එක්සත් ජාතීන්ගේ මහලේකම්, උප කුලපතිවරුන්, පර්යේෂණ ආයතනවල ප්‍රධානීන්, පොදු රාජ්‍ය මණ්ඩලයේ මහලේකම්, අන්තර් ජාතික පාර්ලිමේන්තු මණ්ඩලය, ආණ්ඩුකාරවරුන්, මහ ඇමතිවරුන් ආදී විශාල පිරිසක් විසින් නාම යෝජනා පත්‍ර එවා තිබුණි.

ඔහු පරිපූර්ණ ලේඛකයෙකි. දර්ශනය, ගෝලීය සාමය හා අවිහිංසාව පිළිබඳ ඔහු විසින් ප්‍රකාශන රාශියක් පළ කොට ඇත. ආචාර්ය ආරියරත්න මහතා 1969 රමන් මැග්සයිසයි ත්‍යාගයද, 1982 දී බෙල්ජියමේ බෝඩුවින් රාජ්‍ය සම්මානයද, 1986 දී ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් පිරිනැමූ දේශබන්ධු සම්මානයද, 1990 දී ජම්නලාල් බජාජ් ත්‍යාගය, 1992 දී නව වැනි නිවානෝ සාම ත්‍යාගය ද දිනා ගෙන ඇති අතර ඔහු ආසියානු ග්‍රාම සංවර්ධන ආයතනයේ සභාපතිවරයා වශයෙන් ද ලෝක බැංකුවේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ උපදේශක කමිටුවේ ද ලෝක ආගම් පිළිබඳ පාර්ලිමේන්තුවේ සභාපති වශයෙන් ද ක්‍රියා කරයි.''

සම්මාන සහතිකයක්, සමරු ඵලකයක් ඉන්දීය මුදලින් රුපියල් කෝටියක චෙක්පතක් ද ගාන්ධි සාම ත්‍යාගයට අයත් විය.

දෙස් විදෙස්හි පැසසුමට ලක් වෙමින් ඉකුත් දශක තුනහමාරක් තිස්සේ ග්‍රාමීය ජනතාවගේ සහජ ශක්තිය මතු කොට ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට ඉමහත් කැපවීමෙන් කරනු ලැබූ සමාජ සේවාව සඳහා ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරයයේ නායක ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතාට මෙම ගාන්ධි සාම ත්‍යාගය ප්‍රදානය කිරීමට නියමිත බව 1996 ඔක්තෝම්බර් 01 දින ඉන්දීය රජයේ පුවත්පත් නිවේදනයේ සඳහන්ව තිබුණි.

1996 ඔක්තෝම්බර් මස 01 වැනිදා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් නරේෂ්වර් දයාල් මැතිතුමාගෙන් මට අනපේක්ෂිත දුරකතන පණිවුඩයක් ලැබුණි. 1996 ගාන්ධි සාම ත්‍යාගය සඳහා මා තෝරා ගෙන ඇති බව ඉන්දීය රජයෙන් තමාට දන්වා ඇති බව ප්‍රකාශ කළ එතුමා, තම හෘදයාංගම ශුභාශිංසනය පිරිනැමීය. මෙය අතිශයින්ම මගේ සතුටට හේතු වූ කරුණක් බව නොකිවමනාය.

මෙම ත්‍යාගය ලැබීම මා වෙත දක්වනු ලබන ගෞරවයක් ලෙස සලකන බවත්, මගේ සමාජ සේවාවන් සඳහා මහත්මා ගාන්ධිතුමාගේ ජීවිතය හා ඉගැන්වීම විශාල ශක්තියක් වූ බවත් ඉන්දීය අගමැති එච්.ඩී. දේව් ගව්ඩා මහතාට මා යැවූ පිළිතුරු ලිපියක සඳහන් කළෙමි. මා ඉන්දීය නායකයින්ගෙන් ලැබූ ආභාෂය මට මහත් ශක්තියක් වූ බව 'ද හින්දු' පත්‍රයට මා විසින් කරන ලද ප්‍රකාශය එහි පළ කර තිබුණු අතර මහත්මා ගාන්ධිතුමා හමුවීමට අවස්ථාව නොලැබුණ ද එම දර්ශනය අනුගමනය කිරීමේ වැදගත්කම ද හින්දු පත්‍රය අගය කළේය.

ආචාර්ය විනෝබා බාවේතුමා වෙත මම දෙවරක් ගොස් ඇත්තෙමි. ජයප්‍රකාශ් නාරායන්තුමා ද ලංකාවට දෙවරක් පැමිණි අවස්ථාවේදී මම එතුමා බැහැ දැකීමි. ගාන්ධිතුමාගේ ජීවිතය හා ඉගැන්වීම් මගේ සමාජ මෙහෙවරෙහි මූලික පදනම වූ බව නොරහසකි.

ඉන්දියාවේ නවදිල්ලියේ රාෂ්ට්‍රපති භවන්හි අශෝක් ශාලාවේදී 1997 ජනවාරි 01 වන දින සවස 4.00 ට ත්‍යාග ප්‍රදානෝත්සවය ගාම්භීර ලෙස පැවැත්විණි. ඉන්දීය ජනාධිපතිතුමා පෙරහැරකින් ශාලාවට පැමිණීමෙන් පසු භාරතීය ජාතික ගීතය ගායනා කෙරිණ. ඉන් පසු පිළිගැනීමේ කතාව පවත්වා, හේතුපාඨ කියවන ලදී. අනතුරුව ඉන්දීය ජනාධිපති ගරු ශංකර් දයාල් ශර්මා මැතිතුමන් අතින් ගාන්ධි සාම ත්‍යාගය මා වෙත පිරිනමන ලදී. ත්‍යාගය පිළිගැනීමේ කතාව මම පැවැත්වීමි.

ඉන්දීය අගමැති ගරු ශ්‍රී එච්.ඩී. දේව් ගවුඩා මැතිතුමා, උප ජනාධිපති වන කේ. ආර්. නාරායනන් මැතිතුමා, විපක්ෂයේ නායක ගරු ඒ. බී. වජ්පායි මැතිතුමා, ඉන්දීය කොන්ග්‍රස් සභාවේ නායිකා සෝනියා ගාන්ධි මැතිනිය, ඉන්දීය අගවිනිසුරුතුමා, ඇමතිවරු, මන්ත්‍රීවරුන් සහ නවදිල්ලියේ සිටි තානාපතිවරුන් ත්‍යාග ප්‍රදානෝත්සවයට සහභාගි වූහ. කුමන හේතුවක් නිසා හෝ ශ්‍රී ලංකා තානාපතිවරයා එහි පැමිණ සිටියේ නැත.

ජනාධිපති ගරු ශංකර් දයාල් ශර්මා මැතිතුමා සමඟ

ගාන්ධි සාම ත්‍යාගය ලබාගනිද්දී

ඉන්දීය රජයේ අමුත්තන් වශයෙන් මම සහ මගේ බිරිඳ නීතාත්, දියත්, සදීවා, නිම්නා යන දරුවන් ද දැනට අප අතරින් වියෝවී සිටින මහානාම සෙනෙවිරත්න මහතා ද උත්සවයට සහභාගි වූහ.

මගේ ඉන්දීය මිතුරන් පනස් දෙනෙකුගේ පමණ ලැයිස්තුවක් උත්සවයට සහභාගිවීම සඳහා ආරාධනා පත්‍ර යැවීමට භාර දුනිමි. ඔවුන් සෑම දෙනාම වාගේ පැමිණ සිටියහ.

ඉන්දීය ස්වදේශ කටයුතු ඇමති, ඉන්දීය අගමැති එච්.ඩී.දේව් ගවුඩා සහ ඉන්දීය ජනාධිපති ආචාර්ය ශංකර් සමග

1996 දෙසැම්බර් 29 වැනි දින ලංකාවෙන් පිටත් වූ අප සඳහා හෝටලයක කාමර වෙන් කර තිබූ අතර එහි නැවතී උත්සවයට සහභාගි වී ආපසු ආවේ 1997 ජනවාරි 4 වැනිදාය. එදින කටුනායක ගුවන් තොටුපළින් අරඹා ගම්පහ සහ අවිස්සාවේල්ලේ පිළිගැනීම් උත්සව අවසන් කොට අප නිවසට පැමිණෙන විට සවස් විය. ජනවාරි 6 වැනිදා සර්වෝදය මූලස්ථානයේ ද, ජනවාරි 10 වැනිදා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ද, ඊට පසුව ලංකාවේ නොයෙක් පළාත්වලදී ද, අප සහෝදර සේවක සේවිකාවන් සහ ජනතාව විසින් පිළිගැනීම් උත්සව පවත්වන ලදී.

(මීළඟ පරිච්ඡේදයෙන් පළ වන්නේ මා විසින් ත්‍යාගය පිළිගැනීමෙන් පසු කරන ලද දේශනයයි.)

1996 ගාන්ධි සාම ත්‍යාගය පිළිගනිමින් පැවැත්වූ දේශනය

අතිගරු ඉන්දීය ජනාධිපති ආචාර්ය ශංකර් දයාල් ෂර්මා මැතිතුමනි, අතිගරු ඉන්දීය උප ජනාධිපති ආචාර්ය කේ.ආර්. නාරායනන් මැතිතුමනි, ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු එච්.ඩී. දේව් ගවුඩා මැතිතුමනි, ගරු ඉන්දීය අග්‍ර විනිශ්චයකාරතුමනි, විරුද්ධ පක්ෂයේ නායක ගරු ඒ.බී. වජ්පායි මැතිතුමනි, ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගරු නරේෂ්වාර් දයාල් මැතිතුමනි, ඉන්දියාවේ වැඩබලන ගරු ශ්‍රී ලංකා තානාපතිතුමනි, සම්භාවනීය ප්‍රභූවරුනි, නෝනාවරුනි, මහත්වරුනි,

මෙහි පැමිණ සිටින ඔබ හැමට ස්තුතිවන්ත වෙමි. ලෝකයේ ශ්‍රේෂ්ඨ අනුශාසකයන් වන බුදුන් වහන්සේ, ශ්‍රී රාමක්‍රිෂ්ණ පරමහංසතුමා, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, මහමද්තුමා සහ මහත්මා ගාන්ධි යන උතුමන් හෙළි කළ සත්‍යයේත්, අවිහිංසාවේත්, ආත්මහරණයේත් මාර්ගයේ ගමන් කිරීමට ප්‍රයත්න දරන ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරයේ දහස් ගණන් මගේ ගම්බද සොහොයුරු සොහොයුරියන්ගේ ශුභාසිංසන ඔබ වෙත ගෙන එමි. ඔවුන්ගේ ශුභාසිංසන සහ ආශීර්වාද මා ඔබ වෙත ගෙන එන්නේ ඔබගේ සිත් සතන් තුළ සාමයත්, ඔබගේ හදවත් තුළ තෘප්තියත් ඔබ හැමට සෞඛ්‍ය සම්පන්න දීර්ඝායුෂත් ප්‍රාර්ථනය කරමිනි.

1996 වර්ෂයේ ගාන්ධි සාම ත්‍යාගය ප්‍රදානය කිරීමට මා තෝරා ගැනීම වෙනුවෙන් ඉන්දියාවේ අග්‍රාමාත්‍ය ගරු දේව් ගවුඩා මැතිතුමාටත්, විනිශ්චය මණ්ඩලයේ සාමාජික පිරිසටත් මගේ හෘදයාංගම ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි. මේ සම්මානනීය ත්‍යාගය සඳහා මා නම් කළ ලෝකයේ විවිධ රටවල සියලුම මිත්‍රවරුන්ට ද මම ස්තුතිවන්ත වෙමි. මා මීට පෙර ලැබූ ජාත්‍යන්තර සම්මාන සහ ත්‍යාග සියල්ලට වඩා මෙම ත්‍යාගය මට අගනේය.

එසේ වන්නේ භාරතයේ පියාණන් වූද, සාමයේ සහ අවිහිංසාවේ දූතයාණන් වූද මහත්මා ගාන්ධිතුමාගේ නමින් එය දුන් නිසාත්, අපේම මාතෘ භූමිය වශයෙන් ශ්‍රී ලංකාවේ අප විසින් චිරාගතව සලකනු ලබන ඉන්දියාවෙන් එය ප්‍රදානය කිරීම නිසාත්ය. සියලු සත්ත්වයන්ට සේවය කිරීමට මා ප්‍රබෝධවත් කිරීමට උදව් වූ සියලුදෙනා කෙරෙහි කෘතඥතාපූර්වක හැඟීම්වලින් බරව ඉතාමත් නිහතමානීව මම මේ ත්‍යාගය පිළිගනිමි.

ඉන්දීය රජය මහත්මා ගාන්ධිගේ 125 වැනි ජන්ම ශත සංවත්සර සමය තුළ මෙම ගාන්ධි සාම ත්‍යාගය ආරම්භ කළ අවස්ථාවේ එය ලෝකයේ සාමය සඳහා දායක වන අයට ඉන්දියාව පිරිනමන උසස්ම ජාත්‍යන්තර ත්‍යාගය බවට පත් කිරීමට රජයට වුවමනා වූ බව මට දැන ගන්නට ලැබිණ. 1995 දී මෙම ත්‍යාගයේ ප්‍රථම ලාභියා වශයෙන් බෙහෙවින් ගෞරවයට පත් වූ හිටපු ටැන්සානියා ජනාධිපති අතිගරු ආචාර්ය ජූලියස් නියරේරේ මැතිතුමා වැනි ආදර්ශවත් විශ්ව දේශපාලකයකු තෝරා ගැනීමෙන් සහ 1996 දී මා වැනි ගැමි මට්ටමේ නිහතමානී සේවකයකු තෝරා ගැනීමෙන් විනිශ්චය මණ්ඩලය කර ඇත්තේ සාමය සහ යුක්තිය කරා යන ගාන්ධිතුමාගේ අවිහිංසා මාර්ගය ඔස්සේ පිය මැනීමට උත්සාහ දරන සියලුදෙනාම දිරි ගන්වන අභියෝගාත්මක අවස්ථාවක් සලසා දීමය.

මෙම ත්‍යාගය මට පෞද්ගලිකව පිරිනැමුනු සම්මානයක් වශයෙන් මම නොසලකමි. එය බොහෝ දුරට තම අභ්‍යන්තරයෙහි සත්‍යය, අවිහිංසාව සහ තම සහෝදර ජනතාවට සේවය කිරීම යනාදී හැඟීම් සහ සිතිවිලි නිරන්තරයෙන්ම අන්තර්ගත වූ මිනිස් වර්ගයාගේ හෘදය සාක්ෂිය කෙරෙහි විශ්වාසය තබා ගරු කිරීමකි. මෙම ගාන්ධි සාම ත්‍යාගය මා ලබා ගන්නා අතර ගාන්ධිතුමාට සත්‍ය වශයෙන්ම මම ණයගැති වෙමි.

ස්වකීය කාලයෙන් වැඩි කොටස නිදහස් සටන සඳහා වැය කළ නමුත් මහත්මා ගාන්ධිතුමා සැලකිල්ල යොමු නොකළ ගැටළුවක් මානව සමාජයේ නොවීය. තම ස්වයං චරිතාපදානයට

ලියූ හැඳින්වීමේදී එතුමා මෙසේ සඳහන් කරයි. ''මේ තිස් අවුරුදු කාලය තුළ මට ලබා ගැනීමට වුවමනා කළේත්, ලබා ගැනීමට උත්සාහ කළේත් ආත්මාවබෝධයයි. දෙවියන් වහන්සේ මගේ දෙනෙතින්ම දැක ගැනීමටයි.'' මෝක්ෂය දිනා ගැනීමටයි. ආධ්‍යාත්මික, සදාචාරමය, සංස්කෘතික ක්ෂෙත්‍රයේ සිට සමාජ, ආර්ථික සහ දේශපාලන ක්ෂෙත්‍රයන් දක්වා ස්වකීය ජීවිත කාලය තුළ එතුමා ප්‍රකාශ කළා වූද, සිදු කළා වූද, අත්හදා බැලුවා වූද සියලු දේවල් එතුමා යොමු කළේ මෙම ආත්මාවබෝධය නැමැති පරමාර්ථය හෙවත් ශ්‍රී ලංකාවේ සර්වෝදය ශ්‍රමදාන සංසදය තුළ අප ව්‍යවහාර කරන පරිදි පූර්ණ පෞරුෂ ප්‍රබෝධනය සාක්ෂාත් කර ගැනීම උදෙසාය.

ඉන්දියාව අද ශ්‍රී ලාංකිකයෙකුට පිරිනැමූ මෙම ගාන්ධි සාම ත්‍යාගය වූ කලී එකම ආධ්‍යාත්මික මූලාශ්‍රයකින් සම්භවය ලැබූ සාරධර්ම පද්ධතියකට හිමිකම් කියන අප දෙරටේත්, එහි ජනතාවගේත්, දෙරටේ සංස්කෘති අතරේත් දීර්ඝකාලීන සම්බන්ධතාව තවදුරටත් පවත්වා ගෙන යෑමත් සහ නැවත තහවුරු කිරීමත්වේ. එහෙයින් මා මෙම සම්මානය පිළිගැනීම වූ කලී අප ජනතාවගේ අභිවෘද්ධියටත් පොදුවේ විශ්ව මානව සමාජයේ අභිවෘද්ධියටත් තුඩු දෙන පරිදි එකී පොදු සාරධර්ම මත පදනම් වූ අපේ බැඳීම තවදුරටත් ශක්තිමත් කරනු පිණිස මගෙන් ඉටු විය යුතු සම්පූර්ණ ජීවිත කාලය හා බැඳී ඇති සදාචාරමය කැපවීමක් වේ. 1927 නොවැම්බර් මස ගාන්ධිතුමාගේ ශ්‍රී ලංකා සංචාරයෙන් පසු ශ්‍රේෂ්ඨ ජනතා නායකයෙකු වූත්, ඉන්දියාවේ සිටි ප්‍රථම ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා වූත් ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මැතිතුමා ප්‍රකාශ කළ අදහසක් මට මෙහිදී සිහිපත් වේ. එතුමා මෙසේ පැවැසුවේය: ''ගාන්ධිතුමාගේ සංචාරයේ ජයග්‍රහණය අන් කිසිවක් නොව සත්‍යය, අවිහිංසාව සහ ආත්ම පරිත්‍යාගය යන මේ පරමාදර්ශයන්ට ලංකාව දැක්වූ උපහාරයයි.''

ගාන්ධිතුමා වෙනුවෙන් අපට දක්විය හැකි සැබෑ උපහාරය නම් එතුමා සිය ජීවිතය කැප කළ මෙම පරමාදර්ශයන් අනුව ජීවත්වීමත්, ඒවා පෝෂණය කිරීමට ආත්ම පරිත්‍යාගයෙන් ක්‍රියා කිරීමත්ය. මෙම පරමාදර්ශයන්ගෙන් බැහැර වුවහොත් අප රටවලට හෝ පොදුවේ මානව සමාජයට හෝ අනාගතයක් ඇති නොවනු ඇත.

ඉන්දියාවේ දායකත්වය:

මා ඉපදීමට බොහෝ කලකට පෙර ගාන්ධිතුමා ශ්‍රී ලංකාවට ගියේය. අපේ දෙමව්පියෝත්, වැඩිහිටියෝත්, එතුමාගේ ගමන විචිත්‍රාකාරයෙන් සිහි කළහ. මා ඉගෙන ගත් ගාල්ලේ මහින්ද විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ මුලසුන හෙබවූ ගාන්ධිතුමා, මා ඉගැන්වූ කොළඹ නාලන්දා විද්‍යාලයේ ශිෂ්‍යයන් අමතා දේශනයක් ද පැවැත්වීය. එතුමා 1927 සිය චාරිකාවේදී ශ්‍රී ලංකාව පුරා දකුණේ සිට මධ්‍ය කඳුකරය දක්වාත්, උතුරේත් සංචාරය කළේය. ඔහු ගිය හැම තැනකම සියලු ජාතීන්ට සහ සියලු ආගම්වලට අයත් දහස් සංඛ්‍යාත ජනයා ඔහු පිළිගත් අතර, කාදි මිල දී ගන්නා ලෙස එතුමා කළ ආයාචනය ද මුදුනින් පිළිගත්තේය. ඔව්හු එවකට ඉන්දියාවේ දිළිඳු ජනතාවගේ දුක තුරන් කිරීමට නොමසුරු පරිත්‍යාග ද කළහ.

''ඉන්දියාවේ වෙසෙන දස ලක්ෂ ගණන් ගොළු වූද, සාගින්නෙන් පෙළෙන්නා වූද ජනතාවගේ නියෝජිතයා හැටියට තමා වුවමනාවෙන්ම පෙනී සිටිමින් දරිද්‍ර නාරායන් වෙනුවෙන්'' තමා ශ්‍රී ලංකාවට පැමිණි බව ගාන්ධිතුමා සිය දේශනවලදී පුන පුනා කියා සිටිය ද ආධ්‍යාත්මික පුනරුදයක් උදෙසා වෙහෙසී වැඩ කරන ලෙසත්, සංස්කෘතීන් ආරක්ෂා කරන ලෙසත්, චාම් දිවි පැවතුම් පුරුදු කර ගන්නා ලෙසත්, අන්‍යයන් හා සහජීවනයෙන් ද, ස්වභාව ධර්මයට එකඟව ද ජීවත් වන ලෙසත්, සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටීමට නොඳුරු වෙහෙසක් නැත. එතුමා වෙනුවෙන් පවත්වන ලද පිළිගැනීම් උත්සවවලදිත් අනෙකුත් රැස්වීම්වලදීත් අප දෙරට මුහුණ පෑ ඉන්දු-ශ්‍රී ලංකා සම්බන්ධතා, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ කම්කරු

ප්‍රශ්න වැනි බොහෝ ගැටළු ගැන සිය අදහස් ප්‍රකාශ කළ අතර, අප රටවල අනාගත සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ ද ගෙන හැර දක්වීය.

''ගාන්ධි සමඟ ලංකාවේදී සියලුම වැදගත් කතාවල අනුමත පෙළ සහිත ලංකා සංචාරය පිළිබඳ විස්තරයක්'' නමැති පොත ලියා පළ කළ ශ්‍රීමහාදේවී දේසායි මහතාට අපි කෘතඥතා පූර්වක අපේ ණයගැති භාවය ප්‍රකාශ කරමු. ගාන්ධිතුමාගේ ප්‍රකාශයක් එහි මුල් කවරයේ මෙසේ උපුටා දක්වා ඇත. ''සබඳතාව තව තවත් දෘඩ කර ගන්න - ගාන්ධි'' අප දෙරටේම විවිධ ජාතීය, ආගමික හෝ වාර්ගික භේදවීම්වලට හේතු වූ සාධක කෙරෙහි සැලකිල්ලක් දක්වන නායකයන් මේ කුඩා පොතේ වාර්තා කර ඇති ගාන්ධි වදන් අධ්‍යයනය කිරීමට සැලකිලිමත් වූයේ නම් අපේ ශෝකජනක මෑත ඉතිහාසයේ මාර්ගය වෙනස් කර ගැනීමට මං සලස්වා ගත හැකිව තිබුණා පමණක් නොව, අපගේ සංස්කෘතිමය ජීවිතයේ සියලුම අංශවල ප්‍රගමනයක් ද ලබා ගත හැකිව තිබිණි. එසේ වී නම් පසුගිය කාලයේ ඇති වූ අවිශ්වාස, දෘඩි වාදභේද, ගැටුම්, ලේ හැලීම්, තස්ත්‍රවාදය සහ අවිනිශ්චිතතා දක ගැනීමේ අවස්ථා වළක්වා ගත හැකිව තිබිණි.

දැන් අප දෙරට අතර පවත්නා විශිෂ්ට සබඳතා උපයෝගී කර ගෙන, සබඳතා දෘඩි කර ගැනීමට අපට හැකිය. මේ සඳහා සහස්‍ර වර්ෂ සංඛ්‍යාත ආධ්‍යාත්මික සංස්කෘතික මූලයන් පමණක් නොව අද අපට ප්‍රයෝජනයට ගත හැකි සන්නිවේදන තාක්ෂණයද උපයෝගී කර ගත හැකිය. එවිට ලෝකයේ මේ කොටසේ විද්‍යාමාන වෙනත් රටවල් සමඟ එක්විය හැකි ආර්ථික බලවේගයන් පමණක් නොව මේ මිහිමත පෝෂණය කළ හැකි ජීවිතයක් සඳහා අවශ්‍ය ආධ්‍යාත්මික බලවේගයක් ද අපට සාක්ෂාත් කර ගත හැකිය.

ගාන්ධිතුමාගේ ඉගැන්වීම් අපේ අධ්‍යයන විෂය මාලාවේ කොටසක් නොවූ හෙයින් මගේ වයසේ බාල පරපුර එතුමා ගැන

දන්නේ ඉතා අල්ප වශයෙනි. ගාන්ධි පිළිබඳ මගේ උනන්දුව දැල්වුණේ උදක්ම අහම්බෙනි. එනම්, 1948 පෙබරවාරි මස 01 වැනි දින මගේ ගමේ ගැමියන් පිරිසක් අප රටේ පුවත්පතක් බලා මහා පෞද්ගලික හෝ ජාතික ව්‍යසනයක් සිදු වී ඇති අවස්ථාවකදී මෙන් හඬා වැලපෙනු දුටු අවස්ථාවේදීය. මේ අනපේක්ෂිත දර්ශනය උද්ගත වූයේ ගාන්ධි ඝාතනය කර ඇති බව සුවිසල් අකුරු සහිත ශීර්ෂ පාඨයකින් කියැවූ අවස්ථාවේය. මම ද එම පිරිස හා වැළපෙන්නට වීමි.

ජීවිතයේ දෙවැනි දශකයේ මැද භාගයේ පසු වූ මා ලත් මෙම අත්දැකීම මගේ ජීවිතය කෙරෙහි සදාකාලික බලපෑමක් ඇති කළේය. ඉන් පසු එතුමා විසින් හෝ එතුමා ගැන ලියා තිබුණු මට සොයා ගත හැකි වූ හැම කෘතියක්ම කියවන්නට මම පටන් ගතිමි. මගේ බෞද්ධ හැදියාව, නිහතමානී සහ සමාජ සේවාභිලාෂී දෙමව්පියන් සහ ග්‍රාමීය ප්‍රජාව සහ ඇතැම් විට දිළිඳු ජනයා සමඟ ජීවත් වෙමින් ඔවුන්ට ආධාර කිරීමට මගේ අතීත ජීවිතවලින් ලැබුණු කර්මයේ බලවේගයද යන මේ කරුණු නිසා බාල වියේදීම මා අදහස් අතින් ගාන්ධිතුමාගේ දර්ශනයට නැඹුරු වූවා විය හැකිය. උසස් විද්‍යාලයීය අධ්‍යාපනය ලබමින් සිටියදී ද මම හොඳින් ඉගෙන, ඉහළින් විභාග සමත්වීමට පමණක් නොව මගේ ගම්බද ජනතාවට සේවයක් කොට, ශ්‍රී ලංකාවේ නොදියුණු ප්‍රදේශවල ඉතා දිළිඳු, බලතල රහිත, කිසිවකු විසින් නොසලකා හරින ලද මගේ රටේ ජීවත් වූ ජන කොටස් ජීවත් වූ දිළිඳු තත්ත්වය සියැසින්ම දැක බලා ගෙන ඔවුන් පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමට ද මම කැපවීමකින් ක්‍රියා කළෙමි. නොදියුණු ජන කොටස් යනුවෙන් එවක රජය හැඳින් වූ ප්‍රජාවන් සමඟ සමීප සම්බන්ධකම් පැවැත්වූ වැඩිහිටි මිතුරෙකුගෙන් මා ලැබූ මාර්ගෝපදේශ කෘතඥතා පූර්වකව මෙහිදී මම සිහිපත් කරමි. එම අවදියේදී මගේ සිත් සතන් එම ජනතාව ඇසුරේ පැවැතුණ ද ඔවුන් ගොදුරු වූ අසාධාරණකම් වළක්වාලීමට කිසියම් අවිහිංසක ක්‍රියා මාර්ගයක් ගැන සිතීමට මට නොහැකි විය. මෙහිලා ප්‍රචණ්ඩ වූද, විප්ලවකාරී වූද ක්‍රියා මාර්ග කෙරෙහි මගේ තරුණ සිත

පෙළඹුණේ මා එම අවධියේදී පරණ සෝවියට් දේශයේත්, මහජන චීනයේත්, නැගෙනහිර යුරෝපයේත්, වෙනත් රටවලත් ක්‍රියාත්මක වූ බවට වාර්තා වූ විප්ලවකාරී වෙනස්වීම් ගැන මා වැඩි වැඩියෙන් කියවූ නිසාය. මා අඛණ්ඩව මගේ ප්‍රජා සේවා කටයුතු කර ගෙන ගිය නමුත් අනාගතය උදෙසා මාර්ගය හෙළි පෙහෙළි කර ගැනීමට පැහැදිලි දර්ශනයක් එම අවධියේදී මට නොවීය.

මම 1957 දෙසැම්බරයේදී ප්‍රථම වරට ඉන්දියාවට පැමිණියෙමි. කන්‍යා කුමාරිවල සිට ශ්‍රී නගර් දක්වාත්, බොම්බායේ සිට කල්කටාව දක්වාත් මම සංචාරය කළෙමි. 1959 දෙසැම්බරයේදී මගේ දෙවැනි ඉන්දියා ගමන මා සමඟ තවමත් වැඩ කරන සහෝදර ගුරුවරයකු වන ධර්මා ගුණසිංහ සමඟ පැමිණියෙමු. දිල්ලියට පැමිණි අපගේ එම ගමන ඉතා වාසනාවන්ත ගමනක් වූයේ නූතන ඉන්දියාවේ ආරම්භක පීතෘවරුන් වන අග්‍රාමාත්‍ය ශ්‍රී ජවහල්ලාල් නේරු, ජනාධිපති ආචාර්ය රාජේන්ද්‍ර ප්‍රසාද්, උප ජනාධිපති ආචාර්ය ශ්‍රී එස්. රාධක්‍රිෂ්ණන් වැනි උතුමන්ට සවන් දීමට පමණක් නොව, පෞද්ගලිකව ඔවුන් සමඟ කතා බහ කිරීමට පවා ඉඩ ප්‍රස්ථා ලැබුණු හෙයිනි. මෙම සංචාරයේදී මම, ශ්‍රේෂ්ට ඉන්දීය උගතුන් දේශන පැවැත්වූ නව ලෝක අධ්‍යාපන සහෝදරත්වය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට ද සහභාගි වූයෙමි. නිදහස ලැබීමෙන් පසු ඉන්දීය සමාජයේ ගාන්ධි සංකල්පය පිළිබඳව කෙරුණු ව්‍යක්ත විවරණයකදී අධ්‍යාපනඥ ආචාර්ය එම්.ජී.රාමචන්ද්‍රන් මහතා පාවිච්චි කළ ''සර්වෝදය'' යන වචනය මගේ දෙසවනට වැටුණු සැණෙකින් එහි මා ජීවත් විය යුතු වුත්, එයට මගේ ජීවිතය කැප කළයුතු වූත් පරමාදර්ශය ලෙස එය මා අවදි කරවීය.

අනතුරුව මම පන්ජාබයේ භූදාන් පාදයාත්‍රා ව්‍යාපාරයෙහි නියුක්තව සිටි ආචාර්ය විනෝබා භාවේ හමුවීමට ගොස් ඔහු සමඟ

දින කිහිපයක් ඇවිද්දෙමි. ඔහුගේ ආශීර්වාද, උපදෙස් හා ආභාෂය ලබා ගෙන මා පෙරළා ශ්‍රී ලංකාවට පැමිණියේ සමස්ත සමාජ ප්‍රතිසංස්කරණයක් දියත් කිරීම සඳහා අවිහිංසක ක්‍රමයක් අත්හදා බැලීමේ දැඩි අධිෂ්ඨානයකින්ය. මස්තකප්‍රාප්ත කර ගැනීම දුෂ්කර වූ මේ කාර්යයේදී මා හා පළමුවෙන්ම එකතු වූයේ කොළඹ නාලන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමාත්, ගුරු මණ්ඩලය හා ශිෂ්‍යයනුත්ය.

පසුව ඉන්දීය ජනාධිපති ධූරයට පවා පත් වූ ශ්‍රී වී.වී. ගිරි මැතිතුමාගෙන් පටන් ගෙන, ශ්‍රී ලංකාවේ දැනට සිටින ශ්‍රී නරේශ්වාර් දයාල් මැතිතුමා දක්වා ශ්‍රී ලංකාවේ සිටි ඉන්දීය මහ කොමසාරිස්වරුන් සියලුදෙනා ද, ඉන්දියාවේ අනුප්‍රාප්තික ජනාධිපතිවරුන් සහ අග්‍රාමාත්‍යවරුන් කිහිප දෙනෙක් ද, ප්‍රාන්ත රාජ්‍යවල ආණ්ඩුකාරවරු ද, වෙනත් නායකයන් බොහෝ දෙනෙක් ද මා ඉන්දියාවට වරින් වර පැමිණි හැම විටකම මා දිරි ගන්වා මට ආශීර්වාද කළහ. ශ්‍රී ලංකාවේ සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය ගොඩනැගෙමින් පැවති කාලය තුළ කිහිප වතාවක්ම අප හමුවීමට ගිය ශ්‍රී ඊ.ඩබ්ලිව්. අරියනායගම් සහ ශ්‍රීමතී ආශාදේවී අරියනායගම්, ශ්‍රී ජයප්‍රකාශ් නාරායන් සහ ශ්‍රීමතී ප්‍රභාවතී නාරායන්, ආචාර්ය ආර්.ආර්. දිවාකර් සහ තවත් ගාන්ධි නායකයන් කිහිප දෙනෙක්ම අපට හැම ධෛර්යයක්ම දුන්හ. ඔවුන් දැනට ජීවතුන් අතර නොමැති වුවත් මේ අවස්ථාවේ ඒ සියලුදෙනාම මම කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

සර්වෝදය සමාජයඃ

1997 ජනවාරි මස 01 වැනිදා වන අද දින ඉන්දියාවේ සිය නිදහස ලැබීමෙන් පසු එළඹෙන 50 වැනි වර්ෂයේ ආරම්භක දිනයයි. අද සිට පරම්පරාවලින් අවුරුද්දක් ගිය තැන, ශ්‍රී ලංකාව ද නිදහස ලබා ගැනීමෙන් පසු වර්ෂ පනහක් සම්පූර්ණ කරන අවස්ථාව

එළඹේ. තවත් අවුරුදු තුනකින් අප සියලුදෙනාටම තුන්වන සහශ්‍ර වර්ෂයේ උදාව දක ගත හැකිය. එහෙයින් ස්වාධීන වූත්, අන්‍යෝන්‍ය වශයෙන් යැපෙන්නා වූත්, ජාතීන් වශයෙන් ද සමීප සම්බන්ධතා සහිත වූත්, සමාන සංස්කෘතීන් සහිත වූත් ජනතාවන් වශයෙන් ද අපේ ජයග්‍රහණය සහ පරාජයන් අතීතයට ද බලපාන සේ සලකා බලා අගැයීමට මෙය යෝග්‍ය අවස්ථාවක් බවට ඔබ සියලුදෙනාම එකඟ වනු නොඅනුමානය.

සංස්කෘතික, ආර්ථික හා දේශපාලන පරාධීනත්වයෙන් අප මුදා ගැනීමට ආත්ම පරිත්‍යාගයෙන් ක්‍රියා කළ අපේ මුතුන් මිත්තන් ඔවුන් පසුව එන පරම්පරාවලින්, පාලන ආයතනවලින්, සමාජ හා ආර්ථික පද්ධතිවලින් අපේක්ෂා කළ කාර්යයන් ඉටු කර තිබේ ද? ඉටු කර නැත්නම් ඒවා නිවැරදි කිරීමට දැන් අප විසින් ගත යුතු පියවරවල් කවරේද? ගවේෂණාලෝකය තමන් වෙත සහ තමන් පාලනය කරන ආයතන වෙත එල්ල කොට මේ ප්‍රශ්න දැඩි ලෙස සලකා බලන මෙන් දෙරටේම නායකයන්ගෙන් මම ආයාචනය කරමි. ගාන්ධිතුමා හැම විටම විඳින්නට සිදු වූ දුක්ගැහැට නොතකා සත්‍යය උදෙසාම සටන් කිරීමට ප්‍රෝත්සාහී විය. අපිදු එතුමා ආදර්ශයට ගෙන නිර්භීතව ක්‍රියා කළයුතු වෙමු. ගාන්ධිතුමාගේ අදහස් අනුසාරයෙන් අන්තර්ඥානය වර්ධනය කර ගැනීමෙන්, අප මුහුණ පා සිටින ගැටළුවලට විසඳුම් සොයා ගත හැකිය යනු මගේ හැඟීමයි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, 1996 වර්ෂයේ ගාන්ධි සාම ත්‍යාගය පිරිනැමීමට මා තෝරා ගෙන ඇති බව මා වෙත දන් වූ ඔබතුමාගේ ලිපියේ මෙම ත්‍යාගය සඳහා මා තෝරා ගැනීමට සුදුසුකම් ලැබූ ඇතැම් මිණුම්දඬු අවධාරණයෙන් සඳහන් කර තිබිණ. මෙම මිණුම්දඬුවලින් කිහිපයක් මෙසේය:

1. ගාන්ධි සාරධර්ම ලොව පුරා නඟා සිටුවීම
2. අවිහිංසාව මගින් සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට යත්න දැරීම.
3. ලෝකය පුරා පවතින නොවිසඳිය හැකි සේ පෙනෙන ගැටළු විසඳීමට ගාන්ධිතුමාගේ ඉගැන්වීම උපයෝගි කර ගැනීම.
4. සාමය සහ අවිහිංසාව උදෙසා ස්වාර්ථය නොසලකා සේවය කිරීම සහ
5. සමාජයේ ඌන වරප්‍රසාද සහිත කොටස් කෙරෙහි විශේෂ අවධානයක් සහිතව මානව දුක්ඛිත භාවය තුරන් කිරීම මගින් සමාජයේ යුක්තිය සහ සාමය පැවැත්වීමට දායකවීම යන මේවාය.

මේ වූ කලී සැබැවින්ම මගේ සොහොයුරු පිරිස සහ මා පසුගිය දශක හතරකට ආසන්න කාලය තුළ කිරීමට උත්සාහ දරන කටයුතුවල සම්පිණ්ඩනයකි. එහෙයින් අපගේ මානව සමාජයේ උන්නතිය සඳහා අප ඉටු කරන දෘෂ්ටිවාදීය, ආයතනික සහ ප්‍රායෝගික වැඩ සටහන් සහ ක්‍රියාවලීන් ඉතා ලුහුඬින් හෝ මේ උත්කර්ෂවත් අවස්ථාවේදී විස්තර කිරීම මගේ යුතුකමක් සේ මම සලකමි.

සීග්‍ර වේගයකින් අද සිදු වී ගෙන යන පරිදි ද්‍රව්‍ය වෙළඳපොල විශ්ව ව්‍යාප්ත කිරීමෙන් පමණක් මානව වර්ගයා යුක්තිය හා සාමයට සමීප නොවනු ඇත යනු මගේ විශ්වාසයයි. සැබැවින්ම එහි ප්‍රතිඵලය විය හැක්කේ යුක්තියට හා සාමයට ඉඳුරාම විරුද්ධ දෙයකි. එනම්: තියුණු තරඟකාරිත්වයක් ඇති වී, එමගින් ප්‍රචණ්ඩභාවය සහ අයුක්තිය වඩාත් උග්‍රවීමය. ගෞතම බුදුන් වහන්සේත්, මහත්මා ගාන්ධිතුමාත් අදහස් කළ පරිදි මිනිසුන්ගේ

හෘදය සාක්ෂිමය ප්‍රතිසංස්කරණයක් විශ්ව ව්‍යාප්ත කිරීමෙන් මානව වර්ගයා සාමය සහ යුක්තිය කරා සමීප කරවීම නිසැකවම කළ හැකිය. එහෙත් අද ලොව පුරා දිළිඳු ජනතාව දුක් පීඩාවන්ට ගොදුරු කරන ව්‍යුහාත්මක ප්‍රචණ්ඩ ක්‍රියා ගැන ද ගාන්ධිතුමා දැන සිටියේය. අප විසින් අවිහිංසාවෙන්ම සමනය කළ යුත්තේ මේ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩ භාවයයි. ආධ්‍යාත්මික දියුණුවේ හරය වන්නේ සියලුම සචේතනික සත්ත්වයන් කෙරෙහි පතුරු වන මෛත්‍රියයි. මෛත්‍රිය මගින් විශ්ව ව්‍යාප්ත මානව සම්බන්ධතා ප්‍රතිසංස්කරණය කිරීම මගින් මානව චින්තනයට, වචනයට හා ක්‍රියාවට අවිහිංසාව සූදානම් කර ගත යුතුය.

මෙයින් අදහස් කෙරෙනුයේ කුමක්ද? කවර වෘත්තියක යෙදුණද, ආත්මාවබෝධය ඇති කර ගැනීම සඳහා ආධ්‍යාත්මික දියුණුවක අවශ්‍යතාව කෙරෙහි හැම මිනිසකුගේ සිත් සතන් මෙහෙය විය යුතු බවයි. ආත්මාවබෝධය කවර වචනයකින් විස්තර කළද එයින් අදහස් වන්නේ පරම සන්තුෂ්ටියයි. බුදුන් වහන්සේ දේශනා කළ පරිදි ආර්ය අෂ්ටාංගික මාර්ගය වැනි ආත්මාවබෝධය කරා වැටී ඇති මාර්ගයට අප ස්ථිර වශයෙන් පිවිසුණු විට, එම මාර්ගයේ ගමන් කිරීමේදී කවරාකාර දුක්ගැහැට එළඹුනද, ජීවත්වීමේ ප්‍රීතිය විඳ ගැනීමේ අවස්ථාව එළඹේ. කෙනෙකු තුළ සියල්ලන් කෙරෙහි මෛත්‍රිය නොමැති විටද ඔහු තම සිතිවිලි, වචන හා ක්‍රියා අවිහිංසාවෙන් තොර වන විටද, ඔහු තුළ ආධ්‍යාත්මික දියුණුවක් ඇති විය නොහැකිය. එබඳු පුද්ගලයන්ගෙන් බිහි වන පරමාදර්ශී සමාජය සියලු සත්ත්වයන්ගේ ශුභ සිද්ධිය සහතික කෙරෙන්නා වූත්, සියලුදෙනාගේම පෞරුෂ ප්‍රබෝධනය සඳහා ඉඩ ප්‍රස්ථා සැලසෙන්නා වූත් සමාජයක් වනු ඇත. එබඳු සමාජය ගාන්ධිජී හැඳින්වූයේ සර්වෝදය සමාජය යනුවෙනි. මා මගේ ජීවිතය කැප කර තිබෙන්නේ මගේ රටේත් ලෝකයේත් සර්වෝදය සමාජයක් ගොඩනැගීම උදෙසාය.

පුද්ගලයකු සම්බන්ධයෙන් සර්වෝදය යනු පූර්ණ පෞරුෂෝදයයි. පවුලක් සම්බන්ධයෙන් සර්වෝදය යනු මුළු පවුලේම ප්‍රබෝධය හෙවත් කුටුම්බෝදයයි. ගමක් සම්බන්ධයෙන් සර්වෝදය යනු ගමේ සමස්ත ප්‍රබෝධය ඇති කරන ග්‍රාමෝදය හෙවත් ග්‍රාම ස්වරාජ්‍යයි. නාගරික සමාජය සම්බන්ධයෙන් සර්වෝදය යනු නගරෝදය හෙවත් නගර ස්වරාජ්‍යයයි. ජාතික සමාජය සම්බන්ධයෙන් සර්වෝදය යනු දේශෝදයයි. ලෝක සමාජය සම්බන්ධයෙන් සර්වෝදය යනු විශ්වෝදයයි. අපේ පරමාර්ථය වනුයේ මේ අවස්ථා හයේදීම සංවර්ධනය, සාමය සහ යුක්තිය කරා යොමු වූ අවිහිංසාව පදනම් කර ගත් ස්ථිරසාර ක්‍රියාවලීන් ප්‍රාදුර්භූත කිරීමය.

අප මෙය කරන්නේ කෙසේද? අඩුම වරප්‍රසාද භුක්ති විඳින ජන කොටස් කරා අප ගොස් ඔවුන් සමඟ දවස් කිහිපයක් ජීවිත් වීමටත් එමගින් අපේ අදහස්, උත්සාහයන්, දක්ෂතා සහ අප සතු වෙනත් කවරාකාර වූ හෝ සම්පත් ඔවුන් සමඟ බෙදා හදා ගනිමින් අපගේ පෞරුෂයත්, ප්‍රබෝධවත් කර ගනිමින් අපට සහයෝගය දක්වන ලෙස අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටිමු. ඉන් පසු එම ජන කොටසේ උග්‍ර අවශ්‍යතාවක් සපුරාලිය හැකි පරිදි ඔවුන් සමඟ සාකච්ඡා කොට, තෝරා ගත් ප්‍රයෝජනවත් කාර්යයක් ඔවුන් සමඟ හවුලේ ඉටු කරමු. අප සියලුදෙනා එකමුතුව ඒ කාර්යය සැලසුම් කොට ඔහුට හෝ ඇයට නිරත විය හැකි උසස්ම කාර්යය වන සැබෑ මිනිස් සමාජයක් ගොඩනැගීමේ කාර්යයට සහභාගිවීමේ අගය හැම පුද්ගලයෙකුටම අවබෝධ කර දී කිහිප දිනකට හෝ ඔවුන් තුළ උසස් ගුණ ධර්ම වගා කිරීමට පියවර ගන්නෙමු. පිටතින් පැමිණෙන ස්වේච්ඡා සේවකයෝත් ගමේ සිටින ගැහැණු පිරිමි ළමයි සියලුදෙනාත් මෙහිදී එකට ජීවත් වෙති. එක්ව අවදි වෙති. එක්ව භාවනා කරති. එක්ව ආහාර පිස අනුභව කරති. එක්ව ගී ගයමින් නටමින් විනෝද වෙති. මෙනයින් විධිමත්ව කෙරෙන ඉගැන්වීමකින් තොරව ඔවුනොවුන්ගෙන් බොහෝ දේ උගනිති.

මෙම කඳවුරුවලදී පාරවල් තැනීම, වාරිමාර්ග, වැව් ඉදිකිරීම සහ ඇලවල් තැනීම වැනි දේට වැඩියමක් සිදු කෙරේ. දැන් මානව සම්පත් සංවර්ධනය යනුවෙන් හැඳින්වෙන දේටත් වැඩි දෙයක් සිදු කෙරේ. අඛණ්ඩ මානව පෞරුෂෝදය ක්‍රියාවලියක් ගම තුළ ක්‍රියාත්මක වන මේ මූලික කාර්යයේදී ඉටු වේ. මේ කාර්යය ආධ්‍යාත්මික හා මානසික වූ පොදු කාර්ය පහසුකම් ගොඩනැඟීම වශයෙන් හඳුන්වමු.

මානව සමාජයේ හැම තරාතිරමකම අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වූ අගතිගාමී ක්‍රියාවලීන් හතරක් ක්‍රියාත්මකවේ. බුදුන් වහන්සේ මේවා ඡන්ද, ද්වේෂ, භය සහ මෝහ යනුවෙන් හැඳින්වූහ. එබඳු අගතිගාමී දේවලට මූලික වශයෙන් හේතු වි ඇත්තේ කුල, ආගම්, ජාති, භාෂා, දේශපාලන, පන්ති, වර්ණ හෝ වෙනත් ආකාරයෙන් පවත්නා බෙදීම්ය. සර්වෝදය ශ්‍රමදාන කඳවුරක මෙබඳු වාදභේද ඉස්මතු නොවේ. ඒ වෙනුවට එහි වගා කෙරෙනුයේ ජීවිතයට ගරු බුහුමන් දැක්වීම, සංස්කෘතික හා වෙනත් වෙනස්කම් ඉවසා සිටීම, කරුණා සහගත සේවය, එබඳු පරාර්ථකාමී සේවයෙන් කෙනෙකු ලබන සුබ වින්දනය සහ උපේක්ෂාව වැනි ගුණධර්මය. මේ ගුණධර්ම තව දුරටත් පරිපූර්ණ වීමට එහිදී ක්‍රියාත්මක වන හවුලේ වැඩ කිරීම, ප්‍රසන්නතාවය, නිර්මාණාත්මක ක්‍රියා සහ පුද්ගලයන් සමානත්වයෙන් ආශ්‍රය කිරීම යන මේවා උපකාරීවේ. හාත්පසින්ම වෙනස් ආකාරයේ මානසික රැකවරණයක් සහ අන්‍යෝන්‍ය වශයෙන් පදනම් වූ ආධ්‍යාත්මික ප්‍රබෝධයක් මේ කඳවුරුවලට සහභාගි වන අර්ථලාභීන්ට නිරායාසයෙන්ම ලැබේ. තවද ස්වභාවික ක්‍රියාකාරකම් ඔස්සේ මානව යුතුකම් සහ අයිතිවාසිකම් අපේ පෞද්ගලිකත්වය තුළ රෝපණය වීමක් ද මෙහිදී සිදුවේ.

මේ ව්‍යාපාරය ආරම්භයේ සිට මේ දක්වා දිවයින පුරා හැම ප්‍රදේශයකම මෙබඳු කඳවුරු පවත්වනු ලැබේ. අප රටේ දහස් ගණන් පිරිස්, ලෝකය පුරා සිය ගණනක පිරිස් එම කඳවුරුවලට

සහභාගි වී ඇත. මේ ක්‍රියාකාරකම්වලින් ගම්බද ජනයා ලබන භෞතික ප්‍රතිලාභ කෙරෙහි පමණක් ආර්ථික විද්‍යාඥයන්ගේ සැලකිල්ල යොමු වන නමුත් මෙහි සුවිශේෂ වශයෙන් වැදගත් කාර්යය වනුයේ මේ මගින් සිදුවන සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියයි. අප වැඩි අවධානයක් දක්වන්නේ මේ ගුණාංගය කෙරෙහිය. යම්කිසි ආර්ථික වැඩ සටහනකින් දිළිඳු ජනයාගේ මුදල්මය ලාභ තාවකාලිකව වැඩි විය හැකිය. එහෙත් එම මූල්‍ය ලාභවලින් දිගු කාලීන වූ නියත ඵල නෙලා ගත හැක්කේ ආත්ම බල වර්ධනයකින් පමණි. උදාහරණයක් වශයෙන්, අප මෑතකදී ආරම්භ කර ඇති නව වැඩ සටහනක් ගෙන හැර දැක්විය හැකිය. ඒ සර්වෝදය සංවර්ධන බැංකු පද්ධතියයි. මේවා පිහිටුු වන්නේ නොදියුණු ගම්මානවල ජනතාවගේම ඉතිරිකිරීම් උපයෝගී කර ගෙනය. ඔවුන් අතුරින්ම පුහුණු වූ කළමනාකරුවන් යටතේ මේ බැංකු ක්‍රියාත්මක වන අතර එම කළමනාකරුවන්ගෙන් වැඩි දෙනෙක් තරුණ කාන්තාවන්ය. ඔවුන්ට යෝග්‍ය ශිල්පීය උපදෙස් සහ පවත්නා දේශීය හා ජාත්‍යන්තර ක්‍රමය තුළ වෙළඳපොල ක්‍රියාත්මක වන ආකාරය ගැන දැනුමක් ද සැපයේ.

මේ ආකාරයේ ඒකාබද්ධ සංවර්ධන ක්‍රියාවලියක් ජනතා සිත් සතන් තුළ ක්‍රියාත්මක වන විට ඔවුන්ගේ මනසෙහි, මිනිසා විසින් ඇති කර ගනු ලබන වාදභේද නොවැදගත් තැනකට පත්වේ. මේ හේතු කොට ගෙන, හරවත් ප්‍රතිඵල ඔව්හු ලබා ගනිති. තවද ඔව්හු එකම ලෝකයක් එකම ජනතාවක් පිළිබඳ සංකල්පයට වැඩි වැඩියෙන් සමීප වෙති. මෙහි සඳහන් නියත ප්‍රතිඵල හැරුණු විට මේ ක්‍රියා කලාපය තුළින් දේශීය හා ජාත්‍යන්තර ව්‍යාපාර රාශියක් බිහි වී ඇත. නිදසුනක් වශයෙන්, ජපන් ජාතික කණ්ඩායමක් සර්වෝදයට පැමිණ ශ්‍රමදාන කටයුතුවලට සහභාගි වීම ගෙන හැර දැක්විය හැකිය. ඔව්හු පෙරළා සිය රට ගොස් ''එකම ලෝකයක- එකම ජනතාවයි'' (One World One People) නමින් සංවිධානයක් ගොඩනඟා ගත්හ. ඔව්හු අප සමඟ සහයෝගයෙන් වැඩ කරති. ශ්‍රී ලංකාවේදී අත්දුටු දේ අනුසාරයෙන් තවත් අය එබඳු සංවිධාන

ජපානය, කොරියාව, බංගලාදේශය, නේපාලය සහ ඉන්දියාවේ තමිල්නාඩු යන රටවල බිහි කර ගත්හ. ඒ ආකාරයෙන්ම එක්සත් ජනපදයේ සන්දියාගෝ දේශයෙහි කණ්ඩායමක් ''දයාවෙන් බැඳුණු ප්‍රජාව'' හෙවත් (Community) නමින් සංවිධානයක් පිහිටුවා ගත්තේය. එක්සත් ජනපදය, බෙල්ජියම, නෙදර්ලන්තය, ජර්මනිය සහ වෙනත් ස්ථානයන්හි අප සර්වෝදය නමින්ම ස්වකීය සමාජ නම් කළහ. ලෝකය පුරා ඒ සමාන තවත් සංවිධාන ඒ පරමාර්ථම පෙරදැරි කර ගෙන සකස් වී ක්‍රියාත්මකවේ. මේ සියල්ලෙන් සිදු වන්නේ තම පරිසරයෙහි සර්වෝදය අදහස් සහ පරිචයන් දියුණුවට පත්වීමෙන් ආධ්‍යාත්මික සහ මානසික විඥාන ධාරාවක් තීරණාත්මක ස්කන්ධයක් සේ සකස් වීමට මං පෑදීමය.

සර්වෝදය ගමේ ජනතාව සිය ප්‍රබෝධයේ දෙවෙනි අදියරට ප්‍රවේශ වන්නේ පෙර පාසල් දරුවන්, පාසල් සිසුන්, යෞවනයන්, මවුවරුන්, ගොවීන්, ශිල්පීන් යන මේ අයගේ විවිධ කණ්ඩායම් ගොඩ නැඟීමෙනි. මේ කණ්ඩායම් මූලික මානුෂික අවශ්‍යතා ඉටු කිරීම කෙරෙහි යොමු වෙති. මෙම අවශ්‍යතා වශයෙන් සැලකෙනුයේ සුවදායී පරිසරය, පිරිසිදු පානීය ජලය, පෝෂණය, සෞඛ්‍යය, නිවාස, සන්නිවේදනය, බලශක්ති අවශ්‍යතා, අධ්‍යාපනය, සංස්කෘතික හා ආධ්‍යාත්මික අවශ්‍යතා යන මේවායි.

ආත්ම විශ්වාසයෙන් යුතුව ප්‍රජා සහභාගිත්වය ලබා ගෙන මූලික කටයුතු සැලසුම් කර ගෙන ඉටු කළ හැකි කාර්යය රාශියක් ඔව්හු ක්‍රියාත්මක කරති. ක්‍රමයෙන් විකාශනය වන අදියරවල් අනුගමනය කරමින් ස්වකීය ක්‍රියාකාරී නායකයන් දිවයින පුරා විසිරී ඇති සර්වෝදය සංවර්ධන අධ්‍යාපනික ආයතනවලින් පුහුණු කරවා ගෙන මෙම ප්‍රජා සංවිධාන ගම් මට්ටමේ සමිති වශයෙන් සංවිධානය වී, ඉන්දියාවේ පංචායත් සංවිධාන මෙන් තමන් විසින්ම තෝරා පත් කර ගනු ලැබූ විධායක කමිටු විසින් පාලනය කෙරෙන ආයතනික සැලැස්මක් ඇති කර ගනී.

අප රටේ ගණන් බලා තිබෙන 25000 ක් වූ ගම් සංඛ්‍යාවෙන් ගම් 11300 ක්ම එබඳු ග්‍රාමීය සමිති වශයෙන් සංවිධානය කිරීමට පසුගිය දශක හතර තුළ අප සර්වෝදය සංසදය සමත් වී ඇත. ග්‍රාමෝදයේ සිව්වන හෝ පස්වන අදියර වශයෙන් අප හඳුන්වන අවස්ථාවට එළඹ සිටින සමිති පුරෝගාමී ගම් වශයෙන් වර්ග කර ඇති අතර, ඒ එක් ගමක් තවත් අතරමැදි ගම් හතරකට සහ පර්යන්ත ගම් පහකට සහභාගිත්ව සංවර්ධනයේ ඉහළ අවස්ථා කරා යාමට අවශ්‍ය නායකත්වය සහ මාර්ගෝපදේශ ලබා දෙයි. මෙනයින් ගම් දහයක් එක් පොකුරක් වශයෙන් ක්‍රියා කරයි.

අප දැනට ක්‍රියාත්මක කර තිබෙන පොකුරු ගම් දහස සතුටුදායක ප්‍රගතියක් අත් කර ගෙන ප්‍රමාණවත් ශක්තියක් උදා කරගත් කල එය රජය විසින් මෙන්ම වෙනත් ප්‍රජා සංවිධාන විසින් රට පුරා දියත් කරන විවිධ දේශපාලනික සහ ආර්ථික ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමට ද පහසුවක් වනු ඇත.

ආධ්‍යාත්මික, සදාචාරමය සහ සංස්කෘතික ප්‍රබෝධයට අමතරව මෙම ගම්වල ඉතා පැහැදිලිව සකස් කිරීමෙන් සාර්ථක වන බව ඔප්පු වී ඇති සමාජීය, තාක්ෂණවේදීය සහ ආර්ථික අංශවලින් බලගතු වැඩ සටහන්ද මේ ගම්වල ක්‍රියාත්මක කරනු ලැබේ. මේ ආකාරයෙන් ගම්මාන මූලික වශයෙන් සහ හාත්පසින් ප්‍රබෝධයට පත් කිරීමෙන් ගාන්ධිජී අදහස් කළ ග්‍රාම ස්වරාජ්‍යයේ විශ්ව ව්‍යාප්ත දියුණුව ඕෂසාමුද්‍රීය චක්‍රය මගින් ඇති කළ හැකිය. විශ්ව ව්‍යාප්ත කිරීමේ හැකියාවෙන් යුත් එම ක්‍රියාවලිය තුළින් ගමේ කිසිම කෙනෙක් ඉවත් කරනු නොලැබේ.

සංවර්ධනය කරා පිය නගන මේ විකල්ප ක්‍රියා මාර්ගවලදී (මිනිසුන්ගේම ක්‍රියා නිසා හෝ ස්වාභාවික හේතු නිසා හෝ) කායික හෝ මානසික වශයෙන් ආබාධිත වූවන්, මන්දපෝෂිතයන් සහ අනාථයන්, සමාජයෙන් කොන් කරනු ලැබූවන්, අවතැන් වූවන් සහ සරණාගතයන් යන මේ සියලුදෙනාට ද සාමාන්‍ය ගැමියන් සමඟ

එම කටයුතුවලට සහභාගිවීමටත් ඒවායින් එල ප්‍රයෝජන ලැබීමටත් ඉඩ ප්‍රස්ථා සලසා දෙනු ලැබේ.

පහළ තරාතිරම්වලින් සාමය උදා කිරීම

ශ්‍රී ලංකාවේ දැනට පවතින අර්බුදකාරී තත්ත්වය ගැනද මෙහිදී ගාන්ධි සාම ත්‍යාගය දිනා ගත් තැනැත්තා වශයෙන් අදහස් කිහිපයක් පළ කිරීම උචිත යයි හැඟේ. රජයේ හමුදා සහ කැරලිකාරී එල්.ටී.ටී.ඊ. හමුදා අතරේ බිහිසුණු විනාශකාරී යුද්ධයක් දශකයකටත් වැඩි කාලයක් තිස්සේ පැවතෙන බව අපි සියලුදෙනාම දනිමු. තවත් අංශයකින් මෙම අරගලය සමථයකට පත් කිරීම සඳහා සාකච්ඡා මගින් දේශපාලනමය විසඳුමක් සෙවීමේ ප්‍රයත්නයක් රජයේ ඉහළ මට්ටමේ අය සහ සාමය සඳහා වන ජාත්‍යන්තර සංවිධාන ද දරති. මේ පිළිබඳ සලකා බැලීම් 'දේශපාලනමය විසඳුමකට' සහ 'යුද්ධමය ප්‍රයත්නයකටසීමා වී පවතී' මෙහිලා 'දේශපාලනමය විසඳුම' ගැන සලකා බැලීම සහ 'යුද්ධමය ප්‍රයත්නයට' සහයෝගය දැක්වීම හැර මහජනයාට හෝ සර්වෝදය වැනි ජනතා සංවිධානවලට කළ හැකි අන් දෙයක් නොමැති බව පෙනේ.

ස්වාධිපත්‍යය සහිත රාජ්‍යයන් අතරේ අරගල හටගත් අතීතයේදී එම රාජ්‍ය නායකයන්ට සමාන තත්ත්වයේ පුද්ගලයන් හැටියට අන්‍යෝන්‍ය වශයෙන් සාකච්ඡා පැවැත්වීමට හැකි විය. එහෙත් වර්තමානයේ අරගල පවතින්නේ බොහෝ විට ඒ ඒ රටවල දේශ සීමා ඇතුළතමය. ශ්‍රී ලංකාව, පකිස්තානය යන කවර රටකට වුවද මේ තත්ත්වය පොදුවේ. මේ යුද කටයුතු කෙරෙන්නේ වනාන්තරවල සහ කඳුවලය. යුද්ධ කරන කැරලිකාර කණ්ඩායම් ගරිල්ලා සටන් ක්‍රම සහ යුද්ධයෙන් පීඩිත ප්‍රදේශවල ජනතාව කලකිරවීම සිය උපාය මාර්ග වශයෙන් යොදා ගනිති. මේ තත්ත්වය යටතේ අර්බුදය නිරාකරණය කිරීමෙහි ලා කලින් පැවති ආකාරයේ මහජනතාවට

දැන ගත හැකි පරිද්දෙන් සහ අඩු අවනතභාවයකින් යුතුව රාෂ්ට්‍රීය අගනුවරවලදී එක් රටක් තවත් රටක් සමඟ පැවැත්වූ රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා මාර්ගය වර්තමානයට යෝග්‍ය නොවේ. මීට අමතරව සමාජයේ පවත්නා විශාල ප්‍රමාණයේ දේශපාලන සහ ආර්ථික ව්‍යුහයන්ද ඒකාධිකාරී බලයක් ඇති කර ගැනීමට උත්සාහ කරන ඉහළ මට්ටමේ විවිධ පුද්ගල කණ්ඩායම්ද නිසා ප්‍රජාව අතරේ ජනවාර්ගික හා වෙනත් භේද තව තවත් උත්සන්න වෙමින් පවතී.

දශක හතරකට ආසන්න කාලයක් තිස්සේ සර්වෝදය ව්‍යාපාරය සිය සේවා කටයුතු කර ගෙන එන්නේ ගම් මට්ටමේ සිටින ජන සමූහය සමඟය. යුද්ධයෙන් සහ වාර්ගික අර්බුදයෙන් විශාලතම පාඩු විඳින්නේ මේ ගැමි ජනතාවයි. යුද්ධ ප්‍රයත්නයේ ප්‍රතිඵල වශයෙන් ආර්ථික ලාභ ඉපයීමේ අවස්ථා ඔවුනට අහිමි වී ඇති අතර, යුද බිමේ දිවි පිදූ අය ද සංඛ්‍යාවෙන් විශාලය. රට තුළ පැවැත්වුණු අවසාන මැතිවරණ තුනේදී ජනතාව සාමය උදා කර දීමට පොරොන්දු වූ දේශපාලන පක්ෂවලට විශාල වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා දුන්නේය. එහෙත් පවත්නා සැබෑ තත්ත්වය නම් ස්වකීය අභිලාෂයන් තාත්වික බවට හරවා ගැනීමේ බලයක් මහජනතාවට තවමත් නො ලැබීමය.

සාමය පිළිබඳ සීමිත සංකල්පයකින් කොටු වී සිටින වරප්‍රසාද ලත් කණ්ඩායම් කිහිපයක ඒකාධිකාරයක් වශයෙන් සාමය උදා කර ගැනීමේ කාර්යය පවතින්නට ඉඩ නොදී මහජනතාවට සදාකාලික සාම ක්‍රියාවලියකට සහභාගිවීමේ ඉඩ ප්‍රස්ථා වැඩි වැඩියෙන් ලබා දීමට සර්වෝදය ප්‍රයත්න දරමින් සිටී. එසේ වුවද, අනෙකුත් ක්‍රියාමාර්ග දෙක වන යුද්ධය සහ ඉහළ මට්ටමේ සාකච්ඡා කටයුතු සඳහා තිබෙන සම්පත් ප්‍රමාණය හා සසඳන විට ජනතා ව්‍යාපාරය සඳහා තිබෙන මූල්‍ය, භෞතික හා වෙනත් ද්‍රව්‍යමය පහසුකම් කිසිසේත් ප්‍රමාණවත් නොවේ. මේ අඩුලුහුඬුකම් පවතිද්දී

පවා ආගමික, ව්‍යාපාරික හා අධ්‍යාපනික අංශ ඒකරාශී කර ගැනීමේ වැඩ සටහනක සර්වෝදය නියැලී සිටී. මැද මට්ටමේ සිටින නායකයන්ට තමන්ගෙන් ඉහළ අය සහ පහළ අය සමඟ පවත්නා සම්බන්ධකම්ද උපයෝගී කර ගනිමින් මෙම සාම ක්‍රියාවලිය නඟා සිටුවීමට සහ පුනර්ජීවයට පත් කිරීමට ජනතාව පාදක කරගෙන වැදගත් සේවයක් ඉටු කළ හැකිය යනු අපේ විශ්වාසයයි. අරගලකාරී පක්ෂ අපේ මෙම කාර්යභාරය අගනා දෙයක් වශයෙන් පිළිගතහොත් එවිට අපේ දායකත්ව වඩාත් අර්ථවත් වූද, ලාභදායී වූද, ප්‍රතිඵල උදා කරවීමට සමත් වනු ඇත. කෙසේ වුවද එබඳු පිළිගැනීමක් සහ සහයෝගයක් ලැබුණත් නැතත් සාමය උදා කර ගැනීම උදෙසා අප දරන පරිශ්‍රමය අපි නොනවත්වා දරන්නෙමු.

අවුරුදු 13 ටත් වැඩි කාලයක යුද්ධයකින් සහ සාම ක්‍රියාවලියේම බිඳ වැටීම් කිහිපයකින් පසු ශ්‍රී ලංකා රජයත් දෙමළ විමුක්ති කොටි ඊලාම් ව්‍යාපාරයත් අතර සැලකිය යුතු ප්‍රමාණයේ අවිශ්වාසයන් පවතින බව පැහැදිලිය. අරගලකාරී පක්ෂ දෙක අතර අවිශ්වාසය තීව්‍රවීමත් සන්නිවේදන කටයුතු බිඳ වැටීමත් හේතු කොට ගෙන සර්වෝදය ව්‍යාපාරය මෙම අරගලය සංසිඳුවීම සඳහා ජනතා ආශ්‍රිත ක්‍රියා මාර්ගයක් ආරම්භ කර තිබේ. අප කර ගෙන යන මේ යුද්ධය පිළිබඳ විසඳුම හුදෙක් දේශපාලනඥයන්ට පමණක් හෝ යුද ආඥාපතිවරුන්ට පමණක් බාර දී නිහඬ නොවිය යුතු බව අපි පිළිගනිමු. සාමය උදා කර ගැනීම සඳහා අවශ්‍ය මූලික කරුණු තාත්විකව තක්සේරු කර බැලිය යුතුය. ගම් මට්ටමේ ජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීමත්, අන්‍යයන් විඳින දුක්වේදනා කෙරෙහි සානුකම්පිත හැඟීම් ඔවුන් තුළ ජනනය කරවීමත්, එම මූලික අවශ්‍යතා සකස් කිරීමේ එක් අංශයකි.

ශ්‍රී ලංකාවේ ගැමි ජනතාවගෙන් හරි අඩකට ආසන්න ප්‍රමාණයක් අතරට ගොස් තිබෙන සර්වෝදය සිංහල, දෙමළ, මුස්ලිම් ගම් අතර හුවමාරු වැඩ සටහනක් පවත්වා ගෙන යාම ආරම්භ කර

තිබේ. මේ වැඩ සටහන යටතේ එක් ගමක දිගු කලක් වැදගත් සේවා කටයුතු කිරීමෙහි නිරත වන විවිධ ජන කොටස්වලට අයත් යොවුන් පිරිස් වෙනත් ගමක ගරු සාමාජිකයන් වශයෙන් සලකනු ලැබේ. බහු ජාතික සහ බහු ආගමික සාම පෙළපාලි, සිය දහස් ගණන් ජනයා සහභාගි වූ සාම භාවනා, අරගල සමථයකට පත් කිරීම පිළිබඳ පුහුණු කිරීම බෞද්ධ භික්ෂූන්, දෙමළ හා මුස්ලිම් ප්‍රජා නායකයන් සඳහා පැවැත්වීම සහ වෙනත් සංවිධානවල සාම කටයුතුවලට සම්බන්ධවීම යන මේවා ජනතාව ආශ්‍රය කර ගෙන සාමය උදා කිරීම සඳහා සර්වෝදය ගෙන ඇති තවත් පියවරවල් කිහිපයකි.

ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල හට ගන්නා සිදුවීම්වලින් පෙනී යන්නේ වත්මන් ලෝකය විවිධාකාර ගැටළු රාශියකට මුහුණ පා සිටින බවයි. අන්ත දිළිඳු බව, මාරාන්තික රෝග, වාර්ගික ගැටුම්, ළමයින් සහ කාන්තාවන් ආශ්‍රිත ලිංගික අපරාධ, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, පරිසර දූෂණය, දේශපාලනික ප්‍රචණ්ඩ ක්‍රියා, සිවිල් යුද්ධ, ත්‍රස්තවාදය සහ විශාල ප්‍රමාණයේ දූෂණ එබඳු ගැටළු සමහරකි. මේ සියලු දුශ්චරිත අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ ඒවායි. ඒවා ඇති වන්නේත් එකිනෙකට සම්බන්ධ සාධක මුල් කර ගෙනය. මේ දුසිරිත් මර්දනය කිරීමට දැනට අප සතු ජාතික හා ජාත්‍යන්තර පාලන ක්‍රම, ආර්ථික සංවර්ධනය හා සාම පරිශ්‍රමය ප්‍රමාණවත් නොවන බව පෙනේ. එහෙයින් මේ දේවල් පාලනය කරන හෝ පාලනය කිරීමට උත්සාහ කරන බොහෝ දෙනෙකුට එම කටයුතු ඵලදායී අන්දමින් කළ නොහැකිය. එය එම පුද්ගලයන්ගේ වරදක් නොව යල් පැන ගිය පක්ෂ දේශපාලනය හා සම්බන්ධ ආර්ථික හා නිලධාරිවාදී ක්‍රමවල වරද බව අවබෝධ කර ගෙන ඇත්තේ ටික දෙනෙකි. මේ තත්ත්වය නිසා පුද්ගලයන් තම තමන්ගේ වාසියම සැලකීම, එකිනෙකාට පහරදීම, ප්‍රශ්න විසඳීමට දුර්වල හා අනුචිත පියවරවල් ගැනීම යන මේවායින් සමන්විත සංවේගදායක තත්ත්වයක් වේගයෙන් දියේ ගිලෙමින් පවතින බව පැහැදිලිවම දැන සිටියදී නැවේ සුව පහසු අසුන් දිනා ගැනීම සඳහා එකිනෙකා තල්ලු කරමින්, ඇද දමමින්, පොර කන තත්ත්වයකි.

අඩ සිය වසකටත් පෙර ගාන්ධිජී, ශ්‍රී නේරුතුමා වෙත ලියූ ලිපියක කොටසක් කියවා අපි දිරිමත් වෙමු.

> '' ලොව ගමන් කරන්නේ වැරදි මගක නම් මා ඊට බිය විය යුතු නැත. ඉන්දියාව ද එබඳු මගක ගොස් ජනප්‍රවාදයේ සඳහන් පරිදි පහන් දැල්ල වටා, වඩ වඩා වේගයෙන් කැරකුණු පළගැටියා පහන් දැල්ලට ගොදුරු වී දැවී ගියා සේ දැවී යා හැකිය. එහෙත් එබඳු විනාශයකින් ඉන්දියාව ආරක්ෂා කර ගැනීමටත්, ඉන්දියාව ඔස්සේ මුළු ලෝකය ආරක්ෂා කර ගැනීමටත් අවසන් හුස්ම හෙලන තෙක් ප්‍රයත්න දැරීම මගේ බලවත් යුතුකමයි. මා පැවසූ දේවල හරය නම්, මිනිසා සිය සැබෑ අවශ්‍යතාවලින් තෘප්තිමත්ව ස්වයංපෝෂිතව සිටිය යුතු බවයි. එබඳු ආත්ම දමනයක් මිනිසා සතු නොවේ නම්, ඔහුට තමාම ආරක්ෂා කර ගත නොහැකිය. මහ සයුර දිය බිංදුවලින් සැදී ඇත්තා සේ ලෝකය සැදී ඇත්තේ පුද්ගලයන් ගෙනි.''

පෘථිවි නෞකාව බලවත් අනතුරකට මුහුණ පා සිටී. සිදුර පිළියම් කොට නැව බේරා ගත යුතු ආකාරය ගාන්ධිජී පෙන්වා දුන්නේය. සර්වෝදයේ අපි එතුමා නියම කළ කසාය කාලයට හා පරිසරයට ගැලපෙන පරිදි වෙනස් කොට පාවිච්චි කරමු. ගාන්ධි සාම ත්‍යාගය අපට විශාල ධෛර්යයක් වන බැවින් අප තව තවත් වෙහෙසෙමින් වඩාත් වේගයෙන් ක්‍රියා කරන්නෙමු. ශ්‍රී ලංකාවේ මෙන්ම වෙනත් බොහෝ රටවල ද දැනට අප කර ගෙන යන කාර්යයන් නොකඩවා කර ගෙන යාමට පමණක් නොව 21 වැනි සියවසට ආසියාවේ දායකත්වය විය හැකි විශ්ව දර්ශනයක් නිරාවරණය කර දීමට ද ඔබගේ සහයෝගය අප වෙත නොනවත්වා ලබා දෙනු මැනවි.

1997 ජනවාරි 1 දා ඉන්දියාවේ නවදිල්ලි අගනුවර රාෂ්ට්‍රපති ජනාධිපති මන්දිරයේදී 1996 ගාන්ධි සාම සම්මානය පිළිගනිමින් ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතා කළ දේශනයේ සිංහල අනුවාදයයි.

තණමල්විල ගොවිපළට අක්කර 500ක්
දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව

නොබෝදා 1997 අප අතරින් වෙන් වූ හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා ගැන කෘතඥතා පූර්වකව යමක් සඳහන් කිරීමට මම කැමැත්තෙමි. වරක් අප රටේ ඉඩම් ප්‍රතිසංස්කරණය පිළිබඳව ඒ මහතා ගත් එඩිතර පියවර ජනතාව අගය කරන්නේ යම් සේද, සර්වෝදයේ අපිදූ විශේෂයෙන්ම එතුමා අපට දැක්වූ වැදගත් අනුග්‍රහයක් ගැන මේ අවස්ථාවේදී මෙනෙහි කරන්නෙමු.

තණමල්විල ගොවිපොළ සඳහා අක්කර 500 ක් සර්වෝදයට ලබා දීමට යුහුසුළුව කටයුතු කළේ කොබ්බෑකඩුව ඉඩම් ඇමතිතුමාය. මෙහි වැදගත්කම තවත් කැපී පෙනෙන්නේ, එකල රජයේ බලවත් ඇමතිවරයකු සර්වෝදයට එරෙහිව සිටි අවස්ථාවේ සාධාරණත්වය සලකා, කොබ්බෑකඩුව මැතිතුමා මේ කරුණු ඉටු කිරීමයි. අද තණමල්විල සර්වෝදය කෘෂිකර්ම සංකීර්ණයෙහි

හෙක්ටර් කොබ්බෑකඩුව මහතා

පවත්වා ගෙන යනු ලබන විවිධ කෘෂිකාර්මික සහ සංවර්ධන කටයුතු ඒ මහතාගේ යහපත් තීරණයට දෙස් දෙයි.

ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගයේදී උඩරට පෙදෙස්වල කැරලි ඇති වූ අවස්ථාවන් ගැන කල්පනා කරන විට, ගැමි ජනතාව ලත් තාඩන පීඩනවලින් ඒ අය බේරා ගැනීමට නොයෙකුත් වීරවරයන් ඉදිරිපත් වූ බව පෙනේ. එම තත්ත්වවලට තුඩු දුන්නේ ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්නයි. එම ප්‍රශ්නයම නූතන යුගයේදී කොබ්බෑකඩුව මැතිතුමා එකල රජයෙන් විසඳීමට ගත් එඩිතර පියවර ගැන කාගේත් ගෞරවය එතුමාට හිමි වෙයි. අදහස් යහපත් වුවද, අභිප්‍රායයන් සාර්ථක අන්දමින් ඉටු නොවූවත්, ඒවා පරිපාලනයේදී අප රටේ වැවිලි කර්මාන්තය පිරිහීමට වගකිව යුත්තේ එතුමා නොවේ.

එඩිතර කෙනෙකු වූ එතුමා, පළාත් පාලන කටයුතුවලදීත්, රාජ්‍ය තන්ත්‍රයේදීත්, දේශපාලනයේදීත් පුද්ගලයකු වශයෙන් නිහතමානීව සන්සුන්ව කළ සේවය අප කාටත් අගය කළ හැකිය. නොයෙකුත් ගැහැට මැද එතුමා ජනාධිපති මැතිවරණයේදී ලත් ඡන්ද ගණනින් එය මනාව පැහැදිලි වෙයි. උතුරේ සහ දකුණේ ශ්‍රී ලංකා ජනතාව එතුමාට ගරු කළහ.

ජනාධිපතිවරණයට නාම යෝජනා ලැබීමටත් පෙර, කොබ්බෑකඩුව මහතා බලයේ නොසිටි කාලයේ සර්වෝදය මධ්‍යස්ථානයට පැමිණ, සර්වෝදයේ කටයුතු සඳහා කාගේත් සැලකිල්ල සහ සහාය ලැබිය යුතු යයි සඳහන් කළ අතර, එදින දේශපාලන කටයුතු ගැන කිසිවක් සඳහන් නොකිරීම එතුමා තුළ තිබූ උසස් ගතිගුණයක් පිළිබිඹු කරන්නකි.

ඉඩම් ඇමතිව සිටි අවදියේ එතුමා මැනිලාවේ රැස්වීමකට ගොස් පැමිණි අවස්ථාවේදී, ඉඩම් ඇමති වශයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර අප හමුවූ විටෙක දිවා භෝජනයකට ද කැඳවා, මේ පිළිබඳව අප සමඟ

සාකච්ඡා කිරීමට තරම් එතුමා උනන්දුවක් දැක්වීම අද මෙන් මට මතකය.

කෙනෙකු ජීවත්ව සිටියදී ඔහුගෙන් සමාජයට වන සේවාවන් ඔහුගේ මරණින් පසු වුවද අගය කිරීම සඳහා කොබ්බෑකඩුව මහතාගෙන් සිදුවූ සේවාව කදිම නිදසුනකි. සර්වෝදය අපි මිනිසුන්ගේ යහපත සඳහා කටයුතු කරන්නා සේම, මිනිස් ගුණ ද අතිශයින් අගය කරමු.

කොබ්බෑකඩුව මැතිතුමාට නිවන් සැප ලැබේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමු.

ශාන්තුවරයකුගේ හාස්කමක්

1999 පෙබරවාරි මස 28 වැනිදා අප විසින් අලුතෙන් නිර්මාණය කරන ලද 'විශ්ව නිකේතන' ජාත්‍යන්තර සාම නිවහන සහ භාවනා මධ්‍යස්ථානය විවෘත කිරීමේ උළෙලට අපි හැමදෙනාම කටයුතු සම්පාදනය කරමින් සිටියෙමු. එහි ප්‍රධාන අමුත්තා වශයෙන් තායිවානයේ බෞද්ධ සංගමයේ සභාපති ගරු හුවාං සිං හිමියන්ට ආරාධනා කර තිබුණේය. මේ හැරුණු විට අප මූලස්ථානයේ ද මාර්තු 01 වැනිදා තායිලන්තයේ සුලාක් සිවරාක්ෂ මහතාගේ නායකත්වයෙන් ජාත්‍යන්තර සමුළුවක් ද පැවැත්වීමට කටයුතු යොදා තිබුණි.

මිට සතියකට පමණ පෙර කේරළයේ මිත්‍ර නිකේතන් ආයතනයේ නිර්මාතෘ කේ. විශ්වනාදන් මහතා 'ශාන්තිගිරි' නම් වූ ආශ්‍රමයක සිට මට දුරකතනයෙන් කතා කළේය. එතුමා මට දැන්වූයේ ඉන්දියාවේ වෙසෙන ශ්‍රේෂ්ඨතම ශාන්තුවරයෙක් වූ හැත්තෑ එක් හැවිරිදි ගුරුකරුණාකරට පූජා කිරීම සඳහා 'සහකරණ මන්දිර' නම් වූ විශාල මන්දිරයක් ගොඩනගා ඇති බවත්, එය විවෘත කිරීමේ උත්සවය මාර්තු මස 01 වැනිදා උදේ පවත්වන බවත්, එහි ප්‍රධාන අමුත්තා වශයෙන් පැමිණීම සඳහා ගුරු විසින් යෝජනා කර තිබෙන්නේ මගේ නම බවත්ය. මට ඒමට පුළුවන් වේ දැයි එතුමා විමසීය. මට එදිනට කිසිසේත් පැමිණිය නොහැකි බවත්, එදින දවල් අපේ ජාත්‍යන්තර සමුළුවක් ආරම්භ කිරීම සහ පසු දින විශ්ව නිකේතන සංකීර්ණය විවෘත කිරීමට යොදා ගෙන ඇති බවත් මම ඔහුට දැන්වීමි.

මේ බව කරුණාකර ගුරුට සහ කමිටුවට විශ්වනාදන් මහතා විසින් දන්වන ලදී. එහෙත් ගුරුගේ අධිෂ්ඨානය වෙනස් කිරීමට නොහැකි විය. ඔහුගේ තරුණ අනුගාමිකයෙක් මෙන්ම ජාත්‍යන්තර

ව්‍යාපාරිකයෙක් වූ හර්බි සිද්ධි මහතා ඔහු ළඟට කැඳවා එවේලේම පිටත්ව ලංකාවට යන ලෙසත්, මගේ නිවසට ගොස් මා ඒමට එකඟ වන තුරු එතැනින් පිට නොවන ලෙසත් උපදෙස් දී තිබේ.

දිනක් උදයේ මම ගෙදරින් පිටත්වීමට සැරසෙන විට ලස්සන මනා පෞරුෂයකින් හෙබි ප්‍රියමනාප තරුණයෙක් වාහනයකින් විත් බැස්සේය. තමා කවුදැයි හඳුන්වා දුන් ඔහු, මම ගෙදරට කැඳවා ගෙන ගොස් අපේ ගෙදර ඉස්තෝප්පු කාමරයේ නවාතැන් ගැනීමට සැලැස්වූවෙමි. ඔහු ගුරු කරුණාකර පිළිබඳ සියලුම විස්තර මා සමඟ පැවසීය. මාර්තු මස 01 වැනිදා කටුනායකින් පිටත් වන ගුවන් යානයෙන් ත්‍රිවැන්ඩ්‍රම්වලට (තිරුවානනාථපුරම්) යෑමටත්, එදිනම දවල් 12.40 ට ත්‍රිවැන්ඩ්‍රම් සිට කටුනායක දක්වා එන ගුවන් යානයෙන් ආපසු ඒමට හැකි බවත් සවස 2.00 වන විට උත්සවයට සහභාගිවීමට නැවත ගෙදරට පැමිණිය හැකි බවත් ඔහු ප්‍රකාශ කළේය. එපමණක් නොව මාත් සමඟ තවත් තිදෙනෙකු සඳහා

නිම්නා, ජනන්ත, හර්බි සිද්දු මහතා සහ මම

ගුවන්යානාවල ආසන වෙන් කළ බවත්, වහාම ඉතිරි නම් ටික ඔවුනට ටෙලිපෝන් කර දියයුතු බවත් වැඩිදුරටත් ඔහු ප්‍රකාශ කළේය. ලංකා ගුවන් සේවය මෙන්ම ඉන්දීය ගුවන් සේවය ද නිතරම ප්‍රමාද වන බැවින් මට කලට වේලාවට ඒමට හැකි දැයි සැක බව මම ප්‍රකාශ කළෙමි. එදින ගුවන්යානා දෙකම කලට වේලාවට ගමන් අරඹන බවට ගුරු කරුණාකර වගබලා ගන්නවා ඇති බව ඔහු ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කළේය.

දැන් මට කළ හැකි දෙයක් නැත. එකම දේ මේ ආරාධනය පිළිගැනීමයි. ගුරු කරුණාකරගේ ශක්තිය මට දැනෙන්නට විය. සුසිරි මල්ලීත්, නිමිනාත්, ජනන්තත් සමඟ මාර්තු 01 වැනිදා හරියටම 7.00 ට අපි ත්‍රිවැන්ඩම් බලා කටුනායක ගුවන් තොටුපළින් පිටත් වූයෙමු. සිද්දූ ඇතුළු ආශ්‍රම අනුගාමිකයෝ කිසිම ප්‍රමාදයක් නොමැතිව අපව ශාන්තිගිරි ආශ්‍රමයට මිනිත්තු 45 කින් පමණ කැඳවා ගෙන ගියේය. මා ඇද සිටි කලිසම වටා සරමක් ඔතාගත් මම ගුරු කරුණාකර හමුවීමට ගියෙමි. ආශ්‍රම භූමියේ හතලිස්දාහක පමණ පිරිසක් සුදුවතින් සැරසී සම්පූර්ණ නිශ්ශබ්දතාවයකින් සිටි අතර ගුරු කරුණාකර මගේ දෑතම අල්ලා මා පිළිගත්තේය. ඔබට වැඩි කාලයක් මෙහි සිටිය නොහැකි බැවින් උත්සවය ආරම්භ කරමු යැයි මගේ අතින් අල්ලා ගත් ඔහු මාත්, සෙසු පිරිසත් සමඟ අලුතෙන් ගොඩනඟන ලද සහකරණ මන්දිරයට ගියෙමු. ඉතා වටිනා භාණ්ඩ, පලස් ආදී දේවල් බැතිමතුන් විසින් ගුරුට ප්‍රදානය කරන ලදී. ඒවයේ අත තබා පිළිගත් ඔහු කෙළින්ම දේශනයක් කළේය. ඉන්පසු මට කතා කරන්න ආරාධනා කළේය. මම ගුරු ශිෂ්‍ය සම්ප්‍රදාය ගැනත්, අපේ හිතේ සමාජයේ හා පරිසරයේ සාමය සඳහා ගුරු ශිෂ්‍ය පරම්පරාවක් නැවත ඇති කිරීමේ අවශ්‍යතාවත් ඒ මගින් භාරතයේත් ලෝකයේත් ආධ්‍යාත්මික ප්‍රබෝධයක් ඇති කිරීමේ වැදගත්කම ප්‍රකාශ කළෙමි. ගුරු කරුණාකර මගේ කතාව අවසන දැන් අපි යමුයි කියමින් මගේ අතින් අල්ලා ගත් ගුරු එහි සිටි කේරළයේ මහාචාර්යවරයා, මැති ඇමතිවරුන් ආදී ප්‍රභූන්ට රැස්වීම ඉදිරියට ගෙන යන මෙන් පවසා මා සමඟ නැවත එතුමාගේ කුටියට ගියේය.

සහකරණ මන්දිරය විවෘත කිරීමේ උත්සවයේ දේශණය පවත්වමින්

ගුරු කරුණාකර සමඟ

ගුරු කරුණාකර හමුවූ අවස්ථාව

මට ආශීර්වාද කළ ගුරු ගුවන් යානය වෙලාවට පිටත් වන බැවින් මා ඇතුළු පිරිස ගුවන් තොටුපළට යවන ලෙස අනුගාමිකයින්ට උපදෙස් දුන්නේය. එතුමාට වැඳ නමස්කාර කළ අපි ගුවන් තොටුපළට ගොස් හරියටම නියමිත වේලාවට පිටත් වූ ගුවන් යානයෙන් දවල් 12.30 වන විට කටුනායකටත් සවස 2.00 වන විට ආපසු නිවසටත් පැමිණියෙමු.

සැබැවින්ම මෙය ශාන්තුවරයෙකුට පමණක් කළ හැකි හාස්කමක් බව මට අවබෝධ විය. එහෙත් පැය දෙකක් පමණ ශාන්තිගිරි ආශ්‍රමයේ සිටි අපට මෙය සිහිනයක් මෙන් විය. එහෙත් එදා සිට දිගටම සෑම ආධ්‍යාත්මික ක්‍රියාවකදීම කරුණාකර ගුරු මගේ සිහියට නැගේ. මා ඔහු මුණගැසී හරියටම දින 66 කට පසු එනම් 1999 මැයි මස 06 වැනිදා ඔහු සදහටම මෙලොවින් තුරන් විය.

****

ශාන්තිගිරි ආශ්‍රමයට නැවත

1999 මාර්තු මස 01 වැනිදා ශාන්තිගිරි ආශ්‍රමයට ගුරු කරුණාකරගේ ඇරයුමෙන් සහකරණ මන්දිරය විවෘත කිරීමේ උළෙලේ ප්‍රධාන අමුත්තා වශයෙන් මා සහ තවත් තිදෙනෙක් සහභාගි වූ බව කලින් විස්තර කළෙමි. එමෙන්ම ගුරු කරුණාකර ඊට දින 66 කට පසු එනම් 1999 මැයි මස 06 වැනි දින හින්දූන් විශ්වාස කරන අන්දමට ස්වර්ගස්ථ වී විශ්වයේ ඉහළම තලයක හෙවත් ශුද්ධාවාසයක වාසය කරන බව ඔවුන්ගේ පිළිගැනීමයි. .නව ඕලි. යන නමින් එතුමා එතැන සිට පාරිශුද්ධ දැනීම ධාන්‍ය බලයෙන් එතුමාගේ ප්‍රධාන ශිෂ්‍යාව වන ශිෂ්‍ය පූජිත අම්රිතා ජනනී තපස්වීන්ගේ මාර්ගයෙන් තම අනුගාමිකයිනට සියලුම උපදෙස් එවන බවයි.

මුල්වර මා ශාන්තිගිරි ආශ්‍රමයට කැඳවා ගෙන ගිය හර්බි සිද්දු මහතාම පැමිණ නව ජෝති ගුරු කරුණාකර විසින් ජනනීගේ මාර්ගයෙන් එතුමාගේ තුන්වැනි අනුස්මරණ දිනයට මට ආරාධනා

කළේය. ගුරුගෙන් පැමිණි ආරාධනය මම පිළිගෙන පූජ්‍ය මොරටුවේ සද්ධාවංශී හිමියන් සහ අර්ජුන ක්‍රිෂ්ණරත්න මහතා සමඟ මැයි 01 වැනිදා ට්‍රිච්චලට ගොස් පැය දෙකහමාරක රිය ගමනකින් පසු මදුරායිවලට ගොස් රාත්‍රී එහි ගත කොට මැයි 2 වැනිදා පැය හතක පමණ රිය ගමනකින් පසු 2 වැනිදා සවස ශාන්තිගිරි ආශ්‍රමයට නැවත පැමිණියෙමු. ශාන්තිගිරි ආශ්‍රම් දායක සභාවේ සභාපති ස්වාමි ගුරු භක්ටන් ඤාණ තපස්වී, අධ්‍යක්ෂවරුන් වන ස්වාමි ගුරු රත්නම් ඤාණ තපස්වී සහ ස්වාමි චයිතණ්නා ඤාණ තපස්වී ප්‍රධාන සන්නාසීන් සහ බ්‍රහ්මචාරීන් විසින් අපව ඉතා ආදරයෙන් පිළිගන්නා ලදී. ජනනී මාර්ගයෙන් ගුරු කරුණාකර උපදෙස් දී තිබෙන්නේ ඉතා ගෞරවාන්විතව මා පිළිගෙන සියලුම ආගන්තුක සත්කාර පවත්වා මැයි 5 වැනිදා තිරුවණාතපුරම් නගරයේ ප්‍රධාන උද්‍යානයේදී මගේ ප්‍රදානත්වයෙන් අනුස්මරණ රැස්වීම පැවැත්විය යුතු බවයි. අපට ආශ්‍රමයට නුදුරුව අලුතින්ම ගොඩනගන ලද නිවසක් වෙන්කර තිබුණි. අපේ උපස්ථාන කටයුතු සම්පූර්ණයෙන් බාර දී තිබුණේ බැංකු කළමනාකරුවෙක් වන සුබ්‍රමනියම් මහතාටය. ඔහුගේ සහායට බීජු නැමැති තරුණ බ්‍රහ්මචාරියෙක් ද යොදවා තිබුණේය.



ශාන්තගිරි ආශ්‍රමයේදී

රාත්‍රී පූජාවලට සහ භාවනාවලට අපි සහභාගිවීමු. 3 වැනිදා උදේ ජනනී මුණගැසීමට මාව කැඳවන ලදී. ගුරු පදිංචි වී සිටි කුටියට නුදුරු කුටියක ඇය වාසය කරයි. ඇය සමඟ තවත් තරුණ කහපාට වස්ත්‍රයෙන් සැරසුණු මුහුණ පමණක් පෙනෙනසේ හිස් වසාගත් තපස්විනීන් රැසක් සිටිති.

එළිමහනේ අඹ ගසක් යට වාඩි වී සිටි ශිෂ්‍ය පූජිත අම්රිතා ජනනී තපස්විනිය මා ළඟට කැඳවා ඇස් දෙක පියා ගෙන දෑත් පපුවට තබා ආචාර කොට ඉදිරිපිට තිබෙන පුටුවල වාඩිවන ලෙස දැන්වීය. අප තිදෙනා හැරුණු විට ඉන්දියාවේ සුප්‍රසිද්ධ ඉස්ලාමීය මූලස්ථානයේ සභාපති අසූපස් හැවිරිදි පත්ම විභූෂණ මවුලානා වහිඩුඩීල් ඛාන් මහතා සහ ඔහුගේ දියණිය ද වූහ.

මුලින්ම අප හැමටම පොදුවේ දාර්ශනික අදහස් කිහිපයක් ප්‍රකාශ කළ ඇය අප තිදෙනා හැර අන් අයට යෑමට අවසර දුන්නේය. මා ගැන ගුරුගෙන් විමසූ බවත්, ගුරුගේ අදහස අනුව පංචකර්ම වැනි තද ප්‍රතිකාර මට අනවශ්‍ය බවත්, ඒ වෙනුවට සරල බෙහෙත් නියම කළ බවත්, වෛද්‍ය ශාලාවේ ප්‍රධාන වෛද්‍ය ස්වාමිට ඒවා සපයන ලෙස දැනුම් දුන් බවත් ඇය මා සමඟ ප්‍රකාශ කොට ගුරුගේ වත්මන් තත්ත්වය පිළිබඳවත් ආශ්‍රමයේ ගුරු-ශිෂ්‍ය පරම්පරා සම්ප්‍රදාය දැන් හොඳින් ප්‍රතිෂ්ඨාපනය කර ගෙන යන බවත් ඉන්දියාවේත් වෙනත් රටවලත් ශාන්තිගිරි ආශ්‍රමයේ බැතිමතුන් කුඩා අසපු පිහිටුවන බවත් මා සමඟ පැවැසුවාය. මා මෙහි සිටින අතරතුර කිහිපවරක්ම මා කැඳවන බව පැවැසූ එතුමිය විභූති සහ තවත් රස ආහාර කජු ආදිය තෑගි කොට එවේලේම බුදින ලෙසත් ඉල්ලා සිටියාය.

3, 4 සහ 5 වැනිදා උදෑසන ද අප ගත කළේ පූජාවලට සහභාගිවීමටත් දෙවරක්ම ජනනී මුණගැසීමටත් ආශ්‍රමයේ විවිධ

ප්‍රධානීන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමටත්ය. මේ අතර 1500 ක් පමණ දෙනා වැඩ කරන අප නැවතී සිටි නිවස ඉදිරිපිට අක්කර 50 ක පමණ භූමියේ පිහිටි ආයුර්වේද රෝහලත්, ආයුර්වේද ඖෂධ භාරදාහකට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කෙරෙන නිෂ්පාදනාගාරය නැරඹීමටත් අපි ගියෙමු. 5 වැනිදා පස්වරුවේ ප්‍රධාන උත්සවය පැවැත්විණි. මෙය සංවිධානය කර තිබුණේ ට්‍රිවැන්ඩ්‍රම් හෙවත් තිරුවණාතපුරම් නගරයේය. රැස්වීම සඳහා වේදිකාවක් සූදානම් කර තිබුණේය. සැතපුම් 3 ක් පමණ ඈත සිට කාන්තාවන් එක පසකත්, පිරිමි අය අනෙක් පසත් සැතපුම් දෙකක් පමණ දිග පේලියකින් සවස තුනේ සිට ගුරු වන්දනා සාම පෙරහැරකින් මෙම විශාල පිට්ටනියට පැමිණියහ. ගිහි අය හෙවත් සාමාන්‍ය මිනිසුන් සුදු වස්ත්‍රයෙන්ද, බ්‍රහ්මචාරීහු සුදු රෙද්දකින් සහ උඩුකයට ඇඳුමක් නොමැතිව ඒකාංශ කරගත් සුදු රෙද්දකින් ද සැරසී ගමන් කළහ. සන්‍යාසීහු හෙවත් ගැහැණු පිරිමි ස්වාමිවරු කහපාට වස්ත්‍රයෙන් සැරසී ගමන් කළහ. ඔවුන් අතේ විවිධ කොඩි, සේසත් තිබුණු අතර පාර දිගට දෙපස සරසා තිබුණි. ඔවුන් පැමිණි පාර සියලුම වාහනවලට වසා තිබුණි.

මා සහ මා සමඟ ගිය දෙදෙනා සුබ්‍රමනියම් මහතා ඇතුළු ප්‍රධාන සන්‍යාසිවරුන් රිය දෙකකින් උත්සව භූමියට කැඳවා ගෙන ගියහ.

මේ පෙරහැරේ පැමිණි සියලුදෙනාම ගායනා කරමින් පැමිණියේ පද පහකින් යුත් නමස්කාර පාඨයකි. එය මෙසේය:

ඕම් ශ්‍රී කරුණාකර ගුරු පරබ්‍රහ්මනේ ය නමහ/
ඕම් ශ්‍රී කරුණාකර ගුරු සත්‍ය ප්‍රකාශා නමහ/
ඕම් ශ්‍රී කරුණාකර ගුරු ආදීව සත්‍ය ප්‍රකාශා නමහ///

පෙරහැර මණ්ඩපයට ආවේ පැය එකහමාරක් පමණ නියමිත වේලාවට පසුවය. ඒ අතර තපස්වීන් පිරිවරා ගෙන සුදු ඇඳුමින් සැරසී ජනනී වේදිකාවට සැපත් වූවාය. සියලුම දෙනා දණ ගසා ඇයට වැන්දෝය. ඇය මිනිත්තු 15 ක පමණ දේශනයක් කොට වේදිකාවෙන් බැස ගියාය. ඒ අතර බැංගලෝරයේ සිට සරසන ලද ලොරි දෙකකින් විශාල ඔප කරන ලද කළුගල් තොගයක් වේදිකාව ළගට ගෙනෙන ලදී. එය පිළිගත් ජනනී එයට මල් පූජා කළාය. ඉන් පසුව අප ඇතුළු සියලුදෙනාම එම රියේ නිර්මාණය කර තිබූ විශාල මල් ආසනයට මල් පූජා කළෙමු.

දැන් මේ පිට්ටනියේ වේදිකාව ඉදිරිපිට දස දහසකට අධික පිරිසක් රැස්ව සිටියහ. මේ අවස්ථාවේදී මා සහ ඉස්ලාමීය නායක මවුලානා වහිඩුඩීල් ඛාන් මහතා වේදිකාවට කැඳවූයේය. පිළිගැනීමේ දේශනයකින් පසු ප්‍රධාන අමුත්තාගේ දේශනය මවිසින් කරනු ලැබීය. එයට මිනිත්තු 40 ක පමණ කාලයක් ගත විය. මගේ දේශනයෙන් පසු මලයාල භාෂාවෙන් මගේ දේශනයේ සාරාංශයක් කාන්තාවක් විසින් ඉදිරිපත් කරන ලදී. මගේ දේශනයෙන් පසු ඉස්ලාමීය නායකයා ද, කේරළ ප්‍රාන්තයේ මැතිවරණ කොමසාරිස් ද, තවත් ඉහළ පෙළේ රාජ්‍ය සේවකයෝ ද දේශන පැවැත්වූහ. රාත්‍රී 9.30 ට පමණ අවසර ගෙන අප තිදෙනා සුබ්‍රමනියම් මහතා සමග නගරයේම හෝටලයකින් මසාල තෝසයක් බුදීමෙන් පසු නැවත අපේ නවාතැනට ගියෙමු. පසුවදා උදේ වරුවේ සිද්දූ මහතා සමග එතැන සිට කිලෝමීටර 45 ක පමණ දුරින් පිහිටි මිත්‍රනිකේතන ආයතනයට ගොස් එය නරඹා එහි ශිෂ්‍යයින්ට සහ ගුරුවරුනට දේශනයක් කොට විශ්වනාදන් මහතාගේ ගෙදරින් දිවා ආහාරය ගෙන ආපසු අපි ආශ්‍රමයට පැමිණියෙමු.

එදා සැන්දෑ භාගයේය වැඩිම පිරිස ආශ්‍රමයට එක්රොක් වූයේ. කිසිම තැනක නැගිට සිටීමටවත් ඉඩක් තිබුණේ නැත. කහ පාට කළගෙඩි සහල් සහ මල්වලින් සරසා ගෙන, කළ හිසමත තබා

ගත් දස දහස් ගණන් බැතිමතුන් ඉතාමත් ශාන්තව සහකරණ මන්දිරයට පැමිණියහ. අවසාන පිරිස එහි ළඟා වන විට රාත්‍රී 12.00 ත් පසු වී තිබිණි. ඒ උත්සවය හඳුන්වන්නේ කුම්භමේලා උත්සවය කියාය.

පසුදින උදෙන්ම නැගිට 6.00 ට පමණ ජනනී හමුවීමට තිබුණු නිසාත්, 7.30 ට පෙර ගුවන් තොටුපළට යෑමට තිබුණු නිසාත් අප නවාතැන් ගෙන සිටි නිවසට ගොස් නිදා ගතිමු.

7 වැනිදා උදේ 6.30 ට පමණ ජනනී පෞද්ගලික කරුණු රැසක් මට පවසා සාමය සහ ආධ්‍යාත්මික පුනර්ජීවය සඳහා සර්වෝදයත්, පරම්පරාවත් යන දෙකම කැපවී තිබෙන නිසා උනුන්ට සහායවීමේ අවශ්‍යතාවය මට වටහා දුන්නාය. අප තිදෙනාටම ගුරුගේ ආශීර්වාදය සමඟ කෑම අඩංගු පාර්සල් තුනක් තෑගි කළාය. අපි ජනනීගෙන් සමු ගතිමු. සිද්ධු ඇතුළු ආශ්‍රමයේ දායකයෝ පිරිසක් අප ගුවන් තොටුපළට ඇරලූහ. 10.45 ට පිටත් වූ ගුවන් යානයෙන් 11.30 ට පමණ අපි කටුනායකට ළඟාවීමු.

291

රටේ ගෞරවය රකින ජීවා හා මානෙල්

කොළඹ නාලන්දා මහා විද්‍යාලය වැනි උසස් අධ්‍යාපන ආයතනයක ගුරුවරයෙක් වශයෙන් සේවය කරන්නට ලැබීම මහත් වාසනාවක් ලෙස මම සලකමි. දශක දෙකකට කිට්ටු කාලයක් නාලන්දාවේ සේවය කළ මට ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ඉතා උසස් තත්ත්වයට පත් වූ ශිෂ්‍යයන් සෑහෙන සංඛ්‍යාවක් අද වන තුරු ආශ්‍රය කිරීමට ලැබීම ද හිතට සතුටක් දෙන කරුණකි.

මේ ශිෂ්‍යයන් අතරින් සමහරුන්ගේ ආගන්තුක සත්කාර විඳින්නට ද මට භාග්‍යය ලැබී තිබේ. මම ඇමෙරිකාවේ නැගෙනහිර කලාපයේ හෙවත් නිව්යෝර්ක්, වොෂින්ටන්, බොස්ටන් ආදී ප්‍රදේශවලට ගිය හැම අවස්ථාවකදීම දින කිහිපයක් නතර වී විවේක ගෙන මගේ ගෙදර මෙන් මා කාලය ගත කරන එක් තැනකි ජීවා ගනේපොල, මා දයාබර ශිෂ්‍යයාගේ නිවහන. එය පිහිටියේ නිව්යෝර්ක් නගරයේ සිට කිලෝමීටර් 40 ක් පමණ ඈත පිහිටි නිව්ජර්සි, හිස්ල්ඩේල්, ඇල්ෆයින්ටෙරස්හි අංක 64 දරණ ස්ථානයේය.

පද්මජීව ගනේපොල මහතා

මානෙල් ගනේපොල මැතිනිය

ඔහුගේ සම්පූර්ණ නම ගනේපොල ආරච්චිගේ පද්මජීව ගනේපොලය. ඔහුට අප කුඩා කල සිට ආමන්ත්‍රණය කරන්නේ ජීවා යන නමිනි. ශ්‍රී ලංකාවේ ගාල්ලේ උප්පත්තිය ලත් ජීවාගේ පියා පාඨශාලා පරීක්ෂකවරයකු හැටියට ද අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු හැටියට ද කටයුතු කරනු මට මතකය. ඔවුන් ඒ කාලයේ නැවතී සිටියේ රාජගිරියේ නිවහනකය. හීන්දෑරි කුඩා ශරීරයකින් ද පැත්තට පීරන ලද හිසකෙස්වලින් ද යුතු වූ සුදු කොට කලිසමක් සහ කමිසයක් ඇඳ 9, 10 පන්තිවල වාඩි වී එදා ඉගෙන ගත් හුරුබුහුටි ශිෂ්‍යයා මට අදත් මතකය.

නාලන්දාවේ ඉගෙන ගන්නා කාලයේදි තමන්ගේ සහෝදර ශිෂ්‍යයින් සමඟ එක් වී රොකට්ටුවක් සාදා කැම්බල් උද්‍යානයේදි ගුවන්ගත කිරීමට ඔහු ගත් ප්‍රයත්නය එවකට සියලුම පුවත්පත්වල විශාල ලෙස පළ වී තිබුණි. කුඩා කලදී එසේ හපන්කම් පෙන්වූ ජීවා අද ඇමෙරිකා එක්සත් ජනපදයේ පුරවැසියෙකි.

ඔහු අද පදිංචි වී සිටින නිවසේ ජීවා හා මානෙල් අවුරුදු 40 ක් පමණ පදිංචිව සිටිත්. එකම දරුවා වන සයුරී දියණිය විවාහ වී නිව්යෝර්ක් නගරයේ මූල්‍ය ආයතනයක තම සැමියා සමඟ සේවය කරයි. මානෙල්දේවී සෙනෙවිරත්න අත්තනගල්ලේ සුප්‍රසිද්ධ සෙනෙවිරත්න පවුලේ දරුවෙකි. ඒ යුගයේ බණ්ඩාරනායක මහතාට විරුද්ධව ජන්දය ඉල්ලීමට තරම් ශක්තියක් තිබුණු එඩිතර දේශපාලඥයෙක් වූ සෙනෙවිරත්න මහතා කාගේත් ප්‍රශංසාවට ලක් වූ ඉඩම් හිමි වැවිලිකරුවෙකි. ඒ කාලයේ සිටම මානෙල් නංගී ද ඇයගේ පියා මෙන්ම මම දන හැඳින ගෙන සිටියෙමි.

මා ඇමෙරිකාවට එන බව දන ගත් දවසේ සිට මානෙල් නංගී සහ ජීවා මල්ලී මා පිළිගැනීමට බලාපොරොත්තුව සිටින්නේ නිර්මාංශ ආහාරවලින් මුළුතැන්ගෙයි අල්මාරි පුරවා ගෙනය. ඔවුන්ගේ ලස්සන විශාල ගෙයි මටත් නිතරම මා සමඟ උදව්වට යන ක්‍රිෂ්ණා මල්ලීටත් කාමර දෙකක් වෙන්ව තිබේ. ජීවා මල්ලී නිව්ජර්සි

ප්‍රාන්තයේ වැලි (Valley) ආරෝග්‍ය ශාලාවේ වෛද්‍ය අධ්‍යක්ෂවරයාය. ඇමෙරිකාවේ පිළිකා පර්යේෂණ ආයතනයේ ප්‍රධානියාය. සුප්‍රසිද්ධ කොලම්බියා විශ්ව විද්‍යාලය, නිව්යෝර්ක් සහ වෙනත් ස්ථානවල ශල්‍යකර්ම අංශයෙන් මහාචාර්ය වරයෙක් හැටියට ක්‍රියා කරයි.

නාලන්දාවෙන් අස් වූ පසු ජීවා ගනේපොල අධ්‍යාපනය ලැබුවේ 1961 සිට 63 දක්වා ජපානයේ කියෝටෝ විශ්ව විද්‍යාලයේය. ක්‍රම ක්‍රමයෙන් ඔහු ශල්‍ය වෛද්‍ය වරයෙක් වූ පසු ඇමෙරිකාවේ උසස් වෛද්‍ය උපාධි ලබා විවිධ විශ්ව විද්‍යාල, රෝහල්වල ශල්‍ය වෛද්‍ය වරයෙක් වශයෙන් සේවය කළේය. ඔහු ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ලොව පුරා තිබෙන වෛද්‍ය සම්මේලනවල නිතරම දේශන සහ සම්මේලනවලට යන්නේය. ශ්‍රී ලංකාවේ පේරාදෙනිය සහ කොළඹ විශ්ව විද්‍යාල සමඟ අවුරුදු 30 ක පමණ කාලයක් සම්බන්ධකම් පවත්වන ඔහු ලංකාවේ ශල්‍ය වෛද්‍යවරුන් සමඟ ඉතා සංකීර්ණ ශල්‍යකර්මවල යෙදී ඇත. සම්මේලන, අධ්‍යාපන සැසි ආදිය පවත්වා ශ්‍රී ලංකාවේ තරුණ වෛද්‍යවරුන්ගේ තත්ත්වය උසස් කිරීමට බොහෝ සේ කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාව වෙනුවෙන් ඇමෙරිකා කොන්ග්‍රස් සභාව සහ ඇමරිකන් ජන මතය ශ්‍රී ලංකාවට මිත්‍රශීලී වන සේ හැරවීමේ ගෞරවය වෛද්‍යාචාර්ය ජී.ඒ.පී. ගනේපොල මහතාට හිමි විය යුතුය. 1983 ජාතිවාදී කැරැල්ලෙන් පසු සිංහලයින්ටත් ශ්‍රී ලංකා රජයටත් විරුද්ධව විශාල ප්‍රචාරයක් ඇමෙරිකාව පුරා එල්ටීටීඊ සංවිධානය විසින් පතුරවන ලදී. මෙහි තීරණාත්මක අවස්ථාවක් වූයේ විරුද්ධ පක්ෂ නායක ඒ අමිර්තලිංගම් මහතා ශ්‍රී ලංකාවට විරුද්ධ පක්ෂ සමඟ එක් වී ඇමෙරිකා එක්සත් ජනපදයේ කොන්ග්‍රස් සභාව ඉදිරියේ ලංකාවට ආධාර දීමට විරුද්ධව ක්‍රියා කළ ආකාරයයි. ඒ අවස්ථාවේ කිසිවෙක් ලංකාවේ නම ආරක්ෂා කර දීමට ඉදිරිපත් නොවීය. ඇමෙරිකාවේ නගරයක් නගරයක් පාසා ගොස් ශ්‍රී

ලාංකිකයන් උනන්දු කරවා අමිර්තලිංගම් මහතා ඇතුළු විරුද්ධවාදීන් හමුවේ ශ්‍රී ලංකාවට විරුද්ධව ඉදිරිපත් කර තිබූ කාරණා නිවැරදි කිරීමට ඔහු ඉදිරිපත් විය. කොන්ග්‍රස් කමිටු සමීක්ෂණයේදී ඔහුගේ තර්ක බිඳ හෙළීමට අමිර්තලිංගම් මහතා අසමත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එල්ටීටීඊ සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් වශයෙන් නම් කර කටයුතු කිරීමේ පළමුවන රට ඇමෙරිකා එක්සත් ජනපදය විය.

ආදි නාලන්දීය ශිෂ්‍යයෙක් හැටියට 1975 දී ඔහු ශිෂ්‍යත්වයක් පිහිටු වීය. පසුගිය වසරේ ලංකාවට පැමිණ චීන භාෂාව ඉගෙන ගැනීම සඳහා අංශයක් පිහිටුවීමට විදුහලට ඔහු උදව් විය. නාලන්දාවේ තාරකා විද්‍යා සමිතියට විශාල දුරදක්නයක් වෛද්‍ය ගනේපොල මහතා විසින් පරිත්‍යාග කරන ලදී.

ජීවා මල්ලී පිළිබඳව කරන විස්තරයකදී මානෙල් නංගී කිසිසේත් අමතක කළ නොහැකිය. ඇය ජීවාට සෙවනැල්ලක් මෙන් ළඟ සිට බලා ගන්නීය. මා එම නිවසේ සිටින කාලය තුළදී මගේ සෑම වුවමනාවක්ම ඉටු කර දෙන්නේ ඇයයි. අවුරුදු 39 ක්ම එකම නගරයේ පදිංචි වී සිටින ශ්‍රී ලාංකිකයෙක් හැටියට ඇය නොදන්නා තැනක් ඒ විශාල නගරයේ නැත. ඇය දක්ෂ චිත්‍ර ශිල්පිනියෙකි. ඇය අඳින ලද චිත්‍ර නිවසේ සෑම තැනම එල්ලා ඇත. ඇයගේ කාලයෙන් විශාල කොටසක් ගත වන්නේ ඇයගේ ලස්සන මල් පාත්තිවලින් යුත් නිවස වටා තිබෙන විශාල බිම් කොටසේය. ජීවාගේ මිතුරන්ට සංග්‍රහ කිරීම ඇය සලකන්නේ විනෝද ක්‍රියාවක් හැටියටය. මානෙල් නංගී ශබ්ද නඟා සිනාසෙන විට, ඇයගේ නිවස පමණක් නොව මුළු ප්‍රදේශයටම අලුත් ජීවයක් ලැබෙන්නේය. ඇයගේ සරල ග්‍රාමීය කටහඬ ද කොක් හඬලා කරන සිනාව ද ඇසෙන මට හැඟුණේ මා නිව්යෝර්ක් නගරයේ නොව හද්ද පිටිසර ලංකාවේ ගමක සිටින හැටියටයි.

292

කවදත් හිත මිතුරු ආචාර්ය ලීල් ගුණසේකර

ආචාර්ය ලීල් ගුණසේකර මහතා මට මුලින්ම මුණගැසුනේ 1961 දී අනුරාධපුරයේ පැවැති පූජනීය නගරය පිරිසිදු කිරීමේ මහා ශ්‍රමදාන කදවුරේදීය. දිනපතාම සන්ධ්‍යාවේ අප පවුල් හමුවක් පැවැත්වූ අතර, ඒ පවුල් හමුවේදී විද්වතෙක් ලවා දේශනයක් පැවැත්වීම අපගේ දෛනික වැඩ සටහනේ අංගයක් විය. ණීඅනුරාධපුර සංස්කෘතිය□ යන මැයින් දේශනයක් කිරීමට එවකට අනුරාධපුර උපදිසාපතිව සිටි ලීල් ගුණසේකර මහතාට මම ආරාධනා කළෙමි. ඔහු ඒ කාර්යය කාගේත් සිත් සතුටු වන අන්දමට ඉටු කළේය.

ආචාර්ය ලීල් ගුණසේකර මහතා

ලීල් ගුණසේකර මහතා සර්වෝදය රැස්වීමකදී

එතැනින් ආරම්භ වුණු අපේ සුහද බැඳීම අඛණ්ඩව දශක පහක් ඉකුත් වන අද දක්වා පැවතියේය. ඔහු කළුතර දිසාපතිව සිටි කාලයේදී මට මැග්සයිසයි ත්‍යාගය ලැබී ලංකාවට පැමිණීමෙන් පසු කළුතරදී මා පිළිගැනීමට විශාල උත්සවයක් සංවිධානය කළේය. කෑගල්ල දිස්ත්‍රික්කයේ නොයෙක් ගම්මානවලට විවිධ ශ්‍රමදාන කඳවුරු සඳහා ගිය යුගයේදී එතුමා අනිවාර්යයෙන්ම පැමිණ අපට අවශ්‍ය සහයෝගය ලබා දුන්නේය.

කැනඩා ලෝක සංවිධානයෙන් නියෝජිතයෙක් එවන ලෙස අපෙන් ඉල්ලා සිටි අවස්ථාවක එතුමා අපේ නියෝජිතයා හැටියට කැනඩාවට යැවීමට මට හැකි විය. කල්කටා නුවර පැවැති සම්මේලනයකට ද ලීල් ගුණසේකර මහතා අපේ නියෝජිතයා වශයෙන් යැවූ බව ද මට මතකය.

කලක් පොදු රාජ්‍ය මණ්ඩලයේ ආසියානු තරුණ පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා වශයෙන් ඔහු ඉන්දියාවේ චන්ඩිගා නුවර සේවය කළේය. ඔහුගේ ආරාධනයෙන් මම තෙවරක්ම

චන්ද්‍රිගාවලට ගියෙමි. එක් වරක් නවදිල්ලියට ගිය අවස්ථාවේදී මා චන්ද්‍රිගාවලට ගොස් ඔහු බැලීමට අමතක නොකළෙමි. පසු කාලයක ඔහු යුනෙස්කෝ ආයතනයට සම්බන්ධව බැංකොක්වල සේවය කළේය.

සංස්කෘතික අධ්‍යක්ෂවරයා වශයෙන් ද සමාජ සේවා අධ්‍යක්ෂවරයා වශයෙන් ද සේවය කළ ඔහු තම රාජකාරී කටයුතු සඳහා විවිධ රටවල සංචාරය කළේය. වරක් ගරු අශෝක කරුණාරත්න සමාජ සේවා ඇමතිතුමා සමඟ ඔහු පකිස්තානයේ පැවැති ලෝක සමාජ ශුභසාධන සම්මේලනයකට පැමිණි අවස්ථාවේදී අප තිදෙනා විනෝදාත්මකව ගත කළ දින කිහිපය මගේ මතකයට එයි. චීන සංචාරයකට ද අප දෙදෙනා තවත් කිහිප දෙනෙක් සමඟ ගොස් ඉතාමත්ම විනෝදයෙන් සති තුනක් පමණ චීනය පුරා සංචාරය කළ අන්දම මට මතකය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සම්මාන දිනූ පෙත්සම, අත්සන ආදී නවකතා පොත් මෙන්ම වෙනත් නවකතා පොත් ද සම්පාදනය කළ ලීල් ගුණසේකර මහතා ප්‍රවීණ ලේඛකයෙකු මෙන්ම සර්වෝදය ඇතුළු ලංකාවේ විවිධ ආයතන, සමිති සමාගම්වල නිලතල ඉසිලූ අයෙකි. ලීල් සමඟ කොපමණ දුරක් ගියත් මහන්සියක් නොදැනෙන්නේ වාහනයට ගොඩ වූ තැන සිට ගමනේ අවසානය දක්වාම සියලුදෙනා හාස්‍යයට පත් කිරීමට තරම් අත්දැකීම් මෙන්ම විවිධ කතාන්දර දිගින් දිගටම පැවැසීමට ඔහුට ශක්තිය තිබෙන නිසාය.

කොළඹ විශාඛා විද්‍යාලයේ ගුරුවරියක්ව සේවය කළ ලීල් ගුණසේකර මැතිනිය හදිසියේ මිය යෑම ඔහුට සිදු වූ විශාලම පාඩුවයි. ඉතාමත්ම ගුණවත් කාන්තාවක් වූ ඇය ඔහුගේ මිතුරන් කෙරෙහි ආගන්තුක සත්කාර කිරීමට මෙරටදී මෙන්ම පිටරටවලදී පසුබට නොවූවාය. ඔහුගේ එක් දියණියක් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරියකි. අනෙක් දියණිය විවාහ වී එංගලන්තයේ රැකියාවක යෙදී සිටින්නීය. ලීල්, කළ ගුණ දන්නා,

අගය කළයුතු දේ අගය කරන, අගය නොකළ යුතු දේ අගය නොකර හාස්‍යයෙන් බැහැර කරන අතිශය කල්‍යාණ මිත්‍රයෙක් හැටියට මම සැමදාම සලකමි.

විදේශීය සමුළුවකට සහභාගී වූ අවස්ථාවක්

***

2010 අගෝස්තු 20,21,22 යන දිනයන්හි කොළඹ දිස්ත්‍රික්කයේ පෝරේ පැවැති සර්වෝදය දේශෝදය ජාතික සභාවේදී ලීල් ගුණසේකර මහතා විසින් පවත්වන ලද කතාවේදී ඔහුගේ අතීත මතකයන් මතු වන නිසා මෙයට ඇතුලත් කිරීම අගනේ යැයි මම සිතමි.

සර්වෝදය නායක ආචාර්ය ඒ.ටී. ආරියරත්න මැතිඳුන් ප්‍රමුඛ දහසකට කිට්ටු තරුණ පිරිසක් අනුරාධපුර පූජනීය නගරය ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා 1961 දී සතියක ශ්‍රමදාන වැඩ සටහනක් සඳහා අනුරාධපුරයට පැමිණියහ. ඒ පිරිස සාදරයෙන් පිළිගැනීමටත් ඔවුනට පහසුකම් සැලසීමටත් අතිරේක දිසාපති ලෙස මාගේ රාජකාරිය විය. රාත්‍රී භෝජනයෙන් පසු පැවැත්වෙන පවුල් හමුවේදී මා කැමැති මාතෘකාවක් යටතේ කතාවක් පැවැත්වීමට ආරියරත්න

මහතාගෙන් මට ආරාධනයක් ලැබිණි. මා විසින් තෝරා ගන්නා ලද්දේ ''අනුරාධපුර පුජනීය නගරයේ පැරණි ශ්‍රී විභූතිය'' යන්නයි. එම කතාව පැවැත්වීමෙන් පසු කාගෙත් උනන්දුව වැඩි වී තවත් කතා දෙකක් පැවැත්වීමට මට අවස්ථාව ලැබිණි. මේ නිසා අනුරාධපුර සංස්කෘතිය පිළිබඳ සියලු දෙනාම ප්‍රබෝධවත් වී මා තුළ ඒ ගැන තිබූ උනන්දුව තීව්‍ර විය. සර්වෝදයට බැඳෙන ලෙස ද ආරියරත්න මහතාගෙන් ආරාධනයක් ලැබිණි.

මේ හැඳින්වීමෙන් මා අදහස් කළේ ආරියරත්න මැතිතුමා වැනි ලෝක ප්‍රසිද්ධ වැදගත් ශ්‍රී ලංකා පුත්‍රයකු අර්ධ ශත වර්ෂයක් තුළ අප රටට අවශ්‍ය ජනතාවගේ පෞරුෂෝදය දියුණු කර රටේ සෞභාග්‍යය නැවතත් ඇති කරලීමට දරන ලද ප්‍රයත්නය අගය කිරිමත් ඒ සඳහා පුද්ගලයකු වශයෙන් සහ රාජ්‍ය සේවකයකු වශයෙන් මාගේ දායකත්වය ගැන නිහතමානීව යමක් සඳහන් කිරීමයි. එතෙක් මෙතෙක් සර්වෝදයට මගෙන් ද විවිධ සේවාවන් ඉටු විය. සර්වෝදය නිසා මා ලත් විවිධ අභාෂයන් අනුව මාගේ සිතුවිලි සහ ආකල්ප ද තව දුරටත් සකස් වුනි.

පෞරුෂෝදය, කුටුම්බෝදය, ග්‍රාමෝදය, දේශෝදය සහ විශ්වෝදයට සම්බන්ධ සර්වෝදය සංසදයේ අරමුණු 06 කි. මේ අරමුණු සාක්ෂාත් කර ගැනිමට මා දිස්ත්‍රික් පාලනයේත්, මධ්‍යම රජයේ මෙන්ම ජාත්‍යන්තර සංවිධානවල කටයුතුවලදී ද මම සර්වෝදය පිළිවෙත් අනුගමනය කළෙමි. සමාජ සේවා, සංස්කෘතික, තරුණ කටයුතු, අධ්‍යාපන, පරිපාලන, ඉඩම් අමාත්‍යංශවල ඒවා යටතේ තිබුණු සියලුම ආයතන, සහ ස්වේච්ඡා සංවිධානවල කටයුතු කරද්දී ද සර්වෝදය පිළිවෙත් ඉස්මතු වුනි. මෙය ඇත්ත වශයෙන්ම ආරිය සිංහල සිරිත් විරිත්වලින් සැදි, බෞද්ධ පිළිවෙත් අනුගමනය කරන දෙස-රැස-බස අගය කරන පාරම්පරික හැදියාවකින් යුත් අප වැන්නන්ට අමුත්තක් නොවිනි. එයට හේතුව සර්වෝදයේ සම්ප්‍රදායානුකූල පදනම ලෙස ප්‍රගුණ කරනු ලබන්නේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ යන

පිළිවෙත්ය. එය ශතවර්ෂාදි කාලයක් බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව අප රටේ ජනතාව විසින් ප්‍රගුණ කරන ලද පෞරුෂෝදයේ තිරසාර පදනමයි.

පුද්ගලයන් තුළ මෙම ගුණ යහපත්කම් ඇති කර ඔවුන්ගේ ජීවිතය දුසිරිතෙන් තොරව සමාජයට බරක් නොවී ජීවත් වීමට සර්වෝදයේ දහස් ගණන් නාගරික සහ ගම්, නියම් ගම්වල අයට කරුණු පහදා දී අවශ්‍ය පුහුණු ලබා දී පුද්ගලයාගේ උදාව, ඔවුන්ගේ පවුලේ උදාව, ගමේ උදාව, නගරයේ උදාව, රටේ උදාව, අන්තිමේ දී ලෝකයේ උදාව එනම්, විශ්වෝදය දක්වා කාගේත් විමසිල්ල ඇති කිරීම සර්වෝදයේ අරමුණයි. ඇතැම් විට මෙය මහත් බලාපොරොත්තු ඇති ක්‍රියාත්මක කිරීමට නොහැකි මනඃකල්පිත පැතුමක් ලෙස පෙනෙනු ඇත. එහෙත් සතතාභ්‍යාසයෙන් සහ ආදර්ශයෙන් විශ්ව ශක්ති ගැන සදහන් කරන ආරියරත්නයන් තුළ ඒ පිළිබඳ මහත් විශ්වාසයක් ඇත. ඇත්ත වශයෙන්ම ලෝකයට මේ වකවානුවේ අවශ්‍ය වී ඇත්තේ බුදු සමය ප්‍රමුඛ අනෙකුත් ආගම්වලින් බලාපොරොත්තු වන සාමය හා සදාචාරයෙන් හෙබි සංවර්ධනයයි. ඒ සදහා විශ්ව ශක්තියක් ද කේන්ද්‍රවේ. පීඩාකාරී ලෝක යුද්ධ, දරුණු අපරාධවලට තුඩුදෙන විෂ මත්ද්‍රව්‍ය, මත්පැන් භාවිතය, විවිධ දූෂණවලින් සැදි ව්‍යාකූල ලෝකයට මුහුණ පාන්නට වී ඇති අහිතකර ව්‍යවසනවලට පිළියම් සෙවීමයි.

මෙම ව්‍යසන පිළිබඳව විග්‍රහයක් කරන සර්වෝදය ජාතික දේශෝදය මණ්ඩලය කරුණු 11 ක් මතුකර ඇත. එනම්,

(i) වටිනා මිනිස් ජීවිත විනාශ විම.
(ii) සදාකාලික ආබාධිතයන් බිහි වීම.
(iii) මූලික මානව අයිතීන් උල්ලංඝනය වීම.
(iv) සමාජ සහ ආර්ථික වශයෙන් අනාරක්ෂිත හා අර්බුදකාරි තත්ත්වයක් නිර්මාණය වීම.
(v) සාමාන්‍ය ජන ජීවිතය අඩාල වීම.
(vi) ළමුන් හා ස්ත්‍රීන් පීඩාවට පත් වීම.
(vii) අපරාධ හා හිංසන ක්‍රියාදාමයන් වර්ධනය වීම.

(viii) මානව හිතවාදි සමාජ නායකයින් අභිමිවිම.
(ix) සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය අඩපන විම.
(x) ප්‍රජාතන්ත්‍රවාදයටත්
(xi) සමස්තයක් ලෙස මුළු මහත් සමාජ ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර ලෙස කරනු ලබන බලපෑම යන කරුණුයි.

ඊළගට අපි මේවා තුරන් කිරිමට හෝ අඩු කර ගැනීමට සර්වෝදය අනුගමනය කරන චිරාගත සම්ප්‍රදායානුකූල ප්‍රතිපත්ති සලකා බලමු. එනම් සතර සංග්‍රහ වස්තු ලෙස සැලකෙන දාන, ප්‍රියවචන, අර්ථචර්යා හා සමානාත්මතා ආකල්ප ශ්‍රී ලංකා සමාජයේ අවුරුදු දහස් ගණනක් තුළ අත්හදා බලා සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලද මේ ප්‍රතිපත්තියි. ප්‍රජා සංවර්ධනය සදහා සිව් බඹ විහරණය පදනම් කර ගෙන සතර සංග්‍රහ වස්තු සංකල්පය ක්‍රියාත්මක කිරිමයි. ඇත්ත වශයෙන්ම දේශිය ජිවන පරිචය සදහා මෙම ක්‍රියාදාමය කොතරම් අවශ්‍ය දැයි ජනමාධ්‍යයෙන් වාර්තා වන අවිනීත සමාජ තත්ත්වයන් පිළිඹිබු කරයි. සර්වෝදයේ අපි පරණ පිළිවෙත් අනුගමනය කරමින් සංවර්ධන වන සමාජයක කනා පල්ලම් ගසනු සේ ඇතැම් අය සළකන බව පෙනේ. එසේ වුවද මෙම තත්ත්වය නම් චිරාගත සම්ප්‍රදායානුකූල සංස්කෘතික හරයන් සෝදාපාළු වී යන මෙකල නුතන සංවර්ධන මතවාදීන්ට මතක් කර දිය යුත්තක් ඇත. එනම් සංවර්ධනය යනු, පුහු ආටෝපයෙන් යුත් බාහිර පෙනුමක් ඇති භෞතික අංග උපාංග නොවේ. මේ පිළිබදව ශ්‍රේෂ්ඨ ජාතික විරයෙකු වු අනගාරික ධර්මපාලතුමා සරල ලෙස සදහන් කරන ලද 'සපත්තු දිලිසෙනවා මිනිස්සු පිරිහෙනවා' යන කියමනේ ගැඹුරු අරුතක් ඇත. සර්වෝදයේ ආරියරත්නයන් ප්‍රමුඛ විද්වතුන්ගේ දේශන ලියකියවිලි සහ ආදර්ශයන් අනුව සංවර්ධනය කියන්නේ මිනිසාගේ සහ පැවැත්ම සදහා අවශ්‍ය මානුෂීක දියුණුවයි. අපවත් වි වදාල පුජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නායක ස්වාමීන්වහන්සේ ද මෙම කරුණු නිතර අවධානය කළ සේක.

එක් දහස් නවසිය හැත්තෑ ගණන්වලදී සර්වෝදය වෙනුවෙන් අපරදිග සහ පෙරදිග රටවල විවිධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ දේශනවලට සහභාගිවීමට ආරියරත්න මහතා විසින් මට අවස්ථාව ලබා දෙන ලදී. ඇතැම් විට මා විසින් රාජකාරි කටයුතු සඳහා ද එම විදේශ ගමන් යොදා ගන්නා ලදී. කැනඩාව, එක්සත් රාජධානිය, යුරෝපයේ විවිධ රටවල් ඉන්දියාව, තායිලන්තය මෙන්ම ආසියා ශාන්තිකර කලාපයේ විවිධ රටවල ද එම සංචාරවල යෙදුනු විට මා ලත් අත්දැකීමක් ඇත. එනම්, ශ්‍රී ලංකාවේ කෙනෙකු යයි දැනගත් විට විදේශිකයින් ලෝකයේ ප්‍රථම අගමැතිනිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගැනත් සර්වෝදයේ නායක ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතා ගැනත් විශේෂයෙන් විමසිලිමත් වීමයි. එම යුගයේ ශ්‍රී ලංකාවේ කිර්තිය දෙගුණ තෙගුණ වීමට බණ්ඩාරනායක මැතිනිය දේශ ප්‍රතිපත්තියේ නොබැඳි රටවල්වල සාම සබඳතා ව්‍යාපාරයත්, ආරියරත්න මහතාගේ සර්වෝදය ව්‍යාපාරයත් ලබා තිබූ ජාත්‍යන්තර පිළිගැනිම හේතු විය. ඇත්ත වශයෙන්ම ත්‍රස්තවාදය උග්‍ර විමට පෙර නොයෙකුත් රටවලට ගුවන් ගමන්වලදී ශ්‍රී ලංකාවේ කෙනෙකු බව දැනගත් විටත් ගමන් මලුවල සර්වෝදයේ නෙළුම් මල පිබිදෙන සූර්යා ලාංඡන දුටු විටත් යම් සහනයක් ලැබුණු බව පැහැදිලි විය. ඒ නිසා අප රටේ විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී එක් දහස් නවසිය පනස් ගණන්වල සිට දරන ලද සර්වෝදය ප්‍රයත්න අදට ද වලංගු වන බව කිව යුතුය.

කටයුතුවලදී කිසිම වෙනස් කමක් නැතිව මනුෂ්‍යත්වයට ගරු කොට බුදුදහම ආභාෂයෙන් සුබසෙත සැදීම සර්වෝදයේ මූලික අරමුණයි. ඒ නිසා ශ්‍රී ලංකාවේ සිව් දිගින් ජනතාව එක් රැස් කිරිම සර්වෝදයේ ක්‍රියාදාමයයි. බෙදුම්වාදී දේශපාලනයේ ප්‍රශ්නයක් වූ රටේ සාමය සදාචාරය සහ සංවර්ධනය පවත්වා ගැනිමට ඇති දුෂ්කරතාවය මග හැරීමට වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් අනුගමනය කරන්නේ ද එම පිළිවෙත බව සක් සුදක් සේ පැහැදිලිය. මෙහිදී සර්වෝදයේ ප්‍රතිපත්ති අනුගමනය කරන ඇත්ත වශයෙන්ම එම ප්‍රතිපත්ති අගය

කිරීමට පුහුණුව ලත් අපේ යුගයේ දේශපාලනඥයින් සුළු ගණනක් අපට සිහිවේ. ඔවුන්ගේ චරිත අන් අයගේ චරිතවලට වඩා සහනශීලි බව පෙනේ. රාජ්‍ය කළමනාකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය රාජ්‍ය සේවය දියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස නොබෝදා පුවත් පත් දැන්වීමකින් ඉල්ලීමක් කර තිබුණි. මගේ අත්දැකීම අනුව ඒ සඳහා ඉහල මට්ටමේ සිට ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට සර්වෝදයේ කටයුතු පිළිබඳ ප්‍රතිපත්තිමය වශයෙන් සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයක් ලබා දීම සුදුසු බව සඳහන් කරනු කැමැත්තෙමි. එය දේශීය සහ විදේශීය කටයුතුවලට මහත් සේ උපකාරි වනු ඇත. මෙකල චින්තනය අනුව අපේ සම්ප්‍රදායානුකූල සංස්කෘතික පැවතුම් වර්තමාන තාක්ෂණ විද්‍යාව සහ විවිධ මාධ්‍ය කටයුතුවලදි අපට ඔබින පරිදි දේශියත්වයට මුල් තැන දෙමින් සකස් කර ගැනීමට එවිට ආකල්ප වෙනස්වීම ඉවහල් වනු ඇත.

1971 තරුණ අරගලයට සම්බන්ධ වූ ශ්‍රී ලංකාවේ විවිධ ජාතින් සහ ආගමික මෙන්ම භාෂා කතා කළ විසිදහසක් තරුණයින් පුනරුත්ථාපනය කිරීමේදි සර්වෝදයේ කටයුතු සහ ක්‍රමඋපායන් රජය වෙනුවෙන් මම ප්‍රයෝජනයට ගතිමි. සෑම මට්ටමකම නිලධාරින්ගේ ආකල්ප වෙනස් කර එම පුනරුත්ථාපන ලාභීන්ගේ යහපත සාදා දිමට නිලධාරීන් පුහුණු කිරීමත්, පෞද්ගලික සමාජ සම්බන්ධතාවයන් ඇති කර ගැනීමටත් ඒ ක්‍රම උපායන් අතිශයින්ම උපකාරි වී කටයුතු සාර්ථක විය. ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන වැඩ පිළිවෙළේ සාර්ථකත්වයට තුඩු දුන් විශේෂ හේතුවක් ලෙස ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ ඉහළම මට්ටමේ නිලධාරීන් තුළ ආකල්ප වෙනසක් ඇති කර මේ අපේ රට, මේ අපේ මිනිස්සු යන හැඟීම ඇති කර තිබීම බව ත්‍රස්තවාදින් පුහුණු කිරිමේ කටයුතු පිළිබඳ විශේෂඥයෙකු වූ බ්‍රිතානයේ ඩග්ලස් හයිඩ් විද්වතාණන් විසින් එකල ප්‍රකාශ කරන ලදී. අදට වුවද මේ සර්වෝදයේ මූලධර්මය කොතරම් කාලෝචිත ද යන බව අමුතුවෙන් කිව යුතු නැත. මෙම පුනරුත්ථාපන කටයුතු සාර්ථක කර ගැනීමට මට සහය දුන් සියලුම

දෙනා තෝරාගනු ලැබූ පදනම වූයේ හැඟීමක් සහ දැනීමත් ඇති අය වශයෙන්ය. ඒ සඳහා සම්පූර්ණ නිදහසත් මුදල් ප්‍රතිපාදනත් ලබා දුන් එකල රජයට මම අතිශයින්ම ස්තුතිවන්ත වෙමි. එහි ප්‍රතිඵලයක් ලෙස පොදු රාජ්‍ය මණ්ඩලයේ තරුණ කටයුතු පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය සංවර්ධන අධ්‍යක්ෂක ලෙස කටයුතු කිරීමට මට භාග්‍ය ලැබුණි. ඒ අනුව අවුරුදු ගණනක් ආසියා ශාන්තිකර ප්‍රදේශයේ ශ්‍රී ලංකාව ඇතුළුව තරුණ කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති පුහුණු කිරීම්, දැනුවත් කිරීම්, සැලසුම් සෑදීම්වලට අදාල පර්යේෂණ සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන විට මූලික සර්වෝදයේ මග අනුගමනය කිරීම නිසා කටයුතු සාර්ථක ලෙස ඉටු කර ගැනීමට හැකි විය.

බොහෝ රටවල ඉහලම මට්ටමේ සිට සාමාන්‍ය තත්ත්වයේ අය ආරියරත්න මහත්මයා හඳුනා ගෙන තිබූ අතර ශ්‍රී ලංකාවේ 'සර්වෝදය වන්දනාවෙන්' පැහැදී සිටි අය ද වූහ. මේ එක් අතකින් බලන විට අපේ දේශෝදය විශ්වෝදය වෙත යාමේ පියවරකි. අප රටේ පුද්ගලයින් අතර ආචාර්ය ආරියරත්නයන්ට තරම් ප්‍රජා සංවර්ධය පිළිබඳ කීර්තියක් ඇති කෙනෙකු නැති තරම්ය. එතුමා තරම් විවිධ උසස් මට්ටමේ ජාත්‍යන්තර සහ විවිධ රටවල රාජ රාජ නායකයන් විසින් උපහාර පිරිනමනු ලැබූ කෙනෙකු නොමැති බව සඳහන් කිරීම මගේ යුතුකමයි. එමෙන්ම එම උපහාර සම්මාන අනුව ශ්‍රී ලංකාවේ යහපතට කටයුතු කරන පුද්ගලයන් සඳහා සර්වෝදය ජාතික සම්මාන පිරිනැමීමත් ආදර්ශමත්ය.

එබැවින් මහත් සේ ඇප-කැප වී අප්‍රතිහත ධෛර්යයෙන් බෙදී වෙන් වුනු සමාජයක ජනතාව රැස් කරමින් ඔවුන්ට මග පෙන්වන සර්වෝදයේ දේශෝදය පියවර සඳහා විවිධ ප්‍රදේශවල සිට මෙහි පැමිණ සිටින ඔබ සැමට මාගේ සුභාශීංසනය පිරිනමමි. මෙම කටයුතු සාර්ථක වීමට ඔබ සැම දක්වන ක්‍රියාකාරී සහභාගිත්වයෙන් බොහෝ අයට යහපතක් වනු නොඅනුමානයි. ආචාර්ය ආරියරත්නයන් ඇතුළු සැමට ජය සිරි සෙත් පතමි.

පූජ්‍ය වැලිගම ධම්මිස්සර හිමියන්ගේ මතකයෙන්

මම අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වූයේ 1973 වසරේදීයි. ඉන් පසු උසස් පෙළ හැදෑරීම සඳහා 1974 දී මාතර මහාමන්තින්ද පිරිවෙනට ඇතුළු වූයෙමි. එහි ශිෂ්‍යයෙක් ලෙස ඉගෙන ගනිමින් සිටිය දී එක් දිනයක දවස පුරාම සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය මගින් භික්ෂු සම්මේලනයක් පිරිවෙන් ශාලාවේ පවත්වන ලදී. එම සමුළුවේ මං සිත් ගත් උසස් මට්ටමක කතාව වූයේ පී.ඒ. කිරිවන්දෙනිය මහතාගේ කතාවයි. එදා එම කතාව මගින් අපේ රටේ ජාතික කොඩිය හා එහි සඳහන් සංකේතවලින් කියාපාන අර්ථ ජාතික පණිවුඩයක් ලෙස ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලාංකික අතීත

පූජ්‍ය වැලිගම ධම්මිස්සර හිමිපාණෝ

උරුමයෙන් ප්‍රේක්ෂකයාගේ හදවත් ජාතිකාභිමානයෙන් පිරවීමට එම අර්ථකතනය තුළින් හැකි වූවා යයි මම විශ්වාස කරමි.

සවස් කාලයේ මා වශීකෘත වූ ඊලඟ කතාව පැවැත්වූයේ එම සර්වෝදය ව්‍යාපාරයේ නායක ඒ.ටී. ආරියරත්න මහතායි. අපේ ශාසන ඉතිහාසය පිළිබඳව අගනා විස්තරයක් කළ එතුමා එම ඉතිහාසය අද දවසේ අප විසින් කළයුතු වන්නේ කොපි කිරීම නොව අලුත් අනාගතයකට ගොඩනැඟීම බව පැහැදිලි කිරීම එම කතාවෙන් සිදු කෙරුණි. ඒ සඳහා භික්ෂූන් වහන්සේලාට ඇති පාරම්පරික උරුමයේ ශක්තිය භාවිතා කොට ක්‍රියා කළයුතු යුගය මේ යුගයෙහි පහදා ඒ සඳහා 'සර්වෝදය' මගින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙල ගැන දිගු විස්තරයක් කරන ලදී. එමගින් නම නොකීවාට සමාජය තුළ මිනිසුන් අතරේ මේ ක්‍රියාත්මක තත්ත්වයට පත් කරන්නේ බුදුදහම නොවේ දැයි මට සිතුණි. බණ පොතේ ලියා ඇති දේ මිනිසාගේ ජීවිතයට බද්ධ කරන ක්‍රියාවලිය සර්වෝදය නමින් අරඹා ඇත්තේ ඇත්තෙන්ම මෙයින් ක්‍රියාත්මක සජීවීකරණයට පත් කරන්නේ බුදුදහම නොවේ දැයි මට සිතුණි. මිනිසා ගුණ නැණ වලින් යුතු පිරුණු උතුම් මිනිසෙක් බවට පත් කිරීමේ වැඩ පිළිවෙල කුඩා ළදරු වියේ සිට අරඹා ලොව පුරා විහිදුවාලන වැඩ පිළිවෙලක ඇති අසීමිත අගය ගැන එම දෙසුමට සවන් දුන් අපි සැවොම වශීකෘත වූයෙමු. ඉන්පසු ඉගෙනීමේ කටයුතුවලින් බැහැරව ගත වූ සෑම අවස්ථාවකම එම ව්‍යාපාරය සංවිධානය කළ ශ්‍රමදාන වැනි වැඩ සටහන්වලට මම උනන්දුවෙන් සහභාගි වූයෙමි. එදා එම භික්ෂු සමුළුව සඳහා පැමිණි පිරිස තවම මගේ මතකයේ තිබේ. මහාචාර්ය හැවන්පොල රතනසාර නාහිමි, මහාචාර්ය එල්.ජී. හේවගේ මහතා හා එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා ඒ අතර සිටි පිරිස වූහ.

ඉන් පසු සතිඅන්ත දිනවල සර්වෝදය භික්ෂු පුහුණු පාඨමාලාවන් පිරිවෙණේ ඇරඹුණු අතර එය අවසන් කළ හැම දෙනාම මොරටුව මෙත්මැඳුරේ සතියක නේවාසික පුහුණුවකට යොමු කෙරුණි. ඉන් පසු නිවාඩු දිනවල මාතර නගරයෙන් බැහැර

ඈත එපිට ගම්මානවල පැවැති ශ්‍රමදාන කඳවුරුවලට සහභාගිවීමට පිරිසක් තෝරා ගැනුනු අතර මාද ඊට ඇතුළුව සිටියෙමි. ඈත ගම්වලට ගොස් නිවාඩු දිනවල මිනිසුන් සමඟ වැඩ කිරීමෙන් ඇසුරු කළ පිරිස් විශාලවීමත් නිසා ඒ සඳහා අපි සහභාගි වූයේ අභිරුචියෙනි. ඒ අතර සිදු වූ අමතක නොවන වැදගත් සිදුවීමක් තවම මගේ මතකයෙහි රැඳී ඇත. සර්වෝදය මාතර නියමු සේවක මහතා සංවිධානය කළ එම ශ්‍රමදාන කඳවුර පැවැතියේ කඹුරුපිටියටත් ඈතින් වූ උඟුරුබොක්ක නම් වූ ග්‍රාමයේයි. දවස පුරාම පැවැති ශ්‍රමදාන වැඩ සටහන අවසානයේ සන්ධ්‍යාවේ පැවැති පවුල් හමු රැස්වීමේදී කතාවක් පැවැත්වීමට මගේ නම කියා මට ඇරයුම් කරනු ඇසුණි. කිසි කලෙක මයික්‍රෆෝනයකින් කතා නොකළ මට පිරිවෙණේ ශිෂ්‍ය සමිතිවල පමණක් කතා කර තිබූ මට මෙය බරපතල ගැටළුවක් සහිත විශාල අභියෝගයක් විය. (එවකට මගේ වයස අවුරුදු 19 ක් පමණි. මම කතාව පැවැත්විය යුතු තැනට ගියෙමි. වටපිට බැලූ විට සියල්ලෝම මා දෙස බලා සිටිති. ආපසු හැරී ගොස් වාඩිවීමට ද දැන් බැරිය. ටිකෙන් ටික මගේ ඇඟිලිවලින් ඇරඹී වෙව්ලීම අත් දෙක පුරාමත් දෙපා දක්වාත් විහිදී ගොස් හමාරය. මම දැතින්ම වහාම දැඩි ලෙස මයික් ස්ටැන්ඩ්එක අල්ලා ගතිමි. හිත තදකර ගතිමි. ඇස්දෙක පියා ගතිමි. මගේ හිත තුළ තබාගෙන තිබූ කිය යුතු කරුණු වේගයෙන් කියාගෙන කියාගෙන ගියෙමි. සියල්ලෝ නිහඬව අසා සිටින බව දැනේ. අත්වල ඇඟිලිවල වෙව්ලීම දැන් අඩු වී ඇති බව දැනේ. මගේ දකුණු අත මයික් ස්ටැන්ඩ්එකෙන් ගෙන, ඉනට තබා ගෙන කතාව කරන අතරතුර ඇස් හැර බැලුවෙමි. ඇයි මම මෙතරම් බිය වන්නේ. මම මගේ කතාව ඉතාම හොඳින් කර අවසන් කළෙමි. වැව, ගම, පන්සල, දාගැබ ගැන පුරාණ සංස්කෘතිය පිළිබඳව මම සිතාගත් පින්තූරය කතාවකින් දිග හැර පෙන්වීමට මම ගත් උත්සාහය සාර්ථකව කළා යැයි මම මටම ලකුණු දමා ගතිමි. මගේ සබකෝලය, වෙව්ලීම, බියවීම වැනි දුර්වලකම් වසා ගැනීමට ගත් උත්සාහය කාටවත් හසු නොවූ වේ යයි සිතමි. රැස්වීමෙන් පසු රාත්‍රී නින්දට ගිය විට

මගේ මිතුරු හිමිවරුන් මොනවා කියනවා දැයි විමසිලිමත් වූයෙමි. කතාව නම් මරු. හරිෂෝක්. කීපදෙනෙක්ම කියූ අතර හැබැයි, කතාවේ වේගය වැඩියි. ස්ලෝ... ස්ලෝ... කියලා අපි පිටිපස්සෙන් ඉඳන් කියූ දේ ඇහුනෙ නෑනේ. නැත්නම් වැඩේ හොඳයි. (මසකට වරක් පමණ පැවැත්වෙන ශ්‍රමදාන වැඩ සටහනකට මාතර දිස්ත්‍රික්කයේ පමණක් නොව ගාලු දිස්ත්‍රික්කයේ ද වැඩ සටහන්වලට අපි උනන්දුවෙන් සහභාගි වූයෙමු. ක්‍රමයෙන් සර්වෝදය වැඩ සටහන්වලට සහභාගිවීම අභිරුචියකින් සිදුවන අතරේ වැලිගම අග්‍රබෝධි රජමහා විහාරස්ථානයේදී සර්වෝදය සංඝ සම්මේලනයක් පැවැත්වීමට ද කටයුතු පිළියෙල කළෙමි. 1974 සැප්තැම්බර් 24 වැනි දින අපේ නායක හාමුදුරුවන් වූ පාතේගම ශ්‍රී නන්දාරාම නාහිමිපාණන්ගෙන් අවසර ලබා ගෙන අවශ්‍ය සියලු පහසුකම් සපයා දී ප්‍රදේශවාසී භික්ෂූන් වහන්සේලා සඳහා දවසක සර්වෝදය සංඝ සම්මේලනයක් පැවැත්වීමට හැකි වූයෙමු. මම උපන් ගමට මගේ පන්සලේදී එම සත් කාර්යය සාර්ථකව ඉටු කර ගැනීමට හැකිවීම පිළිබඳව අදත් මම සතුටු වෙමි. වැලිගමට සර්වෝදය හඳුන්වාදීමත් ගම් මට්ටමේ විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පසු වන විට නියමු සේවකයෙක් පත් කිරීමටත් සිදුවීමෙන් එහි ප්‍රගතිය කොතරම් දැයි තේරුම් ගත හැක. වැලිගම සර්වෝදය සංඝ සම්මේලනයෙන් පසු භික්ෂූන් වහන්සේලා රත්නපුර දිස්ත්‍රික්යේ පාතකඩ භික්ෂු පුහුණු ආයතනයට ගොස් පුහුණුව ලැබීමට ද උනන්දු වූහ.

ඉන්පසු අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම 1975 වන විට අත්හැර දැමීමට මම තීරණය කළෙමි. ඊට හේතුව වූයේ මම අනුරාධපුර බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ ප්‍රවේශ පරීක්ෂණයෙන් සමත්වීමයි. මේ නිසා එම භික්ෂු විශ්ව විද්‍යාලයේ ත්‍රිපිටකවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා මම අනුරාධපුරයට ගියෙමි. 1978 වසර වන විට අපි එහි තෙවැනි වසරේ ශිෂ්‍යයින් වී සිටියෙමු.

මේ වසරේ සිදු වූ වැදගත් සිදුවීමක් වූයේ අපේ 25 ක් පමණ වූ ආචාර්ය මණ්ඩලයෙන් පිටස්තර විශේෂ දේශනයක් පැවැත්වීමට අපට හැකිවීමයි. එවකට උපකුලපති ධූරය එනම් එම ආයතනයේ හැටියට පීඨාධිපති ධූරය දැරුවේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක හෙළහවුලේ නයු. අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති පූජ්‍ය කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක නාහිමිපාණන් වහන්සේයි. ප්‍රථම වරට පිටස්තර දේශකයෙක් ගෙන්වා විශේෂ දේශනයක් පැවැත්වීමේදී නියමිත අවසරය ලබා ගැනීමට සමත් වූයෙමි. ඒ සඳහා මට තිබූ බලය වූයේ මහා ශිෂ්‍ය සංගමයේ සිංහල අංශයේ ප්‍රධාන ලේකම් ධූරය දැරීමයි. මම නිවාඩුවට අනුරාධපුර සිට වැලිගම යන විට මොරටුව දම්සක් මන්දිරයට ගොස් ඒ සඳහා ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතාට ආරාධනා කළෙමි. ඊට අමතරව අපේ ශ්‍රවණාගාරයේ කිසි කලෙකත් චිත්‍රපටියක් පෙන්වා තිබුණේ ද නැත. ඒ සඳහා ''පාරක් හදමු පාරෙන් හැදෙමු'' නම් වූ සර්වෝදය චිත්‍රපටිය ද තෝරා ගැනීමට ද හැකි විය. මෙම අමුතු අලුත් වැඩ සටහන් දෙක ඉටු කිරීමට ශිෂ්‍ය පිරිසගෙන් ලැබුණු සහාය විශාල බව සඳහන් කළ යුතුය.

1967 දී එවකට අධ්‍යාපන හා සංස්කෘතික ඇමතිව සිටි අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල මහතාගේ සංකල්පයක් අනුව පිහිටුවන ලද එම විශ්ව විද්‍යාලය නම භාවිතා නොකරන පැරණි භික්ෂු අධ්‍යාපනය විදර්ශනා භාවනාව සහිතව අනුරපුර මහා විහාරයේ සංඝාවාසවල වැඩ සිටි මහ රහත් ගුණ වඩන භික්ෂු පිරිස සිහිපත් කරවන අධ්‍යාපන ආයතනයක ස්වරූපය ගත් තැනකි. එවැනි තැනක බාහිර දේශකයින් ලවා දේශන පැවැත්වීම, චිත්‍රපටි පෙන්වීම, එදා මහ පෙරළියක් ලෙස සැලකුණි. එම සියලු කටයුතු අදාල බලධාරීන් සමඟ කරුණු පහදා දෙමින් සත් භාවයෙන් යුතුව ඉල්ලා සිටීමෙන් ඉටුකර ගත හැකි වූයෙමු.

චිත්‍රපටියක් පෙන්වීමෙන් ඇරඹි එම නම්‍යතාවයෙන් යුත් වැඩ සටහන පසුව මාසිකව පවත්වා ගෙන යාමට අපිට හැකි වූයෙමු.

එවකට අනුරාධපුර මහ දිසාපති ධූරය හෙබවූ අමර හේවාමද්දුම මහතාට ආරාධනා කොට විශේෂ දේශනයක් පවත්වා ඔහු බාරයේ තිබූ රජයේ චිත්‍රපටි අංශයෙන් එම කාර්යය නොකඩවා ඉටු කර ගත හැකි විය. එම වසරේදී එනම්, 1978 දී සර්වෝදය ශාඛා කාර්යාලයක් අනුරාධපුර දෙවැනි පියවරේ නිවසක් කුලියට ගෙන ඇරඹූ අතර එහි දිස්ත්‍රික් නියමු සේවක ලෙස හර්ෂ කුමාර නවරත්න මහතා පත් කර තිබුණි. එහි සමාරම්භක අවස්ථාවේ සිට නගරය තුළත්, ගම්වලත්, පිටස්තර දිස්ත්‍රික්කවලත් සර්වෝදය වැඩ සටහන් සඳහා අපි කිහිප දෙනෙක් නිතර සම්බන්ධව කටයුතු කළෙමු. කොස්ගොඩ සුභූති හිමි, තපෝවනයේ සුගතධර හිමි ඒ පිරිසෙන් ඉදිරියෙන් සිටි දෙනමකි. භූමි ප්‍රදේශයෙන් විශාලම දිස්ත්‍රික්කය වූ අනුරාධපුරයේ වැඩ කිරීම බරපතල කරුණක් විය. එයට හේතුව දුෂ්කර මාර්ග හා අධික දුරබැහැරව ගම්මාන පිහිටා තිබීමයි.

එහෙත්, මට වඩාත් සිත් ගත් කාරණයක් වූයේ හර්ෂ අයියා සමඟ ජීප් රියෙන් ගමන් කිරීමයි. අධිවේගී රියැදුරෙකු වූ ඔහු අනුරාධපුරයේ සිට ත්‍රිකුණාමලයට පැයකින් අලුත්ම ලෑන්ඩ්රෝවර් ජීප්රියෙන් මා ඇතුළු 12 ක් පමණ වූ පිරිස සමඟ පදවා වාර්තාවක් පිහිට වූ බව මතකයේ තිබේ. ප්‍රජාව හමුවේ කතා පැවැත්වීමටත් සංවිධාන කටයුතු මැනවින් ඉටු කිරීමටත් දක්ෂ තරුණයෙක් වූ ඔහු එදා එතරම් වේගයෙන් ජීප්රිය පැදවූයේ ත්‍රිකුණාමලය දිසාපතිවරයා හමුවීමට බව පසුව දැන ගතිමු. එදා උතුරුමැද පළාත බාරව සිටි හර්ෂ කුමාර නවරත්න මහතා අද සේවා ලංකා ආයතනය පිහිටුවා එහි සභාපති ලෙසත්, ජාත්‍යන්තර බෞද්ධ ක්‍රියාකාරිකයන්ගේ සංවිධානයේ ක්‍රියාකාරීව උසස් සේවයක යෙදී සිටියි.

අනුරාධපුරයේදී ත්‍රිපිටකවේදී උපාධි පාඨමාලාව වසර 5 ක කාලයක් හැදෑරිය යුතු එකකි. අපට වස්සාන සමයට පමණක් තුන් මසක නිවාඩුවක් ලැබෙන අතර 1978 වසරේ එම නිවාඩු කාලය තුළ රත්නපුර, පාතකඩ සර්වෝදය භික්ෂු පුහුණු ආයතනයට ගොස් ඉගෙනීමට අපි කණ්ඩායමක් ලෙස තීරණය කළෙමු. එවකට එහි

අධිපති ධූරය දරූ අතිපූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ මාහිමිපාණන් වහන්සේගෙන් අන්තරාභවය, ගන්ධබ්බයා වැනි සංකීර්ණ විවාදාපන්න ධර්ම කරුණු ඉගෙනීමට දැඩි රුචියක් අප පිරිස අතර විය. මම එහි ගොස් ඉගෙනීමට අමතරව අතිරේක කරුණක් මා සිත තුළ තිබුණි. එනම්, එවකට යුදහමුදාපතිව සිටි ජෙනරාල් රිචඩ් උඩුගම මහතා සමඟ එක්ව පූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ පණ්ඩිත හාමුදුරුවන්, අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතාගේ රජය පෙරළා පැහැර ගැනීමට කළ කුමන්ත්‍රණයේ ඇත්ත කතාව දැන ගැනීමයි. ඒ වන විට උන්වහන්සේ ඇතුළු චෝදනා ලැබූ සියළුදෙනා නිදොස් කොට නිදහස් වී සිටි අතර වැලිකඩ බන්ධනාගාරයේදී උන්වහන්සේ ලියූ ධර්ම ග්‍රන්ථ 24 අදත් අගනා ශාස්ත්‍රීය නිර්මාණ ලෙස අප සමාජයේ භාවිතයේ ඇත. බුද්ධධර්මය පිළිබඳ නිර්භීතව විවේචනාත්මකව කරුණු පහදා දීමට එඩිතර වූ එකම භික්ෂූන් වහන්සේ ලෙස මම දකින්නේ උන්වහන්සේ පමණි. අපි උපාධි අපේක්ෂක භික්ෂුන් දාහතර නමක් සර්වෝදය භික්ෂු පාඨමාලාවට අමතරව බුද්ධධර්මය ගැන උන්වහන්සේගේ දෘෂ්ටි කෝණයෙන් කරන විචාරශීලී මත ගැන ඉගෙන ගනිමින් වාද කරමින් ගත කළ එම කාල පරිච්ඡේදය අසීමිත තෘප්තියකින් ගත කළ කාල පරිච්ඡේදයක් විය. ඒ සැමටම වඩා සිසිල් දිය පිරි ජලාශයත් දිය ඇළි කඩා හැලෙන සුවදායී පරිසරයත් තවමත් මගේ මතකයේ පවතී. අප වෙනුවෙන් විශේෂයෙන් සැකසූ ත්‍රෛමාසික භික්ෂු පාඨමාලාවක් හැදෑරූ අප ඇතුළු 150 කට එම සහතික පත්‍ර පිරිනැමීම එවකට අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මහතා අතින් 1979 දී සිදු කෙරුණි. එහිදී පූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ පණ්ඩිත හාමුදුරුවන් කළ කතාවෙන් සියල්ලෝ මහ හඬින් සිනාසුණහ. එනම්, තවත් මාතෘකා රැසකින් පොත් රාශියක් ලියන්නට තිබෙන නිසා මේ විදියට එළියෙ ඉඳගෙන ඒ කිසිවක් ලියා අවසන් කරන්නට නොහැකි නිසා ටික කලකට හරි නැවත වැලිකඩ බන්ධනාගාරයට යවන ලෙස කළ ඉල්ලීමයි.

ඉන් අනතුරුව 1979 අවසන් වන විට විවිධ පාඨමාලාවන් මෙන්ම උපාධි පාඨමාලාවන් ද අවසන් කර තිබූ අපි සැම දෙනම

විසිර ගියෙමු. බොහෝ දෙනෙක් ස්වකීය විහාරස්ථානවලට ද, පිරිවෙන්වල ගුරු පත්වීම් සඳහා ද පිටත්ව ගිය අතර මම කැළණිය විශ්ව විද්‍යාලයට තේරී තිබූ හෙයින් ඊට ඇතුලත්වීම සඳහා කොළඹ බලා නික්ම ගියෙමි.

ඉහත සඳහන් වූයේ වැලිගම ධම්මිස්සර හිමියන්ගේ වචනවලින්ම උන්වහන්සේ සර්වෝදයට එක් වූ ආකාරය පිළිබඳ මතකයකි.

මෙගොඩ කොළොන්නාව සෙනෙවිරත්නාරාමය

උන්වහන්සේ වැල්ලම්පිටිය, මෙගොඩ කොළොන්නාව සෙනෙවිරත්නාරාමාධිපති ලෙස පසුගිය වසර කිහිපය තුළ සිදු කර ඇත්තේ විශාල සේවාවකි. හැම දෙනාගේම උදව් උපකාර ලබා ගෙන උන්වහන්සේ ගොඩනැගූ චෛත්‍යය හතරවටින්ම සැතපුම් ගණනක් ඈතට පෙනේ. කුඩා පන්සල සහ ධර්මශාලාව ගමේ සැදැහැතියන්ගේ ආගමික වතාවත්වලට පමණක් නොව, කුඩා දරු

දැරියන්ගේ ධර්ම ඥානය දියුණු කිරීමටත් උදව් වන ස්ථානයකි. ගමේ පවතින සර්වෝදය ශ්‍රමදාන සමිතිය මුල් වී 1986 දී ගමේ සෑම පවුලකටම පිරිසිදු ජලය ලබාදීමට ජල ව්‍යාපෘතියක් ලබා දුන් අතර, අදත් ගම්වාසීන් ඒ සඳහා අපට කෘතඥතාවය දක්වති. 2010 අගෝස්තු මස 24 වැනි නිකිනි පුරපෝය දා මා වෙනුවෙන් සංවිධානය කරන ලද උපහාර උළෙලකට සහභාගි වීමි.

බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති පූජ්‍ය පොත්තේවෙල විනීත නාහිමිපානෝ, ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමා, ආපදා කළමනාකරණ ගරු අමාත්‍ය ඒ.එච්.එම්. පවුසි මැතිතුමා, විදුලිබල හා බලශක්ති ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා, කලාශූරී ආචාර්ය එඩ්වින් ආරියදාස මැතිතුමා, අසෝකා ලංකාතිලක මැතිනිය, ප්‍රාදේශීය ලේකම්තුමා ආදී වූ නායකයින්ගේ ද සහාය ලබා ගෙන උන්වහන්සේ මෙගොඩ කොළොන්නාව ගම දියුණු කරන ආකාරය අතිශය ප්‍රසංශනීයය.



මා වෙනුවෙන් පැවති උපහාර උත්සවයේදී පූජ්‍ය වැලිගම ධම්මිස්සර හිමියෝ පිළිගැනීමේ දෙසුම පවත්වමින්

පිළිගැනීමේ උත්සවයට සහභාගීවූ කථානායක චමල් රාජපක්ෂ සහ ඒ.එච්.එම්. ෆවුසි යන මහත්වරුන් සමඟ



කථානායක චමල් රාජපක්ෂ මහතා තිළිණයක් පිරිනමයි

සර්වෝදය සිඟිති හවුලේ දරුවන් විසින් මා තැනූ සර්වෝදය ගීත කිහිපයක් ගායනා කරන විට කථානායකතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් පමණක් නොව මා පවා අතිශය ප්‍රබෝධයකට පත්වීමි.

දස වසරකට පෙර අපෙන් සමුගත් අතිපූජ්‍ය මාපලගම විපුලසාර නාහිමි

සමස්ත ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ සියලුම බෞද්ධයින් දැන හැඳින ගෙන ගෞරව කළ ශ්‍රේෂ්ඨ කලාශූරී අතිපූජ්‍ය මාපලගම විපුලසාර නාහිමි අපවත් වී 2011 වන විට දස වසරක් පිරේ.



පූජ්‍ය මාපලගම විපුලසාර නාහිමි

මාපලගම විපුලසාර හිමියන්ගේ කලා හැකියා - වන් මුලින්ම හඳුනා ගෙන අගය කළේ මහාචාර්ය ජී. පී. මලලසේකර මැතිතුමාය. රජයේ කලායතනයේ අධිපති ජේ. ඩී. ඒ. පෙරේරා මහතාට හඳුන්වා දී වර්ෂ තුනක් එහි අධ්‍යාපනය ලබන්නට විපුලසාර හිමියන්ට භාග්‍යය ලැබුණේය. උන්වහන්සේ උපතින්ම ලත් කලා කෞෂල්‍යය සහ හැකියාවන් ශ්‍රී ලංකා රජය, පොදු මහජනතාවද ටික කලකදීම හඳුනා ගත්තේය. මාපලගම විපුලසාර නාමය ලංකා බෞද්ධ සංස්කෘතියේ නොමැකෙන නාමයක් බවට පත් විය. ඒ පිළිබඳව ඩී.බී.ධනපාල මහතා පියල් වික්‍රමසිංහ මහතා ලවා ''ලොකු වැඩ කරන පොඩි සාදු'' නමින් ලංකාදීප පත්‍රයේ ලිපියක් පළ කරවා උන්වහන්සේ ශ්‍රී ලංකාවේ පොදු ජනතාවට හඳුන්වා දුන්නේය.

මාපලගම විපුලසාර නාහිමියන් ඉපදුනේ ගාලු දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ මාපලගම ගමේ 1925 මාර්තු මස 03 දින දීය. උන්වහන්සේ පැවිදි බිමට එළඹුනේ 1940 ජූලි 14 වැනි දාය. උන්වහන්සේ උපසම්පදා වූයේ 1946 පෙබරවාරි 18 වැනි දාය. උන්වහන්සේ අප අතරින් වියෝ වූයේ දස වසරකට පෙර එනම් 2000 ඔක්තෝම්බර් 29 වැනි දාය.

1951 දී ජාතික කලා පෙරමුණ පිහිටුවා ඒ මගින් විශාල ජාතික සේවයක් කිරීමට විපුලසාර හිමියන් හෙන්රි ධර්මසේන, එම්.ඩී.පී. ජයවර්ධන, ආරියවංශ වීරක්කොඩි, යසපාල සල්ගාදු ආදී ප්‍රවීණ කලාකරුවන් සහ තිරාණගම රතනසාර හිමියන් වැනි සමකාලීන කලාකරුවන්ගේ ද සහාය ලබා ගත්හ.

1956 බුද්ධ ජයන්ති සමයේ මෙරටට පැමිණි රාජ්‍ය අමුත්තන් පිළිගැනීමේ දී පළමුවරට ගොක් කලාව එළියට ගෙන ජනප්‍රිය කළේ අපේ විපුලසාර හිමියන්ය. රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන් භූමියේ භික්ෂු පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා මහාචාර්ය ගුණපාල මලලසේකර මහතාට සියලුම උදව් උපකාර කළේ විපුලසාර හිමියෝය. 1959 දී උන්වහන්සේ ඉන්දියාවේ බෞද්ධ මෙන්ම කලා කේන්ද්‍රයන් නැරඹීමෙන් විශාල ආස්වාදයක් මෙන්ම අධ්‍යාපනයක් ලබා ගත්හ. එම සංචාරයේදී ඉන්දීය අගමැති ශ්‍රී නේරුතුමාගේ සහාය ලබා ගැනීමට තරම් දක්ෂ වූහ. දිවයින පුරාම බෞද්ධ වෙහෙර විහාර පමණක් නොව වෙනත් ආගමික ගොඩනැගිලි සැරසිලි ආදියට ගුරු හරුකම් අවශ්‍ය වූ විට මාපලගම හිමියන් වෙතට හැමදෙනාම ඇදී යන්නට වූහ.

අතිපූජ්‍ය වලානේ සට්ධිස්සර හිමියන් අපවත්වීමෙන් පසු 1960 ජනවාරි 14 වැනිදා මාපලගම විපුලසාර නාහිමියෝ රත්මලාන පරමධම්ම චේතිය පිරිවෙණේ අධිපති පදවියට පත් වූහ. අද පවතින සියලුම නවීන කලාංගවලින් සමන්විත රමණීය පරමධම්ම චේතිය පිරිවෙන උන්වහන්සේගේ කලා කෞශල්‍යය මෙන්ම දක්ෂතාවන් ද නිරූපනය කරයි.

පූජ්‍ය නාත්තන්ඩියේ පඤ්ඤාකර නාහිමි, පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි සහ මාපලගම විපුලසාර හිමියන් එක්ව පැවැත්වූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා බෞද්ධ මහා සම්මේලනය ගිහි පැවිදි අයගේ සංවිධානයක් බවට 1964 දී බිහි විය. ප්‍රථමයෙන් සමලේකම් ධුරයද පසුව සභාපති වශයෙන් උන්වහන්සේ ක්‍රියා කළහ. වර්තමානයේ එහි සභාපති ධුරය උසුලන්නේ පූජ්‍ය දිවියාගහ යසස්සී නාහිමියෝය.

අතිගරු ආචාර්ය පූජ්‍යපාද මාපලගම විපුලසාර නාහිමියවන් සමඟ මා මුලින්ම ආශ්‍රයට වැටුණේ කොපමණ කළකට ඉහත දැයි මට හරි මතකයක් නැත. එහෙත් මට ස්ථිරවම කිව හැක්කේ අඩුම වශයෙන් අප මුණ ගැසුනේත් එදා සිට දිගටම ආශ්‍රයට වැටුනේත් අවුරුදු පනහකට පෙරය. මා ජීවිත කාලයක්ම කැප කළ ගම් නියම් ගම්වල සැරිසරමින් සර්වෝදය ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ සේවාවලට හැකි සෑම අවස්ථාවකම උන්වහන්සේ සහභාගී වී ධෛර්යය දුන්නහ.

අද යම් රටක බෞද්ධ සමිති සම්මේලනයක් ක්‍රියාත්මක වේද ඒ හැම තැනකම විපුලසාර නාහිමියන්ගේ නාමය කියැවේ. ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රධාන සභාපති වශයෙනුත්, ඉන්දීය මහාබෝධි සමාගමේ ප්‍රධාන ලේකම් වශයෙනුත් ආදී විවිධ ජාත්‍යන්තර බෞද්ධ සංවිධානවල තනතුරු ඉසිලූ අප මාපලගම විපුලසාර නාහිමියන් සමඟ මා වැඩියෙන් ඇසුරට වැටුනේත්, උන් වහන්සේගේ අභ්‍යන්තරය දැන ගත්තේත්, ශ්‍රී ලංකාවේදි නොවේ. එනම්, අප දෙදෙනාම විවිධ ආයතන නියෝජනය කරමින් සහභාගී වූ බෞද්ධ මෙන්ම අන්තර් ආගමික සහ ලෝක සාම සම්මේලනවලදීය. 1993 චිකාගෝ නුවර පැවති ලෝක ආගම් පාර්ලිමේන්තුවට උන්වහන්සේ සමඟ මට නිදහසේ දින තුන හතරක් පමණ කතා බස් කරමින්, අදහස් හුවමාරු කර ගනිමින් බුද්ධ ශාසනයේ දියුණුවට අපට කළ හැකි සේවය පිළිබඳ සාකච්ඡා කරන්නට අවස්ථාව ලැබුණේය. ලෝක ආගමික පාර්ලිමේන්තුවේ සභාපතිවරයෙක් හැටියට ථෙරවාදී බෞද්ධයන් අතරින් මා තෝරා

ගෙන තිබීම ගැන උන්වහන්සේ ඉමහත් ප්‍රීතියකින් විවිධ රටවලින් පැමිණි මහාබෝධි සංගමයට සම්බන්ධ ගිහි පැවිදි බෞද්ධයිනට මා හඳුන්වා දුන්නේය.

මේ ආකාරයෙන්ම මොස්කව්වල පැවති ලෝක සාම සමුළුවේදී ද, දකුණු කොරියාවේ සහ ජපානයේ පැවැති ලෝක බෞද්ධ සමුළුවේදී ද, ඕස්ට්‍රේලියාව, තායිලන්තය, ඉන්දියාව, තායිවානය ආදී විවිධ රටවලදී ද උන්වහන්සේ මට මගේ එක කුස උපන් සහෝදරයෙක් මෙන් බලා ගත්තා පමණක් නොව අවශ්‍ය සෑම ආධාරයක්ම කළේ ය.

මාපලගම හිමියන්ගේ දානමය ගුණය හෙවත් පරිත්‍යාගශීලිත්වය මෙතෙකැයි කියා වචනයට නැගිය නොහැකිය. සෑම දිනකම උදෑසන හා රාත්‍රියේ මා කුමන රටක, කුමන හෝටලයක නවාතැන්ගෙන සිටියත් උන්වහන්සේ එම හෝටලයේම නැතිනම් නුදුරු තැනක නවාතැන්ගෙන සිටියෝ නම් ආහාරය පිලියෙළ කර ගෙන මා සිටින තැනට වුත් මාත් සමඟ බෙදාගෙන උන්වහන්සේ දානය වැළඳීම සිරිතක් විය.

දිනක් අප දෙදෙනා මොස්කව් නුවර විශාල සාප්පුවකට ගියෙමු. ''පැවිදි මට ආපසු ගොස් දෙන්න කවුරුවත් නැතේ ඔබට එසේ නොවෙයි. ඔබට ඉන්නව ඔබගේ මැතිනිය සහ දරුවන්'' මෙසේ පැවසූ නාහිමියන් ඒ හැම දෙනාටම පොඩි පොඩි සිහිවටන තෑගි අරගෙන බලෙන්ම මා අතේ තැබුවේය. සමහර රටවලදී උන්වහන්සේ සමඟ සිටි අන් අයට ද ඔවැනි නිර්ලෝභී පරිත්‍යාග කිරීම උන්වහන්සේගේ සිරිතක් විය.

දිනක් මා පරමධම්ම චේතිය පිරිවෙනට හදිසියේ ගොඩ වුන විට හාමුදුරුවෝ කලබලයෙන් මෙන් පොඩි හාමුදුරුවරුන්ටත්, දායකයින්ටත් ලොකු කාර්ය භාරයක් පවරනු මම දුටුවෙමි. පසුව මේ ගැන මා විමසූ විට උන්වහන්සේ පැවසුවේ බෞද්ධ ශාසනයට ලොකු සේවාවක් කළ උපාසක මහතෙකු කාත් කවුරුවත්

නොමැතිව රෝහලේ මරණයට පත් වී ඇති බවත්, වහාම ඔහුගේ දේහය පිරිවෙනට ගෙන විත් සියලු ආගමික චාරිත්‍ර පවත්වා අවසන් කටයුතු කිරීමට කටයුතු සැලැස්වූ බවය. මම ද ඒ අවසන් කටයුතුවලට සහභාගි වීමි. කිසිදු නෑදෑ හිතමිතුරෙක් නොසිටි අයෙක් යැයි එහි කිසිදු අඩුපාඩුවක් නොවීය.

මගේ ජීවිතයේ තිබූ ලොකුම ආශාවක් වූයේ විශ්ව නිකේතනය නමින් ඕනෑම කෙනෙකුට පැමිණ භාවනාව ඉගෙන ගත හැකි, භාවනා යෝගිව සිටිය හැකි ස්ථානයක් ගොඩ නැඟීමය. මෙහි ගොඩනැගිලි සහ භූමිය සකස් වී ගෙන යන අතරතුර ශ්‍රී මහාබෝධීන් වහන්සේගේ අංකුරයක් ගෙන වුත් විශේෂයෙන් සාදන ලද බෝමළුවක තැන්පත් කිරීම මගේ ආශාව විය. මේ බව මාපලගම නාහිමියන්ට පැවසූ වහාම විශ්ව නිකේතනයට පැමිණ බෝමළුව සකස් කරන ආකාරය පිළිබඳව එවේලේම සැලැස්මක් සදා දී දිනයක් නියම කර ගෙන මා සමඟ ශ්‍රී මහාබෝධීන් වහන්සේගේ අංකුරයක් ලබා ගෙන ඒමට අනුරාධපුරයට වැඩම කළහ. සුභ නැකතින් රෝපණය කළ එම බෝධි වෘක්ෂය අපේ මාපලගම විපුලසාර නාහිමියන් දිනපතා අපට සිහි කරමින් අදත් අපේ වැඳුම් පිදුම් ලබමින් විශ්ව නිකේතනයේ වැජඹේ.

විපුලසාර හිමියනට ලොකු දුර්වලකමක් තිබුණේය. එය කොතෙක් පෙන්වා දුන්නත් හාමුදුරුවෝ එය ගණන් ගත්තේ නැත. එනම් සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාර ගැනීම වෙනුවට උන්වහන්සේගේ දියවැඩියා රෝගයට කවුරුහරි පැමිණ මේ බෙහෙත හොඳ යැයි පැවසුවහොත් එය අත්හදා බැලීමය. මමත් එම රෝගයෙන්ම පෙළෙන නිසා මට ද මෙය අත්හදා බලන්නැයි කී විට මා එය නිතරම ප්‍රතික්ෂේප කළෙමි. අන්තිමට කියුබාවේ දේශීය වෛද්‍ය ක්‍රමයක් අත්හදා බලන්නට යෑමෙන් හාමුදරුවන්ට සුව කර ගැනීමට බැරි තත්ත්වයකට වකුගඩු දුර්වල විය. අවසාන දින කිහිපය නිතරම උන්වහන්සේ බැලීමට ගිය කිහිපදෙනා අතර මම ද වීමි.

හොඳටම ගිලන්ව සිටියදීත් උන්වහන්සේගේ සුපුරුදු සැහැල්ලු විනෝදාස්වාදය සහ සිනහව අමතක නොකළ හාමුදුරුවෝ මට අවසාන වශයෙන් කීවේ මම කළ මෝඩකම් කිරීමට එපා කියාය.

මාපලගම හිමියන් ශ්‍රී ලංකාවේ දේශීය කලාවේ උන්නතියට කළ සේවාව හැමෝම දනිති. සෑම රාජ්‍ය උළෙලක් හෝ ආගමික උත්සවයක් හෝ වෙනත් සම්භාවනීය දේශීය සංස්කෘතික උළෙලක් හෝ මාපලගම හාමුදුරුවන්ගේ උපදේශනයෙන් තොරව ඒ යුගයේ සිදු වූයේ නැත. සමහර විට සමහරුන්ගෙන් දොස් අසමින් හෝ උන්වහන්සේ කළ සමහර ප්‍රතිසංස්කරණ කටයුතු නිසා අපේ ඉපැරණි ප්‍රතිමා ආදිය අදත් සුරැකිව පවතී. උන්වහන්සේ පැන්සලයක්, කොලයක් අතට ගෙන ඉරි දෙක තුනක් ගැසුවත් එයද කලාවකි. ඒ උන්වහන්සේගේ ජන්ම උරුමයයි.

පූජ්‍ය ආචාර්ය මාපලගම විපුලසාර නාහිමියන් වැනි යුග පුරුෂයෙකු ජීවත් වූ යුගයක අපට ද උන්වහන්සේ ඇසුරු කරමින් ජීවත් වන්නට ලැබීම වාසනාවකි. අපේ ගරු නාහිමියන්ට නිවන් සැප ලැබේවා!

295

කම් ඵල විඳි ශ්‍රේෂ්ඨ ආත්මයක්

මිලේච්ඡ යුගවලින් පසු මානව හිමිකම් සහ සාධාරණත්වය පිළිබඳ ආකල්ප දියුණුව තිබූ සෑම යුගයකදීම, සෑම සමාජයකම, යම් වරදකට යමෙකුට මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය තෙක් සිර දඬුවමක් නියම වූ විට ඒ පුද්ගලයාට ඉහළ අධිකරණයකට අභියාචනය කිරීමේ අයිතියක් තිබුණු බවට සාධක දීමට අවශ්‍ය නැත.

20 - 21 වැනි සියවසේ ජීවත් වන අපට අසන්නට ලැබුණු පහළම උසාවියකින් ජීවිතාන්තය තෙක් සිර දඬුවම නියම වූ මිනිසෙකුට ඉන් ඉහළ උසාවියකට අභියාචනා කිරීමේ අයිතිය අහිමි වී දශක ගණනාවක් සිර බත් කමින් සිට මිය යෑමේ සිද්ධියක් පිළිබඳවයි මේ සංවේගාත්මක ලිපිය ලියන්නේ.

ස්වාමිප්‍රේමානන්දතුමාගේ ආශ්‍රමයේදී

ස්වාමි ප්‍රේමානන්දතුමා

ඉන්දියාව සාමාන්‍ය - යෙන් ඉතා ශ්‍රේෂ්ඨ අධිකරණ ඉතිහාසයක් ඇති අපේ අසල්වාසී රටයි. එය දැනට සති කිහිපයකට පෙර ප්‍රබල ඇමතිවරයෙකු විශාල දූෂණයකට හසු වී ඔහු අධිකරණයට කැඳවීමට තරම් අපක්ෂපාතී නිර්භීත අධිකරණයක් ඇති රටකි. එහෙත් නීතිය පරයා යැමට පහත් මට්ටම්වලදී ප්‍රභූන්ට ශක්තිය තිබෙන බව මා සඳහන් කරන මේ සිද්ධි යෙන් ඔප්පුවේ.

ඉන්දීය අධිකරණයේ අසාධාරණ විනිශ්චයකට යටත්ව සිර බත් කමින් දකුණු ඉන්දියාවේ සිරගෙදරක දඬුවම් විඳිමින් සිට පරලෝ සැපත් වූ පුද්ගලයා ශ්‍රී ලාංකිකයෙකි. මාගේ පුද්ගලික දැනීමේ හැටියට ඔහු ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකිකයෙකි.

මාතලේ ස්වාමි නමින් ජනප්‍රියව සිටි හෙතෙම ශ්‍රී ලංකාවේ හින්දූන්, බෞද්ධයින් මෙන්ම සෙසු ආගමිකයින් අතරද ජනප්‍රියව සිටි ස්වාමි ප්‍රේමානන්දයි එසේ මිය ගියේ. 1983 ජාතිභේද කෝලාහලවලින් පසුව ඔහු සිංහල මාධ්‍යයෙන් උගත් කෙනෙක් වුවත් දෙමළ ජාතිකයෙක් වූ නිසාත් සරණාගතයින් අතර දරුවන් රාශියක්ද ඉන්දියාවට පලා ගොස් සිටි නිසාත් ඔවුන් අතරට ගොස් සේවය කිරීමට තීරණය කළේය. ඔහු එහිදී දෙමළ කියවීමට හා ලිවීමට ඉගෙන ගත් සැටි මා දැක තිබේ.

සමහර මිනිසුනට සාමාන්‍යයෙන් විස්තර කළ නොහැකි විද්‍යාවට හසු නොවන අද්භූත හැකියාවන් සමහර අයට තිබෙන බව විශ්වාස කරන අය අතර මම ද කෙනෙක්මි. මුලින්ම 1980 දී පමණ මාතලේදී මෙතුමා ගැන ඇසූ මම ඔහුගේ ආශ්‍රමයට ගොස් ඈතින් සිට ඔහු සිංහල භාෂාවෙන් කළ දේශනයක් අසා සිටියෙමි. මා ළඟින්ම සිටියේ එවකට මාතලේ සිටි නඩුකාරවරයෙකි. ඔහු අප දෙදෙනා දුටුවේ කෙසේ දැයි මට සිතාගත නොහැකි විය. එහෙත් ඔහු අප දෙදෙනාට නමින්ම කතා කොට පුටු දෙකක් තබා අපට එතුමා ළඟ වාඩි වී එතුමාගේ දෙසුම අසන්නට සැලැස්වීය. එදා සිට මම එතුමා පෞද්ගලිකව දැන හැඳින ගෙන සිටියෙමි.

ජාතිභේද අරගලයට පෙරත් පසුත් උතුරුකරයේදී මෙන්ම කතරගම සිට අප ආරම්භ කළ සාම පා ගමනේදී ද, මූලස්ථානයේදී ද එතුමා සර්වෝදය කටයුතුවලට විශාල සහයෝගයක් දුන්නේය. 1984 දී එතුමා ඉන්දියාවේ ආරම්භ කළ ස්වාමි ප්‍රේමානන්ද ආශ්‍රමයෙන් සිදු වූ අධ්‍යාපනික සහ ආධ්‍යාත්මික සේවය නිසා දහස් ගණන් පිරිස එතැනට රැස් වන්නට වූහ. අසරණයින්, දුප්පතුන්, රෝගීන් ආදීහු වැල නොකැඩී එතුමාගේ පිහිට පතා එම ආශ්‍රමයට පැමිණියහ. එතුමා මා ආමන්ත්‍රණය කළේ 'තාත්තා' යනුවෙනි. දිනක් දිවංගත සෞම්‍යමූර්ති තොන්ඩමාන් මහතාත්, දැනට ඇමතිවරයෙක්ව සිටින ඔහුගේ මුනුපුරා ආරුමුගං තොන්ඩමාන් මහතා ඉදිරියේ මා ඇමතූ එතුමා කියා සිටියේ, 'තාත්තා, කියන්න මේ ඇරුමුගං මහතාට සීයා මෙන් දේශපාලනයට අවතීර්ණ වන ලෙස'. මේ අවවාදය පිළිගත් ඔහු දේශපාලනයට පිවිසියේය. ස්වාමි ප්‍රේමානන්දට ඊර්ෂ්‍යා කරන බමුණන් පමණක් නොව, සෙසු වරප්‍රසාද ලත් දූෂිත ආගමික නායකයන්ද මේ කාලයේදී ඔවුන්ගේ වරප්‍රසාද අහිමිව යන බැවින් ස්වාමි ප්‍රේමානන්දට විරුද්ධව කුමන්ත්‍රණ කිහිපයක් මෙහෙය වූයේය. ස්ත්‍රී දූෂණ, මුදල් වංචා පමණක් නොව මිනීමැරුම් චෝදනාවක්ද මේ අහිංසක මනුෂ්‍යයාට එරෙහිව ගොනු කරන ලදී. මේවාට ඉන්දීය මෙන්ම ශ්‍රී ලංකාවේ සමහර මාධ්‍යද හවුල් විය. අවසානයේදී පහළම උසාවියෙන්,

පොලීසිය විසින් මෙහෙය වූ කිසිම ඔප්පු කළ හැකි සාක්ෂියක් නොතිබූ මරණීය චෝදනාවකට එතුමා වරදකරු විය. ශ්‍රී ලංකාවේ විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කෙනෙකු සහ මා ඇතුළු කිහිප දෙනෙක්ම මෙම නඩුකාරවරියගේ තීන්දුවට විරුද්ධව අභියාචනයක් කිරීමට ඉඩ සලසා දෙන ලෙස ඉන්දීය බලධාරීන්ට කළ ඉල්ලීම්වලට කිසිම ප්‍රතිචාරයක් නොලැබිණි.

ඉන්දියාවේ තමිල්නාඩුවේ එතුමා සිරකර සිටි සිරගෙදරට මම එතුමා බැලීමට ගියෙමි. මා පැමිණි බව ඇසූ වහාම එතුමා සිරගෙදර දොරටුවෙන් පිට වී මා ඉදිරියට ආවේ සිරකරුවෙකු ලෙසින් නොව, සිරකරුවෙකුගේ ඇඳුමක් ඇඳන් සිටියත් සිරගෙදර උසස් නිලධරයකුගේ විලාශයෙනි. මා වැළඳ ගත් එතුමා .තාත්තා, මා බලන්න ආවා නේ. කියමින් ඇතුළට කැඳවා ගෙන ගියේය. ඉහළම නිලධාරියාගේ සිට පහළම සිරකරුවා දක්වා ඔහුට වැඳ ආචාර කරනු මම දැක්කෙමි. එතුමා මට පැවැසූ වදන් කිහිපයක් සඳහන් කරනු කැමැත්තෙමි.

'තාත්තා, මම ආධ්‍යාත්මික ජීවිතයක් ගෙවන කෙනෙක්' තාත්තාට මෙන්ම මටත් ආධ්‍යාත්මික අරමුණක් තිබෙනවා. මම ගිහිගෙය අත්හල පැවිද්දෙක්. එයින් කියවෙන්නේ නැහැ මට මගේ පෙර කර්ම පළ නොදෙයි කියා. බුදුහාමුදුරුවෝ කර්මය සහ කර්ම විපාක ගැන අපට උගන්වලා තිබෙනවා නේද? මා ගෙවන්නේ පෙර කළ කර්මයක්. මා නොකළ වරදකට මාව වැරදිකරුවා කළ හැමෝටමත් ඒ වැරදි කර්මයේ විපාක විඳින්න වේවි. මා ගෙවන කර්මයට විරුද්ධව මා තුළ තිබෙන ශක්තීන් මා පාවිච්චි කරන්නේ නැහැ. ඒක අප වගේ පැවිදි අයට නුසුදුසුයි. අපේ කර්මය අප කවුරු වුවත් ගෙවන්න ඕනෙ. මේ සිරගෙදර මා සිටින්නෙ හරිම සතුටෙන්. මගේ වත්-පිළිවෙත්, මගේ භාවනා ආදී කටයුතු අඩු නැතුව සිදු කරන අතර මේ සිරගෙදර වැටී සිටින නූගත් අහිංසක මිනිස්සු හොඳ මඟට හරවන්න මේක මට ලැබුණු ලොකු වාසනාවක්. දුකෙන් මෙන්ම එක්තරා විදියක ඉන්දීය අධිකරණ ක්‍රමය පිළිබඳ කලකිරීමකින් ද සිටි මගේ හිත එතුමා මෙසේ සැනසුවේය.

වරක් එතුමා මට දුරකතනයෙන් කතා කර 'තාත්තා, මට හුඟක් අසනීපයි' තාත්තා කළ උදව් මට මතකයි. මා ජීවත් නොවෙන්නටත් පුළුවන්. ජීවත් වුනොත් මා නිදහස් කළොත් ලංකාවට නැවත පැමිණ අපේ ජාතීන් දෙක එකට එකතු කිරීමේ සර්වෝදය ප්‍රයත්නයට මම නැවත එකතු වෙනවා.

ඒ එතුමාගේ කටහඬ මා ඇසූ අවසාන අවස්ථාවයි. එතුමාගේ අක්මාව සම්පූර්ණයෙන් අකර්මන්‍ය වූ නිසා ශල්‍යකර්මයක් කිරීමට පෙර එතුමා සදහටම අප අතරින් සමුගත් බව දැන ගැනීමෙන් මම අතිශය සංවේගයට පත්වීමි. සැබෑ බෞද්ධ පිළිවෙත් පිරීමට මෙන්ම බුදුන් දහම් සඟුන් කෙරෙහි සද්ධාවන්තවීමට ද හැකි වන්නේ උපතින් සිංහල බෞද්ධ අපට පමණක් නොවේ.

ස්වාමි ශ්‍රී ප්‍රේමානන්දතුමන්ට නිවන්සැප ලැබේවා!

296

මගේ බිරිය - නීතා ධම්මචාරී

ස්වයං ලිඛිත චරිතාපදානයකදී එහි අන්තර්ගතයේ තමන්ගේම පවුලේ අයවළුන් පිළිබඳව ද සෑහෙන ප්‍රමාණයක් තොරතුරු තිබිය යුතුය යන මතයේ යම් වැදගත් කමක් තිබෙන බව මම පිළිගනිමි. ඒ නිසා මගේ බිරිඳ, දරුවන්, මුණුපුරු මිනිපිරියන් ආදීන් පිළිබඳව යමක් ලිවීමට අදහස් කළෙමි.

නීතා සහ මම

නීතා ධම්මචාරී ඇල්පිටිආරච්චි මෙනවිය නීතා ධම්මචාරී ආරියරත්න කෙනෙක් නොවන්නට මගේ මෙන්ම සර්වෝදයේ ද ගමන් මඟ වෙනස් වන්නට තිබිණි. ඇය මගේ සහකාරියවීම නිසා මා කලින් අදහස් නොකළ සේවා අංශ රාශියකටම සර්වෝදයට ප්‍රවේශවීමට හැකි විය. අප දෙදෙනා විවාහ වී අදට පණස් වසරක්

පිරේ. සර්වෝදය සංසදයේ සිටි සියලුම වැඩිහිටියන් නීතා නංගී යැයි ඇය ඇමතූ අතර, බාල සියලුදෙනාම ඇය ඇමතුවේ නීතක්කා, නීතා නැන්දා ආදී යන වචනවලිනි.

නීතාගේ හා මගේ දෛවෝපගත එකතුවීම පිළිබඳව මා පළමු වෙළුමේ ලියා ඇත. එදා සිට අද දක්වා ගත වූ පණස් වසර තුළ දී අප එක්ව හා වෙන් වෙන්ව ලත් අත්දැකීම් ලේඛනගත කළොත් පොත් කිහිපයක්ම ලියන්නට සිදුවේ.

අඹු සැමියන් වශයෙන් මේ පණස් වසරම අපි සතුටින් ජීවත්වීමු. අනුන්ට සේවය කරමින් ජීවත්වීම අපේ සතුටට මුල් හේතුවයි. දියණියන් තිදෙනෙක් ද පුතාලා තිදෙනෙක් ද ඔවුන්ගේ සහකාරයින් සහ සහකාරියන් හය දෙනෙක් ද ඒ අතරට මුණුපුරන් පස් දෙනෙක් ද මිණිපිරියන් හය දෙනෙක් ද යනුවෙන් විසිතුන් දෙනෙක් අපේ න්‍යෂ්ටික පවුලේ අද සතුටින් සිටිති.

මේ සතුට ඇති කිරීමට මාත් යම් පමණකට හවුල් වී ඇති අතර ඒ සඳහා සියයට අනූනවයක ගෞරවය හිමි විය යුත්තේ නීතාටයි. නීතා අප කාටත් කලින් උදෑසනින් නැගිටියි. ළමයින් නින්දට ගිය පසුව නින්දට යයි. අප නිවසේ මෙන්ම මුළු දම්සක් මන්දිර පරිශ්‍රයේම හැමදාම පැය දෙකක් පමණ ඇවිද සෙසු අය ද මෙහෙයවා වත්ත පිරිසිදුව තබා ගැනීමට, ගස් කොළන් නඩත්තු කිරීමට, මල් වැවීමට ගත කරයි. ඒ අතර මගේ උදෑසන තේ කෝප්පය මෙන්ම උදේ ආහාරය ද උදව්කාරියන් සමඟ සූදානම් කොට තබා, සර්වෝදය සුවසෙත නිවාසයට ගොස් එහි සිටින අතදරුවන්, බිළින්දන් හා පෙරපාසල් දරුවන් ගැන සොයා බලයි. ආපසු පැමිණ ගෙදරට අවශ්‍ය එළවළු, වියළි ආහාර ආදිය කඩමණ්ඩියට ගොස් ගෙනෙයි. දිවා ආහාරය හා රාත්‍රී ආහාරය පිළියෙල කරයි.

පැය ගණන් දුරකතනයේ රැඳී සිට රට පුරා විසිර තිබෙන ළමා නිවාස, වැඩිහිටි නිවාස, ආබාධිත නිවාස ආදිය ගැන සොයා බලා අඩුපාඩු සැපිරීමට විවිධ රජයේ දෙපාර්තමේන්තු හා පෞද්ගලික දානපතියන්ගේ ආධාරය ලබා ගනියි. දහසකට අධික අසරණයින් නේවාසිකව තබාගෙන ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කර දෙයි. ගංවතුර, නායයෑම්, ඉඩෝරය, යුද්ධයෙන් අනාථවූවන් සුනාමිය ආදී ව්‍යසන පැමිණි විට සර්වෝදය සුවසෙත සමිතියේ නිලධාරීන් හා සාමාජික සාමාජිකාවන් සංවිධානය කොට දිවයින පුරා ශුභසාධන කටයුතුවල නිරතවෙයි.

මේ සියල්ල නොමිලේ කරන අතර මේ සේවා ගැන කිසිත් නොදන්නා පිටස්තර පුද්ගලයන් හා මාධ්‍යවලින් කරන සාවද්‍ය චෝදනා හා අපහාස භුක්ති විඳිමින්, ඒ සේවය අඛණ්ඩව ගෙන යෑමට නීතාට තිබෙන ශක්තියට මම ප්‍රශංසා කරමි.

මේ සියල්ල කරන අතරේ දරුවන් හය දෙනෙකුගේ දුක-සැප බලාගෙන, ඔවුන්ගේ සියලු අධ්‍යාපන කටයුතුවල වගකීම ද නීතා විසින් උසුලනු ලැබුවාය. ළමයකුගේ උපන් දිනයවත්, පන්තියවත්, අවශ්‍යතා ගැනවත් නොදන්නා තරමට මා සර්වෝදය කටයුතුවලට මගේ අවධානය යොමු කර තිබුණේ නීතා විසින් ඒ සියලු කටයුතු කළ නිසාය.

දරුවන් හයදෙනාත් ඔවුන්ගේ සහකාරයන් හා සහකාරියන්ගේ දුක සැප බැලීම පමණක් නොව, මුණුපුරු මිනිපිරියන් එකොළොස් දෙනෙකුගේ ද වගකීම වැඩි වශයෙන් බාරගෙන ඇත්තේ නීතා, ඔවුන්ගේ ආච්චි අම්මා යැයි කීමේ වරදක් නැත. පවුලේ ලොකු මුණුපුරා දැන් විවාහ වී ඇති බැවින් හෙට අනිද්දා මීමුණුපුරු මිණිබිරියන්ගේ වගකීම ද ඇය බාර ගනු බවට මට සැකයක් නැත. මේ අනුව බලන විට එක් අතකින් ඇයගේ භාරයේ පවතින සුවසෙත සේවාවන්හි නිරතවන අතර පවුලේ සියලු බර ඉසිලීම ද නීතා විසින් ඉටු කිරීම මගේ ලොව පුරා කෙරෙන කටයුතු කිරීමට මට ලැබුණු දිව්‍යමය ආශීර්වාදයකි.

දිනපතා මා හමුවීමට එන දේශීය හා විදේශීය අමුත්තන් මෙපමණක් යැයි කිව නොහැකිය. ඔවුන්ට ආගන්තුක සත්කාර කිරීමේ වගකීම ද ඇය උසුලන බැවින් සතියකට දින දෙක තුනක්වත් ඔවුන්ට දිවා ආහාරය සැපයීමට ද ඇයට සිදුවේ. මේ සියල්ල කරන්නේ සිනහ මුසු මුහුණෙනි. මට ඔවුන් හා කතාබස් කිරීම පවා වෙහෙස ගෙන දෙන අතර ඇය මේ කිසිවක් නිසා වෙහෙසට පත්වන බවක් නොපෙන්වයි.

නීතා මට ලැබුණු සෑම ජාත්‍යන්තර ත්‍යාගයක්ම ප්‍රදානය කරන අවස්ථාවලට සහභාගි කර ගෙන ඇත්තෙමු. පිලිපීනය, බෙල්ජියම, ඇමෙරිකාව, කැනඩාව, ජපානය, ජර්මනිය, ඉන්දියාව ආදී වූ රටවල් රැසකටම ඈ මා සමඟ සංචාරය කර ඇත. ඒ අතින් ඇය වෙත මගේ තිබෙන ණය බරින් සියයට එකක් පමණ හෝ ගෙවා ඇත.

බොහෝ විට මගේ හෝ ඇයගේ දෙමාපියන් හා ඥාතීන් පිළිබඳව කළයුතු වගකීම් යුතුකම් දානමාන පින්කම් ආදිය පිළිබඳ දින වකවානු මට මතක නැත. නමුත් ඇය ඒ සියල්ල මතකයේ තබා ගෙන නිසි දිනට වෙලාවට ඒ යුතුකම් පින්කම් අප්‍රමාදව ඉටු කරන්නීය.

කොළඹ මියුසියස් විදුහලේ ඇය අධ්‍යාපනය ලැබුවේ විද්‍යා අංශයෙනි. ඇයට වුවමනා වූයේ වෛද්‍යවරියක් වීමටය. ඇය සමඟ ඉගෙන ගත් ඇගේ මිතුරියන් කිහිප දෙනෙක්ම වෛද්‍යවරියන් වී දැන් විශ්‍රාම ගෙන ඇත. එහෙත් ඒ වෘත්තියට නොගොස් විශ්‍රාම නොගෙන යාවජීව ව කළ හැකි සමාජය සුවපත් කිරීමේ සේවයට ඇය යොමු වූයේ මා නිසාය. එයට වරදකරු මා බව මම පිළිගනිමි. වෛද්‍යවරියකවීමේ ආශාව ඇගේ යටි සිතේ වැඩ කළ නිසාදෝ අදත් ඇය තරම් ලෙඩ ගැන දන්නා, විශේෂඥ වෛද්‍යවරු පුද්ගලිකවම හඳුනන, බෙත්හේත්, සාත්තු සප්පායම්, දේශීය හා විදේශීය රෝහල් ගැන දන්නා වෙන කිසිවෙකු ගැන මම නොදනිමි. සුවසෙතට සම්බන්ධ අය පමණක් නොව සර්වෝදය සංසදයේ අය ද

නෑදෑ හිතමිතුරන් ද ඇයගෙන් විවිධ රෝග පිළිබඳ උපදෙස් ගැනීමට දිනපතා වාගේ අපේ ගෙදරට පැමිණෙන්නේ හෝ දුරකතනයෙන් කතා කර වෛද්‍ය උපදෙස් ඉල්ලන්නේ වෛද්‍ය උපදේශ ලබාදෙන ආයතනයකට එන ආකාරයෙනි.

2011 වසරේ ජාත්‍යන්තර කාන්තා දින සම්මාන තිළිණය ඇයට ලැබී තිබේ. අසරණ වූ ආබාධ සහිත දරුවන් සහ වැඩිහිටියන්ට මෙන්ම පිළිසරණක් නොලබන අනාථ දරුවන් සහ ළමා මව්වරුන් උදෙසා සර්වෝදය සුවසෙත සේවා සමිතිය මගින් වසර ගණනාවක සිට කරනු ලබන සේවය අගයනු වස්, ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ළමා සංවර්ධනය හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ සංවිධානත්වයෙන් 2011 මාර්තු මස 08 වනදා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ගරු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැති අභිමානවත් උත්සවයේදී සර්වෝදය සුවසෙත සේවා සමිතියේ ගරු ප්‍රධාන ලේඛිකා නීතා ධම්මචාරී

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අතින් සම්මාන තිළිණය පිළිගැනීම.
ගරු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමා ඇතුළු සම්භාවනීය පිරිස

නීතා ලැබූ සම්මානය අතැතිව

ආරියරත්න මහත්මිය පුදනු ලැබීය. නමුත් මා කිවයුත්තේ මා ලැබූ සෑම සම්මානයක්ම මට වඩා සුදුසු වන්නේ මගේ අදරැති බිරිය වන නීතා ධම්මාචාරීට බවයි.

අඳුරෙන් ආලෝකය කරා
මාරි මියුසියස් හිගින්ස් පීටර් ද ආබෲ සමරු දෙසුම
නීතා ධම්මචාරී ආරියරත්න

දයාබර විදුහල්පතිතුමියනි, නියෝජ්‍ය විදුහල්පතිතුමියනි, ගුරුමහත්මීනි, පාලක මණ්ඩලයේ මහත්ම මහත්මාවනි, විද්‍යාලයීය ආදි ශිෂ්‍යාවනි, වත්මන් සිසු දියණියනි, දෙමාපියනි,

මෙම 2012 වසරේ මාරි මියුසියස් හිගින්ස් - පීටර් ද ආබෲ සමරු දෙසුම සඳහා මා තෝරා ගැනීම පිළිබඳව ඉතා නිහතමානීව මම ආඩම්බර වෙමි. එසේම එය මාහටත් මා සේවය ලබා දෙන සර්වෝදය ව්‍යාපාරයටත් කරන ලද විශාල ගෞරවයක් ලෙස සලකමි. තවද මා මියුසියස් ආදි සිසුවියක වශයෙන්, අප ආදි කතුවරුන් වන මාරි මියුසියස් හිගින්ස් මැතිණියගේ සහ පීටර් ද ආබෲ මැතිඳුන්ගේ චරිතාපදානයන්ගෙන් හා එවකට අප හට බුදු දහම කියාදුන් අප විදුහලේම ආදි ශිෂ්‍යාවක වූ සුධර්මා මෙහෙණින් වහන්සේගෙනුත්, සිප් සතර කියා දුන් සෙසු ගුරු මැණිවරුන්, ගුරු පියවරුන්ගෙනුත්, මා ලැබූ ආභාෂය නිසාවෙන්ම දශක පහකට වැඩි කාලයක් මිනිස් වර්ගයාගේ සේවය සඳහා ජීවිතය කැප කිරීමට අවශ්‍ය ශක්තිය මා හට ලැබුණු බව මම දැඩිසේ විශ්වාස කරමි. මා මියුසියස් විදුහලේ අධ්‍යාපනය ලබන වකවානුවේදී දක්ෂතම ශිෂ්‍යාවට ලබා දුන් පීටර් ද ආබෲ ශිෂ්‍යත්වය මා වෙත ප්‍රදානය කිරීම හේතුවෙන් මධ්‍යම පාන්තික ව්‍යාපාරිකයෙකු වූ මගේ පියාට මා වෙනුවෙන් වැය කිරීමට සිදුවූයේ නේවාසිකාගාර ගාස්තු පමණක් බව මා මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරමින් එවකට සිටි පාලක මඩුල්ලට වසර 50 කට පසුව අද දින මම පින් දෙමි.

සර්වෝදය ව්‍යාපාරයේ නිර්මාතෘ ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතාණන් ප්‍රමුඛ කොළඹ නාලන්ද ගුරු සිසුන්ගේ සහභාගීත්වයෙන් වර්ෂ 1958 කුරුණෑගල දිස්ත්‍රික්කයේ කනතොලුව

නොදියුණු ගම්මානයේ පළමු ශ්‍රමදාන ප්‍රජා සේවාව ඇරඹුණි. වර්ෂ 1959 අප්‍රේල් මාසයේ මියුසියස් විද්‍යාලයීය 23 වැනි කොළඹ බාලදක්ෂිකා කණ්ඩායම් නායිකාව වශයෙන් කටයුතු කළ සීතා රාජසූරිය මැතිණියගේ මඟ පෙන්වීම යටතේ බාලදක්ෂිකා කණ්ඩායම් නායිකාවන් පස්දෙනෙක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මානාව නම් සමාජයෙන් කොන් කරනු ලැබූ දිළිඳු ගම්මානයේ පැවති ජාත්‍යන්තර ශ්‍රමදාන කඳවුරට සහභාගිවූහ. මා ද එම කණ්ඩායමට ඇතුළත් වීමත් එදා මා ලැබූ ජීවිත අත්දැකීමත් අදත් මා සිහිපත් කරන්නේ ආඩම්බරයෙන් හා ගෞරවයෙනි.

අද වනවිට සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය නමින් මෙම වැඩපිළිවෙල ප්‍රචලිත වී ඇත. පුරා අඩ සියවසකට අධික කාලයක් දිවයිනේ සතර දිග්භාගයේම ගම් නියම් ගම්වල සැරිසරමින් ගම්මාන 15000කට අධික සංඛ්‍යාවක මිනිසාගේ ආධ්‍යාත්මික ශක්තිය සහ බලය අවදි කිරීම තුළින් අහිංසාවාදි සමාජ ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම දක්වාවූ පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමින් සිටියි.

අද මා පූර්ණකාලීන ස්වෙච්ඡා සේවිකාවක් ලෙස තවත් සේවයටම කැපවූ පිරිසක් සමඟ සමාජයේ විවිධ විෂමතා නිසා අසරණ වූවන්ට සරණ වීමේ වැඩපිළිවෙලක මූලිකත්වය ගෙන කටයුතු කරමි. මහමඟක හෝ රෝහලක අතහැර දමන බිළිඳුන්, කුඩා දරුවන්, වියපත්ව අසරණවූවන්, විවිධ ආබාධයන්ගෙන් පෙළෙන ආබාධිත වූවන් රැකබලා ගනිමින් වෘත්තීය පුහුණුව ලබාදෙමින් සමාජයට වැඩදායක පුද්ගලයන් බවට පත්කිරීමත්, අපට අවේණික සාරධර්ම වටිනාකම් හා හර පද්ධතීන් බිඳ වැටුණු වර්තමාන සමාජයේ ලිංගික අපයෝජනයන්ට හා දූෂණයට ලක්ව ගැබ්ගන්නා වයස අවුරුදු 12 - 18 අතර දැරියන්ට රැකවරණය දෙමින් ඔවුන්ට අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව මානසික හා ශාරීරික සුවතාව ලබාදී නැවත සමාජ ගත කිරීමේ විශේෂ වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කරමින් සිටින්නෙමු. බිළිඳු අවදියේ පටන් අපගේ ආදරය, රැකවරණය යටතේ හැදුනු වැඩුණු ගැහැණු දරුවන් සහ මාසෙවණ

නිවහනේ රැකවරණය ලැබූ දැරියන් සෑහෙන සංඛ්‍යාවක් චාරිත්‍රානුකූලව විවාහ කර දීමට හැකිවූ බව පවසන්නේ ඉමහත් සතුටිනි.

එසේම පාසැල් වියේ සිටින අසරණ වූ ගැහැණු දරුවන් සඳහා ළමා නිවාස හතරක් සහ පිරිමි දරුවන් සඳහා ළමා නිවාස දෙකක් රටේ විවිධ ප්‍රදේශවල අප විසින් පවත්වාගෙන යන අතර, එතුළින් බිහිවූ දරු දැරියන් කීපදෙනෙක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබූ අතර, විදේශ ශිෂ්‍යත්වද ලබා ඉගෙනුමෙහි යෙදේ.

මෙම සියලු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි විශාල මූල්‍යමය අපහසුකම් වලට අපට මුහුණදීමට සිදුව ඇති අතර, සම්පත් සෙවීමේ දැඩි පරිශ්‍රමයක අද මම යෙදී සිටිමි. මෙම භාරදූර කර්තව්‍යයේදී මා හට සුළු වශයෙන් හෝ උදව් උපකාර ලබාදෙන්නන් මා සිහිපත් කරනුයේ තුති පූර්වකව පින් දෙමිනි.

අප විදුහලේ ආදර්ශ පාඨය ආලෝකය පසු පස ගමන් කරන්න" යන්නය. එහෙයින් මගේ තේමාව වශයෙන් මා තෝරා ගත්තේ අඳුරෙන් ආලෝකය කරා" යන්නයි.

සෑම දෙනාගේම උදාව හෙවත් සර්වෝදය අදහස පිළිගැනීම නිසා තමන්ගේ යහපත සඳහා පමණක් නොව මුළු මිනිස් ලෝකයාගේම යහපත සඳහා සේවය කිරීමට යමෙක් පෙළඹේ නම් එවැන්නකුට ජීවිතයෙහි සත්‍යය, අහිංසාව සහ ආත්මහරණය යන ප්‍රතිපත්තිද මනාව ක්‍රියාවට නැංවිය හැකිබව අපේ අත්දැකීමයි.

පුද්ගලයින් වශයෙන් උසස් සාරධර්ම පද්ධතියකින් තොරව මෙම පෘථිවි ගෝලයෙහි තවදුරටත් මනුෂ්‍යයාට සත්ව විශේෂයක් හැටියට ආරක්ෂාවීමට හැකියාවක් නැත. අප ජීවත් වන ලෝකයෙහි විශාල වශයෙන් නැති බැරිකම, දුප්පත්කම, හාමත සහ රෝගීබවින් මිනිසා පීඩිතව ඇත. එමනිසා මිනිසා අශිෂ්ඨ තත්ත්වයට පත්කර තිබෙන සංවිධානාත්මක වූ පාපයන්ගෙන් සැදුනු භයානක

සමාජ පද්ධතීන් ප්‍රතික්ෂේප කිරීමට සමත්, ශ්‍රේෂ්ඨ යහ ගුණයෙන් යුතු, නව මිනිසුන් ලොවට අවශ්‍යය. මෙම නව මිනිසා නව මිනිස් සමාජයකුත් සනාතන ධර්මයනට බර වූ නව මනුෂ්‍ය ශිෂ්ඨාචාරයකුත් ගොඩනගනු ඇත.

සර්වෝදය දර්ශනය හා වැඩපිළිබඳව කෙටියෙන් ඔබට යමක් පැවසීමට මම අදහස් කරමි.

බුදුදහම ප්‍රමුඛ සියලු ආගම් වල මූලික මානව හර පද්ධතීන් හා මහත්මා ගාන්ධිතුමන්ගේ සර්ව උදය හෙවත් සියලු දෙනාගේ උදාව" යන දර්ශනය මත සත්‍යය, අවිහිංසාව, ආත්මහරණය යන මූලික ප්‍රතිපත්තීන් සර්වෝදය ගමන් මගෙහි දාර්ශනික මග පෙන්වීම විය.

සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ පරම අධිෂ්ඨානය මෙම නව මිනිසා සහ නව සමාජය ගොඩනැගීමයි. ශ්‍රී ලංකාවේ සර්වෝදය ක්‍රියාදාමය අප විසින් ආරම්භ කළේ සෑම දෙනාගේම යහපත සඳහා තම තමන්ගේ කාලය, සිතිවිලි හා ශ්‍රමය පරිත්‍යාග කිරීමට අප විසින් කරන ලද ආයාචනයකිනි. මෙම බෙදා ගැනීමේ ක්‍රියාදාමය අප හැඳින්වූයේ ශ්‍රමදාන යන නාමයෙනි. ශ්‍රී ලංකාවේ ගම් අතරින් ඉතාමත් ම දුප්පත් ගම් සමූහයක් තෝරා ගත් අපි, ගම්වාසීන් සමග ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට ශ්‍රමදානයෙහි යෙදෙමින්, සෙසු සංවර්ධන ක්‍රියාමාර්ගයන් ද ගොඩනගා ගත්තෙමු. මෙම ස්වයං සංවර්ධන ව්‍යාපාර, ස්ව ශක්තිය, ප්‍රජා සහභාගිත්වය සහ සැලසුම්ගත ක්‍රියා මාර්ගයන් තුළින් මූලික මානුෂික අවශ්‍යතා සහ ප්‍රජා අවශ්‍යතා සැපිරීමට යොමු කළෙමු.

සර්වෝදය ව්‍යාපාරය ආරම්භ වී දැනට වර්ෂ 54 කි. මේ කාලය තුළදී සර්වෝදය සෑහෙන පරිණත භාවයකට පත්ව තිබේ. ශ්‍රී ලංකාවේ සෑම මට්ටමකම ජනතා කොටස් මෙන්ම, ලෝකයේ නොයෙක් රටවලින් පැමිණි සහභාගි වු පුද්ගලයෝ ද මෙම ව්‍යාපාරයේ වර්තමාන තත්ත්වය ඇති කරලීමට උපකාර වූහ.

පෞද්ගලිකව මා හටද මේ සඳහා පූර්ණ දායකත්වයක් ලබාදීමට හැකිවු බව නිහතමානීව සනිටුහන් කරමි.

දශක පහක් ඇවෑමෙන් දේශීය වු සජීවි ජනතා ව්‍යාපාරයක් දක්වා සර්වෝදය පරිණාමය විය. එය සැබවින්ම අහඹු සිදුවීමක් විය. මෙබඳු සක්‍රිය ගමනකට ජීවය ලබාදුන් සාධක රාශියකි. ජාති, ආගම්, කුල, ගෝත්‍ර, පක්ෂ දේශපාලන, උතුරු, දකුණු දේශීය, විදේශීය ආදී පටු බෙදීම් හා සීමා මායිම් ඉක්මවා, ඕනෑම පරිසරයකට හා කාලයකට ගැලපෙන පරමාදර්ශී දර්ශනය ඒවා අතර ප්‍රමුඛ වේ.

සර්වෝදය අරමුණු වල පොදු බව මානව සමාජයෙහි ප්‍රගමනයට ඉවහල් විය. විනිවිද භාවයද, නම්‍යශීලි බව, සොබා දහමෙහි නීතීන්ට එකඟව කටයුතු කිරීමේ ගුණය ඊට බලපෑ සාධකයෝ වෙති.

එපමණක් නොව ග්‍රාමීය, අර්ධ නාගරික, නාගරික හා වතුකරයෙහි ප්‍රජාව අතරට ගොස් ඔවුන්ගේ සිතුම් පැතුම් ගති සිරිත් සංස්කෘතිය මැනවින් අවබෝධ කර ගැනීමට අප සමත්වීම, ඒවාට අනුගත වෙමින් ඔවුන් හමුවේ ඇති ආධ්‍යාත්මික, සංස්කෘතික සමාජ හා ආර්ථික ගැටළු හා අභියෝග හඳුනා ගැනීමට අපට හැකිවිය. ඒතුළින් ස්වශක්තියෙන් හා සහභාගිත්වයෙන් ඒවා විසඳා ගැනීම පිණිස ප්‍රජාවක් ලෙස සංවිධානය වී අවශ්‍ය ප්‍රජා විඥානය හා පෞරුෂය ගොඩනගමින් ප්‍රායෝගික වැඩපිළිවෙලක් සකස් කළෙමු. ඒ සඳහා උචිත තාක්ෂණ හා ශිල්ප ක්‍රම සහ සංවිධානාත්මක ව්‍යුහයක් හඳුන්වාදෙමින් ප්‍රජාවට තම ඉරණම තම අතට ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙමින් අඛණ්ඩව තම ප්‍රජාව මෙහෙයවමින් සර්වෝදය ව්‍යාපාරය ක්‍රියාත්මක වෙයි.

සමාජයෙහි සියලු පරාසයන් ආවරණය වන පරිදි සමාජයට බලපෑමක් ඇති කිරීමට සර්වෝදයට හැකි වූයේ ඒ නිසාය.

ජාතියක් ගොඩනැගීම යනු එහි ජනතාව ගොඩනැගීමයි. ජනතාව යනුවෙන් ළදරු, ළමා, යොවුන්, වැඩිහිටි ආදී සියලු දෙනාමත්, මව්වරු, පියවරු, ගොවියෝ, කාර්මිකයෝ ආදී හැම දෙනාත් අදහස් වෙති. දුබල අංග විකල අය පවා මෙයට ඇතුළත් වන අතර කිසිවෙක් කොන් කළ නොහැකිය. තමන්ගේ ස්වයං සංවර්ධනය සඳහා මේ සැම අයකුටම අර්ථාන්විතව සහභාගී වීමට අවස්ථාවක් ලැබෙන අන්දමින් සර්වෝදය විසින් සංවර්ධන ක්‍රියාදාමයන් සංවිධානය කොට තිබේ.

සර්වෝදය විසින් සංවර්ධනය අර්ථ දක්වනු ලබන්නේ අවදිවීමේ හෙවත් උදාවීමේ ක්‍රියාමාර්ගයක් හැටියටය. මිනිසාගේ නොසන්සිඳෙන ආශාවන් විවිධ භාණ්ඩ සහ සේවාවන් වඩ වඩා සැපයීමෙන් පෝෂණය කිරීම සංවර්ධනය හැටියට සර්වෝදය නොසලකයි. ඒ වෙනුවට සිත නොකෙලෙසා, ගත විෂ කර නොගෙන, පාරිසරික සමබර බව නොනසා, සංස්කෘතික සීමාවන් ඉක්ම යන්නේ නැතිව, ඇති නැති පරතරය තවත් පුළුල් නොකොට, මනුෂ්‍යයාගේ ගුණාත්මක බව රැක ගෙන, පුද්ගලයන් පවුල් සහ ප්‍රජාවන් ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගෙන පිබිදීම සංවර්ධනය යනුවෙන් අප අර්ථ දක්වා තිබේ. ඇත්ත වශයෙන්ම සැබෑ සංවර්ධනයේදී බෙදා ගැනීම, සහෝදරත්වය සහ සාමය ඉස්මතු කර ගනිමින් මිනිසුන් භෞතික අංශයෙන් මෙන්ම ආධ්‍යාත්මික අංශයෙන් ද දියුණු වීමක් අපි අපේක්ෂා කරමු.

නව මිනිසෙක් සහ නව සමාජයක් ගොඩ නැගීමේ අරමුණ ප්‍රායෝගිකව කැපී පෙනෙන, ජීවමාන සහ වැඩෙන අත්දැකීමක් වශයෙන් සර්වෝදය ව්‍යාපාරය විසින්, තුන්දහසක් පමණ සිඟිති සේවා මධ්‍යස්ථානයන්ද, ග්‍රාමෝදය මධ්‍යස්ථානද, දිස්ත්‍රික් සංවර්ධන අධ්‍යාපන ආයතනද, කෘෂි කාර්මික තාක්ෂණික මධ්‍යස්ථාන රැසක් ද පිහිටුවා තිබෙන අතර ශ්‍රමදාන කඳවුරු ද පවත්වනු ලැබේ. මීට අමතරව සුනාමි, ජල ගැලීම්, නියඟය ආදී ස්වාභාවික ව්‍යසනයන් මෙන්ම යුදමය කාලවලදී අවතැන්වූ අයට සේවා සැපයීමද, නීතියේ

පිළිසරණ පතා පැමිණෙන්නන්ට නීති සහන සේවාවන් ලබාදීමද, මාවත්වාසී දරුවන් හා කාන්තාවන්ගේ සුභසාධනය සහ පුනරුත්ථාපනය සඳහා වැඩසටහන්ද ක්‍රියාත්මක කෙරේ.

මේ සියලුම වැඩ සටහන්වල පොදු ලක්ෂණයක් නම් එක් අතකින් ඒවා පාරම්පරික - ආධ්‍යාත්මික - සංස්කෘතික පදනමක පිහිටා ඇති අතර - අනික් අතින් ඒවා ජාත්‍යන්තර වශයෙන්ද ක්‍රියාත්මක කළ හැකි අන්දමට ගොඩ නගා තිබීමයි. සර්වෝදය ප්‍රයත්නය

රජයේ මෙන්ම, රජයේ නොවන ආයතන වලටද ජනතාවට සේවයක් කිරීමට නව මාර්ග පිළිබඳ මඟ පෙන්වීමක් කිරීමටත්, ධෛර්ය දීමටත් සමත්ව තිබේ. සර්වෝදය පණිවුඩය සහ සේවාවන්වල තිබෙන විශ්වමය ස්වභාවය නිසා ඒවා වෙනත් දුප්පත් මෙන්ම පොහොසත් රටවල් රැසකට ම ව්‍යාප්ත වී තිබේ.

පැරණි ලෝක සමාජ ක්‍රමය බිඳ වැටී ගෙන යයි. පසුගිය දශක කිහිපය තුළ බල පැවැත්වූ ප්‍රධානතම බලවේගය වූයේ කෘතිම වශයෙන් නිර්මාණය කරන ලද ආශාවන් රැසක් මුදුන්පත් කර ගැනීම සඳහා වඩ වඩාත් භෞතික ධනය සම්පාදනය කිරීමයි.

මේ මිනිසාට තම සිත තුළ පැවතිය යුතු සාමකාමී බවත්, තම සහෝදර මිනිසුන් සමග තිබිය යුතු සාමකාමී බවත්, තම ස්වභාවික පරිසරය සහ ආයතනීය පරිසරයන් සමඟ තිබිය යුතු සාමකාමී බවත් අහිමි වී තිබීම පුදුමයක් නොවේ. මනුෂ්‍ය පෞරුෂය මේ අන්දමින් කඩින් කඩ වීම නිසා ඇතිවූ භයානක ප්‍රතිඵල වඩාත්ම දක්නට ලැබෙන්නේ විද්‍යාව හා තාක්ෂණය ඉතාම ඉහළ මට්ටමට දියුණු වී තිබෙන සමාජවලයි. පාරිසරික දූෂණය, පාරිසරික අසමතුලිතතාව, සුඛෝපභෝගීත්වයේ ව්‍යාධීන් හැටියට සැලකෙන මානසික, පිළිකා සහ හෘදය සම්බන්ධ රෝග, පවුල් ජීවිතය කඩාකප්පල්වීම සහ සිතාමතා හෝ හදිසි අනතුරක් තුළින් ඇති විය හැකි න්‍යෂ්ටික මහා විනාශයක තර්ජනය යනාදී භයානක තත්ත්වයන් රැසකට ඔවුහු මුහුණ දී සිටිත්. පසුගිය ශතවර්ෂ පහ තුළදී ක්‍රියාත්මක වූ ඓතිහාසික

බලවේගයන් නිසා ශ්‍රී ලංකාවේ ජීවත්වන අපිද මෙම අවදානම් ලෝක සමාජ ක්‍රමයේ විෂම චක්‍රයට අසුවී සිටිමු. බටහිර ජාතීන් අද හසුව තිබෙන ආර්ථික වර්ධනය මැදි කොට සකස් වුන බටහිර සංවර්ධන ආකෘතිය එලෙසම අප පිළිගනිමු ද? අසීමිත භෞතිකවාදී ආශාවන් අනුව අපි හැඩ ගැසෙමු ද? නැතහොත් හොඳින් තෝරාගත් අපේ ජනතාවගේ මූලික අවශ්‍යතාවන් මුල් වූ සංවර්ධන ආකල්පයන් අපි අනුගමනය කරමු ද? යන ප්‍රශ්නය මතුවේ.

අධ්‍යාපනය මිනිසාගේ ආත්මාවබෝධය පදනම් කොට ගොඩනැගිය යුතු බව අපගේ විශ්වාසයයි. අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලදී මනුෂ්‍යාගේ පූර්ණ පෞරුෂෝදයට ප්‍රමුඛ ස්ථානය දිය දුතු බව ද අපි විශ්වාස කරමු. ඉගෙනීමේ කාර්යාවලිය බෙහෝ විට බුදුරජාණන් වහන්සේගේ දේශනයෙහි සඳහන් වන ''චක්ඛුං උදපාදි'' යන ඉන්ද්‍රිය ප්‍රබෝධයන්ය. උන්වහන්සේගේ ''ඤාණං උදපාදි'' යන දෙසුම දැනීම ලබා ගැනීම හා සමාන කළ හැක.

මෙම ඉන්ද්‍රිය ප්‍රබෝධය අතර ''පඤ්ඤා උදපාදී'' හෙවත් ප්‍රඥාවේ උදාව, අධ්‍යාපනය හැටියට අපි දකිමු. අධ්‍යාපනය හෙවත් මෙම ප්‍රඥාව ලබන තැනැත්තා ඔහු මුහුණ දී තිබෙන අසතුටුදායක තත්වයන් ගෙන් මිදීම සඳහා ''විජ්ජා උදපාදී'' හෙවත් විද්‍යා ප්‍රබෝධය ලබයි. මෙම ඉගෙන ගැනීමේ, ප්‍රඥාව වැඩිමේ සහ විද්‍යාව ප්‍රගුණ කිරීමේ උසස්ම අවස්ථාව අවසාන වන්නේ ''ආලෝකෝ උදපාදී''හෙවත් අන්ධකාරයෙන් සම්පූර්ණයෙන් ඉවත් වී, ආලෝකය උදා කර ගැනීමෙනුයි. මෙවන් සාරධර්ම පදනම් කොට අරමුණක් ඇතිව අපේ අධ්‍යාපන ක්‍රියාවලියට නව පදනමක් දැමීමට අපට හැකි නොවේ ද?

මෙවැනි අධ්‍යාපනික දර්ශනයක් පිළිගැනීමෙන් මිනිස් ජීවියකුගේ ආරම්භයේ සිටම හෙවත් මව් කුසෙහි පිළිසිඳගත් අවදියේ සිටම මනුෂ්‍ය සංවර්ධනයට ඉවහල් වන අයුරින් පරිසරයක් ගොඩනැංවීමට අපට හැකි වනු ඇත. මේ සඳහා සර්වෝදය විසින්

ගැබිණි මව්වරුන් හා ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් සඳහා පවත්වා ගෙන යන මව් පදවියට දහම් ප්‍රවේශයක්" යන වැඩසටහන මෙම ව්‍යායාමයට අතදීම සඳහා ගොඩ නැඟුවකි.

ඉතාම කෙටි කාලීන පැවැත්ම සඳහා අපි අපගේ පහසුකම් අනුව අප විසින්ම මවාගනු ලැබූ පටු ලෝකයක අද ජීවත් වෙමු. ඊට එරෙහිව කිසිදු බියකින් හෝ පැකිලීමකින් තොරව, බටහිර සංවර්ධන ආකෘතිය අප විසින් ප්‍රතික්ෂේප කළ යුතු වෙයි. ඒවා පිළිගත් කිසිදු සමාජයක් සතුටට හෝ සෑහීමට හෝ පත් වූයේ නැත. බටහිර සමාජවල තිබෙන අන්දමේ පාරිභෝගික මට්ටමේ සියලු ජාතීන් අතර ව්‍යාප්ත කිරීමට ලෝකයේ ස්වභාව සම්පත් ප්‍රමාණවත් නොවේ. එම සමාජවල ද එම පරිභෝජන තත්ත්වය තව එක දශකයකුදු ඉදිරියට පවත්වා ගෙන යා නොහැක.

අපේ ජනතාවගේ සැබෑ අවශ්‍යතාවන් සපුරාලීමට හැකිවන්නේ අපේම ජාතික සම්පත් සහ අපටම ආවේනික වූ යෝග්‍ය විද්‍යා හා තාක්ෂණයක් ම පදනම් කරගත් සංවර්ධන වැඩ සටහන් සම්පාදනය කිරීම තුළිනි. මෙය සාක්ෂාත් කර ගැනීමට නම් බටහිර ශාස්ත්‍රිය ආර්ථික සාධක නිසර්ගයෙන්ම භෞතිකවාදී සහ හිංසාවාදී වූ, ආපසු හැරවිය නොහැකි බටහිර සංවර්ධන රටාවන් වලට හසු නොවී, අපේම සම්පත් සහ හැකියාවන් ඇතුළත සමබර සංවර්ධනයක අරමුණ තබා ගෙන අප ඉදිරියට ගොස් සෑහීමකට පත් වූත් සතුටින් සිටින්නා වූත් සමාජයක් ගොඩනැංවීමට අපේ රටට හැකියාව තිබේ. මේ අභියෝගාත්මක කාර්යය සඳහා ප්‍රාරම්භක පියවර ගැනීමට මා සිතන හැටියට, ලෝකයේ ශ්‍රී ලංකාව හැර වෙනත් රටක් නැත.

ජාතියක් වශයෙන් කාලයෙන් පැරණි වුවත්, වර්තමාන විද්‍යාත්මක සොයා ගැනීම් අනුව අතිශයින් නවීන හැටියට සැලකිය හැකි වේගාත්මක ලෝක දර්ශනයක් ඓතිහාසිකව අපට උරුමව ඇත. අවංක නායකත්වයටත්, සාරධර්ම ගරු කරන බහුතර ජනතාවක් තවමත් අප රටේ වාසය කරති. අපට ඇති බාධකය

හැටියට මට පෙනෙන්නේ, අලුතින් සිතීමට ඇති බියත්, ප්‍රමාණවත් ධෛර්යයකින් යුතුව ක්‍රියා කිරීමට අප අපොහොසත් වීමත්ය.

නව පරපුරක් හා නව ලෝක සමාජ ක්‍රමයක් ගොඩනැංවීමට අවශ්‍ය සම්පූර්ණයෙන් වෙනස් වූ බුද්ධිමය බලවේගයක් මුදා හැරීමට අදට වඩා යෝග්‍ය - තවත් තීරණාත්මක අවස්ථාවක් නැත. මේ සඳහා නව අලෝක ධාරාවක් දල්වන ලෙස මම ඔබ සියලු දෙනාටම ආරාධනා කරමින් මියුසියස් හිගින්ස් මැතිණියගේ ශ්‍රේෂ්ඨ සංකල්පනාවක් මෙසේ සටහන් කරනු කැමැත්තෙමි. දරුවනි මමද මතු සසරෙහි බුද්ධ රාජ්‍යය ලබා ගැනීමට අධිෂ්ඨාන කරන්නෙමි. පාරමී දම් පිරීම කා හට වුවද අපහසු කරුණක් නොවේ. වුවමනා කරන්නේ පිරිසිදු පරහිතකාමී හිතක් හා බලවත් අධිෂ්ඨානයක් පමණකි. අප සියල්ලන්ටම බුද්ධත්වය පහසුවෙන් ලබන්නට නොහැකි වුවත් බෝසත් චරිතයක අත්තිවාරම මේ ආත්ම භවයේදීම ආරම්භ කිරීම අපහසු නොවේ".

ඔබ සියලු දෙනාටම තෙරුවන් සරණයි.

නීතා ආරියරත්න.

දරු මුණුපුරන් ගැන සතුටු වන පියෙක්

මා නීතා සමඟ පවුලේ දරු මුණුබුරු, මී ණිබිරියන් සමඟ

භවතණ්හා තෙවැනි වෙළුම මුද්‍රණයට දෙන විට මා විවාහක දරුවන් හය දෙනෙකුගේ පියෙකි. මිණිබිරියන් හය දෙනෙකුගේ හා මුණුබුරන් පස් දෙනෙකුගේ සීයා කෙනෙකි. දොළොස් වැනි මුණුබුරා හෝ මිණිබිරිය ළඟදීම අප අතරට එයි. මගේ වැඩිමහල් මුණුබුරා ජනන්ත දේසර ළඟදී විවාහ වූ නිසා සමහර විට මේ වසර නිම වීමට පෙර මට මී මුත්තෙක් වීමට ද හොඳටම ඉඩ ඇත.

මැගේ වැඩිමහල් දුව සාම්යා චාරිකාය. ඇය විවාහ වූයේ විශේෂඥනාරි වෛද්‍යවරයකු වූ උපාලි මාරසිංහ සමඟය. චාරිකා විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියේ සිට විශ්ව විද්‍යාල විභාගවලදී ඉතා ඉහළින් දස්කම් පෑ නිසා ඇගේ උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව රැසක්ම හිමි කර ගත්තාය. ජනාධිපති ශිෂ්‍යත්වය මෙන්ම පොදු

රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වයද ඇය ලැබුවාය. ඒ නිසා ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය, බැරිස්ටර් උපාධිය මෙන්ම ජාත්‍යන්තර නීතිය පිළිබඳ ආචාර්ය උපාධියද ඇය ලබා ගත්තාය. අවුරුදු 19 කට කිට්ටු කාලයක් කොළඹ නීති විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වශයෙන් සේවය කළ ඇය හිටි හැටියේම ඒ ධූරයෙන් ඉල්ලා අස් වී දරුවන්ගේ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් සුරකින පෞද්ගලික පුණ්‍යායතනයක් පිහිටුවා එහි සේවය කරන්නීය. ඒ අතර ඇයගේ ස්වේච්ඡා සේවය ඒ.ටී. ආරියරත්න භාර අරමුදල මගින් පවත්වා ගෙන විශ්ව නිකේතන සාම නිවහනේ ප්‍රධාන භාරකාරිය වශයෙන් පිරිනමයි.

විශේෂඥවෛද්‍ය උපාලි මාරසිංහ රජයේ සේවයේ යෙදී සිටියදීම ස්වේච්ඡාවෙන් 'මව් පදවියට දහැමි ප්‍රවේශයක්' යන වැඩ සටහන ගර්භනී මව්වරුන් හා ඔවුන්ගේ ස්වාමිවරුන් සඳහා විශ්ව නිකේතනය මධ්‍යගත කොට දැනට වසර කිහිපයක සිටම ක්‍රියාත්මක කරයි. සිය ගණනක් නව විවාහකයන් මෙම වැඩ සටහනෙන් ප්‍රයෝජන ගන්නා අතර දැන් මේ වැඩ සටහන පදවිය, පොළොන්නරුව, අම්පාර, ගාල්ල, රත්නපුරය ආදී ඈත ප්‍රදේශවලට ද ගෙනගොස් තිබේ. ඔහු 'චිත්ත ශාරීරික චිකිත්සාව' යන වැඩ සටහනක් ද විශ්ව නිකේතනය මධ්‍යගත කොට අරඹා දැන් ක්‍රියාත්මක කරයි.

චාරිකා උපාලි දෙපොළට ජනන්ත දේසර නමින් පුතෙක් සිටී. එංගලන්තයේ බ්‍රෑනල් විශ්ව විද්‍යාලයේ විද්‍යා උපාධියක් ලබා ඇති ඔහු දැන් මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධව සේවයේ යෙදී සිටී. ඔවුන්ගේ දෙවැනි දරුවා දම්නි නිවේද්‍යා තවම උසස් අධ්‍යාපනය ලබයි.

මගේ දෙවැනි දරුවා වින්යා ශාන්තිදාස් ආරියරත්න පිලිපීනයේ ලසාල් විශ්ව විද්‍යාලයේ සහ එංගලන්තයේ චරම් යන විශ්ව විද්‍යාලවලින් වෛද්‍ය විද්‍යාව හදාරා ඇමෙරිකාවේ ජෝන්

හෝප්කින්ස් හිදී ප්‍රජා සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් විශේෂඥඋපාධි ලබා කලක් රජයේ වෛද්‍ය සේවාවේ සහ වෛද්‍ය විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙක් වශයෙන් ද සේවය කළේය. පසුව විශේෂඥවෛද්‍ය වෘත්තියට ආයුබෝවන් කියා සර්වෝදය සංසදයේ විධායක අධ්‍යක්ෂ වශයෙන් පූර්ණකාලීනව මට උදව් කිරීමට එක් විය. මේ වන විට වසර 12 ක් පමණ ඔහු මගේ බර සැහැල්ලු කරමින් සර්වෝදය සංසදයට නායකත්වය දෙන අතර පසුගිය මහා සභා රැස්වීමේදී ඔහු විධායක අධ්‍යක්ෂ ධුරය සමන් අල්ගොඩ මහතාට බාර දී සංගමයේ ප්‍රධාන ලේකම් ධුරයට ඒකඡන්දයෙන් තේරී පත් විය. ඔහු සර්වෝදය ජාතික මට්ටමේ ස්වාධීන ආයතන සියල්ලම ද දිවයින පුරා ව්‍යාප්තව තිබෙන ගම් මට්ටමේ නීතිගත සමිති ද ඒකාබද්ධ කොට දීප ව්‍යාප්ත ජාලයක් ගොඩ නඟමින් සැබෑ සිවිල් සමාජ සංවිධානයක් ගොඩනැඟීමේ භාරදූර කාර්යයක යෙදී සිටී.

මීට අමතරව සර්වෝදය ළඟදී පිහිට වූ දේශෝදය මූල්‍ය සමාගමේ සභාපති ධූරය ද සර්වෝදය විශ්වලේඛා ආයතනය, ෆියුෂන් ආයතනය, ආදී වූ සියලුම වැදගත් සර්වෝදය ආයතනවල වගකීම් ඔහු උසුලයි. රජයේ ආයතනවල සහ විදේශීය සම්බන්ධතාවලට සර්වෝදය ප්‍රධාන නියෝජිතයා වශයෙන් කටයුතු කරන්නේ ද වින්යා ය. වින්යා මහාචාර්ය නන්දසේන රත්නපාල ශූරීන්ගේ දියණිය වූ මදාරා සමඟ විවාහ වී සිටී. ඇය නීතිඥවරයකි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නීතිඥවරියක් හැටියට ඇය සේවය කරයි. ඒ දෙදෙනාට හසල සහ අසේනි යනුවෙන් පුතෙක් හා දුවෙක් සිටිති. මා ජීවිත කාලයම කැප කළ ලංකාව සහ ලෝකය පිළිබඳ මා සිහින දුටු ක්‍රියාත්මක කළ යමක් ඇත්නම් එය ඉදිරියට ගෙන යා හැකි ශ්‍රේෂ්ඨ පුත්‍ර රත්නයක් වින්යා ශාන්තිදාස් තුළ සිටින බව දන්නා මා කවදා හෝ මිය යන්නේ අතිශය සැහැල්ලු සිතකිනි.

ජීවන් ධම්මික මගේ තුන්වැනි දරුවාය. දෙවැනි පුතාය. ඔහු වෘත්තියෙන් ගුවන් නියමුවෙකි. මුලින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ද, පසුව ශ්‍රී ලංකා ගුවන් සේවයේද ගුවන් නියමුවෙකු ලෙස

සේවය කළ ඔහු දැන් වසර කිහිපයක සිට කටාර් ගුවන් සේවයේ සේවය කරයි. ඔහුට ජිත්වන් සහ කණිෂ්ඨා යනුවෙන් පුතෙක් සහ දුවෙක් සිටිති. ඔහු ශෙහාරි ප්‍රනාන්දු සමඟ විවාහ වී සිටී.

ජීවන් මට පුදුම ආදරයක් දක්වයි. අම්මා හා තාත්තා මෙන්ම සහෝදර සහෝදරියන් හිත මිතුරන් සඳහා ද ඔහු කිසිම අඩුවක් නැතිව සියළු යුතුකම් ඉටු කරයි. ඔහු විශ්ව නිකේතනයේ භාරකරුවකු වශයෙන් මෙන්ම වෙනත් අවශ්‍ය කටයුතුවලදී ද සර්වෝදය සංගමයේ වැඩවලට ද සහාය වේ. 2004 සුනාමි කාලයේදී ඔහු රට පුරා ඇවිදිමින් විශාල සේවයක් ඉටු කළේය.

මගේ සිව්වැනි දරුවා සදීවා සාමදීපාය. ඇය විවාහ වී සිටින්නේ සුරැකුම්පත් සහ විනිමය කොමිසන් සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල්ව සිටි චන්න ද සිල්වා සමඟය. දැනට ඔහු ඩෙල්මේජ් සමාගමේ අධ්‍යක්‍ෂවරයකු වශයෙන් සේවය කරයි. සදීවා ගියේ සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා පාසලටය. ඉන්පසු උසස් අධ්‍යාපනය සඳහා ඉන්දියාවේ බැංගලෝර් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ද ලබා ගත්තාය. ටික කලක් පරිසර අමාත්‍යාංශයේ සේවය කළ ඇය දිනක් ගෙදර ආවේ ඇගේ අස්වීමේ ලිපිය බාරදීමෙන් පසුවය. හේතුව ඇමතිතුමාගේ කතා ලියාදීම හැර කිසිම නිර්මාණාත්මක වැඩක් කිරීමට එහි ඉඩක් නොතිබුණු නිසාය. එදා සිට විශ්ව නිකේතන මධයස්ථානයේ භාරකාරියක් හැටියට ඇය ස්වේච්ඡාවෙන් සේවය කරයි. සදීවා සහ චන්න දෙපොළට සුරතල් දියණියක් සහ පුතෙක් සිටී.

මගේ තුන්වැනි පුතා දියත් සමන්ත නාලන්දාවේ අධ්‍යාපනය නිමවා ඇමෙරිකාවේ මිසිසිපි විශ්ව විද්‍යාලයෙන් පරිගනක විද්‍යාව පිළිබඳ උපාධියක් ලැබ දැනට ලංකාවේ වර්චුසා සමාගමේ සේවය කරයි. ඔහු ෂෙනරින් ස්මිත් නැමැති කාන්තාවක් සමඟ විවාහ වී දියණියන් දෙදෙනෙකු සමඟ අප නිවස අසලම පදිංචිව සිටිත්. සර්වෝදය වෙබ් අඩවිය සඳහා දියත් උදව් වේ. මගේ බාලම දියණිය

නිම්නා හයන්ති අපේ පවුලේ තුන්වැනි දියණිය වන අතර ඈය ධම්මික ගනේගම සමඟ විවාහ වී සුරතල් දරු දෙදෙනෙකුගේ දෙමාපියන් වී සිටිති. නිම්නා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකාරිත්වය පිළිබඳ උපාධියක් ලැබූ නමුත් රැකියාවකට ගියේ නැත.

මගේ සියලුම දරු මුණුබුරන් පදිංචි වී සිටින්නේ අපේ මුල් ගෙදරට නුදුරුව නිසා දිනපතාම වාගේ ඔවුන් අපේ නිවසට එක්වීම අප දෙදෙනාට ලොකු සතුටක් ගෙන දේ.

අපේ පන්සල නව සැරසුන්ගෙන් හා සෙසු විහාරාංගවලින් පරිපූර්ණ කිරීම.

මොරටුව, රාවතාවත්ත, පල්ලියගොඩැල්ල පුරාණ විහාරයේ දායකයෙකු වශයෙන් මා සම්බන්ධ වූයේ අතිපූජ්‍ය යටිපව්වේ රතනසාර නාහිමියන් විහාරාධිපති ධූරය ඉසිලූ යුගයේය. එනම්, අවුරුදු 40 කට පමණ ඉහත දීය. එම දශක හතරේ මුල් භාගයේදී උන් වහන්සේගේ අනුශාසකත්වය යටතේ සර්වෝදය සඳහා විශාල සේවයක් පන්සලෙන් ලබා ගැනීමටත්, පන්සලට එවැනිම සේවාවක් සර්වෝදයෙන් ප්‍රදානය කිරීමටත් අපට හැකි විය.

රතනසාර ලොකු හාමුදුරුවන්ගේ අපවත්වීමෙන් පසු ප්‍රධාන වශයෙන් නිසි නායකත්වයක් නොතිබුණු නිසා පන්සල ක්‍රම ක්‍රමයෙන් පරිහානියට පත් විය. පල්ලියගොඩැල්ල පුරාණ විහාරය අවුරුදු හාරසීයක් පමණ පැරැණි සමහර විට මේ ප්‍රදේශයේ තිබෙන පැරැණිම සිද්ධස්ථානය විය හැකිය. මෙහි විශාල අඩුවක් තිබෙන බව මට පෙන්වා දුන්නේ අවුරුදු විස්සකට වැඩි කාලයක් පන්සලේ අටසිල් සමාදන් වූ මගේ මෑණියන්ය. එතුමිය ජීවත් වන කාලයේම මා විසින් චෛත්‍ය කර්මාන්තය ඇරඹීමට විශාල පරිත්‍යාගයක් කළ මුත් එයින් ප්‍රතිඵල ලැබුණු බව පෙනෙන්නට තිබුණේ නැත. මගේ මව අභාවප්‍රාප්ත වී අවුරුදු විස්සකට වැඩි කාලයක් ගත වූවත්, දැනට වසර එකහමාරකට පමණ පෙර එතුමියගේ ඉල්ලීම මගේ සිතට ආවේ විශ්මය ජනක අන්දමටය. කෙසේ නමුත් එවේලේ මා අත කිසිදු ධනයක් නොතිබුණත් වර්තමාන විහාරාධිපති පූජ්‍ය උඟුරගහ නාගිත ස්වාමීන් වහන්සේගේ සහ දායක සභාවේ ලිඛිත අවසරයක් ඇතිව මෙම චෛත්‍ය රාජයාණන් වහන්සේ ගොඩනැගීමට මම ඉදිරිපත් වීමි. එවකට මා ලබා ගත් ඇස්තමේන්තුව අනුව රුපියල් මිලියන දෙකකට අඩු ප්‍රමාණයකින් මෙය නිම කිරීමට හැකියාව තිබුණි.

පන්සලට ගොස් චෛත්‍ය නිර්මාණය කිරීමට මූලික කටයුතු කරන අවස්ථාවේදී මගේ හිතට ආ අදහසක් නම් මගේ මහන්සිය අඩු වශයෙන් අවුරුදු 500 ක් ඉදිරියට පවතින ලෙස කරන ආයෝජනයක් විය යුතු බවයි. ඒ අනුව මා විසින් ආරාමයේ පහත සඳහන් සංවර්ධන කටයුතු කළෙමි. මේ සඳහා අවම වශයෙන් රුපියල් මිලියන 22 කට වැඩි මුදලක් වැය විය.

ඉදිකිරීම් වැඩ විස්තරය

1. මූලික වැඩ:
    - 1 - 1 කැලෑව එළිපෙහෙලි කර ශුද්ධ කිරීම.
    - 1 - 2 තිබූ අබිලි ද්‍රව්‍ය අප ද්‍රව්‍ය ඉවත් කිරීම
    - 1 - 3 ගස් හා මුල් ගලවා ඉවත් කිරීම
    - 1 - 4 පැතිබැම් සහ අභ්‍යන්තර බැම් බැඳීම සඳහා අත්තිවාරම් කැපීම.

2. ඉදිකිරීම් වැඩ:
    - 2 - 1 සියලු අංගෝපාංගවලින් සමන්විතව රියන් 21කින් උස නව චෛත්‍ය රාජයාණන් වහන්සේ (දාගැබ) ඉදිකිරීම, තීන්ත ආලේප කිරීම සහ විදුලි ආලෝකය ලබාදීම.
    - 2 - 2 චෛත්‍ය මළුවේ මල් ආසන හතරක් ඉදි කොට බුද්ධප්‍රතිමා හතරක් තැන්පත් කොට ඇලුමිනියම් රාමු සහිත වීදුරු පෙට්ටිවලින් ආවරණය කිරීම.
    - 2 - 3 චෛත්‍ය මළුවට පිවිසීම සඳහා ඇත් පවුරක් සහිත කොන්ක්‍රීට් මාර්ගයක් තැනීම. මාර්ගය දෙපැත්තෙහි මකර රූප සහිත බැම් බැඳ වැඩ නිම කිරීම.
    - 2 - 4 සඳකඩ පහණක් ඉදිකිරීම.
    - 2 - 5 චෛත්‍ය මළුව හා පිවිසුම් මාර්ගය ගැනයිට් ටයිල් අල්ලා අලංකාර කිරීම.
    - 2 - 6 චෛත්‍ය මළුවේ වැසි ජලය බැස යෑමට සකස් කිරීම.

2 - 7 පල්ලියගොඩැල්ල විහාර මාවතෙන් පන්සලට යෑමට හැකි වන පරිදි පඩිපෙළ ඉදි කිරීම.

2 - 8 එම පඩිපෙළ මාර්ගයේ ආරක්‍ෂක අභ්‍යන්තර පැති බැම්මක් බැඳ වැඩ නිම කිරීම

2 - 9 පල්ලියගොඩැල්ල විහාර මාවතෙන් ඇතුළු වන දොරටුවේ ශාන්ති තොරණක් ඉදි කිරීම සහ අඩි 12ක් උස යකඩ කම්බි යොදා ගේට්ටුවක් සවි කිරීම.

2- 10 පල්ලියගොඩැල්ල විහාර මාවත පාර පැත්තේ නැගෙනහිර සහ බටහිර දිශාවට පන්සල් ඉඩමේ අඩි 400ක් දිග උස අඩි 16 ක්වූ ආරක්ෂිත කළුගල් මායිම් බිත්තිය (පැති බැම්ම) බැඳ නිම කිරීම.

2 - 11 එම බැම්ම කපරාරු කර තීන්ත ආලේප කිරීම.

2 - 12 එම බැම්ම මත ආරක්ෂිත ප්‍රකාර බැම්මක් අඩි 3ක උසකින් යුතුව සිමෙන්ති බ්ලොක් ගලින් බැඳ කපරාරු කර තීන්ත අලේප කිරීම.

2 - 13 එම බැම්ම මත පහන් කණු 21ක් ස්ථාපිත කොට විදුලිපහන් දෙක බැගින් වන ලෙසට සවි කිරීම හා විදුලි ආලෝකය ලබාදී.

2 - 14 අපිරිසිදු තත්ත්වයක තිබූ පන්සල විසින් කලින් සිමෙන්ති ගලින් බැඳ වැඩ නිම කර තිබූ පැති බැම්ම පිරිසිදු කිරීම, පලුදු වැසීම හා තීන්ත ආලේප කිරීම.

2 - 15 කලින් නිම කර තිබූ බෝමළුව හා භාවනා ශාලාව අතර අභ්‍යන්තර පැති බැම්ම අළුත්වැඩියා කර කපරාරු කර තීන්ත අලේප කිරීම.

2 - 16 එම පැති බැම්ම පැරණි ධර්මශාලාව දක්වා චෛත්‍ය රාජයාණන් වහන්සේත්, බෝධීන් වහන්සේත් සහ ධර්මශාලාව ආරක්ෂා වන පරිදි අලුතින් අඩි 48ක් දිග අඩි 11 1/2ක උසකින් කළුගලින් බැඳ බෝමළුව සඳහා තිබූ වපසරිය වැඩි කිරීම.

2 - 17 බෝමළුව හා අටවිසි බෝමළුවට පිවිසීම සඳහා පඩිපෙළක් ඉදි කිරීම.

2 - 18 බෝමළුව අභ්‍යන්තර බැම්මේ සිට මායිම් පැති බැම්ම අතර කොටස් දෙකක ගල් බැම් බැඳීම සහ එක් බැම්මකට පඩි තුනක් බැඳීම.

2 - 19 බෝමළුව අභ්‍යන්තර පැති බැම්ම මත අඩි 3ක් උස ආරක්ෂිත ප්‍රකාර බැම්මක් බැඳීම, තිබූ කොටසක් අළුත්වැඩියා කිරීම සහ තීන්ත ගෑම.

2 -20 එම බැම්මට සම්බන්ධව තිබූ අබලන් පහන් කණු අළුත්වැඩියා කිරීම සහ අලුතින් පහන් කණු 7ක් සිටුවා විදුලි ආලෝකය සැපයීම.

2 - 21 මල් ආසනය අසල පොලව කොටසක් කොන්ක්‍රීට් කර සැකසීම.

2 - 22 බෝමළුවේ එක් කෙළවරක චෛත්‍යයට පිවිසුම් මග දකුණු පස කොන්ක්‍රීට් පොලවක් ඉදි කර විවෘත ස්ටේජ්එකක් සෑදීම.

2 - 23 චෛත්‍ය රාජයාණන් වහන්සේ රඳා තිබෙන කොන්ක්‍රීට් කණු ප්‍රයෝජනයට ගෙන අඩි 100ක් දිග අඩි 50 ක් පළල භාවනා ශාලාවක් ඉදි කිරීම. ශාලාව තුළ භාවනා කුටි 51 ක් ඉදිකරවා තීන්ත ආලේප කර සියළු වැඩ නම කිරීම.

2 - 24 භාවනා ශාලාව සම්පූර්ණයෙන්ම දැල් ගසා ආවරණය කිරීම. ශබ්ද විකාශණ යන්ත්‍රයක් සවි කිරීම, විදුලි බුබුලු සවිකර විදුලි ආලෝකය සැපයීම.

2 - 25 භාවනා ශාලාවේ අඩි 7 ක් උසට යකඩ කම්බියොදා දොරටු තුනක් සවි කිරීම.

2 - 26 භාවනා ශාලාවේ සිට අට විසි බුදු කුටි මළුවට යෑමට පඩිපෙලක් ඉදි කිරීම.

2 - 27 භාවනා ශාලාවට යාබද උද්‍යානය සම්පූර්ණයෙන්ම පස් පුරවා අටවිසි බෝධීන් වහන්සේලා රෝපණය කිරීමට භූමිය සකස් කිරීම.

2 - 28 අටවිසි බුදු කුටි ඉදිකිරීම, ටයිල් අල්ලා සියළු වැඩ නිම කිරීම, ඉදිරිපස ඇළුමිනියම් රාමු සහිත වීදුරු පෙට්ටි වලින් ආවරණය කිරීම.

2 - 29 අටවිසි බුදුපිළිම වහන්සේලා තැන්පත් කිරීම, විදුලි ආලෝකය සැපයීම.

2 - 30 අටවිසි බුදුකුටි ඉදිරිපස අභ්‍යන්තර ආරක්ෂක පැති බැම්මක් ඉදි කිරීම.

2 - 31 අටවිසි බුදුකුටි ඉදිරිපස වැලි මළුවක් සැකසීම.

2 - 32 වැසි ජලය / පිටාර ජලය බැස යාමට බැසුම් නල දැමීම.

2 - 33 පල්ලියගොඩැල්ල විහාර මාවතෙන් නව විදුලි සැපයුමක් ලබා ගැනීම.

2 - 34 උද්‍යානයට ජල සැපයුම ලබාදී ජල කරාම 4 ක් සවි කිරීම.

2 - 35 චෛත්‍ය ගර්භය ඇතුළත බුදුරජාණන් වහන්සේගේ ලංකා ගමන දැක්වෙන චිත්‍ර ඇඳීමේ හා ප්‍රතිමා නෙලීමේ කාර්යය සිදු කෙරෙමින් පවතී.

දායක සභාවෙන් පරිත්‍යාග කෙරුණු රුපියල් 10,20000/-ක ආධාර මුදල, චෛත්‍ය අත්තිවාරමට අවශ්‍ය කොන්ක්‍රීට් කුළුනු 16ක් ඉදි කිරීම, චෛත්‍ය ඉදිකිරීමට කොන්ක්‍රීට් තට්ටුව දැමීමට අවශ්‍ය වන සැටලිම සකස් කරදීම, කොත්වහන්සේ සහ චූඩාමාණික්‍යය පූජා කිරීම, චෛත්‍ය මන්දිරයට ඇතුළුවන දොරටුවට අලංකාර උළුවස්ස සහදොර සවිකිරීම, චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ආලේප කිරීම සඳහා තීන්ත සහ පිලර් ආදිය ලබාදීම, ගර්භ නිධානෝත්සවය සහ කොත් පැළඳවීමේ උත්සවය සිදු කිරීම ආදී වූ ආධාරයන් කළ බව කෘතඥතා පූර්වකව සඳහන් කරමි.

මා විසින් පෞද්ගලිකව කරන ලද ආයෝජනය මිලියන විස්ස ඉක්මවා ඇත. මා වෙත ජපානයේ, ජපන් බෞද්ධ සම්මේලනය හෙවත් බුක්කියෝ ඩෙන්ඩො කියෝකායි (Bukkyo Dendo Kyokai) ආයතනය විසින් ලෝක බෞද්ධ ධර්මදූත සේවය සඳහා පිරිනැමුන සම්මානයෙන් ලත් මුදලත්, ඉන්දියාවේ කර්නාටක ප්‍රාන්තයේ චිත්‍රදුර්ගා නගරයේ ශ්‍රී මුර්ගා මත් ආශ්‍රමයෙන් පිරිනමන ලද 2010 බසවා ශ්‍රී සම්මානයෙන් ලැබුණු මුදල් පරිත්‍යාගයත්,

ඇමෙරිකානු සංචාරයේදී මා කළ දේශනවලදී විවිධ බැතිමතුන් කළ පරිත්‍යාගත් හැරුණු විට මෙරට සහ පිටරට පින්වතුන් ලබා දුන් මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර පරිත්‍යාගවලින් බොහෝ වැඩ නිම කර ගැනීමට හැකි විය.

2012 අගෝස්තු මස 23 වැනිදා විශාල බැතිමතුන් පිරිසකගේ සහභාගිත්වයෙන් ගර්භ නිධානෝත්සවය සිදු කරන ලදී. ඔක්තෝම්බර් මස 23 දින ධාතූන් වහන්සේලා මගේ නිවසේ ඇති බුදුකුටියේ සිට පල්ලියගොඩැල්ල පුරාණ විහාරස්ථානය වෙත වැඩම කරගෙන ගොස් සැදැහැවතුන්ට වන්දනා මාන කර ගැනීමට පන්සලේ විශේෂ වේදිකාවක තැන්පත් කර එදින රාත්‍රී සර්ව රාත්‍රික පරිත්‍රාන ධර්ම දේශනාවක් පල්ලියගොඩැල්ල පුරාණ විහාරස්ථානයේදී පවත්වා 24 වැනිදා උදේ සර්වඥධාතූන් වහන්සේලා තැන්පත් කිරීම සහ චූඩාමාණික්‍ය සහිත කොත් වහන්සේ තැන්පත් කිරීම නැකත් වේලාවට අනුව සිදු කළෙමු.

2012 නොවැම්බර් මස 04 වැනි දින සර්වෝදය මූලස්ථානයේ සර්ව රාත්‍රික පරිත්‍රාන ධර්ම දේශනාවද, 05 වැනිදා සියක් නමකට දානමය පින්කමද, 06 වැනිදා පස්වරු 3.00 සිට 6.00 දක්වා චෛත්‍ය රාජයාණන් වහන්සේ නිරාවරණය කිරීමේ මහොත්සවය ද පැවැත්වූ අතර බෝධි පූජාව සහ චෛත්‍ය පූජාව රාත්‍රී 7.00 ට පවත්වා උත්සව කටයුතු නිමා කරන ලදී.

චෛත්‍ය රාජයාණන් වහන්සේට පනස්නමකට අධික සර්වඥධාතූන් වහන්සේලා ලබා ගැනීමට උදව් වූ ශ්‍රී සත්‍යසායි බාබා තුමාගේ දේව ශක්තියට ද ඒ සඳහා මැදිහත් වූ කාංචන මහතාටද මම කෘතඥවෙමි. චෛත්‍ය රාජයාණන් වහන්සේ විවෘත කරද්දී බුදුරැස් විහිදුණු ආකාරයත්, භාවනා ශාලාව විවෘත කර පළමු මෙත්තා භාවනාව පවත්වද්දී චෛත්‍ය හා බෝධීන් වහන්සේ වටා දේවතා එළි රැසක් දිස්වූ සැටිත් රැස්ව සිටි සැදැහැවතුන් දුටු නිසා අපේ මහන්සිය සාර්ථක වූ බව සන්තෝෂයෙන් මෙනෙහි කරමු.

චෛත්‍ය සෑදීමට කොන්ක්‍රීට් තට්ටුව දැමීම

මුල්ගල තැබීම

ධාතූන් වහන්සේලා පෙරහැරෙන් රැගෙන ඒම



ධාතු නිධානය

ස්වාමීන්වහන්සේලා ප්‍රධාන ආරාධිත අමුත්තන් පැමිණීම

මහා සංඝරත්නය වැඩම කරවීම

චෛත්‍ය කොත් වහන්සේ නිරාවරණය කිරීම

උත්සව සභාවට පැමිණි විශේෂ අමුත්තන්



භන්තේ මහින්ද හිමි අතින් කරුණා ශාලාවේ ප්‍රථම මල් පහන් පූජාව



තිම වූ සෑ රදුන්



කරුණා භාවනා ශාලාව

පසුවදන

ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා නාලන්දා විද්‍යාලයේ මා ඉගෙන ගන්නා යුගයේ සිටි අපේ ගුරුතුමෙකි. අද වන විට සසුන් ගතවී සිටින මා හට ආත්මහරණයේ සෙවනැල්ල හඳුන්වා දුන්නේ මෙම සත් පුරුෂයාය. මිනිසා මිනිසාට උදව් කිරීමේ පරම යුතුකමේ බීජය මනසට වැපුරවූයේ මෙතුමාය. එදා සිට අද දක්වා එතුමාත් මාත් අතර තිබෙන කිට්ටු සබැඳියාව අපේ සසර ගමන පවතින තුරු පැවතේ යැයි මට හැඟේ. සමාජයට ගත හැකි ආදර්ශ රැසක් අඩංගු සිද්ධීන්, අත්දැකීම් සහ සංකල්පනා මෙම භවතණ්හා වෙළුම්වලට ඇතුලත්ව ඇත. මෙම භවතණ්හා සිව්වන වෙළුමට පසුවදනක් ලිවීමට මට අවස්ථාව ලැබීම ගැන මම සතුටුවෙමි. තව තවත් ලෝක ශාසනික සේවයට එකතුවීමට ආරියරත්න මහතාට දීර්ඝායු ලැබේවායි පතමි.

පූජ්‍ය බුද්ධංගල ආනන්ද හිමි
බුද්ධංගල ආරාණ්‍ය සේනාසනය,
අම්පාර.

ඒ. ටී. ආරියරත්න

සර්වෝදය සංසදයේ නිර්මාතෘ වන ආචාර්ය ඒ. ටී. ආරියරත්නයන් පිළිබඳව හා එතුමන්ගේ කැපවීම සහ වෙහෙස වී වැඩ කිරීම තුළින් සර්වෝදය සංසදය ශ්‍රී ලංකාවේ ගම් දනව් කරා පැතිරුණු ආකාරයත්, ඉතා දුෂ්කර අවධීන්හීද සාර්ථකත්වය කරා පිය නැඟි ආකාරයත් ගැන මම අසා ඇත්තෙමි. ආත්මාභිලාභයෙන් තොරව එතුමන් ශ්‍රී ලංකාවේ ජනතාව කෙරෙහි කරනා සේවය සැබවින්ම ශ්‍රී ලංකාවේ තරුණ පරපුරට ඉතා හොඳ ආදර්ශයක් වේ.

ඉන්දියාවේ හිටපු ජනාධිපති,
ආචාර්ය ඒ.පී.ජේ. අබ්දුල් කලාම්

සර්වෝදය
විශ්ව ලේඛා මුද්‍රණයෙකි.

ISBN 978-955-599-516-

මිල රු. 700/=

භව තණ්හා

ස්ව චරිතාපදානය

සිව්වන වෙළුම